# ත්‍රිපිටක ධර්මය

## 04

## හතරවන ශ්‍රේණිය

මූලික පිරිවෙණ

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය - 2017
දෙවන මුද්‍රණය - 2018
තෙවන මුද්‍රණය - 2019
සිව්වන මුද්‍රණය - 2020

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0454-9

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල දුම්රියපළ පාර, නො. 44 දරන
ස්ථානයෙහි පිහිටි නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.
Published by: Educational Publications Department
Printed by: Neo Graphics (Pvt) Ltd

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නඟා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ  සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යාස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම,  කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යාස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ තව තවත් පුළුල් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශීර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඉසුරුපාය

බත්තරමුල්ල

2020.06.26

**නියාමනය හා අධීක්ෂණය :-**

පී. එන්. අයිලප්පෙරුම - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම :-**

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**උපදේශකත්වය :-**

මහාචාර්ය ඩබ්.එම්. දේශප්‍රිය ගුණසේන - පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය

**සම්බන්ධීකරණය :-**

පූජ්‍ය රත්මලවිට චන්ද්‍රානන්ද හිමි - විෂය උපදේශක (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩී.එම්.ජේ. පුෂ්පකුමාර - නියෝජ්‍ය කොමසාරිස් (පාලන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සංස්කරණය :-**

පූජ්‍ය උඩුගම සුදස්සි හිමි - අංශ ප්‍රධාන, ආගම් හා සාරධර්ම
අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

**ලේඛක මණ්ඩලය :-**

පූජ්‍ය රත්මලවිට චන්ද්‍රානන්ද හිමි (සභාපති) - විෂය උපදේශක (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

| | |
|---|---|
| පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි | - ගුරු උපදේශක<br>කො/නාලන්දා ධර්මායතන මූලික පිරිවෙණ<br>ගල්කිස්ස |
| පූජ්‍ය උඟුරුගමුවේ අස්සජි හිමි | - පරිවේණාචාර්ය<br>කලු/ගංගාතිලක මූලික පිරිවෙණ<br>කෙසෙල්වත්ත, පානදුර |
| පූජ්‍ය දියගම නාරද හිමි | - පරිවේණාචාර්ය<br>කො/සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙණ<br>ගංගොඩවිල, නුගේගොඩ |
| පූජ්‍ය ගැමුණුපුර සෝමවංශ හිමි | - පරිවේණාචාර්ය<br>කො/විද්‍යාලංකාර මහ පිරිවෙණ, පන්නිපිටිය |
| පූජ්‍ය ගල්කිස්සේ ධම්මිස්සර හිමි | - ගුරු උපදේශක<br>කො/වංගීස මූලික පිරිවෙණ<br>කලපලුවාව, මුල්ලේරියාව |
| පූජ්‍ය පළමුගෙදර සුමනවංශ හිමි | - ගුරු උපදේශක<br>ගම්/විද්‍යාරවින්ද මහ පිරිවෙණ, ගම්පහ |
| ඊ.ඒ. ජයසේන එදිරිසිංහ | - විශ්‍රාමික විෂය උපදේශක (පිරිවෙන්)<br>498/B, කොස්වත්ත, රදාවාන |
| පී.ඒ. සරත් කුමාර | - පරිවේණාචාර්ය<br>කො/තක්ෂිලා මහ පිරිවෙණ<br>කොතලාවල, කඩුවෙල |
| ආර්.එම්.ටී.ටී. රත්නායක | - පරිවේණාචාර්ය<br>මහ/විමලධර්ම මහ පිරිවෙණ<br>දංගොල්ල, මහනුවර |
| පී.එල්. ලලිත් අබේසේකර | - ගුරු උපදේශක<br>නුවරඑළිය දිස්ත්‍රික්කය |

**සෝදුපත් කියවීම** :-

| | |
|---|---|
| පූජ්‍ය තණබද්දේගම සෝභිත හිමි | - සම්බන්ධීකරණ පරිපාලන (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**පරිගණකගත කිරීම, පිටු නිර්මාණය සහ පිට කවරය** :-

| | |
|---|---|
| ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ | - පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | |
|---|---|---|
| 01. | වඳිම් මුනි උතුමන් තිලෝගුරු | 01 |
| 02. | මම නමදිම් සදහම් පහදා සිතු | 11 |
| 03. | වඳිම් මහ සඟන මුනි නන්දන | 13 |
| 04. | බුද්ධකාලීන මහා ශ්‍රාවක ශ්‍රාවිකා චරිතාදශී | 16 |
| 05. | සසුන එකලු කළ නූතන යතිවරු | 24 |
| 06. | පරමාදර්ශී උපාසක උපාසිකා චරිත හඳුනා ගනිමු | 34 |
| 07. | සම්බුදු සසුනෙහි ආයුෂය විනයයි | 41 |
| 08. | සසුන්කෙත සරු කරන උපසම්පදාව | 45 |
| 09. | සඟ සසුනේ පාලනය - පැවිදි උපෝසථය | 53 |
| 10. | අමතක වන්නට නොදිය යුතු කරුණු (පඨම සාරාණීය සූත්‍රය) | 62 |
| 11. | තමන් හැදී අනුන් හදන භික්ෂුව (ධම්මඤ්ඤු සූත්‍රය) | 68 |
| 12. | ජංගම නිධානය (නිධිකණ්ඩ සූත්‍රය) | 77 |
| 13. | ගිහියාගේ දියුණුව (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය) | 84 |
| 14. | සිතුවිලි හඳුනා ගැනීම හා අන්‍ය සමාන චෛතසික | 92 |
| 15. | නරක සිතුවිලි | 98 |

| | | | |
|---|---|---|---|
| 16. | හොඳ සිතුවිලි | | 102 |
| 17. | අනුවණයා හා අසත්පුරුෂයා | (බාල වග්ගය) | 109 |
| 18. | නුවණැති සත්පුරුෂයා | (පණ්ඩිත වග්ගය) | 136 |
| 19. | කෙලෙසුන් නැසූ උතුමෝ | (අරහන්ත වග්ගය) | 153 |
| 20. | කමටහන් උගනිමු | (සම සතළිස් කර්මස්ථාන) | 171 |
| 21. | සිත එකඟ කරන හැටි | (සමථ භාවනාව) | 180 |
| 22. | බුදුමග පහන් එළි | | 185 |
| 23. | ලෝකයේ ප්‍රධාන ලක්ෂණ තුන | | 196 |
| 24. | සසර බැඳ තබන බැමි දහය | | 204 |
| 25. | බුදුන් දවස දඹදිව වෙනස | | 211 |
| 26. | සාසන සංවිධාන සමුළු තුන | | 218 |
| 27. | බුදුසසුන රජ හසුන කළ අධිරජ | | 229 |
| 28. | භික්ෂූන් වහන්සේගේ ආගමික මෙහෙවර | | 235 |
| 29. | බුදු දහමින් හැදී වැඩුණු සිංහලය | | 248 |
| 30. | ලොවට වඩන මෙත හා සතට සදන සෙත | | 252 |

01
පාඩම

# වැඳිමි මුනි උතුමන් තිලෝගුරු

බුද්ධ රත්නය, ධර්ම රත්නය සහ සංඝ රත්නය බුද්ධාගමේ උතුම් පූජනීය වස්තූන් ය. ඒවා ත්‍රිවිධ රත්නය, තුනුරුවන් යන නම්වලින් ද හැඳින්වෙයි. මෙහි රත්න යන්න යෙදී ඇත්තේ උතුම් යන අර්ථයටයි. එය සාමාන්‍යයෙන් යෙදෙන්නේ වටිනා වස්තුවලට ය. ඒවාට රත්නයැයි කියන්නේ හේතු පහක් නිසා ය.

**"චිත්තීකතං මහග්ඝං ච - අතුලං දුල්ලභදස්සනං**
**අනොම සත්ත පරිභොගං - රතනං තෙන වුච්චති"**

දැකුම්කළු විසිතුරු බව නිසා ද, මිල කළ නොහැකි තරම් අගනා බැවින් සෙසු දේට සමාන නොවන විශේෂ ලක්ෂණ ඇති බැවින් නිතර දක්නට නැති කලාතුරකින් පහළවන දේ බැවින් හා සාමාන්‍ය පුද්ගලයන් අතර නොව උසස් මට්ටමේ පුද්ගලයන් විසින් පරිහරණය කෙරෙන නිසා ද රත්න යැයි කියනු ලැබේ.

බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ රත්න භාවයට ද මේ කරුණු පහ ම හේතුවේ.

### 01. චිත්තීකතං - විසිතුරු බව

බුදුරජාණන් වහන්සේ ගැන පමණක් සලකන විට උන්වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයකින් හා අසූවක් අනුබ්‍යඤ්ජනවලින් යුතු රූප සෝභාවෙන් විසිතුරු උතුමන් වහන්සේ ය. උන්වහන්සේගේ දේශනා විලාසය මෙන් ම අෂ්ටාංගික බ්‍රහ්මස්වරය ද විසිතුරු ය. එසේ ම ෂඩ් අසාධාරණ ඤාණයන්ගෙන් ද විසිතුරු ය. ධර්ම රත්නය හා සංඝරත්නය ද ඒ බුදුරජාණන් වහන්සේගේ ම විසිතුරු පිළිවෙතට අනුව ම පවතින නිසා විසිතුරු ය. බුදුගුණ නවයෙන් ද දහම් ගුණ හයෙන් සඟ ගුණ නවයෙන් ද කියවෙන්නේ ඒ ඒ රත්නයේ ඇති එම විසිතුරු බව යි.

### 02. මහග්ඝං - ඉතා අගනා බව

**"යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා"** යනාදී ගාථාවෙන් පැවසෙන පරිදි මෙලොව හෝ වෙනත් කවර ලෝකයක හෝ අගනා වස්තුවක්, ධනයක් වේ නම් ඒ කිසිවක් බුදුරජාණන් වහන්සේ තරම් නොවටනේ ය. උන්වහන්සේ රත්නයක් වන්නේ ඒ නිසා ය. මේ ආකාරයට ත්‍රිවිධ රත්නයේ ම අගනා බව රතන සූත්‍රයේ පැහැදිලි කර තිබේ.

## 03. අතුලං - කිසිවකට සමාන නොවන බව

තමන් වහන්සේ විසින් ම සත්‍ය අවබෝධ කරගෙන සියලු කෙලෙසුන් නසා ලෝක සත්ත්වයාට නිවන් මග පෙන්වන සදාකාලික දහමක් දෙසා වදාළ බුදුරජාණන් වහන්සේ වෙන කිසිදු ශාස්තෘවරයෙකුට හෝ දෙවියෙකුට සමාන නොවේ. උන්වහන්සේගේ ධර්මය හා සමාන ධර්මයක් ද ලොව නැත. චතුරාර්ය සත්‍යය, ත්‍රිලක්ෂණය වැනි ධර්ම ඇතුළත් වන්නේ බුදුදහමේ පමණි. ලෝකයේ කොතරම් ආගමික ශ්‍රාවකයන් සිටියත් බුද්ධ ධර්මයෙන් පෝෂණය වී තමනුත් සසරින් මිදී සෙසු ජනතාව ද සසරින් මුදවාලන සුපටිපන්න ආදී ගුණවලින් පරිපූර්ණ වෙන කිසිදු ශ්‍රාවක පිරිසක් ලොව නැත.

## 04. දුලලභ දසසනං - කලාතුරකින් දක්නට ලැබෙන බව

"කලකිනි බුදුකෙනෙකුන් උපදින්නේ" - බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වන්නේ කලාන්තරයකිනි. පසුගිය සාරසංඛ්‍ය කල්ප ලක්ෂයට ම ලොව බුදුරජාණන් වහන්සේලා පහළ වී ඇත්තේ විසි අට නමක් පමණි. ඇතැම් විට කල්ප සිය දහසක් ගණන් බුදුවරුන්ගෙන් තොරව ගත වේ. බුදුවරුන් දැකීම දුර්ලභ වන්නේ මේ නිසා ය. "**සදධමෙමා පරම දුලලභො**" යනුවෙන් සඳහන් වන පරිදි ඉතාම දුර්ලභ දෙය නම් සද්ධර්මය යි. සද්ධර්මය ලොව ඉස්මතු වන්නේ ද සංසරත්නය පහළ වන්නේ ද බුදු කෙනෙකුන් වහන්සේ පහළ වුවහොත් පමණි. ඒ නිසා මෙම රත්නත්‍රය ම දුර්ලභ ය.

## 05. අනොම සතත පරිභොගං - උසස් පුද්ගලයන් විසින් පරිහණය කරනු ලැබීම.

සාමාන්‍යයෙන් රන් රුවන් වැඩිපුර පරිභෝග කරන්නේ සමාජයේ රජවරුන් සිටුවරුන් හෝ ධනවත් බලවත් අය යි. සමාන්‍ය දුගී දුප්පතුන් නොවේ. එසේ ම තුනුරුවන් ඇසුරු කරන්නේ ද ශ්‍රද්ධාව සීලය වැනි උසස් ගුණවලින් යුක්ත අයයි. පාපයේ ඇලී ගැලී සිටින්නෝ තෙරුවන් ඇසුරට බොහෝ විට නොපැමිණෙති.

### බුදුගුණ

> **"ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"**

ඒ භාග්‍යවතුන් වහන්සේ රහසින්වත් පවු නොකිරීම ආදී කාරණා නිසා **අරහං** වන සේක. චතුරාර්ය සත්‍යය තමන් වහන්සේ විසින් ම අවබෝධ කිරීම ආදී කාරණා නිසා **සම්මා සම්බුද්ධ** වන සේක. අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්ත හෙයින් **විජ්ජාචරණ සම්පන්න** වන සේක. සුන්දර වූ නිවනට පැමිණීම යනාදී කාරණා නිසා සුගත වන සේක. සත්වලෝක, සංස්කාර ලෝක, අවකාශ ලෝක යන සියලු ලෝකයන් මැනවින් දැන වදාළ හෙයින් **ලෝකවිදූ** වන සේක. දමනය කළ යුතු සත්වයන් දමනය කිරීමෙහි උතුම් ආචාර්යවරයන් වන බැවින් **අනුත්තර පුරිසදම්ම සාරථී** වන සේක. සියලු දෙවි

මිනිසුන්ට ශාස්තෘෘ හෙවත් මග කියාදෙන උතුමන් බැවින් **සත්ථා දේවමනුස්සානං** වන සේක. දතයුතු තාක් සියලු දේ අවබෝධ කොට අනුන්ට දෙසා වදාළ බැවින් **බුද්ධ** වන සේක. භාග්‍යසම්පන්නය යනාදී කාරණාවලින් **භගවා** වන සේක.

**අරහං බුදුගුණය**

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කාරණා පහක් නිසා අරහං වන සේක. එනම්,

> **"ආරකත්තා හතත්තා ච - කිලෙසාරීන සො මුනි**
> **හතසංසාර චක්කාරො - පච්චයාදීන චා රහො**
> **න රහො කරොති පාපානි - අරහං තෙන වුච්චති"**

කෙනෙකු පිළිකුල් සහගත දේකින්, බියකරු තැනකින් ඈත්වන්නා සේ බුදුරදුන් කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් අරහං වන සේක. සතුරන් නසන රණ ශූරයෙකු සේ තමා තුළ ම වූ කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද සංසාර චක්‍රයේ ගරාදි හෙවත් පටිච්චසමුප්පාදයේ එන අවිද්‍යාදී ධර්ම සිඳලූ හෙයින් ද සියලු පූජාවන් ලැබීමට සුදුසු උතුම් ම පූජනීයයන් වහන්සේ වූ හෙයින් ද සිතින් කයින් හෝ වචනයෙන් රහසින්වත් පව් නොකරන හෙයින් ද අරහං වන සේක.

> **''රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරුකොට**
> **නිසි වූයෙන් පුදට - අරහ යැයි නම කියති මුනිඳුට''**
> **(බුදුගුණ අලංකාරය)**

**සම්මා සම්බුද්ධ ගුණය**

බුදුරජාණන් වහන්සේ සියලු ලෝකයේ දතයුතු තාක් සියලු ධර්මයන් වැරදීමකින් තොරව මැනවින් වෙනත් කෙනෙකුගේ උපදේශයක් ද නැතිව තමන් වහන්සේ ම අවබෝධකර වදාළ හෙයින් සම්මා සම්බුද්ධ වන සේක.

ලෝකයේ සත්‍යය අවබෝධ කරන කෙනෙකු විසින් දතයුතු දේ තුන් ආකාර ය. එනම් **අභිඤ්ඤෙය්‍ය** ධර්ම හෙවත් විශේෂ ඥාණයෙන් දතයුතු, හැම අතින් ම විමසා බලා දතයුතු චතුරාර්ය සත්‍ය ධර්මයත් **පහාතබ්බ** ධර්ම හෙවත් දුරුකළ යුතු අකුසල ධර්ම හා සමුදය සත්‍යය හෙවත් තෘෂ්ණාව'ත් **"භාවෙතබ්බ"** හෙවත් වැඩිය යුතු ආර්ය අෂ්ටාංගික මාර්ගයත් ය.

> **"අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං - භාවෙතබ්බං ච භාවිතං**
> **පහාතබ්බං පහීනං මෙ - තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ"**
> **(සේල සූත්‍රය)**

එසේ විශේෂ නුවණින් දතයුතු දේ දැන වදාළ හෙයින් ද වැඩිය යුතු ධර්ම වැඩූ හෙයින් ද දුරු කළයුතු ධර්ම දුරුකර වදාළ හෙයින් ද බුද්ධ වෙමියි, බුදුරජාණන් වහන්සේ ම වදාරා තිබේ. තමන් වහන්සේ ම සත්‍යාවබෝධ කරන බුදුවරු දෙනමකි. එනම් සම්මා සම්බුදු රජාණන් වහන්සේත්, පසේ බුදු රජාණන් වහන්සේත් ය. ඒ අතුරින් පසේ බුදුරජාණන් වහන්සේ දතයුතුතාක් සියලු දේ දැනගන්නා සර්වඥතාඥාණයෙන් යුක්ත නොවෙති. උන්වහන්සේට ඇත්තේ චතුරාර්ය සත්‍ය පිළිබඳ ඥාණය පමණි.

"තුන්කල්හි ම පැවති - පදරුත් සියල් ලොව ඇති
අතැඹුල සෙ දැන ගති - එයින් සම්මා සම්බුදුන යෙති"
(බුදුගුණ අලංකාරය)

**විජ්ජාචරණ බුදුගුණය**

බුදුරජාණන් වහන්සේ විද්‍යා හෙවත් මහා ඥාණසම්පත්තියකින් යුක්ත වූ හෙයින් ද ලෝක සත්ත්වයා කෙරෙහි මහාකරුණාවෙන් පිළිපන් ප්‍රතිපත්ති හෙවත් චරණ ධර්ම පහළොවකින් සමන්විත වූ හෙයින් ද විජ්ජාචරණ සම්පන්න වන සේක.

විද්‍යාවන් ධර්මයේ දෙයාකාරයකින් දක් වේ. එනම් ත්‍රිවිද්‍යාව හා අෂ්ටවිද්‍යාව යි.

**ත්‍රිවිද්‍යාව නම්,**

**පුබ්බේනිවාසානුස්සති ඥාණය**
තමා පෙර සසර ගත කළ කඳ පිළිවෙල හෙවත් ජීවිත පරම්පරාව දැකීමේ නුවණ

**දිබ්බ චක්ඛු ඥාණය**
ලෝක සත්ත්වයන් සසර උපදින මැරෙන, සැප දුක් විඳින, පව් පින් කරන ආකාරය දැකීමේ නුවණ යි. මෙය චුතුපපාත ඥාණය යනුවෙන් ද හැඳින් වේ.

**ආසවක්ඛය ඥාණය**
සියලු කෙලෙසුන් නසා දැමීමේ නුවණ යි. එනම් අරහත් මාර්ගඥාණය යි.

**අෂ්ටවිද්‍යා**

"විපස්සනා ඥාණ මනොමයිද්ධි
ඉද්ධිප්පභෙදාපි ච දිබ්බසොතං
පරස්ස චෙතොපරියාය ඥාණං
පුබ්බෙනිවාසානුගතං ච ඥාණං
දිබ්බං ච චක්ඛාසව සංඛයං ච
එතානි ඥාණානි ඉධට්ඨවිජ්ජා"

විදර්ශනා ඥාණය, මනෝමය ඉද්ධි ඥාණය, ඉද්ධිවිධ ඥාණය, දිබ්බසෝත ඥාණය, පරචිත්ත විජානන ඥාණය, පුබ්බේ නිවාසානුස්සති ඥාණය, දිබ්බ චක්ඛු ඥාණය හා ආසවක්ඛය ඥාණය යනු අෂ්ටවිද්‍යාව යි.

## චරණ ධර්ම

චරණ යනු පිළිපැදීම හෝ හැසිරීමයි. විද්‍යා ඥාන අවබෝධ කිරීමෙන් සර්වඥ බවට පත් බුදුරජාණන් වහන්සේ මුළු ලෝක සත්ත්වයා කෙරෙහි මහාකරුණාවෙන් මුළු දිවිය ම සේවය සඳහා කැප කළ හ. ඒ ඥාණ ලබා සම්බුද්ධත්වයට පත්වීමටත් සේවය කිරීමටත් උපකාර වූ ධර්ම චරණ ධර්ම නම් වෙයි.

## පසළොස් චරණ ධර්ම

"සීලං වරං ඉන්‍ද්‍රිය සංවරො ච
මත්තඤ්ඤුතා ජාගරියානුයොගො
සද්ධා හිරොත්තප්ප බාහුසච්චං
පරක්කමො චෙව සතී මතී ච
චතුක්ඛ ඣානානි ච තානි මානි
තිපඤ්ච ධම්මා චරණානි ජඤ්ඤා"

සීලය, ඉන්ද්‍රිය සංවරය, ආහාරයෙහි පමණ දැනීම, නිතර අවදියෙන් සිටීම, ශ්‍රද්ධාව, ලැජ්ජා භය, බහුශ්‍රැතභාවය, වීර්යය, සිහිය, ප්‍රඥාව, ප්‍රථමධ්‍යාන, ද්වීතියධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන යන මේ ධර්ම පසළොව බුද්ධ ජීවිතයේ අනුපමේය බුද්ධත්වය හා මෙහෙවර සඳහා උපකාර වූ ධර්ම වන හෙයින් චරණ ධර්ම නම් වෙයි.

"විද්දෑ නැණ අට ද - පසළොස් චරණ ගුණය ද
ඇතියෙන් එ මුනි සඳ - පිරුණු විජ්ජාචරණ නම් ලද"
(බුදුගුණ අලංකාරය)

### සුගත බුදුගුණය

බුදුරජාණන් වහන්සේගේ සුගත ගුණය දෙයාකාරයකින් විස්තර කෙරෙයි.

01.
සුගත යන මෙහි "ගත" යනු ගමන යි. භාග්‍යවතුන් වහන්සේ සෝභන ගමන් ඇති බැවින් ද සුන්දර තැනට සැපමිණි බැවින් ද මනාකොට ගිය බැවින් ද සුගත නම් වෙති. සෝභන ගමන නම් ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. එය මෙලොව ඇති දුකින් මිදීම කරා යන සැබෑ සුන්දර ම මාර්ගය යි. ඒ මග ගමන් කළ හෙයින් සුගත නම් වන සේක.

එසේම සුන්දර තැන නම් නිර්වාණය යි. භවයේ උපදින තාක් කල් ඇත්තේ දුක ම ය. එය අසුන්දර ය. නිවන යනු නැවත නූපදීම වන බැවින් දුකෙන් තොර ය. එහෙයින් සුන්දර ය. භාග්‍යවතුන් වහන්සේ එතැනට වැඩි බැවින් ද සුගත වන සේක. එසේ ම ඒ ගමන සෝවාන් ආදී මාර්ගයන්ගෙන් සියලු ක්ලේශයන් ප්‍රහීණ කරමින් නැවත ඒ කෙලෙස්වලට නොවැටී පිරිසිදුව ම ගමන් කළ හෙයින් ද සුගත වන සේක.

02.

සුගද - ඉතා යහපත්, නිවැරදි, ප්‍රිය තෙපුල් වදාරණ හෙයින් ද උන්වහන්සේ සුගත වන සේක. බුදුරජාණන් වහන්සේ කිසිදා සිදු නොවූ අසත්‍ය අනර්ථකාරී අප්‍රිය වචන කතා නොකරති. ඒ බව මජ්ඣිම නිකායේ අභය රාජකුමාර සූත්‍රයේ මැනවින් පැහැදිලි කර තිබේ. උන්වහන්සේ දේශනා කළ ධර්මය ද **සාත්‍ථං** - අර්ථ සහිතය, **සබ්‍යඤ්ජනං** - මනා පද වාක්‍ය ගැලපීමෙන් යුක්ත ය. **කෙවලපරිපුණ්ණං** - හැම අතින් ම සම්පූර්ණ ය. එනිසා ද උන්වහන්සේ සුගත වන සේක.

> **"යහපත් කොට යෙතැයි - සුන්දර තැනට සැපතැයි**
> **සොඳුරු බස් කියතැයි - කියති ඒ මුනි රජුට සුගතැයි"**
>
> (බුදුගුණ අලංකාරය)

**ලෝකවිදූ බුදුගුණය**

භාග්‍යවතුන් වහන්සේ සර්වප්‍රකාරයෙන් ම ලෝකය ගැන දැන වදාළ සේක. ලෝකය සත්ත්ව ලෝක, සංස්කාර ලෝක, අවකාශ ලෝක යනුවෙන් ත්‍රිවිධ වේ.

01.

සත්ව ලෝකය - භාග්‍යවතුන් වහන්සේ සියලු සත්ත්වයන්ගේ ආසය හෙවත් උපදින තැන්, අනුසය හෙවත් සත්ත්ව සන්තානයෙහි නිදන්ගතව ඇති ක්ලේශ ධර්මයන් කවරේ ද යන්නත් චරිත වශයෙන් සුචරිත දුශ්චරිත සහ රාග, ද්වේශ, මෝහ, ශ්‍රද්ධා, විතක්ක, බුද්ධි යන චරිත ලක්ෂණත් අධිමුත්ති හෙවත් අවබෝධ කිරීමේ ශක්තිය කෙතරම් ද යන්නත් එසේම කෙලෙස් අඩුවැඩි බව ආදී සියලු සත්ව ලක්ෂණ දැන වදාළ සේක.

සංස්කාර ලෝකය - නම් ලෝකය සකස් වී ඇති ආකාරය යි. උන්වහන්සේ එය මැනවින් දන්නා සේක. එනම්, සියලු සත්ත්වයන් හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා බව, නාම රූප භේදය, ත්‍රිවිධ වේදනා, සතර ආහාර, පඤ්ච උපාදානස්කන්ධ, ෂඩායතන, අෂ්ටලෝක ධර්මය, නවසත්තාවාස, යනාදී මේ ලෝකයේ සකස් වීම හා පැවැත්ම පිළිබඳ ඤාණය සංස්කාර ලෝකය පිළිබඳ ඤාණය යැයි කියනු ලැබේ.

02.

අවකාශ ලෝකය - මහා පෘථිවිය ඉර මඩල, සඳ මඩල, අච්ච, වැස්ස, සුළඟ, ගංගා ඇළ, දොළ, සාගර ආදී ලෝක ධාතුත් කාම රූප අරූප ලෝකත් අවකාශ ලෝකයට ගැනේ. මේ ත්‍රිවිධාකාර වූ ලෝකය පිළිබඳ ඤාණයෙන් බුදුරජාණන් වහන්සේ යුක්ත වූ හෙයින් ලෝකවිදූ වන සේක.

''තුන්ලොව තතු ලෙසට - දැනගෙන නොදත් මෙලොවට
දෙසුයෙන් නියම කොට - ලෝකවිදූ යයි කියති මුනිඳුට''
(බුදුගුණ අලංකාරය)

**අනුත්තරෝපුරිසදම්ම සාරථී බුදුගුණය**

**"පුරිසදම්මෙ සාරෙතීති පුරිසදම්ම සාරථී"** දමනය කළ යුතු පුද්ගලයන් මෙහෙයවයි. දමනය කරයි, හික්මවයි යන අර්ථයෙන් පුරිසදම්ම සාරථී වන සේක. මෙහි පුරිස යන්න යෙදී ඇත්තේ ස්ත්‍රී පුරුෂ භේදයක් දෙව් මිනිස් තිරිසන් භේදයක් හෝ නැතිව පුද්ගලයන් යන අර්ථයෙනි. ඒ අනුව උන්වහන්සේ නාලාගිරි නම් හස්ති රාජයා ද චූලෝදර මහෝදර වැනි දිව්‍ය නාගයන් ද බක වැනි බ්‍රහ්මයන් ද රාහු වැනි අසුරයන් ද සක්දෙව් රජ ඇතුළු නොයෙකුත් දෙවියන් ද ආලවක වැනි යක්ෂයන් ද චිඤ්චිමානවිකා වැනි කාන්තාවන් ද සච්චක අම්බට්ඨ වැනි බමුණන් ද දමනය කළ සේක. මේ සියලු ම දමනයන්ගෙන් ප්‍රකටවන්නේ පුරිසදම්ම සාරථී ගුණයයි.

උන්වහන්සේ පුද්ගලයන් දමනය කරන ආකාරය විස්තර කරමින් අංගුත්තර නිකාය චතුක්ක නිපාතයේ කේසී සූත්‍රයේ දී **"අහං ඛො කෙසී පුරිසදම්මං සණ්හෙනපි විනෙමි, ඵරුසෙනපි විනෙමි, සණ්හඵරුසෙනපි විනෙමි"** යනාදී වශයෙන් තමන් වහන්සේ දමනය කළ යුතු පුද්ගලයන්ගෙන් ඇතමෙකු මෘදු පිළිවෙතින් ද ඇතමෙකු රළු පිළිවෙතින් ද ඇතමෙකු දෙයාකාරයෙන් ම ද හික්මවන බව වදාරා තිබේ. මෙහි මෘදු පිළිවෙත යනු සුචරිතය සහ සුචරිතයෙන් ලැබෙන විපාක කියා දීමයි. රළු පිළිවෙත යනු දුශ්චරිතය සහ දුශ්චරිතයෙන් වන විපාක ගැන කියාදීම යි. ඇතැම් පුද්ගලයන් මේ දෙයාකාරයෙන් ම හික්මවන්නට සිදු වීම තුන්වෙනි පියවරයි. හතරවෙනි පියවරක් ද ඇත, එනම් ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය පැණවීම මෙන් අවවාද අනුශාසනා කිරීමෙන් වැළකීමයි.

මේ ගුණය අනුත්තරෝ - පුරිසදම්ම සාරථී යනුවෙන් ගුණ දෙකක් ලෙස පිළිගන්නා සම්ප්‍රදායක් ද තිබේ. විසුද්ධි මාර්ගයේ දී අනුත්තරෝ යනු තථාගතයන් වහන්සේට වඩා උතුම් කෙනෙක් නැත යන අර්ථයෙන් ද පුරිස දම්ම සාරථී යනු පුරුෂයන් දමනය කිරීමේ උතුම් ආචාර්යයන් යන අර්ථයෙන් ද ගුණ වෙන වෙන ම දක්වා, නැවත පුද්ගලයන් දමනය කිරීමෙහි උන්වහන්සේ තරම් උතුම් කෙනෙක් නැත යන අර්ථයෙන් එක ගුණයක් ලෙස ද දක්වා තිබේ. බුදුගුණ අලංකාරයේ දී මේ දෙක වෙන වෙන ගුණයන් ලෙස දක්වා තිබේ. එවිට බුදුගුණ දහයක් වේ. පොදු පිළිගැනීම නම් බුදුගුණ නවයක් බවයි. එහි දී මේ දෙක එක ගුණයක් සේ ගත යුතුයි.

''බඹසුර යකුන් තද - දමනය කර තමන් ලද
සෙත් දී මුනිඳු සඳ - පුරිසදම්සාරතී නම් ලද''
(බුදුගුණ අලංකාරය)

**සත්ථා දේවමනුස්සානං බුදුගුණය**

බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ට ශාස්තෲ වන සේක. ශාස්තෲ යනු අනුසාසනා කරන්නා ය. බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ට දිට්ඨධම්මික හෙවත් මෙලොව දියුණුවට ද සම්පරායික හෙවත් පරලොව දියුණුවට ද පරමත්ථ හෙවත් නිර්වාණය පිණිස ද අනුශාසනා කරන හෙයින් (සත්ථා) ශාස්තෘ වන සේක. සත්ථ (සාර්ථ) යනු ගැල් සියගණනින් යුක්ත ගැල් සාත්තුවකට තවලමකට කියන නමකි. අතීතයේ එබඳු ගැල් කණ්ඩායම් රැගෙන කාන්තාරවලින්, මහා වනාන්තර අතරින් තරණය කිරීමේ දී ඒවාට මඟපෙන්වන ගැල් නායකයා, සාත්තු නායකයා සත්ථා යනුවෙන් හඳුන්වන ලදී. එසේ ම බුදුරජාණන් වහන්සේත් සත්වයන් සසර කතරින් එතෙර කරවන හෙයින් සත්ථා නම් වන සේක.

වෙනත් ශාස්තෘන් වහන්සේලා අතර බුදුරජාණන් වහන්සේ විශේෂ වන්නේ කවර කරුණුවලින් දැයි අංගුත්තර නිකායේ පංචක නිපාතයේ කකුධ සූත්‍රයේ මෙසේ සඳහන් වෙයි. "මොග්ගල්ලානය, මේ ලෝකයේ අපිරිසිදු සීල ඇති අපිරිසිදු ජීවිකා ඇති අපිරිසිදු ධර්ම දේශනා ඇති අපිරිසිදු විවරණ ඇති අපිරිසිදු ඤාණ දර්ශන ඇති ශාස්තෘවරු වෙති. ඔවුහු තමන් එම කරුණුවලින් පිරිසිදු අය සේ පෙනී සිටිති. එහෙත් මම පිරිසිදු සීල ඇතිව ම පිරිසිදු ජීවිකා ඇතිව ම පිරිසිදු ධර්ම දේශනා ඇතිව ම පිරිසිදු විවරණ කිරීම් ඇතිව ම පිරිසිදු ඤාණ දර්ශන ඇතිව ම එම කරුණුවලින් මා පිරිසිදු බව පවසමි. ඒ අපිරිසිදු ශාස්තෘවරු එම කරුණුවලින් ශ්‍රාවකයන් තමා බේරාගනු ඇතැයි බලාපොරොත්තු වෙති. මගේ ශ්‍රාවකයන් මේ කිසිම කරුණකින් මා නොරකිති. මම ඔවුන්ගෙන් එබඳු රැකවරණයක් බලාපොරොත්තු නොවෙමි. මන්ද ඒ හැම කරුණින් ම මා පිරිසිදුව සිටින බැවිනි.''

''බව කතරින් එතෙර - ලනුයෙන් සතන් හැම වර
තිලෝගුරු මුනිවර - වීය සත්තා නමින් පුවතර''

(බුදුගුණ අලංකාරය)

**බුද්ධො බුදුගුණය**

**"බුජ්ඣිතා සච්චානීති බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො, සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බ දස්සාවිතාය බුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො"** යනාදී වශයෙන් පටිසම්භිදා මග්ගයෙහි හා නිද්දේස පාලියෙහි සඳහන් වන පරිදි බුදුරජාණන් වහන්සේ චතුස්සත්‍යය අවබෝධ කළ බැවින් ද අන්‍යයන්ට අවබෝධ කර වූ බැවින් ද සියල්ල දන්නා බැවින් ද සියල්ල දක්නා බැවින් ද අනෙකෙකු විසින් අවබෝධ නොකරවන ලදුව තමන් ම අවබෝධ කළ බැවින් ද බුද්ධ වෙති.

බුදුගුණ අතර සම්මා සම්බුද්ධ සහ බුද්ධ යැයි ගුණ දෙකකි. චතුස්සත්‍ය අවබෝධ කළ අර්ථය මේ ගුණ දෙකට ම පොදු ය. ගුණ දෙක අතර වෙනස තිබෙන්නේ සම්මා සම්බුද්ධ යනු තමන් වහන්සේ විසින් ම ඉතිරි නොකොට ලෝ තතු සහමුලින් ම අවබෝධ කිරීමයි. එයින් උන්වහන්සේගේ සර්වඥ බව හෙවත් විශිෂ්ට අවබෝධය ප්‍රකාශ වෙයි.

එයට **අවබෝධඤාණය** යැයි කියනු ලැබේ. බුද්ධ යන්නෙන් සම්මා සම්බුද්ධ ගුණයෙන් නොකියවුණු විශේෂත්වය නම් තමන් අබෝධ කරගත් සත්‍ය ධර්මය සත්ත්වයන්ගේ ආසයානුසය ආදී කාරණා සලකා සියල්ලන්ට අවබෝධ කරලීමේ සමර්ථ භාවය යි. එය **දේශනා ඤාණය** යැයි හඳුන්වනු ලැබේ.

චතුස්සත්‍යාවබෝධ කිරීම යන අර්ථයෙන් සම්මා සම්බුදුරජාණන් වහන්සේත් පසේ බුදුරජාණන් වහන්සේත් ශ්‍රාවක රහතන් වහන්සේත් බුද්ධ යන ගුණයට ගැනේ. එහි දී විශේෂත්වය ශ්‍රාවක රහතන් වහන්සේ චතුස්සත්‍යාවබෝධය කිරීමෙන් බුද්ධ වුවත් අනුන් වෙතින් අවබෝධ කරගන්නා නිසා සම්මා සම්බුදුරජාණන් වහන්සේට සමාන නොවෙති. පසේබුදු රජාණන් වහන්සේ තමන් වහන්සේ ම චතුස්සත්‍යාවබෝධය කිරීමෙන් සම්මා සම්බුදුරජාණන් වහන්සේට සමාන වුවත් ලෝකයේ සියලු තතු අවබෝධ කිරීමේ සර්වඥතා ඤාණයෙන් ද බුද්ධො ගුණයෙන් කියවුණු පරිදි අන්‍යයන්ට අවබෝධ කරවීමේ දේශනා ඤාණයෙන් ද තොර බැවින් සම්මා සම්බුදුරජාණන් වහන්සේට සමාන නොවෙති.

**භගවා බුදුගුණය**

භගවත් යනු ශ්‍රේෂ්ඨ උතුම් යන අර්ථය දෙන ගුණ නාමයකි.

> **"භගවාති වචනං සෙට්ඨං**
> **භගවාති වචන මුත්තමං**
> **ගරු ගාරව යුත්තො සො**
> **භගවා තෙන වුච්චති"**
> **(විසුද්ධි මාර්ගය)**

භගවත් යනු ශ්‍රේෂ්ඨ නාමයකි, භගවත් යන නාමය උතුම් ය, තථාගතයන් වහන්සේ ගුරුවරයා ය ගෞරවයෙන් යුක්ත ය. එහෙයින් උන්වහන්සේ භගවත් යැයි කියනු ලැබේ.

> **"භාග්‍යවා භග්ගවා යුත්තො - භගෙහි ච විභත්තවා**
> **භත්තවා වන්තගමනො - භවෙසු භගවා තතො"**

**භාග්‍යවා**

බුදුරජාණන් වහන්සේ දස පාරමිතා ආදී කුසල පුණ්‍යභාග්‍යයෙන් යුක්ත හෙයින් භගවා නම් වෙති. ''භග්ගවා'' - සියදහස් ගණන් කෙලෙසුන් බින්ද හෙයින් භගවා නම් වෙති. භගෙහියුත්තො - ඓශ්වර්යය හෙවත් ඊශ්වර භාවය අධිපති භාවය. ධර්ම හෙවත් ලෝකෝත්තර ධර්මය. යසශ් හෙවත් තුන්ලොව පතළ කීර්තිය. ශ්‍රී හෙවත් මහා පුරුෂ ලක්ෂණාදියෙන් සපිරි රූප සෝභාව. කාම හෙවත් සිතු පැතු ආකාරයෙන් තම යහපත හෝ අනුන්ගේ යහපත සිදු වීම ය. ප්‍රයත්න හෙවත් ලෝකයාගේ ගෞරවය ලැබිය යුතු තරම් වූ වීර්යයෙන් යුක්ත බව ය යන භග ධර්ම හයෙන් යුක්ත බැවින් ද භගවත් නම් වෙති.

**විභත්තවා**

සියලු ධර්ම ස්කන්ධ ධාතු ආයතනාදී වශයෙන් බෙදා දක්වන විභජ්ජවාදී වන හෙයින් භගවත් නම් වෙති. භත්තවා - දිව්‍ය විහාර හෙවත් ධ්‍යාන ය, මෛත්‍රී කරුණාදී බ්‍රහ්ම විහාර ය, සෝවාන් ආදී ඵල සමාපත්ති නම් වූ ආර්ය විහාර ය යන මේ ත්‍රිවිධ විහරණයන් භජනය කළ හෙයින් ද භගවත් නම් වෙති. භවෙසු වන්තගමනො - භව ගමන සිදුකරන තෘෂ්ණාව වමාරා දැමූ හෙයින් ද භගවත් නම් වෙති.

> **බෙදුයෙන් දහම් කඳ - බජනය කෙළෙන් ගුණ කඳ**
> **බග දහමින් සසඳ - බැවින් බගවත් වී ය මුනි සඳ**
>
> **(බුදුගුණ අලංකාරය)**

ධර්මය බෙදා දැක් වූ බැවින් ද අනූන ගුණයෙන් යුතු බැවින් ද භාග්‍යධර්මයෙන් යුක්ත බැවින් ද මුනීන්ද්‍රයන් වහන්සේ භගවා නම් වූ හ.

බුදුගුණ නවයක් පමණක් ම නොවේ. බුදු කෙනෙකුන්ටවත් කියා නිම කළ නොහැකි තරම් ය. අනන්ත ය. ලොව ඇති යහගුණ මෙපමණයයි කිසිවෙකුට ගණනින් කිව නොහැකි ය. ඒ සියලු යහගුණ එක් පුද්ගලයෙකු වෙත පිහිටියේ නම් ඒ බුදුරජාණන් වහන්සේ ය. ගණන් කළ නොහැකි ජලය පත, කෝප්ප, වීදුරු, බෝතල, ලීටර, ගැලුම්, වැව්, මුහුදු වශයෙන් අන්තර්ගත භාජන වශයෙන් ගණන් කරන්නා සේ අපරිමිත බුදුගුණ ගණන් කිරීමේ පහසුව සඳහා අරහං ආදී බුදුගුණ නවයකැයි දක්වනු ලැබේ. මේ එක් ගුණයක ගුණ දහස් ගණනක් අඩංගු ය.

මේ අනන්ත බුදුගුණ මෙනෙහි කිරීම බුද්ධානුස්තියයි. බුද්ධානුස්සතිය වැඩීමෙන් ශ්‍රද්ධාව වැඩෙන්නේ ය.

**අභ්‍යාස**

01. අෂ්ට විද්‍යා හා පසළොස් චරණ ධර්ම සොයා ලියන්න.
02. ඔබ කැමැති බුදුගුණයක් ඇසුරුකරමින් පන්තිය ඉදිරියේ ධම්ම චින්තාවක් ඉදිරිපත් කරන්න.
03. බුදුගුණ ඇතුළත් බුදුගුණ අලංකාරයේ කවි පාඩම් කරන්න.

02
පාඩම

# මම නමදිමි සදහම් පහදා සිතු

"ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො
ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි"

ශ්‍රී සද්ධර්මය තථාගතයන් වහන්සේ විසින් මනා කොට දේශනා කරන ලද බැවින් ස්වාක්ඛාත ය, ඒ සද්ධර්මයෙන් දේශනා කෙරෙන අර්ථය තමා විසින් ම දැක්ක යුතු බැවින් සන්දිට්ඨික ය. සද්ධර්මය අනුගමනය කිරීමෙන් ලැබෙන සෝවාන් ආදී සතර මාර්ග කල් නොයවා පල දෙන බැවින් අකාලික ය. සතර මග, සතර ඵල, නිවන යන නව ලෝකෝත්තර ධර්මය එන්න, බලන්න කියා දැක්විය හැකි, සැඟවුණු කාරණයක් නොවන බැවින් එහිපස්සික ය. සෝවාන් ආදී නව ලෝකෝත්තර ධර්ම තම සිත තුළ ම එළවා ගත යුතු, උපදවාගත යුතු බැවින් හෝ ඕපනයික ය. ඥාණවන්තයන් විසින් නව ලොව්තුරා දහම තම තමන් ම අවබෝධ කර ගත යුතු හෙයින් **පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි** ය.

## සන්දිට්ඨිකො

සෝවාන් ආදී ආර්ය මාර්ගයෙන් සිදුවන්නේ තමාගේ සන්තානයේ ඇති කෙලෙස් සංසිඳුවීම ය. එසේ කෙලෙසුන් සංසිඳෙන සංසිඳෙන තරමට එහි සුවය දැනෙන්නේ ද තමාට ම ය. එහෙයින් ආර්ය මාර්ගය සන්දිට්ඨික ය. එසේ ම නවලොව්තුරා දහම ද අනුන් කෙරෙහි විශ්වාසයෙන් ගොස් ලබා ගත හැක්කක් නොවේ. තමාගේ ම ඥාණයෙන් අවබෝධ කර ගත යුත්තකි. එහෙයින් ද සන්දිට්ඨික නම් වෙයි. තව ද ලෝකයේ නොයෙකුත් ආගම් ඇත. දෙවියන් ඇත. ඔවුන් කියන විමුක්ති ඇත. දිව්‍ය ලෝක ඇත. එහෙත් ඒ කිසිවෙකු හෝ ඒ කිසිවක් තමාට දැක්ක නොහැකි ය. එහෙත් මේ තථාගත ධර්මයෙන් පෙන්වන මාර්ගය සහ නිර්වාණ ඵලය තමාට මෙලොව දී ම අත්දැකිය හැක්කකි. රහතන් වහන්සේ නමක් පිරිනිවන් පාන්නේ ඒ අත්දැකීම මෙලොව දී ම ලබා ගෙන ය.  එහෙයින් තමාට ම මෙහිදී ම අත්දැකිය හැකි බැවින් මේ ධර්මය **සන්දිට්ඨික** ය.

## අකාලිකො

සෙසු කුසල කර්ම මෙන් ම අකුසල කර්ම ද සැමවිට එවලේ ම විපාක දෙන්නේ නැත. **"නහි පාපං කතං කම්මං - සජ්ජු ඛීරං ව මුච්චති"** යනුවෙන් පැවසෙන පරිදි පාපකර්මයක් වුව ද කිරි මිදෙන්නා වැනි ය. එවෙලේ නොමිදේ, පල නොදේ. දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය යන කවර ලෙසකින් වුව ද විපාක දෙන්නේ පසුව ය. එහෙත් සෝවාන් ආදී සතර මාර්ගවලට පත්වීමත් සමග ම ඵලය ද ලැබේ. එහෙයින් මේ ධර්මය **අකාලික** ය.

### එහිපස්සිකො

අංගුත්තර නිකායේ තික නිපාතයේ හරණ්ඩු වර්ගයේ දී වැසී ආවරණය වී තිබීම නිසා රැකෙන කාරණා තුනක් කියැ වේ. එනම් කාන්තාවත් බ්‍රාහ්මණයන්ගේ මන්ත්‍ර සහ මිථ්‍යාදෘෂ්ටියත් ය. ඒ නිසා ලෝකයේ කිසි ම ආගමක් එන්න බලන්න යැයි විවෘතව කීමට සමත් නොවේ. ආවරණය නොවී විවෘතව තිබුණු තරමට බැබලෙන කාරණා තුනක් ද එම සූත්‍රයේ සඳහන්ව ඇත. එනම්, ඉරමඬලත්, සඳමඬලත්, තථාගත ධර්මයත් ය. **"තථාගතප්පවෙදිතො ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"** යනුවෙන් ඒ බව පැවසේ. එසේ ම බුදුරජාණන් වහන්සේ ධර්මය හඳුන්වා දෙන්නේ **"ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං"** මුල මැද අග යහපත් ය, අර්ථවත් ය, මනා නිවැරදි භාෂාවෙන් යුක්ත ය, හැම අතින් ම පරිපූර්ණ ය, පිරිසිදු ය යනුවෙනි. එන්න බලන්න යැයි විවෘතව කිව හැක්කේ ඒ නිසා ය. එසේ කිව හැකි ලොව ඇති එකම ධර්මය බුද්ධ ධර්මය යි.

### ඔපනයිකො

**උපනය+ඉක - ඔපනයික** - උපනය යනු එළවාගත යුතු පමුණුවාගත යුතු යන අදහස දෙයි. සෝවාන් ආදී මාර්ග ඵල ධර්ම භාවනා වශයෙන් වැඩීමෙන් තම සිතට පමුණුවා ගත යුතු වන බැවින් ඔපනයික නම්. එසේ ම මෙම මාර්ග ඵල ධර්ම ප්‍රත්‍යක්ෂ කිරීමෙන් ම නිර්වාණයට පමුණුවන බැවින් ද නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන බැවින් ද ඔපනයික යැයි කියනු ලැබේ.

### පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි

මෙම මාර්ග ඵල ඔස්සේ නිවන් අවබෝධය අනිකෙකු ලවා කරවිය නොහැකි ය. තමා ම ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් ම අවබෝධ කළ යුතු ය. එය ද සම්මා දිට්ඨි සම්මා සංකප්ප වශයෙන් ඥාණය ඇති කෙනෙකු විසින් ම මිස ඒ නුවණ නැතියෙකුට අවබෝධ කළ නොහැකි ය. ආචාර්ය උපාධ්‍යායන් වහන්සේ හෝ වෙනත් කෙනෙකු භාවනා වැඩීමෙන් ශිෂ්‍යයාට (අතවැසියාට) මාර්ගඵලාවබෝධය සිදු නොවේ. ඒ ඒ පුද්ගලයා තම තමන්ගේ ශ්‍රද්ධා වීර්ය සති සමාධි ප්‍රඥා ධර්මයන්ගේ ප්‍රමාණය අනුව තමා විසින් ම අවබෝධ කළ යුත්තේ ය. අත්දැකිය යුත්තේ ය. එහෙයින් සද්ධර්මය **විඤ්ඤූහි පච්චත්තං වෙදිතබ්බො** හෙවත් ඥාණවන්තයින් විසින් වෙන වෙන ම තම තමා ම අවබෝධ කළ යුත්තකැයි කියනු ලැබේ.

**අභ්‍යාස**

01. ධර්ම රත්නයේ ගුණ පිළිබඳ කියවෙන කවි කට පාඩම් කරගන්න.
02. ඔබ කැමැති ධර්ම රත්නයේ ගුණයක් උපයෝගී කරගෙන කතාවක් පවත්වන්න.
03. ධර්ම රත්නයේ ගුණ හා එහි තේරුම් මතකයෙන් ලියන්න.

03
පාඩම

# වැඳිම් මහ සඟන මුනි නන්දන

**"සුපටිපන්නො භගවතො සාවකසංඝො, උජුපටිපන්නො භගවතො සාවකසංඝො, ඤාය පටිපන්නො භගවතො සාවකසංඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවකසංඝො, ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති"**

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්ය මාර්ග ප්‍රතිපදාවට මනාව පිළිපන් හෙයින් සුපටිපන්න ය. අවංක, ඍජු ප්‍රතිපදාවට පිළිපන් හෙයින් උජුපටිපන්න ය. නිවැරදි සම්‍යක් ප්‍රතිපදාවට පිළිපන් හෙයින් ඤායපටිපන්න ය. සසර දුකින් බැහැරලීමට සමත් ප්‍රතිපදාවට පිළිපන් හෙයින් සාමීචිපටිපන්න ය. සෝවාන් ආදී මාර්ගස්ථ ඵලස්ථ යනුවෙන් පුරිස යුගල වශයෙන් හතරක් වන, පුද්ගලයන් අට දෙනෙකු වන, අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නය දුර බැහැර සිට ගෙනවුත් පුදන සිවුපස පිළිගැනීමට සුදුසු වන හෙයින් ආහුනෙය්‍ය ය. බැහැරින් පැමිණෙන නෑ හිත මිතුරන් උදෙසා වෙන් කළ ආගන්තුක සංග්‍රහය පවා පිළිගැනීමට සුදුසුවන හෙයින් පාහුනෙය්‍ය ය. පරලොව සුවපතා දෙන දානය පිළිගැනීමට සුදුසුවන හෙයින් දක්ඛිණෙය්‍ය ය. දෑත් එක්තැන් කොට වැඳීමට ආචාර කිරීමට ගරු සැරු කිරීමට සුදුසුවන හෙයින් අඤ්ජලීකරණීය ය. ලෝකයාට දානාදී පින් බීජ වැපිරීමට සුදුසු උතුම් පින් කෙත වන බැවින් අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත ය.

## සුපටිපන්නො

සුපටිපන්න යනු සම්මා දිට්ඨි ආදී යහපත් ප්‍රතිපදාවට පිළිපන්නේ ය, කෙලෙසුන් නසමින් ඉදිරියට ම යන ආපසු නොඑන ප්‍රතිපදාවට පිළිපන්නේ ය, තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් ලැබෙන නිර්වාණයට පත්වීමට අනුකූල ප්‍රතිපදාවට පිළිපන්නේ ය යන අදහස යි. ස්වාක්ඛාත වූ ධර්ම විනයෙහි ඇති අනුශාසනාවට අනුකූලව පිළිපන් බැවින් ද සංඝයා සුපටිපන්න වෙති.

## උජුපටිපන්නො

ආර්ය අෂ්ටාංගික මාර්ගය නැමැති ප්‍රතිපදාව ඍජු ය. වංක නැත. "**එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා**" යනාදී වශයෙන් වදාළ පරිදි නිර්වාණය කරා යාමට ඇති එකම මාර්ගය ය. **කාමසුඛල්ලිකානුයෝග අත්තකිලමථානුයෝග** යන අන්ත දෙකට නොවැටී මධ්‍යම ප්‍රතිපදාවෙහි ගමන් කරන මාර්ගයක් වන බැවින් ද කය වචන සිත යන තුන් දොරෙහි ඇදකුද දුරු කිරීමේ ප්‍රතිපදාවක් වන බැවින් ද මේ මාර්ගය ඍජු ය. එයට පිළිපන් හෙයින් සංඝයා උජුපටිපන්න ය.

**ඤායපටිපනෙනා**

ඤාය යනු අර්ය අෂ්ඨාංගික මාර්ගය යි. සම්‍යක් ප්‍රතිපදාව යි. නිවැරදි උපාය යි. තවත් අර්ථයකින් කිවහොත් ඤාය යනු නිර්වාණය යි. එය අවබෝධ කිරීමේ මාර්ගය වන බැවින් ආර්ය මාර්ගයට ද ඤාය යැයි කියනු ලැබේ. මේ අනුව නිර්වාණ අවබෝධය සඳහා පිළිපන් බැවින් හෝ ආර්ය මාර්ගයට පිළිපන් බැවින් මහා සංඝරත්නය ඤාය පටිපන්න වෙති.

**සාමීචිපටිපනෙනා**

"සාමීචිකම්මනති - යපෙතවා අභිවාදනාදීනි අඤඤසස අනුචඡවිකසස වීජනවාතදානාදිනො ආභිසමාචාරිකසෙසතං අධිවචනං" යනුවෙන් චුල්ලවග්ග පාරිවාසික්ඛන්ධ අටුවාවේ සඳහන්වන පරිදි සාමීචිකම්ම යනු නමස්කාර වන්දනාදිය හැර පිදිය යුතු පුද්ගලයාට කළ යුතු පවන් සැලීම් උණුපැන් සිසිල් පැන් සකස්කර දීම් ආදී වතාවත් හා ඇප උපස්ථාන ආදිය යි. ගිහිගෙය හැර පැවිදි වූ මහා සංඝයාගේ ජීවිතය පහසුවන්නේ ඔවුනොවුන් අතර සිදුකරගන්නා වතාවත් ආදියෙනි. ඒවා ආචාර්ය අන්තේවාසික, උපජ්ඣාය සද්ධිවිහාරික, ආගන්තුක, ගමික ආදී වශයෙන් වත්තක්ඛන්ධකයෙහි දක්වා තිබේ. සංඝයා ඒ ආකාරයෙන් ඇප උපස්ථාන කරගනිමින් සමගියෙන් සතුටින් පහසුවෙන් පැවිදි ජීවිතය ගෙවන බැවින් සාමීචිපටිපන්න වෙති. එසේ ම ආර්ය මාර්ගය සසර දුකින් බැහැරලීමට සමත් වන හෙයින් සාමීචි නම් වෙයි. ඒ මඟට පිළිපන් බැවින් ද මහසඟරුවන සාමීචි පටිපන්න වෙති.

**ආහුනෙයොා**

ආහුන යනු මව්පිය ආදී පිදිය යුත්තන්ට දුර බැහැර සිට ගෙනවුත් පුදන පුද පඬුරු ආදිය යි. එසේම දුර බැහැර සිට හෝ ගෙනවුත් සිල්වතුන්ට පුදන සිව්පසය ද ආහුන නම් වෙයි. ඒ ආහුනය ලැබීමට සීලයෙන් ගුණයෙන් සුදුසුවන හෙයින් මහ සඟ රුවන ආහුනෙය්‍ය වෙයි.

**පාහුනෙයොා**

පාහුන යනු බැහැරින් පැමිණෙන ඥාති මිත්‍රාදීන් සඳහා පිළියෙල කරන හෝ වෙන් කර ඇති භෝජනාදිය යි. ඒවා ඔවුන්ට පවා නොදී සංඝයාට පිදීම සුදුසුවන බැවින් උන්වහන්සේ පාහුනෙය්‍ය වෙති. සාමාන්‍ය ආගන්තුකයන් ආහුනයට සුදුසු වන්නේ බැහැරින් පැමිණි නිසා හෝ නෑ හිත මිතුරන් වන නිසා මිස වෙනත් ගුණයක් නිසා නොවේ. එහෙත් එම ආහුනය හෙවත් ආගන්තුක සංග්‍රහය ඔවුන්ට පවා නොදී සංඝයාට පිදීම සුදුසු වන්නේ සංඝයා සීලාදී ගුණයෙන් උතුම් වන බැවිනි. කලාතුරකින් පහළවන පිදිය යුත්තන් වන බැවිනි.

### දක්ඛිණෙය්‍යො

දක්ෂිණාව යනු පරලොව සුව පතා දෙන දානය යි. මියපරලොව ගිය ඇත්තන්ට සැප පිණිස දෙන දානය ද හින්දු දහමට අනුව දක්ෂිණාව යැයි හඳුන්වනු ලැබේ. එහිදී සිදුවූයේ මියගියවුන්ට භුක්ති විඳීමට ප්‍රණීත ආහාරපානාදිය පිදේනි තටු ලෙස තැබීම ය. එය නිෂ්ඵල ය. ඵලවත් ක්‍රමය නම් සිල්වත්, ගුණවත්, උතුමන්ට ඒවා පුදා මියගියවුන්ට පිං අනුමෝදන් කරවීමයි. එසේ පුදන දන සංඝගත දක්ෂිණාව නම් වෙයි. එම දක්ෂිණාව ලැබීමට සුදුසු වන හෙයින් සංඝයා දක්ඛිණෙය්‍ය නම් වෙති.

### අඤ්ජලිකරණීය

අභිවාදන - හිස මුදුනෙන් වැඳීම. පච්චුට්ඨාන - හුනස්නෙන් නැගී සිටීම. අඤ්ජලිකම්ම - දෑත් එක් තැන් කොට ආචාර සමාචාර දක්වීම. සාමීචිකම්ම - වතාවත් කිරීම යනුවෙන් ගරු කළ යුත්තන්ට ගරු කරන පිදිය යුත්තන් පුදන ක්‍රම හතරකි. ඒ අතරින් අඤ්ජලිකර්මයට හෙවත් ලොව ඕනෑ ම කෙනෙක් තවත් කෙනෙකුට ගරු කළ යුත්තෙකැයි සලකා දක්වන ආචාර සමාචාරවලට ස්වභාවයෙන් ම සුදුසුවන හෙයින් මහසඟරුවන අඤ්ජලිකරණීය වෙති. අඤ්ජලි කම්ම යන්නේ අදහස ආචාර කිරීම වුවත් සාමීචි කර්මය හැර අභිවාදන, පච්චුට්ඨාන, අඤ්ජලිකම්ම යන තුන් ආකාරයෙන් ම වැඳුම් පිදුම් ගරු සරු කිරීම මෙහි අඤ්ජලිකරණීය යන්නෙන් අදහස් කරයි.

### අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස

කෙතක බිජුවට වැපුරූ විට කලකට පසුව ඒවා පැසී අස්වනු, පලදාව ගෙන දෙයි. එසේ ම සංඝයා කෙරෙහි ඉහත කී ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිණෙය්‍ය, අඤ්ජලිකරණීය වශයෙන් කරන ලද දාන මාන, පුද පූජා ආදී පින් දහම් සසර පුරා ඉතා ඉහළ සැප සම්පත් පල ගෙන දෙන්නේ ය. එහෙයින් සැදැහැවතුන්ට මහ සඟරුවන උතුම් පින්කෙතක් බඳු ය. සඟගුණ නවය අතරින් සුපටිපන්න, උජුපටිපන්න, ඤායපටිපන්න, සාමීචිපටිපන්න යන හතර සංඝයා භාවනාවෙන් වතින් පිළිවෙතින් වැඩිය යුතු පුරුදු පුහුණු කළයුතු ධර්ම හතරකි. උන්වහන්සේ ආර්යයන් වහන්සේ නමක් වන්නේ ද පිදිය යුත්තෙක් වන්නේ ද ඒ ගුණ ධර්ම හතර නිසා ය. ඉතිරි ගුණ පහෙන් කියවෙන්නේ සංඝයා වහන්සේ එම ගුණ හතරෙන් සපිරි නිසා ලෝකයාගේ වන්දනාමාන පුද පූජාවලට සුදුසුවන බවයි. උන්වහන්සේට කවර ආකාරයේ පිදුම් ලැබේ ද යන්නයි.

**අභ්‍යාස**

01. සුපටිපන්න පාඨය නිවැරැදි ව මතකයෙන් ලියන්න.
02. මහා සංඝරත්නය සතු නව ගුණයන් වෙන වෙන ම මතකයෙන් විස්තර කරන්න.

04 පාඩම

# බුද්ධකාලීන මහා ශ්‍රාවක ශ්‍රාවිකා චරිතාදර්ශ

**මහාකාශ්‍යප මහරහතන් වහන්සේ**

ගෞතම සම්මාසම්බුද්ධ ශාසනයෙහි තෘතීය මහා ශ්‍රාවකයන් වහන්සේ වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තෙළෙස් ධුතංගධාරී භික්ෂූන් වහන්සේලා අතරෙහි අග්‍රස්ථානය ද ලැබූහ. පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී සිටි කාලයේ පටන් ම උන්වහන්සේ ඒ වෙනුවෙන් පාරමී සම්පූර්ණ කිරීම ආරම්භ කළහ. එකී බුදුරදුන්ගෙන් ම ඒ සඳහා විවරණ ලදහ.

අප ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ ව ඇති සමයෙහි දඹදිව මගධ රට කපිල නම් බමුණාට හා එම බැමිණියට දාව උපත ලබා පිප්ඵලී මාණවක නමින් හේ ප්‍රසිද්ධියට පත් වූයේ  ය. භාර්යාව වූයේ පෙර ජන්ම ගණනාවක සිට ම ඔහුගේ භාර්යාව බවට පත් වූ මදුරට සාගල නුවර කෝසිය නම් බමුණාගේ හා එම බැමිණියගේ දියණිය ව උපන් භද්‍රාකාපිලානිය යි. මෙම දෙදෙනා ම බඹලොවින් චුතව මෙහි උපන්නෝ වූහ. දෙදෙනාගේ ම එක ම අපේක්ෂාව වූයේ පැවිදිව සසර ගමන නිමා කිරීම ය. මේ බවක් නොදත් ඔවුනගේ දෙමව්පියෝ ඔවුනොවුන් සඳහා විවාහ මඟුල් පිළියෙල කළහ. දෙදෙනා ම එය තරයේ ප්‍රතික්ෂේප කළහ. අන්තිමේදී දෙමව්පියන්ගේ බලවත් ඉල්ලීම මත මෙම දෙදෙනාගේ විවාහය සිදු වී ඇත්තේ එක්තරා ගිවිසුමක් ඇතිව එහි දී පිප්ඵලී මානවකයා,


''භද්‍රාකාපිලානිය, මම ගිහි ගෙයින් නික්ම පැවිදි වනු කැමැත්තෙමි. එබැවින් මා හා විවාහ ප්‍රාප්තව පසුතැවිලි නොවන්න. ඔබ සුදුසු පරපුරකින් ස්වාමියෙකු ලැබ විවාහ වන්නැයි බිරිඳට කල්ඇතිව ම කී ය.''

භද්‍රාකාපිලානියගේ අදහස ද මෙයට ම සමාන විය.

'' පිප්ඵලී මානවකයාණෙනි, මම ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නෙමි. එබැවින් මා හා විවාහප්‍රාප්තව පසුතැවිලි නොවන්න. ඔබ සුදුසු පරපුරකින් කුමරියක ලැබ විවාහ වන්නැයි'' එතුමිය ද පැවසුවා ය.

මෙවැනි සමාන අදහස් දරා විවාහප්‍රාප්ත වුව ද දෙදෙනාගෙන් එක් අයෙකුටවත් අනෙකා කෙරෙහි රාග චේතනාවක් පහළ නොවී ය. බ්‍රහ්මචාරී ජීවිතයක් ගතකළ ඔවුහු රාත්‍රියෙහි එක යහනෙහි සැතපීමෙන් ඔවුනොවුන් ස්පර්ශ වේදැයි බියෙන් තුන්යම් රෑ

නිදි නොලබා දවස් යැවූහ. දහවල් කාලයෙහි මුහුණ බැලීමක් හෝ සිනාසීම් මාත්‍රයකුදු ඔවුනතර නොවී ය. දෙමව්පියන් ජීවත්ව සිටිනතාක් කල් පිප්ඵලී කුමරු තමා සන්තක අසූහත් කෝටියක් ධනය ගැන සොයා බැලීමක් නොකළේ ය. දෙමව්පියන් මිය ගිය පසු ඒ ගැන සෙවූ හෙතෙම එයින් තමාට අත්විඳීමට සිදුවන ආදීනව ගැන සිතා සියල්ල භද්‍රාකාපිලානියට පවරා පැවිදිවීමට සූදානම් ව මෙසේ කීවේ ය.



''භද්‍රාකාපිලාවනි, මා සතු වූ ද ඔබ සතු වූ ද යම් වස්තු සම්භාරයක් ඇත් ද ඒ සියල්ල අද පටන් ඔබට ම භාර ය. මම පැවිදි වන්නෙමි.

එකල්හි ඇය '' ස්වාමීනි, මමත් බලා සිටින්නේ ඔබ පැවිදි වනතුරු ය. මමත් මේ සියලු ධනය අත්හැර පැවිදි වෙමි'' යි කීවා ය.

එසේ නම් අපි දෙදෙනා ම පැවිදි වන්නෙමු යි, කතිකාකොට හිසකෙස් කපා සිවුරු හැඳ පොරවා ගත් ඔවුහු පාත්‍ර දෙකක් ගෙන මාලිගාවෙහි දොරවල් විවෘතව ම තබා සේවක සේවිකාවන් හඬා වැළපෙද්දී පිටත්වූහ.

**''යෙ ලොකෙ අරහන්තො තෙසං උද්දිස්ස අම්හාකං පබ්බජ්ජා''**

යනුවෙන් මේ ලෝකයෙහි යම් රහත් කෙනෙක් වෙත් ද අපගේ පැවිද්ද උන් වහන්සේ උදෙසා යි, කියා ගුරුවරයෙකු හමුවන තුරු දෙදෙනා මහමගට පිලිපන්නෝ ය.

පිප්ඵලී තෙරුන් වහන්සේ පෙරටුව වඩිමින් '' පැවිදි වූ මා දැන් භද්‍රාකාපිලානියගෙන් වෙන්ව යා යුතු ය. මැය පසුපසින් එනවිට බොහෝදෙනා අප කෙරේ වරදවා සිතා පව් රැස්කර ගනිති. එකමග යාම සුදුසු නොවේ යැ''යි, කල්පනා කළහ. ඒ බව කී විට භද්‍රාකාපිලානිය ද එය අනුමත කළා ය. ඉක්බිතිව ඇය තෙවරක් ම පිප්ඵලී තෙරුන් වහන්සේ වටා ප්‍රදක්ෂිණා කොට සතර තැනෙක සිට වැඳහෙව දසනිය එකට පිහිටුවා ඇඳිලිබැඳ වැඳ,

''ස්වාමීනි, මෙපමණ කලක් සසර එකට ආ අප මෙතැන් පටන් සසරින් මිදීමේ මග සොයනු පිණිස වෙන්ව යමු'' යි, කීවා ය.

නැවත ද, එක්තරා දෙමංසලක දී ස්වාමීනි, පිරිමි වූ ඔබ දක්ෂිණ ජාතික වෙති. කාන්තාවෝ නම් වාම ජාතිකයෝ ය. එබැවින් ඔබ දකුණුපස මග ඔස්සේ යනු මැනවි. මම වම්පස මග ඔස්සේ යමි''යි, ද කීවා ය. මේ අයුරින් ඔවුන් දෙදෙනා වෙන් වූ මේ අනුවේදනීය අවස්ථාවේ දෙදෙනාගේ ම ගුණ මහත්වය නිසා මහ පොළොව කම්පා විය.

එකල්හි අප බුදුරජාණන් වහන්සේ මහ පොළව කම්පාවීමට හේතු විමසා බැලූ සේක. පසුව තමන් වහන්සේ ම පා සිවුරු ගෙන කිසිදු ශ්‍රාවකයෙකුට හෝ ආමන්ත්‍රණය නොකොට තුන්ගව්වක් පමණ දුර පෙර ගමන් කොට රජගහ නුවරටත් නාලන්දා නුවරටත් අතර වූ බහුපුත්තක නමැති නුගරුකමුල පළක් බැඳ සවණක්සණ බුදුරැස් විහිදුවමින් වැඩසිටි සේක. එසේ වැඩසිටි බුදුරජාණන් වහන්සේ දුටු සැණින් ම පිප්ඵලී තාපස තෙමේ උන්වහන්සේ වෙත නැමි නැමී ගොස් වැඳ,

**''සත්ථා මෙ භන්තෙ සාවකො හමස්මි''**

''භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මාගේ ශාස්තෘන් වහන්සේ වන සේක. මම ඔබ වහන්සේගේ ශ්‍රාවකයෙක්මි'' යි, තෙවරක් ම කීය.

එවිට බුදුරජාණන් වහන්සේ පිප්ඵලි තාපසතුමා හට දහම් දෙසූ සේක.

එම දහම් අවවාද පිළිගැනීම ම උන්වහන්සේගේ පැවිදි උපසම්පදාව විය. ඕවාද පටිග්ගහන උපසම්පදා ක්‍රමය පළමුවෙන් ම සිදුවූයේ මෙහිදී ය. එයින් පසු උන්වහන්සේ පිප්ඵලී නාමය අතහැර කාශ්‍යප තෙරුන් වහන්සේ නමින් ද, බොහෝ කාශ්‍යප හිමිවරුන් වැඩසිටි හෙයින් පසුව මහා කාශ්‍යප නමින් ද ප්‍රසිද්ධියට පත් වූහ.

මහා කාශ්‍යප තෙරුන් වහන්සේ තෙළෙස් ධුතාංග සමාදන්ව සත් දිනක් පුහුදුන්ව සිට අටවෙනි දින සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේ නමක් බවට පත් වූහ. ධුතාංග යනු දිවිහිමියෙන් පිණ්ඩපාතයෙන් ම යැපීම, වනගතව විසීම වැනි දුෂ්කර පිළිවෙත් දහතුනකි. එබඳු ධුතාංග වැඩි ගණනක් පිරූ ශ්‍රාවකයන් වහන්සේ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ,

**''එතදග්ගං භික්ඛවෙ මම සාවකානං**
**භික්ඛූනං ධුතවාදීනං යදිදං මහා කස්සපො''**

යනුවෙන් මාගේ ශ්‍රාවකයන් වහන්සේලා අතර ධුතාංගධාරී ශ්‍රාවකයන් අතරින් මහා කාශ්‍යප ස්ථවිර තෙමේ අග්‍ර යැයි, වදාරා අග තනතුර දුන් සේක.


බුදුරජාණන් වහන්සේගේ ශරීරය දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්ත වූ අතර මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ ශරීරය සප්ත මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්ත විය. බුදුරජාණන් වහන්සේගේ හා මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ සිරුරු හැඩහුරුකමින් සමාන බව කියවෙන්නේ එබැවිනි. විටෙක බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ සඟල සිවුර මහාකාශ්‍යප මහරහතන් වහන්සේට දී උන්වහන්සේගේ සඟල සිවුර බුදුරජාණන් වහන්සේ පිළිගත් සේක. ඒ මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ උදාර ගුණ මහත්වයට දැක් වූ ගෞරවයක් ලෙස යි. එකසියවිසි වසක් ආයුෂ ඇතිව සිටි උන්වහන්සේ අගසව් දෙනමගේ හා සම්බුදුන්ගේ පරිනිර්වාණයෙන් පසුව භික්ෂූන් වහන්සේලාට අවවාද දීමට සුදුසු තත්ත්වයේ සිටි මහතෙරුන් වහන්සේ වූහ.

බුදුරජාණන් වහන්සේ කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනෙහි පිරිනිවන් පා වදාළ බව සැළවීමෙන් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ පාවා නුවර සිට කුසිනාරා නුවර බලා පිටත් වූහ. උන්වහන්සේ වැඩමවන තුරු බුදුරදුන්ගේ චිතකයට ගිනි ඇවිලුනේ නැත. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ පැමිණ බුදුසිරිපතුල් වැඳ අවසන්වීමත් සමග ම චිතකය හාත්පසින් ගිනි දැල් නැගී දැල් වී ගියේ ය.

සම්බුද්ධ පරිනිර්වාණය ගැන අසා සතුටු වූ තමාගේ ම අතවැසියෙකු වූ සුභද්‍ර නම් බුඩ්ඪ පබ්බජිතයෙකුගේ අභද්‍ර වචනය අසා ධර්ම සංවේගය ඉපද වූ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ඉකුත්ව ගිය සැණින් සිය මූලිකත්වයෙන් ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වූහ. මෙසේ අනාගත ශාසනාභිවෘද්ධිය පිණිස කළ යුතු සියල්ල මැනවින් නිම කළ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සම්මා සම්බුද්ධ ශාසනයෙහි තෙවැනි මහාශ්‍රාවකයන් වහන්සේ වෙති.

**පටාචාරා තෙරණිය**

පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි දඹදිව හංසවතී නුවර එක් සිටුපවුලක උපත ලැබූ දියණියක් එකී බුදුරදුන්ගෙන් බණ අසා බෙහෙවින් ම ප්‍රසාදයට පත්වූවා ය. දිනක් ඇය එම බුදුරජාණන් වහන්සේ එක්තරා භික්ෂුණියක විනයධර භික්ෂුණීන් අතර අග්‍රස්ථානයෙහි පිහිටුවනු දැක ''මම ද මතු යම් බුදුවරයෙකු හමුවෙහි දී මෙම තනතුර ලබන්නෙම් නම් ඉතා යෙහෙකැයි, සිතුවා ය. ඉක්බිති සත් දිනක් ම බුද්ධ ප්‍රමුඛ මහසඟනට මහ දන් පැවැත්වූවා ය. සත්වැනි දින දන් වළඳා නිම වූ කල්හි පදුමුත්තර බුදුරදුන්



වෙත එළඹී ඇය ස්වකීය ප්‍රාර්ථනාව උන්වහන්සේ වෙත සැළකර සිටියා ය. අනතුරුව උන්වහන්සේ අයගේ පැතුම ඉටු වේදෝ යි, නොවේදෝ යි, අනාගතය දක්නා නුවණින් බලන සේක් මතු ගෞතම බුදුරදුන්ගේ කාලයෙහි එය ඉටුවන බව දැක ඒ බැව් ඇයට වදාරා විවරණ දුන් සේක.

අනතුරුව අප ගෞතම බුදුරජාණන් වහන්සේ සමයෙහි සැවැත්නුවර මහා ධනවත් සිටුගෙයක උපන් ඇය මහත් රූපශ්‍රීයෙන් යුක්ත වූවා ය. කුඩා කල පටන් ම දෙමව්පියන්ට අකීකරුව වාසය කරන ස්වභාවයක් ඇය කෙරෙහි පිහිටා තිබුණි. දෙමව්පියෝ මහල් සතකින් යුතු මැඳුරෙහි ඉහළ ම මාලයෙහි ශ්‍රී යහන් ගබඩාවක රඳවා ඇයව ආරක්ෂා කළහ. එසේ තිබීය දීත් ඇය එම සිටු මැඳුරෙහි ම දාසයෙකු සමග රහස් පෙම් සබඳකමක් පැවැත්වූවා ය. මේ අතරතුර දෙමව්පියෝ ඇය සුදුසු ධනවත් සිටු කුමරෙකුට විවාහකොට දීමට කටයුතු සියල්ල පිළියෙල කළහ. මේ බව දැනගත් ඇය තම සිත්ගත් දාසයාට ''හැකි ඉක්මනින් තමා රැගෙන කැමති තැනකට යව''යි, රහසින් පණිවුඩයක් යැවූවා ය. දාසයා ද ඇයගේ එම ඉල්ලීම පිළිගෙන ''එසේ නම් හෙට දිනයෙහි මම නගරයෙහි වාසල ළඟ සිටිමි. ඔබ ද හොර රහසේ ම එහි පැමිණෙන්නැ''යි, කියා යැවී ය.

පසු දින අලුයම සිටු මැඳුරේ සියලුදෙනා ම ඇයගේ විවාහ මංගල්‍යයට අවශ්‍ය වැඩ කටයුතුවල නිරතව සිටියහ. ඒ අතර ඇය ඉරුණු කඩමාල්ලක් හැඳගෙන දාසියක මෙන් සැරසී හොර රහසේ ම තමා සිත්ගත් දාසයා කියූ තැනට ගියා ය. අනතුරුව දෙදෙනා ම එකතුව පිටිසර ගමක් කරා ගොස් පැලක් තනාගෙන ඉතා දුකසේ අනුන්ගේ බැලමෙහෙවරකම් කරමින් ජීවත් වූහ.

මෙසේ දිවිපෙවෙත ගත කරන අතර සිටුදියණියගේ කුස තුළ දරුගැබක් හටගෙන එය ක්‍රමයෙන් වැඩෙන්නට වන්නේ ය. දිනක් ඇය ස්වාමියා අමතා ''ස්වාමීනි, මෙහි අපගේ කිසිදු නෑයෙක් නැත්තේ ය. අපගේ සුවදුක් බලන්න එන්නට කෙනෙකුදු නැත්තේ ය. දෙමව්පියෝ නම් තම දරුවන්ගේ කවර තරම් වරදක් ඇතත් දරු මුණුබුරන් මුහුණ බලා සමාව දෙති. එබැවින් දරු ප්‍රසූතිය සඳහා තම දෙමව්පියන්ගේ ගෙදරට යාම සිරිතක් වන හෙයින් අපගේ ගෙදරට යමු'' යි, යෝජනා කළා ය. දාසයා තමා කළ වරදට බියෙන් ඊට එකඟ නොවී ය. ඇය දෙවැනි තුන්වැනි වරට ද එම ඉල්ලීම සිදු කළ ද ඔහු ඊට කිසිසේත් ම කැමති නොවූයේ ය. පසුව කුමරිය සිදුකළේ සැමියා නිවසේ නොසිටි අවස්ථාවක තමා දෙමව්පියන්ගේ ගෙදර ගිය බව සැමියාට පවසන්නැයි, අසල්වැසියන්ට කියා හුදකලාව ගමට යාම යි. නිවසට පැමිණි පසු අසල්වැසියන්ගෙන් එම කරුණ දැනගත් සැමියා වහ වහා ඇය සොයා ලුහුබැන්දේ ය. එක්තරා මහ වනයක් මැද දී බිරිඳ මුණ ගැසුණි. එහි දී ද නොයෙක් අයුරින් කරුණු කී නමුත් බිරිඳගේ ගමන වළකාලන්නට කිසිසේත් ම නොහැකි විය. එබැවින් දෙදෙනා ම එක්ව දෙමව්පියන් කරා යාමට පිටත්වූහ. එසේ ටික දුරක් යන අතර කුමරියට ප්‍රසව වේදනාව ඇති විය. ඕ තොමෝ එම වනයෙහි දී ම පුතණු කෙනෙකු බිහි කළා ය. පැමිණි කාර්යය මග දී ම ඉටු වූ බැවින් දැන් දෙමව්පියන් කරා යාමෙන් පලක් නැතැයි, තීරණය කළ ඔවුහු පෙරලා නිවසට පැමිණ පෙර සේ ම කල් ගෙවූහ.

මෙසේ කල්ගත වෙද්දී කුමරිය දෙවැනි වරට ද ගැබ් ගත්තා ය. එම අවස්ථාවෙහි ද ඇය මව්පියන් වෙත යාමට අවශ්‍ය බව සැමියාට කී නමුත් ඔහු එවර ද ඊට නොකැමැත්ත පළ කළේ ය. ඇය මුල් වතාවෙහි මෙන් ම සැමියා නිවසේ නොමැති විටෙක දෙමව්පියන්ගේ ගෙදරට යාමට පිටත් වූයේ සිය දරුවා ද කැටිව ය. පෙර සේ ම ලුහුබැඳ පැමිණි සැමියාට අතරමග දී ඇය හමු විය. එවර ආපසු යාමට බිරිඳ අකමැති වූ හෙයින් සැමියා ද ඇය සමග සිටු මැදුර බලා පිටත් විය. රෑබෝ වෙද්දී වටින් පිටින් කළු කරගෙන මහ වැස්සක පෙර නිමිති පහළ විය. මේ අතර බිරිඳට ප්‍රසව වේදනාව ද ඇති වූ හෙයින් සැමියා වහා ම පැලක් අටවා ගනු පිණිස කොළ අතු සොයා වන වැදුණේ ය. එහිදී විෂඝෝර සර්පයෙකු දෂ්ට කිරීමෙන් සැමියා මළේ ය. මහ වැසි ඇද හැළෙන්නට විය. සැමියා එනතුරු මගබලා සිටි බිරිඳ වැස්සේ තෙමී හිඳිමින් ම දෙවැනි දරුවා ද බිහි කළා ය. රැය පහන් වූ පසු ඇය එක් දරුවෙකු තුරුළට ගෙන එක් දරුවෙකු අතින් අල්ලාගෙන ස්වාමියා සොයමින් වනයෙහි සැරිසැරුවා ය. එහි දී එක් තැනෙක තම ස්වාමියාගේ මළසිරුර දුටු ඇය සිදු වූ විපත හැඳින ''මාගේ ස්වාමියා මා නිසා මළේ ය'' යි, හඬ හඬා දරු දෙදෙනා ද සමග දෙමව්පියන් වෙත යනු පිණිස මහමගට පිවිසියා ය.

රාත්‍රියේ ඇදහැළුණු ධාරාණිපාත මහවැස්සෙන් ඇය යන අතරමග තිබූ අචිරවතී නදිය දෙගොඩතලා යමින් තිබුණි. කෙසේ හෝ ගඟින් එතෙර වියයුතු හෙයින් ඇය වැඩිමහලු පුතු මෙගොඩ තබා අලුත උපන් පුතු වඩාගෙන පීනා ගඟින් එතෙර වූවා ය. බිළිඳා එගොඩ තැබූ ඇය නැවත වැඩිමහලු පුතු රැගෙන ඒමට ආපසු පීනමින් සිටියා ය. එහි දී එක් උකුස්සෙක් පැමිණ අලුත උපන් බිළිඳා මස් කැටියකැ යි, සිතා ඩැහැගෙන පියාසර කරන්නට වන්නේ ය. ගඟ මැද සිටි සිටුදියණිය වහා උකුස්සා එළවා හරිනු පිණිස අත්පොළසන් දුන්නා ය. එවිට මෙගොඩ සිටි දරුවාට එම හඬ ඇසුණි. මව තමාට හඬ ගසන්නී යැයි, වරදවා සිතූ හෙතෙම ගඟට බැස්සේ ය. සැඩපහර ඉතා වේගවත් හෙයින් දරුවා දිය පහරට හසු වී ගසාගෙන ගියේ ය.

සියල්ල අහිමි වූ සිටුදියණිය ඉවසාගත නොහැකි බලවත් වේදනාවෙන් යුතුව''මාගේ සැමියා මා නිසා සර්පයෙකු දෂ්ට කොට මළේ ය, බාල පුතු උකුස්සෙකු ඩැහැගෙන ගියේ ය. වැඩිමහලු පුතු ගඟෙහි ගිලී මළේ ය'' යි, විලාපදෙමින් තමන්ගේ මව්පියන් වෙත යාමට පිටත් වූවා ය. ඒ අතර සැවැත්නුවර සිට එන මගියෙකු හමුවිය. ඇය ඔහුගෙන් තම මව්පියන් ගැන තොරතුරු විචාළා ය.

එවිට හෙතෙම ''ඔබ කුමක් අසන්නෙහි ද? ඊයේ රාත්‍රී ඇදහැලුණු ධාරාණිපාත මහා වර්ෂාවට සිටු මැදුර කඩා වැටුණා. මහ සිටුතුමාත්, සිටු දේවියත්, ඔවුන්ගේ එක ම පුතාත් එයින් මිය ගියා ඒ තිදෙනා ම දවන එක ම දරසෑයෙන් තමයි අර දුම් නැගෙන්නේ යැයි පැවසී ය.

මේ පුවත ඇසූ තැන් පටන් දුක දරාගත නොහැකි ව සොවින් මුසපත් වූ කුමරිය,

''උභො පුත්තා කාලකතා - පන්‍ථෙ මය්හං පතී මතො
මාතා පිතා ච භාතා ච - එකචිතකස්මිං ය්‍යේව ඩය්හරෙ''

මාගේ දරුදෙදෙනා මළෝ ය. සැමියාත් මළේ ය. මව්පියන් හා සහෝදරයා එකම දර සෑයේ දවති යි, විලාප දෙමින් පිස්සියක මෙන් යන එන මගක් ද නොදන්නී හිස හැරුණු අත දිව ගියා ය. සිහිමද හෙයින් හඳනා පොරෝනා වස්ත්‍ර පවා ගිලිහී ගිය බැව් ඇය නොදත්තා ය. ඇය දුටු ඇතැමෙක් පිස්සියකැයි ගල් මුල් ආදියෙන් දමා ගසමින් එළවා දැමූහ. මෙසේ වස්ත්‍ර නැතිව සිහි විකලෙන් ඇවිදින හෙයින් මිනිස්සු ඇයට ''පටාචාරා'' යැයි නම් පට බැන්දහ. නන් දොඩවමින් සිටි හිසහැරුණු අත ගිය ඕ කෙසේ හෝ තොමෝ බුදුරදුන් දහම් දෙසන ජේතවනාරාමය වෙත ආවා ය. ඇය දුටු බුදුරජාණන් වහන්සේ පෙර සසර කළ මහපින් ඇතියක හෙයින් විහාරයට ම එන ලෙසට අධිෂ්ඨාන කළහ. බණ අසමින් සිටි මිනිස්සු ඇය දැක කලබල වී ''මෙම වියරු ගැහැණිය වළක්වන්නැ''යි, කෑ ගැසූහ. එහෙත් බුදුරදුන් ඔවුන් වළකා ''නැගණියනි, සිහිඑළවා ගන්නැ''යි, වදාළ සේක. එසේ වදාළ සැණින් බුදුරදුන්ගේ ආනුභාවයෙන් පියවි සිහිය ලද ඇය තමා සිටින ආකාරය ගැන ලැජ්ජාවට පත්ව වෙනත් කළ හැකි දෙයක් නොමැති හෙයින් උක්කුටිකයෙන් හිඳ ගත්තා ය. එවිට එක් උවසුවෙක් වහා ඇය දෙසට තමාගේ උතුරු සළුව දැමී ය. එය හැඳගත් ඇය බුදුරදුන්ගේ පා යුවල වැඳ තමන්ට සිදු වූ සියලු විපත් එකින් එක විස්තර කළා ය. බුදුරජාණන් වහන්සේ ඇය අමතා ''දියණියනි, නුඹ ආවේ සුදුසු තැනකට ම ය. නුඹ දැන් මේ හඬන්නේ එක ස්වාමියෙකුත්, දරු දෙදෙනෙකුත්, මව්පියන් හා සහෝදරයෙකුත් නිසා ය. මේ අනන්ත වූ සසරෙහි නැසුණා වූ ඔබේ ඥාති සමූහයාගේ ගණන් මෙතෙකැ යි, නැත්තේ ය. ඒ මළ ඥාතීන් නිසා නුඹ හැඬූ කඳුළු සප්ත මහා සාගරයේ ජල කඳටත් වඩා වැඩි යැ''යි, වදාරා දහම් දෙසූහ. දේශනාවසානයෙහි පටාචාරා සෝවන් වූවා ය. පසුව ''ස්වාමීනි, මා පැවිදිකොට වදාළ මැනවැ'' යි, පැවිද්ද ඉල්ලුවා ය. අනතුරුව බුදුරදහු ඇය භික්ෂුණීන්ට භාරදුන් සේක. භික්ෂුණීහු ඇය පැවිදි කළහ.

පසුදිනෙක පටාචාරා භික්ෂුණිය භාජනයකින් පැන්ගෙන දෙපා දෝවනය කරන කල්හි ඒ ජලය මද දුරකින් ගලා ගොස් සිඳී ගියේ ය. දෙවැනි දවස එසේ පය දෝවනය කරන කල්හි ඒ ජලය කලින් දිනට වඩා ඈතට ගොස් සිඳී ගියේ ය. තෙවැනි දින එසේ කළ කල්හි ජලය බොහෝ දුර ගොස් සිඳී ගියේ ය. මෙය උපමා කරගත් පටාචාරා තෙරණිය උපන් මිනිසුන් අතරින් කෙනෙක් ළදරු වියේ දී ම මිය පරලොව යති, තවත් කෙනෙක් මධ්‍යම වයසේ දී මිය පරලොව යති. තව කෙනෙක් මහළුව මිය පරලොව යති. මෙසේ උපන් සත්ත්වයාට මරණයෙන් ගැලවීමක් නම් නැත්තේ ය. සියලු සත්ත්වයාට මරණය නියත ය. යනුවෙන් මරණානුස්සතිය සිහි කරමින් භාවනා කළා ය. ඒ දුටු බුදුරජාණන් වහන්සේ ඇය වෙත බුදුරැස් මාලාවක් විහිදුවා ඇය ඉදිරියෙන් ම වැඩ සිට අනිත්‍යය පිළිබඳ ව ම දහම් දෙසූ සේක. එම ධර්ම දේශනාවසානයෙහි පටාචාරා මෙහෙණින් වහන්සේ සිව්පිළිසිඹියාපත් රහත් ඵලයට පත්වූහ.

පටාචාරා මහරහත් තෙරණිය විනය ශික්‍ෂාපද පිළිබඳ හසල දැනුමැත්තී ය. මේ හේතුකොට ගෙන බුදුරජාණන් වහන්සේ පසු කලෙක භික්ෂු - භික්ෂුනීන් වහන්සේලා අමතා,

''එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං භික්ඛුණීනං
විනයධාරීනං යදිදං පටාචාරා''

යනුවෙන් මාගේ ශ්‍රාවිකාවන් අතර විනයධාරී භික්ෂුණීන්ගෙන් මෙම පටාචාරා තොමෝ අග්‍ර වන්නීයැ යි, වදාරා අග තනතුරෙහි පිහිටුවා වදාළ සේක.

**පැවරුම**

01. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ධර්මයේ චිර පැවැත්මට සිදු කළ සේවාව කෙබඳු දැයි කරුණු ඉදිරිපත් කරන්න.
02. පොත පත පරිශීලනයෙන් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ පිළිබඳ තව තවත් කරුණු සොයා එක් රැස් කරන්න.
03. අභියෝගවලට නොසැලී ජීවිතය ජයගන්නා අයුරු පටාචාරා කතාපුවත ඇසුරින් විස්තර කරන්න.

05
පාඩම

# සසුන එකලු කළ නූතන යතිරුවන්

## හික්කඩුවේ සුමංගල නාහිමි

සියවස් ගණනාවක් පුරා ම ලක්වැසියන්ට ජීවිත ගත කිරීමට සිදු වූයේ පෘතුගීසි, ඕලන්ද, ඉංග්‍රීසි ජාතිකයන්ට යටත්ව ඔවුන්ගේ සැහැසිකම්වලින් බොහෝසෙයින් ම පීඩිත, දුර්භාග්‍ය සම්පන්න වටපිටාවක් තුළ ය. නිදහසේ අරුණලු උදාවන සේයාවක් පෙනෙන තෙක් මානයකවත් නොතිබුණි. වසර දෙදහසක් ස්වාධිපත්‍යයෙන් පැවති රටක් ඉක්බිතිව පරාධීන හස්තයකට යටත්ව ජීවත්වීමට ලැබීම ලක්වැසියෝ කිසිසේත් ම නොඉවසූහ. ඔවුහු මෙකී මහා ව්‍යසනයෙන් රට, ජාතිය, ආගම බේරාගැනීමේ මහසටන් ඇරඹූහ. එහෙත් ඒවා අඛණ්ඩ ව පවත්වාගෙන යා නොහැකි විය. මෙම තත්ත්වයෙන් රට මුදවා ගැනීමට සමත් පුත් රුවනක් ලක් පොළොවේ ජනිත වේවා යි, ශාසන පාලක දෙවියන් යැදීම හැර කළ හැකි අන් දෙයක් ඔවුන්ට නොතිබුණි. එහි ප්‍රතිඵලයක් නිසාදෝ රටේ වාසනාවකට මෙන් වැලිවිට අසරණසරණ සරණංකර සංඝරාජෝත්තමයාණන් වහන්සේ උඩරට වැදගත් පරපුරක ජන්මලාභය ලැබූ හ. ඉතා දුක සේ ධර්මවිනයත් භාෂා ශාස්ත්‍රයත් මැනවින් හදාළ උන්වහන්සේ චිරරාත්‍රඥ, බහුශ්‍රැත, මහා පඬිවරයෙකු බවට ද පත්ව ශාසනයත් ජාතියත් භාෂාවත් පුනර්ජීවනයෙහිලා ස්වකීය කාර්යභාරය ඉතා මැනවින් සම්පූර්ණ කළ හ. එහෙත් සඟරජ මාහිමියන්ගේ අභාවයෙන් පසු එම ආලෝකය ටික කලෙකින් පහව ගොස් අන්ධකාරයේ සෙවනැලි පහළ වන්නට විය.

එම හිඩැස පිරවීමට දෝ 19 වෙනි ශත වර්ෂයේ මුල් භාගයේ සිරිලක දකුණු පළාතේ ගාලු නගරයට නුදුරු හික්කඩුව නම් රමණීය ගම්පියසේ දී වර්ෂ 1827 ජනවාරි මස 20 වෙනිදා තවත් ශ්‍රේෂ්ඨ කුල කුමරුවෙකුගේ ජන්මලාභය සිදු විය. උපතින් තෙළෙස් වන වියේ දී එනම්, වර්ෂ 1840 දී හෙතෙම ''හික්කඩුවේ සුමංගල'' නමින් උතුම් වූ ප්‍රව්‍රජ්‍යාභාවයට පත් විය. හික්කඩුවේ තිලකාරාමයේ වැඩවිසූ අරුග්ගමුවේ රේවත හිමියන්ගේ ආචාර්යත්වයෙන් ප්‍රව්‍රජ්‍යාභාවයට පත් මෙම සාමණේර හිමියෝ එවකට පළාතේ වැඩසිටි විද්වත් යතිවරයෙකු වූ පන්නම්ගොඩ ජෙතුත්තර මහතෙරුන් වහන්සේ වෙතින් සිංහල, පාලි ඉගෙනීම ආරම්භ කළහ. පුරාකෘත පුණ්‍ය මහිමයේ බලය මේ යැයි, ප්‍රකට කරමින් ගුරුන් එක්වරක් කී දෙයක් සිය ගුණයෙන් තේරුම් ගැනීමට මේ ශිෂ්‍යයා සමර්ථ විය.

කාලයාගේ ඇවෑමෙන් සුමංගල සාමණේරයන් උසස් පඬිවරයෙකු වෙත භාර දී ධර්ම ශාස්ත්‍ර විෂයෙහි පරිණත වියතෙකු කිරීමට පළාත්වාසී ප්‍රභූ බෞද්ධයෝ සූදානම් වූහ. ගුරු හිමියන් ද සමග සාකච්ඡා කොට එවකට ලංකාවේ සිටි ශ්‍රේෂ්ඨ පඬිවරයෙකු වූ රත්මලානේ පරමධම්මචේතිය විහාරාධිපති වලානේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත සාමණේර නම භාර කෙරිණි. වර්ෂ කිහිපයක් උන්වහන්සේ වෙතින් සිප්සතර ද හොඳින් ප්‍රගුණ කළ සුමංගල හිමියෝ පසුව කාසිනාථ නම් බමුණු පඬිවරයෙකු ගෙන් සංස්කෘත තර්ක න්‍යාය, නක්ෂත්‍රය ආදී විෂයන් ද උගත්හ. මහනුවර මල්වතු මහාවිහාරීය උපෝසථාගාරයේ දී උපසම්පදාව ලැබූ සුමංගල හිමියෝ එහි ධර්මඥානය පරීක්ෂා කිරීමේ

දී පරිවාර පාළිය සම්පූර්ණයෙන් කටපාඩම් දී වෙනත් ප්‍රශ්නවලට ද නිසි පිළිතුරු දී සංඝසභාව ඉදිරියේ සිය හැකියාවන් මොනවට ප්‍රකට කළ හ. එසේ ම කලින් පිළියෙල කරගෙන ආ පාලියෙන් රචිත දළදා වන්දනාවට සුදුසු අෂ්ටකයක් ද සංඝසභාව මධ්‍යයෙහි කියවූහ. මෙම සැම සමත්කමක් කෙරෙහි ම සංඝසභාවේ බලවත් ප්‍රසාදය පළ වූ අතර මහනාහිමියෝ ස්වකීය සොම්නස පළකරනු වස් හෙරණ නමට අටපිරිකරක් පරිත්‍යාග කොට මංගල සූත්‍රයෙන් පිරිත් සජ්ඣායනා කොට සෙත් පැතීම ද කළ හ.

කල්ගතවත් ම කාලයට අනුරූපව නිසි නායකත්වය දැරීමට පරිපූර්ණ සුදුසුකම්වලින් අනූන ශ්‍රේෂ්ඨ යතිවරයෙකු ලෙස හික්කඩුවේ සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලංකාවේ ලොකු කුඩා සැම අතර මහත් සේ ප්‍රකට වූහ. මෙකල කොළඹ නගරයේ විසූ බෞද්ධ ප්‍රභූහු බුදුදහමත් සිංහල ජාතියත් භාෂා ශාස්ත්‍රයත් නගා සිටුවීමට අවශ්‍ය කරුණු ගැන සාකච්ඡා කරමින් සිටියහ. බෞද්ධයන්ගේ අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමත් මිෂනාරී බලවේගවලින් රට බේරා ගැනීමත් ඔවුන්ගේ මූලික පරමාර්ථයක් විය. සුමංගල හිමියන් පිළිබඳ කරුණු දැනගත් ඔවුහු හික්කඩුවේ තිලකාරාමය වෙත ගොස් උන්වහන්සේ බැහැදැක ධර්ම ශාස්ත්‍ර ඉගැන්වීමට සුදුසු ආයතනයක් කොළඹ පිහිටුවන ලෙස ඉල්ලීමක් කළහ. උන්වහන්සේ ආරාධනය පිළිගත්හ. ඒ වෙනුවෙන් දොන් පිලිප්පු සිල්වා ඇපා අප්පුහාමි, දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමා ඇතුලු 13 දෙනෙකුගෙන් යුත් සභාවක් මගින් මරදාන ප්‍රදේශයේ අප්‍රසිද්ධ ව පැවති භූමි භාගයක් මිලයට ගනු ලැබී ය. එහි ශ්‍රී සුමංගල හිමියන්ගේ මූලිකත්වයෙන් විද්‍යෝදය පිරිවෙණ ආරම්භ කෙරිණි.

ශ්‍රී සුමංගල හිමියන් සතුව පැවති ප්‍රාමාණික ප්‍රඥා ශක්තිය තුළින් සමස්ත ලෝකයේ ම පාලි භාෂාවත්, ථෙරවාද බුද්ධ ධර්මයත් පැතිරවීමට මෙය ඉතා හොඳම තෝතැන්නක් විය. මේ කාලය වන විට ශ්‍රී සුමංගල යන නාමය යුරෝපයේ පවා පැතිර පැවතියේ ය. විද්‍යෝදය පිරිවෙණ ඇරඹීමත් සමග ම පෙර අපර දෙදිශාවෙන් ම ධර්ම ශාස්ත්‍ර හැදෑරීමටත්, පාලි භාෂාව ඉගෙනීමටත් බොහෝ ශාස්ත්‍රවන්තයෝ මෙරටට පැමිණියහ. ලංකාවේ ද සියම්, අමරපුර හා රාමඤ්ඤ නිකායත්‍රයේ ම භික්ෂූන් වහන්සේ ශ්‍රී සුමංගල නාහිමි වෙත පැමිණ ධර්ම ශාස්ත්‍ර පිපාසය දුරුකර ගත්හ. ගිහි සාධු ජනයා වෛද්‍ය, නක්ෂත්‍ර ඇතුළු විෂයන් ද භාෂාවන් ද ඉගෙන පරිහානිය කරා ගමන් කරමින් තිබූ අපේ පැරණි ධර්ම ශාස්ත්‍රවලට නව ආලෝකයක් ගෙන දුන්හ.

විද්‍යෝදය පිරිවෙණ පිහිටුවීම ගැන යගිරල පඤ්ඤානන්ද නාහිමියෝ ඉතා උචිත සැසඳීමක් කරති.

''ඈත පිටිසර පෙදෙසක ජලය කොළඹට ගෙනවුත් මහා ජනතාවකට දෙවා ඔවුන්ගේ පිපාසා සංසිඳුවන බාහිර පවිත්‍රතාව ඇති කිරීමට මූලික ස්ථානය ලෙස මාලිගාකන්ද තෝරාගත්තේ සර් විලියම් හැන්රි ග්‍රැගරි ආණ්ඩුකාරතුමා ය. ස්වදේශීය විදේශීය ධර්ම ශාස්ත්‍රාභිලාෂීන්ගේ ධර්ම ශාස්ත්‍ර පිපාසා සංසිඳුවා බාහිර අභ්‍යන්තර පවිත්‍රතාව ඇති කිරීමට මූලස්ථානය ලෙස මාලිගාකන්ද තෝරාගන්නා ලද්දේ ශ්‍රී සුමංගල නායක හිමියන් විසිනි. ග්‍රැගරි ආණ්ඩුකාරතුමා එකල අඳුරු පුරයක් ව පැවති කොළඹ නගරය ගෑස් ආලෝකයෙන් එළිය කරන්නට පටන් ගත්තේ ය. ශ්‍රී සුමංගල නායක හිමියෝ ලංකාව ධර්ම ශාස්ත්‍රාලෝකයෙන් බබලවනු පිණිස විද්‍යෝදය පිරිවෙණ පටන් ගත්හ.''

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගේ ශාස්ත්‍රීය සේවාව දෙස අවධානය යොමු කිරීමේ දී සිංහල, පාලි හා සංස්කෘත යන භාෂාත්‍රයෙන් රචිත ග්‍රන්ථ සම්භාරයක් දක්නට ලැබේ. සිදත් සඟරාව වටහා ගැනීම දුෂ්කර කාර්යයක් වූයේ සුදුසු සන්නයක් නොමැතිකම නිසා ය. පළමුකොට ම එම කාර්යය සිදුකළ උන්වහන්සේ මහාවංසය සිංහලයට ද පරිවර්තනය කළහ. **බ්‍රාහ්මණ ධර්මය, වර්ණ රීතිය, කාව්‍යශේඛර ව්‍යාඛ්‍යාව, සංස්කෘත සන්ධි ග්‍රන්ථය, මාසර්තු ලක්ෂණය, පාලි වරනැගිල්ල, සීමා විභාගය** යනාදී ග්‍රන්ථ උන්වහන්සේ සම්පාදනය කළහ. **සරසවි සඳරැස, සමය සංග්‍රහව, ලංකාලෝකය** වැනි පත්‍ර හා සඟරා ආරම්භ කිරීමට මූලිකත්වය ගත් උන්වහන්සේ යෝග්‍ය කතුවරුන් පවා සොයාදීමෙන් අනුග්‍රහ දැක්වූහ. එවකට පැවති පාරුපනවාදය, සව්සත්දම් වාදය, අධිමාසවාදය ආදී ධර්ම ශාස්ත්‍රීය වාදයන්හි එක් පක්ෂයක ප්‍රමුඛයා වූයේ ශ්‍රී සුමංගල නාහිමි ය. වරෙක ඕල්කට්තුමා පුබ්බේනිවාසානුස්සති ඥාණය පිළිබඳ තේරුම් ගැනීමට අනල්ප වෙහෙසක් දරා ලංකාවේ පඬිවරුන් සමගත් සාකච්ඡා කළ ද ඒ සියල්ල නිෂ්ඵල විය. පසු ව ශ්‍රී සුමංගල නාහිමියන්ගේ දේශනයෙන් එක් ක්ෂණයකින් එය තේරුම් ගත්තේ ය. ප්‍රවෘත්ති පතුරුවා හැරීමේ මාධ්‍යය ඉතා දුර්ලභ වූ එකල ලංකාවේ ආරම්භ වූ විද්‍යොදය පිරිවෙණ ගැන තොරතුරු ලෝකයට පැතිර ගියේ ශ්‍රී සුමංගල නාහිමි නාමයත් සමග ය. ටිබැට්, ජපන්, ඉන්දියා, චිටගොන්, සියම්, බුරුම හා කාම්බෝජ රටවලිනුත් එංගලන්ත, ඇමෙරිකා, ජර්මන් රටවලිනුත් විද්‍යාර්ථීන් මෙන් ම පඬිවරුන් ද මෙහි පැමිණියේ ථෙරවාද බුදුදහමත් පාලි භාෂාවත් ඉගෙනීම සඳහා ය. ජපන් ජාතිකයන් වූ කොජින් ගුණරතන හිමි, කොජිමා කොණ්ඩඤ්ඤ හිමි, ඉන්දියාවේ කෝසම්බික ධම්මානන්ද හිමි, මහාචාර්ය සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ, හරගෝවින්ද ආදීහු විදේශීය ශිෂ්‍යයන් අතර වඩාත් ප්‍රකට ය.

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි ශ්‍රී පාදස්ථානයේ නායක ධුරය ද ගාලු පළාතේ සංඝනායක ධුරය ද කොළඹ නව කෝරළයේ ප්‍රධාන සංඝනායක ධුරය ද දරා ඇත. උන්වහන්සේගේ සාධු චරිතය මෙවන් සංක්ෂිප්ත විස්තරයකින් දැක්වීම බෙහෙවින් ම උගහට ය.

නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලැබූ ඇන්ටෝල් ප්‍රාන්ස් නමැති ප්‍රංශ ලේඛකයාගේ ප්‍රකාශයකින් මෙම හැඳින්වීම අවසන් කිරීම යෝග්‍ය ය.

''ලංකාවේ දකුණු බුදුසමයේ (ථෙරවාදයේ) මහානායක සුමංගල හිමි නවීන විද්‍යාව ඉත සිතින් පිළිගන්නේ ය. පෙරෙවි කහ සිවුර නිසා උදාර පෙනුමක් ලබන තඹ පැහැති මුහුණක් ඇති මහලු මොහු බුලත් කමින් හර්බට් ස්පෙන්සර්ගේ පොත් කියවයි. හික්කඩුවේ හිමි දෙවැනි බුදුවරයෙකි''

## රත්මලානේ ධම්මාලෝක නාහිමි

බෝධිසත්ත්ව ගුණෝපේත වැලිවිට අසරණසරණ සරණංකර සංඝරාජෝත්තමයාණන් වහන්සේ ආරම්භ කළ අත්‍යුදාර ශාසනික මෙහෙවර අඛණ්ඩව පවත්වාගෙන යාමට 19 වැනි සියවසේ අග භාගය වනවිට පහළ වූ අග්‍රගණ්‍ය මහා යතිවරයන් වහන්සේලා බොහෝ සිටියහ. සංඝරාජෝත්තමයාණන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට අයත් උන් වහන්සේලා අතර කීර්තිමත් මහා යතිවරයෙකු ලෙස පණ්ඩිතාචාර්ය රත්මලානේ ශ්‍රී ධම්මාලෝක මහාස්වාමීන්ද්‍රයන් වහන්සේ හඳුන්වා දිය හැකි ය.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන ප්‍රදේශයේ විසූ රයිගම විදානෙලාගේ දොන් කොර්නේලිස් අප්පුහාමි හා අබේපිටියගේ දෝන අද්‍රියානා හාමිනේ යන සැදැහැබර වාසනාවන්ත දෙමව්පියන්ගේ පුත්‍රයෙකු ලෙස වර්ෂ 1828 මැයි මස 28 වෙනිදා රත්මලානේ ශ්‍රී ධම්මාලෝක නාහිමියෝ ජන්මලාභය ලැබූහ. වර්ෂ 1837 දී රත්මලාන පුරාණ රජමහාවිහාරයේ දී උතුම් වූ ප්‍රව්‍රජ්‍යාභාවයට පත්වූයේ අඹුපේ සෝණුත්තර මහාස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙනි. පසුව පණ්ඩිතාචාර්ය මලිගස්පේ ශ්‍රී ධර්මකීර්ති, පණ්ඩිතාචාර්ය වලානේ ශ්‍රී සිද්ධාර්ථ යන බහුශ්‍රැත ධර්මවිනයධර මහතෙරවරුන් වහන්සේලා වෙතින් ධම්මාලෝක හිමියෝ ධර්මවිනය භාෂා ශාස්ත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ලැබූහ. වර්ෂ 1860 දී මහනුවර මල්වතු මහාවිහාර මංගල උපෝසථාගාරයේ දී අධිසීල සංඛ්‍යාත උපසම්පදා සම්පත්ති ප්‍රතිලාභය ලැබූ අතර එහි දී ඉදිරිපත් කළ අර්ථවත් පාලි නිබන්ධනය කෙරෙහි සංඝසභාවේ බලවත් ප්‍රසාදය පළ කෙරිණි.

උපසම්පදා සම්පත්ති ප්‍රතිලාභයෙන් පසු උන්වහන්සේ රත්මලාන පුරාණ රජමහා විහාරස්ථානයේ වැඩසිටිමින් එහි ප්‍රාචීන ශාස්ත්‍ර ශාලාවක් ඇති කළහ. එහි දී දිවයිනේ නන් දෙසින් පැමිණි ගිහි පැවිදි ශිෂ්‍යයන්ට තමා උගත් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා දුන්හ. උන්වහන්සේ සිදු කළ ලෝක ශාසනික සේවාවෙහි ස්වර්ණමය යුගය ආරම්භ වන්නේ එතැන් සිට යි. චිරරාත්‍රඥ මහතෙර නමක් ලෙස උන්වහන්සේ පිළිබඳ වූ කීර්තිරාවය රටපුරා පැතිරෙන්නට විය. ඒ අතර ධම්මාලෝක නාහිමි පිළිබඳ වෙසෙසින් පැහැදුණු කැලණිය ප්‍රදේශයේ ධර්මශාස්ත්‍රෝන්නතිකාමී සැදැහැවත් බෞද්ධ පිරිසක් වර්ෂ 1875 දී වස් විසීම සඳහා කැලණියේ දළුගමට වැඩම කරන ලෙස ආරාධනා කරන ලදුව උන්වහන්සේ එහි වැඩම වූහ. වස් වසන අතරතුර සැදැහැවතුන්ගේ බලවත් ඉල්ලීම පරිදි ප්‍රදේශයට අඩුවක් ව තිබූ විද්‍යාස්ථානයක් ආරම්භ කළහ. එය නමින් ''විද්‍යාලංකාර ශාස්ත්‍රශාලාව'' විය. එහි සමාරම්භක දිනය ලෙස සනිටුහන් වන්නේ වර්ෂ 1875 නොවැම්බර් 01 වන දිනය යි. මෙයින් උන්වහන්සේගේ ලෝක ශාසන සංග්‍රහය මල්පල ගැන්විණ.

මෙය උන්වහන්සේගේ ම වචනයෙන් කිවහොත් ශාස්ත්‍රශාලාවක් හා ධර්ම ශාලාවක් තැනීම යි. ශාස්ත්‍රශාලාව නම් පූර්වෝක්ත ''විද්‍යාලංකාර ශාස්ත්‍රශාලාව'' නොහොත් විද්‍යාලංකාර පිරිවෙණ යි. ධර්ම ශාලාව නම් ප්‍රාචීන ප්‍රතිචීන, භාෂා පිළිබඳ මෙන් ම නොයෙක් විෂයන් පිළිබඳ දැනුමින් පාරප්‍රාප්ත රත්මලානේ ධම්මාරාම හිමියන් වැනි උගත් ශිෂ්‍යවරයෙකු බිහි කිරීම යි.

කෙතෙක් කාර්යබහුල ජීවන රටාවක් ගෙන ගිය ද ශ්‍රී ධම්මාලෝක නාහිමි ශාස්ත්‍රීය ග්‍රන්ථ කරණය ද අත් නොහළේ ය. **රාජචරිතය, විනය කතිකාවත, සත්‍යවිලාසිනී, සංස්කෘත වරනැගිල්ල** ආදී ග්‍රන්ථ රැසක් රචනා කළ උන්වහන්සේ සිංහලයේ අක්ෂර වින්‍යාසය, න, ණ, ල, ළ ප්‍රයෝගය, පර්යේෂණ මාර්ගය, ග්‍රන්ථ සංශෝධන ග්‍රන්ථ සංස්කරණවිධි පිළිබඳ පළ කළ අදහස් එදත් අදත් වියත් පැසසුම් ලබති.

ශ්‍රී ධර්මාලෝක නාහිමි සිදු කළ අනුපමේය සේවාව පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ ආරම්භ කිරීම යි. එහි ම සංවර්ධිත අවස්ථාවක් සනිටුහන් කරමින් තත් විශ්වවිද්‍යාලය කැලණිය දළුගම ප්‍රදේශයට ගෙන යන ලදී. අද කැලණිය විශ්වවිද්‍යාලය නමින් හැඳින්වෙන්නේ එම විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය යි. ප්‍රාචීන අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් ලෙස විද්‍යාලංකාර පිරිවෙන් භූමියෙහි විද්‍යාලංකාර මහ පිරිවෙණ අද ද අභිමානවත් ව පවත්වාගෙන යාම සතුටට කරුණකි. මෙම විශ්වවිද්‍යාලය පිහිටුවීමේ දී ධම්මාලෝක නාහිමි තුළ පැවති උදාරාධ්‍යාසය නම් පරාධීනත්වයෙන් වැනසී ගිය ජාතික අධ්‍යාපනය, භාෂාව, ධර්ම ශාස්ත්‍ර හා ගිහි - පැවිදි සබැඳියාව ශක්තිමත් පදනමක් ඔස්සේ ගොඩනැගීම යි. වර්ෂ 1875 දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක බෞද්ධ පාඨශාලාව ආරම්භ කිරීම තුළින් උන්වහන්සේ බලාපොරොත්තු වූයේ මිෂනාරී අධ්‍යාපනයෙන් බෞද්ධ ළමා පරපුරත් බෞද්ධ ජනතාවත් සුරක්ෂිත කිරීම යි.

ශ්‍රී ධම්මාලෝක නාහිමියන්ට ගෞරවයක් ලෙස කැලණිය වරාගොඩ විද්‍යාලය ''ශ්‍රී ධම්මාලෝක විද්‍යාලය'' ලෙසත් එහි ම පවත්වාගෙන යන කැලණිපුර බෞද්ධ බල මණ්ඩලීය දහම් පාසල ''ශ්‍රී ධම්මාලෝක ධර්ම විද්‍යාලය'' ලෙසත් හැඳින්වේ.

අව්‍යාජ වූ ගැඹුරු පාණ්ඩිත්‍යයෙන් හෙබි ශ්‍රී ධම්මාලෝක මහාස්වාමීන්ද්‍ර චරිතය ගුණ සම්පත්තියෙන් ද අනූන වූ අයුරු මහාචාර්ය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියෝ මෙසේ විවරණය කරති.

''ලෝකයෙහි ඇතැමෙක් විද්‍යාධරයෝ ය, බහුශ්‍රැතයෝ ය. එහෙත් ඔවුහු ගුණවත්හු නොවෙති. තවත් සමහරෙක් ගුණ වෘද්ධයෝ ය. ප්‍රතිපත්තිගරුකයෝ ය. එහෙත් ඔවුහු නැණවත්හු නොවෙති. මෙසෙයින් ගුණයත් නැණයත් එක්තැන් වනුයේ කලාතුරෙකිනි. ගුණය නුවණෙහි ඵලය ලෙස සැලකිය හැකි වුව ද උගතුන් ගුණවතුන් වනු විරල ය. ගුණවතුන් උගතුන් වනු ද කලාතුරෙකිනි. එසේ කලට ගුණයට සරිලන නුවණත් නුවණට සරිලන ගුණයත් එක්තැන් වූ උතුමන් විරලවීම කවර ආශ්චර්යයෙක් ද? එසේ ද වුවත් රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහාස්වාමීන්ද්‍රයාණෝ ගුණවෘද්ධයෙකි. එසේ ම ඥාන වෘද්ධයෙකි.''

ධර්මශාස්ත්‍රෝද්දීපනය වෙනුවෙන් මුළු ජීවිතය ම කැප කළ රත්මලානේ ශ්‍රී ධම්මාලෝක මහාස්වාමීන්ද්‍රයන් වහන්සේ උපතින් සැට වස් පිරෙත් ම ගිලන් බවට පත්ව වර්ෂ 1887 අගෝස්තු 15 වන දින රාත්‍රී අපවත් වී වදාළ සේක. උන්වහන්සේගේ සාධු චරිතය ලොකු කුඩා සැවොම විමසා, කියවා, සිතා ආදර්ශයට ගත යුතු ඉතා දුර්ලභ උදාර චරිතයකි.

## හේන්පිටගෙදර ඤාණසීහ නාහිමි

ත්‍රිපිටක ධර්මය විෂයෙහි විවිධ අංශයන්හි විසිරී පැතිරී පැවැති දැනුම් සම්භාරයකින් සේ ම ඒ පිළිබඳ විස්තර කිරීමෙහි හා වෙනත් දර්ශනවාද සමග තුලනය කිරීමෙහි මනා කෞශල්‍යයකින් හෙබි හේන්පිටගෙදර ඤාණසීහ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෑතකාලීනව ලංකාවේ වැඩසිටි විද්වත් යතිවරයන් වහන්සේලා අතර විශිෂ්ඨ ස්ථානයක් උසුලති. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ මරඳගහමුල නගරාසන්නයේ පැරැණි සොඳුරු මිනිසුන් වසන ගමක් වෙයි. එය නමින් හේන්පිටගෙදර යි. එගම විසූ සම්භාවනීය පරපුරකින් පැවතෙන දෝන ඇලිස් ජයසිංහ හාමිනේගේත්, දොන් බස්තියන් පෙරේරා සකලසූරිය රාළහාමිගේත් තෙවෙනි පුත්‍ර රත්නය මෙලොව එළිය දුටුවේ වර්ෂ 1909 දෙසැම්බර් 18 වෙනිදා ය. සමරවීර සකලසූරිය ලෙස නම් ලැබූ ඔහු ලාබාල වියේ දී ම මූඩගමුවේ මාහිමි වෙත භාර කෙරිණි. කලක් ගතවීමෙන් පසු සාමණේර බණ දහම් සහ වත් පිළිවෙත් ආදිය පුරුදු පුහුණු කිරීම සඳහා ඔහු භාරදුන්නේ බලගල්ලේ සරස්වතී පරිවේණාධිපති හිස්සැල්ලේ ශ්‍රී ඤාණෝදය මාහිමියන් වෙත ය. හේන්පිටගෙදර බෞද්ධ මිශ්‍ර පාසලින් මූලික අධ්‍යාපනය ලබමින් සිටි සකලසූරිය කුමරු අධ්‍යාපනය විෂයෙහි දැක්වූයේ නෛසර්ගික කාර්යශූර භාවයකි.

මෙම කාලයෙහි ලංකාවේ දක්ෂතම ශිෂ්‍යයන්ගේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් අතහිත දීමට පිහිටුවා තිබූ ''බෙන්හැම්'' ශිෂ්‍යත්වයට කොළඹ දිස්ත්‍රික්කයෙන් තේරුණු එක ම ශිෂ්‍යයා මොහු ය. එම ශිෂ්‍යත්වයෙහි ස්වභාවය එංගලන්තයේ විශ්වවිද්‍යාලයක අධ්‍යාපනයෙන් අවසන්වීම යි. එහෙත් ඊට කැමැත්තක් නොදැක්වූ සකලසූරිය කුල කුමරු වර්ෂ 1919 ජනවාරි 18 වැනිදා හේන්පිටගෙදර ඤාණසීහ නමින් උතුම් වූ ප්‍රව්‍රජ්‍යාභාවයට පත්විය. ඉක්බිතිව බලගල්ලේ සරස්වතී පිරිවෙණට ඇතුළත් ව ධර්ම විනය, භාෂා ශාස්ත්‍රය මැනවින් හදාළේ ය. උන්වහන්සේ තුළ සහජයෙන් පැවැති ඉගෙනීමේ දක්ෂතාව වඩාත් ඔප මට්ටම් කරමින් ප්‍රාචීන ප්‍රාරම්භ හා මධ්‍යම පරීක්ෂණවල දී විශිෂ්ටතා මැනවින් ප්‍රකට කරමින් වර්ෂ 1939 දී ප්‍රාචීන අවසාන විභාගයෙන් උභයසේකර ස්වර්ණ මුද්‍රිකාව සහිතව රාජකීය පණ්ඩිත උපාධිය ලබා ගැනීමට සමත් වූහ. අනතුරුව ස්වකීය විද්‍යාස්ථානය වූ පූර්වෝක්ත බලගල්ල සරස්වතී පිරිවෙණෙහි ආචාර්යවරයෙකු වශයෙන් ද ක්‍රියා කරමින් ශාසනික, සාහිත්‍යයික හා ජාතික සේවාවන්හි නිරත වූහ. එම සේවාවන් ගිහි-පැවිදි සකල සත්පුරුෂ සාධු ජනයාගේ අපමණ ගෞරවාදරයට ලක්විණ. ඒ ඒ ප්‍රදේශවලට වැඩමවන ලෙස උන්වහන්සේට අපමණ ආරාධනා ලැබෙන්නට විය. ඒ අතර සරස්වතී පිරිවෙණෙහි ම ආදි ශිෂ්‍යයෙකු වූ රත්නපුර තිරිවානකැටියේ මූල මහා විහාරාධිපති එළමල්දෙණියේ සුමේධාලංකාර හිමියන්ගේ ඉල්ලීමට පමණක් හේන්පිටගෙදර හිමියෝ ප්‍රතිචාර දැක්වූහ.

ඒ අනුව වර්ෂ 1934 දී රත්නපුරයට වැඩම කළ උන්වහන්සේ එදා මුද්දුවේ තිබූ අම්බලම හා ඒ ආශ්‍රිත කුඩා බිම් තීරුවේ වර්ෂ 1934 අගොස්තු මස 26 වෙනිදා රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන ආරම්භ කළහ. රත්නපුර ශ්‍රී සුමන මහා විද්‍යාලය, ශ්‍රී සුමන බාලිකා

විද්‍යාලය, ඇහැළියගොඩ බුළුගහපිටිය ශ්‍රී සුමන විද්‍යාලය, තෙප්පනාව ශ්‍රී සුමන විද්‍යාලය, තුම්මෝදර ශ්‍රී සුමන විද්‍යාලය, ඉඟිනියාගල විද්‍යාරාජ පිරිවෙණ, වතුපිටිය සාරිපුත්ත පිරිවෙණ, මුවගම්කන්ද විද්‍යාලය, පාතකඩ බෞද්ධ විද්‍යාලය, සර්වෝදය ප්‍රජා නායකත්ව භික්ෂු පුහුණු ආයතනය ආදී ගිහි පැවිදි අධ්‍යාපන ආයතන ආරම්භ කිරීමට පුරෝගාමීව ක්‍රියා කළහ. මේ අතර වූ ශ්‍රී සුමන බාලිකා විද්‍යාලය දැනට ජාතික පාසලකි.

යම් යම් ජාතික ප්‍රශ්නවල දී අභීතව හා අව්‍යාජව සිය අදහස් පළ කිරීම නිසා හේන්පිටගෙදර හිමි වෙත මුලු රටේ ම අවධානය යොමු විය. වර්ෂ 1956 සිදු වූ දේශපාලන පෙරළියේ අදෘශ්‍යමාන බලවේගයක් වූයේ උන්වහන්සේ ය. ඒ නිසා ම වර්ෂ 1966 න් පසු වසර 03 යි මාස 04 යි  දින 14ක් කුමන්ත්‍රණ සැකකරුවෙකු ලෙස චෝදනා ලැබ සිරගත වී සිටින්නට ද සිදුවිය.

හේන්පිටගෙදර හිමි පිළිබඳ කතා කිරීමේ දී උන්වහන්සේගේ ග්‍රන්ථකරණය පිළිබඳ වෙසෙසින් සඳහන් කළයුතු ම ය. වර්ෂ 1946 දී එළිදැක්වූ 'දෙවියෝ' නම් කෘතියෙන් ග්‍රන්ථකරණයට පිවිසි උන්වහන්සේ ඉක්බිතිව පිළිවෙළින් 'සිංහල මේඝදූතය, අභිධර්ම පරීක්ෂණය, සද්ධර්ම ශතකම්, සිංහල රසුවංශය, මහරහතන් වහන්සේ, සියබස්ලකර විස්තර වර්ණනා, විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය, බෞද්ධදර්ශනය යනාදී ශාස්ත්‍රීය සංස්කරණ හා ග්‍රන්ථ ලියා පළ කළහ. බන්ධනාගාරගතව සිටිය දී ලත් විවේකයෙන් උපරිම ප්‍රයෝජනගත් හේන්පිටගෙදර හිමියෝ **ගාමිණීගීත නාම ජෙට්ඨගාමිණී චරිතය, මහා පැරකුම්බා සිරිත, මිනිසා සහ ජීවිත පරමාර්ථ, ලෝකය, සසර, බන්ධකවිනය, කලාව කුමක් පිණිස ද?, රූපා (නවකතාවකි), ශූන්‍යතාදර්ශනය, සත්ත්වයා පිරිසිදු වන්නේ කෙසේ ද?, හැඩගැසෙන චරිතය, ගැටලු තැන්, බුද්ධධර්මය හා බෞද්ධ සභ්‍යත්වය, දර්ශනය විද්‍යාව සහ බුද්ධාගම, උපාධියෙන් පසු, සත්ත්වයා, අභිධර්මය ප්‍රශ්න හා පිළිතුරු, බෞද්ධ සමාජවාදය, සිරකුඩුවක් තුළ දී** ඇතුළු ග්‍රන්ථ සම්භාරයක් රචනා කරමින් සිදුකළ ශාස්ත්‍රීය සේවාව විද්වත් ලෝකයාගේ අතිශය සම්භාවනාවට ලක්වූවකි.

සිංහලෙන් කවි ලිවීමටත් පාලියෙන් ගාථා සැදීමටත් සංස්කෘත ශ්ලෝකයන් ප්‍රබන්ධ කිරීමටත් එක සේ හුරු පුරුදු වූ පත්හිඳක් හේන්පිටගෙදර හිමියන් සතුව පැවතිණ. ප්‍රේමයත් සෞන්දර්යයත් එකට කැටි කොට නවකතා ලිවීම ද සාහිත්‍ය විචාරය ද, කවිත්වය ද උන්වහන්සේ තුළ වඩ වඩාත් කැපී පෙනුණු හැකියාවන් විය. පසු කලෙක ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ උසස් ම පදවියක් වූ අධිකරණ නායක පදවියට ද පත් වූ හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියෝ උදාර සාධු චරිතය ගිහි පැවිදි කාගේත් චරිත සංවර්ධනයෙහිලා කදිම පූර්වාදර්ශයක් සපයති.

## රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමි

ලක්දිව ථෙරවාද භික්ෂු පරපුරේ උදාර ගුණයන් මේ යැයි, මැනවින් ප්‍රකට කරමින් වැඩසිටි ධර්මවිනයධර ශික්ෂාකාමී අග්‍රගණ්‍ය මහායතිවරයන් වහන්සේ නමක ලෙස අතිපූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙරට ගිහි පැවිදි සකල සාධු ජනයා අතර බෙහෙවින් ගෞරවාදරයට ලක් වූහ. ලේඛන කලාව මගින් සම්බුදු සසුනෙහි චිරස්ථිතිය වෙනුවෙන් මෑත කාලීනව අද්විතීය මෙහෙවරක් සිදුකළ උන්වහන්සේ උපන්නේ බණ්ඩාරගම ප්‍රදේශය ආසන්නයේ අදිකාරී පත්තුවේ රයිගම් කෝරළයේ ''රේරුකාන'' නමැති සුන්දර ගම් පියසේ ය. දොන් බස්තියන් ද පවුලිස් ගුණවර්ධන හා මුණසිංහගේ පොඩිනෝනා යන පුණ්‍යවන්ත සැදැහැවත් දෙමව්පියන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය ලෙස වර්ෂ 1897 ජූලි මස 19 වෙනි දින රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමියෝ ජන්මලාභය ලැබූහ. ප්‍රාථමික අධ්‍යාපනය ලැබූවේ සමීපතම ගම වූ වීදියගොඩ පාසලෙනි.

එකල බුරුම ජාතික යූ. විනයාලංකාර හිමිපාණෝ හොරණ ප්‍රදේශයට වැඩමකොට කළුපහන නමැති කන්දේ ගල් ගුහාවක වැඩ සිටියහ. උන්වහන්සේ ව්‍යක්ත ලෙස සිංහල භාෂාව නොදැන සිටියත් දන්නා ප්‍රමාණයෙන් එකී ගම් වැසියන්ට ධර්ම දේශනා කළහ. පැවිදිකමේ අගය පෙන්වා දීම එම ධර්ම දේශනාවල විශේෂත්වයක් විය. බුරුමයේ සෑම පිරිමියෙකු ම තාවකාලිකව හෝ පැවිදි වීම පිළිබඳ වූ වටිනාකම මෙරට සැදැහැවතුන්ට පහදාදීම උන්වහන්සේගේ පරමාර්ථය වූ බව සිතිය හැකි ය. මේ නිසා ගම්වැසියෝ තම දරුවෙකු සසුන්ගත කිරීමට දැඩි කැමැත්තක් දැක් වූහ. එහි මාහැඟි ප්‍රතිඵලයක් ලෙස ගමේ කුල දරුවන් 27 දෙනෙක් පැවිදිවීමට කැමැත්ත පළ කළ හ. යූ. විනයාලංකාර හිමියෝ එකී 27 දෙනාට ම ආචාර්යවරයා වූහ. වර්ෂ 1906 ජනවාරි මස 08 වෙනිදා පැවිදි දිවියට ඇතුළත් වූ රූබෙල් ගුණවර්ධන කුල කුමරු ද මෙම පිරිසට අයත් වූ අතර ඔහුගේ ප්‍රව්‍රජ්‍යානාමය රේරුකානේ චන්ද්‍රවිමල නම් විය.

මෙම අභිනව සාමණේරයන් වහන්සේලා පිරිස වැඩි කලක් ලංකාවේ රැඳී නොසිටියහ. වර්ෂ 1908 ජනවාරි 27 වෙනිදා විනයාලංකාර හිමියන් විසින් උන්වහන්සේලා පිරිස බුරුම රටට (මියන්මාර්) කැඳවාගෙන යන ලදී. සිංහල භාෂාව විනා අන් භාෂාවක් නොදත් මෙම සාමණේර පිරිසට අධ්‍යාපනය ලැබීම කෙසේ වෙතත් එරට වැසියන් සමග එදිනෙදා කතාබහ පවා බෙහෙවින් දුෂ්කර විය. එහෙත් වැඩිකල් නොගොස් උන්වහන්සේලා බුරුම බස මැනවින් උගත්හ. බුරුම බසින් ම විනය, සූත්‍ර හා අභිධර්මය භික්ෂු ජීවිතයට අවශ්‍ය කරන ඇවතුම් පැවතුම් හා භාවනාව ද මැනවින් ප්‍රගුණ කළහ.

බුරුමයේ වියත් ධර්මවිනයධර භික්ෂූන් වහන්සේලා වෙතින් අධ්‍යාපනය ලැබූ මෙම සාමණේර පිරිස අතර රේරුකානේ හිමියෝ ඉතා දක්ෂ අන්දමින් ඉගෙනීමෙහි සමත්කම් දැක්වූහ. බුරුම භාෂාව ඉතා චතුර ලෙස කථා කිරීමටත්, මැනවින් ලිවීමටත්, කියවීමටත් දක්ෂයෙක් වූහ. බුරුමයේ දසවසරක සාර්ථක අධ්‍යාපනයක් ලැබූ රේරුකානේ හිමියෝ වර්ෂ 1917 ඔක්තෝම්බර් 26 වෙනිදා බුරුම රටේ ධම්මිකාරාම සීමාවේ දී අධිසීල සංඛ්‍යාත උපසම්පදා සම්පත්ති ප්‍රතිලාභය ලැබූහ. එයින් ටික කලකට පසු ලංකාවට වැඩම කළ උන්වහන්සේ දෙමටගොඩ මහා විශුද්ධාරාම පන්සලේ වැඩ සිටියහ. එහි වැඩසිටි සිරිධම්ම නමැති නාහිමි නමක් සිසු පිරිසකට අභිධර්මය උගන්වන ආකාරය බලා සිටි

රේරුකානේ හිමියෝ ටික දිනකින් සිංහල වඩාත් හොඳින් ප්‍රගුණ කොට එම පන්තියේ සිසුන්ට අභිධර්මය ඉගැන් වූහ. කුඩා අවධියේ බුරුමයට වැඩම කළ හෙයින් සිංහල භාෂාව පිළිබඳ හොඳ හැකියාවක් නොතිබූ උන්වහන්සේ ජාතකපොත, සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය වැනි පොත් කියවා සිංහල දැනුම වර්ධනය කර ගත්හ.

රේරුකානේ චන්දවිමල මහනාහිමියෝ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ 25කටත් වැඩි ප්‍රමාණයක් රචනා කළහ. එකී සෑම ග්‍රන්ථයක් ම ත්‍රිපිටකයේ කරුණු මතු කරමින් ඉතා සරලව ධර්ම විනය පිළිබඳ කිසිදු මත භේදයකට තුඩු නොදෙන ආකාරයෙන් රචනා කළ ඒවා ය. උන්වහන්සේගේ ව්‍යක්ත ලේඛන කෞශල්‍යය අනුව ලියූ දෙයක් නැවත කපා වැරදි නිවැරදි කිරීමටවත් කටු සටහන් ලියා පසුව නිවැරදිව ලිවීමටවත් කිසිදු අවශ්‍යතාවක් නොවුණි. ලියන දේ එක වතාවෙන් ම නිමකොට මුද්‍රණයට යැවීම මහනාහිමියන්ට හුරුපුරුදු ක්‍රමය යි. අද වනවිට උන්වහන්සේගේ ග්‍රන්ථ මාලාව මෙරට පමණක් නොව ලෝකයේ බොහෝ රටවල ද සිංහල ජනතාවගේ හස්තසාර ධර්ම ග්‍රන්ථ බවට නිතැතින් ම පත්ව ඇත. මෙම ග්‍රන්ථ මාලාව අතර **පොහොය දිනය, ධර්ම විනිශ්චය, බෞද්ධයාගේ අත්පොත, පාරමිතා ප්‍රකරණය, අභිධර්ම මාර්ගය, ශාසනාවතරණය, සූවිසි විවරණය, උපසම්පදා සීලය** යනාදී ග්‍රන්ථ ගිහි පැවිදි කා අතරත් බෙහෙවින් ම ජනප්‍රිය ය. උන්වහන්සේට මෙකී ධර්ම ශාස්ත්‍රීය සේවාව වෙනුවෙන් විශ්වවිද්‍යාල හා වෙනත් අධ්‍යාපන ආයතනාදියෙන් පිරිනැමූ උපාධි හා ගෞරවනාම රැසකි. ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් ''සම්මාන පණ්ඩිත'' උපාධියත් විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය මගින් අභිධර්මය පිළිබඳ මහාචාර්ය පදවියත්, තත් විශ්වවිද්‍යාලය මගින් ම ''සාහිත්‍ය චක්‍රවර්තී'' උපාධියත්, අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨය මගින් ''ප්‍රවචන විශාරද'' සම්මාන උපාධියත් පිරිනැමීම ඒ අතර ප්‍රධාන ය. එසේ ම වර්ෂ 1976 දී ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ මහානායක පදවියත්, වර්ෂ 1995 දී අමරපුර මහා සංඝසභාව මගින් ''අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසනශෝභන'' යන ගෞරව නාමයත් පිරිනැමිනි. මෙවන් උත්තරීතර උපාධි, ගෞරවනාම හා තනතුරු ලැබුව ද උන්වහන්සේ පිරිවෙන් හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා උපාධි සමත් කෙනෙකු නොවූ බව ද වෙසෙසින් සඳහන් කළ යුතු ය. බුරුමයේ පන්සල් අධ්‍යාපනයත් භාවනාව තුළින් ලැබූ දැනුමත් තුළින් ග්‍රන්ථ රචනා කළ උන්වහන්සේගේ දැනුම් සම්භාරය බෙහෙවින් ම අව්‍යාජ විය.

ලක්දිව සුපතල මහා අග්‍රගණ්‍ය යතිවරයෙකු වුව ද රේරුකානේ මහනාහිමියෝ සුඛෝපභෝගී දිවිපෙවෙතක් ගත නොකළහ. කුඩා කුටියක් තුළ පුටුවේ හිඳගෙන ඔප් නැගුණු සුවිසල් මේසයක් මත නොව කුඩා ලෑල්ලක් මත තබාගෙන පූර්වෝක්ත ධර්ම ග්‍රන්ථ රචනා කළ උන්වහන්සේගේ අල්පේච්ඡ ජීවිතය සැමට බෙහෙවින් ම ආදර්ශයට යෝග්‍ය ය. හුදෙක් ධර්ම දානය පිණිස ම නිස්සරණාධ්‍යාසයෙන් ධර්ම ග්‍රන්ථ රචනා කළ අතර ඒ එක ද පොතකින් වත් උන්වහන්සේ ආර්ථික ලාභයක් නොලැබූහ.

මෙසේ කලාතුරකින් පහළ වන ඉතා දුර්ලභ ගණයේ අග්‍රගණ්‍ය මහා යතිවරයෙකු වූ උන්වහන්සේ වර්ෂ 1997 ජූලි 04 වෙනිදා මනා සිහි නුවණින් යුක්තව අපවත් වී වදාළහ. ස්වකීය ආදාහනය සිදුකළ යුතු ආකාරය ජීවත්ව සිටිය දී ම ලියා තැබූ උන්වහන්සේගේ ඉල්ලීම වූයේ ලස්සන පෙට්ටියක තබා, කොඩි දමා, තොරණ ගසා මහා චිතක ඉදිකොට ලොකු ආදාහන උළෙලක් සිදු නොකළ යුතු බව යි. තමන් වහන්සේ දහවල් විවේක ගන්නා

කුඩා ඇඳ පිටින් ම ඔසවාගෙන ගොස් වත්තේ දර ගොඩක් ගසා ඒ මත තබා ආදාහනය කරන ලෙස එහි දන්වා තිබුණි. සිරුර දින ගණන් තබා නොගෙන දරගොඩ ගසා අවසන් වූ විගස ම ආදාහනය කොට අන් අයට දැනුම්දෙන ලෙස එහි සටහන් වී තිබිණ. එම ඉල්ලීම පරිදි ම රේරුකානේ මහනාහිමිගේ ආදාහනය ඉතා චාම් අයුරින් සිදු කොට පින් අනුමෝදන් කෙරිණි.

අතීත මහරහතන් වහන්සේලාගේ ආර්යසංඝ පරපුරෙන් පැවත එන මහා සංඝරත්නය එදා මෙන් ම අදත් ආදර්ශසම්පන්න දිවිපෙවෙත් හා උතුම් සමාජ මෙහෙවර තුළින් මුළුමහත් මානව සංහතියටම උදාර යුග මෙහෙවරත් සිදුකරති. ඒ උතුමන් වහන්සේලාගේ චරිතාදර්ශ කරගනිමින් නූතන සඟපරපුරට අභිමානවත් ඉදිරි ගමනක් උදා කරගත හැකි ය. සිප්සතර හදාරන කුඩා හිමිවරුනට උතුම් යතිවර පරපුර ජීවිතාදර්ශ කරගැනීමට අවශ්‍ය අවස්ථාව උදාකරදීම යුගයේ අවශ්‍යතාවකි.

**අභ්‍යාස**

01. වියත් යතිවරයාණන් වහන්සේලා පිළිබඳ හැදෑරීමේ වැදගත්කම ගැන ශිෂ්‍ය සමිතියේ කතාවක් පවත්වන්න.
02. මේ හැරුණුවිට තවත් ඔබ දන්නා සසුන බැබලවූ නූතන යතීන්ද්‍රයන් වහන්සේලාගේ නාමාවලියක් පිළියෙළ කරන්න.

# 06 පාඩම

# පරමාදර්ශී උපාසක උපාසිකා චරිත හඳුනා ගනිමු

## සුදත්ත (අනේපිඬු) සිටුතුමා

සුදත්ත සිටුතුමා බුදුසසුනේ අග්‍ර දායකයා ය. සැවැත්නුවර විසූ මහා ධනවතෙකු වූ එතුමා අනාථ වූ අසරණයන්ට ආහාරපානාදිය සපයා බොහෝ උදව් උපකාර කළේ ය. එම නිසා එතුමා අනාථපිණ්ඩික යන අන්වර්ථ නාමයෙන් ජනතාව අතර වඩාත් ප්‍රකට විය. එතුමාට මහා සුභද්‍රා, චුල්ල සුභද්‍රා හා සුමනා නමින් දියණිවරුන් තිදෙනෙකු හා කාල නමින් එක් පුතණු කෙනෙක් වූහ. සුදත්ත සිටුතුමා බෞද්ධයෙකු බවට පත්වීම අසිරිමත් කතා පුවතකි.

දිනක් සුදත්ත සිටුවරයා කිසියම් කාර්යයක් සඳහා රජගහනුවරට පැමිණියේ ය. රජගහනුවර සිටුමාලිගය බලා ගිය ඔහුට එදින එහි කිසියම් කලබලකාරී ස්වභාවයක් දක්නට ලැබුණි. ඊට හේතුව කවරේදැයි එතුමා රජගහනුවර සිටාණන්ගෙන් විමසී ය. එහි දී දැන ගැනීමට ලැබුණේ හෙට දිනයෙහි සිටුමැඳුරේ බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සංඝ රත්නය විෂයෙහි දානයක් පිරිනැමීමට කටයුතු සූදානම් වන බව යි. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී වැඩ සිටින බව සුදත්ත සිටුතුමා ඒ වනතුරු ම නොදත්තේ ය. එයින් ''බුද්ධ'' යන වචනය ඇසීමෙන් ම විස්මයට පත් වූයේ ය. බුද්ධ යන වචනය ඇසීමත් දුර්ලභ බව පැවසූ හේ එම බුද්ධෝත්තමයාණන් වහන්සේ දක්නට දැන්ම ම යා හැකි දැයි විමසී ය. එවිට රජගහනුවර සිටුවරයා ප්‍රකාශ කළේ දැන් රාත්‍රිය බැවින් හෙට දින උදෑසනින් ම බුදුරදුන් හමුවන ලෙස යි. එබැවින් හිමිදිරි පාන්දර ම බුදුරදුන් දැකීමට යන්නෙමි යි, සිතා සිටුතුමා නින්දට ගියේ ය. රාත්‍රිය පහන් වී ඇතැයි සිතා තෙවරක් ම නින්දෙන් අවදි වූ සුදත්ත සිටුතුමා තෙවැනිවර බුදුරදුන් දැකීම පිණිස පිටත්ව ගියේ ය. ඉතා අලුයම සිටුවරයා සීත වනයට පිවිසියේ ය. සක්මනෙහි යෙදී සිටි බුදුරජාණන් වහන්සේ සිටුවරයා සීත වනයට පිවිසෙනු දුරදී ම දුටු සේක. දැක ''සුදත්ත මෙහි එන්නැ'' යි, ඇමතූ සේක. බුදුරදුන් මාගේ නමින් ම අඬගසති යි, සිටුවරයා වඩාත් සතුටට පත් විය. ඉක්බිතිව බුදුරදුන්ගේ සිරිපා පියුම මත හිස තබා වැඳ ''ඔබවහන්සේ පෙර දින සුවසේ සැතපුණු සේක් දැ'' යි, විමසී ය.

එහි දී බුදුරදුන් දුන් පිළිතුර වූයේ ''කෙලෙස් නැසූ සිතේ ගිනි නොමැති, සියලු දුක් දුරු කළ උතුමෝ සුවසේ සැතපෙති'' යන්න යි. එම වචනය ඇසීමෙන් ම පෙර කළ පින් ඇති සිටුතුමා සෝවාන් විය. එසේ ම තමා දිවි ඇතිතාක් තෙරුවන් සරණගිය උපාසකයෙකු ලෙස පිළිගන්නා ලෙස ද ඉල්ලී ය. ඉමහත් චිත්ත සන්තෝෂයට පැමිණි සිටුතුමා සැවැත්නුවර වැඩමවා වස් වසන ලෙස ද බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ ය.

ඉක්බිති සිටුවරයා පෙරළා සැවැත්නුවරට පැමිණියේ ය. එහි විසූ ජේත නම් කුමරු ගේ උයන කහවණු දහඅට කෝටියක් ගෙවා මිළ දී ගත්තේ ය. තවත් දහඅට කෝටියක් වියදම් කොට විහාර, සෙනසුන්, උවටැන්හල්, වැසිකිළි, කැසිකිළි, සක්මන්මළු යනාදිය ද ඉදි කරවී ය. එය ජේතවනාරාමය ලෙස නම් කළ අතර එම මහා විහාරය මහල් සතකින් යුක්ත වූ බව ද සඳහන් වේ. තවත් කහවණු දහඅට කෝටියක් වියදම් කොට විහාරය



සඟසතු කොට පූජා කිරීමේ උත්සවය පැවැත් වී ය. මෙම ජේතවනාරාම පූජාව වෙනුවෙන් සිටුතුමා පනස් හතර කෝටියක් වියදම් කළේ ය. බුදුරජාණන් වහන්සේ සම්බුද්ධ පරිනිර්වාණය දක්වා ගත කළ වස් සතළිස් පහෙන් වස් දහඅටක් ම වැඩ වාසය කළේ අනේපිඬු සිටුතුමා කළ මෙම ජේතවනාරාමයේ ය. මේ නිසා ම සැවැත්නුවර නිදාන කොට (සාවත්ථි නිදානං) ත්‍රිපිටකයේ එන සූත්‍ර දේශනා බොහොමයක් දේශනා කොට තිබේ.

අනේපිඬු සිටුතුමා දිනකට දෙවතාවක් බුදුරදුන් හමුවට ගොස් බුද්ධෝපස්ථානය සිදු කළේ ය. එහෙත් ඒ කිසිදු අවස්ථාවක එතුමා බුදුරදුන්ගෙන් ප්‍රශ්න විමසීමට උනන්දු නොවූ බව කිය වේ. සිටුතුමා එසේ කළේ උන්වහන්සේ වෙහෙස ගැන්වීමට ඇති නොකැමැත්ත නිසා ය. දන්දීම වෙනුවෙන් ම සේදූ අත් ඇතිව සිටි එතුමා දිනපතා දන්දීමට ස්වකීය නිවසෙහි ආසන පන්සියයක් සූදානම් කොට තැබූ බව කිය වේ. සැදැහැති බෞද්ධයෙකු වූ එතුමා ධනෝපායනය නොකරමින් ධන විසර්ජනය ම සිදු කළේ ය. ස්වකීය ශක්ති ප්‍රමාණයෙන් බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට දන්දීම නොකඩවා සිදු කළේ ය. දන්දීම වැළැක්වීමට යම් ඉෂ්ටකාමී දේවතාවෙකු උත්සාහ කළ බවත් එම දේවතාවා පසුව සිය මාලිගයෙන් ඉවත් කිරීමට සිටුවරයා ක්‍රියා කළ බවත් බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. එය සිටුතුමා තුළ පැවති දානය සඳහා වූ නැඹුරුතාව තහවුරු වන සාධකයකි.

ස්වකීය දරුවන් සිව්දෙනා අතරින් කාල නම් වූ පුත්‍රයා පමණක් බුදුරදුන්ගේ ඇසුරට යොමු කරවීමට සිටුතුමා අසමත් විය. එයට සම්‍යක් උපායක් යෙදූ සිටුතුමා විහාරයට ගොස් එක් බණ පදයක් ඉගෙනගෙන පැමිණියහොත් කහවණු සියයක් ඔහුට ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දුණි. ඒ අනුව කාල එක් බණ පදයක් අසා එය මතකයේ රැඳුණු විගස විහාරයෙන් වහා පිටත් වීමේ අරමුණින් පිරිස් කෙළවර සිට බණ ඇසී ය. දේශනාව අවසන් වනතුරු එක් බණ පදයක්වත් ඔහුගේ මතකයේ නොරැඳෙන අධිෂ්ඨානයෙන් බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළහ. එබැවින් දේශනාව අවසන් වනතෙක් එක බණ පදයක් වත් මතකයට ගැනීමට කාල සිටුපුතුට නොහැකි විය. ඉතා උනන්දුවෙන් බණ ඇසූ නිසා ඔහු දේශනාව අවසානයත් සමඟ සෝවාන් ඵලයෙහි පිහිටියේ ය.

මේ අනුව මුළු සිටුපවුල ම බුදුදහමෙන් ලද ආලෝකය ඔස්සේ තෙරුවන් සරණ ගිය සැදැහැතියන් වීමටත් අධිගමයන්ට පත්වීමටත් ප්‍රධාන හේතුව නම් අනේපිඬු සිටුතුමා තුළ පැවැති අචල ශ්‍රද්ධා ගුණය යි. ප්‍රථම බෝධිරෝපණ පින්කම ද මෙතුමාගේ මූලිකත්වයෙන් ජේතවනාරාම භූමිය තුළ සිදු කෙරිණි. සිටුතුමා ස්වකීය ජීවිතාවසානයෙහි මියගොස් ඉපදුණේ අනාථපිණ්ඩික නම් දිව්‍යපුත්‍රයෙකු ලෙස යි. දෙව්ලොව සිට සෝවාන් වූ දෙවියෙකු ලෙස පැමිණ හෙතෙම නිරන්තරව ජේතවනාරාමය ප්‍රදක්ෂිණා කළේ ය.

## විසාඛා උපාසිකාව

සොළොස් මහා ජනපද අතර අංග ජනපදය එක් කුඩා රාජ්‍යයකි, ධනංජය එහි ප්‍රධාන සිටුවරයා ය. ඔහුගේ භාර්යාව වූයේ සුමනා සිටුදේවිය යි. එම දෙපළ ම තෙරුවන් සරණ ගිය ඉතා සැදැහැතියෝ වූහ. ඔවුන්ගේ දියණිය විසාඛා නම් වූවා ය. ඇය ස්වකීය මව හා පියා සේ ම තෙරුවන් සරණ ගොස් සිටි අතර දිනක් බුදුරදුන්ගෙන් බණ අසා සෝවාන් තත්ත්වයට ද පත් වූවා ය. ඇය ඒ වනවිට පසු වූයේ සත් හැවිරිදි වියේ ය. දෙමව්පියන්ගේ හා ඥාතීන්ගේ අපමණ ගෞරවාදරය ලබමින් විනීත ගති ඇතිව පංචකල්‍යාණයෙන් යුතු කුල කාන්තාවක් ලෙස ඇය වර්ධනය වූවා ය.

මේ අතර සැවැත්නුවර මිගාර සිටුවරයා තම පුත් පූර්ණවර්ධන කුමරුට සුදුසු කුමාරිකාවක සොයමින් සිටියේ ය. හේ විසාඛාවන් ගැන අසා ඇයගේ යහගුණයන් හා සුරූපී බව සලකා විවාහයට කටයුතු සූදානම් කළේ ය. එහි දී ධනංජය සිටුතුමා ස්වකීය දියණියට විවාහ දිවිය සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය වන අවවාද දහයක් ලබා දුනි. ඒවා සහ ඒවායින් කියවෙන අදහස් මෙසේය.

01. ඇතුළත ගිනි පිටත නොදෙන්න,
    ගෘහාශ්‍රිත ප්‍රශ්න පිටට නොකියන්න.
02. පිටත ගිනි ඇතුළට නොගන්න.
    බාහිර ප්‍රශ්න ගෙදරට නොගන්න.
03. දෙන අයට දෙන්න
    ණයට ලබා ගත් දේ නැවත දෙන අයට දෙන්න.
04. නොදෙන අයට නොදෙන්න.
    ණයට ලබාගත් දේ නැවත නොදෙන අයට නොදෙන්න.
05. දෙන අයටත් නොදෙන අයටත් දෙන්න.
    ඥාතීන්ටත් යාචකයන්ටත් ආපසු බලාපොරොත්තු යමක් නැතිව දෙන්න.
06. සුවසේ හිඳින්න.
    වැඩිහිටියන් එනවිට නොනැගිටිය යුතු තැන හිඳගන්න.
07. සුවසේ හිඳ අනුභව කරන්න.
    කාටත් ආහාර ලැබුණු බව දැන අනුභව කරන්න.
08. සුවසේ සැතපෙන්න.
    දොරගුළු පරීක්ෂාකොට කාටත් පසුව නින්දට යන්න.
09. ගිනි පිරිමසන්න.
    නැන්දා සහ මාමාත් සැමියාත් ගිනි සේ සලකා අතපසුවීම්වලින් වළකින්න.
10. ඇතුළත දෙවියන් පුදන්න.
    නැන්දා සහ මාමාටත් සැමියාටත් දෙවියන්ට සේ ගරු කරන්න. යනුයි.

මෙම අවවාද එදා විසාඛාවට සේ ම වත්මන් දියණිවරුන්ට ද එක සේ ගැලපෙන බව මනාව පෙනෙයි.

විවාහයෙන් පසු විසාඛාවන්ගේ යහපත්කම් පිළිබඳ අවබෝධ කර නොගත් ඇයගේ මාමණ්ඩිය වූ මිගාර සිටුවරයා ඇය කෙරෙහි ක්‍රියා කළේ කෝපයෙන් යුක්තව යි. ඊට හේතුව ඇතැම් ක්‍රියාකලාපයන් හා භාවිතාවන් ඔහු වැරදියට තේරුම් ගැනීම යි. විසාඛාවන්ගේ පියා ඇයට ලබාදුන් පූර්වෝක්ත අවවාද පිළිබඳ ව ද ඔහු සැක උපදවා ගත්තේ ය. මිගාර සිටුවරයා නිගණ්ඨ ශ්‍රාවකයෙකු විය. එහෙත් හේ පසුව කරුණු නිවැරදිව තේරුම් ගත්තේ ය. තෙරුවන් මුල් කරගත් පින්කම් නිවසේ දී ම සිදු කිරීමට විසාඛාවන්ට අවසරය ද ලබා දුන්නේ ය. මේ අතර දිනක් බුදුරජාණන් වහන්සේ සිටුමැදුරේ දී දේශනා කළ ධර්මය අසා මිගාර සිටුතුමා සෝවාන් තත්ත්වයට පත් වූයේ ය. තමා නිවැරදි මගට යොමු කළ විසාඛාවන් කෙරෙහි පැහැදුනු ඔහු එතැන් පටන් ඇය ස්වකීය මව් තනතුරෙහිලා සලකන්නට විය. විසාඛාව ''මිගාරමාතාව'' ලෙස ප්‍රකට වූයේ එතැන් සිට යි.



විසාඛා සිටු දියණියගේ පුරාකෘත පුණ්‍ය මහිමයෙන් දෙමව්පියන් ගෙන් ඇයට අගනා ආභරණයක් උරුම වුණි. රනින් නිමවා මැණික් එබ්බ වූ එය ''මහාලතා පසාදනය'' හෙවත් ''මේළ පළඳනාව'' නම් විය. දිනක් අතපසුවීමකින් ඇය එය බණමඩුවේ තබා ගියා ය. එය අනඳ තෙරුන් වහන්සේ සුරක්ෂිත කොට ලබා දුන්හ. එහෙත් භික්ෂු සංඝයා අතට පත් වූ දෙයක් නිසාවෙන් විසාඛාව එය නැවත ගැනීමට මැලි වූවා ය. කහවණු විසිහත් කෝටියකට මිල කොට එය විකුණා එම මුදලෙන් නව කෝටියක් වටිනා භූමි භාගයක් මිල දී ගත්තා ය. එහි තවත් නව කෝටියක් වියදම් කොට අගනා විහාරයක් ඉදි කර වූ එතුමිය එය සඟසතු කොට පිදීමේ පින්කම පැවැත්වූයේ තවත් නව කෝටියක් වියදම් කිරීමෙනි. එම විහාරය නගරයට පූර්ව දිශාවේ වූ බැවින් ''පූර්වාරාමය'' නම් විය. එසේ ම ''මිගාරමාතු ප්‍රාසාදය'' ලෙස ද හැඳින්විණ. බුදුරජාණන් වහන්සේ මෙහි වස්කාල සයක් වැඩ සිටිය හ.

සෝවන් ඵලලාභී මහෝපාසිකාවක වූ විසාඛා සිටුදේවිය දිනකට දෙවතාවක් විහාරයට ගියා ය. උදෑසන යනවිට එම අවස්ථාවට ගැලපෙන ලෙසත්, සවස් කාලයේ නම් එම අවස්ථාවට ගැලපෙන ලෙසත්, යමක් රැගෙන යාමට එතුමිය අමතක නො කළා ය. සාමණේර හිමිවරු එතුමිය පැමිණෙනු දැකීම ඉතා උනන්දුවෙන් බලාපොරොත්තුව සිටියහ. එතුමිය කුඩා හිමිවරුන් කෙරෙහි ක්‍රියා කළේ අපමණ මව් සෙනෙහසිනි. දාරක සෙනෙහස උතුරා ගිය මවක් වූ එතුමිය දූ පුතුන් විසි දෙනෙකු මෙලොවට ජනිත කළා ය.

වස් වසන භික්ෂූන් වහන්සේලාට වැසිසළු පූජා කිරීමට අනුමැතිය හිමිවන්නේ විසාඛා සිටුදේවියගේ ඉල්ලීමකට අනුව බව විනය පිටකයෙහි දක්වේ. එසේ ම භික්ෂුණීන් වහන්සේ සම්බන්ධ විනය ගැටලුවල දී ඒවා විසඳීමේ ප්‍රධානත්වය හිමි වූයේ ද විසාඛා මහෝපාසිකාවට ය. බුදුසසුනේ අග්‍රදායිකාව වූ විසාඛා සිටු දේවිය ශාසනයේ උන්නතිය වෙනුවෙන් අනුපමේය දායකත්වයක් දැක් වූ උත්තමාවියකි.

## අනගාරික ධර්මපාලතුමා

දහනව වෙනි සියවසේ මැද භාගය වනවිට ශ්‍රී ලාංකික බොහෝ දෙනා තුළ රට, ජාතිය හා ආගම පිළිබඳ වූ අභිමානයත් ආදරයත් බොහෝ සෙයින් ම යටපත් වී තිබුණි. දීර්ඝ කාලයක් ශ්‍රී ලංකාද්වීපය පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතිකයන්ට යටත්ව යටත් විජිතයක් ලෙස පැවතීම එයට හේතුව යි. එකල ඇතැම් බෞද්ධයෝ තමන් බෞද්ධ යැයි කීමට පවා ලජ්ජා වූහ. විදේශීය පාලනයක් පැවති අප ශ්‍රී ලංකාව තුළ බුද්ධාගම ඇදහීම සේ ම දේශීය නම් ගම් භාවිත කිරීම පවා සමච්චලයට ලක් කෙරිණි. ක්‍රිස්තියානි ආගම වැළඳගත් අයට රජයේ උසස් තනතුරු මෙන් ම යම් යම් ගරු නම්බුනාම ප්‍රදානය කෙරිණ. මේ නිසා ස්වකීය ආගම මෙන් ම සිංහල නම් ගම් හා සිරිත් විරිත් පවා බැහැරකොට ක්‍රියා කිරීමට බොහෝ සිංහලයෝ පෙළඹුණහ. බෞද්ධාගමික ක්‍රියාවන්හි නිරතවූවෝ ඒවා ඉතා රහසිගතව සිදු කළ හ. භික්ෂූන් වහන්සේලාට දන්දීම් ආදී දේ සිදු කළහොත් දඩ ගැසීම වැනි නීති පවා එකල සම්මත ව පැවතිණ. එබැවින් සැදැහැවත්හු ස්වකීය ආරක්ෂාව ද සලසා ගනිමින් දන්දීම් ආදිය ඉතා රහසිගතව සිදු කළහ.

මෙසේ අපේක්ෂා භංගත්වයෙන් හා ආත්ම විශ්වාසයෙන් තොරව ජීවත් වූ සිංහල ජනතාවට එම පරගැති වහල් භාවයෙන් මිදී නිදහස්ව, නිවහල්ව ජීවත්වීමට යෝග්‍ය පසුබිම සකස් කරදීමට සමත් අභීත වීරත්වයක් ජන්මයෙන් ම උරුම කරගෙන සිටි ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙක් වර්ෂ 1864 සැප්තැම්බර් මස 17 වෙනි දින ජන්මලාභය ලැබීය. ජාතියේ පිනින් පහළ වූ එම උදාර යුග පුරුෂයා අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ ය.

මාතර හිත්තැටියේ දොන් කරෝලිස් හේවාවිතාරණ මැතිතුමාගේ හා මල්ලිකා ධර්ම ගුණවර්ධන මැතිණියගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රරත්නය වූ ධර්මපාලතුමාට දෙමව්පියන් තැබූ නම දොන් ඩේවිඩ් හේවාවිතාරණ යන්න යි. මෙතුමාට බාල එඩ්මන්, සයිමන්, චාර්ලිස්, යනුවෙන් සොහොයුරන් තිදෙනෙකු හා සොහොයුරියන් දෙදෙනෙක් සිටියහ. දොන් ඩේවිඩ් හේවාවිතාරණ වර්ෂ 1872 සිට 1874 දක්වා බැප්ටිස්ට් සිංහල පාසලේත් 1874 සිට 1876 දක්වා ශාන්ත බෙනඩික් විද්‍යාලයේත් 1876 සිට 1878 දක්වා කෝට්ටේ ක්‍රිස්තියානි විද්‍යාලයේත්, 1878 සිට 1883 දක්වා ශාන්ත තෝමස් විද්‍යාලයේත් අධ්‍යාපනය ලැබුවේ ය. එම විද්‍යාස්ථානවල ඉගැන්වූයේ ක්‍රිස්තියානි ධර්මය යි. ඒ නිසා ම එකී ධර්මය ඉගෙනීමටත්, එහි එන ගීතිකා ගැයුමටත් ඔහුට සිදු විය. මෙසේ ඉගෙනුම ලබන අතරතුර දෙමව්පියන් ගේ තිබූ ධාර්මික බව නිසා ම ඔවුන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් පොහොය දිනවල විහාරස්ථානයට ගොස් උපෝසථ අෂ්ටාංගසීලය සමාදන්වීම ද හෙතෙම ඉතා උනන්දුවෙන් සිදු කළේ ය. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, පූජ්‍ය හෙයියන්තුඩුවේ දේවමිත්ත හිමි යන ධර්මධර තෙරවරුන්ගේ ඇසුරෙන් බුද්ධ ධර්මය හා බෞද්ධ වත්පිළිවෙත් පිළිබඳ ව හෙතෙම උසස් අවබෝධයක් අත්කරගෙන සිටියේ ය. මෙම විහාරස්ථාන හා පැවති සමීප ඇසුර ඔහුගේ ජීවිතය වෙනස් මගකට යොමු කරවීමට මංපෙත් විවර කළේ ය.

ලංකාවේ ඉපදුණ සිංහලයන් විදේශීය භාෂා හා ක්‍රිස්තියානි ධර්මය ඉගෙනගෙන පරගැති වහල් මානසිකත්වයක් ගොඩනගාගෙන භික්ෂූන් වහන්සේලාටත් බුදුදහමටත්

චෝදනා කරමින් බුදුදහමේ අඩු ලුහුඬුකම් ඇති බව පෙන්වාදෙමින් නිර්දය ලෙස විවේචනය කිරීම මෙකල ප්‍රසිද්ධියේ ම සිදු කෙරිණි. ඒ පිළිබඳ වූ බෞද්ධ හා අබෞද්ධ වාද විවාද රාශියක් ද තැනින් තැන පැවතිණ. පංචමහාවාද ලෙස වඩාත් ප්‍රකටව ඇත්තේ එම ප්‍රධාන වාද පහ යි. මේ අතර වර්ෂ 1873 දී ඇති වූ පානදුරාවාදය එකල වඩාත් ප්‍රසිද්ධියක් ඉසිලී ය. වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමියෝ වාදයෙහි පැවති මනා දක්ෂතාව නිසා ම ක්‍රිස්තු භක්තිකයන් හා තෙදිනක් වාදකොට ඔවුන්ගේ සියලු තර්ක බිඳ හෙළා පරාජයට පත් කළහ. පානදුරාවාදය ආදී වාදවලින් ලංකාවේ බෞද්ධයන් ජයග්‍රහණය කළ ඓතිහාසික පුවත ලංකාවේ පමණක් නොව ලෝකය පුරා ම ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කෙරිණි. එහි මාහැඟි ප්‍රතිඵලයක් වූයේ ඇමෙරිකානු ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා, බ්ලැවැට්ස්කි මැතිනිය නම් වූ රුසියානු ජාතික කාන්තාවක සමග ලංකාවට පැමිණීම යි.

එවැනි පසුබිමක් යටතේ ලංකාවට සැපත් ඕල්කට්තුමා ගාල්ල විජයානන්ද පිරිවෙන් විහාරස්ථානයේ දී තිසරණ සහිත පන්සිල් සමාදන්ව බුදුදහම වැළඳ ගත්තේ ය. ඉක්බිතිව ලංකාවේ දේශහිතෛෂී ශාසනමාමක පිරිස් සමග එකතුව ''පරම විඥානාර්ථ බෞද්ධ සංගමය'' ස්ථාපිත කළේ ය. ''සරසවි සඳරැස'' නම් පුවත්පත ආරම්භ වූයේ ද එහි ප්‍රතිඵලයක් ලෙස යි. තැනින් තැන සිදු කළ ඕල්කට්තුමාගේ දේශන අසා ඒ කෙරෙහි බෙහෙවින් ම ප්‍රසාදයට පත් ඩේවිඩ් තරුණයා දිගින් දිගට ම එතුමා සමග එක්ව ජාතික ආගමික කාර්යයන් හි නිරත වූයේ ය. වෙසෙසින් රටේ ඒ ඒ ප්‍රදේශයන්හි ගමන් කරමින් ඕල්කට්තුමා ඉංග්‍රීසි භාෂාවෙන් සිදු කළ දේශන එතුමා සිංහල භාෂාවට පරිවර්තනය කළේ ය. මෙතැන් පටන් ''ඩේවිඩ්'' යන විදේශීය නම ඉවත් කොට ''අනගාරික ධර්මපාල'' යන බෞද්ධ නම භාවිත කිරීමට එතුමා තීරණය කළේ ය.

ඕල්කට්තුමාත් අනගාරික ධර්මපාලතුමා ප්‍රමුඛ මෙම සත්පුරුෂ විද්වත් පිරිස අප රටේ දරුවන්ට මිෂනාරී අධ්‍යාපනය වෙනුවට බෞද්ධ අධ්‍යාපනයක් ලබාදිය යුතු ය, යන අරමුණ ඇතිව ක්‍රියා කළහ. ඒ වෙනුවෙන් රටේ විවිධ ප්‍රදේශවල විශේෂ රථයකින් ගමන් කරමින්, එම රථයේ ම රාත්‍රිය නිදා ගනිමින් රටේ ජනතාව දැනුවත් කිරීමට කළ කැප කිරීම ඉතා විශිෂ්ට ය. මෙකී රථයේ ''ගෙරි මස් නොකව්'' යනුවෙන් ලොකු අකුරින් සඳහන් කොට තිබිණ. ගවමස් කෑමට හා සුරා පානයට දැඩි ලෙස විරුද්ධව ක්‍රියා කළ ධර්මපාලතුමාගේ දේශන ඉතා දැඩි ස්වරයක් ගත්තේ ය. ඒ සිතේ පැවති දරුණු ස්වභාවයක් නොව අපේ බෞද්ධාගමටත්, ජාතියටත් තිබූ අව්‍යාජ අවංක භක්තිය හා ගෞරවය යි. මෙසේ කල්යත් ම ඕල්කට්තුමා සමග එක්ව මිෂනාරීන්ගේ නොමනා අධ්‍යාපනය වෙනුවට බෞද්ධ දරුවන්ට යෝග්‍ය අධ්‍යාපනයක් ලබාදීමේ උදාරාධ්‍යාසයෙන් ''ඉරිදා පාසල්'' ආරම්භ කළේ ය. අද කොළඹ ආනන්ද විද්‍යාලය නමින් ප්‍රකටව ඇත්තේ එසේ ආරම්භ කළ ඉරිදා පාසලකි. පරම විඥානාර්ථ සමාගම මගින් කෙටි කලක් තුළ පාසල් 50කටත් වැඩි ප්‍රමාණයක් ආරම්භ කරන ලදි. අප රටේ දරුවන්ට සිංහල බෞද්ධ අධ්‍යාපනයක් ලැබීමේ හිමිකම උරුම වූයේ ඒ අනුව යි.

වරෙක අනගාරික ධර්පාලතුමාට ජපන් ජාතික භික්ෂූන් වහන්සේ නමක සමග දඹදිව චාරිකාවක යාමට අවස්ථාව උදා විය. ඒ බෞද්ධයන්ගේ පරම වාසනා මහිමයකට ය. ඒ වනවිට ''මහන්තා'' නම් හින්දු පූජකයෙක් බුද්ධගයා භූමිය අත්පත් කරගෙන එය ස්වකීය අණසක යටතේ පාලනය කරගෙන ගියේ ය. එදා සම්මතව පැවතියේ එම බුද්ධගයා

භූමිය බෞද්ධයන්ට නොව හින්දූන්ට අයිති දෙයක් බව යි. මේ පිළිබඳ දැඩි සේ කම්පාවට පත් ධර්මපාලතුමා''කවදා හෝ මා මේ බුද්ධගයාව බේරා ගන්නවා'' යන අධිෂ්ඨානය ඇතිකර ගත්තේ ය. එහි මාහැඟි ප්‍රතිඵලයක් ලෙස ''සිංහලයිනි, නැගිටිවු. බුද්ධගයාව බේරා ගනිවු'' යන ආදර්ශ පාඨය මගින් සිංහලයන් පුබුදුවා ලෝකවාසී බෞද්ධයන්ගේ ද සහාය ලබාගෙන දැඩි පරිශ්‍රමයක් දරා දඹදිව බුද්ධගයාව ප්‍රමුඛ සෙසු සිද්ධස්ථානයන්හි උරුමය බෞද්ධයන්ට ලබා ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සම්පූර්ණ කළේ ය. එතුමාගේ එම අත්‍යුදාර සේවාවට පින් සිදු වන්නට අද අප සේ ම ලෝකවාසී බෞද්ධ ජනතාවත් නිදහසේ ගොස් දඹදිව සිද්ධස්ථාන වන්දනා කරති. එතුමා පහළ නොවන්නට බුද්ධගයාව නාමශේෂ බවට පත්වනු නො අනුමාන ය.

ලෝකවාසී සියලු බෞද්ධයන්ට ධර්මය ප්‍රචාරය කොට හැරීමේ උදාර පරමාර්ථයෙන් ධර්මපාලතුමාගේ මූලිකත්වයෙන් එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ විහාරය, කල්කටාවේ ධර්ම රාජික මහා විහාරය, බරණැස මූලගන්ධකුටි මහා විහාරය, බුද්ධගයාවේ හා මදුරාසියේ බෞද්ධ විශ්‍රාම ශාලා ආදී බොහෝ දේ ඉදි විය. එතුමා බොහෝ රටවලට ගොස් හරවත් දේශන පවත්වා බෞද්ධයන්ගේ ධර්මඥානය දියුණු කරවී ය. ස්වකීය දිවිමගේ 57 වෙනි වියට සැපත් වර්ෂ 1931 දී එතුමා අනගාරික ගිහි භවතෙකු ලෙස අවසන් දේශනය සිදු කළේ මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙණේ දී ය. පසුව ''සිරි දේවමිත්ත ධර්මපාල'' නමින් ප්‍රව්‍රජ්‍යාභාවයට පත් එතුමා දඹදිව බලා ගමන් ගත්තේ ය. වර්ෂ 1933 ජනවාරි 16 වැනිදා උපසම්පදාව ද ලැබී ය. ඉක්බිතිව සමස්ත බෞද්ධ ලෝකයා ම අප්‍රමාණ සංවේග යට පත් කරමින් වර්ෂ 1933 අප්‍රේල් මස 29 වෙනිදා සිරි දේවමිත්ත ධර්මපාල හිමියෝ මනා සිහිනුවණින් යුක්තව අපවත් වී වදාළහ. උන්වහන්සේගේ අවසාන ප්‍රාර්ථනාව වූයේ, ''සම්බුදුසසුන බේරා ගැනීමට තවත් විසි පස් වතාවක් මේ දඹදිව ඉපදේවා'' යන්න යි.

සිය ජීවිතයේ ළාබාල අවධියේ පටන් ම සිල් සමාදන් වෙමින්, විහාරස්ථාන ඇසුරු කරමින්, මැනවින් දහම් අධ්‍යාපනය ද ලබා සිය ජාතිය අවදි කරමින් සසුන පුබුදුවා ධර්මාලෝකය විහිදුවාලූ ලෝ ප්‍රකට කීර්තිධර අතිශ්‍රේෂ්ඨ මහෝත්තමයෙකු වූ අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්ගේ අත්‍යුදාර චරිතය ගිහි - පැවිදි අප සැමට ආදර්ශවත් ය.

**අභ්‍යාස**

01. සුදත්ත සිටුතුමා බුදුසසුනේ අග්‍ර දායකයා ලෙස පත් වූ ආකාරය පිළිබඳ කෙටි ධම්ම චින්තාවක් ඉදිරිපත් කරන්න.
02. ධනංජය සිටුතුමා විශාඛාවට දුන් ඔවදන් සහ එහි තේරුම් පිළිවෙළින් මතකයෙන් කියන්න.
03. වර්තමාන ජාතික ආගමික පුනරුදය උදෙසා අනගාරික ධර්මපාලතුමාගෙන් වූ මෙහෙය පිළිබඳ කෙටි රචනයක් ලියන්න.

07 පාඩම

# සම්බුදු සසුනෙහි ආයුෂය විනයයි

## විනය පිටකය

තථාගතයන් වහන්සේ ලොව පහළවීමත් සමග ධර්මානුධර්ම ප්‍රතිපතියෙහි නියැලෙන අනුගාමික පිරිසක් බිහිවූහ. ආයති සංවරය ඇතිකර ගනිමින් නිර්වාණාධිගමයට පත්වීම එම අනුගාමික ශ්‍රාවකයන් වහන්සේගේ එක ම අභිලාශය විය. එනිසා ම ඕවාදප්‍රාතිමෝක්ෂය සියලු භික්ෂු සංඝයාගේ පහසුව පිණිස ප්‍රමාණවත් විය. ආසවට්ඨානීය ධර්ම ශාසනය තුළ පහළවීමත් සමග විනය නීති පැණවීමේ අවශ්‍යතාව මතු විය. කෙලෙස් වැඩීමට හේතුවන කාරණා නම්,

| | | |
|---|---|---|
| **රත්තඤ්ඤු මහත්තතා** | - | **පැවිදි වී බොහෝ කල් වන භික්ෂූන් බහුල වීම.** |
| **වෙපුල්ල මහත්තතා** | - | **සංඝයා පිරිස වශයෙන් විශාල වීම.** |
| **ලාභග්ග මහත්තතා** | - | **ලාභ ප්‍රයෝජන බහුල වීම.** |
| **බාහුසච්ච මහත්තතා** | - | **බහුශ්‍රැතයන් වැඩිවීම.** |

යනාදියයි.

මෙබඳු කාරණා මුල්කොටගෙන භාග්‍යවතුන් වහන්සේ විනය ශික්ෂාපද පැනවූහ. විනය ශික්ෂා පැණවීමේ පූර්ණ බලය ශාස්තෲන් වහන්සේ සතුවිය. එහෙත් විනය ශික්ෂා කඩවන විට අවශ්‍ය පිළියම් යෙදීම භික්ෂු සංඝයාගේ වගකීමක් ලෙස ද පිළිගැනේ. විනය නීති පැණවීමේ අපේක්ෂා දහයක් පාරාජිකා පාළියේ දක්වේ.

| | |
|---|---|
| **සංඝසුට්ඨුතාය** | **- සංඝයාගේ යහපත් බව පිණිස** |
| **සංඝඵාසුතාය** | **- සංඝයාගේ පහසුව පිණිස** |
| **දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය** | **- දුස්සීල පුද්ගලයන්ට නිග්‍රහ පිණිස** |
| **පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය** | **- ශික්ෂාකාමී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස** |
| **දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය** | **- මෙලොවදී පැවතිය හැකි ආශ්‍රවයන්ගේ සංවරය පිණිස** |
| **සම්පරායිකානං ආසවානං පටිඝාතාය** | **- පරලොව පැවැත්මට හේතුවන ආශ්‍රවයන් නැසීම පිණිස** |
| **අප්පසන්නානං වා පසාදාය** | **- නොපැහැදුන අයගේ පැහැදීම පිණිස** |
| **පසන්නානං වා භීයොභාවාය** | **- පැහැදුන අයගේ වැඩි ප්‍රසාදය පිණිස** |
| **සද්ධම්මට්ඨිතියා** | **- සද්ධර්මයේ දිගුකාලීන පැවැත්ම පිණිස** |
| **විනයානුග්ගහාය** | **- සාසනික ශික්ෂාවට අනුග්‍රහය පිණිස** |

භික්ෂූන් වහනක්සේලාට නීති පණවා පීඩනයකට පත්කිරීම භාග්‍යවතුන් වහන්සේගේ අපේක්ෂාව නොවී ය. සංසාර දුක හැඳින සසුන්ගත වූ උන්වහන්සේලාට නිවැරදි ලෙසට ම නිවන කරා සමීපවීමට අවශ්‍ය ශික්ෂණය ලබාදීම විනය පැණවීමේ අපේක්ෂාව විය.

විනය යන්නෙහි සරල අර්ථය හික්මීම යි. මේ පිළිබඳ සමන්තපාසදිකා විනය අටුවාව මෙසේ විවරණයක් සපය යි.

**විවිධවිසෙස නයත්තා - විනයනතො චෙව කායවාචානං**
**විනයත්ථවිදූහි අයං - විනයො විනයොති අක්ඛාතො**

නොයෙක් විශේෂ නය ක්‍රම ඇති බැවින් හා කය වචනය හික්මවන බැවින් විනයාර්ථ දන්නවුන් විසින් මේ විනය විනයැයි කියන ලදී.

මෙහිදී විශේෂ නය ලෙස දක්වා ඇත්තේ පාතිමොක්ඛ උද්දෙස, පාරාජිකා ආදී ආපත්තිස්කන්ධ හා මාතිකා විභංග ආදී කොටස් ය. කය, වචනය, සංවර වීම විනය යි. ශික්ෂාපද රැකීම ඉන් අදහස් කරයි. එහෙත් ශික්ෂාපද පැණවීමෙන් කය වචනය දෙක හික්මවීමට අමතරව භික්ෂු සංඝයාගේ යහපතත්, ශාසනයේ පැවැත්මත් බුදුසමයේ ජීවයත් අපේක්ෂා කර ඇති බව පැහැදිලි ය.

බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවන්හි පණවන ලද විනයශික්ෂා විනය පිටකය ලෙස ප්‍රථම ධර්ම සංගායනාවේ දී ඒකරාශී කරගන්නා ලදී. විනය පිටකයේ නීතිමය අගය සැලකූ අට්ඨකථාචාරීන් වහන්සේ,

**ආඥාවිධාන බහුලකොට ඇති බැවින් - ආණාදෙසනා**
**අපරාධ චෝදනාවන්ට අනුරූපවන ලෙස දේශනා කර ඇති බැවින් - යථාපරාධ සාසන**
**කය වචනය දෙකෙහි සමස්ත සංවරය සිදු කරන බැවින් - සංවරාසංවර කතා**

යන තේරුම්වලින් එය හැඳින්වූහ.

මෙයින් සංවර විනය වශයෙන් වදාරා ඇති පැනවීම් සාසන බ්‍රහ්මචරියාවෙහි මූලය වන බැවින් ශාසනික ප්‍රතිපත්ති පුරන භික්ෂූන් වහන්සේ විසින් විනය ගෞරවාදරයෙන් යුතුව ම ආරක්ෂා කළ යුතු වේ.

තථාගත සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවූ විට ප්‍රථම ධර්ම සංගායනාව පවත්වන්නේ ශාසනභාරධාරී මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙනි. එහිදී විනයධාරීන් අතරින් අගතනතුරට පත් උපාලි මහරහතන් වහන්සේගෙන් විනය විමසන ලදි. උන්වහන්සේ බුදුරදුන් වදාළ විනය දේශනාවන් සියලු මහාසංඝයා ඉදිරියෙහි ප්‍රකාශ කළහ.

| උභතො විභංග | ඛන්ධක | පරිවාර |
|---|---|---|
| 1. පාරාජික පාළි<br>2. පාචිත්තිය පාළි | 1. මහාවග්ග පාළි<br>2. චුල්ලවග්ග පාළි | 1. පරිවාර පාළි |

විනය පිටකය ග්‍රන්ථ පහක් යටතේ සංග්‍රහ වී ඇත. විනයධාරී උපාලි මහරහතන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර විසින් විනය පිටකය ආරක්ෂා කිරීමේ භාරදූර කාර්යය සිදුකරන ලදි.

විනය පිටකය තුළ ඒ ඒ පුද්ගලයන් විසින් කරන ලද වැරදිවල ප්‍රමාණයට කරන ලද අනුශාසනා අන්තර්ගත වේ. වරදක් ඇති තැන පමණක් විනය පැණවීමක් දක්නට

ලැබෙයි. තිවැරැද්දෙහි විනය පැණවීම් නැත. වරක් සැරියුත් මහරහතන් වහන්සේ විනය පණවන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි අවස්ථාවේ දී ඒ සඳහා සුදුසු කාලය තමන් වහන්සේ දන්නා බව දේශනා කොට වදාළේ මේ හේතුව නිසා ය. ඒ නිසා සෑම විනය ප්‍රඥප්තියක් ම සනිදාන ය. හේතුවක් නැතිව පැණවූ කිසිදු විනය ප්‍රඥප්තියක් නොමැත. මෙය විනය පිටකයෙහි සුවිශේෂ අනන්‍ය ලක්ෂණයකි.

### විනය පිටකයේ අන්තර්ගතය

1. **පාරාජිකා පාළිය** - භික්ඛු විභංගයේ සතර පාරාජිකා, තෙළෙස් සංඝාදිසේස, අනියත දෙක, තිංස නිස්සග්ගිය පාචිත්තිය යන ශික්ෂාපද

2. **පාචිත්තිය පාළිය** - භික්ඛු විභංගයෙහි දෙඅනූවක් පාචිත්තිය, සතර පාටිදෙසනීය, සේඛියා පන්සැත්තෑව, සප්ත අධිකරණ සමථ හා භික්ඛුණී විභංගයෙහි සියලු ශික්ෂාපද

3. **මහා වග්ගපාළි** - මහාක්ඛන්ධක ආදී කොට ඇති ඛන්ධක දහයකි

1. මහාක්ඛන්ධක - පැවිදි කිරීම පිළිබඳ නීතිරීති.
2. උපොසථක්ඛන්ධක - උපෝසථ කර්ම, පාමොක් උදෙසීම් පිළිබඳ නිති රීති
3. වස්සූපනායිකක්ඛන්ධක - වස් එළඹීම පිළිබඳ නීති රීති
4. පවාරණක්ඛන්ධක - වස් පවාරණ කටයුතු පිළිබඳ නීති රීති
5. චම්මක්ඛන්ධක - පිරිකර, ආරාමික භාණ්ඩ පරිහරණය පිළිබඳ නීති රීති
6. භෙසජ්ජක්ඛන්ධක - බෙහෙත් වර්ග භාවිතාව පිළිබඳ නීති රීති
7. කඨිනක්ඛන්ධක - කඨිනය පිළිබඳ නීති
8. චීවරක්ඛන්ධක - සිවුරු පිළිබඳ නීති රීති
9. චම්පෙයාක්ඛන්ධක - සංඝකර්ම කරන විධි
10. කොසම්බක්ඛන්ධක - සංඝභේදවලදී අනුගමනය කළ යුතු අධිකරණ ක්‍රම

4. **චුල්ලවග්ග පාළි** - විනය ඛන්ධක දහය, පඤ්ච සතිකක්ඛන්ධකය හා සත්ත සතිකක්ඛන්ධකය

1. කම්මක්ඛන්ධක - භික්ෂූන් සඳහා පනවන ලද දඬුවම්
2. පාරිවාසක්ඛන්ධක - පිරිවෙස් පිරීම, වත් මානත් අබ්භාන කර්ම කිරීම
3. සමුච්චයක්ඛන්ධක - සංඝාදිසෙස ආපත්තිවලින් නැගී සිටීමට වත් මානත් අබ්භාන කර්මය කළයුතු සැටි
4. සමථක්ඛන්ධක - අධිකරණ සමථ විධි
5. ඛුද්දකවත්ථුක්ඛන්ධක - යාම්, ඊම්, හැඳීම්, පෙරවීම් පිළිබඳ විනය පැනවීම
6. සෙනාසනක්ඛන්ධක - සෙනසුන් පිළිබඳ පැනවීම
7. සංඝභෙදක්ඛන්ධක - සංඝයා භේද කිරීම පිළිබඳ කරුණු
8. වත්තක්ඛන්ධක - භික්ෂූන්ගේ වත් පිළිවෙත්
9. පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධක - පාමොක් උදෙසීම පිළිබඳ කරුණු
10. භික්ඛුණීක්ඛන්ධක - භික්ෂුණීන් පිළිබඳ කරුණු
11. පඤ්චසතිකක්ඛන්ධක - ප්‍රථම සංගීතිය පිළිබඳ වාර්තාව
12. සත්තසතිකක්ඛන්ධක - දෙවැනි සංගීතිය පිළිබඳ වාර්තාව

මේ ඛන්ධකවල දක්වෙන්නේ උභතො විභංගයෙහි මෙන් වැලකිය යුතු කරුණු ඇතුළත් ශික්ෂාවන් නොව භික්ෂු සමූහයාගේ මනා පැවැත්ම හා ජීවත් විය යුතු ආකාරය පිළිබඳ ව ය.

5. පරිවාර පාළි - **පරිවාර දහසයක් ඇතුළත් වේ. (සොළොස පරිවාර) උභතො විභංග හා ඛන්ධකවල එන කරුණු සංක්ෂිප්ත කොට දක්වීමක් පරිවාරයෙන් කෙරී ඇත.**

මේ අනුව විනය පිටකය අන්තර්ගත විෂයය අනුව උභතොවිභංග ඛන්ධක හා පරිවාර යනුවෙන් කොටස් තුනක් වශයෙන් ද පාරාජික පාළි පාචිත්තිය පාළි, මහාවග්ග පාළි, චුල්ලවග්ග පාළි, පරිවාර පාළි යනුවෙන් ග්‍රන්ථ පහක් වශයෙන් ද සංග්‍රහ වී ඇත.

භික්ෂූන්ගේ පිරිහීම, ඔවුන් දහමින් ඈත්වීමත් අනුව විටින් විට ශික්ෂා පද පණවන ලදින් විනය නීති බහුල විය. ඒ අනුව භික්ෂු සංඝයාගේ යහපත ම සලකා විනය නීති පණවා ඇති බව පැහැදිලිව පෙනේ. යම් විනය නීතියක් භික්ෂු සංඝයාගේ නිදහස්, පහසු පැවැත්මට අවහිරයක් වූ විට, පිළිපැදීමට අපහසු බව පෙනී ගිය විට බුදුරජාණන් වහන්සේ ඒවා සුදුසු පරිදි සංශෝධනය කළ සේක. නො එසේ නම් අහෝසි කළහ. කිසියම් කුල පුත්‍රයෙක් සසුනට පිවිසෙන්නේ ශ්‍රද්ධාවෙන් යුතු ව ශාසන බ්‍රහ්මචරියාවෙහි නියැලී සංසාර දුක නිම කර ගැනීම උදෙසා ය. ඒ නිසා ම භික්ෂූන් වහන්සේලාගේ ආයති සංවරය අවශ්‍ය ම අංගයක් වූ බැවින් විනය නීති මගින් එම අවශ්‍යතාව සම්පූර්ණ කර ඇත. සමාජයක් වශයෙන් භික්ෂූන් වහන්සේගේ සාමූහික සහජීවනය පිණිස මග පෙන්වීම විනයෙහි අනෙක් අරමුණයි. භික්ෂු සංඝයාගේ සමගිය සැපයකි. උන්වහන්සේලා එකිනෙකා කෙරෙහි ප්‍රියශීලීව අන්‍යෝන්‍ය විශ්වාසය ඇතිව සමානාත්මතාවෙන් යුතුව එකිනෙකා නොඉක්මවා ක්‍රියා කරනු දැකීම බුදුරජාණන් වහන්සේගේ අපේක්ෂාවක් විය. එම අපේක්ෂා විනය මගින් සම්පූර්ණ කර ඇති බව පැහැදිලිය. විනය ශාසනයෙහි ආයුෂය බවට පත්වන්නේ එබැවිනි. සියලු භික්ෂූන් වහන්සේ මේ පිළිබඳ නිසි අවබෝධයෙන් යුතු ව විනය ගරුක ව ක්‍රියාකරන්නේ නම් එය සමස්ත ශාසනයේ දිගුකාලීන පැවැත්මට හේතුවක් වනු ඇත.

**අභ්‍යාස**

01. විනය යනු කුමක්දැයි නිර්වචනයක් සපයන්න.
02. විනය පිටකයේ ක්‍රම විකාශය සාකච්ඡා කරන්න.
03. ''විනය සම්බුදුසසුනේ ආයුෂයි'' පුවත්පතකට ලිපියක් සම්පාදනය කරන්න.

08
පාඩම

# සසුන්කෙත සරු කරන උපසම්පදාව

## හැඳින්වීම

බෞද්ධ භික්ෂූන් වහන්සේගේ පැවිදි දිවියෙහි අතිශයින් ම වැදගත් අවස්ථාව වනුයේ උපසම්පදාව යි. භික්ෂූන් වහන්සේට භික්ෂු සමාජයේ පූර්ණ සාමාජිකත්වය හිමිවන්නේ මෙම විනය කර්මයත් සමඟිනි. උපසම්පත්ති ප්‍රතිලාභයෙන් යුතු භික්ෂුව ම ''භික්ඛුසංඝ'' යන පිරිසට අයත් වේ. උපසම්පදාව යනු සාමණේර පැවිද්දට අනතුරුව උසස් සීල ප්‍රතිපදාවකට පත්වීමෙන් ලබන තත්ත්වයකි. උප+සං+පද ධාතුවෙන් නිපන් උපසම්පදා යන වචනයේ දළ අදහස

01. වගකීම් සහිත නියම භික්ෂුත්වයට එළඹවීම
02. සාමණේර බවින් ඔසවා තැබීම
03. අධිශීලයට පත්වීම

උපසම්පදා සීලය කෝටියක් සංවර සීලය ලෙස හඳුන්වා ඇත. මේ අනුව උපසම්පදාව යනු සීලයේ උපරිම තත්ත්වයට පත්වීම යි. එනිසා එයට අධිසීලයැයි ද කියනු ලැබේ.

උපසම්පදා විනය කර්මය යනු කුමක්දැයි හඳුනා ගැනීම ද ඉතා වැදගත් ය.

සාමාන්‍යයෙන් කුලපුත්‍රයෙකු සසුනට ඇතුලත් කරගන්නේ සාමණේර නමක් වශයෙනි. එහිදී උන්වහන්සේ දසසිල් හා සේඛියා ශික්ෂාවන්හි හික්මිය යුතු ය. පිරිත් බණදහම් වණපොත් කළ යුතු ය. සතර කමටහන් භාවනා පුහුණු විය යුතු ය. දිනචරියා වත්පිළිවෙත් පුරුදුවිය යුතු ය. බුද්ධ පූජා, බුද්ධ වන්දනා අනුමෝදනා ප්‍රගුණ කළ යුතු ය. එසේ ම දසධම්ම සූත්‍රයේ එන දහම් නිතර සිහිකරමින් ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලාට කීකරුව නොපහන් අයගේ පැහැදීමටත් පහන් අයගේ ප්‍රසාදය වැඩිදියුණුවීමටත් හේතුවන අයුරින් සංවරව කල් ගෙවිය යුතු ය.

මෙකී සීලාචාර ධර්ම ප්‍රගුණ කළ සාමණේර නමක් වයසින් විසිවයස් පිරී ඇත්නම් උපසම්පදාව ලැබීමට සුදුස්සෙක් වේ. උපසම්පදාවට පෙර උන්වහන්සේ ප්‍රාතිමොක්ෂය පාඩම් කළ යුතු ය. ධම්මපදය අර්ථ නිදාන කතා සමග පාඩම් කළ යුතු ය. සුදුසුකම් සපිරූ සාමණේරයන් වහන්සේ නමක් උපසම්පදා කරන්නේ විනය කර්මයකිනි. එය සිදුකරන්නේ සීමාමාලකයක විසිනමකට අධික උපසම්පදා භික්ෂූන් හමුවේ ය. එම විනය කර්මය හඳුන්වන්නේ **ඤත්ති චතුත්ථ කම්ම** නමිනි. ඤත්තිය යනු මේ උපසම්පදාපේක්ෂකයා අසවල් තෙරුන්ගේ උපාධ්‍යායත්වයෙන් උපසම්පදාව බලාපොරොත්තු වන්නේ යැයි කර්ම වාක්‍යය කියන භික්ෂූන් දෙනමක් විසින් සංඝයාට දැනුම්දීමයි. අනතුරුව ඒ අපේක්ෂකයා උපසම්පදා කරනු ලබන බවත් ඊට කැමති නම් සංඝයා නිහඬවන ලෙසත් අකමැති නම්

පවසන ලෙසත් තෙවරක් ප්‍රකාශ කෙරේ. මෙසේ ඤත්තිය සමග කර්ම වාක්‍යය සතරවරක් ප්‍රකාශ කෙරෙන නිසා ඤත්ති චතුත්ථ කර්මය යැයි කියනු ලැබේ. එහිදී සංඝයා නිහඬ වූයේ නම් ඒ භික්ෂුව උපසම්පදා වූයේ වෙයි. එතැන් පටන් උන්වහන්සේ උපසම්පදා සීලය පිරිය යුතු වන්නේ ය.

එම සීලය සතරාකාර වේ.

1. ප්‍රාතිමෝක්ෂර සංවර ශීලය
2. ඉන්ද්‍රියසංවර ශීලය
3. ආජීවපාරිශුද්ධි ශීලය
4. ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය

භික්ෂු භික්ෂුණීන්ගේ සංවරය උදෙසා දේශනා කරන ලද ශික්ෂාපද දෙසිය විසි හතක් ප්‍රතිමෝක්ෂ සංවර සීලයට අන්තර්ගත වෙයි. ඉන්ද්‍රිය සංවර සීලය යනු ඇසින් රූප දැක නිමිති වශයෙන් නො ගැනීම ආදී වශයෙන් පංච ඉන්ද්‍රියයන් සංවර කර ගැනීම යි. ජීවන පිළිවෙත පිරිසිදුව තබා ගැනීම ආජීවපාරිශුද්ධ සීලය වන අතර ප්‍රත්‍යවේක්ෂාවෙන් යුක්තව ප්‍රත්‍ය පරිභෝග කිරීම ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය නම් වේ. ඒ අනුව පඤ්චසීලය, අෂ්ටාංග සීලය, දස සීලය, ආදි සියලු ම සීලයන්ට වඩා චතුපාරිශුද්ධි සීලය උසස් වන බැවින් අධිසීලය වශයෙන් හඳුන්වනු ලැබේ. මෙසේ සතර සංවර සීලයෙන් යුතුව පැවතීම උපසම්පදා භික්ෂුවගේ පිළිවෙතයි.

## උපසම්පදාවෙහි ආරම්භය

ආරම්භයේ දී බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා පැහැදුණු බොහෝ පිරිස් බුදුසසුනට එකතු වූහ. උන්වහන්සේගේ ධර්ම දේශනා අසා පැහැදුණු පිරිස ''අද පටන් මා හට ඔබ වහන්සේගේ සමීපයෙහි පැවිදි උපසම්පදාව ලබා දෙන මැනවැ'යි ආයාචනා කර සිටියහ. එම අවස්ථාවෙහි බුදුරජාණන් වහන්සේ ''මහණ මෙහි එන්න. මැනවින් දුක් කෙළවර කරනු පිණිස මේ බඹසරෙහි හැසිරෙන්නැ'යි'' වදාරා **''එහිභික්ඛු උපසම්පදාව''** ලබා දුන්හ. පස්වග තවුසන්ගෙන් ඇරඹි බුදුසසුනේ මුල් කාලයේ දී පැවිද්ද හා උපසම්පදාව වශයෙන් අවස්ථා දෙකක් නොවී ය. පැවතියේ පැවිද්දත් සමග එකවර උපසම්පදාව ලබා දීමේ ක්‍රමය යි. දෙවනුව සරණාගමන පැවිද්ද හඳුන්වා දෙන ලදි. විවිධ පුද්ගලයන් සසුනට එකතු වීම නිසා ගැටලු ඇති වූ අතර ඔවුන් පාලනය කිරීම පිණිස ආචාර්ය උපාධ්‍යාය වශයෙන් දෙදෙනකු අනුදැන වදාරන ලදි. මේ සමග ම ගුරුවරුන් සිය ශිෂ්‍යයන්ට දරුවන්ට සේ සැලකිය යුතු වූ නිසා සාමණේර නමින් නවක පැවිද්ද හැඳින්විණි. පුහුණුවකින් පසු වයස විස්සක් පිරුණු සාමණේරවරු උපසම්පදා තත්ත්වයට පත්කරනු ලැබූහ.

මුල් අවධියේ දී උපසම්පදාව ලබාදීමේ බලය බුදුරජාණන් වහන්සේ පමණක් සතුවිය. මේ නිසා පැවිදි උපසම්පදා කිරීමට ඉදිරිපත් වූ පිරිස දුර බැහැර ගෙවා ඉතා අපහසුවෙන් බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කෙරිණි. එසේ පැමිණීමේ දී උපසම්පදාපේක්ෂකයන් සහ ධර්ම ප්‍රචාරක භික්ෂූන් යන සියල්ලෝ ම අපහසුතාවට පත් වූ බව මහාවග්ගපාළියෙහි සඳහන් වේ. මෙම හේතුව නිසා බුදුරජාණන් වහන්සේට පැවිදි උපසම්පදා කිරීම සඳහා

තමන් වහන්සේ සතු ව පැවති බලය විමධ්‍යගත කිරීමට සිදුවිය. ඒ ඒ දිශාවල දී ඒ ඒ ජනපදවල දී පැවිදි උපසම්පදා කිරීමෙහි බලය භික්ෂූන් වෙත ම පවරා දුන්හ. මේ අනුව උපසම්පදා කිරීමේ කාර්යය ඒහිභික්ඛු උපසම්පදාවෙන් ආරම්භ වී ඉතා කෙටි කාලයකින් ව්‍යාප්ත විය. මෙසේ උපසම්පදා කිරීමේ බලය විමධ්‍යගත කිරීමෙන් පසුව ද විවිධ ගැටලු මතු වූ අතර බුදුරජාණන් වහන්සේ ඒවාට ද විසඳුම් ලබාදුන්හ. උපසම්පදාවට සහභාගි විය යුතු භික්ෂූන්ගේ සංඛ්‍යාව පිළිබඳ මුල දී ගැටලු ඇති විය. මුල් කාලයේ දී දහ නමකගෙන් උපසම්පදා විනය කර්මයක් කළ හැකි බව අනුදත් බුදුරජාණන් වහන්සේ පසු කාලය වනවිට එය භික්ෂූන් පස් නමක් දක්වා අඩුකරන ලදී. ප්‍රත්‍යන්ත ප්‍රදේශවල භික්ෂූන් වහන්සේලාගේ හිඟකම එයට හේතුව විය.

### විවිධ උපසම්පදා ක්‍රම

බුදුරජාණන් වහන්සේ ඒහිභික්ඛු උපසම්පදාව හැරුණුවිට යම් යම් පුද්ගලයන් සඳහා අවස්ථානුකූලව විවිධ පැවිදි උපසම්පදා ක්‍රම භාවිත කළ සේක. සෝපාක සාමණේර හිමිය-න් වැනි හත්හැවිරිදි අයට ''එක නාම කිං?'' ආදි ප්‍රශ්න ඇසීමෙන් පැවිද්දන් උපසම්පදාවන් දී ඇත. එය පඤ්හව්‍යාකරණ උපසම්පදා නම්. ප්‍රජාපතී ගෝතමිය ඇතුළු පිරිසට අෂ්ට ගරුධර්ම පිළිගැනීම ම පැවිද්ද හා උපසම්පදාව විය. මෙබඳු ක්‍රම අටක් පිළිබඳ ශාසන ඉතිහාසයේ සඳහන් වේ.

1. **ඒහිභික්ඛු උපසම්පදාව**
   **(බුදුරජාණන් වහන්සේ විසින් ම ලබාදුන් උපසම්පදා ක්‍රමය)**
2. **සරණාගමන උපසම්පදාව**
   **(තිසරණය සමාදන් කරවීමෙන් ලබාදෙන උපසම්පදා ක්‍රමය)**
3. **ඕවාද පටිග්ගහන උපසම්පදාව**
   **(බුදුරජාණන් වහන්සේ විසින් අවවාද කරන ලදුව එම අවවාද පිළිගැනීමත් සමග ම ලැබෙන උපසම්පදාව)**
4. **පඤ්හව්‍යාකරණ උපසම්පදාව**
   **(බුදුරජාණන් වහන්සේ විසින් අසන ලද ප්‍රශ්නවලට නිසි පිළිතුරු ලැබීමෙන් පසුව ලබාදෙන උපසම්පදා)**
5. **ගරුධම්ම පටිග්ගහන උපසම්පදාව**
   **(ගරුධර්ම අට පිළිගැනීමෙන් ලැබෙන උපසම්පදාව)**
6. **දූතේන උපසම්පදාව**
   **(දූතයකු මාර්ගයෙන් යවන උපසම්පදාව)**
7. **අට්ඨවාචක උපසම්පදාව**
   **(භික්ෂු භික්ෂුණී යන උභතෝසංඝයා ඉදිරියේ දී ධර්ම කාරණා අටක් අසා ඒවාට පිළිතුරු ලබා ගැනීමෙන් පසුව ලැබෙන උපසම්පදාව)**
8. **ඤත්ති චතුත්ථකම්ම උපසම්පදාව**
   **(ඤත්තියත් සමග කර්ම වාක්‍යය කීමෙන්)**

## උපසම්පදා චාරිත්‍රය (විනය කර්මය) සිදු කිරීම

සාමණේරයන් වහන්සේ නමකට සංඝ සමාජයේ පූර්ණ සාමාජිකත්වය උපසම්පදා විනය කර්මය මගින් හිමි වේ. විසිවස සම්පූර්ණ වූ පසු ආචාර්ය උපාධ්‍යායන් ඇතුළු භික්ෂූන් වහන්සේලා මධ්‍යයේ සිදු කෙරෙන සුවිශේෂිත ම විනය කර්මය මෙය වන්නේ ය. එය විශේෂ සීමාවක ඉමහත් ගෞරවයෙන් සිදු කෙරෙන්නෙකි. මේ සඳහා විශේෂ සීමා දෙකකි. එනම්,

01. බද්ධ සීමාව 02. උදකුක්ඛේප සීමාව

වශයෙනි.

මෙම විනය කර්මය සඳහා සහභාගි වන්නේ උපසම්පදා භික්ෂූන් හා උපසම්පදා අපේක්ෂකයන් පමණි. උපසම්පදා අපේක්ෂකයා පන්සිල් ගෙන සුදුවතින් හා සළුවෙන් සැරසී පාත්‍රා සිවුරු සහිතව සංඝයා වෙත පැමිණ පළමු කොට සාමණේර පැවිද්ද ලබයි. අනතුරුව එම සංඝයා අතරින් ජ්‍යෙෂ්ඨ තෙර නමකට තම උපාධ්‍යායන් වහන්සේ වශයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටී. මෙය 'උපජ්ඣාය ගහණ' නමින් හැඳින්වේ. ඇරයුම පිළිගන්නා උපාධ්‍යායන් වහන්සේ මෙම උපසම්පදා කර්මය අවසන් වන තුරු ම හඳුන්වනු ලබන්නේ 'තිස්ස' නමිනි. 'නාග' නමින් උපසම්පදා අපේක්ෂකයා හැඳින්වීම සිරිත යි. ඇතැම් නිකාය සම්ප්‍රදායයන්හි තිස්ස හා නාග යන ව්‍යවහාර වෙනුවට අදාළ උපාධ්‍යායන් වහන්සේගේ හා උපසම්පදාපේක්ෂකයාගේ නම යොදා ගැනේ.

අනතුරුව කර්මාචාර්ය නමින් හැඳින්වෙන භික්ෂුවක් හෝ භික්ෂූන් තෙනමක් නාගට උපදෙස් දීම සඳහා මහා සංඝයාගෙන් අවසර පතති. එම අවසරය ලද පසු නාග මහා සංඝයාගෙන් ඉවත් කොට, අටපිරිකර හඳුන්වා දී සංඝයා ඉදිරියේ අන්තරායික ධර්ම නමැති ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරය කර්මවාගාචාර්යන් විසින් කියා දෙනු ලැබේ. ''අන්තරායික ධර්ම'' නමැති ප්‍රශ්නවලට ඇතුළත් වන්නේ උපසම්පදා අපේක්ෂකයාගේ සෞඛ්‍ය පිළිබඳ ව අසන ප්‍රශ්නත් ඔහු සමාජ බැඳීම් හා වගකීම්වලින් යුක්ත කෙනෙක් දැයි විමසා බැලීමට අසනු ලබන ප්‍රශ්නත් ය.

නැවත වරක් නාග මහා සංඝයා වෙත කැඳවනු ලැබේ. නාග චාරිත්‍රානුකූලව මහා සංඝයාගේ පා වැඳ ඇඳිලි බැඳ උක්කුටිකයෙන් හිඳ ''ස්වාමීනි, සංඝයාගෙන් උපසම්පදාව ඉල්ලමි. අනුකම්පා කොට මා සාමණේර භාවයෙන් මුදාවා'' යනුවෙන් තෙවරක් අයැද සිටියි. ඉක්බිති කර්මාචාර්යන් වහන්සේ නාගගෙන් අන්තරායික ධර්ම පිළිබඳ ප්‍රශ්න ඇසීමට මහා සංඝයාගෙන් අවසර ලබා ගෙන එම ප්‍රශ්න විචාරත්. නාගයාගේ පිළිතුරුවලින් මහා සංඝයා සෑහීමකට පත්වුවහොත් උපසම්පදා කර්මයට අනුමැතිය ලැබෙන්නේ ය. අන්තරායිකර ධර්ම විචාරීමෙන් පසු ඤත්ති චතුත්‍ථ කම්ම වාක්‍යයෙන් උපසම්පදා කළ යුතු ය.

## උපසම්පදාව අවසානයේ කරනු ලබන දේශනාව

### අකරණීය ධර්ම හෙවත් පාරාජිකා

අකරණීය ධර්ම හෙවත් උපසපන් භික්ෂුවක විසින් දිවිහිමියෙන් නොකළයුතු ධර්ම හතරකි. එනම් සතර පාරාජිකාවන් ය. පරාජය වීම පාරාජිකා යන්නෙහි සරලාර්ථය යි. භික්ෂුත්වයෙන් පරාජය වීම හෙවත් පැවිද්ද අහිමි වීම මෙයින් ගම්‍යමාන ය. කිසියම් හෝ පාරාජිකාවකට හසුවුණු උපසම්පන්න භික්ෂුවක් එම තත්වයෙන් පිරිහී යාම තල්, පොල් වැනි ගසක් කරටියෙන් බිඳීයාම වැනි ය. උපසපන්භාවය වැනසීමට හේතු වන පාරාජිකා හතර වන්නේ,

1. මෛථුනධම්ම පාරාජිකාව
2. අදත්තාදාන පාරාජිකාව
3. මනුස්සවිග්ගහ පාරාජිකාව
4. උත්තරිමනුස්සධම්ම පාරාජිකාව

වශයෙනි.

උපසම්පන්න භික්ෂුවක විසින් යටත් පිරිසෙයින් තිරිසන්ගත මාගමක් සමග හෝ මෙවුන්දම් සේවනය නොකළ යුතු ය. තණ පතක් හා සමාන හෝ නොදුන් දෙයක් සොර සිතින් නොගත යුතු ය. මිනිසකු ඝාතනය නොකළ යුතු ය. එසේ ම තමා තුළ නැති ධ්‍යාන මගඵල ඇතැයි හුවා නොදැක්විය යුතු ය. යම් උපසම්පන්න භික්ෂුවක් මෙම බරපතල වැරදිවලින් එකක් හෝ සිදු කරන්නේ නම් **"ඉදී කහ පැහැ ගැන්වී නටුවෙන් ගැලවී ගිය ශාක පත්‍රයක් යලි නිල්වන් වීමට යම් සේ නොහැකි වෙයි ද, එලෙසින් ම එම පැවිද්දාගේ පැවිදි බව නැති වී යයි."** එමනිසා උපසපන් භික්ෂුවක් සතර පාරාජිකාවන්ට පත් නොවී කටයුතු කිරීමට වග බලා ගතයුතු ය. සතර පාරාජිකාවන්ට ලක් වූ භික්ෂුවට කිසිසේත් ම එයින් පවිත්‍රත්වයට පත් විය නොහැකි ය. සතර පාරාජිකාවන්ට පිළියම් නැත. එමනිසා මෙම කරුණු සතර උපසපන් භික්ෂුවකට "අකරණීය ධර්ම " ලෙස සැලකේ. ඒවා උපසම්පදාවෙහි පිහිටුවීමෙන් අනතුරුව කර්මාචාර්යයන් වහන්සේ විසින් ප්‍රකාශ කරනු ලැබේ.

### නිශ්‍රය ධර්ම

අකරණීය ධර්ම දේශනාවෙන් අනතුරුව සිදු කරනුයේ සතර නිශ්‍රය ධර්ම දේශනාව යි. ඉහත සඳහන් විනය ශික්ෂාවන්ට අමතර ව උපසම්පදාවෙහි පිහිටුවනු ලැබූ භික්ෂුවක විසින් පිළිපැදිය යුතු කරුණු හතරක් නිශ්‍රය ධර්ම නමින් සඳහන් වෙයි. මුල් කාලයේ දී උපසම්පන්න වීමට පෙර නිශ්‍රය ධර්ම සමාදන් කරවිය යුතු යැයි නියම කරන ලදී. එහෙත් වර්තමානයෙහි මෙම නිශ්‍රය ප්‍රකාශ කරන්නේ උපසම්පදා කර්මයෙන් අනතුරුව යි. එයට හේතුව වූයේ මුලින් නිශ්‍රය සමාදන් කරවීම නිසා ඒවාට බිය වූ සාමණේර පිරිස් උපසපන් නොවී සිවුරු හැරයෑම යි. ආරම්භක යුගයේ සිටි භික්ෂූහු අවම සිව්පස ලාභයෙන් සතුටුව භාවනානුයෝගීව ක්‍රියා කළහ. එහෙත් ක්‍රමයෙන් එම තත්ත්වය වෙනස්වීම නිසා උපසම්පන්න භික්ෂුවට නිශ්‍රය සතර සමාදන් කරවනු ලැබේ.

''සසර බිය දැක නිවන් පසක් කරනු රිසියෙන් බුදුසසුන් වන් ආයුෂ්මතාණෙනි, පැවිදි ජීවිතය පවත්වා ගනු සඳහා මහා කාරුණිකයන් වහන්සේ අනුදැන වදාරා ඇති නිශ්‍රය සතර අසනු මැනවි''

1. මහණෙනි, මේ පැවිද්ද පිණ්ඩපාතයෙන් සොයා ගන්නා ආහාරය මත පවතින්නේ ය. තොප විසින් පිණ්ඩපාතයෙන් ම ජීවත් වීමට දිවි හිමියෙන් උත්සාහ කළ යුතු ය. අනෙකුත් තමාට ලැබෙන සියලු ම ප්‍රණීත භෝජන අතිරේක දේවල් ලෙස සලකා ඒවා කෙරෙහි බැඳීමක් ඇතිකර නොගත යුතු ය.

2. පැවිද්ද පංශුකුල චීවරය මත පවතින්නකි. උපසපන් භික්ෂුව පංශුකුල චීවරයෙන් ම දිවි පැවැත්මට උත්සාහ කළ යුතු ය. පෙර කළ පින් බලෙන් නොයෙක් වටිනා අතිරේක පිළී ලැබිය හැකි ය. ඒවා අතිරේක ලාභ වශයෙන් සලකා ක්‍රියා කළ යුතු ය.

3. පැවිද්ද වෘක්ෂමූල සේනාසනය මත ම පවත්නේ වෙයි. රුක්මුල් වන සෙනසුන්වල ම දිවි ඇති තෙක් ගත කිරීමට උත්සාහ කළ යුතු ය. පූර්ව කුසලානුභාවයෙන් ලැබෙන අනෙක් ආවාස ආදිය අතිරේක ලාභ ප්‍රයෝජන ලෙස සලකා පරිභෝග කළ යුතු ය.

4. පැවිද්ද අරළු, ගෝ මුත්‍රාදියෙහි ලා සාදන පූතිමූත්‍ර බෙහෙත් මත ම පවතින්නේ ය. අනෙක් සියලු ම දේ අතිරේක ලාභ යැයි සලකා පූතිමුත්තභේසජ්ජයෙන් ම විසීමට උත්සාහ කළ යුතු ය.

භික්ෂුවකගේ අපේක්ෂාව වන්නේ පරම සුවය වන නිවන් සුව වෙත පැමිණීම යි. ඒ සඳහා භික්ෂුවගේ ජීවන පදනම සැහැල්ලු පැවතුම් ඇති, පහසුවෙන් පෝෂණය කළ හැකි එකක් විය යුතු ය. එමනිසා උන්වහන්සේගේ ජීවිත පැවැත්ම මෙම නිශ්‍රය ධර්ම සතර මත පදනම් වී ඇත. ආහාර පාන, වාසස්ථාන, ඇඳුම්-පැළඳුම්, බෙහෙත් යන දේ සෑම මනුෂ්‍යයකුට ම පොදු වූ අවශ්‍යතාවන් ය. ඒවායෙහි ගිජු වීම භික්ෂුවගේ මූලික අරමුණ ගිලිහී යෑම සඳහා හේතු වේ. විමුක්තිය සාක්ෂාත් කර ගැනීමට බාධාවකි. මේ නිසා භික්ෂුවට නිශ්‍රය සතර සමාදන් කරවීම සිරිත ය.

### උපසපන් භික්ෂුවක් ආරක්ෂා කළ යුතු ශික්ෂා

මුල් අවුරුදු විසිවස තුළ පැවිදි වූවෝ නිවන් සුවය ම අරමුණු කොට ගත්තවුන් ය. එමනිසා ප්‍රථමාභිසම්බෝධි යුගය තුළ දී බුදුරජාණන් වහන්සේ කිසිදු විනය නීතියක් නොපැණවූ අතර භික්ෂූන් තුළ ශික්ෂණය පවත්වාගෙන යාම සඳහා ඕවාදප්‍රාතිමෝක්ෂය පමණක් අනුදැන වදාළහ. ගාථා ත්‍රිත්වයකින් සමන්විත මෙම ඕවාදප්‍රාතිමෝක්ෂයෙන් සියලු පව්වලින් ඈත්වීමට ද, කුසල් රැස්කිරීමට ද, තම සිත දමනය කර ගැනීමට ද උපදෙස් දෙයි. එහෙත් කල්යාමේ දී විවිධ ප්‍රදේශවලින්, විවිධ අරමුණු ඇතිව සසුනට පිවිසෙන්නවුන් නිසා සසුන තුළ විවිධ ගැටලු ඇති විය. එබැවින් බුදුරජාණන් වහන්සේට විනය නීති පැණවීමට සිදුවිය. ද්විතියසම්බෝධි යුගය හෙවත් බුද්ධත්වයෙන් විසිවන අවුරුද්දේ සිට පරිනිර්වාණය දක්වා භික්ෂූන් සඳහා විනය නීති 227ක් ද, භික්ෂුණීන් සඳහා විනය නීති 311ක් ද පණවා ඇත.

ඒවා මෙසේ ය.

| | භික්ෂු | භික්ෂුණී |
|---|---|---|
| පාරාජික | 04 | 08 |
| සංඝාදිසේස | 13 | 17 |
| අනියත | 02 | - |
| නිස්සග්ගිය පාචිත්තිය | 30 | 30 |
| පාචිත්තිය | 92 | 166 |
| පාටිදේසනීය | 04 | 08 |
| සේඛියා | 75 | 75 |
| අධිකරණ සමථ | 07 | 07 |
| | 227 | 311 |

## උපසම්පදා කිරීමට නුසුදුසු පුද්ගලයෝ

මුල් කාලීනව නිවන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ම පැවිදි වූ පිරිසක් සිටිය ද පසු කාලය වනවිට එම අරමුණු වෙනස් විය. ඇතැම් දෙනා නොයෙක් ආකාරයේ අකටයුතුකම් කොට ඒවායින් නිදහස් වීමේ මගක් ලෙස ද පැවිද්ද හා උපසම්පදාව යොදා ගත්හ. භික්ෂු සමාජයට ඇතුළු වීමට බාධාවක් නොපැවතීම නිසා කිසි වග විභාගයකින් තොරව බොහෝ පිරිස් සසුනට එකතු වූහ. එබඳු අපරාධකරුවන් හා කායික අයෝග්‍යතා ඇත්තවුන් සමාජයේ පිළිකුලට භාජනය වන බැවින් පැවිදි උපසම්පදා කිරීමට සුදුසු නොසුදුසු අයගේ නාමලේඛනයක් ඉදිරිපත් කිරීමට සිදුවිය. උපසම්පදාපේක්ෂකයා වසර (20) විස්සක් සම්පූර්ණ වූ අයෙකු විය යුතු ය. වසර විස්සක් උප්පත්තියෙන් සම්පූර්ණ නොවන්නේ නම් වයස ගණන් ගත යුත්තේ මව්කුසේ සිටින කාලයත් සමගිනි. මෙසේ මාස කිහිපයක විශේෂ වරප්‍රසාදයක් ද උපසම්පදාපේක්ෂකයාට ලබා දී ඇත. උපසම්පදා නොකළ යුතු අපේක්ෂකයන් රාශියක් මහාවග්ග පාළියේ මහාක්ඛන්ධකයේ සඳහන් වෙයි.

**පණ්ඩක, ථෙය්‍ය සංවාසක, තිත්ථියපක්කන්තක, තිරච්ඡානගතික, මාතු ඝාතකය, පිතු ඝාතකය, අරහන්ත ඝාතකය, උභතො බ්‍යඤ්ජනක, ලොහිතුප්පාදක, සංඝ භෙදක, භික්ඛුණී දූෂක,**

මේ පිරිස් විශේෂයෙන් උපසම්පදා නොකළ යුතු බව බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළහ. එම පිරිසට අමතර ව පහත සඳහන් අය ද උපසම්පදා නොකළ යුතු යැයි දක්වා තිබේ.

1. උපාධ්‍යායන් වහන්සේ කෙනෙකු නැති තැනැත්තා
2. පාත්‍රයක් නැති තැනැත්තා
3. සිවුරක් නැති තැනැත්තා
4. පාත්‍රයක් හා සිවුරක් නැති තැනැත්තා
5. ණයට ගත් පාත්‍රයක් ඇති තැනැත්තා
6. ණයට ගත් සිවුරක් ඇති තැනැත්තා
7. ණයට ගත් පාත්‍රයක් හා සිවුරක් ඇති තැනැත්තා

**මීට අමතර ව,**

1. අන්‍ය තීර්ථක ආරාමයක සිට පැමිණ පැවිදි වී සිට නැවතත් එම ආරාමයට ගිය පිරිස් උපසම්පදා නොකළ යුතු ය.
2. අන්‍ය තීර්ථකයකු සසුනට එකතු වුවහොත් උපසපන් කිරීමට පෙර මාස හතරක පරිවාස කාලයක් පිරිය යුතු ය.

තවද අන්තරායික ධර්මවලින් තොර අය පමණක් උපසම්පදා කිරීමට අවසර ලබා දී ඇත.

- කුෂ්ට, ගෙඩි, වණ, ඇදුම, අපස්මාරය වැනි ආබාධ නොතිබීම. (කුට්ඨං, ගණ්ඩො, කිලාසො, සොසො, අපමාරො)
- මනුෂ්‍යයෙකු වීම. (මනුස්සොසි)
- පුරුෂයෙකු වී.ම (පුරිසොසි)
- දාසයෙකු නොවීම. (භුජිස්සොසි)
- ණයෙන් මිදුණෙකු වීම. (අණණොසි)
- රාජ භටයෙක් නොවීම. (නසි රාජභටො)
- මව්පියන්ගෙන් අවසර ලැබූවෙකු වීම. (අනුඤ්ඤාතොසි මාතාපිතූහි)
- විසි වයස් සම්පූර්ණ වීම. (පරිපුණ්ණ වීසතිවස්සොසි)
- පාත්‍රා සිවුරු සම්පූර්ණ වීම. (පරිපුණ්ණං තෙ පත්තචීවරං)

අන්තරායික කරුණු විමසීම උපසම්පදාපේක්ෂකයා උපසපන් කිරීමට පෙර කළ යුතු ය. යම් උපසම්පදාපේක්ෂකයකු අන්තරායික ධර්මවලින් යුක්ත නම් ඔහු උපසම්පදා නොකළ යුතු බව බුදුරජාණන් වහන්සේ අවධාරණය කළහ. එසේ උපසම්පදා කිරීමෙන් නොයෙකුත් ගැටළු ඇතිවනවා සේම මහජනයාගේ ගෞරවය ද සිඳී යන්නේ ය.

**අභ්‍යාස**

01. උපසම්පදා යන්නෙහි වචනාර්ථය ලියන්න.
02. උපසම්පදාවෙහි ආරම්භය කෙටියෙන් දක්වන්න.
03. නිශ්‍රයධර්ම නම් කර ඉන් එකක් විස්තර කරන්න.
04. උපසම්පදාවෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.

09
පාඩම

# සඟ සසුනේ පාලනය - පැවිදි උපෝසථය

**යාවකීවඤ්ච භික්ඛවෙ භික්ඛූ අභිණ්හං සන්නිපාතා භවිස්සන්ති සන්නිපාත බහුලා වුද්ධියෙව භික්ඛවෙ භික්ඛූනං පාටිකංඛා නො පරිහානි.**

මහණෙනි, භික්ෂූන් වහන්සේලා නිතර රැස්වනසුලු වෙත්නම් එක්රැස්වීම් බහුලකොට වෙසෙත්නම් එයින් භික්ෂූන්ට දියුණුවක් මිස පරිහාණියක් නම් කිසිදා අපේක්ෂා කළ නොහැක්කේ ය.

(අං. නි. 4 භික්ඛු අපරිහානිය සූත්‍රය)

යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද පරිදි භික්ෂූන් වහන්සේලා නිතර රැස්වී සංඝකර්මවල යෙදීම ඔවුනොවුන් නිතර සාමූහිකව මුණගැසීම, ශාසනයේ චිරස්තිථිය සඳහා මෙන්ම උන්නතිය සඳහන් නිර්දේශ කරන ලද පිලිවෙතයි. එසේ ම

**යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා**

යනුවෙන් පිරිනිවන් පාන මොහොතේ බුදුරදුන් වදාළේ තමන් වහන්සේගෙන් පසුව ධර්මයත් විනයත් ශාසනයේ ශාස්තෘවරයා නොහොත් පාලකයා වන බවයි. එතැන් සිට භික්ෂු සංඝයා එම පැණවීම ඉතා ගෞරවයෙන් පිළපදිමින් ආහ.

බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු දිනක් අනඳ හිමියන් හමුවීමට පැමිණි ගෝපක මොග්ගල්ලාන නම් බමුණා විමසා සිටියේ බුදුරදුන් පිරිනිවීමෙන් පසු සසුනේ පාලනයට පත්කළ අයෙකු ඇත් ද කියා ය. එවැනි කෙනෙකු නැතැයි අනඳ තෙරුන් කී කළ ගෝපක බමුණා ඇසුවේ, එසේ නම් සසුන පාලනයක් නැති අරාජික සාසනයක් නොවේ ද කියා ය. එවිට අනඳ තෙරුන් දුන් පිළිතුර නම්:-

"බ්‍රාහ්මණය ඒ සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ භාග්‍යවත් වූ අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන්ට පණවන ලද ශික්ෂා පද ඇත. දෙසන ලද ප්‍රාතිමොක්ෂයක් ඇත.

යම් ග්‍රාමක්ෂෙත්‍රයක් ඇසුරු කොට වසන යම්තාක් භික්ෂූහු වෙත් ද ඒ සියලු දෙනා පොහොය දවසට එක් තැනකට රැස්වෙමු. රැස් වී එදිනට ප්‍රාතිමොක්ෂ දේශනාවට නියමිත භික්ෂුවට එය දෙසන්නට ඇරයුම් කරමු. එසේ විනය ප්‍රාතිමොක්ෂය දේශනා කළ කල් හි යම් කිසි භික්ෂුවකට ඇවැත් ඇතැයි හෙළිවේ නම්, ශික්ෂා පදයක් උල්ලංඝණය කර ඇතැයි හෙළිවේ නම් උන්වහන්සේට අපි ධර්මානුකූලව බුද්ධානුශාසනයට අනුව පිලියම් කරවමු යනුවෙනි.

එවිට කරුණු වටහාගත් ගෝපක බමුණා කියා සිටියේ එසේ නම් ඔබ වහන්සේලා පාලනය නොකරත් පාලනය කරන්නේ ධර්මය නොවේ ද කියා ය.

(ම. නි ගෝපක මොග්ගල්ලානා සූත්‍රය)

මේ අනුව අනඳ හිමියන් පවසන්නේ ශාස්තෘන් වහන්සේ නැති සාසනය පාලනය වන්නේ අඩමසකට හෝ මසකට වරක් භික්ෂූන් වහන්සේලා පොහොය සීමාවට රැස්ව කරන විනය දේශනා සංඝකර්මයෙන් බවයි. උපොසථය හෙවත් පොහොයකර්ම යනු රටක පාර්ලිමේන්තුව රැස්වීම, උසාවි අධිකරණ පැවැත්වීම මෙන් සාසනය පාලනය කරන පාලන ක්‍රමයයි.

මෙසේ පොහොය දිනකට සීමාවට රැස්ව පොහොය කිරීමේ ක්‍රමය මුලින් ම ඇරඹෙන්නේ බිම්බිසාර රජුගේ ආරාධනාවක් කර අනුව ය. අන්‍ය තීරථක පරිබ්‍රාජකයෝ සතර පොහොයට එක් තැනකට රැස්වෙති. රැස්වී ඔවුන්ගේ දහම් දෙසති. මිනිස්සු එය ඇසීමට ඔවුන් වෙත යති. මෙයින් අන්‍ය තීර්ථකයන් වෙත යන පිරිස වැඩිවීම නිසා ඔවුන්ගේ බලය වැඩේ. මේ බව දුටු රජතුමා බුදුරදුන් හමුවී ඒ පුවත සැළකොට අපගේ ආර්යයන් වහන්සේලාත් සතර පොහොයට රැස්වන්නා හු නම් යහපතැයි සැළකළේ ය. ඒ කාරණය පිළිගත් උන්වහන්සේ පසළොස්වක තුදුස්වක අටවක යන සතර පොහොයට ම රැස්වන්නට අනුදැනවදාළහ. එසේ රැස්වන උන්වහන්සේලා නිහඬ ව සිටිති. මේ පිළිබඳව ද මහජනයා අතර කසුකුසුවක් ඇති විය.

එය දැනගත් බුදුරජාණන් වහන්සේ "**ඉධ මය්හං භික්ඛවෙ එවං චෙතසො පරිවිතක්කො උදපාදි, යන්නූනාහං යානි භික්ඛූනං පඤ්ඤත්තානි සික්ඛාපදානි තානි නෙසං පාතිමොක්ඛුද්දෙසං අනුජානෙය්‍යං සො නෙසං භවිස්සති උපොසථකම්මන්ති අනුජානාමි භික්ඛවෙ පාතිමොක්ඛං උද්දිසිතුං**"

යනුවෙන්, මහණෙනි මා විසින් පනවන ලද යම් ශික්ෂා පද වෙත් නම් ඒවා පොහෝ දින උදෙසන්නට අනුදනිම් නම් යෙහෙකි. එය සංඝයාට පොහොය කර්මය වනු ඇතැයි මට සිතිණ. එහෙයින් ප්‍රාතිමෝක්ෂය උදෙසන්නට අනුදමියි වදාළහ.

අද පවත්නා පොහොය කිරීමේ ක්‍රමය සකස් වූයේ එතැන් සිටය. තුන් සිවුරෙන් සැරසී උපෝසථ කර්මයක් සිදුකිරීමට පොහොය සීමාවට රැස්වන උපසම්පන්න භික්ෂූන් වහන්සේලා පළමුව, බුද්ධප්‍රතිමා වහන්සේට නමස්කාර කොට දෙනම බැගින් සුදුසු ස්ථානවලට ගොස් ඇවැත් දෙසාගත යුතු ය. තමාගෙන් සිදු වී ඇති ගරුකාපත්ති, ලහුකාපත්ති, දුක්කටාපත්ති, දුබ්භාසිතාපත්ති, ථුල්ලච්චය, පාචිත්තිය, නිස්සග්ගිය, පාටිදෙසනීය ආදී ආපත්තීන් අනෙක් භික්ෂුවට ප්‍රකාශ කොට පිරිසිදු වීම ඇවැත් දෙසීම නම් වෙයි. මෙසේ ඇවැත් දෙසීමේ වාක්‍යය තෙවරක් ප්‍රකාශ කොට පිරිසිදු වී අනතුරුව බුද්ධප්‍රතිමා වහන්සේ දෙපස වාඩි වී තෙරුවන් නමැදීම කළයුතු ය. ඉන් අනතුරුව උපෝසථ කර්මය සිදු කරනු ලබත්. උපෝසථ කර්මයක් ආරම්භ කිරීමට පෙර මූලික අවශ්‍යතා දෙකක් සම්පූර්ණ විය යුතු ය. එනම්,

1. පුබ්බකරණ 2. පුබ්බකිච්ච

යනුවෙනි.

**පුබ්බකරණ**

**සම්මජ්ජනී පදීපො ච - උදකං ආසනෙන ච**
**උපොසථස්ස එතානි - පුබ්බකරණන්ති වුච්චති**

සංඝයා වහන්සේලා උපෝසථාගාරයට රැස්වීමට පෙර කළයුතු කාර්යයන් පුබ්බකරණ නම් වෙයි. ඒවා නම්,

1. උපෝසථාගාරය ඇමදීම
2. පහන් දැල්වීම
3. පරිභෝග කළයුතු පැන් තැබීම
4. අසුන් පැනවීම

යනු යි.

උපෝසථ කර්මය සිදුකරන අවස්ථාව වන විට සූර්යාලෝකය ඇත්නම් පහන් දැල්වීම අනවශ්‍ය ය. ඒ බව සංඝයාට දැන්විය යුතු අතර අනෙක් වත් තුන නිම කළ යුතු ය.

## පුබ්බකිච්ච

ඡන්‍දපාරිසුද්ධි උතුක්ඛානං - භික්ඛු ගණනා ච ඕවාදො
උපොසථස්ස එතානි - පුබ්බකිච්චන්ති වුච්චති

උපෝසථාගාරයට රැස් වූ භික්ෂූන් වහන්සේලා පළමුවෙන් ම සිදු කළයුතු කාර්යයන් පුබ්බකිච්ච නමින් හැඳින්වෙයි. මෙහි දී සිදුවන්නේ උපෝසථාගාරයට රැස්වන භික්ෂූන් වහන්සේලාගෙන් ව්‍යක්ත ප්‍රතිබලසම්පන්න භික්‍ෂූන් වහන්සේ නමක විසින් මීට අදාළ ප්‍රශ්න විමසීම හා පිළිතුරු නිවැරැදි ව දැන ගැනීම යි. එනම්,

01. ඡන්දපාරිශුද්ධිය සංඝයා හට ආරෝචනය කිරීම. සීමාවට අදාළ ග්‍රාම ක්ෂේත්‍රයේ කිසියම් උපසපන් භික්ෂුවකට පොහොය කිරීමට පැමිණිය නොහැකි නම් උපසපන් භික්ෂුවක් විසින් ම ඊට උන්වහන්සේගේ කැමැත්ත ගෙනවිත් සඟ මැද ආරෝචනය කළ යුතු ය.
02. හේමන්ත, ගිම්හාන හා වස්සාන යනුවෙන් ඍතු තුනකි. එයින් උපෝසථ කර්මය සිදු කරන පොහොය දිනය අයත් ඍතුව දැක්විය යුතු ය.
03. දැනට සීමාවෙහි රැස්ව සිටිනා භික්ෂූන් වහන්සේලාගේ ගණන සංඛ්‍යා වශයෙන් සංඝයාට දැන්විය යුතු ය.
04. භික්ෂුණී සාසනය පවතී නම් සීමාවට රැස්වූ සංඝයා විසින් එම පොහෝ දිනට භික්ඛුනොවාදක හෙවත් භික්ෂුණීන්ට අවවාද කරන භික්ෂුවක් නම් කළ යුතු ය. අද භික්ෂුණී සාසනය නොමැති හෙයින් එය අනවශ්‍ය බව සංඝයාට දන්විය යුතු ය.

මෙම මූලික අවශ්‍යතා හතර සංඝයා වහන්සේලා සීමාවට රැස් වූ පසු උපෝසථ කර්මයට පෙර සිදුකළ යුතු බැවින් පූර්වකෘත්‍ය යැයි කියනු ලැබේ.

## උපෝසථ ප්‍රභේද

උපෝසථ කර්මය පවත්වන දිනය හෝ හේතුව අනුව උපෝසථය තෙවැදෑරුම් ය.

1. චාතුද්දසී උපෝසථය
2. පණ්ණරසී උපෝසථය
3. සාමග්ගි උපෝසථය

වශයෙනි.

මුලදී පොහොය හතරට ම රැස්වන්නට අනුදැන වදාළ නමුත් ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමට නියමිත ව ඇත්තේ මාසයක පෙහොය දෙකකට පමණි. එනම් පසළොස්වක හා අමාවකයි. එයින් එක් පොහායක් ගත වී ඊළඟ පෙහොය පැමිණෙන්නේ සඳපායන ක්‍රමය අනුව දින 14 න් නම් එය චාතුද්දසී හෙවත් තුදුස්වක පොහොය යැයි කියනු ලැබේ. එම පොහොය පැමිණෙන්නේ දින 15න් නම් එය පණ්ණරසී හෙවත් පසළොස්වක යැයි කියනු ලැබේ. ඒ අනුව පොහොය දින දෙකකි. සාමාන්‍යයෙන් ඍතුවක තුන්වන හා හත්වන පොහොය යෙදෙන්නේ දින 14කිනි. එනම් චාතුද්දසී පොහොයයි. ඉතිරි පොහෝ දින 6 යෙදෙන්නේ දින 15කිනි. ඒ පණ්ණරසී පෙහොයයි. ඒ අනුව කුමන පොහොයදැයි ගණන් බලා සංඝයාට ආරෝචනය කළ යුතු ය. සාමග්ගි උපෝසථය යනු භේද වී සිටි සංඝයා සමගි කළ දිනයෙහි ඒ සමගිය නිමිත්තෙන් කරන පොහොය කිරීම යි.

උපෝසථ කර්මයක දී මීළඟට වැදගත් වන්නේ එයට සම්බන්ධ වන භික්ෂූන්ගේ සංඛ්‍යාව යි. එම සංඝයාගේ සංඛ්‍යාව අනුව ද උපෝසථ කර්මය තෙවැදෑරුම් ය.

1. සංඝ උපෝසථය
2. ගණ උපෝසථය
3. පුග්ගල උපෝසථය යනුවෙනි.

ශාසනයේ සංඝ යන පදය යෙදෙන්නේ උපසම්පන්න භික්ෂූන් හතරනමකට හෝ ඊට වැඩි පිරිසකට ය. ඒ අනුව එම සංඛ්‍යාවේ සහභාගිත්වයෙන් සිදු කරනු ලබන උපෝසථ කර්මය සංඝ උපෝසථය නමි. එකනමකට වැඩි හතරනමකට අඩු සංඛ්‍යාව හැඳින්වෙන්නේ ගණ නමිනි. එම සංඛ්‍යාවේ සහභාගිත්වයෙන් කරන උපෝසථ කර්මය ගණ උපෝසථය නම් වේ. එක් නමක විසින් කරනු ලබන උපෝසථ කර්මය පුග්ගල උපෝසථය නමින් හැඳින්වේ.

පැවිදි උපෝසථයේ තවත් වර්ගීකරණයක් වන්නේ සිදු කරන ආකාරය සැලකිල්ලට ගනිමින් කරන ලද බෙදීම යි. එනම්,

1. සුත්තුද්දේස උපෝසථය
2. පාරිශුද්ධි උපෝසථය
3. අධිට්ඨාන උපෝසථය වශයෙනි.

භික්ෂූන් වහන්සේලා හතර නමක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සීමාවකට රැස් වූ අවස්ථාවක දී ප්‍රාතිමෝක්ෂය සජ්ඣායනා කරමින් කරන උපෝසථය සුත්තුද්දේස නම් වේ. තුන් නමක් හෝ දෙනමක් වුවහොත් තම තමන්ගේ පාරිශුද්ධිය ප්‍රකාශ කිරීම පමණක් කළ යුතු අතර, එය පාරිශුද්ධි උපෝසථය වශයෙන් ද, එක් භික්ෂුවක් පමණක් වුවහොත් උන් වහන්සේ විසින් ම පොහොය අධිෂ්ඨාන කිරීම වශයෙන් කරන උපෝසථය අධිට්ඨාන උපෝසථය නමින් ද හැඳින්වේ.

බුදුරජාණන් වහන්සේ විසින් හඳුන්වාදෙන ලද මෙම උපෝසථ කර්මයෙන් අපේක්ෂා කළේ භික්ෂූන් අතර අන්‍යෝන්‍ය ගෞරවය, සුහදතාව, සමගිය හා පිරිසිදු බව තහවුරු කර ගැනීම යි. ඒ උපෝසථ කර්මය වර්තමානය දක්වා ම ක්‍රියාත්මක වන සංඝ කර්මයක් ලෙස සඳහන් කළ හැකි ය.

**සංඝ උපෝසථය සිදු කිරීමේ ක්‍රමය**

පුච්ඡකත්ථේර: නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස
සුණාතු මේ භන්තෙ සංඝො යදි සංඝස්ස පත්තකල්ලං අහං
ආයස්මන්තං (ඉත්ථං නාමං) විනයං පුච්ඡෙය්‍යං

ස්වාමීනි, සංඝයා වහන්සේ මා කියනා දෙය අසන සේක්වා, ඉදින් මහා සංඝයා වහන්සේගේ උපෝසථයට සුදුසු කාලය පැමිණියේ වේ නම් මම ආයුෂ්මත් (අසවල් නම් ඇති) තෙර නමගෙන් විනය විචාරන්නෙමි.

දෙසකත්ථේර: නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

සුණාතු මෙ භන්තෙ සංඝො යදි සංඝස්ස පත්තකල්ලං අහං
ආයස්මතා (ඉත්ථං නාමෙන) විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං

ස්වාමීනි, මහා සංඝයා වහන්සේ මා කියනා දෙය අසන සේක් වා, සංඝයාගේ (උපෝසථයට) සුදුසු කාලය පැමිණියේ නම් ආයුෂ්මත් (අසවල් නම් ඇති භික්ෂුව විසින්) විනය විචාරණ ලද්දෙම් (එසේ විචාරණ විනය කාරණා) විසඳන්නෙමි.

පුච්ඡකත්ථේර: සම්මජ්ජනී පදීපො ච - උදකං ආසනෙන ච
උපොසථස්ස එතානි - පුබ්බකරණන්ති වුච්චති
ඔකාස, ඔකාස, ඔකාස, සම්මජ්ජනී?

ඇමදීම, (අවශ්‍ය නම්) පහන් දැල්වීම, පානීය, පරිභෝජනීය ජලය තැබීම ආසන පැනවීම යන මේ කරුණු හතර පොහෝ පවුරුණුවලට ප්‍රථම කළ යුතු නිසා පුබ්බකරණ යයි කියනු ලැබේ. අවසර, අවසර, අවසර හැමදීම යනු (කිමෙක් ද?)

දෙසකත්ථේර: සම්මජ්ජන කරණඤ්ච

ඇමදීම, පිරිසිදු කිරීම් ය. එය සපුරා ඇත.

පුච්ඡකත්ථේර: පදීපො ච?

පහන් දැල්වීම යනු (කිමෙක් ද)

දෙසකත්ථෙර: පදීප උජ්ජලනඤ්ච. ඉදානි සූරියාලොකස්ස අත්ථිතාය පදීපකිච්චං නත්ථි

පහන් දැල්වීමයි, මේ අවස්ථාවේ හිරු එළිය ඇති නිසා පහන් දැල්වීමේ අවශ්‍යතාවක් නැත.

පුච්ඡකත්ථෙර: උදකං ආසනෙන ච.

පැන් තැබීම, ආසන පැනවීම යනු (කිමෙක් ද?)

දෙසකත්ථෙර: ආසනෙන සහ පානීය පරිභොජනීය උදකට්ඨපනඤ්ච.

ආසන පැනවීම සහ පානීය පරිභෝජනීය ජලය තැබීම ද සිදුකර ඇත.

පුච්ඡකත්ථෙර: උපොසථස්ස එතානී පුබ්බකරණන්ති වුච්චති?

පොහෝ පවුරුණු සඳහා මේ කරුණු පුබ්බකරණයැයි කියත් ද?

දෙසකත්ථෙර: එතානි චත්තාරිවත්තානි සම්මජ්ජන කරණාදීනි සංඝසන්නිපාතතො පඨමං කත්තබ්බත්තා උපොසථස්ස උපොසථකම්මස්ස පුබ්බකරණන්ති වුච්චති. පුබ්බකරණානීති අක්ඛාතානි.

මේ ඇමදීම් කිරීම් ආදී වත් හතර සංඝසන්නිපාතයට පළමුවෙන් කළයුතු බැවින් පොහොයකර්මයාගේ පූර්ව කෘත්‍ය යැයි කියන ලදී

පුච්ඡකත්ථෙර: ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං. භික්ඛු ගණනා ච ඔවාදො, උපොසථස්ස එතානි. පුබ්බ කිච්චන්ති වුච්චති. ඡන්දපාරිසුද්ධි?

ඡන්දය ගැනීම, පාරිශුද්ධිය, සෘතුකීම, භික්ෂූන් සංඛ්‍යාව කීම, භික්ෂූන්ට අවවාද දීම යන මේ කරුණු (පහ) පොහෝ පවුරුණු කිරීමට පෙරාතුව කළයුතු බැවින් පුබ්බ කිච්ච යයි කියන්නේ ය. ඡන්ද ගැනීම හා පාරිශුද්ධිය යනු කුමක්ද?

දෙසකත්ථෙර: ඡන්දාරහානං භික්ඛූනං ඡන්දපාරිසුද්ධි ආහරණඤ්ච (ඉධ නත්ථි)

ඡන්දය ගැනීමට සුදුසු භික්ෂූන්ගෙන් ඡන්දයත් පාරිශුද්ධියත් ගෙන්වාගැනීම ය. (ඡන්දය ගෙන ආ යුතු භික්ෂූන් නැති නම් නැතැයි කිව යුතු ය)

පුච්ඡකත්ථෙර: උතුක්ඛානං?

සෘතුකීම යනු කිමෙක් ද?

දෙසකත්ථෙර: හෙමන්තාදීනං තිණ්ණං උතූනං එත්තකං අතික්කන්තං එත්තකං අවසිට්ඨන්ති එවං උතු ආචික්ඛණං, උතූනීධපන සාසනෙ හෙමන්ත, ගිම්හාන, වස්සානානං වසෙන තීණි හොන්ති, අයං (හෙමන්ත උතු) උතු අස්මිං උතුම්හි (අට්ඨ) උපොසථා, ඉමිනා පක්ඛෙන එකො උපොසථො සම්පත්තො (එකො) උපොසථා අතික්කන්තො (ඡ) අවසිට්ඨා

හේමන්ත ආදී තුන් සෘතූන් අතරින් මෙපමණ සෘතූන් ගණනක් ඉක්මිණ. මෙපමණක් ඉතිරි විණැයි. මෙසේ සෘතූන් ගණන කීමයි. මේ සසුනෙහි හේමන්ත, ගිම්හ, වස්සාන වශයෙන් සෘතු තුනකි. (නිදසුනක් ලෙස) හේමන්ත සෘතුව නම් මේ සෘතුවෙහි පොහොය අටකි. මේ පක්ෂයෙන් එක් පොහොයක් පැමිණ තිබේ. එක් පොහොයක් ඉක්ම ගොස් ය. පොහොය සයක් ඉතිරිය.

පුච්ඡකථෙර: භික්ඛු ගණනා ච?

භික්ෂූන්ගේ ගණන කීමය යනු කිමෙක් ද?

දෙසකථෙර: ඉමස්මිං උපොසථග්ගෙ සන්නිපතිතානං භික්ඛූනං ගණනා (එත්තකා භික්ඛූ) හොන්ති.

මෙම පෝය ගෙට රැස්වූ භික්ෂූන්ගේ ගණන මෙපමණ භික්ෂූහු යැයි ගණන් කර කීම ය.

පුච්ඡකථෙර : ඔවාදො?

අවවාද දීම යනු කුමක් ද?

දෙසකථෙර: භික්ඛුණීනං ඔවාදො දාතබ්බො, ඉදානි පන තාසං නත්ථිතාය සො ච ඔවාදො ඉධ නත්ථි

භික්ෂුණීන්ට අවවාද දිය යුතු ය. එහෙත් මෙකල භික්ෂුණීන් නොමැති බැවින් භික්ෂුණීන්ට අවවාද දීමක් මේ අවස්ථාවේ නැත.

පුච්ඡකථෙර: උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති?

මේ කරුණු පොහොය කර්මයාගේ පුබ්බකිච්ච යයි කියත් ද?

දෙසකථෙර: එතානි පඤ්චකම්මානි ඡන්දාහරණාදීනි පාතිමොක්ඛුද්දෙසතො පඨමං කත්තබ්බං. උපොසථස්ස උපොසථකම්මස්ස පුබ්බකිච්චන්ති වුච්චති, පුබ්බකිච්චානීති අක්ඛාතානි.

(එසේය) කැමැත්ත ගෙන ඊම ආදී මේ පස් වැදෑරුම් කටයුතු පාමොක් දෙසීමට ප්‍රථම නිමකළ යුතු බැවින් පුබ්බකිච්ච යයි කියනු ලැබේ.

පුච්ඡකථෙර: උපොසථො යාවතිකා ච භික්ඛූ - කම්මප්පත්තා සභාගාපත්තියො ච නවිජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා - තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති.

තුදුස්වක ආදී පොහොයක් වේ ද යම් පමණ මහා සංඝයා වහන්සේ අවම වශයෙන් සතර නමකට නොඅඩුව පැමිණි සේක් ද, විකාල භෝජනා දී සමාන ඇවැත්වලට නොපැමිණියහු ද, බැහැර කළ යුතු පුද්ගලයෝ නොවෙද්ද (එය පොහෝ කිරීම සඳහා සුදුසු අවස්ථාවය යි කියනු ලැබේ.)

පුච්ඡකත්ථෙර: උපොසථො?

උපෝසථය යනු (කිමෙක් ද?)

දෙසකත්ථෙර: තීසු උපොසථ දිවසෙසු චාතුද්දසී පණ්ණරසී සාමග්ගීසු අජ්ජුපොසථො (පණ්ණරසො)

තුදුස්වක, පසළොස්වක හා සමගිපෝය වශයෙන් පොහෝ දින තුනකි. (නිදසුනක් ලෙස) අද පසළොස්වක පෙහෙයයි.

පුච්ඡකත්ථෙර: යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා?

යම් පමණ භික්ෂූහු උපෝසථ කර්මයට පැමිණියාහුද යනු (කිමෙක් ද?)

දෙසකත්ථෙර: යත්තකා භික්ඛූ තස්ස උපොසථ කම්මස්ස පත්තා යුත්තා අනුරූපා සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන චත්තාරො භික්ඛූ පකතත්තා සංඝෙන අනුක්ඛිත්තා තෙ ච ඛො හත්ථපාසං අවිජහිත්වා එකසීමායං ඨිතා.

අවම වශයෙන් සතර නමකට නොඅඩුව සංඝයා විසින් උක්ඛෙපනිය කර්මය නොකළ, ප්‍රකෘතිමත් භික්ෂූන් වහන්සේ පැමිණිය යුතු ය. ඒ වැඩම කළ මහා සංඝයා වහන්සේ අතේ දුර නොවන සේ එකම සීමාවේ වැඩ සිටිය යුත්තෝ වෙති.

පුච්ඡකත්ථෙර: සභාගාපත්තියො ච න විජ්ජන්ති?

සමාන ඇවැත්වලට පැමිණියෝ නො වෙත් යනු (කිමෙක් ද?)

දෙසකත්ථෙර: විකාලභොජනා දී වත්ථු සභාගාපත්තියො නවිජ්ජන්ති.

විකාල භෝජන ආදී කිසියම් ඇවතකට සියලු දෙනා වහන්සේ එකවර පත්වීම සභාගාපත්ති නම්. එවැනි ඇවතකට පත් වූවෝ නැත.

පුච්ඡකත්ථෙර: වජ්ජනීයාච පුග්ගලා තස්මිං න හොන්ති?

බැහැර කළ යුතු පුද්ගලයෝ සීමාව තුළ නොවෙත් යනු (කිමෙක් ද?)

දෙසකත්ථෙර: ගහට්ඨ පණ්ඩකාදයො එකවීසති වජ්ජනීය පුග්ගලා හත්ථපාසතො බහිකරණ වසෙන වජ්ජෙතබ්බා, අස්මිං න හොන්ති.

ගිහියන් පණ්ඩකයන් ආදී විසිඑක් පුද්ගලයන්, පොහෝ පවුරුණු අවස්ථාවේ අතේ දුරින් පවා බැහැර කළ යුත්තන් මෙහි නැති බව ය.

පුච්ඡකත්ථෙර: පත්තකල්ලන්ති වුච්චති?

පැමිණි කාල ඇත්තේ යි කියන්නේ කුමක් නිසා ද?

දෙසකථෙර: සංඝස්ස උපොසථකම්මං ඉමෙහි චතූහි ලක්ඛණෙහි සංගහිතං පත්තකල්ලන්ති වුච්චති පත්තකාලවන්තන්ති අක්ඛාතං

මහා සංඝයා වහන්සේගේ පොහොය කර්මය, මේ මූලික කරුණු හතරෙන් සමන්විත නම් පොහොය කිරීමට සුදුසු කාලය යයි, පැමිණි කල ඇත්තේ යැයි කියනු ලැබේ.

පුච්ඡකථෙර: පුබ්බකරණ පුබ්බකිච්චානි සමාපෙත්වා දෙසිතාපත්තිකස්ස භික්ඛු සංඝස්ස අනුමතියා පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරොමි.

පුබ්බකරණ, පුබ්බකිච්ච, නිමවා දෙසූ ඇවැත් ඇති මහා සංඝයා වහන්සේගේ අනුමතයෙන් පාමොක් උදෙසීමට ආරාධනා කරමි.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
සුණාතු මෙ භන්තෙ සංඝො, අජ්ජුපොසථො පණ්ණරසො, යදි සංඝස්ස පත්තකල්ලං සංඝො උපොසථං කරෙය්‍ය පාතිමොක්ඛං උද්දිසෙය්‍ය.

කිං සංඝස්ස පුබ්බකිච්චං? පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ, පාතිමොක්ඛං උද්දිසිස්සාමි. තං සබ්බෙව සන්තා සාධුකං සුණොම මනසිකරොම. යස්ස සියා ආපත්ති සො ආවීකරෙය්‍ය අසන්තියා ආපත්තියා තුණ්හී භවිතබ්බං තුණ්හීභාවෙන ඛො පනායස්මන්තෙ පරිසුද්ධාති වෙදිස්සාමි.

යථා ඛො පන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණං හොති, එවමෙවං එවරූපාය පරිසාය යාවතතියං අනුසාවිතං හොති. යො පන භික්ඛු යාවතතියං අනුසාවියමානො සරමානො සන්තිං ආපත්තිං නාවිකරෙය්‍ය, සම්පජානමුසාවාදස්ස හොති. සම්පජානමුසාවාදො ඛො පනායස්මන්තො අන්තරායිකො ධම්මො වුත්තො භගවතා. තස්මා සරමානෙන භික්ඛුනා ආපන්නෙන විසුද්ධාපෙක්ඛෙන සන්ති ආපත්ති ආවිකාතබ්බා, ආවිකතාහිස්ස ඵාසු හොති.

උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං තත්ථායස්මන්තෙ පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා?

පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි.

මෙම ආරාධනාවෙන් අනතුරුව සතර පාරාජිකා ආදී වූ ප්‍රාතිමෝක්ෂ දේශනාව සිදු කිරීම සිරිත ය.

**අභ්‍යාස**

01. උපෝසථ යන්නෙහි අර්ථය පෙන්වා දෙන්න.
02. උපෝසථ කර්මයෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.
03. උපෝසථ කර්මයට අන්තරායික පුද්ගලයින්ගේ නාමලේඛනයක් සකස් කරන්න.
04. පුබ්බකරණ සහ පුබ්බකිච්ච වෙන වෙන ම විස්තර කරන්න.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

10
පාඩම

# අමතක වන්නට නොදිය යුතු කරුණු
## (පඨම සාරාණීය සූත්‍රය)

සාවත්‍ථි නිදානං

ඡයිමෙ භික්ඛවෙ ධම්මා සාරාණීයා කතමෙ ඡ:

1) ඉධ භික්ඛවෙ භික්ඛුනො මෙත්තං කායකම්මං
පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච.
අයම්පි ධම්මො සාරාණීයො.

2) පුන ච පරං භික්ඛවෙ භික්ඛුනො මෙත්තං වචීකම්මං
පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච.
අයම්පි ධම්මො සාරාණීයො.

3) පුන ච පරං භික්ඛවෙ භික්ඛුනො මෙත්තං මනොකම්මං
පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච.
අයම්පි ධම්මො සාරාණීයො.

4) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යෙ තෙ ලාභා ධම්මිකා
ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි, තථාරූපෙහි ලාභෙහි
අප්පටිවිභත්තභොගී හොති, සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී.
අයම්පි ධම්මො සාරාණීයො.

5) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යානි තානි සීලානි අඛණ්ඩානි
අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි
අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි, තථාරූපෙහි සීලෙහි
සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච.
අයම්පි ධම්මො සාරාණීයො

6) පුන ච පරං භික්ඛවෙ භික්ඛු යායං දිට්ඨි අරියා
නියාානිකා නීයාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයාය,
තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතො විහරති
සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච.
අයම්පි ධම්මො සාරාණීයො.
ඉමෙ ඛො භික්ඛවෙ ඡ ධම්මා සාරාණීයාති.

(අ.නි. 4,18, පඨම සාරාණීය සුත්ත)

**මහණෙනි මේ සිහිකටයුතු ධර්ම සයකි, කවර සයක් ද යත්:-**

මහණෙනි, මේ සස්නෙහි කිසියම් භික්ෂූන් වහන්සේ නමකට සිය සබ්‍රහ්මචාරීන් කෙරෙහි ඔවුන් ඉදිරිපිටදීත් ඔවුන් නැති තැනදීත් මෛත්‍රී සහගත කායකර්ම එළඹ සිටියේ (යුක්තවූයේ) වෙයි ද මේ කාරණය සිහි කළ යුත්තකි.

තවද, මහණෙනි, භික්ෂූන් වහන්සේට සිය බ්‍රහ්මචාරීන් කෙරෙහි ඔවුන් ඇතිවිටත් නැතිවිටත් මෛත්‍රී සහගත වාක් කර්ම එළඹ සිටියේ වෙයි ද ඒ කාරණය ද සිහිකළ යුත්තකි.

තවද, මහණෙනි, භික්ෂූන් වහන්සේට සිය බ්‍රහ්මචාරීන් කෙරෙහි ඔවුන් ඇතිවිටත් නැති විටත් මෛත්‍රී සහගත මනෝ කර්ම එළඹ සිටියේ වෙයි ද, ඒ කාරණය ද සිහිකළ යුත්තකි.

තවද මහණෙනි, භික්ෂූන් වහන්සේ දැහැමින් ලබන ලද යටත් පිරිසෙයින් පාත්‍රයට ලැබුණු අහරක් පමණ වූ හෝ දැහැමි ලාභයක් වෙයි ද, එබඳු ලාභය අඩු වැඩි කිරීමකින් තොර ව බෙදා වළඳන සුලු වූයේ, සිල්වත් සබ්‍රහ්මචාරීන් සමග සමාන පරිභෝග ඇත්තේ වෙයි ද ඒ කාරණය ද සිහිකළ යුත්තකි.

තවද මහණෙනි, භික්ෂූන් වහන්සේ කඩතොලු නොවූ, සිදුරු රහිත වූ, පුල්ලි රහිත වූ, තැන තැන කැලැල් නොවූ, නිවහල් වූ නුවණැත්තන් විසින් පසස්නා ලද කිසිවෙකු විසින් වත් චෝදනා කළ නොහැක්කා වූ සමාධිය කරා යොමු වූ, සීලයෙන් සබ්‍රහ්මචාරීන් සමඟ ඔවුන් ඉදිරිපිටදීත්, නැති තැනදීත් සීල සමානත්වයට පත්ව වාසය කෙරේද එය සිහි කළ යුත්තකි.

තවද, මහණෙනි, භික්ෂූන් වහන්සේ නෛර්යාණික වූ හෙවත් නිවන කරා පමුණුවන්නා වූ යම්, මේ සම්‍යක් දෘෂ්ටියක් ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක කරන විට මනාව දුක් දුරු කිරීම පිණිස හේතු වෙයි ද, එබඳු දෘෂ්ටියෙන් සබ්‍රහ්මචාරීන් කෙරෙහි ඔවුන් ඉදිරියේදීත්, නැති තැනදීත් දෘෂ්ටියෙන් සමානත්වයට පත් ව වෙසෙයි ද, ඒ කාරණය ද සිහිකළ යුත්තකි.

**සාරාණීය ධම්ම - සිහිකළ යුතු ධර්ම යි**

බුද්ධ දේශනාවේ සිහි කළයුතු ධර්ම වශයෙන් විශේෂයෙන් දැක්වෙන කරුණු රැසක් හමුවෙයි. ඒ අතර දසධම්ම සූත්‍රයේ දී භික්ෂූන් වහන්සේලා විසින් නිතර සිහිකළ යුතු ධර්ම දහයක් දැක්වෙයි. අභිණ්හපච්චවෙක්ඛිතබ්බ සූත්‍රයේ දී ගිහි පැවිදි සියල්ලන් විසින් ම නිතර සිහිකළ යුතු ජාති-ජරා-මරණ- ආදී කරුණු රැසක් දක්වා තිබේ. අංගුත්තර නිකායේ සාරාණීය වර්ගයේ සූත්‍රවල ද එන්නේ විශේෂයෙන් පැවිද්දන් විසිනුත් අවිශේෂයෙන් සියල්ලන් විසිනුත් සිතිය යුතු කරුණු හයකි. එනම්,

1. සබ්‍රහ්මචාරීන් කෙරෙහි මෛත්‍රී සහගත කායකර්මයෙන් යුක්ත විය යුතු බව
2. මෛත්‍රී සහගත වාක් කර්මයෙන් යුක්ත විය යුතු බව
3. මෛත්‍රී සහගත මනෝකර්මයෙන් යුක්ත විය යුතු බව
4. සිව්පසය සම්බන්ධයෙන් සබ්‍රහ්මචාරීන් සමඟ සාධාරණ භෝගී වියයුතු බව
5. සබ්‍රහ්මචාරීන් හා සමාන වූ ආර්යශීලයෙන් යුක්ත වියයුතු බව
6. සමාන සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත වියයුතු බව

යන කරුණු හය යි.

**මෙත්තං කාය - වචී - මනො කම්මං**

සබ්‍රහ්මචාරීන් වහන්සේලා සමග තිදොරින් ම මෛත්‍රී සහගත හැසිරීම මෙයින් අදහස් කෙරේ. මේ පිළිබඳ විස්තර කිරීමට වඩා එය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ අවස්ථාවක් මජ්ඣිම නිකායේ චූලගොසිංග සූත්‍රයෙන් ගෙන හැර දක්විය හැකි ය. ගොසිංග සාලවනයේ විසූ අනුරුද්ධ, නන්දිය හා කිම්බිල තෙරුන් වහන්සේලා තමන් ඔවුනොවුන් කෙරෙහි කෙබඳු මෛත්‍රියකින් වාසය කරන්නෝ ද යන්න මේ සූත්‍රයේ දී බුදුරදුන් හමුවේ ද පවසති. ඒ සාකච්ඡාවෙන් කොටසක් මෙසේ ය.

**1. ''කච්චි පන වො අනුරුද්ධා සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරථාති?**

**තග්ඝ, මයං භන්තෙ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තෙ විහරාමාති.**

**ඉධ මය්හං භන්තෙ එවං හොති, ලාභා වත මෙ සුලද්ධං වත මෙ, යොහං එවරූපෙහි සබ්‍රහ්මචාරීහි සද්ධිං විහරාමි. තස්ස මය්හං භන්තෙ ඉමෙසු ආයස්මන්තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං ආවී චෙව රහො ච. මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං ආවි චෙව රහො ච. මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං ආවී චෙව රහො ච.**

**තස්ස මය්හං භන්තෙ එවං හොති; යන්නූනාහං සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසං යෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තෙය්‍යන්ති. සො ඛො අහං භන්තෙ සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසං යෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තාමි. නානා හි ඛො නො භන්තෙ කායා. එකඤ්ච පන මඤ්ඤෙ චිත්ත'න්ති....''**

**2. ''ඉධ පන භන්තෙ, අම්හාකං යො පඨමං ගාමතො පිණ්ඩාය පටික්කමති; සො ආසනානි පඤ්ඤාපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨපෙති. අවක්කාරපාතිං උපට්ඨපෙති යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමති, සචෙ හොති භුත්තාවසෙසො සචෙ ආකඞ්ඛති භුඤ්ජති. නො චෙ ආකඞ්ඛති, අප්පහරිතෙ වා ඡඩ්ඩෙති. අප්පාණකෙ වා උදකෙ ඕපිලාපෙති. සො ආසනානි පටිසාමෙති. පානීයං පරිභොජනීයං පටිසාමෙති. අවක්කාරපාතිං පටිසාමෙති. භත්තග්ගං සම්මජ්ජති. යො පස්සති පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං, සො උපට්ඨපෙති. සචස්ස හොති අවිසය්හං, හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨපෙම නත්වෙව මයං භන්තෙ තප්පච්චයා වාචං භින්දාම.**

**(ම.නි.චූලගොසිංග සූත්‍රය)**

**භාවය**

1. ''අනුරුද්ධයෙනි, කෙසේ ද ඔබ වහන්සේලා සමගියෙන්, සතුටින්, විවාදයකින් තොරව, කිරිත් දියත් මුසු වූවා සේ ඔවුනොවුන් දෙස ප්‍රිය මනාප බැල්මෙන් බලමින් වසන්නාහු ද?

''ස්වාමීනි, අපි ඇත්ත වශයෙන් ම සමගියෙන්, සතුටින් විවාදයකින් තොරව කිරිත් දියත් මුසු වූවා සේ ඔවුනොවුන් දෙස ප්‍රිය බැල්මෙන් යුතු ව වසමු.

''ස්වාමීනි, (එසේ වසන) මට මෙසේ සිතෙයි: ''මට මෙවන් සබ්‍රහ්මචාරීන් සමග වසන්නට ලැබීම මහත් ලාභයකි.

''ස්වාමීනි, (එසේ සිතන) මට මේ ආයුෂ්මතුන් වහන්සේලා කෙරෙහි එළිපිට මෙන් ම රහසිනුත් මෛත්‍රීසහගත කායකර්ම, වාක්කර්ම හා මනෝකර්ම එළඹ සිටී (ඇතිවෙයි)

''ස්වාමීනි, එසේ (මෛත්‍රියෙන්) ක්‍රියාකරන මට මෙසේ ද සිතෙයි. ඒ මම මගේ සිත (අදහස්) පසෙක තබා මේ ආයුෂ්මතුන් වහන්සේලාගේ සිතට අනුකූල ව පවතින්නෙම් නම් යෙහෙකි යි.

''ස්වාමීනි, එසේ සිතන මම මගේ සිත පසෙක තබා මේ ආයුෂ්මතුන් වහන්සේලාගේ සිතට අනුව පවතිමි. ස්වාමීනි, අපි ශරීරයෙන් විවිධ වෙමු. එහෙත් සිතින් නම් එක් කෙනෙකැයි මට හැඟෙයි.

2. ''අපෙන් යම් කෙනෙක් සැමට පසුව පිඬු පිණිස හැසිර ගමෙන් පෙරළා පැමිණෙත් ද, උන්වහන්සේ සෙස්සන් වළඳා ඉතිරි වූ යමක් වේ ද ඒවා කැමති නම් වළඳයි, නැතිනම් තණකොළ නැති බිමක හෝ දමයි. සතුන් නැති ජලයක හෝ ගිල්වා දමයි. උන්වහන්සේ අසුන් ද හකුලා තබයි. දන්ගෙය ද අමදියි.

''අපෙන් යම් කෙනෙක් පිවයුතු හෝ පරිභෝග කළයුතු පැන් බඳුන් හිස් ව තිබෙනු දකී ද උන්වහන්සේ ඒවා පුරවා තබයි. උන්වහන්සේ එය තනිව එසවීමට අසමත් වේ නම් තවත් කෙනෙකුට අත වනා කථාකොට දෙදෙනාගේ අත්පැටළුම මගින් (අත් එකට බැඳ ඔසවාගෙන) ගෙනවුත් තබමු. ස්වාමීනි, අපි ඒ වෙනුවෙන් වචනයක්වත් පිට නොකරමු''.

(මහණදම් පුරණ ඇත්තන් ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කාය, වාක්, මනඃකර්ම කෙසේ පැවැත්විය යුතු ද යන්න මේ ඇසුරින් වටහා ගත හැකි ය).

**අප්පටිවිභත්තභොගී** - සිවුපස කිසිවෙකුටත් විශේෂයක් නොකොට, තෝරා තෝරා නො බෙදා ඔවුනොවුන් අතර බෙදා ගෙන පරිභෝග කිරීම යි.

**සාධාරණභොගී** - ලැබෙන දෙය අල්ප වුව ද කිසිවෙකුටත් අඩුවක් නොතබා සමව බෙදාගෙන පරිභෝග කිරීම යි. මෙසේ බෙදා හදා ගැනීම මුහුණට පමණක් නොව මුලු හිතින් ම කළයුතු බව **ආවී චෙව රහො** යන්නෙන් කියවේ.

**සීල සාමඤ්ඤගතො**

සීල පාරිශුද්ධියෙන් සමාන වීම ය. මේ සම්බන්ධ ව පස්වන සාරණීය ධර්මයේ දී විශේෂ විග්‍රහයක් දක්වේ.

**අඛණ්ඩ** - අගින් හෝ මුලින් සික පද නොකැඩුණු, උල්ලංඝනය නොකොට රැකගත් ශීලය

**අච්ඡිද්ද** - කළයක සිදුරක් තිබීමෙන් දිය කාන්දු වන්නාසේ මැදින් එක් සික පදයක් බිඳීමෙන් සිදුරු වීමට එසේ ඉඩ නොතැබූ ශීලය අච්ඡිද්ද ශීලයයි.

**අසබල** - සබල යනු පුල්ලි සහිත බව යි. අතරින් පතර සික පද සිඳී යාම පුල්ලි වැටීමක් බඳු ය. එසේ නොවූ ශීලය අසබල නම් වේ.

**අකම්මාස** - ලප කැලැල් සහිත බව කම්මාස නම්. ගවයෙකුගේ ලප විවිධ වර්ණයෙන් කැපී පෙනෙන්නා සේ තැනින් තැනින් සිකපද කිහිපයක් සිඳී යා නොදී රැකගත් සීලය අකම්මාස නම්.

**භුජිස්ස** - වහල් බවින් මිදීම ය. තණ්හාවට හෝ කාමයන්ට වහල් නොවූ සීලය භුජිස්ස නම් වේ.

**විඤ්ඤුප්පසත්ථ** - දසධම්ම සූත්‍රයේ කී පරිදි සීලය නුවණැත්තන්ගේ උපවාදයට ලක් නොවිය යුතු ය.

**අපරාමට්ඨ** - මෙහි අර්ථ දෙකකි. තෘෂ්ණා, දෘෂ්ටි දෙකින් ස්පර්ශ නොවූ සීලය හෝ මේ වරද ඔබ කළේ යයි කිසිවෙකුටත් අභියෝග කළ නොහැකි සීලයයි.

**සමාධි සංවත්තනික** - සීල යනු කාය වාග් සංවරය යි. සමාධි යනු මනෝ සංවරය යි, මනෝ සංවරයට කාය වාක්, සංවරය ඉවහල්වන බැවින් සමාධි සංවත්තනික නම්.

මෙබඳු සීලයෙන් සෙසු සබ්‍රහ්මචාරීන් සමග සමාන ව විසීම යි. එහිදී සබ්‍රහ්මචාරීන් සමග රහසින් වත් සීලයෙන් වෙනසක් නැතිව විසිය යුතු බව '' ආවී චෙව රහොච'' යන පාඨයෙන් කියවේ.

- **දිට්ඨි සාමඤ්ඤගතො** - පිළිපදින්නා නිවන කරා පමුණුවන්නාවූ (නියයාණික), උතුම් වූ (අරියා) සම්‍යක් දෘෂ්ටියෙන් රහසින් පවා සබ්‍රහ්මචාරීන් සමග සම ව පැවතීම යි.

**ආනිසංස** - මෙසේ මෙකී සාරණීය ධර්ම පුරුදු පුහුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන අංගුත්තර නිකායේ දුතිය සාරාණීය සූත්‍රයේ එයි.

ඒ අනුව මේ ධර්ම සය සබ්‍රහ්මචාරීන් අතර,

1. **පියකරණා** - **ප්‍රිය උපදවන**
2. **ගරුකරණා** - **ගෞරව ඇතිවන**
3. **සංගහාය** - **සංග්‍රහ පිණිස වන**
4. **අවිවාදාය** - **විවාද නොකිරීම පිණිස හේතුවන**
5. **සාමග්ගියා** - **සමගිය පිණිස වන**
6. **එකීභාවාය** - **එකමුතු බව පිණිස වන**

කරුණු හයකි.

සිත, කය, වචනය යන ත්‍රිවිධ ද්වාරයෙන් ඔවුනොවුන් හා මෛත්‍රී සහගතව ක්‍රියාකරමින් අල්ප දෙයක් හෝ බෙදා පරිහරණය කරගෙන ආර්ය ශීලයෙන් හා සම්මා දිට්ඨියෙන් යුතුව භික්ෂූන් වහන්සේ ක්‍රියාකරන්නේ නම් සංඝ සමාජයේ ඒකීයත්වය ආරක්ෂා වන්නේ ය. එසේම තම තමන් විසින් අපේක්ෂිත පරම සුවය වන නිවන අවබෝධය සඳහා ද එය මනා ශක්තියක් වනු ඇත.

**අභ්‍යාස**

01. "භික්ෂූන් වහන්සේලාගේ සමගි සම්පන්න බව සාසනයේ ඉදිරි යහපතට හේතුවේ" මෙම අදහස සනාථ කිරීමට ත්‍රිපිටකයේ එන තොරතුරු එක්රැස් කරන්න.
02. සාරාණීය ධර්ම සහ ඒවා පුරුදු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන වෙන් වෙන් වශයෙන් දක්වන්න.
03. සිල්වත්වීමේ අගය පිළිබඳ ව ධර්ම පත්‍රිකාවක් සකසන්න.

11 පාඩම

# තමන් හැඳී අනුන් හඳන භික්ෂුව

## (ධම්මඤ්ඤු සූත්‍රය)

සත්තහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අංජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි සත්තහි?

ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මඤ්ඤූ ච හොති අත්ථඤ්ඤූ ච, අත්තඤ්ඤූ ච මත්තඤ්ඤූ ච කාලඤ්ඤූච පරිසඤ්ඤූ ච පුග්ගලපරොවරඤ්ඤූ ච

(1) කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මඤ්ඤූ හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. නො චෙ භික්ඛවෙ, භික්ඛු ධම්මං ජානෙය්‍ය සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං නයිධ ධම්මඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු ධම්මං ජානාති සුත්තං ගෙය්‍යං - පෙ - අබ්භුතධම්මං වෙදල්ලං, තස්මා භික්ඛු ධම්මඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ.

(2) අත්ථඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානාති ''අයං ඉමස්ස භාසිතස්ස අත්ථො, අයං ඉමස්ස භාසිතස්ස අත්ථො'' ති. නො චෙ භික්ඛවෙ, භික්ඛු තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානෙය්‍ය ''අයං ඉමස්ස භාසිතස්ස අත්ථො, අයං ඉමස්ස භාසිතස්ස අත්ථොති'' නයිධ අත්ථඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු තස්ස තස්සෙව භාසිතස්ස අත්ථං ජානාති '' අයං ඉමස්ස භාසිතස්ස අත්ථො, අයං ඉමස්ස භාසිතස්ස අත්ථො''ති. තස්මා අත්ථඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ, අත්ථඤ්ඤූ.

(3) අත්තඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු අත්තානං ජානාති එත්තකොම්හි සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙනාති. නො චෙ භික්ඛවෙ, භික්ඛු අත්තානං ජානෙය්‍ය එත්තකොම්හි සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙනාති, නයිධ අත්තඤ්ඤූති වුච්චෙය්‍ය, යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු අත්තානං ජානාති එත්තකොම්හි සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙනාති. තස්මා අත්තඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ අත්තඤ්ඤූ.

(4) මත්තඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු මත්තං ජානාති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං පටිග්ගහණාය; නො චෙ භික්ඛවෙ, භික්ඛු මත්තං ජානෙය්‍ය චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං පටිග්ගහණාය, නයිධ මත්තඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු මත්තං ජානාති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං පටිග්ගහණාය, තස්මා මත්තඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ, අත්තඤ්ඤූ මත්තඤ්ඤූ.

(5) කාලඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛු කාලං ජානාති: අයං කාලො උද්දෙසස්ස, අයං කාලො පරිපුච්ඡාය, අයං කාලො යොගස්ස, අයං කාලො පටිසල්ලානායාති. නො චෙ භික්ඛවෙ, භික්ඛු කාලං ජානෙය්‍ය, අයං කාලො උද්දෙසස්ස, අයං කාලො පරිපුච්ඡාය, අයං කාලො යොගස්ස, අයං කාලො පටිසල්ලානායාති නයිධ කාලඤ්ඤූති වුච්චෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු කාලං ජානාති: අයං කාලො උද්දෙසස්ස, අයං කාලො පරිපුච්ඡාය, අයං කාලො යොගස්ස, අයං කාලො පටිසල්ලානායා'ති තස්මා කාලඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ අත්තඤ්ඤූ මත්තඤ්ඤූ කාලඤ්ඤූ.

(6) පරිසඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ භික්ඛු පරිසං ජානාති: අයං ඛත්තිය පරිසා, අයං බ්‍රාහ්මණ පරිසා, අයං ගහපතිපරිසා, අයං සමණපරිසා, තත්ථ එවං උපසඞ්කමිතබ්බං, එවං ඨාතබ්බං, එවං කත්තබ්බං, එවං නිසීදිතබ්බං, එවං භාසිතබ්බං, එවං තුණ්හී භවිතබ්බන්ති. නො චෙ භික්ඛවෙ, භික්ඛු පරිසං ජානෙය්‍ය: අයං ඛත්තියපරිසා, අයං බ්‍රහ්මණපරිසා, අයං ගහපති පරිසා, අයං සමණපරිසා, තත්ථ එවං උපසඞ්කමිතබ්බං, එවං ඨාතබ්බං, එවං කත්තබ්බං, එවං නිසිදිතබ්බං, එවං භාසිතබ්බං, එවං තුණ්හී භවිතබ්බන්ති, නයිධ පරිසඤ්ඤූති වුච්චෙය්‍ය, යස්මා ච ඛො භික්ඛවෙ, භික්ඛු පරිසං ජානාති: අයං ඛත්තියපරිසා, අයං බ්‍රාහ්මණපරිසා අයං ගහපතිපරිසා, අයං සමණපරිසා, තත්ථ එවං උපසඞ්කමිතබ්බං, එවං ඨාතබ්බං, එවං කත්තබ්බං, එවං නිසීදිතබ්බං, එවං භාසිතබ්බං, එවං තුණ්හී භවිතබ්බන්ති. තස්මා පරිසඤ්ඤූති වුච්චති. ඉති ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ අත්තඤ්ඤූ මත්තඤ්ඤූ කාලඤ්ඤූ පරිසඤ්ඤූ.

(7) පුග්ගලපරොවරඤ්ඤූ ච කථං හොති. ඉධ භික්ඛවෙ, භික්ඛුනො ද්වයෙන පුග්ගලා විදිතා හොන්ති. ද්වෙ පුග්ගලා: එකො අරියානං දස්සනකාමො, එකො අරියානං න දස්සනකාමො. ය්වායං පුග්ගලො අරියානං න දස්සනකාමො එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. ය්වායං පුග්ගලො අරියානං දස්සනකාමො එවං සො තෙනඞ්ගෙන පාසංසො.

ද්වෙ පුග්ගලා අරියානං දස්සනකාමා: එකො සද්ධම්මං සොතුකාමො, එකො සද්ධම්මං න සොතුකාමො. ය්වායං පුග්ගලො සද්ධම්මං න සොතුකාමො, එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. ය්වායං පුග්ගලො සද්ධම්මං සොතුකාමො, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

ද්වෙ පුග්ගලා සද්ධම්මං සොතුකාමා: එකො ඔහිතසොතො ධම්මං සුණාති, එකො අනොහිතසොතො ධම්මං සුණාති. ය්වායං පුග්ගලො අනොහිතසොතො ධම්මං සුණාති, එවං සො තෙනඞ්ගෙන ගාරය්හො, ය්වායං පුග්ගලො ඔහිතසොතො ධම්මං සුණාති, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

ද්වෙ පුග්ගලා ඔහිතසොතා ධම්මං සුණන්ති: එකො සුත්වා ධම්මං ධාරෙති, එකො සුත්වා ධම්මං න ධාරෙති, ය්වායං පුග්ගලො සුත්වා ධම්මං න ධාරෙති, එවං සො තෙනඞ්ගෙන ගාරය්හො, ය්වායං පුග්ගලො සුත්වා ධම්මං ධාරෙති, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

ද්වෙ පුග්ගලා සුත්වා ධම්මං ධාරෙන්ති: එකො ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, එකො ධතානං ධම්මානං අත්ථං න උපපරික්ඛති. ය්වායං පුග්ගලො ධතානං ධම්මානං අත්ථං න උපපරික්ඛති, එවං සො තෙනඞ්ගෙන ගාරය්හො. ය්වායං පුග්ගලො ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති, එවං සො තෙනඞ්ගෙන පාසංසො.

**දෙව පුගගලා ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛන්ති: එකො අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො, එකො න අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො. යවායං පුගගලො න අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො, එවං සො තෙනඞ්ගන ගාරය්හො. යවායං පුගගලො අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො, එවං සො තෙනඞ්ගන පාසංසො.**

**දෙව පුගගලා අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නා: එකො අත්තහිතාය පටිපන්නො නො පරහිතාය. එකො අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච. යවායං පුගගලො අත්තහිතාය පටිපන්නො නො පරහිතාය, එවං සො තෙනඞ්ගන ගාරය්හො, යවායං පුගගලො අත්තහිතාය ච පටිපන්නො පරහිතාය ච, එවං සො තෙනඞ්ගන පාසංසො.**

**එවං ඛො භික්ඛවෙ, භික්ඛුනො ද්වයෙන පුගගලා විදිතා හොන්ති, එවං ඛො භික්ඛවෙ භික්ඛු පුගගලපරොවරඤ්ඤූ හොති.**

**ඉමෙහි ඛො භික්ඛවෙ සත්තහි සද්ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති - පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.**

**(අ.නි.4.444.448, ධම්මඤ්ඤූ සුත්ත)**

**අර්ථය :-**

මහණෙනි, ධර්ම හතකින් යුක්ත භික්ෂූන් වහන්සේ ආහුනෙය්‍ය වෙයි. පාහුනෙය්‍ය ද වෙයි. දක්ඛිණෙය්‍ය ද වෙයි. අංජලීකරණීය ද වෙයි. ලෝකයාට උතුම් වූ පින් කෙතක් ද වෙයි. ඒ කවර ධර්ම හතකින් යුක්ත භික්ෂුවක් ද යත්.

මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් ධර්මය දන්නේ වෙයි. ධර්මාර්ථ දන්නේ වෙයි තමා පිළිබඳ ව දන්නේ වෙයි. සිව්පසයෙහි පමණ දන්නේ වෙයි. තමාගේ කාල පරිහරණය දන්නේ වෙයි. පිරිස් මැද හැසිරෙන අයුරු දන්නේ වෙයි. පුද්ගලයන්ගේ විවිධත්වය දන්නේ වෙයි.

## 01. ධම්මඤ්ඤූ

යම් භික්ෂුවක් කෙසේ නම් ධර්මය දන්නේ වෙයි ද ? මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුවක් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා , උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වේදල්ල යන නවාංග ශාස්තෘ සාසනය දන්නේ වෙයි. මහණෙනි, භික්ෂුවක් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන නවාංග ශාස්තෘසාසන ධර්මය නොදන්නේ නම් එම භික්ෂුව ධර්මය දන්නේ යැයි කියනු නොලැබේ. මහණෙනි, යම් භික්ෂුවක් සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන ධර්මය දන්නේ නම් එහෙයින් ඒ භික්ෂුව ධර්මය දන්නේ යැයි කියනු ලැබේ. මෙසේ භික්ෂුව ධර්මය දන්නේ වෙයි.

## 02. අත්ථඤ්ඤූ

යම් භික්ෂුවක් කෙසේ නම් අර්ථය දන්නේ වෙයි ද ? මහණෙනි, මේ ශාසනයෙහි යම් භික්ෂුවක් ඒ ඒ කියන ලද ධර්මයන්හි අර්ථය දනී, මේ කියන ලද්දෙහි අර්ථය මෙසේ ය, මේ කියන ලද්දෙහි අර්ථය මෙසේ ය යනුවෙනි. මහණෙනි, යම් භික්ෂුවක් මේ කියන ලද්දෙහි අර්ථය මෙසේ ය, මේ කියන ලද්දෙහි අර්ථය මෙසේ යැයි ඒ ඒ කියන ලද්දෙහි අර්ථය නොදන්නේ නම් ඒ භික්ෂුව මේ සාසනයෙහි ධර්ම අර්ථ දන්නෙකැයි කියනු නොලැබේ. යම් හෙයින් මහණෙනි, භික්ෂුවක් මේ කියන ලද්දේ අර්ථය මෙසේ ය. මේ කියන ලද්දේ අර්ථය මෙසේ ය. ඒ ඒ කියන ලද දෙයෙහි අර්ථය දන්නේ ද එහෙයින් ධර්ම අර්ථ දන්නේ යැයි කියනු ලැබේ. මෙසේ භික්ෂුව ධර්මය දන්නෙක්, අර්ථය දන්නෙක් වෙයි.

## 03. අත්තඤ්ඤූ

යම් භික්ෂුවක් කෙසේ  නම් තමා පිළිබඳ ව දන්නේ වෙයි ද? මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුවක් මම ශ්‍රද්ධාවෙන් මෙපමණ වෙමි. ශීලයෙන් මෙපමණ වෙමි ශ්‍රැතයෙන් හෙවත් ධර්ම ඥානයෙන් මෙපමණ වෙමි. ත්‍යාගශීලී භාවයෙන් මෙපමණ වෙමි, ප්‍රඥාවෙන් මෙපමණ වෙමි. පටිභාන හෙවත් වැටහීමෙන් මෙපමණ වෙමි යි තමා පිළිබඳ දන්නෙක් වෙයි. මහණෙනි, යම් හෙයකින් භික්ෂුවක් මම ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන්, වැටහීමෙන් මෙපමණ වෙමියි තමා පිළිබඳ ව නොදන්නේ නම් ඒ භික්ෂුව මේ සාසනයෙහි තමා පිළිබඳ ව දන්නෙකැයි කියනු නොලැබේ. මහණෙනි, යම් හෙයකින් භික්ෂුවක් මම ශ්‍රද්ධාවෙන් ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන්, වැටහීමෙන් මෙපමණ වෙමියි දන්නේ නම් එහෙයින් භික්ෂුව තමා පිළිබඳ ව දන්නෙකැයි කියනු ලැබේ. මෙසේ භික්ෂුව ධර්මය දන්නෙක් ද අර්ථය දන්නෙක් ද තමා පිළිබඳ ව දන්නෙක් ද වෙයි.

## 04. මත්තඤ්ඤූ

කෙසේ නම් භික්ෂුවක් පමණ දන්නේ වෙයි ද? මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුවක් සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත්, පිරිකර පිළිගැනීම පිළිබඳ ව පමණ දන්නේ වෙයි. මහණෙනි, භික්ෂුවක් සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර පිළිගත යුතු පමණ නොදන්නේ වෙයි නම් මේ සාසනයෙහි එම භික්ෂුව පමණ දන්නෙකැයි කියනු නොලැබේ. මහණෙනි, යම් හෙයකින් භික්ෂුව චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත්, පිරිකර පිළිගැනීමේ පමණ දන්නේ නම් එහෙයින් උන්වහන්සේ පමණ දන්නෙකැයි කියනු ලැබේ. මෙසේ භික්ෂුව ධර්මය දන්නෙක් ද අර්ථය දන්නෙක් ද තමා පිළිබඳ දන්නෙක් ද පමණ දන්නෙක් ද වෙයි.

## 05. කාලඤ්ඤූ

භික්ෂුවක් කෙසේ නම් කාලය දන්නෙක් වෙයි ද? මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුවක් මෙය ඉගෙනීමේ වේලාව යි, මෙය ප්‍රශ්න විමසීමේ වේලාව යි, මෙය භාවනාවේ යෙදීමේ වේලාව යි, මෙය විවේකයට වේලාවය යි දන්නේ වෙයි. මහණෙනි, යම් හෙයකින්

භික්ෂුවක් මෙය ඉගෙනීමට වේලාව ය, මෙය ප්‍රශ්න විමසීමට වේලාව ය, මෙය භාවනාවේ යෙදීමට වේලාව ය, මෙය විවේකයට වේලාව ය යි කාලය ගැන නොදන්නේ නම් උන්වහන්සේ මේ සසුනෙහි කාලය ගැන දන්නෙකැයි කියනු නොලැබේ. යම් හෙයකින් භික්ෂුව මේ ඉගෙනීමට වේලාව ය, මේ ප්‍රශ්න විමසීමට වේලාව ය, මෙය භාවනාවට වේලාව ය, මෙය විවේකයට වේලාවයැයි, කාලය ගැන දන්නේ නම් එහෙයින් උන්වහන්සේ කාලඤ්ඤූ හෙවත් කාලය දන්නෙකැයි කියනු ලැබේ.

මෙසේ භික්ෂුව ධර්මය දන්නෙක් ද, අර්ථය දන්නෙක් ද තමා ගැන දන්නෙක් ද පමණ දන්නෙක් ද කාලය දන්නෙක් ද වෙයි.

## 06. පරිසඤ්ඤූ

භික්ෂුවක් කෙසේනම් පිරිස් ගැන දන්නේ වෙයි ද? මහණෙනි, මේ සාසනයේ භික්ෂුවක් මේ ක්ෂත්‍රිය පිරිස ය, මේ බ්‍රාහ්මණ පිරිස ය, මේ ගෘහපති පිරිස ය, මේ ශ්‍රමණ පිරිස ය, ඒ ඒ පිරිස මැදට යායුත්තේ මෙසේ ය, එහි සිටිය යුත්තේ මෙසේ ය, එහි ක්‍රියා කළ යුත්තේ මෙසේ ය, එහි හිඳිය යුත්තේ මෙසේ ය, එහි කථාකළ යුත්තේ මෙසේ ය, එහි නිහඬව සිටිය යුත්තේ මෙසේ යැයි ඒ පිරිස් ගැන දන්නේ වෙයි.

මහණෙනි, යම් භික්ෂුවක් මේ ක්ෂත්‍රිය පිරිස ය, බ්‍රාහ්මණ පිරිස ය, මේ ගෘහපති පිරිස ය, මේ ශ්‍රමණ පිරිස ය, ඔවුන් මැදට යා යුත්තේ මෙසේ ය, එහි සිටිය යුත්තේ මෙසේ ය, ක්‍රියාකළ යුත්තේ මෙසේ ය, හිඳිය යුත්තේ මෙසේ ය, කථාකළ යුත්තේ මෙසේ ය, නිහඬව සිටිය යුත්තේ මෙසේ යැයි නොදන්නේ නම් උන්වහන්සේ මේ සසුනෙහි පිරිස් ගැන දන්නෙකැයි  කියනු නොලැබේ.

මහණෙනි, යම් හෙයකින් භික්ෂුවක් මේ ක්ෂත්‍රිය පිරිස ය. මේ බ්‍රාහ්මණ පිරිස ය, මේ ගෘහපති පිරිස ය. මේ ශ්‍රමණ පිරිස ය, එහි එළඹිය යුත්තේ මෙසේ ය. සිටිය යුත්තේ මෙසේ ය. ක්‍රියා කළ යුත්තේ මෙසේ ය. හිඳිය යුත්තේ මෙසේ ය. කතාකළ යුත්තේ මෙසේ ය. නිහඬව සිටිය යුත්තේ මෙසේ ය යැයි පිරිස් ගැන දන්නේ නම් එහෙයින් එම භික්ෂුව පරිසඤ්ඤූ හෙවත් පිරිස් ගැන දන්නෙකැයි කියනු ලැබේ.

මෙසේ භික්ෂුව ධර්මය දන්නෙක් ද අර්ථය දන්නෙක් ද තමා ගැන දන්නෙක් ද පමණ දන්නෙක් ද කාලය දන්නෙක් ද පිරිස් ගැන දන්නෙක් ද වෙයි.

## 07. පුග්ගල පරොවරඤ්ඤූ

භික්ෂුවක් කෙසේනම් (ගුණයෙන් උස්පහත් බව අනුව) පුද්ගලයන් ගැන දැන්නෙක් වෙයි ද?

මහණෙනි, මේ සසුනෙහි භික්ෂුවට නිතර ම දෙයාකාරයකින් පුද්ගලයන් දැන ගන්නට ලැබේ.

පුද්ගලයෝ දෙදෙනෙකි. එක් අයෙක් ආර්යයන් වහන්සේලා දක්මට කැමති ය. එක් අයෙක් ආර්යයන් වහන්සේලා දකීමට අකමැති ය. මෙයින් යමෙක් ආර්යයන් වහන්සේලා දක්නට අකමැති වෙයි ද ඒ පුද්ගලයා ඒ කාරණයෙන් ගැරහිය යුත්තෙක් වෙයි. යම් පුද්ගලයෙක් ආර්යයන් වහන්සේලා දක්නට කැමති වෙයි ද ඔහු ඒ කාරණයෙන් පැසසිය යුත්තෙක් වෙයි.

ආර්යයන් වහන්සේලා දකිනු කැමති පුද්ගලයෝ දෙදෙනෙකි. එක් අයෙක් බණ අසනු කැමති ය. එක් අයෙක් බණ ඇසීමට අකමැති ය. මෙයින් යම් පුද්ගලයෙක් බණ අසනු නොකැමැත්තේ වෙයි ද ඒ කාරණයෙන් හෙතෙම ගැරහිය යුත්තෙක් වෙයි. යම් පුද්ගලයෙක් බණ අසනු කැමති වෙයි ද ඒ කාරණයෙන් හෙතෙම පැසසිය යුත්තෙක් වෙයි.

බණ අසනු කැමති පුද්ගලයෝ ද දෙදෙනෙකි. එක් අයෙක් හොඳින් කන් යොමා බණ අසයි. එක් අයෙක් හොඳින් කන් යොමු කිරීමෙන් තොරව බණ අසයි. මෙයින් යම් පුද්ගලයෙක් හොඳින් කන් යොමු නොකොට බණ අසයි ද හෙතෙම එම කාරණයෙන් ගැරහිය යුත්තෙක් වෙයි. යම් පුද්ගලයෙක් හොඳින් කන් යොමුකොට බණ අසයි ද හෙතෙම එම කරුණින් පැසසිය යුත්තෙක් වෙයි.

හොඳින් කන් යොමා බණ අසන පුද්ගලයෝ ද දෙදෙනෙකි. එක් අයෙක් බණ අසා ධාරණය කරගනී එක් අයෙක් බණ අසා ධාරණය කර නොගනී. මෙයින් යම් පුද්ගලයෙක් බණ අසා ධාරණය කර නොගනී ද හෙතෙම එම කාරණයෙන් ගැරහිය යුතු ය. යම් පුද්ගලයෙක් බණ අසා ධාරණය කරගන්නේ ද ඒ කාරණයෙන් හෙතෙම පැසසිය යුත්තෙක් වෙයි.

ධර්මය අසා ධාරණය කරගන්නා පුද්ගලයෝ ද දෙදෙනෙකි. එක් අයෙක් අසා ධාරණය කරගත් ධර්මයෙහි අර්ථ විමසා බලයි. අයෙක් අසා ධාරණය කරත් ධර්මයෙහි අර්ථ විමසා නොබලයි. මෙසේ යම් පුද්ගලයෙකු අසා ධාරණය කරගත් ධර්මයෙහි අර්ථ විමසා නොබලයි ද හෙතෙම එම කරුණින් ගැරහිය යුත්තෙක් වෙයි. යම් පුද්ගලයෙක් ධාරණය කරගත් ධර්මයෙහි අර්ථ විමසා බලයි ද හෙතෙම එම කරුණින් පැසසිය යුත්තෙක් වෙයි.

ධාරණය කරගත් ධර්මයේ අර්ථ විමසා බලන පුද්ගලයෝ ද දෙදෙනෙකි. එක් අයෙක් අර්ථයත් දැන ධර්මයත් දැන ධර්මානුකූලව පිළිපදින්නෙක් වෙයි. එක් අයෙක් අර්ථයත් ධර්මයත් දැන ධර්මානුකූලව පිළිපදින්නෙක් නොවෙයි. මෙයින් යම් පුද්ගලයෙක් අර්ථයත් ධර්මයත් දැන ධර්මානුකූලව පිළිපදින්නෙක් නොවේ ද හෙතෙම ඒ කරුණින් ගැරහිය යුත්තෙක් වෙයි. යම් පුද්ගලයෙක් අර්ථයත් දැන ධර්මයත් දැන ධර්මානුකූලව පිළිපදියි ද හෙතෙම එම කරුණින් පැසසිය යුත්තෙක් වෙයි.

අර්ථයත් දැන ධර්මයත් දැන ධර්මානුකූලව පිළිපදිනා පුද්ගලයෝ ද දෙදෙනෙකි. එක් අයෙක් තමාගේ යහපත පිණිස පිළිපදින්නෙක් වෙයි. අනුන්ගේ යහපත පිණිස පිළිපදින්නෙක් නොවෙයි. එක් අයෙක් තමාගේ යහපත පිණිස ද අනුන්ගේ යහපත පිණිස ද

පිළිපදින්නෙක් වෙයි. මෙයින් යම් පුද්ගලයෙක් තමාගේ යහපත පිණිස පිළිපදින්නේ වේ ද අනුන්ගේ යහපත පිණිස පිළිපදින්නෙක් නොවේ ද හෙතෙම ඒ කාරණයෙන් ගැරහිය යුත්තෙක් වේ. යම් පුද්ගලයෙක් තමාගේ යහපත පිණිසත් අනුන්ගේ යහපත පිණිසත් පිළිපදින්නේ වේ ද හෙතෙම එම කාරණයෙන් පැසසිය යුත්තෙක් වේ.

මහණෙනි, මෙසේ භික්ෂුවට නිතර ම පුද්ගලයෝ දෙයාකාරයකින් දක්නට ලැබෙත්. මහණෙනි, මෙසේ භික්ෂුව පුද්ගලයන්ගේ උස්පහත් බව දන්නේ වෙයි.

මහණෙනි, මෙම ධර්ම හතෙන් යුතු භික්ෂුව ආහුනෙය්‍ය වෙයි, පාහුනෙය්‍ය වෙයි, දක්ඛිණෙය්‍ය වෙයි, අංජලිකරණීය වෙයි. ලෝකයට උතුම් පින්කෙත වෙයි.

## සූත්‍ර විවරණය

සංඝරත්නයෙහි ගුණ නවයකි. ආර්ය සංඝරත්නය බුදුරජාණන් වහන්සේ විසින් මැනවින් වදාළ ධර්මය හා විනය වශයෙන් ඇති නිවැරදි ප්‍රතිපදාවට පිළිපන් හෙයින් සුපටිපන්න වෙයි. කාමසුල්ලිකානුයෝගය, අත්තකිලමථානුයෝගය යන අන්ත දෙකට නොවැටී මධ්‍යම ප්‍රතිපදාවට පිළිපන් හෙයින් ද කය, වචනය හා සිත යන තිදොරෙහි ඇද කුද හෙවත් අකුසල් හෝ වැරදි දුරු කිරීම පිණිස පිළිපන් හෙයින් ද උජුපටිපන්න වෙයි. ඤාය නම් නිර්වාණය යි, නිර්වාණයට ගමන් කරන මග නම් ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිළිපන් හෙයින් ඤායපටිපන්න වෙයි, සාමීචිය නම් වතාවත්, සත්කාර, සම්මාන, උපස්ථාන ආදිය යි. ඒ සාමීචි කර්මයට සුදුසු වන පරිදි පිළිවෙත් පුරණ බැවින් සාමීචිපටිපන්න වෙයි,

ආහුන නම් දුරසිට ගෙනවිත් දෙන හෝ එවනු ලබන පුද පඬුරු ආදිය යි. එසේ දුරසිට ගෙනෙන සිව්පසයෙන් පිදීමට සුදුසු වන හෙයින් ආහුනෙය්‍ය වෙයි. නොයෙක් දෙසින් එන ආගන්තුකයන් සහ නෑදෑ හිතමිතුරන් සඳහා පිළියෙල කරන ආගන්තුක සත්කාරය පාහුන නම් වෙයි. එය ඔවුන්ටත් පෙර ආර්ය සංඝරත්නයට පිදීමට සුදුසුවන හෙයින් පාහුනෙය්‍ය වෙයි, පරලොව සුව පතා හෝ පරලොව ගිය අයට සුවපතා දෙන එම දානය දක්ෂිණාව යි. එම දක්ෂිණාව ලැබීමට සුදුසුවන හෙයින් දක්ඛිණෙය්‍ය වෙයි. ලෝවැසි ඕනෑ ම කෙනෙකු විසින් දෑත් එක්කොට පිදිය යුත්තන්ට ගරුකළ යුත්තන්ට කරන ආචාර සමාචාර හා වන්දනා සියල්ල පිළිගැනීමට සුදුසු වන හෙයින් අංජලිකරණීය වෙයි.

කෙතක බිජුවට වැපිරීමෙන් පසු කලෙක අස්වනු ලැබෙන්නා සේ මහා සංඝරත්නය කෙරෙහි ලෝ වැසියා කරන සියලු පුද පූජා සත්කාරවලින් මෙලොව පරලොව දෙලොව ම උසස් පින්පල ලැබෙන බැවින් සංඝරත්නය උතුම් පින්කෙතක් වෙයි.

මෙකී ගුණ නවයෙන් මුල් ගුණ හතර සංඝරත්නය විසින් පිළිපැදිය යුතු, තමා වෙත ඇති කරගත යුතු ගුණ හතරකි. පසුව එන ගුණ පහ සංඝරත්නයට ලෝකවාසීන්ගෙන් ලැබෙන සංග්‍රහයන් ය. පළමු වන ගුණ හතර අරි අටගිමග පිළිපැදීමෙන් හා මාර්ගඵල අවබෝධ කිරීමෙන් සම්පූර්ණ කරගත යුතු ය. පසුව එන ගුණයන්ගෙන් කියවෙන මහජන

ප්‍රසාදය පෘථග්ජන, උපසපන්, සාමණේර කෙනෙකුට වුවද දිනා ගතහැකි ක්‍රම හතක් මෙම සූත්‍ර දේශනාවෙන් දක් වේ. වෙනත් අයුරකින් පැවසුවහොත් සුපටිපන්න ආදී පාඨයෙන් කියවෙන ආර්ය සඟගුණ වර්තමානයෙහි සංඝ සමාජයට අදාළ වේ ද යන සැකයක් තිබේ නම් එය මින් දුරු වේ. එනම්, මුල් සඟගුණ උපදවා ගැනීම බරපතල කරුණකි. එහෙත් පසුව කියවෙන ජනප්‍රසාදනීය ගුණ මෙම සූත්‍රයේ එන ධර්ම කරුණු හත තමා තුළ වර්ධනය කරගැනීමෙන් ඕනෑ ම භික්ෂුවකට හිමිකර ගත හැකි ය.

මෙහි ධම්මඤ්ඤූ නම් ත්‍රිපිටක ධර්මය දැනගැනීම යි. මුලින් ම ධර්මය දන්නේ භික්ෂූන් වහන්සේ ය. ලොවට එය දේශනා කිරීම උන්වහන්සේට පැවරුණ වගකීම යි.

චරථ භික්ඛවෙ චාරිකං... වශයෙන් සඳහන් වන්නේ එම වගකීම පැවරූ ආකාරය යි. මහජනයා  සැදැහැ උපදවාගෙන පිනට දහමට යොමු වී නිවන්මග ගමන් කරන්නේ ඒ දහම් ඇසීමෙනි. භික්ෂූන් වහන්සේ ධර්මය නොදන්නේ නම් මේ මුළු කාර්යය ම අඩපණ වන්නේ ය. අටුවා, ටීකා ඇසුරින් එම ධර්මයෙහි නිවැරදි අර්ථ දැනගත යුතු ය. එසේ නො වුවහොත් ධර්ම විරෝධී පුද්ගලයන් වැරදි අර්ථකථන දෙමින් මහජනයා නොමග යවනු ඇත. වර්තමානයෙහි එබඳු දේ සිදුවෙමින් පවතී. විවිධ දෘෂ්ටි ඇති අය තම තමන්ගේ මතයන්ට අනුව ධර්මයට අර්ථ කියති. එහි දී ඔවුන් සිදු කරන්නේ බුද්ධඝෝෂ හිමියන්ගේ අදහස් යැයි කියමින් පළමුව අටුවාව බැහැර කිරීමයි. අටුවා බුද්ධඝෝෂ හිමියන්ගේ නිර්මාණයන් නොවේ. ධර්මයට අර්ථකීමේ ක්‍රමය ඇරඹුණේ සාරිපුත්ත මහරහතන් වහන්සේගෙනි. ඒ ධම්මචක්ක පවත්තන සූත්‍ර දේශනාවට අර්ථ සපයමින් සච්චවිභංග සූත්‍රය දේශනා කිරීමෙනි. බුදුරජාණන් වහන්සේගේ නියමය පරිදි එය සිදුවිය. එතැන් සිට ධර්මකථික මහරහතන් වහන්සේලා විසින් ධර්මයට සැපයූ අර්ථකථන අටුවා නමින් පවත්වාගෙන එන ලදි. මිහිඳු මහරහතන් වහන්සේ විසින් ඒවා ලක්දිවට ගෙනවිත් සිංහලෙන් දේශනා කර ලදි. බුද්ධඝෝෂ හිමියන් සිදුකරන ලද්දේ එම හෙළටුවා පාලියට පරිවර්තනය කිරීම පමණි. එහෙයින් ධර්ම විරෝධීන්ගේ මතිමතාන්තර මැඩපැවැත්වීමට භික්ෂූන් වහන්සේලා විසින් අටුවාව ඇසුරින් ධර්මය ප්‍රගුණ කළ යුතුව ඇත.

භික්ෂූන් වහන්සේ නමකට භික්ෂුවක් වශයෙන් තමා සිටින්නේ කුමන තත්වයේ දැයි මැන බලා ගැනීමට හැකි වීම අත්තඤ්ඤූ නම් වේ. එහි දී භික්ෂුවකට තිබිය යුතු ගුණාංග පහක් අවධාරණය කර ඇත. එනම්, ශ්‍රද්ධාව, සීලය, ශ්‍රැතය හෙවත් ධර්ම ඥානය, පරිත්‍යාග ශීලී බව හා ශාසනික සේවයට කැපවීමේ තරම සහ ප්‍රඥාව යි. මේ කරුණුවලින් තමන් වහන්සේ සිටින්නේ කුමන මට්ටමක දැයි භික්ෂූන් වහන්සේ දැන සිටිය යුතු එම ධර්මවලින් පිරිහී තිබුණු හොත් මහජනයාගේ අප්‍රසාදයට ලක්වන්නේ ය.

භික්ෂූන් වහන්සේගේ යැපීම සඳහා සිවුපසය අනුදැන වදාරා ඇත. එනම්, තුන්සිවුර, පිඬුසිඟා වැඩීමෙන් ලබන ආහාර, සේනාසන හා විහාරාරාම, සෞඛ්‍ය සම්පන්න ව දිවි ගෙවීමට අවශ්‍ය බෙහෙත් හා අතිරේක ගිලන්පස ආදිය යි. මින් පරිබාහිරව ද්‍රව්‍ය, දේපළ උපකරණ ගොඩගසා ගැනීම භික්ෂු ජීවිතය අවුල් වීමට හා බරක් වීමට හේතු වේ. එහෙයින් අල්පේච්ඡතාව හෙවත් අවම පහසුකම්වලින් යැපීමටත් සන්තුට්ඨිතාව හෙවත් ලද පමණින් යැපීමටත් පුරුදුවිය යුතු ය.

කාලය කළමනාකරණය භික්ෂු ජීවිතයක වැදගත් ම කරුණක් වෙයි. මෙම සූත්‍රයෙහි දක්වා ඇත්තේ ඉගෙනීම, ප්‍රශ්න විමසීම භාවනා කිරීම සහ විවේකය යන කාල හතර පිළිබඳ පමණි. භික්ෂු ජීවිතයක කාල සටහන ඒ හතර පමණක් ම නොවේ. දක්වා ඇත්තේ උදාහරණයක් පමණි. සෑම බෞද්ධ විහාරස්ථානයකත් පිරිවෙන් අධ්‍යාපන ආයතනවලත් නියමිත කාල සටහනක් තිබේ. සම්ප්‍රදායික පැවිදි කාල සටහන දින චරියාව නමින් ඔබ උගෙන ඇත. භික්ෂූන් වහන්සේ එම කාලසටහන හෝ දින චරියාවට අනුව විහාරස්ථානයේත් පිරිවෙනේත් කටයුතු කළ යුතු ය. එසේ නොවුවහොත් සංඝයා අතරත් මහජනයා අතරත් එම භික්ෂූන් වහන්සේ පිරිහෙන්නේ ය.

භික්ෂූන් වහන්සේ උත්තරීතර චරිතයකි. උන්වහන්සේ රටේ රාජ්‍ය නායකයා ඇතුළු සියලු දෙනාට වඩා ඉහළින් සිටින කෙනෙකු බව දැනගෙන වාසය කළ යුතු ය. ඒ පිළිබඳ ලොවට ම ආදර්ශය වූයේ ධර්මාශෝක රජුගේ රජ ගෙදරට වැඩම කළ නිග්‍රොධ සාමණේරයන් වහන්සේ ය. අද ඇතැම් භික්ෂූන් වහන්සේලා තමන්ගේ මේ උත්තරීතර බව අමතක කර මහමග දී පවා කටයුතු කරන ආකාරය ඉතා අශෝභන ය. හැසිරීම පිළිබඳ නොදන්නාකම නිසා ඇතිවන මහජන අප්‍රසාදය සමස්ත ශාසනයට ම ප්‍රබල බලපෑමක් වී ඇත. ජනයා මැද හැසිරිය යුතු ආකාරය සේඛියා ධර්මවලින් පවා උගන්වා ඇත. ඒ ඒ පිරිස් මැද හැසිරෙන ආකාරය දන්නා භික්ෂූන් වහන්සේලා එමගින් තමන් වහන්සේගේ ගෞරවයත් ශාසන ගෞරවයත් ආරක්ෂා කරගනිති.

භික්ෂූන් වහන්සේ යනු මහජනයා මෙහෙයවන, මහජනයාට අනුශාසනා කරන, නායකත්වය දරන කෙනෙකි. සෑම භික්ෂූන් වහන්සේ නමක් ම පුහුණුවන්නේ ඒ සඳහා ය. එහි දී ඉහත කී කරුණුවලින් තමන් සන්නද්ධ වී පුද්ගලයන් හඳුනා ගැනීමට ද පුරුදු විය යුතු ය. එසේ නොවුවහොත් ඔවුන්ගේ රැවටිලිවලට භික්ෂූන් වහන්සේ ගොදුරුවෙයි. බොහෝ අවස්ථාවල පුද්ගලයන් පිළිබඳ විමසිලිමත් වීමෙන් ඔවුන් හඳුනා ගැනීමට සිදුවේ. එහිදී හැමවිට ම, ලොව පුද්ගලයන් හොඳ නරක යන දෙපැත්තට බෙදෙන බව මෙහි දැක්වේ. මෙම ස්වභාවය හඳුනාගෙන කටයුතු කළයුතු ය. ඔවුන්ට අවවාද අනුශාසනා කළ යුත්තේ එම හඳුනා ගැනීම මත පිහිටීමෙනි. එසේ හඳුනාගෙන සිටීමෙන් පුද්ගලයන්ගෙන් එල්ලවන විවිධ පීඩාවන් ඉවසා දරා ගැනීමට හැකිවේ. ශාසනික සේවය පිළිබඳ ඇතිවිය හැකි කළකිරීම් ද පාලනය කරගත හැකි ය.

මෙම කරුණුවලින් යුතු භික්ෂූන් වහන්සේ මහජනයා බලාපොරොත්තු වන අංග සම්පූර්ණ භික්ෂුවක් වන්නේ ය.

**අභ්‍යාස**

01. නවංග ශාස්තෘ අංග නවය සාසන වණ්ණපොත් නම් කර එහි අර්ථ විමසන්න.
02. අංගසම්පූර්ණ භික්ෂුවක් සතු ගුණාංග මෙම සූත්‍රය ඇසුරින් ලියන්න.
03. ධම්මචක්ඛු සූත්‍රය ඇසුරින් ධර්ම දේශනාවක් සිදු කරන්න.

**12 පාඩම**

# ජංගම නිධානය

## (නිධිකණ්ඩ සූත්‍රය)

සැවැත්නුවර ඉතා ධනවත් කෙළෙඹි පුත්‍රයෙක් විසී ය. සිටුවරයෙකු නොවුවත් රජතුමා පවා ඔහු සමග ගනුදෙනු කරයි. එසේ ම හෙතෙම තුනුරුවන් කෙරෙහි පැහැදුණු ශ්‍රද්ධාවන්තයෙකි. මසුරුකමක් නැත ත්‍යාගශීලී ය. හෙතෙම එක් දිනක් බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට සිය නිවසේ දන් පිළිගන්වමින් සිටියේ ය. එදින ම රජතුමාට මුදල් අවශ්‍යතාවක් යෙදී ඔහු කැඳවාගෙන ඒමට දූතයෙකු යැවී ය. දූතයා ද කෙළෙඹි පුත්‍රයා වෙත ගොස් රජුගේ පණිවුඩය දන්වා සිටියේ ය. එහිදී කෙළෙඹි පුත්‍රයා, පින්වත් පුරුෂය, මා සිටින්නේ නිධානයක් තැන්පත් කරමිනි. මා පසුව එන බව රජුට දන්වන්න යැයි කීය. ඔහුගේ මේ ප්‍රකාශය මුල් කරගෙන බුදුරජාණන් වහන්සේ දන් වළඳා අවසානයෙහි පින් අනුමෝදන් කරමින් මෙම ගාථා දේශනා කළ සේක.

"නිධිං නිධෙති පුරිසො
ගම්භීරෙ ඔදකන්තිකෙ
අත්ථෙ කිච්චෙ සමුප්පන්නෙ
අත්ථාය මෙ භවිස්සති"

**වැඩදායක යම්කිසි කටයුත්තක් ඇති වූ කල්හි මට ප්‍රයෝජනවත් වන්නේ යැයි සලකා පුද්ගලයෙක් පොළොවෙහි දිය උල්පත් හමුවන තරම් ගැඹුරු තැන නිධානයක් තැන්පත් කරයි.**

**විවරණ:-**

මෙහි නිධානය යනු පසු කලෙක ප්‍රයෝජනය සඳහා තැන්පත් කර තබාගන්නා ධනය යි. අද බැංකු වැනි දියුණු ක්‍රම ඇතත් එදා රන්, රිදී, මුතු, මැණික් ආදී ධනය ආරක්ෂා කළේ පොළොව හාරා රහසිගතව තැන්පත් කර තැබීමෙනි. නිධන් කිරීම ලෙස හැඳින්වෙන්නේ එය යි. ධර්මයට අනුව නිධාන හතරකි.

**ථාවර නිධාන** :- **තමන් සතු රන්රුවන් කෙත්වතු, ඉඩකඩම් ආදිය යි. ඒවා තිබූ තැන ම පවතින හෙයින් ථාවර නිධාන යැයි කියනු ලැබේ.**

**ජංගම නිධාන** :- **අඹුදරුවන්, දාසි දසුන්, ඇතුන්, අසුන්, ගවයන් හෝ යාන වාහන ආදිය යි. ඒවා ගමන් කරන හෝ තැන තැන ගෙන යා හැකි බැවින් ජංගම නිධාන යැයි කියනු ලැබේ.**

**අංග සම නිධාන**:- **තමන් ඉගෙන ගත් ශාස්ත්‍ර සහ හුරු පුරුදු කරන ලද විද්‍යා, ශිල්ප වැනි දේ ය. ඒවා තමා හා බැඳී පවතින නිසා අංග සම නිධාන යැයි කියනු ලැබේ.**

**අනුගාමික නිධාන** :- **දාන, සීල, භාවනා ආදී වශයෙන් සිදුකර ගන්නා පින්දහම් ය. ඒවා පරලොව යන විට තමා හා පසුපස අවුත් සැප විපාක ගෙන දෙන බැවින් අනුගාමික නිධාන යැයි කියනු ලැබේ.**

මෙසේ නිධානයක ප්‍රයෝජන දක්වන බුදුරජාණන් වහන්සේ එයින් ලැබෙන සම්පත්තිය පැහැදිලි කර අනතුරුව නිධානයකින් විපත්ති වළකන ආකාරය මෙසේ වදාරති.

**''රාජතො වා දුරුත්තස්ස - චොරතො පීළිතස්ස වා**
**ඉණස්ස වා පමොක්ඛාය - දුබ්භික්ඛෙ ආපදාසු වා**
**එතදත්ථාය ලොකස්මිං - නිධි නාම නිධීයති''**

අනුන්ගේ කේලාම් හෝ අභූත චෝදනා අසා උදහස් වූ රජුන්ගේ දණ්ඩනයෙන් මිදීම පිණිස ද සොර සතුරු පීඩාවක දී ඔවුන්ගෙන් මිදෙනු පිණිස ද ණයෙන් නිදහස් වීම පිණිස ද දුර්භික්ෂයක දී හෝ වෙනත් ගිනි ගැනීම්, ජල ගැලීම් ආදී ස්වාභාවික ආපදාවක දී ඊට මුහුණ දීම පිණිස ද යන මෙබඳු ප්‍රයෝජන සඳහා ලෝකයේ රන් රුවන් ආදී නිධන් තැන්පත් කරනු ලැබේ.

එබඳු නිදන් වුවද එතරම් විශ්වාස දායක නොවන බව මීළඟ ගාථාවෙන් විස්තර වේ.

**''තාව සුනිහිතො සන්තො - ගම්භීරෙ ඔදකන්තිකෙ**
**න සබ්බො සබ්බදා එව - තස්ස තං උපකප්පති''**

ජලය හමුවන තරම් ගැඹුරු තැනෙක තැන්පත් කළ ඒ හැම ධනයක් ම ඔහුට උපකාර වේ ය යනු හැමවිට ම සිදු නොවේ. නැතහොත් අපට අවශ්‍ය මොහොත වනතුරු ආරක්ෂා වී තිබේ ද යන්න ස්ථිර නැත. ඊට හේතු කවරේද යත් ?

**''නිධි වා ඨානා චවති - සඤ්ඤා වාස්ස විමුය්හති**
**නාගා වා අපනාමෙන්ති - යක්ඛා වාපි හරන්ති නං''**

ඇතැම්විට නිධානය තිබූ තැනින් ඉවත් විය හැකි ය. නිධන් කළ තැන සළකුණු ඔහුට අමතක විය හැකි ය. ඇතැම්විට නාගයන් තුබූ තැනින් රැගෙන යා හැකි ය. යක්ෂයන් විසින් පැහැර ගනු ලැබිය හැකි ය.

**''අප්පියා වාපි දායාදා - උද්ධරන්ති අපස්සතො**
**යදා පුඤ්ඤක්ඛයො හොති - සබ්බමෙතං විනස්සති''**

තමාට අප්‍රිය අමනාප උරුමක්කාරයෝ ඇතැම්විට ඔහුට නොදැනෙන්නට ඒවා තිබූ තැනින් ගොඩ ගනිති. යම් හෙයකින් පින් පිරිහුණ දාට මේ සියල්ල විනාශ වෙයි.

**වි.** භාග්‍යවතුන් වහන්සේ මෙතෙක් දේශනා කරන ලද ලෞකික නිධාන කෙතරම් බලාපොරොත්තු තබාගෙන තැන්පත් කළත් නොයෙකුත් ආකාරයෙන් ඔහුට අහිමි විය හැකි බව පැහැදිලි ය. එහෙත් කිසිලෙසකින් නොනැසෙන පින හෙවත් කුසල නිධානය උතුම් ම නිධන් වස්තුව යි. අනුගාමික නිධානය වන එහි අගය මෙතැන් සිට විස්තර කරනු ලැබේ.

**''යස්ස දානෙන සීලෙන - සංයමෙන දමෙන ච**
**නිධී සුනිහිතො හොති - ඉත්ථියා පුරිසස්ස වා''**

යම් ස්ත්‍රියක හෝ පුරුෂයෙකු හෝ විසින් දානයෙන්, ශීලයෙන් චිත්ත සංයමයෙන් හෙවත් සිත එකඟ කිරීම නම් වූ භාවනාවෙන් ද කෙලෙස් දමනය කිරීම හෙවත් නුවණින් යුතුව තදංග වශයෙන් හෝ කෙලෙස් මැඩපැවැත්වීමෙන් ද යම් පුණ්‍ය නිධානයක් මනාව නිදන් කරන ලද්දේ ද

**''චෙතියම්හි ච සඞ්ඝෙ වා - පුග්ගලෙ අතිථීසු වා**
**මාතරි පිතරි චාපි - අථො ජෙට්ඨම්හි භාතරි''**

ශාරීරික, පාරිභෝගික, උද්දේසික යන චෛත්‍ය ස්ථානවල ද ආර්ය සංඝරත්නය කෙරෙහි ද ගිහි පැවිදි කිසියම් සිල්වත් ගුණවත් පුද්ගලයන් කෙරෙහි ද ආගන්තුකයන් කෙරෙහි ද මව පියා හෝ වැඩිමහලු සහෝදර සහෝදරියන් කෙරෙහි ද යම් පුණ්‍ය නිධානයක් මනාව තැන්පත් කරන ලද ද

**වි.** ඉහත ගාථා දෙකෙහි පින්කරගත හැකි ක්‍රම රාශියක් කියවෙයි. දානයෙන් තණ්හාව මැඩ පැවැත් වීම, සීලයෙන් කය වචනය දෙක සංවර කර ගැනීම, සංයමයෙන් සිත සමාධියට පත් කර ගැනීම, ප්‍රඥාවෙන් කෙලෙස් මැඩ පැවැත්වීම යනාදිය ඉහළ ම කුසල් ය. පින්කම් ය. එසේ ම බුද්ධවන්දනා, බුද්ධපූජා, සංඝරත්නය කෙරෙහි කරන ඇප උපස්ථානාදිය ද එබඳු පූජා බුද්ධියෙන් සිදු කරන පින්කම් ය. සිල්වත් පුද්ගලයන්ට හා ආගන්තුකයන්ට කරන සංග්‍රහ පමණක් නොව මාපිය, වැඩිහිටි, සහෝදර සහෝදරියන්ට කරන සංග්‍රහ ද උතුම් වූ පුණ්‍ය නිධානයට අයත් වන බව මෙහි දී පැහැදිලිව විග්‍රහ කර ඇත.

එම පුණ්‍ය නිධානයත් මිනිසුන් විසින් තැන්පත් කරන ධන නිධානත් අතර වෙනස කෙබඳු දැයි මීළඟට විස්තර කෙරේ.

**''එසො නිධී සුනිහිතො - අජෙය්‍යො අනුගාමිකො**
**පහාය ගමනීයෙසු - එතං ආදාය ගච්ඡති''**

මෙසේ මනාව තැන්පත් කරන ලද පුණ්‍ය නිධානය වෙනත් කෙනෙකුට ඔහුගෙන් දිනාගත නොහැකි ය. අන් සියලු දෙය මරණින් පසු හැරදමා යතත් පුණ්‍ය නිධානය පමණක් රැගෙන යන්නේ ය. ඒවා පරලොව දී පවා ඵල විපාක ගෙන දෙන්නේ ය.

**වි.** භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පුණ්‍ය නිධානයත් ධන නිධානයත් අතර වෙනස දක්වා වදාරා අනතුරුව, තමාගේ භාණ්ඩ පිළිබඳ අගය වර්ණනා කිරීමෙන් මිලදී ගන්නා ජනයාගේ උනන්දුව වැඩිකරන දක්ෂ වෙළෙන්දෙකු මෙන් තමන් වහන්සේ විසින් දේශනා කරන ලද පුණ්‍ය නිධානයේ ගුණ වර්ණනා කිරීම මගින් පුණ්‍ය නිධානය නිදන් කර ගැනීමට දෙව් මිනිසුන් උත්සාහවත් කරවමින් මෙසේ වදාළහ.

**''අසාධාරණමඤ්ඤෙසං - අචොරහරණො නිධි**
**කයිරාථ ධීරො පුඤ්ඤානි - යො නිධී අනුගාමිකො''**

පුණ්‍ය නිධානය වෙනත් නිධාන මෙන් රජවරුන්ට තබා මව්පියාදීන්ටවත් ගත නොහැකි ය. අන් කිසිවෙකුට අයිතිවාසිකම් කිවනොහැකි අනන්‍යසාධාරණ නිධානයකි. සොරුන්ටත් පැහැරගත නොහැකි ය. එහෙයින් නුවණැත්තෝ තමා පසුපස එන්නා වූ නිධානය වන පින්දහම් රැස් කිරීම කරන්නාහු ය.

ඉන් අනතුරුව උන්වහන්සේ ඒ නිධන් කරන ලද පුණ්‍ය නිධාන මහිමයෙන් ලැබෙන ආනිසංස හෙවත් ඵල විපාක මෙසේ සැකෙවින් දක්වති.

**''එස දෙවමනුස්සානං - සබ්බකාමදදො නිධි**
**යං යදෙවාභිපත්‍ථෙන්ති - සබ්බමෙතෙන ලබ්භති''**

මේ පින්කම් යනු දෙව් මිනිස් සැමදෙනට තමන් කැමති සම්පත් දෙන නිධානය යි. ඔවුහු යමක් ප්‍රාර්ථනා කරත් ද ඒ සියල්ල මේ පුණ්‍ය නිධානය කරණකොට ලැබෙයි. ඒ කවරේද යත්,

**''සුවණ්ණතා සුස්සරතා - සුසණ්ඨානා සුරූපතා**
**ආධිපච්චපරිවාරං - සබ්බමෙතෙන ලබ්භති''**

සුන්දර ශරීරවර්ණ ඇති බව ද මිහිරි හඬ ඇති බව ද මනා වූ කඩවසම් බව හා සුරූපී බව ද අධිපති බව හා පිරිවර ජනයා ඇති බව ද යන මේ සියල්ල පුණ්‍ය නිධානය හේතුවෙන් ලැබේ.

**වි.** මෙහි සුවණ්ණතා යනු සමේ සුන්දර පැහැය යි. බුදුරජාණන් වහන්සේ රන්වන් ශරීර ඇති සේක. එම වාසනාව ලැබූයේ සංසාරයේ දී කෝප වියයුතු තැන්හි දී පවා කෝප නොගෙන සිටි නිසාත් ඉතා සියුම් සුවපහසු ඇතිරිලි ආදිය පරිත්‍යාග කළ නිසාත් බව දීඝනිකායේ ලක්ඛණ සූත්‍රයේ සඳහන් වේ. සුස්සරතා යනු ඉතා මිහිරිහඬ ඇති බව යි. බුදුරජාණන් වහන්සේ එම වාසනාව ලබා ඇත්තේ සසර සැරිසරද්දී පරුෂවචන කීමෙන් වැළකී ප්‍රියවචන කථා කිරීම හේතුවෙනි. සුසණ්ඨාන සුරූපතා නම් මනාව පිහිටි අඟපසඟ ඇති රූපසම්පන්න බව යි. බුදුරජාණන් වහන්සේ එම ආනිසංස ලැබූයේ අනෙකුත් ජනයාගේ හිතසුව පිණිස ඔවුන් ශීලයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන් ධන ධාන්‍යාදී සම්පත්වලින් දියුණු

කරවීමට කටයුතු කළ බැවිනි. මේ අනුව විවිධ පින්කම්වලින් විවිධ ඵල ලැබෙන බව සලකා සෑම පින්කමක් ම හැකි තරමින් කළ යුතු ය.

මෙසේ පුණ්‍යානුභාවයෙන් ලැබිය හැකි සාමාන්‍ය සැපසම්පත් සඳහන් කොට අනතුරුව දෙව් මිනිසුන් අතර ඉහළ ම සම්පත් වන රජසම්පත් ලැබිය හැකි බවත් මෙසේ දේශනා කළ හ.

**''පදෙසරජ්ජං ඉස්සරියං - චක්කවත්තිසුඛං පියං**
**දෙවරජ්ජම්පි දිබ්බෙසු - සබ්බමෙතෙන ලබ්භති''**

ප්‍රාදේශීය රජ පදවිය ද මුළු මහත් පොළොවට අධිපති වන සක්විති රාජ්‍ය සුවය ද දෙවියන් අතර දී දෙව්රජ පදවිය ද යන මේ සියල්ල මේ පුණ්‍ය නිධානයෙන් ලැබෙයි.

පින් බලමහිමයෙන් ලැබිය හැකි ලෞකික සැප සම්පත් විස්තර කොට එයින් ලෝකෝත්තර සම්පත් ද ලැබිය හැකි බව මෙතැන් සිට පෙන්වා දෙති.

**''මානුසිකා ච සම්පත්ති - දෙවලොකෙ ච යා රති**
**යා ච නිබ්බාණසම්පත්ති - සබ්බමෙතෙන ලබ්භති''**

මනුෂ්‍ය සැප සම්පත් ද දෙව්ලොව ලැබිය හැකි යම් සුවයක් වේ නම් එය ද නිර්වාණ සම්පත්තිය ද යන මේ සියල්ල මේ පින්බලය නිසා ලැබෙයි.

පින්දහම් කරන්නාට නිවන් සැප ලැබිය හැක්කේ කෙසේද යත් ?

**''මිත්තසම්පදමාගම්ම - යොනිසො ච පයුඤ්ජතො**
**විජ්ජාවිමුත්ති වසීභාවො - සබ්බමෙතෙන ලබ්භති''**

කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලබාගෙන ලොව ඇති තතු මෙනෙහි කරමින්, භාවනාවෙහි යෙදෙන්නා හට පුබ්බේනිවාසානුස්සති ඤාණ ආදී ත්‍රිවිද්‍යාව හා නිර්වාණ විමුක්තිය යන මේවා තමන් සතු කර ගැනීමට මේ පුණ්‍ය නිධානය හේතු වේ.

**වි.** පිනට දහමට ලැදි ඊට හුරුපුරුදු වී දාන, සීල, භාවනා ආදී කුසල කර්මයන්හි යෙදෙන පුද්ගලයාට ලෞකික සැපත නිරායාසයෙන් ම ලැබේ. පින්දහම් කරනු හැර ඒ සැප සම්පත් සඳහා අමුතුවෙන් කළයුත්තක් නොමැත. ලෝකෝත්තර සම්පත්තිය හෙවත් නිර්වාණය ලැබීමට පින්දහම් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ශ්‍රද්ධාවන්ත, සීලවන්ත ප්‍රඥා සම්පන්න කෙනෙකු වූ පුද්ගලයා කල්‍යාණ මිත්‍රයෙකුගේ අවවාද අනුශාසනා ලබාගත යුතු ය. බුදුරජාණන් වහන්සේ හෝ වෙනත් ශ්‍රාවකයන් වහන්සේ නමක හෝ ධර්මධර සිල්වත් ගුණවත් ආචාර්ය උපාධ්‍යාය ආදී පැවිදි උතුමෙකු හෝ ඇසුරු කොට අවවාද අනුශාසනා ලබාගෙන ඒවා පිළිපදින අතර යෝනිසෝමනසිකාරයෙන් හෙවත් අනිත්‍ය

දුක්ඛ අනාත්ම වශයෙන් ඇත්ත ඇති හැටියෙන් නුවණින් මෙනෙහි කොට භාවනාවෙහි යෙදීමෙන් ත්‍රිවිද්‍යාව උපදවා උතුම් නිර්වාණය ලද හැකි ය. තුන්තරාබෝධිය සඳහා ම පිනට දහමට හුරු වීම උපකාර වන බව මෙසේ වදාරති.

''පටිසම්භිදා විමොක්ඛා ච - යා ච සාවකපාරමී
පච්චෙකබොධි බුද්ධභූමි - සබ්බමෙතෙන ලබ්භති''

මේ පුණ්‍ය මහිමයෙන් රහත් බව සමග සිව්පිළිසිඹියා නුවණ ද අෂ්ටවිමොක්ෂය ද ලද හැකි වේ. එසේ ම අරහත් බුද්ධශ්‍රාවකයෙකු වීමේ පාරමිතාව ද පසේ බුදුරජාණන් වහන්සේ නමක වීමේ පාරමිතාව ද සම්මාසම්බුද්ධ වීමේ පාරමිතාව ද යන මේ සියල්ල මේ පුණ්‍ය නිධානය හෙවත් පින් කිරීමේ අභ්‍යාසයෙන් ම සපිරෙන්නේ ය.

සියලු ම පාරමිතා දාන සීලාදී පින්දහම්වල යෙදීමෙන් ම හුරු පුරුදු කිරීමෙන් ම ආරම්භ කළයුතු බව එයින් අදහස් කෙරේ.

''එවං මහත්ථිකා එසා - යදිදං පුඤ්ඤසම්පදා
තස්මා ධීරා පසංසන්ති - පණ්ඩිතා කතපුඤ්ඤතං''

**(ඛුද්දක පාඨ, 16.20, නිධිකණ්ඩ සුත්ත)**

මෙසේ මේ පුණ්‍ය නිධානය මේ සා මහත් සම්පත් ලබා දෙන්නේ ය. එහෙයින් ප්‍රඥාවන්ත උත්තමයෝ කළ පින් ඇති බව අගය කරන්නාහ.

**වි.** මෙම සූත්‍රය පින්රැස් කිරීම නිධානයක් තැන්පත් කිරීම හා සමාන කොට දක්වයි. එහෙත් මෙම පුණ්‍ය නිධානය හා ලෞකික නිධානය හා වටිනාකමෙන් සමාන නැත. ස්ථාවර බවින් ද සමාන නැත. මෙහි තිබෙන සමානකම නම් තැන්පත් කර ගතහොත් පසුව ප්‍රයෝජන ලද හැකි බව යි. මෙම සූත්‍රය දෙස බැලූ පමණින් සිතෙන්නේ පිනෙන් ලැබිය හැකි ලෞකික සම්පත් වර්ණනා කරන සූත්‍රයක් ලෙස ය. එහෙත් සමස්ත සූත්‍රය ම සැලකිල්ලෙන් බලන විට එය එසේ නොවන බව පෙනීයයි.

සමාජයෙහි ජීවත්වන බොහෝ මිනිස්සු මෙවා නොදන කොපමණ පව්කම් කරමින් දිවි ගෙවත් ද? ඔවුන්ට මේ සම්පත් ලැබීම තබා සතර අපායෙන් ගැළවීමට පවා කොතරම් කාලයක් ගතවේවි ද? මිනිසුන් සියලු දේ සිදු කරන්නේ සැප පතා ය. මෙම සූත්‍රය ආරම්භක කොටසේ දී පිනෙන් ලෞකික සම්පත් ලැබීමට ඇති කරවන උනන්දුව, පව්කරන මිනිසුන් ඉන් මුදවා පිනට සමීප කිරීමට දරන උපක්‍රමයකි.

මේ උතුම් සම්බුද්ධ ශාසනය මහමුහුද වැනි ය. වෙරළෙන් බැස්ස තැන ම ගැඹුර නැත. ගැඹුරු වන්නේ ක්‍රමානුකූලව ය. එසේ ම මේ ශාසනයට ද බැස්ස තැන ම රහත් විය නොහැකි ය. ඒ සඳහා දාන ශීලාදී වශයෙන් අනුපිළිවෙළ ප්‍රතිපදාව පුරාගත යුතු යැයි අංගුත්තරනිකායේ අට්ඨක නිපාතයේ පහාරාද සූත්‍රයේ දක්වේ. මේ බව නොදන්නා

බොහෝ දෙනෙක් ධර්මය වරදවා උගන්වන පුද්ගලයන් පසුපස ගොස් දාන, සීල, භාවනා දී කිසිදු අනුපූර්ව ප්‍රතිපදාවක් නැතිව එක්වර ම මගපල ලැබීමට වෑයම් කරති. ඔවුන්ට ඉතා අගනා උපදේශයක් මෙමඟින් ලැබේ. එනම්, කෙනෙකු පළමු කොට තමන් දාන ශීල භාවනාදියෙහි යෙදෙන, තෙරුවන් වඳින පුදන, වෙහෙර විහාර ඇසුරු කරන කෙනෙකු විය යුතු ය. මසුරුමළ නැති පරිත්‍යාගශීලී, දාන මානාදියෙහි යෙදෙන ආගන්තුකයන්ට සලකන, මව්පිය වැඩිහිටියන්ට ගරුකරන, සත්කාර කරන කෙනෙකු විය යුතු ය. මෙම පින් පිළිවෙත පුරාගෙන යාම පාරමිතාවකැයි කියනු ලැබේ. එසේ පාරමිතා පුරන පුද්ගලයා සසරෙහි පුරන ලද පාරමිතා හේතුවෙන් බුදුරජාණන් වහන්සේ, මහරහතන් වහන්සේ ආදී කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලබයි. ධර්ම ශ්‍රවණය කරයි. යෝනිසෝමනසිකාරයෙන් අනිත්‍ය දකියි. ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිපදියි. සෝවාන් ආදී මගපල ලැබූ පුද්ගලයා මේ භවයේ දී ම හෝ ආත්ම භාව හතක් ඇතුළත දී හෝ උතුම් වූ රහත් බව ලබන්නේ ය. සිරිපා කඳු මුදුනට පැමිණීමට ඔබ පතන්නේ නම් පළමුව ඔබ කළ යුත්තේ පියගැටපෙළෙහි පළමු පඩියට අඩිය තැබීම යි. එතැන් සිට ක්‍රමානුකූලව අඩියෙන් අඩිය ඉහළට අඩිය තැබීම යි. අවසානයේ ඔබ සිරිපතුල වෙත පැමිණ සිටිනු ඇත. නිධිකණ්ඩ සූත්‍රයෙන් ඉගැන්වෙන්නේද පින් දහම් කිරීමෙන් නිවන් දැකීමේ මාර්ගය යි.

**අභ්‍යාස**

01. නිධිකණ්ඩ සූත්‍රයෙහි ඔබ කැමති ගාථාවක් තෝරාගෙන ධර්ම පත්‍රිකාවක් සකසන්න.
02. දානානිසංස කියවෙන අනුමෝදනා දේශනාවක් ගුරුවරයාගේ උපදෙස් මත පිළියෙල කරන්න.
03. දානානිසංස කියවෙන වෙනත් සූත්‍ර දේශනාවන්හි එන කරුණු ලැයිස්තුවක් සකස් කරන්න.

13
පාඩම

# ගිහියාගේ දියුණුව

## (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය)

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කෝළිය ජනපදයේ කක්කරපත්ත නම් වූ කෝළියන්ගේ නියම් ගමෙහි වැඩවසන සේක. මෙම කෝළිය ජනපදය පැවතුණේ බුදුරජාණන් වහන්සේගේ මව්බිම වූ ශාක්‍ය ජනපදය ආසන්නයේ ය. ජනපද දෙක වෙන් වූයේ රෝහිණී නදියෙනි. කෝළිය ජනපදය බුදුරජාණන් වහන්සේගේ මව් පාර්ශ්වයේ නිජබිම ය. ආවාහ විවාහ එම ජනපද දෙක අතර සිදුවීම සිරිතක්ව පැවතුණි. මහාමායා ප්‍රජාපතී, යශෝධරා යන දේවිවරුන් සහ දෙව්දත් තෙරුන් කෝළියයන් ය.

භාග්‍යවතුන් වහන්සේ එරට වැඩවසන අතර දිනක් දීඝජානු නම් කෝළිය පුත්‍රයා උන්වහන්සේ හමුවීමට පැමිණියේ ය. ව්‍යග්ඝපජ්ජ යනු මොහුගේ පරම්පරා නාමයයි. දීඝජානු යනු ඔහුගේ නමයි. එමනිසා නම් දෙක ම මෙම සූත්‍රයේ භාවිත වී තිබේ. බුදුරජාණන් වහන්සේට වැඳ එකත්පසෙක හිඳගත් දීඝජානු උන්වහන්සේගෙන් මෙසේ විමසී ය. ''ස්වාමීනි, අපි අඹුදරුවන්ගේ ගැහැට මැද නිදන, කසීසළු හඳින පොරවන, කසීසඳුන් සහ මල් ගඳවිලවුන් දරණ රන් රිදී පරිහරණය කරන ගිහි කාමභෝගීහු වෙමු. අපට මෙලොව පරලොව හිත සුව පිණිස හේතුවන කරුණුවලින් දහමක් දෙසනු මැනවි.'' එවිට බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

### මෙලොව දියුණුවට හේතු වන කරුණු

''චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති දිට්ඨධම්මසුඛාය. කතමෙ චත්තාරො? උට්ඨානසම්පදා, ආරක්ඛසම්පදා, කල්‍යාණමිත්තතා සමජීවිකතා''

''ව්‍යග්ඝපජ්ජය, කුලපුත්‍රයෙකුට මෙලොව හිතසුව පිණිස පවතින ධර්ම හතරකි. එනම්, උත්සාහ සම්පත්තිය, ආරක්ෂා සම්පත්තිය, කළණ මිතුරන් ඇතිබව සහ සමසේ දිවි පැවැත්ම'' යනුවෙනි.

### 1. උට්ඨානසම්පදා

''කතමා ච ව්‍යග්ඝපජ්ජ උට්ඨාන සම්පදා, ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො යෙන කම්මට්ඨානෙන ජීවිකං කප්පෙති, යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන, යදි සිප්පඤ්ඤතරෙන. තත්ථ දක්ඛො හොති අනලසො, තත්‍රූපායාය විමංසාය සමන්නාගතො අලං කාතුං අලංසංවිධාතුං, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ උට්ඨාන සම්පදා''

''ව්‍යග්ඝපජ්ජය, මෙලොව කුලපුත්‍රයෙක් කෘෂිකර්මයෙන්, වෙළඳාමෙන්, ගව පාලනයෙන්, අවි ශිල්පය හෙවත් ආරක්ෂා සේවයෙන්, රාජපුරුෂ හෙවත් රාජ සේවයෙන් හෝ වෙනත් කිසියම් ශිල්පයකින් දිවි ගෙවයි ද හෙතෙම ඒ පිළිබඳ අලස නැති එම ජීවිකා වෘත්තිය පිළිබඳ උපාය හා විධික්‍රම පිළිබඳ විමසිල්ලෙන් යුතු, එය නිසි ලෙස කිරීමට අවශ්‍ය පරිදි සංවිධානය කිරීමට දක්ෂයෙක් වෙයි නම් මෙය ඔහුගේ උත්සාහ සම්පත්තිය යැයි කියනු ලැබේ.''

## 2. ආරක්ඛ සම්පදා

**''කතමා ච ව්‍යග්ඝපජ්ජ ආරක්ඛසම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තස්ස භොගා හොන්ති උට්ඨානවිරියාධිගතා බාහාබල පරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා. තෙ ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති, කින්ති මෙ ඉමෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං න චොරා හරෙය්‍යුං න අග්ගි ඩහෙය්‍ය න උදකං වහෙය්‍ය න අප්පියා දායාදා හරෙය්‍යුන්ති අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ ආරක්ඛ සම්පදා''**

''ව්‍යග්ඝපජ්ජය, මෙලොව කුලපුත්‍රයෙකුට වීර්යයෙන් ලබාගත්, දැතේ වීර්යයෙන් රැස්කරගත් දහදිය හෙළා දැහැමින් උපයාගත් ධනය වෙයි. හෙතෙම මාගේ මේ දැහැමි භෝග සම්පත්තිය දඩමුදල් ආදී වශයෙන් රාජසන්තක ව නොයන්නේ කෙසේ ද සොරුන්ට පැහැර ගැනීමට නොලැබෙන්නේ කෙසේ ද ගින්නෙන් දැවීයාමට හෝ දියෙන් ගසාගෙන යාමට නොදෙන්නේ කෙසේ ද මා අකමැති උරුමකරුවන් අත්පත්කර නොගන්නේ කෙසේ දැයි සලකා එම ධනයෙහි රැකවරණය හා පරෙස්සම සලසා ගනී. ව්‍යග්ඝපජ්ජය, මෙය ඔහුගේ ආරක්ෂා සම්පත්තිය යැයි කියනු ලැබේ.''

## 3. කල්‍යාණ මිත්තතා

**''කතමා ච ව්‍යග්ඝපජ්ජ කල්‍යාණමිත්තතා? ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති තත්ථ යෙ තෙ හොන්ති ගහපති වා ගහපතිපුත්තා වා දහරා වා වුද්ධසීලිනො වුද්ධා වා වුද්ධසීලිනො සද්ධාසම්පන්නා සීලසම්පන්නා චාගසම්පන්නා පඤ්ඤාසම්පන්නා තෙහි සද්ධිං සන්තිට්ඨති, සල්ලපති, සාකච්ඡං සමාපජ්ජති යථාරූපානං සද්ධාසම්පන්නානං සීලසම්පදං අනුසික්ඛති, යථාරූපානං චාගසම්පන්නානං චාගසම්පදං අනුසික්ඛති, යථාරූපානං පඤ්ඤා සම්පන්නානං පඤ්ඤාසම්පදං අනුසික්ඛති, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ කල්‍යාණ මිත්තතා''**

''ව්‍යග්ඝපජ්ජය, මෙලොව යම් කුලපුත්‍රයෙක් කිසියම් ගමක හෝ නියම් ගමක වාසය කරයි ද එහි යම්කිසි තරුණ වුවත් වැඩිහිටිකම ඇති මහලු වුවත් වැඩිහිටිකම ඇති සැදැහැති, සිල්වත්, ත්‍යාගශීලී, ප්‍රඥාවන්ත යම් ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍ර කෙනෙක් වෙත්නම් ඔවුන් ඇසුරු කරයි. ඔවුන් සමග සංවාද සාකච්ඡා පවත්වයි. ඔවුන් වෙත ඇති යම් ශ්‍රද්ධා සම්පත්තියක් වේ නම් එය හුරුපුරුදු වෙයි. යම් ආරක්ෂා කළ සීල සම්පත්තියක් වෙයි නම් එය හුරුපුරුදු වෙයි. යම්බඳු ත්‍යාග සම්පත්තියක් වෙයිනම් එම සම්පත්තිය පුරුදු වෙයි. යම්බඳු ප්‍රඥා සම්පත්තියක් වෙයි නම් එය පුරුදු පුහුණු වෙයි. ව්‍යග්ඝපජ්ජය, මෙය ඔහුගේ කල්‍යාණමිත්‍ර ඇසුර යැයි කියනු ලැබේ.''

4. සමජීවිකතා

''කතමා ච ව්‍යග්ඝපජ්ජ සමජීවිකතා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො ආයඤ්ච භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති නාච්චොගාළ්හං නාතිහීනං, එවං මෙ ආයො වයං පරියාදාය ඨස්සති න ච මෙ වයො ආයං පරිදාය ඨස්සතීති

සෙය්‍යථාපි ව්‍යග්ඝපජ්ජ තුලාධාරො වා තුලාධාරන්තෙවාසී වා තුලං පග්ගහෙත්වා ජානාති එත්තකෙන වා ඔනතං එත්තකෙන වා උන්නතන්ති එවමෙව ඛො ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො ආයඤ්ච භොගානං විදිත්වා වයඤ්ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති න ච අච්චොගාළ්හං න අතිහීනං, එවං මෙ ආයො වයං පරියාදාය ඨස්සති න ච මෙ වයො අයං පරියාදාය ඨස්සතී'ති

සචායං ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො අප්පායො සමානො උළාරං ජීවිකං කප්පෙති තස්ස භවන්ති වත්තාරො උදුම්බරඛාදිකං වායං කුලපුත්තො භොගෙ ඛාදතීති.

සචෙ පනායං ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො මහායො සමානො කසිරං ජීවිකං කප්පෙති, තස්ස භවන්ති වත්තාරො අජද්ධුමාරිකං වායං කුලපුත්තො මරිස්සතීති.

ව්‍යග්ඝපජ්ජය, සමජීවිකතාව කෙසේදයත්. මෙලොව කුලපුත්‍රයෙක් තමාගේ භෝග සම්පත් අයවන ආකාරයත් භෝග සම්පත් වැයවන ආකාරයත් දැනගෙන මේ අයුරින් මාගේ ආදායම වියදම අභිබවා පවතින්නේ ය. මේ අයුරින් මාගේ වියදම ආදායම ඉක්මවා නොයන්නේ යැයි දැනුවත්ව ඉතා ඉහළ ම නොවූත් ඉතා පහළ ම නොවූත් සම මට්ටමින් දිවි පැවැත්ම කරන්නේ ය.

මෙහිදී උදාහරණයක් ගෙනහැර දක්වන බුදුරජාණන් වහන්සේ, තරාදියක් අත දරා ගත් අයෙක් මෙපමණ බරකින් තරාදිය පහළට යන්නේ ය. මෙපමණ බරකින් තරාදිය ඉහළට යන්නේ යැයි දැනගෙන තරාදිය අල්ලා ගන්නා සේ, කුලපුත්‍රයෙක් අයවැය සමව පවත්වාගැනීමට උත්සාහ කළයුතු බව වදාළ සේක. යම්කිසි ආදායම් අඩු අයෙක් අත දිගහැර වියදම් කරමින් ඉතා සුවපහසු දිවියක් ගතකරන්නේ නම් මිනිසුන් විසින් ඔහු උදුම්බරඛාදිකයෙකු හෙවත් දිඹුල් නොහොත් අට්ටික්කා කන්නෙකු මෙනැයි කියනු ඇත. මන්දයත්, අට්ටික්කා ගසෙන් පල නෙලන්නා ගස සොලවා වැටෙන සියලු ගෙඩි අතරින් පමණට පැසුණු ගෙඩි පමණක් තෝරාගෙන සෙසු ගෙඩි අතහැර දමන්නා සේ මොහු ද අරපරෙස්සමෙන් තොරව වියදම් කරන බැවිනි.

එසේ ම මහා ධන සම්පත් ඇති කුලපුත්‍රයෙක් මසුරුකමින් දිළිඳු ජීවිතයක් ගතකරන්නේ නම් මිනිසුන් විසින් මොහු අජද්ධුමාරික හෙවත් නොකා නොබී මැරෙන්නෙකැයි කියනු ඇත. එහෙයින් අය ඉක්මවා වැය කරන ඉතා නාස්තිකාරයෙකුත් මහා ආදායමක් තිබියදී නොකා නොබී රැස්කරන මසුරෙකුත් නොවී සම මට්ටමින් ජීවිකාව ගතකළ යුතු බව බුදුරජාණන් වහන්සේ වදාරති. මෙසේ අයවැය පවත්වා ගැනීම සමජීවිකතා නම් වේ.

මීළඟට මෙහිදී ධනය විනාශවන දොරටු හතරක් ද ධනය රැස්වන දොරටු හතරක් ද දේශනා කොට ඇත.

### ධනය නැසෙන දොරටු

| | |
|---|---|
| ඉත්ථිධුත්තො හොති | - ස්ත්‍රී ලෝලියෙකු වෙයි |
| සුරාධුත්තො හොති | - සුරා ලෝලියෙකු වෙයි |
| අක්ඛධුත්තො හොති | - සූදු ලෝලියෙකු වෙයි |
| පාපමිත්තො පාපසහායො පාපසම්පවංකො | - පාපමිත්‍රයන්, පාපසහායන් ඇති පවට නැඹුරු වූ අයෙකු වෙයි |

මෙයින් ධනය නැසෙන ආකාරය කෙබඳුද යත්, කිසියම් මහා තටාකයක ඇති ජලය සැපයෙන දොරටු හතර වසයි නම් ජලය පිටවන දොරටු සතර විවෘත කරයි නම් එය ස්වාභාවික ව පිරෙන්නට වැස්ස ද නොමැති නම් එවිට එම තඩාගය වියළී සිඳී යන්නේ ය. එමෙන් මෙම භෝග අපාය මුඛ හතර ඇති තැනැත්තාගේ ධනය මුළුමනින් ම නැසී යන්නේ ය. යම්කිසි අයෙක් තටාකයට ජලය සැපයෙන දොරටු හතර විවරකොට ජලය පිටවන දොරටු හතර වසා දමන්නේ ය. වැසිදිය ද මනාව ලැබෙන්නේ ය. එයින් එම තඩාගය නිතර ම පිරී ඉතිරී පවතින්නේ ය. වියළී යාමක් නොවන්නේ ය. එසේ ම කෙනෙකුගේ ධනය නොනැසෙන හෙවත් වැඩිදියුණු වන දොරටු ද හතරකි.

### ධනය නොනැසෙන දොරටු

| | |
|---|---|
| න ඉත්ථිධුත්තො හොති | - ස්ත්‍රී ලෝලියෙකු නොවෙයි |
| න සුරාධුත්තො හොති | - සුරා ලෝලියෙකු නොවෙයි |
| න අක්ඛධුත්තො හොති | - සූදු ලෝලියෙකු නොවෙයි |

කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවංකො

කළණ මිතුරන් යහපත් සහායයන් ඇති යහපතට නැඹුරු වූ කෙනෙකු වෙයි.

මෙසේ කුලපුත්‍රයෙකුට මෙලොව හිත පිණිස පවතින සැප පිණිස පවතින ධර්ම හතරක් ව්‍යග්ඝපජ්ජ කෝළිය පුත්‍රයාට වදාළ සේක.

## පරලොව දියුණුවට හේතු වන කරුණු

'' චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ ධම්මා කුලපුත්තස්ස සම්පරායහිතාය සංවත්තන්ති. සම්පරායසුඛායාති. කතමෙ චත්තාරො,? සද්ධාසම්පදා සීලසම්පදා චාගසම්පදා පඤ්ඤාසම්පදා''

''ව්‍යග්ඝපජ්ජය, කුලපුත්‍රයෙකුට පරලොව හිත පිණිස පරලොව සුව පිණිස පවතින කරුණු හතරකි. ඒ කවරේද යත්, ශ්‍රද්ධා සම්පත්තිය, සීල සම්පත්තිය, ත්‍යාග සම්පත්තිය, ප්‍රඥා සම්පත්තිය යනු යි.''

## 01. සද්ධා සම්පදාව

**''කතමා ච ව්‍යග්ඝපජ්ජ සද්ධාසම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං, ඉති'පි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ සද්ධාසම්පදා''**

''ව්‍යග්සපජ්ජය, ශ්‍රද්ධා සම්පත්තිය යනු කුමක් ද යත්, මෙලොව කුලපුත්‍රයෙක් ශ්‍රද්ධා සම්පන්න වෙයි. තථාගතයන් වහන්සේගේ බුදුබව විශ්වාස කරයි. ඒ කෙසේ ද යත්, ඒ භාග්‍යවතුන් වහන්සේ අරහත් ය. සම්‍යක්සම්බුද්ධ ය. විද්‍යා හා චරණ ධර්මයන්ගෙන් සමන්විත ය. සුගත ය ලෝකවිදූය. පුරුෂයන් දමනය කිරීමේ උතුම් ඇඳුරිඳු වෙයි. දෙව් මිනිසුන්ට ශාස්තෘ ය, බුද්ධ ය. භාග්‍යවත් ය, යනුවෙනි. මෙය ශ්‍රද්ධා සම්පදාව යැයි කියනු ලැබේ.''

**වි.** ශ්‍රද්ධා වශයෙන් මෙහි විග්‍රහ කර ඇත්තේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය යි. සමහර තැනක තෙරුවන පිළිබඳ විශ්වාසය ද ශ්‍රද්ධාව යැයි දක්වා තිබේ. එහි ගැටලුවක් නැත. මන්ද යත් තෙරුවන ම තථාගතයන් වහන්සේ නිසා පහළවන බැවිනි. උන්වහන්සේ දේශනා කළේ යමක් ද; බුදුරජාණන් වහන්සේගේ චරිතයත් ගුණයත් එය ම විය. සංඝරත්නය යනු බුදුරජාණන් වහන්සේ අනුගමනය කරන දහම පිළිපදින පිරිස යි. මෙයින් කුමන රත්නයක් විශ්වාස කළ ද තෙරුවන ම විශ්වාස කළා වන්නේ ය. මෙහිදී කියවෙන්නේ දෙවියන් විශ්වාස කරන්නාක් මෙන් බුදුරජාණන් වහන්සේ විශ්වාස කළ යුතු බවක් නොව උතුම් බුදුබව විශ්වාස කිරීම ශ්‍රද්ධාව වන බව යි. බුදුබව නම් උතුම් වූ සත්‍යය අවබෝධ කිරීම යි. නැතහොත් ධර්මයෙන් ලැබිය හැකි උත්තරීතර බවට පත්වීම යි. එනිසා ශ්‍රද්ධාවන්තයා යනු ධර්ම මාර්ගයෙහි ගමන් කොට බුදුරජාණන් වහන්සේ බුදු වූ බව පිළිගෙන තමාටත් එම ධර්මය පිළිපැදීමෙන් අවබෝධයක් කරා යා හැකි යැයි විශ්වාස කරන්නා ය. කෙනෙක් දානාදී පින්කම් කරන්නේත් තෙරුවන් වැඳීම වතාවත් කිරීම, සීල සමාධි ප්‍රඥා ගුණ පුරන්නේත් ශ්‍රද්ධාව ඇතිවිට ය.

## 02. සීල සම්පදාව

**''කතමා ච ව්‍යග්ඝපජ්ජ සීල සම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ සීලසම්පදා''**

''ව්‍යග්සපජ්ජ, සීල සම්පදාව යනු කවරේ ද යත්, මෙලොව කුලපුත්‍රයෙක් ප්‍රාණයන් නැසීමෙන් වැළකුණේ වෙයි. නොදුන් දෑ ගැනීමෙන් වැළකුණේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණේ වෙයි. බොරුකීමෙන් වැළකුණේ වෙයි. මත්වීමට හා ප්‍රමාදයට හේතුවන මද්‍යසාර පානයෙන් වැළකුණේ වෙයි. ව්‍යග්සපජ්ජය, මෙය සීල සම්පදාව යැයි කියනු ලැබේ.''

මෙම සූත්‍ර දේශනාව ගිහියන්ගේ ඉල්ලීමකට අනුව ඔවුන්ට දේශනා කරන ලද්දක් වන බැවින් ගිහිසීලය වන පඤ්ච සීලය සීල ප්‍රතිපදාව වශයෙන් දක්වා ඇත.

## 03. චාග සම්පදාව

''කතමා ච ව්‍යග්ඝපජ්ජ චාගසම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ චාගසම්පදා''

''ව්‍යග්ඝපජ්ජය, ත්‍යාග සම්පදාව යනු කවරේ ද යත්, මෙලොව කුලපුත්‍රයෙක් මසුරුමලයෙන් තොර සිතින් ගිහිගෙයි වසයි. හෙතෙම දුන් දේ සිතින් ම අතහැර දෙන්නේ වෙයි. තමා සතු දේ පරිත්‍යාග කිරීමෙහි ම ඇලුණේ වෙයි. කෙනෙකුට අවුත් යමක් ඉල්ලීමට සුදුස්සෙක් වෙයි. දෙන සුලු බෙදා හදාගෙන භුක්ති විඳින සුලු කෙනෙක් වෙයි. ව්‍යග්ඝපජ්ජය, මෙය ඔහුගේ ත්‍යාග සම්පදාව යි.''

**වි.** පළමුකොට ම යමෙක් පරිත්‍යාගශීලියෙකු හෝ දන්දෙන්නෙකු වන්නට නම් මසුරුකමින් තොරවිය යුතු ය. මසුරුකම නම් අදින්නපුබ්බක, ඉල්ලීස සිටු වැනි පුද්ගලයන් සේ තමනුත් භුක්ති නොවිඳින, අනුන් භුක්ති විඳිනවාටත් අකමැති බව යි. පරිත්‍යාගශීලියා යනු මෙලොව පරලොව පිං පිණිස දන් දීම පමණක් කරන්නා නොව තමනුත් භුක්ති විඳින අතර ම මාපියන්, නෑ හිතවතුන් අතර ද ගේ දොර, ඉඩකඩම්, ආහාර පාන ආදී සැප සම්පත් බෙදාහදාගෙන භුක්ති විඳින්නා ය. දාන සංවිභාගරතො යනුවෙන් හැඳින්වෙන්නේ එයයි.

## 04. පඤ්ඤා සම්පදාව

''කතමා ච ව්‍යග්ඝපජ්ජ පඤ්ඤාසම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා, පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛය ගාමිනියා, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ පඤ්ඤා සම්පදා''

''ව්‍යග්ඝපජ්ජය, පඤ්ඤා සම්පදාව කවරේ ද යත්, මෙලොව කුලපුත්‍රයෙක් ප්‍රඥා සම්පන්න වේ. එනම්, කෙලෙස් නිවීමට හේතුවන මැනවින් දුක් කෙළවර කිරීම පිණිස පවතින සංස්කාරයන්ගේ ඇතිවීම හා නැතිවීම පිළිබඳ ව උතුම් වූ ප්‍රඥාවෙන් සමන්විත වෙයි. ව්‍යග්ඝපජ්ජය, මෙය ඔහුගේ පඤ්ඤා සම්පදාව යැයි කියනු ලැබේ.''

**වි.** මෙහි උදයත්ථගාමිනී යන තැන උදය නම් ඇති වීම යි. අත්ථගාමිනී යනු අස්ථංගත වීම හෙවත් නැතිවීම යි. හිරු බැසීම මෙනි ඇතිවීම නැතිවීම පිළිබඳ නුවණ ප්‍රඥා සම්පත්තියෙන් කියවේ. එනම්, විදර්ශනා ප්‍රඥාව යි. එය ඍජුව ම නිවන් අවබෝධ කරන නුවණ යි. ගිහියන්ට දෙලොව දියුණුව කියාදෙන ලෙස ඉල්ලූවිට ගිහියන්ට එකවර අවබෝධ කරගත නොහැකි විදර්ශනා දක්වන ලද්දේ ඇයි ද යන්න ගැටලුවක් විය හැකි ය. සාමාන්‍යයෙන් බුදුරජාණන් වහන්සේ කිසිකෙනෙකුත් ලෞකික සැපත ළඟ නවතන්නට

දහම් නොදෙසති. උන්වහන්සේගේ සෑම ධර්ම දේශනාවක් ම අවසන් වන්නේ නිර්වාණය කුළුගැන්වීමෙනි. එබැවින් දෙලොව දියුණුව ඇසූ ව්‍යග්ඝපජ්ජට ද ප්‍රඥාවෙන් නිවන් දකින තැනට ගෙන එමින් දේශනාව නිමා කළ හ.

දෙලොව දියුණුවට හේතුවන මංගල කරුණු දේශනා කරන බුදුරජාණන් වහන්සේ මංගල සූත්‍රයේදී ද ''**අසොකං විරජං ඛෙමං**'' යනුවෙන් කරන ඉගැන්වීම ද මෙබන්දකි.

අනෙක් අතට ගිහියන් සඳහා කරන දේශනාවන්හි දී ප්‍රඥාව තල තුනක සිට දක්වා ඇති බව පෙනේ.

- **අංගුත්තර නිකායේ නවක නිපාතයේ බලසංගහවත්‍ථු සූත්‍රයේදී ගිහියන් සඳහා ප්‍රඥා බලය ලෙස දක්වා ඇත්තේ කුසල් අකුසල් හෝ හොඳ නරක පිළිබඳ නුවණ යි. එය ශීලයේ පිහිටා ගිහියාට ප්‍රඥාවේ මූලික පියවර පිළිබඳ කළ දෙසුමකි.**

- **අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ එන අනේපිඬු සිටුතුමාට දෙසූ පත්තකම්ම සූත්‍රයේ පඤ්ඤා සම්පදා නමින් ගිහියන් සඳහා දක්වා ඇත්තේ පඤ්චනීවරණ ධර්ම තමාගේ සිත කිලුටු කරන බව දැන ඒවා දුරුකර සිත වැඩීම පඤ්ඤා සම්පදාව වන බව යි. කලකට හෝ නීවරණ ධර්ම නැවැත් වීම සිදුවන්නේ ධ්‍යාන බලයෙනි. සමාධියෙනි. ඒ අනුව එහි ප්‍රඥා සම්පදාව ගිහියන්ට නිර්දේශ කරන්නේ සමාධි තලයේ සිට ය.**

- **ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ එන මේ ප්‍රඥා සම්පදාව ඊළඟ පියවර යි. එය විදර්ශනාව නම් වූ බුදුදහමේ ප්‍රඥාවේ උපරිම තලය යි. ඒ බව මෙහි (අරියාය) උතුම් වූ හෝ සෝවාන් ආදී ආර්යන් වහන්සේට අයත් වූ (නිබ්බෙධිකාය) නිර්වේදයට හෙවත් නැවත විඳීමක් නැති අවේදයිත සුවය වන නිවනට හේතුවන (සම්මාදුක්ඛක්ඛයගාමිනී) සියලු සසර දුක් කෙළවර කරන ප්‍රඥාව යැයි සඳහන්වීමෙන් පැහැදිලි වේ.**

මේ අනුව මුලින් මෙලොව දියුණුවට හේතුවන කරුණු හතර දක්වා අනතුරුව පරලොව සුවයත් නැවත නූපදින නිවන් සුවයත් යන ත්‍රිවර්ග සම්පත්තිය ම මේ සූත්‍රයෙන් කාමභෝගී ගිහියාට දේශනා කර තිබේ.

**උට්ඨාතා කම්මධෙය්‍යෙසු**
**අප්පමත්තො විධානවා**
**සමං කප්පෙති ජීවිකං**
**සම්භතං අනුරක්ඛති**

''කරන රැකියා කර්මාන්තවලදී උත්සාහය, වීර්යය ඇති, අනලස්ව ප්‍රමාද නොවන මනා සංවිධානයකින් යුක්ත තැනැත්තා අයවැය සමව පවත්වාගනිමින් ජීවිකාව කරයි. රැස්කළ ධනය රැකගනී.''

සද්ධාය සීලෙන සම්පන්නො
වදඤ්ඤූ වීතමච්ඡරො
නිච්චං මග්ගං විසොධෙති
සොත්ථානං සම්පරායිකං

''ශ්‍රද්ධා සම්පන්න, සීල සම්පන්න, යාචකයන්ගේ වදන් හඳුනන මසුරුමල නැති තැනැත්තා පරලොව සුවදායී මාර්ගය නිතර පිරිසිදු කරගනී.''

ඉච්චෙතෙ අට්ඨධම්මා ච
සද්ධස්ස ඝරමෙසිනො
අක්ඛාතා සච්චනාමෙන
උභයත්ථ සුඛාවහා

''මේ ධර්ම අට ශ්‍රද්ධාවන්ත ගිහියාගේ දෙලොව යහපත සලසන්නේ යැයි සත්‍ය නාමයෙන් ම අන්වර්ථ වූ බුදුරජාණන් වහන්සේ වදාළහ.''

දිට්ඨධම්මහිතත්ථාය
සම්පරායසුඛාය ච
එවමෙතං ගහට්ඨානං
චාගො පුඤ්ඤං පවඩ්ඪති

(අං.නි. අට්ඨක නිපාත, ව්‍යග්ඝපජ්ජ සුත්ත)

මෙම පරිත්‍යාගය වනාහි ගිහියන්ගේ මෙලොව හිතසුව පිණිස ද පරලොව හිතසුව පිණිස ද හේතුවන පින් වඩන්නේ ය.

මෙම සූත්‍ර දේශනාව පුද්ගලයෙකුගේ මෙලොව පරලොව ජීවිත සුවදායී කරගනිමින් නිර්වාණය අවබෝධ කර ගැනීමට මහෝපකාරී වන බුද්ධ දේශනාවකි. මෙය දැන ඒ මග ගමන් කිරීම ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයා සතු වගකීමකි.

**අභ්‍යාස**

01. මෙම සූත්‍රයේ එන මෙලොව, යහපතට හේතුවන කරුණු අනුගමනය නොකිරීමෙන් එන හානිය පැහැදිලි කරන්න.
02. ''සද්ධා සම්පදා'' පිළිබඳ විවරණයක් කරන්න.
03. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ඇසුරින් ශිෂ්‍ය සමිතියේ ධර්මදේශනාවක් සිදු කරන්න.

14
පාඩම

# සිතුවිලි හඳුනාගැනීම හා අන්‍ය සමාන චෛතසික

එකුප්පාද නිරෝධා ච - එකාලම්බන වත්ථුකා
චේතොයුත්තා ද්විපඤ්ඤාස - ධම්මා චේතසිකා මතා

**සිත සමග ම උපදින්නේ - සිත සමග ම නැතිවන්නේ**
**සිත ගත් අරමුණ ගන්නේ - සිත සිටි තැන ම යි ඉන්නේ**

සිතක් හොඳ සිතක් ද නරක සිතක් ද ආදී වශයෙන් සිතක ස්වරූපය තීරණය වන්නේ ඊට අඩංගු වන චෛතසික අනුව ය. කසායක ජලය සිත වැනි ය. එහි අඩංගු බෙහෙත් ද්‍රව්‍ය සාරය චෛතසික වැනිය. ජලයෙන් ද්‍රව්‍ය සාර වෙන්කළ නොහැකි වාක් මෙන් චෛතසිකයන්ගෙන් සිතක් වෙන් කළ නොහැක. කසායන් වාතයට ද, පිතට ද, සෙමට ද යනාදී වශයෙන් තීරණය වන්නේ එහි අඩංගු බෙහෙත් ද්‍රව්‍ය අනුව ය. එසේ ම සිත ද කුසල සිතක් ද අකුසල සිතක් ද යනුවෙන් තීරණය වන්නේ එහි අඩංගු චෛතසික අනුව ය. කුසලසිත් අකුසල සිත් කියා සිත් නොමැත. අකුසල චෛතසික සමග යෙදෙන සිත අකුසල සිතක් වෙයි. කුසල චෛතසික සමග යෙදෙන සිත කුසල සිතක් වෙයි.



උදාහරණයක් ලෙස ප්‍රීතිය නැමති චෛතසිකය සිතක පහළ වූ අවස්ථාවේ ද්වේෂය නැමති චෛතසිකයට එහි ඉඩක් නැත. ඔබට තරහ ඇති වූ විට සිනහ නොඑන්නේත් සිනහවන විට තරහ නොඑන්නේත් මේ හේතුවෙනි. මේ දෙක සිදුවන්නේ එකිනෙකට විරුද්ධ චෛතසික දෙකක ක්‍රියාකාරීත්වය මත ය.

චෛතසික ලක්‍ෂණ සතරකි.

1. සිත සමග ම උපදියි (එකුප්පාද)
2. සිත සමග ම නැතිව යයි (එක නිරොධ)
3. සිත ගත් අරමුණ ම ගනී (එකාලම්බන)
4. සිත ඒ අවස්ථාවේ ඇසුරු කරන චක්ඛු, සෝතාදී ප්‍රසාද වස්තුව ම ඇසුරු කොට පවතී (එකවත්ථුක)

යනුවෙනි.

## චෛතසික ප්‍රභේද

පනස් දෙකක් වූ චෛතසික ධර්ම රාශි වශයෙන් කොටස් තුනකට බෙදේ.

| | | | |
|---|---|---|---|
| 1. අන්‍යසමාන රාශිය | - (13) | සබ්බචිත්තසාධාරණ චෛතසික | 7 යි |
| | | පකිණ්ණක චෛතසික | 6 යි |
| 2. අකුසල රාශිය | - (14) | අකුසල චෛතසික | 14 යි |
| 3. සෝභන රාශිය | - (25) | සොභන සාධාරණ චෛතසික | 19 යි |
| | | අසාධාරණ සෝභන චෛතසික 6 යි එනම්, (විරති චෛතසික 3 යි, අප්පමඤ්ඤා චෛතසික 2 යි පඤ්ඤා චෛතසික 1 යි) | |

1. අන්‍යසමාන රාශිය - (13)

අන්‍යසමාන චෛතසික රාශිය කොටස් දෙකකට බෙදේ. එනම්,

1. සබ්බචිත්තසාධාරණ චෛතසික 7 යි.
2. පකිණ්ණක චෛතසික 6 යි.

යනුවෙනි.

මෙම සිත්වලින් සබ්බචිත්තසාධාරණ චෛතසික සියලු ම සිත්වල යෙදේ. ප්‍රකීර්ණක චෛතසික එසේ සෑම සිතක ම නොයෙදුනත් අවස්ථානුකූලව ගැලපෙන පරිදි යෙදේ. අකුසල සිතක් ඇතිවන විට අකුසල චෛතසික ලෙසත් කුසල සිතක් ඇතිවන විට කුසල චෛතසික ලෙසත්, පැවතීම මෙහි ස්වභාවය යි. මෙසේ මෙම චෛතසික 13 තමන් හා යෙදෙන සිතටත් සෙසු චෛතසිකවලටත් අනුරූපව සිටින බැවින් නොහොත් සමානව සිටින බැවින් අන්‍යසමාන චෛතසික යනුවෙන් හැඳින් වේ.

### 1. සබ්බචිත්ත සාධාරණ චෛතසික 7

ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර යනුවෙන් සබ්බචිත්තසාධාරණ චෛතසික සතකි. අසූ නවයක් වූ සියලු සිත්වල මෙම චෛතසික සියල්ල යෙදේ. කුසල අකුසල භේදයක් නොමැතිව සියලු සිත්වල එකසේ යෙදෙන නිසා මෙම චෛතසික සත මේ නමින් හඳුන්වයි.

(කථං? ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා එකග්ගතා ජීවිතින්‍ද්‍රියං මනසිකාරොචෙති සත්තිමෙ චෙතසිකා සබ්බචිත්තසාධාරණා නාම)

### 1.1. ඵස්ස

**ඵුසතීති ඵස්සො - අයං හි අරූපධම්මො සමානො, ආරම්මණෙ ඵුසනාකාරෙනෙව පවත්තති.**


ස්පර්ශ වීම, හැපීම, ගැටීම ඵස්ස ලෙස හැඳින් වේ. රූපයක් දැකීමට නම් කාරණා තුනක් සම්පූර්ණ විය යුතු ය. එනම් ඇසත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් එක්වීම ය. **(චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො)** ඇසත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් නිසා ස්පර්ශය ඇති වේ. කණට ශබ්දය ද නාසයට සුවඳ ද දිවට රසය ද කයට ස්පර්ශය ද මනසට සිතිවිලි ද මේ ආකාරයට ම ස්පර්ශය වේ. මේ අතරින් තදින් සිදුවන්නේ කායික ස්පර්ශයයි. එතැන්සිට ඇස, කණ, නාසය, දිව, මනස යන පිළිවෙලට ස්පර්ශය සියුම්ව යයි.

### 1.2. වේදනා

**වෙදියති ආරම්මණ රසං අනුභවතීති වෙදනා**

වේදනා යනු විඳීම යි. ඉඳුරන්ට අරමුණු දැනෙන ස්වභාවයයි. අරමුණේ ස්වභාවය අනුව වේදනාව වෙනස් වේ. අරමුණ හොඳ වේ නම් සුඛ වේදනාවක් ඇති වේ. අරමුණ නරක එකක් නම් දුක්ඛ වේදනාවක් ඇති වේ. අමුතු හොඳක් හෝ නරකක් නැති මධ්‍යස්ථ වූ එකක් නම් උපෙක්ඛා වේදනාවක් උපදී. ඒ අනුව වේදනාව තුන් ආකාර වේ.

### 1.3. සඤ්ඤා



**නීලාදී භෙදං ආරම්මණං සඤ්ජානාති, සඤ්ඤං කත්වා ජානාතීති සඤ්ඤා.**

ඉඳුරන්ට මුණගැසෙන අරමුණක් නිල්, රතු ආදී වර්ණ වශයෙන් හෝ ගඳ, සුවඳ වශයෙන් හෝ රස වශයෙන් හෝ හොඳ නරක වශයෙන් වෙන්කොට හඳුනාගන්නේ සඤ්ඤා මගිනි. පෙර දුටු කෙනෙකු නැවත දුටුවිට අප හඳුනාගන්නේ මෙම සඤ්ඤා චෛතසිකය නිස යි. ඒ අනුව මතකය යනු ද සඤ්ඤාවයි.

### 1.4. චේතනා

**චෙතෙති, අත්තනා සම්පයුත්ත ධම්මෙ ආරම්මණෙ අභිසන්දහති සංඛතාභි සංකරණෙ වා ව්‍යාපාරං ආපජ්ජතීති චෙතනා**

තමනුත් සිතමින් තමන් හා යෙදුන චිත්ත චෛතසික ධර්මයනුත් කාර්යයෙහි යොදවන්නේ චේතනාව යි. එම නිසා මෙය සෙන්පතියෙකු ලෙස ද හැඳින්වේ. අප යෑම් ඊම් ආදී යම් ක්‍රියාවක් කිරීමට හෝ යම් දෙයක් කථාකිරීමට මෙහෙයවන්නේ ද චේතනාව යි.

එනිසා ම ''චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි - චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා වා.'' යනුවෙන් ද දක්වා ඇත. මේ අනුව කර්මය යනු චේතනාවෙන් හිතාමතා කළ කී දෙයයි.

### 1.5. එකග්ගතා

නානාරම්මණ වික්ඛෙපාභාවෙන එකං ආරම්මණං අග්ගං ඉමස්සාති එකග්ගං, තස්ස භාවො එකග්ගතා.

සිත නොයෙක් අරමුණුවලට යා නොදී එක් අරමුණක තබා ගැනීමට උපකාර වන්නේ ඒකග්ගතාව යි. විසිර යන දූවිල්ලකට ජලය ඉසීමෙන් එය වළක්වා ගන්නාක් මෙන් සිත එහි මෙහි විසිර යන්නට නොදී වළක්වන්නේ මෙම චෛතසිකය යි. භාවනාවේ දී මෙම චෛතසිකය ඉතා වැදගත් කාර්යයක් ඉටුකරයි. සිතේ සමාධිය ඇතිකර ගැනීම භාවනාවෙන් සිදුවෙයි. මෙයින් කුසල අකුසල සෑම අවස්ථාවක ම එකඟ බව ඇතිකරයි.

### 1.6. ජීවිතින්ද්‍රිය

ජීවන්ති තෙන සම්පයුත්තා ධම්මෙහි ජීවිතං. තදෙව සහජාතානුපාලනෙ ආධිපච්චයොගෙන ජීවිතින්ද්‍රියං.

සිතෙහි පවත්නා ධර්ම අභාවයට යන්නට නොදී සුළු මොහොතක් හෝ ජීවත් කරවන්නේ ජීවිතින්ද්‍රිය චෛතසිකය යි. එනම් චෛතසික ධර්ම එක් වී සිතක් සේ පැවතීගෙන යන්නේ ජීවිතින්ද්‍රිය නිසා ය. නෙලුම් ආදිය ජලයෙන් රැකෙන්නාක් මෙනි. ජීවිතින්ද්‍රිය දෙකකි. නාම හා රූප ජීවිතින්ද්‍රිය යනුවෙනි. මෙහි විස්තර වන්නේ නාම ජීවිතින්ද්‍රිය යි. රූප ජීවිතින්ද්‍රිය රූප පරමාර්ථ ධර්ම විස්තරයෙහි දැක් වේ. මෙම චෛතසිකය ද සියලු තැන්හි යෙදෙන බැවින් සබ්බචිත්තසාධාරණ වන්නේ ය.

### 1.7. මනසිකාර

මනස්මිං මනසිකාරො සො චෙතසො ආරම්මණෙ සමන්නාහාර ලක්ඛණො.

සිහිකිරීම මනසිකාරය නමින් හැඳින් වේ. සිත වෙනතකට යන්නට නොදී නැවත නැවත අරමුණ වෙත යොදවන්නේ මෙම මනසිකාරය යි. අශ්වයන් ඉදිරියට මෙහෙයවන අශ්වාරෝහකයෙකු මෙන් චිත්ත චෛතසිකයන් ද මෙහෙයවන්නේ මනසිකාරය යි.

## 2. පකිණ්ණක චෛතසික සය

විතක්කො විචාරො අධිමොක්ඛො විරියං පීති ඡන්දො චාති ඡ ඉමෙ චෙතසිකා පකිණ්ණකා නාම. එවමෙතෙ තෙරසචෙතසිකා අඤ්ඤසමානාති වෙදිතබ්බා.

කුසල සිත් හා අකුසල සිත්වල මිශ්‍රව යෙදෙන බැවින් මෙම චෛතසික පකිණ්ණක නමින් හැඳින් වේ. එසේ විසිරී පවතින චෛතසික හයකි.

1. විතක්ක
2. විචාර
3. අධිමොක්ඛ
4. විරිය
5. පීති
6. ඡන්ද

යනු ඒ සය යි.

- **විතක්ක**

ආරම්මණං විතක්කෙති සම්පයුත්ත ධම්මෙ අභිනිරොපෙතීති විතක්කො

අරමුණකට සිතේ අවධානය යොමු කරවමින් සෙසු චෛතසිකයන් ද සිත ද අරමුණට නැංවීම විතක්ක නමි. දොරටු පාලකයෙක් රජමාලිගාවට පැමිණි ගැමියෙකු රජුවෙත කැඳවාගෙන යන්නා සේ විතර්ක චෛතසික ක්‍රියා කරයි. මෙහි දී විතර්කය දොරටුපාලයකයා ය. ගැමියා නම් සිතයි. අරමුණ නම් රජමැදුර යි. විතර්ක චෛතසිකය දෙපස් විඤ්ඤාණ හැර සෙසු සිවුසාළිස් (44) කාමාවචර සිත්වලත්, ප්‍රථමධ්‍යාන සිත් 11 තුළත් යෙදේ.

- **විචාර**

ආරම්මණෙ චිත්තං විචාරෙතීති විචාරො

විතර්ක චෛතසිකයෙන් අරමුණට නැංවූ චිත්ත චෛතසික එම අරමුණෙහි හැසිරවීම සිදුකරන්නේ විචාරය යි. ගණ්ඨාවකට ගසන පළමු පහර විතක්කය නම් ඊට පසුව නැගෙන අනුරාව විචාරය යි. පක්ෂියකු අහසට නැගීම සඳහා වෑයමින් පියාපත් සැලීම විතක්කය නම් අහසට නැගුණු පක්ෂියා සන්සුන් වී පියාපත් සමව සලමින් ගමන් කිරීම විචාරය යි. මෙම විචාර චෛතසිකය විතක්ක චෛතසිකය යෙදුණ සිත් 55 හා ද්වීතීය ධ්‍යාන සිත් එකොළොසේත් (11) යෙදේ.

- **අධිමොක්ඛ**

අධිමුච්චනං අධිමොක්ඛො ආරම්මණෙ නිච්චලභාවෙන ඉන්‍දඛීලො විය දට්ඨබ්බො

අධිමොක්ඛ යනු ඉන්‍දඛීලයක් හෙවත් නගර මැද ශක්තිමත් ව සිටවූ කණුවක් මෙන් ස්ථිරව නිශ්චිතව පවත්නා ස්වභාවය යි. සැක හැර අරමුණෙහි බැස ගැනීම මෙහි ලක්‍ෂණයකි. අරමුණ පිළිබඳ සිතේ හැඳිනීම නිවැරදි බව තීරණය කරන්නේ අධිමොක්ඛයෙනි. මෙම චෛතසිකය දෙපස් විඤ්ඤාණ සිත් හා විචිකිච්ඡා සිත හැර සෙසු සිත් හැත්තෑ අටෙහි ම (78) යෙදේ.

### 4. විරිය

**විධිනා ඊරයිතබ්බං පවත්තෙතබ්බන්ති වා විරියං**

ඒ ඒ සිත් හා චෛතසික නිසි පරිදි ක්‍රියාත්මක වීමට උනන්දු කරවන්නේ විරිය චෛතසිකය යි. සිතේ හැකිළුණු ගතිය, අලස ගතිය දුරුකොට රුකුල් දෙන්නේ වීර්ය යි. මෙම චෛතසිකය දෙපස් විඤ්ඤාණ, සම්පටිච්ඡන යුගලය, සන්තීරණ ත්‍රිකය යන සිත් හැර සෙසු සිත් සැත්තෑ තුනෙහි (73) යෙදේ.

### 5. පීති

**පීණයති, කාය චිත්තං තප්පෙති වඩ්ඪෙති වා පීති**

සිත හා සම්ප්‍රයුක්ත ධර්මයන් (චෛතසික) පිණවීම, සතුටු කිරීම, ප්‍රබෝධමත් කරවීම පීතිය යි. ලස්සන මල්වත්තක් දුටු විට සතුටක් ඇතිවන්නා සේ ය. මෙම ප්‍රීති චෛතසිකය නිසා සිනහව, අත්පුඩි ගැසීම් වැනි දේ සිදු වේ. මෙම දෝමනස්ස චෛතසිකය සහගත අකුසල් සිත් දෙක, උපෙක්ඛා සහගත සිත් පනස් පහ, කාය විඤ්ඤාණ සිත් දෙක, චතුර්ථ ධ්‍යාන සිත් එකොළොස, යන සිත් හැත්තෑව (70) හැර සෙසු සිත් පනස් එකෙහි (51) යෙදේ.

### 6. ඡන්ද

**ඡන්දොති කත්තුකම්‍යතායෙතං අධිවචනං තස්මා කත්තුකම්‍යතා ලක්ඛණො ඡන්දො**

ඒ ඒ දේවල් කිරීමේ කැමැත්ත, ඕනෑකම ඡන්ද නම් වේ. මෙය ලෝභය නොවේ. ඡන්දය යනු ඇලීමෙන් තොර වූවකි. ඕනෑකමකි. ලෝභ සහගත සිත්වල ඇතිවන ඡන්දය ලෝභයට අනුකූලව ද ලෝභයට විරුද්ධ සිත්වල දී ඊට අනුකූලව යෙදීම මෙහි ස්වභාවය යි. මෙම චෛතසිකය මෝහ මූලික සිත් දෙක, අහේතුක සිත් අටළොස (18) යන සිත් 20 හැර සෙසු සිත් එකුන් සැත්තෑවේ (69) යෙදේ.

ඉහතින් දැක් වූ සබ්බචිත්තසාධාරණ චෛතසික සෑම සිතක ම යෙදේ. එහෙත් ප්‍රකීර්ණක චෛතසික සෑම සිතක ම නොයෙදුණත් කුශලාකුශල, ලෞකික ලෝකෝත්තරාදී සෑම කොටසක ම සිත්වල සුදුසු පරිදි විසිරී යෙදී ඇත. එනිසා ප්‍රකීර්ණක නමින් හැඳින් වේ. මෙම චෛතසික අකුශල රාශිය, ශෝභන රාශිය යන රාශි දෙකට ම අයත් චෛතසිකයන් හා ඒ ඒ රාශියට අනුකූලව යෙදෙන බැවින් අන්‍යසමාන නමින් හැඳින්වේ.

**අභ්‍යාස**

01. සබ්බචිත්තසාධාරණ චෛතසික කීය ද? ඒ මොනවා ද?
02. ප්‍රකීර්ණක චෛතසිකවල ස්වභාවය විස්තර කරන්න.

15
පාඩම

# නරක සිතුවිලි

## අකුසල රාශිය - චෛතසික 14

අකුසල් සිත් දොළොස ඇසුරුකරමින් උපදින චෛතසික තුදුස (14) කි. ඒවා අකුසල රාශිය යටතේ විස්තර වේ. මේවාට අකුසල චෛතසික යන නම ද භාවිත වේ.

**මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං ලොභො දිට්ඨි මානො**
**දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං ථීනං මිද්ධං විචිකිච්ඡා චෙති**
**චුද්දසිමෙ චෙතසිකා අකුසලා නාම**

## අකුසල චෛතසික 14

| | | | | |
|---|---|---|---|---|
| 1. මෝහ | 2. අහිරික | 3. අනොත්තප්ප | 4. උද්ධච්ච | 5. ලෝභ |
| 6. දිට්ඨි | 7. මාන | 8. දෝස | 9. ඉස්සා | 10. මච්ඡරිය |
| 11. කුක්කුච්ච | 12. ථීන | 13. මිද්ධ | 14. විචිකිච්ඡා | |

### 1. මෝහ

**ආරම්මණෙ මුය්හතීති මොහො අඤ්ඤාණං**

සිතෙහි අරමුණුවල සැබෑ තත්ත්වය මුවහ කරන ස්වභාවය මෝහය යි. නොදැනීමයි. ඇසෙහි පටලය මෙනි. නිල් කණ්ණාඩියක් දැමුවා සේ මෝහය අපව නොමග යවයි. මෙය බලවත් අකුසල ධර්මයකි. පටිච්චසමුප්පාදයෙහි දී අවිජ්ජා යනුවෙන් හැඳින්වූයේ ද මෙය යි. මෝහය දොළොස් අකුසල් සිත්හි යෙදෙන්නේ ය.

### 2. අහිරික

**කාය දුච්චාරිතාදිතො අජිගුච්ඡන ලක්ඛණං අහිරිකං**

කාය දුශ්චරිතාදිය පිළිකුල් නොකරන ස්වභාවයයි. ඌරා අසුචිවලට මෙන් පවට ඉතා කැමැතිවීම අහිරිකය යි. ප්‍රසිද්ධියේ පව්කරන්නේ ඒ ලැජ්ජාව නැති නිසා ය. මෙම චෛතසිකය ද දොළොස් අකුසල සිත්වල යෙදේ.

### 3. අනොත්තප්ප

කාය දුච්චාරිතාදීහි අසාරජ්ජ ලක්ඛණං අනුත්තාස ලක්ඛණං වා

පව්කිරීමට ඇති බිය ඔත්තප්පය යි. කාය දුශ්චරිතාදී පව් කිරීමට බියක් නොමැතිකම තැතිගැන්මක් නොමැතිකම අනොත්තප්පය යි. පලගැටියා ගින්නට බියක් නොදක්වන්නාක් මෙන් මෙම චෛතසිකය නිසා පව් කිරීමට බියක් නොදක්වයි. මෙම සිත ද දොළොස් අකුසල සිත්වල යෙදේ.

### 4. උද්ධච්ච

උද්ධතස්ස භාවො උද්ධච්චං, තං චිත්තස්ස අවූපසම ලක්ඛණං

සිතෙහි නොසන්සුන් භාවය උද්ධච්චය යි. අළුගොඩකට ගලකින් ගැසූ කල මෙන් ද සුළඟින් සෙලවෙන ධජයක් මෙන් ද උද්ධච්චයෙන් යුතු සිත නිතර චංචල ව විසිරී පවතී. සිතෙහි තැන්පත් ස්වභාවය නැතිවන්නේ මෙම චෛතසිකයෙනි. මෙය ද දොළොස් අකුසල සිත්වල යෙදේ.

### 5. ලෝභ

ලුබ්භතීති ලොභො, සො ආරම්මණෙ අභිනිවෙස ලක්ඛණො

ආශාව, ඇලීම, ගිජුකම ලෝභය යි. අරමුණෙහි ඇලෙන බැඳෙන ස්වභාවය ලෝභය යි. අළුත් වස්ත්‍රයක දැලි, තෙල් ආදිය ඉක්මනින් ඇලෙන්නාක් මෙන් සිතෙහි ලෝභ චෛතසිකය අරමුණෙහි සිත අලවන්නේ ය. මෙය ලෝභ මූලික සිත් අටෙහි පමණක් යෙදේ.

### 6. දිට්ඨි

ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති මිච්ඡාභිනිවෙස ලක්ඛණා දිට්ඨි

තමා පිළිගත් දෙය ම සත්‍ය ය අන් දේ අසත්‍ය ය. යනුවෙන් අරමුණ වරදවා දකින ස්වභාවය දිට්ඨිය යි. වැරදි නිගමනවලට බැසීම යි. මිරිඟුව ජලය සේ පෙනෙන්නාක් මෙන් දිට්ඨිය සිත නොමග යව යි. මෙම චෛතසිකය ලෝභ මූලික දිට්ඨිගත සම්පයුක්ත සිත් සතරෙහි පමණක් යෙදේ.

### 7. මාන

සෙය්‍යොහමස්මීත්‍යාදිනා මඤ්ඤතීති මානො

මාන යනු මැනීම යි. අනුන් හා තමා සංසන්දනය කරමින් මැනීම යි. ''මම උසස්මි'' යනාදී වශයෙන් මැනීම හෙවත් සිතෙහි උඩඟු ස්වභාවය යි. මෙම මානය සෙය්‍යමාන (තමා

උසස් ය), සදිසමාන (තමා සමාන ය) හීනමාන (තමා පහත් ය) යනුවෙන් තෙයාකාර ය. මෙම චෛතසිකය දොළොස් අකුසල් සිත් අතරෙින් දිට්ඨිගතවිප්පයුත්ත සිත් සතරෙහි පමණක් යෙදේ.

### 8. දෝසො

දුස්සතීති දොසො. සො චණ්ඩික්ක ලක්ඛණො, පහටාසිවිසො විය

සිත දූෂණය කරවන්නේ ද්වේශය යි. දණ්ඩෙන් පහර කෑ නයෙකු මෙන් අනිටු අරමුණෙහි කෝපවන, සැඩපරුෂ වන ලක්‍ෂණය ද්වේශය යි. ක්‍රෝධය, තරහ, කේන්තිය යනාදී වචනවලින් හැඳින්වෙන්නේ ද මෙය යි. මෙය ද අකුසල චෛතසිකයකි. දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සිත් දෙකෙහි පමණක් මෙය යෙදේ.

### 9. ඉස්සා

ඉස්සතීති ඉස්සා. පරසම්පත්තිං උසූයනලක්ඛණා

අනුන්ගේ සම්පත් නො ඉවසන ස්වභාවය යි. අනුන්ගේ සැපතට ඊර්ෂ්‍යා කරන ස්වභාවය යි. මෙය ද අකුසල චෛතසිකයකි.

### 10. මච්ඡරිය

අත්තනො සම්පත්තිං නිගුහනලක්ඛණං

මච්ඡරිය නම් මසුරුකම යි. තමාගේ සම්පත් සඟවන ස්වභාවය යි. මෙය ලෝභයට වඩා බලවත් ය. අනුන්ට තම සම්පත් දෙනවා තබා දකිනවාට වත් කැමති නැති ස්වභාවය යි. මසුරුකම ඇත්තා තමන් භුක්ති විඳින්නේත් නැත. අනුන්ට විඳින්නට දෙන්නේත් නැත.

### 11. කුක්කුච්ච

කතාකත දුච්චරිත සුචරිතානුසොචනලක්ඛණං

විපිළිසර බව යි. කළ දුසිරිත් සහ නොකළ සුසිරිත් පිළිබඳ පසුතැවෙන බව යි. මෙය උද්ධච්චය හා සමව යන්නකි. මේ දෙක එක්ව නීවරණයක් වශයෙන් කුසල් සිත ආවරණය කරයි. ඉහත දැක්වූ දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන චෛතසික දෝස මූලික පටිඝසම්පයුත්ත සිත් දෙකෙහි පමණක් යෙදේ. අන් තැන නොයෙදේ.

## 12. ථීන

**අනුසඝාහනාව සංසිදන වසෙන සංගතභාවො**

සිතෙහි දුබල බව චිත්ත වේගයේ හීන බව, මැළි බව, පසුබස්නා ස්වභාවය, සිතෙහි ඇතිවන අලස බව ථීන නම් වේ.

## 13. මිද්ධ

**විගත සාමත්ථියතා, ආසත්ති විසාතො වා**

චෛතසිකයන්ගේ අලස බව මින් අදහස් කෙරේ. මෙයින් සිත හැකිළේ. උත්සාහය හීන වේ. සමහරවිට නිදිමත ඇති වේ. අභිධර්මයේ දී ථීන හා මිද්ධ දෙක චෛතසික දෙකක් ලෙස වෙන වෙන ම යෙදුණ ද, සූත්‍ර ධර්මවල දී ථීන හා මිද්ධය එකක් ලෙස එනම් ථීනමිද්ධ නීවරණය ලෙස විග්‍රහ වේ.

## 14. විචිකිච්ඡා

**සභාවං විචිනනෙතා තාය කිචඡති කිලමතීති විචිකිචඡා**

විචිකිච්ඡා නම් සැකය යි. ඕනෑම දෙයක ස්වභාවය නියම තත්ත්වය නිගමනය කරගත නොහැකිව කුතුහලයෙන් සොය සොයා විමසීමයි. මෙම චෛතසිකය උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුක්ත සිතෙහි පමණක් යෙදේ. මෙය ශ්‍රද්ධාවට හා ඥානයට විරුද්ධ චෛතසිකයකි.

**අභ්‍යාස**

01. අකුසල චෛතසික කීය ද? ඒ මොනවා ද? මතකයෙන් ලියන්න.
02. අකුසල් චෛතසිකවලින් යුත් සිතක ස්වභාවය පැහැදිලි කරන්න.

16
පාඩම

# හොඳ සිතුවිලි

## සෝභන රාශිය - චෛතසික 25

සෝභන රාශියට අයත් කුසල චෛතසික විසි පහකි. ඒවා ප්‍රධාන කොටස් හතරක් යටතේ වර්ග කොට ඇත.

1. සෝභන සාධාරණ චෛතසික 19 යි
2. විරති චෛතසික 03 යි
3. අප්පමඤ්ඤා චෛතසික 02 යි
4. පඤ්ඤා චෛතසික 01 යි

යනුවෙනි.

### 1. සෝභන සාධාරණ චෛතසික - 19

අකුසල් සිත් දොළොස (12) ය, අහේතුක සිත් අටළොස (18) ය යන අකුසල් හා කුසල් හෝ අකුසල් නොවන සිත් හැර ඉතිරි සෝභන සිත්වල යෙදෙන කුසල චෛතසික සෝභන සාධාරණ නම් වේ. එම චෛතසික සියල්ල දහනවයකි.

1. සද්ධා
2. සති
3. හිරි
4. ඔත්තප්ප
5. අලෝභ
6. අදෝස
7. තත්‍රමජ්ඣත්තතා
8. කායපස්සද්ධි
9. චිත්තපස්සද්ධි
10. කායලහුතා
11. චිත්තලහුතා
12. කායමුදුතා
13. චිත්තමුදුතා
14. කායකම්මඤ්ඤතා
15. චිත්තකම්මඤ්ඤතා
16. කායපාගුඤ්ඤතා
17. චිත්තපාගුඤ්ඤතා
18. කායුජ්ජුකතා
19. චිත්තුජ්ජුකතා

#### 1. සද්ධා

සද්දහතීති - සද්ධා සා, සම්පයුත්තානං ධම්මානං පසාද ලක්ඛණා

බුද්ධාදී තුනුරුවන් කෙරෙහි විශ්වාසය, පිළිගන්නා ස්වභාවය ශ්‍රද්ධාව යි. ඇදහීම, විශ්වාසය, පැහැදීම යන වචනයන්ගෙන් ද ශ්‍රද්ධාව හැඳින්විය හැකි ය. සම්ප්‍රසාදන ශ්‍රද්ධාව හෙවත් චිත්ත චෛතසිකයන් පැහැදවීම හා සම්පක්ඛන්දන ශ්‍රද්ධාව හෙවත් කුසල චෛතසිකයන්ට පෙරටුව ගමන් කරන ශ්‍රද්ධාව යනුවෙන් මෙය දෙයාකාර ය. අකුසල චෛතසික නිසා සිතේ ඇතිවන අප්‍රසන්න ස්වභාවය ශ්‍රද්ධාවෙන් නැතිවී යයි. තුනුරුවන් කෙරෙහිත් කර්මය, කර්මඵල කෙරෙහිත් විශ්වාසයක් ඇති වේ. ශ්‍රද්ධාව ඇතිවිට බුදුන් වඳිති. දන්දෙති. පින්කම් කරති. ශ්‍රද්ධාව නැතිවිට මේවා කිරීමට මැළිවෙති.

**2. සති**

**සරණං සති අසම්මොහො**

සිහි කිරීම සතිය යි. සිතට නිරායාසයෙන් ඇතුළුවන අකුසල ධර්ම වෙනුවට කුසල ධර්ම සිහිපත් කරවීම සතියේ කාර්යය යි. අපිලාපන හෙවත් කුසල් මේවා යැයි සිහිපත් කරවීම හා උපගණ්හන හෙවත් කුසලාකුසල දෙක ම දැන එයින් කුසල් ඉදිරිපත් කිරීම යනාදී වශයෙන් මෙය දෙයාකාර ය.

**3. හිරි**

**හිරීයති කාය දුච්චරිතාදීහි ජිගුච්ඡතීති හිරි**

වරදෙහි ලජ්ජාවන කුල කාන්තාවක මෙන් කාය දුශ්චරිතාදී පාපයන්ට ඇති ලජ්ජා සහගත බව යි. සත්පුරුෂයෝ අකුසල් කිරීමට ලජ්ජාවෙති. ජීවිතයේ සාමාන්‍යයෙන් ඇතිවන ලජ්ජා සහගත බව ද හිරි නමින් ගැනෙන අතර මෙහි දී විශේෂයෙන් අකුසල් කිරීමට ඇති ලජ්ජාව ගැනේ.

**4. ඔත්තප්ප**

**ඔත්තප්පතීති ඔත්තප්පං. පාපතො උත්තාසලක්ඛණං**

පාපයට බියවන තැතිගන්නා ස්වභාවයයි. හිරි සහ ඔත්තප්ප දෙක ඇතිවිට පාපයෙන් වළකින හෙයින් ලොව පාලනය කරන ධර්මතා දෙකක් ලෙස සැලකේ. කරුණු සතරක් පදනම් කරගෙන බිය ඇති වේ.

1. අත්තානුවාද භය (තමාට තමාම දොස් නගතී'යි බිය)
2. පරානුවාද භය (අනුන් තමාට දොස් නගතී'යි බිය)
3. දණ්ඩ භය (දඬුවමට බිය)
4. දුග්ගති භය (දුගතියට බිය)

යනු ඒ බිය සතර යි. මෙම කරුණු සතර නිසා ලොව මිනිස්සු නරකින් වැළකෙති.

**5. අලෝභ**

**ලොභ පටිපක්ඛො අලොභො. ආරම්මණෙ චිත්තස්ස අලග්ගතාලක්ඛණො**

අරමුණෙහි නොඇලෙන ස්වභාවය අලෝභය යි. පියුම් පතෙහි ජලය නොඇලෙන්නාක් මෙනි. ලෝභයට විරුද්ධ වූ බලවත් කුසල මූලයකි.

**6. අදෝස**

**දොස පටිපක්ඛො අදොසො, අචණ්ඩික්ක ලක්ඛණො**

ද්වේශයට විරුද්ධ වූයේ අදෝසය යි. නො කිපෙන ගතියයි. මෛත්‍රීය යැයි පවසනුයේ ද අදෝසය යි. මෙය ද බලවත් කුසල මූලයකි. අලෝභයෙන් දානය වර්ධනය වේ. අද්වේශයෙන් සීලය වර්ධනය වේ.

## 7. තත්‍රමජ්ඣත්තතා

තෙසු තෙසු ධම්මෙසු මජ්ඣත්තතා තත්‍ර මජ්ඣත්තතා

සිතට දැනෙන ඒ ඒ අරමුණෙහි ඇලීමක් හෝ ගැටීමක් හෝ නැතිව චිත්ත චෛතසික සමව පවත්වාගෙන යාම, මධ්‍යස්ථව පැවැත්වීම මේ නමින් හැඳින් වේ. රාග ද්වේශ ආවේග බලවත්වූ විට හොඳ නරක තැන නොතැන නොපෙනේ. එබඳු සෙසු චෛතසික පාලනය කොට සමව පවත්වන්නේ තත්‍රමජ්ඣත්තතාවයි.

## 8. කායපස්සද්ධි

කායස්ස පස්සම්භනං කාය පස්සද්ධි (කාය චිත්ත දරථ වූපසමලක්ඛණා)

මෙහි කාය යනු පඤ්චස්කන්ධයෙන් වේදනා, සඤ්ඤා, සංඛාර යන ස්කන්ධත්‍රය යි. එම ස්කන්ධත්‍රයේ සංසිඳීම කායපස්සද්ධි නමි. එනම් චෛතසිකයන්ගේ සන්සුන් බවයි. අකුසලයේ දී උද්ධච්චයෙන් නොසංසුන් වන චෛතසික කායපස්සද්ධියෙන් කුසල පක්‍ෂයේ දී සංසිඳුව යි.

## 9. චිත්තපස්සද්ධි

චිත්තස්ස පස්සම්භනං චිත්ත පස්සද්ධි

දිව ආ කෙනෙක් හති ඇර නිසොල්මන් වන්නා සේ විඤ්ඤානස්ඛන්ධයේ හෙවත් සිතෙහි සන්සිඳුණු බව චිත්ත පස්සද්ධි නම් වේ. සිත කළඹන උද්ධච්චාදී ක්ලේශයන්ට විරුද්ධව ක්‍රියා කරයි. මෙය වැඩි දියුණු කොට මාර්ග අංගයක් වශයෙන් වඩන කල්හි පස්සද්ධි සම්බොජ්ඣංගය ලෙස හැඳින් වේ. මෙම කාය සහ චිත්ත පස්සද්ධි දෙකෙන් සුළඟෙන් සැලෙන පරඬැල් වැනි චිත්ත චෛතසිකයන්ගේ කලබලය සංසිඳුවයි.

## 10. කායලහුතා

කායස්ස ලහුභාවො කායලහුතා (කායචිත්ත ගරුභාව වූපසම ලක්ඛණා)

චෛතසිකයන්ගේ සැහැල්ලු බව කායලහුතා නම් වේ. අකුසල සිතේ දී ඇතිවන මිද්ධ නම් චෛතසිකය සිත බර කරයි. ඒ බර ගතිය මැඩ පවත්වා කුසලයේදී සිත සැහැල්ලු කරන්නේ මෙම කායලහුතාව යි.

## 11. චිත්තලහුතා

චිත්තස්ස ලහුභාවො චිත්තලහුතා

සිතේ සැහැල්ලු බව චිත්තලහුතා නම් වේ. අකුසලයේදී ථීන නම් චෛතසිකයෙන් ඇති කරන සිතේ බර ගතිය නැති කරයි. සිත සැහැල්ලු කරයි. මිද්ධයට එරෙහි චෛතසිකය කාය ලහුතාවයි. ථීනයට එරෙහි චෛතසිකය චිත්ත ලහුතාවයි.

## 12. කායමුදුතා

**කායසසස මුදු භාවො කායමුදුතා**

චෛතසිකයන්ගේ මෘදු බව, මොලොක් බව කායමුදුතා නම් වේ. අකුසලයේදී දිට්ඨියෙන් හා මානයෙන් සිතේ ඇතිවන තද බව රළු, නොනැමෙන බව කුසල සිතේ දී මැඩපවත්වා චෛතසික මෘදු බවට පත් කරන්නේ මේ චෛතසිකය යි. නොනැමෙන හිතුවක්කාරකම ඇතිවන්නේ දිට්ඨිය හා මානය නිසාය. කාය මුදුතාවෙන් ඒ ගතිය දුරු කරයි.

## 13. චිත්තමුදුතා

**චිත්තසස මුදු භාවො චිත්තමුදුතා**

දිට්ඨි, මාන නිසා සිතේ ඇතිවන තද බව රළු බව මැඩලා සිත මෘදු බවට පත් කෙරෙන්නේ චිත්තමුදුතාවයි. මෙම මුදුතාව නිසා සිත කුසලයට නැමෙන සුලු මොලොක් බවට පත් වේ.

## 14. කායකම්මඤ්ඤතා

**කායසස කමමඤ්ඤතා කාය කමමඤ්ඤතා**

කුසල චෛතසිකයන් කුසල කර්මයෙහි කඩිසරව යෙදෙන ස්වභාවය යි. පංච නීවරණ ධර්මවලින් ආවරණය වූ සිත අකුසලයට ම මිස කුසලයට උද්යෝගවත් නොවෙයි. එම නීවරණ යටපත් කරමින්, මැඩලමින් චෛතසික කුසලයෙහි ක්‍රියාශීලීව යෙදෙන තත්ත්වයට පත් කරන්නේ කායකම්මඤ්ඤතාව යි.

## 15. චිත්තකම්මඤ්ඤතා

**චිත්තසස කමමඤ්ඤතා චිත්ත කමමඤ්ඤතා**

සිත කුසල කර්මයන්ට උද්යෝගී වන පරිදි ක්‍රියාශීලී භාවයට පත් කරන්නේ චිත්ත කම්මඤ්ඤතාව යි.

## 16. කාය පාගුඤ්ඤතා

**කායසස පාගුඤ්ඤතා කාය පාගුඤ්ඤතා**

චෛතසිකයන්ගේ ගිලන් බව දුරුකර ප්‍රගුණ භාවයට, නිපුණ භාවයට පත් කරන්නේ කාය පාගුඤ්ඤතාව යි. අශ්‍රද්ධාව, මුට්ඨස්සතිය, අහිරිකය, අනොත්තප්පය, ආදී අකුසල චෛතසික නිසා චෛතසික වීර්ය සම්පන්නව ක්‍රියා කළ නොහැකි ගිලන් බවට පත්වෙයි. එම අකුසල චෛතසික මැඩලා චෛතසික ධර්ම නීරෝග කරවීම, කාර්යශූර කරවීම මෙයින් අදහස් කෙරේ.

## 17. චිත්තපාගුඤ්ඤතා

චිත්තස්ස පාගුඤ්ඤතා චිත්ත පාගුඤ්ඤතා

අශ්‍රද්ධා ආදී අකුසල චෛතසික නිසා සිතේ ඇතිවන ගිලන් බව දුරුකොට සිත ප්‍රගුණ කරන්නේ, දක්ෂ කරන්නේ චිත්තපාගුඤ්ඤතාව යි. කුසල් කිරීමට පසුනොබා සිත පෙරමුණට ගැනීමට මුල්වන්නේ මේ ප්‍රගුණ බව යි.

## 18. කායුජ්ජුකතා

කායස්ස උජුභාවො කායුජ්ජුකතා

කුසල චෛතසිකයන්ගේ අවංක බව, ඍජු බව හෙවත් ඇද නැති බව කායුජ්ජුකතා නම් වේ. මායා (කළ වරද සැඟවීම) සාඨෙය්‍ය (නැති ගුණ පෙන්වීම) යන ධර්මයන්ගෙන් සෙසු චෛතසිකත් වංක වෙයි. මේ චෛතසිකයෙන් ඒවා මැඩ චෛතසික ඍජු බවට පත් කෙරේ. වැරදිඅතට සහාය වන චෛතසික වෙනුවට හොඳ අතට සහාය වන චෛතසික පෙරට ගන්නේ කායුජ්ජුකතාව යි.

## 19. චිත්තුජ්ජුකතා

චිත්තස්ස උජුකභාවො චිත්තුජ්ජුකතා

මායා, සාඨෙය්‍ය යන වංක කරවන චෛතසික ධර්ම මැඩලා සිත අවංක වීම, ඍජු වීම චිත්තුජ්ජුකතා නම් වේ. අවංකව එකසිතින් ම කුසලයෙහි යෙදෙන්නේ චිත්තුජ්ජුකතාවෙනි.

චිත්ත චෛතසික එකවර පහළවන්නේ නම් මෙහි අවසන් කුසල චෛතසික දොළස කාය චිත්ත වශයෙන් දෙයාකාරයකින් දක්වූයේ ඇයි? අත්පොළසන් දීමට අත් දෙක ම එක්කළ යුතු වුවත් එක් අතක අනෙක් අත ගැටීමෙන් පමණක් කරන අත්පොළසන් දීමක් ද ඇත. එය අලස අත්පොළසමකි. එසේම චිත්ත චෛතසික එකවර පහළ වුවත් එකක් අනික තරම් ක්‍රියාශීලි නොවීමේ ස්වභාවයක් ඇත. එයින් කුසල සිත වුවද නියම ලෙස සක්‍රිය නොවේ. අලස වේ. සාර්ථක කුසල සිතක් වන්නේ චිත්ත චෛතසික දෙක ම එකසේ සක්‍රිය වූ විට ය. මෙහි විස්මය නම් චෛතසික සක්‍රිය කරවන්නේත් චෛතසිකයකිනි. සිත සක්‍රිය කරවන්නේත් චෛතසිකයකිනි.

ඉහත දැක් වූ චෛතසික දහනවය විශේෂයක් නැතිව සියලු ම සෝභන සිත්වල යෙදෙන බැවින් සෝභන සාධාරණ නම් වේ.

## 2. අසාධාරණ ශෝභන චෛතසික 6

විරති චෛතසික තුනත් අප්පමඤ්ඤා චෛතසික දෙකකත් පඤ්ඤා චෛතසිකයත් සමගින් ශෝභන අසාධාරණ චෛතසික සියල්ල සයකි. මේවා සියලු ශෝභන සිත්වල සාධාරණව නොයෙදෙන නිසා මේ නමින් හැඳින් වේ.

- විරති චෛතසික 03 යි
- අප්පමඤ්ඤා චෛතසික 02 යි
- පඤ්ඤා චෛතසික 01 යි

## 2. විරති චෛතසික - 3

විරති නම් වැළකීම යි. කාය දුශ්චරිතයෙන් හා වාක් දුශ්චරිතයෙන් වැළකීම මෙයින් අදහස් වේ. ඒ අනුව විරති චෛතසික තුනකි.

**සම්මාවාචා**

සම්මා වදන්ති එතායාති සම්මාවාචා. වචී දුච්චරිත විරති

යහපත් කථාවෙන් යුක්ත වීම සම්මාවාචා නම් වේ. එනම්, වාග් දුශ්චරිතයෙන් වැළකීම යි. වචනයෙන් සිදුවන දුසිරිත් සතරකි. එනම් බොරුකීම, කේලාම් කීම, එරුෂ වචන කීම හා හිස්වචන කීම යි.

**සම්මාකම්මන්ත**

සම්මා පවත්තෙතා කම්මන්තො. සම්මා කම්මන්තො. කාය දුච්චරිත විරති.

කාය දුශ්චරිතයෙන් වැළකී යහපත් ක්‍රියාවෙන් යුක්තවීම සම්මා කම්මන්තය යි. කයින් සිදුවන අකුසල තුනකි. සතුන් මැරීම. සොරකම් කිරීම. කාම මිථ්‍යාචාරය යනු ඒ අකුසල් තුනයි.

**සම්මාආජීව**

සම්මා ආජීවන්ති එතෙනාති සම්මා ආජීවො, මිච්ඡාජීව විරති

සම්මාආජීව යනු යහපත් දිවි පැවැත්ම යි. ඉහත කී ප්‍රාණඝාත ආදී දුසිරිත් හත ජීවත් වීම සඳහාවත් නොකිරීම සම්මාආජීවයයි. ඒ හැරුණුවිට ජීවිකාව සඳහා අනුන් රැවටීම, කපටිකම, වංචාව, නැතිගුණ පෙන්වීම ආදී දේ නොකිරීම ද සම්මාආජීවයයි. දීඝ නිකායේ සීලක්ඛන්ධ වග්ගයේ සූත්‍රවල ඒ ගැන දීර්ඝ විස්තරයක් ඇත.

## 3. අප්පමඤ්ඤා චෛතසික - 2

ලොව අප්‍රමාණ වූ සත්ත්වයන් අරමුණු කොට පහළ වන චෛතසික අප්පමඤ්ඤා නම් වේ. බ්‍රහ්මවිහාර නමින් ද හැඳින්වෙන මෙම චෛතසික සතරකි. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනුවෙනි. එයින් අදෝස චෛතසිකයෙන් මෙත්තාවත්, තත්‍රමජ්ඣත්තතා යන චෛතසිකයෙන් උපෙක්ෂාවත් කලින් දක්වා ඇත. මෙහි දී කරුණා සහ මුදිතා යන දෙක විස්තර කෙරේ.

1. කරුණා

පරදුක්ඛෙ සති සාධූනං හදය කම්පනං කරොතීති කරුණා. සා පරදුක්ඛාපනයන කාමතා ලක්ඛණා

අනුන්ගේ දුකෙහි දී සත්පුරුෂයන්ගේ හදවතේ අතිවන අනුකම්පාව කරුණාව යි. තමා දුකින් මිදීමට කැමැත්තක් දක්වන්නා සේ ම අනුන් ද දුකින් මුදවාලීමේ කැමැත්ත එහි විශේෂත්වය යි.

2. මුදිතා

මොදන්ති එතායාති මුදිතා සා පරසම්පත්ති අනුමොදන ලක්ඛණා

තමන්ට යම් සම්පත්තියක් ලැබුණහොත් සතුටුවන්නාක් මෙන් අනුන්ට ලැබෙන සැප දැක සතුටු වීම මුදිතාව යි. අනුන්ගේ සම්පත් දැක බොහෝ දෙනා ඊර්ෂ්‍යා උපදවත්. එයට විරුද්ධ වූයේ මුදිතාව යි.

## 4. පඤ්ඤා චෛතසික 1 යි

පකාරෙන ජානාති, අනිච්චාදි වසෙන අවබුජ්ඣතීති පඤ්ඤා

මෝහයෙන් මිදී අමෝහය හෙවත් ප්‍රඥාව ඇතිකර ගනී. විද්‍යාව යනු ද මෙයට නමකි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් අරමුණ අවබෝධ කරගනී යන අර්ථයෙන් පඤ්ඤා නම් වේ. මෙය බලවත් කුසල ධර්මයකි. සඤ්ඤා, විඤ්ඤාණ සහ පඤ්ඤා යන චෛතසික තුන සමාන ලෙස පෙනුණ ද මෙහි විෂමතාවක් ඇත. ගැහැණු මිනිසුන් හෝ සත්ත්ව, ද්‍රව්‍ය, වෘක්ෂලතා නමින් හැඩයෙන් හඳුනාගැනීම සඤ්ඤාව යි. දරුවෙකු රන් කාසියක් හඳුනාගැනීම වැනි ය. විඤ්ඤාණය වර්ණ වශයෙන්, ජාති වශයෙන් හෝ වෙනත් විශේෂ ලක්ෂණ වශයෙන් හඳුනාගනී. ගැමියෙකු රන් කාසිය හඳුනාගන්නාක් මෙනි. පඤ්ඤා යනු අරමුණෙහි නියම තත්ත්වය මනාව හඳුනා ගැනීම යි. රන්කරුවෙකු රන් කාසියක් හඳුනාගැනීම වැනි ය.

**සැලකිය යුතු යි. :-** මෙහි එන පාලි පාඨ ආදිය අභිධම්මත්ථවිභාවිනී නම් අභිධම්මත්ථ සංගහ ටීකාවෙන් උපුටාගත් බව සලකන්න.

**අභ්‍යාස**

01. ශෝභන රාශියට අයත් චෛතසික 25 මොනවා ද? මතකයෙන් කියන්න.
02. "කුසල් කිරීමට චෛතසිකවල උපකාරී බව" සනාථ කිරීමට ඔබ කැමති චෛතසික උපයෝගී කරගනිමින් විස්තරයක් කරන්න.

17
පාඩම

# අනුවණයා හා අසත්පුරුෂයා

## (බාල වගගය)

**ධම්මපදය** වනාහි ත්‍රිපිටකයෙහි සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ 15 අතරින් දෙවැන්න යි. ධම්මපද යන නාමයෙන් ම කියවෙන පරිදි මෙහි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර වදාළ ඒ සා විශාල මහා ධර්මස්කන්ධයේ සාරය ගාථා වශයෙන් කැටිකොට ධර්මපද වශයෙන් ගෙන හැර දැක්වේ. සූත්‍ර, විනය, අභිධර්මය යන ත්‍රිපිටකයෙහි ම පැවසෙන ධර්ම, විනය කරුණු මෙහි දී සංක්ෂිප්තව උපමා රූපක අලංකාර මගින් ඉතා රසවත් ව සංග්‍රහ වේ.

බුදුදහමට ප්‍රවේශ වන කෙනෙකුට එහි ධර්ම විනය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ඇතිකර ගැනීමට මෙම එක ම ධමමපදය පමණක් වුව ද ප්‍රමාණවත් ය. මුළු ත්‍රිපිටකය ම ග්‍රන්ථ වශයෙන් 31කි. එනම්, සූත්‍ර පිටකයේ ග්‍රන්ථ 19කි. විනය පිටකයේ ග්‍රන්ථ 05කි. අභිධර්ම පිටකයේ ග්‍රන්ථ 07කි. මේ ග්‍රන්ථ 31 අතරින් සමස්ත ධර්ම විනය පිළිබඳ කරුණු කැටි කොටගත් එක ම ග්‍රන්ථය ධම්මපදය යි. උදාහරණ ලෙස ''මනෝපුබ්බංගමා ධම්මා'' ආදී ගාථා දෙකත්, චිත්ත වග්ගයත්, අභිධර්මයේ චිත්ත කාණ්ඩයට පෙරවදනක් වැනි ය. ''කායෙන සංවරෝ සාධු'' ආදී ගාථාවන් වැනි විනය පිළිබඳ ව උපදෙස් දෙන දහම්පද රාශියකි. මෙම ධම්මපදයේ ඇතුළත් ''දුක්ඛං දුක්ඛසමුප්පාදං'' වැනි ගාථාවලින් චතුරාර්ය සත්‍යය ද 'ඉධ තප්පති' වැනි ගාථාවලින් කර්මය ද යනාදී වශයෙන් මෙහි එන දහම්පද රාශියකින් වැඩි කොටසක් සූත්‍ර පිටකයේ එන කරුණු සංක්ෂිප්ත කොට දක්වා ඇත. බුදු කෙනෙකු ලොව පහළ වී පවත්වන අනුශාසනාව හෙවත් දෙන පණිවුඩය දක්වෙන ''සබ්බ පාපස්ස අකරණං'' ආදී ගාථා දෙක පමණක් ම ධම්මපදය, ත්‍රිපිටකය තුළ කෙබඳු ග්‍රන්ථයක් ද යන්න අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් ය. මේ අනුව තුන් පිටකයට ම පෙරවදනක් වැනි වූ ධමමපදය බුදු සසුනේ ප්‍රවේශ ග්‍රන්ථය ලෙස ද සැලකිය හැකි ය. බෞද්ධයාගේ අත්පොත යන විරුදාවලිය මෙම ග්‍රන්ථයට ලැබී ඇත්තේ එබැවිනි.

ගැඹුරු දහම් කරුණු ගාථාවකට නගා තිබීමෙන් මතක තබා ගැනීමට පහසුවක් වන අතර එමගින් ඒවා හස්තසාර උපදේශ වශයෙන් අවශ්‍ය තැන දී උපයෝගී කරගැනීමට බෞද්ධයෝ හුරුපුරුදු වී සිටිති. ඒ ඒ දහම් කරුණු ජන ජීවිතයට හුරු පුරුදු උපමාවන්ගෙන් තහවුරු කරනවා සේ ම ධම්මපද අටුවාවේ එන කථා මගින් ඒවා ප්‍රායෝගික ජීවිතයට අදාළ වන ආකාරයෙන් සජීවීව ප්‍රත්‍යක්ෂ කර දෙනු ලැබේ. මේ නිසා මෙම ග්‍රන්ථය ධර්මදේශකයන් අතර ද වඩාත් ජනප්‍රිය හස්තසාර ග්‍රන්ථයක් බවට පත්ව තිබේ.

### බාල වගගය

බාලයෙකුගේ ලක්ෂණ තුනක් පිළිබඳ අංගුත්තර නිකායයේ තික නිපාතයෙහි දක්වේ. එනම්, බාලයා **'දුච්චින්තිත චින්තී** - නරක සිතුවිලි සිතන්නෙකි. **දුබ්භාසිත භාසී** - නරක වචන කතා කරන්නෙකි, **දුක්කත කම්මකාරී** - නරක පවිටු ක්‍රියා කරන්නෙකි යනාදී වශයෙනි සත්තිස් බෝධිපාක්ෂික ධර්ම නොදන්නා ද බාලයෙකි. එවැනි

බාලයාට සංසාරය බොහෝ සෙයින් දිග ය. කුමක් මෙන් ද යත්? නොනිදන්නා හට තුන් යාමයක් පමණ වූ රාත්‍රිය දික්වන්නා සේ ය. මෙවැනි බාලයා සිතන්නේ තමාට වඩා දන්නා කෙනෙකු නැතැයි කියා ය. තමා සිතන හැම දේ ම හරිය, උගතා, පණ්ඩිතයා නම් තමා ම ය කියා ය. එසේ ම ධර්මය නොඅදහන්නා, ධර්මයට ගරු නොකරන්නා, ධර්මයෙහි නොහැසිරෙන්නා, කර්මඵල නොපිළිගන්නා, බුදුගුණ, දහම්ගුණ, සඟගුණ නොපිළිගන්නා, සීලයෙහි නොපිහිටන්නා. සිල් නොරකින්නා, අන්‍යයන් පහත හෙළා කතා කරන්නා ආදී බොහෝ කරුණුවලින් බාලයා, මෝඩයා, අඥානයා නම් කවරෙක් ද, ඔහුගේ ක්‍රියා කලාපය කෙබඳු දැයි හඳුනා ගත හැකි ය.

එවැනි වූ බාලයන් ඇසුරට යාමෙන් වැළකෙන ලෙසත් තම ඇසුරට සුදුසු පණ්ඩිතයෙකු නැතිනම් තනිව ම හුදකලාව විසීම සුදුසු බවත් ප්‍රතිඵල දායක බවත් මෙහිදී විස්තර කෙරේ. බාලයා ඇසුරු කරන පුද්ගලයා ද එබඳු ම කෙනෙකු බවට පත්විය හැකි ය. සීලයක් නොරකින පුද්ගලයා සමඟ ඇසුරට යාමෙන් ඇසුරට යන පුද්ගලයා ද එබඳු ම දුස්සීලයෙකු විය හැකි ය. මෙලොව වශයෙන් සමාජයේ ගැරහුම්වලටත් පරලොව වශයෙන් දුගතිගාමී වීමටත් බාලයාගේ ඇසුර හේතු විය හැකි ය.

මෙවැනි බොහෝ සදුපදේශ රාශියකින් ධම්මපදයේ බාල වග්ගය සමන්විත වෙයි. මෙම වග්ගය පරිශීලනය කිරීමෙන් ප්‍රායෝගිකව තම ජීවිතය සාර්ථක කැර ගැනීමටත් ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා, ධර්ම චින්තා ආදිය මගින් සාරවත් ව සරලව, සිත්ගන්නා සුළු අයුරින් ශ්‍රාවක ජනයාට ධර්ම රසය බෙදා දීමටත් හැකි වේ.

### 4.5.1.1 බාලයාගේ සසර ගමන දිගය

තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන සමයෙහි එක් සැණකෙළි දිනක පසේනදී කොසොල් රජතුමා සර්වාභරණයෙන් සැරසී ඉතා අලංකාරව සරසන ලද මංගල හස්තිරාජයා පිට නැඟී සහ පිරිවරින් වීථි සංචාරය කරයි. එක්තරා රූපවත් කාන්තාවක් මැදුරක ඉහළ මාලයේ කවුළුවකින් රජ පෙරහැර නරඹමින් සිටියා ය. රජුගේ නෙත එදෙසට යොමුවනවාත් සමඟ ම ඇය කවුළුවෙන් ඈත් වූවා ය. එහෙත් රජු ඇය දුටුවේය. දුටු ඇසිල්ලෙහි ම ඇය පිළිබඳ සිතක් පහළ විය. රජ වහා ම රාජ පුරුෂයෙකු යවා ඇය සස්වාමික බව දැනගත්තේ ය. එසේ දැනගත් රජතුමාට ඇය කෙරෙහි ඇති වූ බැඳීම කෙතරම් වී ද යත් ඇගේ ස්වාමියා මරා හෝ ඇය අත්පත් කරගනිමියි සිතිණ. පළමු කොට ඔහුට පණිවුඩ යවා මාළිගයට ගෙන්වා කඩුවක් හා පළිහක් දී රාජ පුරුෂයෙකු ලෙස පත්කර ගත්තේ ය. රජුගේ උපාය වූයේ එම පුරුෂයාගේ සුළු හෝ වරදක් සොයා මරා දැමීම ය. එහෙත් මේ කිසිවක් නොදත් ඒ අසරණයා මරණ බියෙන් සිය රාජකාරිය අකුරට ම ඉටු කළේ ය. ඔහුගේ අඩුවක් දෝෂයක් සොයාගත නොහැකි වූ තැන ඔහුට පහසුවෙන් ඉටු කළ නොහැකි රාජකාරියක් පැවරීමට රජු තීරණය කළේ ය. ඒ අනුව රජු මෙයින් යොදුන් සියයක් දුර ගියවිට විලක් හමු වේ. එහි ගොස් කුමුදු හා උපුල් මල් ද අරුණුවන් මැටි ද රැගෙන තමා ස්නානය කරන්නට පෙර පැමිණිය යුතු බවත් ද, එසේ නාවොත් මරණ දඬුවම දෙමියි ද නියෝග කළේ ය. ඒ පුරුෂයා වහා ම ගෙදරට ගොස් ලිප තබා තිබූ බත් සැලියෙන් කැඳ පෙරා නෙත බත් ද ව්‍යඤ්ජනයක් ද රැගෙන ගමන පිටත් වූයේ ය.

ඔහු, කුමුදු උපුල් මල් හා අරණුවන් මැටි නම් නාග ලෝකයෙහි ඇති ඒවා ය. මේවා මා කෙසේ නම් ලබා ගන්නේ දැයි සිතමින් මරණ භයෙන් තැතිගෙන යන අතරතුර යොදුනක් පමණ දුරක් ගොස් රැගෙන ආ බත්පත ලිහා නොයිඳුල්ව කොටසක් වෙන් කර ආහාර ගැනීමට සූදානම් වන අතර ඒ අසලින් යන මගියෙකු දැක මා නොඉඳුල්ව වෙන් කළ බත්පතේ කොටසක් ඇත. එය අනුභව කරනු මැනවැයි කීවේ ය. මගියා එය පිළිගෙන අනුභව කළේ ය. ඔහු බත් කා ටිකක් ඉතිරි කරගෙන එය ජලයට දමා කට සෝදාගෙන මහ හඬින් කියන්නේ මේ නදී ප්‍රදේශයෙහි අධිගෘහිත නාග සුපර්ණාදී දේවතාවෝ මෙය අසත්වා. රජු මට දඬුවම් දෙනු පිණිස කුමුදු උපුල්මල් හා අරුණුවන් මැටි ගෙන එවැයි නියෝග කළේ ය. මාගේ බත් පතෙන් මගියෙකුටත් දන් දුන්නෙමි. එය දහසක් ආනිශංස ය. මෙසේ මා ලැබූ ආනිශංස පින් ඔබට පවරා දෙමි. මට කුමුදු මල් හා අරුණුවන් මැටි ගෙනවුත් දෙන්නැ'යි තෙවරක් ම ඉල්ලා සිටියේ ය. එහි අධිගෘහිත නාරජු ඒ ශබ්දය අසා මහලු වේශයක් මවාගෙන පැමිණ කරුණු විමසා ඔහුගේ ඒ ඉල්ලීම ඉටුකර දීමට නම් තමාටත් පින්දෙන ලෙස කීය. හෙතෙම නාරජුට පින් අනුමෝදන් කළේ ය. නාරජු ද මෙසේ තුන්වරක් ම පින් ලබාගෙන කුමුදු මල් හා අරුණුවන් මැටි ඔහුට ගෙනවුත් දුන්නේ ය.

රජු කල්පනා කරන්නේ, මිනිස්සු නම් බොහෝ උපාය දන්නෝ ය. ඉදින් ඔහු කුමක් හෝ උපායකින් මේ දේවල් ලබා පැමිණියහොත් මාගේ බලාපොරොත්තු සුන් වී යන්නේ ය. මෙසේ සිතා කල් තියා ම දොරටු පාලයන්ට දන්වා වාසල් දොරටු වසවා යතුරු තමා ළඟට ගෙන්වා ගත්තේ ය. පුරුෂයා කුමුදු උපුල් මල් හා අරුණුවන් මැටි රැගෙන වේගයෙන් රජු ස්නානය කරන වේලාවට පෙර වාසල් දොර සමීපයට පැමිණියේ ය. පැමිණ රජතුමා බැහැ දැකීමට යාමට අවසර දෙන ලෙස දොරටු පාලයන්ගෙන් ඉල්ලා සිටියේ ය. රජු දොරගුලු දම්මවා යතුරු ගෙන්වාගත් හෙයින් පසුදා පහන්වන තුරු නැවත දොර විවර කළ නොහැකි බව ඔවුහු කීහ. හෙතෙම ද තමා ගෙන ආ කුමුදු උපුල් මල් හා අරණුවන් මැටි වාසල් දොර උළුවස්සෙහි එල්ලා තබා මහ හඬින් කියන්නේ පින්වත් නගරවාසීනි, මා රජුගේ ඉල්ලීම ඉටු කළෙමි, එහෙත් රාජ දූතයෝ දැන් දොරවල් නොඅරිති රජු මා නිකරුනේ මරා දැමීමට තැත් කරයි. යනුවෙන් තුන්වරක් ම කියා ඔහු විහාරයට ගොස් නිදා ගත්තේ ය.

රජතුමාට මුලු රැය ම නින්දක් නම් නොවී ය. ඔහු මුලු රැය ම ගත කළේ ඒ ස්ත්‍රිය කෙරෙහි කාම ගින්නෙන් දැවෙමිනි. රෑ පහන් වූ සැණින් ඒ පුරුෂයා මරවා ස්ත්‍රිය තමා වෙත කැන්දා ගන්නා ආකාරය සිතමිනි. මේ අතර ඉඳහිට රජතුමාගේ දෑස් පියවෙයි. එසැණින් ඔහු සිහිනෙන් බියකරු හඬක් ඇසී අවදි වෙයි. ඔහුට සිහිනෙන් ඇසුණේ කවුරුන් හෝ කෑ ගසා යමක් කියන්නට හදන බවකි. එක් අයෙක් 'දු' කියා කියන්නට පටන් ගැනීමත් සමග ම ඒ හඬ ගිලී ගියේ ය. මේ ආකාරයෙන් සතර දෙනෙකු දු.ස.න.සො යනුවෙන් තමා කෑ ගසා කියන්නට ගිය දෙය කීමට පෙර ගිලී යන බියකරු හඬ රජු බියපත් කළේ ය. කාම දාහයත් මේ බිහිසුණු රාවයත් නිසා එම රාත්‍රිය රජතුමාට නොනිදා ම පහන් වූ මහා බියකරු රාත්‍රියක් බවට පත්විය. පසු දා උදෑසන ම රජතුමා මල්ලිකා දේවියගේ උපදෙස් අනුව දෙව්රම් වෙහෙරේ වැඩ සිටි බුදුරදුන් වෙත ගොස් මේ බිහිසුණු හඬවල් පිළිබඳ ව උන් වහන්සේට දැන්වී ය. එපවත් ඇසූ බුදුරජාණන් වහන්සේ, මහරජ මෙයින් ඔබටත් ඔබේ රාජ්‍යයටත් වන හානියක් නැත. ඒ හඬනම් පෙර පරදාර සේවනාදී පවුකම් කරමින් සිට කළුරිය කොට අවීචි මහා නරකාදියේ උපන් යහළු සිටුවරු සතර දෙනෙකු ඒ ලෝකුඹු නිරයේ පැසෙමින් සිට උඩට මතු වූ අවස්ථාවක තමන් කළ පවු ගැන පාපොච්චාරණය කළ හඬයි. ඔවුන්, එතරම් ධනය තිබිය දී පිනක් දහමක් නොකොට සුරාවට, සූදුවට ධනය වැය කරමින් පරදාර සේවනය කරමින් ගත කළ පව්වු ජීවිතවල විපාකයයි අප මේ ගෙවන්නේ. මෙයින් මිදී පිනක දහමක

යෙදෙන්නේ කවදා දැයි කියාගන්නට සැරසෙන විට ම නැවත ඊළඟ නිරයෙහි ගිලී ගියහ. ඔබට දු.ස.න.සො යැයි ඇසුනේ ඒ සතර දෙනාගේ විලාපයේ පළමු අකුරු සතර යයි වදාළහ.

මේ ධර්ම දේශනාව ඇසූ රජුට මහත් සංවේගයක් ඇතිවිය. ඔහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ පැවසීය. ස්වාමීනි, පරස්ත්‍රී සේවනය නම් ඉතා බරපතල ය. එක් බුද්ධාන්තරයක් නිරයේ පැසී එයින් චුත වී. සැට යොදුනක් පමණ වූ ලෝකුඹු නිරයේ නැවත ඉපදී එහි වර්ෂ හැටදාහක් පැසී ගියත් ඔවුන් දුකින් මිදෙන කාලයක් නම් නැත. ස්වාමීනි, මමත් පරස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිතින් මුළු රෑ නිදි නොලැබුවෙමි. ගෙවුණු රාත්‍රිය ඉතා දිග බවක් වැටහුණි. මින්මතු පරදාරාවන් කෙරෙහි සිත් නොඅලවමි යි කීහ.

අරුණුවන් මැටි හා කුමුදු මානෙල් මල් සොයා ගිය පුරුෂයා ද ඒ මොහොතේ ඒතැනට පැමිණ ඒ කථාව අසා ස්වාමීනි, මහරජුට රාත්‍රිය එතරම් දිගයැයි දනුනා සේ ම මරබියෙන් කුමුදු, උපුල් මල් හා අරුණුවන් මැටි සොයා ගිය මමත් ඊයේ යොදුනක් කෙතරම් දිගදැයි දැනගත්තෙමි යි කීය. බුදුරජාණන් වහන්සේ දෙදෙනාගේ ම කථා සංසන්දනය කොට මෙම ගාථාව දේශනා කළ සේක.

**දීඝා ජාගරතො රත්ති - දීඝං සන්තස්ස යොජනං**
**දීඝො බාලානං සංසාරො -සද්ධම්මං අවිජානතං**

පදාර්ථ:-
**දීඝාජාගරතො රත්ති**, නිදිවරන්නාට රාත්‍රිය දිග ය; **දීඝං සන්තස්ස යොජනං**, ගමන් විඩාවෙන් පෙළෙන්නාට යොදුන දිගය; **සද්ධම්මං අවිජානතං**, සද්ධර්මය නොදන්නා; **බාලානං සංසාරො දීඝො**, අනුවණයන්ට සංසාරය දිග ය.

**විවරණය:-**
බියක්, තැතිගැනීමක් නිසා හෝ රෝගයක් නිසා හෝ නිදි නොලබන්නාට රාත්‍රිය ඉතා දිග වූවක් සේ වැටහේ. පා ගමනින් ගොස් වෙහෙස වූ මගියාට යොදුන, සැතපුම නැතහොත් කිලෝමීටරය පවා මහා දිග දුරක් සේ වැටහේ. එසේ ම අන්ධ පෘථග්ජනයාට සසර කෙළවර කරන සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පිළිබඳ දැනුමක් තබා ඒ ගැන අදහසක්වත් හිතාගත නොහැකි ය. මැරිමැරී 'ඉපද ඉපදී සසර දුකෙහි ගිලෙන ඔහුට සසර දිග ය.

යම් පුද්ගලයෙක් මෙලොව දියුණුවට හේතුවන කරුණු මොනවා ද යි දෙලොව දියුණුව ම දන්නේ ද ඔහුට පණ්ඩිතයා යැයි කියනු ලැබේ.

මෙසේ සසර දුක හැඳින මෙලොව පරලොව දෙලොව දියුණුව දකින පුද්ගලයා අවසානයේ දී සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වඩා සෝවාන් ආදී මාර්ගඵල පිළිවෙළින් සසර දුක කෙළවර කරන්නේ ය. එහෙයින් දෙලොව දියුණුව දන්නා පණ්ඩිතයාට සසර කෙටි ය.

**දිට්ඨෙව ධම්මෙ යො අත්ථො- යොචත්ථො සම්පරායිකො**
**අත්ථාභිසමයා ධීරො - පණ්ඩිතොති පවුච්චති**

## ධර්ම කරුණුඃ-

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම යනු චතුරාර්ය සත්‍ය ඥානය ලබා ගැනීමට උපකාරවන ධර්මයන් ය. ඒවා නම්, සතර සතිපට්ඨානය, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඉද්ධිපාද, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්චබල සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ටාංග මාර්ගය යන මේවා ය.

**සතර සතිපට්ඨාන ධර්ම** - කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා

**සතර සම්‍යක් ප්‍රධාන** - නූපන් අකුසල් නොඉපදවීම, උපන් අකුසල් දුරු කිරීම, නූපන් කුසල් ඉපද වීම, උපන් කුසල් වැඩි දියුණු කිරීම

**සතර ඍද්ධිපාද** - ඡන්ද, චිත්ත, විරිය, වීමංසා

**පංච ඉන්ද්‍රිය ධර්ම** - සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා

**පංච බල ධර්ම** - සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා

**සත්ත බොජ්ඣංග** - සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා

**ආර්ය අෂ්ටාංගික මාර්ග ධර්ම** -
සම්මා දිට්ඨි, සම්මා සංකප්ප - ප්‍රඥා
සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව - සීල
සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි - සමාධි

**සංසාරය**

| | |
|---|---|
| සංසාරය යනු | කාමලෝක |
| | රූපලෝක |
| | අරූපලෝක යන තුන් ලෝකයෙහි චුති පටිසන්ධි වශයෙන් ස්කන්ධ<br>ධාතු<br>ආයතනයන්ගේ පරපුරින් පරපුරට නොකැඩී නොසිඳී පැවැත්ම වේ |

ඛන්ධානං පටිපාටි - ධාතු ආයතනානි ච
අබ්බොච්ඡින්නං වත්තමානා - සංසාරොති පවුච්චති

## 4.5.1.2 අනුවණයන් ඇසුරට වඩා තනිව විසීම යෙහෙකි

සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන සේක. එකල මහා කාශ්‍යප මහරහතන් වහන්සේ රජගහනුවර පිප්ඵලී ගුහාවෙහි වැඩ වෙසෙති. උන්වහන්සේට සද්ධිවිහාරික උපස්ථායකයෝ දෙදෙනෙක් වූහ. ඉන් එක් නමක් ඉතා වත් සම්පන්න ය. උපාධ්‍යායයන් වහන්සේට වතාවත් ආදරයෙන් ඉටු කරයි. අනෙක් නම අලස ය. වත්පිළිවෙත් හරිහැටි ඉටු නොකරයි. එහෙත් අනෙක් නම කරන කියන වතාවත් තමා කළා සේ මහතෙරුන්ට අඟවයි. වත් සම්පන්න හිමියන් මහ තෙරුන්ට උණු පැන් පිළියෙල කළ විට අනෙක් නම එය නාන කුටියට ඔසවා ගෙන ගොස් තබා, ස්වාමීනී උණුපැන් සූදානම් යැයි මහතෙරුන්ට දන්වා තමා පිළියෙල කළ සේ මහ තෙරුන්ට අඟවයි.

මේ ක්‍රියාව නොඉවසූ වත් සම්පන්න භික්ෂූන් වහන්සේ මොහුට හොඳ පාඩමක් උගන්වමියි සිතා දිනක් උණුපැන් පිළියෙල කොට එය වෙනත් සැළියකට දමා සැළියේ උණු පැන් ස්වල්පයක් ඉතිරිකොට පසකට වී බලා සිටියේ ය. අලස භික්ෂුව ද වෙනදා මෙන් ම සැළිය දුම් දමනු දැක මහතෙරුන් වෙත ගොස්. ස්වාමීනි, උණු පැන් සූදානම් යැයි දන්වී ය. තෙරණුවෝ ද නානතොට වෙත පැමිණ උණුදිය නොදැක උණුපැන් කොහේදැයි එම භික්ෂුවගෙන් විමසූහ. උන්වහන්සේ ලිප තබා ඇති සැළියට හැන්ද දමා එය හිස් බව දැක අනෙක් භික්ෂුවට දොස් නඟමින් පැන් ගෙනෙන්නට තොටුපොළට ගියේ ය. වත් සම්පන්න භික්ෂුව සඟවා තැබූ තැනින් උණුපැන් ගෙනවුත් මහතෙරුන්ට ස්නානය කරන්නට දුන්හ. එවිට මහා කාශ්‍යප තෙරණුවෝ, එම අලස භික්ෂුවට තමා කළ දේ පමණක් කළ බව කියනු මිස අනුන් කළ දේ තමා කළ යයි සේ රැවටීම නොකළ යුතු යැයි අවවාද කළහ. එයින් එම භික්ෂුව කිපුණේ ය. එනිසා පසු දින උන්වහන්සේලා පිණ්ඩපාතයට වඩිනතුරු බලා සිට මහාකාශ්‍යප තෙරුන්ගේ උපස්ථායක ගෙදරකට ගියහ. නිවැසියන් මහතෙරුන් කොහි දැයි විමසූවිට උන්වහන්සේ අසනීපව වෙහෙරෙහි වැඩ සිටිතියි කීය. එයින් කම්පාවට පත් සැදැහැතියන් මහ තෙරුන්ට ගෙනගොස් දෙන්න යැයි පිළියෙල කරදුන් දානය තමා වැළඳී ය. පසුදින මේ කාරණය දායකයන්ගෙන් දැනගත් මහකසුප් තෙරණුවෝ මුවින් කියා ඉල්ලාගෙන වැළඳීම භික්ෂුවකට නොවටින්නේ යැයි අවවාද කළහ. එයින් ඒ භික්ෂුව වඩාත් කිපුණේ ය. පෙර දවසේ උණුවතුර ටිකක් නිසා තෙරණුවෝ මට දොස් කියූහයැයි ද අද උපස්ථාදායක කුලයකින් බත් මිටක් කෑ නිසා දොස් කියූහයැයි ද වෛර බැඳ ගත්තේ ය. පසු දින මම උන්වහන්සේට කරන දේ දනිමියි කියා තෙරුන් වහන්සේලා පිඬු පිණිස ගමට පිවිසි කල්හි ඔහු විහාරයේ රැඳී සිට දණ්ඩක් ගෙන ආවාසයේ තිබූ පාරිභෝගික භාණ්ඩ බිඳ දමා පන්සල ද ගිනි තබා පලා ගියේ ය. පසුව හෙතෙම මිය පරලොව ගොස් අවීචි මහා නරකයෙහි උපන්නේ ය. රජගහනුවර සිට බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට සැවැත් නුවරට පැමිණි භික්ෂූන් වහන්සේ නමක් බුදුරදුන්ට මේ බව සැළ කළේ ය. බුදුරජාණන් වහන්සේ මේ පිළිබඳ ව අතීත කතාවක් වදාරා මා පුතු කාශ්‍යපයන්ට මෙබඳු බාලයන් සමඟ වාසය කරනවාට වඩා හුදකලාව වාසය උතුම් යයි පවසමින් මේ ගාථාව දේශනා කළ සේක.

**චරං චෙ නාධිගච්ඡෙය්‍යා - සෙය්‍යං සදිසමත්තනො**
**එකචරියං දළ්හං කයිරා - නත්ථි බාලෙ සහායතා**

පදාර්ථ:-
**චරං චෙ,** ඉදින් තමාගේ ඇසුරට කල්‍යාණ මිත්‍රයෙකු සොයමින් හැසිරෙන්නේ; **සෙය්‍යං සදිසං අත්තනො,** තමාට වඩා උසස් කෙනෙකු හෝ තමා හා සමාන කෙනෙකු; **නාධිගච්ඡෙය්‍ය,** නොලැබේ නම්; **එක චරියං දළ්හං කයිරා,** සෑමවිට ම හුදකලාව වාසය කිරීම කළ යුත්තේ ය; **නත්ථි බාලෙ සහායතා,** මන්ද, බාලයන් ළඟ ඇසුරට සුදුසු සහායතා ගුණ නැති බැවිනි;

විවරණය:-
ඇසුරු කිරීමට සුදුසු කල්‍යාණ මිත්‍රයෙකු වන්නේ තමාට වඩා ශීල, සමාධි, ප්‍රඥා යන ගුණයන්ගෙන් වැඩි කෙනෙකු හෝ සමාන කෙනෙකි. ඒ මන්ද යත්,

**නිහීයති පුරිසො නිහීනසෙවී - න ච කදාචි හායෙත තුල්‍යසෙවී**
**සෙට්ඨං උපනමං උදෙති ඛිප්පං - තස්මා උත්තරිං භජෙථ සත්තිපෙක්ඛා**

යනුවෙන් වදාළ පරිදි තමාට වඩා ගුණයෙන් පහත් අය ඇසුරු කරන්නා පහත් බවට වැටේ සමානයෙකු ඇසුරු කරන්නා සිටින මට්ටමින් පහළට නොවැටේ. තමාට වඩා ගුණයෙන් උසස් කෙනෙකු ඇසුරු කරන්නා වහ වහා ඉහළට නැගේ. එබැවින් තමාට වඩා උසස් කෙනෙකු ඇසුරු කිරීම ඉතා වටී. ඒ කිසිවෙකු නැතිනම් හුදකලා වාසයට හුරුවිය යුතුයි. මන්ද, ශීලය දස කථා වස්තු, තෙළෙස් ධුතාංග, විදර්ශනාව, සතරමග, සතරඵල, ත්‍රිවිද්‍යා, ෂඩ්අභිඥා යනු මේ සහායතා ගුණාංගයන් ය. මේවා උතුම් කල්‍යාණ මිත්‍ර ඇසුරෙන් ම ලබාගත යුතු බැවින් සහායතා ගුණ නම් වේ. බාලයා තුළ මේ ගුණ නැත.

### 4.5.1.3 තමාට තමාවත් නැති කල කුමන පුත්තු ද කුමන ධනයක් ද?

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි එනුවර හතළිස් කෝටියක ධන සම්පත් ඇති ආනන්ද නම් සිටුවරයෙක් විය. හෙතෙම මහ මසුරෙකි. ඔහුට මූලසිරි නම් පුතෙක් විය. මේ සිටුවරයා නිතර ම මේ පුතුට මෙසේ අවවාද කරයි. පුත, මගේ මේ හතළිස් කෝටියක ධනය මහධනයක් යැයි නොසිතන්න. තිබෙන ධනය වැය නොකොට අළුතින් ධනය නිපදවිය යුතු ය. එක එක කහවණුව බැගින් හෝ වැය කළොත් ධනය නැසී යන්නේ ය. ඔහු ඊට උදාහරණ වශයෙන් මෙබඳු උපදේශයක් දෙයි.

**අංජනානං ඛයං දිස්වා - වම්මිකානං ච සංචයං**
**මධූනං ච සමාහාරං - පණ්ඩිතො ඝරමාවසෙ**

ඇසෙහි ආලේප කරන අඳුන් බිඳ බිඳ ගත්තත් නැසී යන ආකාරයත්, වේයන් පස් බිඳුවෙන් බිඳුව ගෙනවුත් හුඹස් බඳින ආකාරයත් බඹරුන් රොන් බිඳ බිඳ ගෙනවුත් මීවද බඳින ආකාරයත් සලකා ඥානවන්තයා ධන සම්පත් රැකගෙන ගිහිගෙහි විසිය යුතු ය.

මේ කියන සිටුවරයා තැනින් තැන තැන්පත් කළ පංච මහා නිධානයක් විය. එහෙත් හෙතෙම මසුරුකමින් ම දිවිගෙවා කළුරිය කොට ඒ නගරයෙන් පිටත ගමක සැඩොල් කතක කුස පිළිසිඳ ගත්තේ ය. කොසොල් රජතුමා ඔහුගේ ධනය ඔහුගේ පුත් මූලසිරිට ම පවරා ඔහු එම සිටු තනතුරෙහි ම පිහිටු වීය.

මේ සැඩොල් ගමේ මිනිසුන් ජීවත් වූයේ කුලී වැඩ කරමිනි. මේ දරුවා පිළිසිඳගත් දා පටන් ඒ ගමේ කිසිවෙකුට කුලී වැඩක් නොලැබෙන තැනට පත්වී ය. මෙය කිසියම් කාලකන්නියෙකුගේ උපත නිසා යැයි තීරණය කළ ගම්වැසියෝ ගම කොටසින් කොටස බෙදාගෙන ගොස් අන්තිමේ දී ඒ කාලකන්නි ගෙදර මෙය යැයි තීරණය කොට ඒ මව ගමෙන් නෙරපා දැමූහ. ඇය ඉතා දුකින් දිවි ගෙවමින් කෙසේ හෝ ඒ දරුවා බිහි කළා ය. එම දරුවා ද ඇස් කන් නාසාදිය විකාර ලෙස පිහිටි කුරු වකුටු විරූපියෙක් විය. මේ දරුවා රැගෙන යන මවට කිසිවක් නොලැබුණේ ය. දරුවා නවතා ගිය විට යන්තම් දවස යැපෙන්නට මුදලක් ලැබේ. ඇය මෙසේ ඒ දරුවාට ඇවිද කියාගන්නට හැකිවන තුරු අමාරුවෙන් පෝෂණය කොට දරු සෙනෙහස කෙතරම් වුවත් ජීවත් වීමේ අපහසුව නිසා ඔහුට ම යමක් සිඟාගෙන ජීවත්වනු කියා මුදා හැරියා ය. ගෙන්ගෙට ගොස් සිඟාගෙන කන මේ දරුවා දිනක් මූලසිරි සිටුවරයාගේ මැඳුර අසලට ද පැමිණියේ ය. මූලසිරි සිටුවරයාගේ කුඩා දරුවෝ මොහු දැක තැතිගෙන හඬන්නට වූහ. එවිට ඒ සිටුවරයාගේ සේවකයෝ ඔහුට තලා පෙළා කසළ ගොඩකට ඇද දැමූහ. මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන් සමඟින් ඒ අසලින් පිඬු පිණිස හැසිරෙති. මේ සිදුවීම දුටු උන් වහන්සේ සිනහ පහළ කළහ. ඊට හේතුව වදාරන්නට පෙර බුදුරදුහු මූලසිරි සිටුවරයා එතැනට කැඳවන්නට නියම කළහ. ඒ මොහොතේ බුදු අනුහස දැක බලාගන්නට මහජනතාවක් ද එතැනට රැස්වූහ. අනතුරුව උන්වහන්සේට මූලසිරි සිටුවරයා අමතා ඔබ මොහු හඳුනන්නෙහි දැයි ඇසූහ. ඔහු නැතැයි කී විට මේ ඔබේ මියගිය පියා යැයි බුදුරදුහු වදාළහ. සිටුවරයා මහත් පිළිකුළෙන් එය ප්‍රතික්ෂේප කළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ එසේ නම් මා ඔබට ඔප්පු කරවන්නෙමියි කියා සැඩොල් දරුවාට පෙර නමින් ම කථාකොට ආනන්ද සිටුවරය, ඔබේ පංච මහා නිධානය මේ දරුවාට පෙන්වන්නැයි කීය. ඒ මොහොතේ ජාතිස්මරණ ඥානය පහළවී සිටි හෙයින් හේ දිවගොස් පස්තැනක පොළොව පහුරු ගා පංච මහා නිධානය දක්වී ය. ඒවා භාරවා බැලූ මූලසිරි සිටුවරයාට සත්‍ය පිළිගන්නට සිදුවිය. හෙතෙම එතැන් සිට තෙරුවන් සරණ ගිය උපාසකයෙකු බවට පත්විය. බුදුරජාණන් වහන්සේ ඒ නිමිති කොට මේ ගාථා දේශනාව දේශනා කළ සේක.

**පුත්තාමත්ථි ධනමම්මත්ථි - ඉති බාලො විහඤ්ඤති**
**අත්තාහි අත්තනො නත්ථි - කුතො පුත්තා කුතො ධනං**

පදාර්ථ:-
**පුත්තා මෙ අත්ථි,** මට පුතුන් ඇත කියා ද; **ධනං මෙ අත්ථි** මට ධනය ඇත කියා ද; **බාලො,** අනුවණයා; **විහඤ්ඤති,** ඔවුන් මත්තේ ම හැපෙයි, නැසෙයි; **අත්තාහි අත්තනො නත්ථි** අන්තිමේ දී තමාට තමාවත් පිහිටට නැතිවිට; **කුතො පුත්තා කුතො ධනං,** ඒ පුතුන්ගෙන් හෝ ධනයෙන් කවර පිහිටක් ද;

විවරණය:-
පරලොව ගැන හැඟීමක් නැති අනුවණ මිනිස්සු පුත්‍ර තෘෂ්ණාවෙන් හා ධන තෘෂ්ණාවෙන් ඒ වෙනුවෙන් ම දිවා රෑ දියෙහි ගොඩබිම මහමඟ ආදී තැන්වල රැකියා කරමින් වෙහෙසෙති. ඔවුහු බොහෝ දෙනෙක් පරලොව සඳහා කිසිඳු පිනක් දහමක් නොකරති. සමහර මසුරෝ මෙලොව යුතුකම් වත් ඉටු නොකරති. අන්තිමේ දී මිය ඇදෙන දවසට ඔහු ළඟ කිසිවක් නැත. ඔහු මරණ දුකින් ගලවා ගන්නට හෝ පරලොව දුගතියෙන් ගලවාගන්නට ඒ දූ පුත්තුවත් ඒ ධනයවත් සමත් නොවෙත් මන්ද, ඔහු තමාට තමාවත් පිහිටක් කර නොගත් කල අනුන්ගෙන් කවර පිහිටක් ද?

## 4.5.1.4. තමාගේ අනුවණකම හඳුනන්නා පණ්ඩිතයෙකි

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සමයක ගැට කපන සොරුන් දෙදෙනක් වූහ. ඔවුහු දිනක් ගැට කපන අදහසින් ම දෙව්රම්වෙහෙරට ගොස් බණ අසන පිරිස අතර හිඳගත්හ. ඉන් එක් අයෙක් කරන්නට ආ සොරකම අමතක වී හොඳින් බණ ඇසුවේ ය. අනෙකා එහි හිඳගත් අයගේ ඉනේ බැඳි මුදල් ගැට ගැන විමසිල්ලෙන් සිට එක් අයෙකුගේ ගැටයක් කපාගෙන ගෙදර ගියේ ය. බණ අසා සෝවාන් ඵලයට පත් අනෙකා හිස් අතින් ම ගෙදර ගියේ ය. සොරා එම සොරකමෙන් මසුරන් පහක් සොරා ගෙන තිබිණ. එය එදා දවසේ ඔවුන්ගේ යැපීමට ප්‍රමාණවත් විය. හිස් අතින් ගෙදර ගිය අනික් තැනැත්තාගෙන් අද උපයාගත් මුදල් කොහි දැයි බිරිය ඇසුවා ය. සිදු වූ සිද්ධිය ඇයට කී විට ඔබගේ අති පණ්ඩිතකම නිසා අපට සුන්බත්ව ඉන්නට සිදු වී යැයි ඈ දොස් නගන්නට වූවා ය. එවිට හෙතෙම මැයගේ අනුවණකම නිසා මා කළේ නුවණැති වැඩක් ද නැද්දැයි වටහා ගැනීමට මැයට නොහැකි යැයි සිතා නෑ හිතවතුන් සමඟ පෙරළා දෙව්රම් වෙහෙරට ගොස් මේ පුවත බුදුරදුන්ට දන්වා සිටියේ ය. එවිට බුදුරජාණන් වහන්සේ මේ ගාථාවෙන් දහම් දෙසා වදාළ සේක.

**යො බාලො මඤ්ඤති බාල්‍යං - පණ්ඩිතො වා’පි තෙන සො**
**බාලො ච පණ්ඩිතමානී - ස වෙ බාලො’ති වුච්චති**

පදාර්ථ:-
**යො බාලො,** යම් අනුවණයෙක්; **බාල්‍යං,** තමාගේ අනුවණ බව; **මඤ්ඤති,** දනීනම්; **තෙන සො,** එයින් ම හෙතෙම; **පණ්ඩිතො වා අපි,** පණ්ඩිතයෙකු වෙයි; **බාලො ච පණ්ඩිතමානී,** යම් බාලයෙකු තමා කරුණු කාරණා දන්නා පණ්ඩිතයෙකැයි සිතා සිටී ද; **සවෙ බාලොති ඉති වුච්චති,** හෙතෙම ඒකාන්තයෙන් ම බාලයෙකැයි කියනු ලැබේ;

විවරණය:-
තමාගේ බාලකම, නොදන්නාකම පිළිගන්නා තැනැත්තා පණ්ඩිතයන් ඇසුරුකොට ඔවුන්ගේ අවවාද අනුශාසනා ලැබ මෙලෝ පරලෝ දෙලොව ම දකිනා පණ්ඩිතයෙකු බවට පත් වේ. යන්තම් යමක් දැනගෙන හෝ තමාගේ කපටි ශූරභාවය නිසා හෝ තමා පණ්ඩිතයෙකි, වීරයෙකැයි මානයෙන් දැපී සිටින තැනැත්තා පණ්ඩිතයන් ඇසුරු නොකරයි ධර්ම ශාස්ත්‍ර ඉගෙන ඥානවන්තයෙකු බට පත් නොවේ. බාලයන් ම ඇසුරු කරමින් බාල වැඩ ම සිදුකොට දෙලොව ම දියුණුව පිරිහෙළා ගනී. මෙසේ තමාගේ නොදන්නා බව දන්නා තැනැත්තා එනිසා ම පණ්ඩිතයෙකු වෙයි. එය නොදන්නා තැනැත්තා පණ්ඩිතයෙකැයි සිතා සිටිය ද බාලයෙක් ම වෙයි.

## 4.5.1.5. හැන්දක් කවදා හොද්දේ රස දනී ද?

උදායී තෙරුන් වහන්සේ තමා පණ්ඩිතයෙකැයි සිතා සිටිය කෙනෙකි. නිතර වාසය කෙළේ ද බුදුරදුන් වැඩ වෙසෙන විහාරයෙහි ම ය. උන්වහන්සේ සැරියුත් තෙරුන් ආදී මහ තෙරවරුන් සංඝයාට දහම් දෙසා නික්ම ගිය කල්හි ධර්මාසනයට නැග තමනුත් දන්නා කෙනෙකු බව අඟවමින් දහම් දෙසති. උන්වහන්සේ ගැන දන්නා බොහෝ දෙනා ප්‍රශ්න විමසීම් ආදියෙන් තොරව උන්වහන්සේට දහම් දෙසන්නට ඉඩහැර උපේක්ෂාවෙන් නිහඬව සිටිති. දිනක් එහි පැමිණි ආගන්තුක භික්ෂූන් පිරිසක් මේ බව නොදන මහා බහුශ්‍රැතයෙකැයි සිතා ස්කන්ධ ධාතු ආයතන පිළිබඳ ගැටලු තැන් විචාරන්නට වූහ. උදායී තෙරණුවෝ ඒවා විසඳාගත නොහැකිව නිරුත්තර වූහ. මෙයින් විපිළිසර වූ ආගන්තුක භික්ෂූන් වහන්සේලා මේ කවරෙක් ද? බුදුරදුන් සමග එක ම විහාරයේ වාසය කොටත් ස්කන්ධ ධාතු ආයතන වැනි තරම් දෙයක්වත් නොදනිත් දැයි කියා ඒ බව තථාගතයන් වහන්සේට දන්වා සිටියෝ ය. උන්වහන්සේ ඒ පිළිබඳ ව ඔවුන්ට දහම් දෙසමින් මේ ගාථාව දේශනා කළ සේක.

**යාවජීවම්පි චෙ බාලො - පණ්ඩිතං පයිරුපාසති**
**න සො ධම්මං විජානාති - දබ්බී සූපරසං යථා**

**පදාර්ථ:-**

**බාලො,** සද්ධර්මය වටහා ගැනීමට අපොහොසත් අනුවණ පුද්ගලයා; **යාවජීවං අපි,** දිවි ඇති තෙක් ම; **පණ්ඩිතං පයිරුපාසති,** බුද්ධාදී පණ්ඩිතයෙකු ඇසුරු කළත්; **දබ්බී සූපරසං යථා** හැන්ද සූපයෙහි රස නොදන්නා සේ; **සො,** හෙතෙම; **ධම්මං න විජානාති,** ධර්මය වටහා නොගනී;

**විවරණය:-**

අනුවණ පුද්ගලයා බුදුරාජාණන් වහන්සේ, රහතන් හෝ ආචාර්ය, උපාධ්‍යාය ආදී නුවණැත්තන් දිවිහිමියෙන් ඇසුරු කළත් බුද්ධ වචනය මෙයයි, බුද්ධ වචනය නොවන්නේ මෙයයි, කියා හෝ ආරාමයෙහි හැසිරිය යුත්තේ මෙසේ ය කියා හෝ වරද නිවරද සේවනය කළ යුත්ත නොකළ යුත්ත මේ මේ කියා හෝ නොදනී. ඒ කුමක් වැනි ද යත්, හොද්දට, ව්‍යංජනයට බැසගෙන සිටින හැන්ද එහි ලුණු ඇඹුල් ආදී රස නොදන්නා සේ ය.

මේ දේශනාව අසා ආගන්තුක භික්ෂූහු රහත් වූහ.

## 4.5.1.6 අනුන් ගැන සෙවීමට වඩා තමන් ගැන සෙවීම යහපත් ය

එක් කලෙක පාවෙය්‍යක කුමාරවරුන් තිස්දෙනෙකුට තමන්ගේ ඇඳුම් ආයිත්තම් සොරාගෙන ගිය ස්ත්‍රියක සොයායන අතර කප්පාසිත වන ලැහැබේ දී බුදුරදුන් හමුවිය. මෙතැනින් ගිය ස්ත්‍රියක දුටුසේක් දැයි ඔවුන් ඇසූ කල බුදුරජාණන් වහන්සේ, වඩා වටින්නේ ස්ත්‍රියක ගැන සෙවීම ද තමන් ගැන සෙවීම දැයි අසා ඔවුන්ට දහම් දෙසූහ. එහි දී ඔවුහු ඒහි භික්ෂුභාවයෙන් පැවිද්ද ලැබූහ. තෙළෙස් ධුතාංග සමාදන් වී වනගතව විසූ ඔවුහු පසුකලෙක අනමතග්ග දේශනාව අසා රහත් වූහ.

මේ පුවත පිළිබඳ ව දිනක් දම්සභා මණ්ඩපයට රැස්වූ භික්ෂූන් අතර කතාබහක් ඇතිවිය. මේ භික්ෂූන් මෙතරම් ඉක්මනින් ධර්මාවබෝධය කළේ කෙසේදැයි සාකච්ඡා කරමින් සිටි තැනට වැඩම කළ බුදුරජාණන් වහන්සේ එපවත් අසා මහණෙනි, මොවුන් තිස්දෙනා අද පමණක් නොව පෙර භවයේදීත් සුරා ධූර්තයන්ව සිට මහා කුණ්ඩිල පඬිවරයාගෙන් දහම් අසා පංචශීලයේ පිහිටියාහු යැයි කුණ්ඩිල ජාතකය වදාරා ඒ හේතුව නිසා ම අදත් හුනස්නේ දී ම රහත් වූහයි දක්වා මේ ගාථාව වදාළ සේක.

> **මුහුත්තමපි චෙ විඤ්ඤූ - පණ්ඩිතං පයිරුපාසති**
> **ඛිප්පං ධම්මං විජානාති - ජිව්හා සූපරසං යථා**

**පදාර්ථ:-**

**විඤ්ඤූ,** අවබෝධ ඥානය ඇති නුවණැත්තා; **මුහුත්තං අපි,** මොහොතක් පමණ වුවත්; **පණ්ඩිතං පයිරුපාසති,** නුවණැත්තෙකු ඇසුරු කරන්නේ ද හෙතෙම; **ඛිප්පං එව,** වහා ම; **ධම්ම විජානාති,** ධර්මය දැනගන්නේ ය. කෙසේ ද යත්; ''**සූපරසං ජිව්හා යථා,** සූපයෙහි ලුණු ඇඹුල් රස වහා දැනගන්නා දිව මෙනි;

**විවරණය:-**

**උද්ඝටිතඥ** හෙවත් ඇසුණු සැණින් කරුණු අවබෝධ කරගන්නා ද, **විපචිතඥ** හෙවත් පුරුදු පුහුණු කිරීමෙන් හදාරා කරුණු තේරුම්ගන්නා ද **ඤෙය්‍යය** හෙවත් නිතර ම පසු පසින් සිට කියාදීමෙන් සිහිපත් කිරීමෙන් ඉතා අමාරුවෙන් කරුණු අවබෝධ කරන්නා ද **පද පරම** හෙවත් මුතින් නැවූ කළයකට වතුර වත් කරන්නාක් මෙන් මෙකී කවර ක්‍රමයකින් වත් අවබෝධ නොකරන්නා දැයි අවබෝධ කිරීමේ ශක්තිය අනුව පුද්ගලයෝ සතරදෙනෙකි. එයින් පළමු තුන්දෙනා පෙර පින් ඇති, යම් යම් තරමකට සහජ නුවණ ඇත්තන් ය. සූපයෙහි ලුණු ඇඹුල් රස දිව ගෑ පමණින් සූපරස දැන ගන්නා වැනි පළමු ගණයේ උද්ඝටිතඥ පුද්ගලයා මේ ගාථාවෙන් අදහස් කරන ලදී. මීට පෙරකී ගාථාවෙන් කියවුනේ කිසිසේත් අවබෝධ කිරීමට අසමත් සතරවැනි පදපරම පුද්ගලයා ගැන ය.

## 4.5.1.7. පව් කරන්නාගේ සතුරා තමා ම ය.

බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ වසන සමයේ සුප්පබුද්ධ නම් කුෂ්ට රෝගියෙක් විසී ය. හෙතෙම මහජනයා තමා පිළිකුල් කරන හෙයින් පිරිස් මැදට නොයයි. දිනක් බුදුරදුන් දහම් දෙසන තැන පිරිස් කෙළවර හිඳ හෙතෙම බණ අසා සෝවාන් වූයේ ය. තමා ලැබූ මගපල පිළිබඳ බුදුරදුන්ට දැන්වීමට ඔහුට උවමනා වුවත් මහජනයා මැද එය කළ නොහැකි විය. එනිසා පිරිස නැති අවස්ථාවක හෙතෙම බුදුරදුන් බැහැදැකීමට වෙහෙරට යමින් සිටියේ ය. මේ බව දැක ඔහු සැබවින් ම සෝවාන් වූවෙකුදැයි පිරික්සීමට සිතූ සක් දෙවිඳු වෙස් වලාගෙන අතරමග සිට සුප්පබුද්ධ ඔබ දුගියෙකි මම ඔබට අපමණ ධනය දෙමි. බුදුන් බුදුන් නොවේ ය, දහම දහම නොවේ ය, සඟුන් සඟුන් නොවේ යැයි ද, බුදුන් දහම් සඟුන් ගෙන් මට එලක් නැතැයි කියවයි ද කීය. එවිට සුප්පබුද්ධ වෙස් වලාගත් ශක්‍රයා අමතා විලිබිය නැති අන්ධබාලය, ඔබ වැන්නෙකු මා සමඟ කථා කිරීමටවත් නොවටින්නේ ය. මම දිළින්දෙක් නොවෙමි. යම් ස්ත්‍රියකට හෝ පුරුෂයකුට ශ්‍රද්ධාව, ශීලය, හිරිය, ඔත්තප්පය, ශ්‍රැතය, ත්‍යාගය, ප්‍රඥාව යන මේ

සප්ත ආර්යධනය වේ නම් ඔහු දිළින්දෙක් නොවේ. ඔහුගේ ජීවිතය හිස් නැත. මා වෙත මේ ධන හත ම තිබේ. එහෙයින් බුදු, පසේබුදු ආදී කිසි කෙනෙක් මා දිළින්දෙකැයි කියා නොකියති යි කීය. ඒ ඇසූ ශක්‍රයා බුදුරදුන් වෙත ගොස් ඔහුට පෙර ඒ පුවත දන්වී ය.

සුප්පබුද්ධ කුට්ඨී ද බුදුරදුන් හමු වී වැඳ තමා ලැබූ ගුණ විශේෂය දන්වා පෙරළා යාමට පිටත් විය. අතරමග දී තරුණ වැස්සියකගෙන් පහර ලැබ හේ කලුරිය කළේ ය. මේ වැස්සිය යක්ෂණියකි. ඇය මේ ආකාරයෙන් ම පුක්කුසාතිය ද බාහිය දාරුචීරිය ද තම්බදාඨික, චොරඝාතක යන මේ සිව්දෙනා ම ඇන මරා දැමුවාය. ඇය මේ ක්‍රියාව ආත්මභාව සීයයක සිට කරගෙන ආවකි.

දම්සභා මණ්ඩපයේ සිටි භික්ෂූන් වහන්සේලා මොහු කුෂ්ට රෝගියෙකු වීමත්, මෙසේ අකාලයේ මියයාමත් කෙසේ සිදුවී දැයි බුදුරදුන්ගෙන් විමසූහ. එහි දී උන්වහන්සේ ඔහු කුෂ්ඨ රෝගියෙකු වූයේ තගරසිඛී පසේ බුදුන් දැක කෙළ ගසා කළ අපහාසයක් නිසා ය. ඔහු මරා දැමූ ගවදෙන යක්ෂණියකි. මෙකී සතර දෙනා ම පෙර භවයක සිටු පුතුන් සිවු දෙනෙකු ව සිට දිනක් එක්තරා නගරසෝභිනී ගණිකාවක උයනකට ගෙනගොස් ධනය දී කම් සැප විඳ නැවත ඇය මරා දමා ඇයට දුන් සියලු ධනය ආපසු පැහැර ගත්හ. මේ ගැන වෛර බැඳගත් එම ස්ත්‍රිය මම හමුවන තැනක දී යකිනියක වී නුඹලා මරන්නෙමියි අධිෂ්ඨාන කළා ය. මේ අනුව මොවුන් සිවු දෙනා නිරයේ පැසෙමින් තම තමන් කළ පාප කර්මයේ පව්ටු විපාක සසර දිගුකාලයක් විඳ මේ අවසාන ආත්මභාවයේ දීත් එහි විපාක ලදහ යි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**චරන්ති බාලා දුම්මෙධා - අමිත්තෙනෙව අත්තනා**
**කරොන්තා පාපකං කම්මං - යං හොති කටුකප්ඵලං**

පදාර්ථ:-

**බාලා,** මෙලොව පරලොව දියුණුව නොදන්නා වූ; **දුම්මෙධා,** අනුවණයෝ; **අත්තනා අමිත්තෙනෙව:** තමාටම සතුරෙකු මෙන්; **කටුකප්ඵලං,** කටුක විපාක ගෙන දෙන; **පාපකං කම්මං,** පවුකම්; **කරොන්තා,** කරමින්; **චරන්ති,** හැසිරෙති;

විවරණය:-

මෙලොව පරලොව දෙලොව ම දියුණුව නොදන්නෝ බාලයෝ ය, ඔවුන් යහපත අයහපත දෙකෙහි වෙනස හෝ විපාක නොදන්නා බැවින් හා නොපිළිගන්නා බැවින් අනුවණයෝ ය. ඔවුන් නිතර ම හැඩි දැඩිකම් ලෙස හෝ පළිගැනීම් ලෙස හෝ විනෝදය පිණිස හෝ කරන්නේ තමාට ම කටුක විපාක දෙන පවුකම් ය. ඒවා කරමින් ජීවත්වීම තමාගේ පරම සතුරෙකු හා ජීවත් වීමක් වැනි ය.

## 4.5.1.8. තමාට ම පසුතැවිල්ලට හේතුවන දේ කරගන්නේ මන්ද?

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි සැවැත් නුවර එක් ගොවියෙක් විසී ය. හෙතෙම සැවැත් නුවරට නුදුරු තැනක කෙතක් කරයි. දිනක් හොරු ඒ නුවර ධනවත් පවුලක ගෙයක් බිඳ රන්රුවන් පැහැරගෙන රාත්‍රියෙහි ම ඒ කුඹුරෙහි හිඳ ධනය බෙදා ගත්තෝ ය. එයින් එක් සොරෙක් අනෙක් අයටත් හොරෙන් කහවනු දහසක මල්ලක් ඔඩොක්කුවේ සඟවාගෙන හිඳ නැගිට යනවිට එය වැටී අමතක වී ගියේ ය. පසුදා උදෑසන මහා කරුණාවෙන් ලොව බලා වදාරණ බුදුරජාණන් වහන්සේට මෙම කුඹුර හිමි ගොවියා දිවැසින් පෙනුනේ ය. ඔහු අද අමාරුවක වැටෙන බව දැනගත් උන්වහන්සේ අනඳ තෙරුන් සමඟ ඒ කුඹුර මැදින් පිඬු පිණිස වැඩම කළහ. ගොවියා ද උදෑසනින් පැමිණ සී සාමින් සිටියේ ය. කහවණු මල්ල ඇති තැන නැවතුණු බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන් අමතා ආනන්ද සර්පයෙක් පෙනේදැයි ඇසූහ. අනඳ තෙරණුවෝ ද එසේ ය ස්වාමීනි මහා විෂ ඇති සර්පයෙක් දකිමි යි පිළිතුරු දුන්හ. බුදුරජාණන් වහන්සේ ද එපමණක් වදාරා අනඳ තෙරුන් සමඟ පිටත්ව ගියහ. ගොවියා ද බුදුරදුන් වදාළ සර්පයා කොහිදැයි කෙවිටක් රැගෙන එහි ගොස් කහවනු මල්ල දැක බුදුරදුන් පවසන්නට ඇත්තේ මේ ගැන යැයි සිතා එය රැගෙන පස්වලින් වසා දමා නැවත සී සාන්නට පටන් ගත්තේ ය. මිනිස්සු ද රෑ පහන් වූ කල්හි මේ සොරකම ගැන දැනගෙන සොරුන් ගිය පියවර අනුව ගොස් ඔවුන් මුදල් බෙදාගත් තැන හඳුනාගෙන එහි තිබූ කහවණු මල්ල ද සොයාගත්හ. එසේ ම එහි තිබූ ගොවියාගේ අඩිසලකුණු ද දැක "මොහු රාත්‍රියේ ගෙවල් බිඳ දවල්ට කුඹුරු කොටන්නේ" යැයි කියා දැත් බැඳ රැගෙන ගොස් රජුට දැක්වූහ. බඩුත් සමග හොරා අසුවූ හෙයින් ඔහුගේ හිස සිඳින්නට රජු නියම කළේ ය. ඔහු කස පහර කමින් වධකස්ථානයට යන අතර ආනන්ද සර්පයා දුටුවා ද මහ විෂ ඇති සර්පයෙක් දුටුවෙමි යි යන මේ කියමන දොඩවමින් යයි. එවිට රාජපුරුෂයෝ නුඹ මේ කියන බුදුරජාණන් වහන්සේගෙත් අනඳ තෙරුන්ගේත් කතාව කුමක්දැයි විමසූහ. රජුට ම කියන්නෙමි යි ගොවියා කීවේ ය. රාජපුරුෂයෝ නැවත ඔහු රජු වෙත ගෙන ගොස් පුවත සැල කළහ. එවිට රජතුමා මොහු තුන්ලෝකාග්‍ර බුදුරජාණන් වහන්සේ සාක්ෂියට ඉදිරිපත් කරයි එනිසා එය හරිහැටි දැනගන්නා තුරු මට මේ දඬුවම දීමට නොහැකියැයි සිතා ගොවියාත් සමග බුදුරදුන් හමුවට ගියේ ය. එහිදී ස්වාමීනි ඔබවහන්සේ උදෑසන මොහුගේ කුඹුරට වැඩිසේක් ද එහිදී මේ කියන ආකාරයෙන් අනඳ තෙරුන් සමඟ සාකච්ඡාවක් සිදුවීදැයි විචාළේ ය. මහරජ එය සැබැවැයි බුදුහු වදාළහ. එවිට රජතුමා ස්වාමීන් වහන්සේ ගේ සාක්ෂිය නොවී නම් අද මොහුගේ දිවි තොර වන්නේ ය. නුඹ වහන්සේ නිසා අද මොහු දිවි ලද්දේයැයි කීවේ ය. බුදුරජාණන් වහන්සේ ද එය නිමිති කරගෙන මෙම ගාථාව වදාළ සේක.

> **න තං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති**
> **යස්ස අස්සුමුඛො රොදං - විපාකං පටිසෙවති**

පදාර්ථ:-

**යං කත්වා,** යම් කර්මයක් කොට; **අනුතප්පති,** පසුතැවෙන්නට සිදුවේ ද; **යස්ස විපාකං,** යම් කර්මයක විපාක; **අස්සුමුඛො,** කඳුලුපිරි මුහුණින්; **රොදං,** හඬමින්; **පටිසෙවති,** විඳින්නට සිදුවෙයි ද; **තං කම්මං,** එබඳු කර්මය; **න කතං සාධු,** කිරීම යහපත් නොවේ;

**විවරණය:-**
නිරය ආදී දුගතියෙහි ඉපදීමට හේතුවන දුක්ඛදායක කර්ම කළ තැනැත්තා පසුව තමා කළ ඒ කර්මය පිළිබඳ කිසිදා සතුටු නොවේ. එහි විපාක විඳින දවසට හඬා වැළපෙමින් විපාක විඳී. එ නිසා ඒ බව කල් ඇතිව දැන දහමෙන් ඉගෙනගෙන එබඳු කර්ම නොකර සිටීම කළ යුත්තේ ය.

## 4.5.1.9 සුවඳ මලින් මුනිඳු පුදා රාජ්‍ය සම්මාන ලැබූ මල් වෙළෙන්දා

රජගහනුවර සුමන නම් මාලාකාරයෙක් විය. හෙතෙම දිනපතා බිම්බිසාර රජුට උපස්ථාන පිණිස සමන් මල් නැලි අටක් සපයයි. එයින් ඔහුට කහවනු අටක් හිමි වෙයි. එක් දවසක් ඔහු මල් රැගෙන නගරයට පිවිසෙන විට ම බුදුරජාණන් වහන්සේ සවණක් ගණ රැස් විහිදුවමින් මහත් බුද්ධානුභාවයෙන් මහ සඟන පිරිවරා රජගහනුවරට පිඬු පිණිස පිවිසි සේක. සාමාන්‍යයෙන් බුදුරජාණන් වහන්සේ වඩින්නේ එබඳු රැස් විහිදෙන්නේ නැතිව සාමාන්‍ය රහතන් වහන්සේ කෙනෙකු ලෙසිනි. එහෙත් එදින උන්වහන්සේ සවණක් රැස් විහිදුවමින් වැඩිසේක. සුමන මාලාකරුද රන් පහන් කුළුණක් සේ දෙතිස් මහා පුරුෂ ලකුණින් හා අසූවක් අනුව්‍යඤ්ජන අසිරියෙන් බබලන බුදුරදුන් දැක අතිශයින් ප්‍රීතියට පත්වී ය. භාග්‍යවතුන් වහන්සේට කෙබඳු උපහාරයක් කරම් දැයි හේ කල්පනා කළේ ය. ඒ මොහොතේ වෙන කළහැකි කිසිවක් නොවූ බැවින් තමා රැගෙන ආ සමන් මල්වලින් බුදුන් පුදන්නට සිතී ය. ඒ සමඟම ඔහුට රජතුමා සිහිවිය. මේ මා දිනපතා රජතුමාට සපයන මල් ය. මෙය නොලැබුණ හොත් රජතුමා මා නසා දැමීම හෝ සිරගේ දැමීම හෝ රටින් පිටුවහල් කිරීම කරනු ඇත. කුමක් කරම් දැයි මොහොතක් කල්පනා කළ හෙතෙම රජතුමා මා නැසුවත් සිරකළත් කම් නැත. රජතුමා මට දුන්නත් දෙන්නේ මේ ආත්මභාවයේ ජීවත්වීමට ධනය පමණකි. එහෙත් බුදුරදුන්ට කරන පූජාව එසේ නොවේ. කල්ප කෝටි ගණන් හිතසුව පිණිස පවතින්නේ ය. මෙසේ සිතා හෙතෙම තම ජීවිතය ම බුදුරදුන්ට පරිත්‍යාග කොට සතුටින් ඔද වැඩී ගිය සිතින් මල් දෙමිටක් බුදුරදුන්ට ඉහළින් විසුරුවා දැමී ය. එය බුදුරදුන්ට ඉහළින් වියනක් සේ සිටියේ ය. තවත් මල් දෙමිටක් දකුණු පසට විසුරුවාලී ය. එය මල් තිරයක් සේ සිටියේ ය. මෙසේ විසුරුවන විසුරුවන මල් බුදුරදුන් වටා උඩුවියන් වටතිර පාවාඩ සේ සැදී සිටියේ ය. මෙසේ මල් නැලි අට සතර දෙසින් බුදුරදුන් වියනකින් වසා සිටියේ ය. බුද්ධ ශරීරයෙන් සවණක් ඝන බුද්ධ රශ්මි මාලා විහිදුණි. මේ ප්‍රාතිහාර්ය දකින්නට මුළු නුවර වැසි දහස්ගණන් ජනයා මහ මඟට රැස්වූහ. බුදුරජාණන් වහන්සේත් මාලාකාරයාගේ ගුණ ප්‍රකට වන පරිදි තුන්ගව්වක් පමණ වූ මාර්ග යෙහි ම බෙරහඬ මධ්‍යයේ වැඩි සේක. මාලාකාරයාගේ මුළු සිරුර ම පස්වනක් ප්‍රීතියෙන් පිනා ගියේ ය. බුදුරදුන් පසුපස මඳ දුරක් ගිය හෙතෙම බුදුරදුන්ට ස්තුති පූජා කොට වැඳ හිස් වූ මල් කුඩයත් රැගෙන ගෙදර ගියේ ය.

හිස් අතින් එන ඔහු දුටු භාර්යාව මල් කොහිදැයි ඇසුවා ය. බුදුරදුන්ට මල් පූජා කළ බව හා එයින් ඇති වූ ප්‍රාතිහාර්ය පිළිබඳ සියලු පුවත් හෙතෙම ඇයට හෙළිකොට තවමත් ඒ මල් වියන් වටතිර පාවඩ පිට වඩින බුදුරදුන් සමඟ මහජනතාව පෙරහරින් යති. ඔය ඇහෙන්නේ එම නින් නාදය යි පැවසී ය.

ඔහුගේ අනුවණ බිරිය සැදැහැත්තියක් නොවූවා ය. ඇය ඔහුට බැණ දොඩා රජුගෙන් විපත් වේ යැයි බියෙන් දරුවනුත් සමඟ ඔහු අතහැර දමා පලා ගියා ය. පළමුව ම

රජගෙදරට ගිය ඇය බිම්සර රජු බැහැදක තමාගේ ස්වාමියා කළ වරද ගැන කියා තමා ඔහු අතහැර ආ බව කීවා ය. බුදුරදුන් දුටු පළමු අවස්ථාවේ ම සෝවාන්ව සිටි මහරජතුමා ඇගේ අනුවණකම ගැන නුවණින් දක කිපුණු ආකාරයක් අඟවා ඔබ ඔහු අතහැර දමා පැමිණීම හොඳයි. මගේ මල් පූජා කළ ඔහුට කළ යුතු දේ මම දනිමි, යි කියා ඇය පිටත් කොට යවා එවෙලේ ම පිටත්ව බුදුරදුන් වඩනා මඟට ගොස් උන්වහන්සේ සමග ම නගරය ප්‍රදක්ෂිණා කළේ ය. බුදුරජාණන් වහන්සේ මාළිගාව අසළට වැඩම කළ විට රජු උන් වහන්සේගේ පාත්‍රය ගෙන රජ ගෙට වඩින ලෙස ඇරයුම් කළේ ය. බුදුරජාණන් වහන්සේ සුමනමාලාකාරයාගේ ගුණ ප්‍රකට කරවනු පිණිසත් දහස් ගණන් මහජනතාවගේ සුබසෙත පිණිසත් රජ මිදුලේ ම වැඩ සිටියහ. ඒ අනුව මහරජතුමා රජ මිදුලේ මණ්ඩපයක් තනවා බුදුරදුන් වඩා හිඳෙව්වේ ය. මල්වලින් සැදුණු වියන් එලෙස ම බුදුරදුන් වටකොට සිටියේ ය. මහරජතුමා බුද්ධ ප්‍රමුඛ මහ සඟරුවනට මහදන් පිළිගැන්වී ය. දන් වළඳා අවසානයේ උන් වහන්සේ අනුමෝදනා කොට පෙර සේ ම මල් වියන් මැදින් මහජනයා පිරිවරාගෙන ම පෙරළා විහාරයට වැඩම කළ සේක.

මේ අතර මහ රජතුමා සුමන මල්කරු කැඳවා මට ගෙනා මල් අට මිට බුදුරදුන්ට පිදුවේ කෙසේ දැයි තොරතුරු විචාළේ ය. මල්කරු ද ස්වාමීනි, කමා කළ මැනව බුද්ධ මහිමය දුටු මා ඔබවහන්සේ හිසගසා දමුවත් කමක් නැතැයි සිතා ජීවිත පරිත්‍යාගයෙන් පිදුවෙමි'යි පිළිතුරු දුන්නේ ය. එවිට රජු ඔබ මහා පුරුෂයෙකි. ඔබ කර ඇත්තේ මා විසින් කළ යුතු පූජාවකි'යි කියා මල් අටමිට වෙනුවට ඇතුන් අසුන් දැසි දස්සන් ද ගම්වර අටක් යන මේ සියලු දේ ම අට බැගින් ද කහවනු අට දහසක් ද සමග සබ්බට්ඨක නම් පරිත්‍යාගයක් කළේ ය.

අනඳ තෙරණුවෝ මේ සා මහත් වූ ප්‍රාතිහාර්යය ද රජතුමාගෙන් සුමන මාලාකාරු ලද පරිත්‍යාගය ද පිළිබඳ තොරතුරු දැන, ස්වාමීනි, මල්කරුගේ පූජාවේ අනුසස් කෙබඳුවේදැයි විචාළහ. එවිට බුදුරජාණන් වහන්සේ ආනන්දය, මෙය එසේ මෙසේ පූජාවක් නොවේ. මොහු විසින් මෙය මා කෙරෙහි ජීවිත පූජාවෙන් කරන ලද්දෙකි. මේ පිනෙන් හෙතෙම කල්ප ලක්ෂයකට දුගතියකට නොයන්නේ ය. දෙව්මිනිසුන් අතර ම සැරිසරා මහත් වූ පින්පල විඳ සුමන නමින් පසේ බුදුවරයෙකු වන්නේ යැයි වදාළහ.

එදින සවස දම් සභාවට රැස් වූ භික්ෂූන් අතර ද කතාබහ වූයේ මේ ගැන ම ය. අනේ මහ පුදුමයකි. මේ මල්කරු ජීවමාන සම්බුදුන් කෙරෙහි ජීවිත පූජාවෙන් කළ මහ පිනක මහිම, එවෙලේ ම හෙතෙම මහරජතුමාගෙන් සබ්බට්ඨක නම් ත්‍යාගයක් ලැබුවේ නොවේදැයි, කතාවක් ඇතිවිය. ඒ මොහොතේ දම්සභාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ මේ කතා අසා මහණෙනි, යම් ක්‍රියාවක් කිරීමෙන් පසුතැවිල්ලක් ඇති නොවේ නම් සිහිකරන හැම මොහොතක ම සතුටක් ම ප්‍රීතියක් ම උපදී නම් එබඳු ක්‍රියා ම කළ යුත්තේ යැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**තඤ්ච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති**
**යස්ස පතීතො සුමනො - විපාකං පටිසෙවති**

පදාර්ථ:-
**යං කත්වා,** යම් යහපත් ක්‍රියාවක් කොට; **නානුතප්පති,** පසුතැවිල්ලක් නොවේ ද; **පතීතො,** පරලොවදිත්; **සුමනො,** සතුටු සිත් ඇත්තේ; **විපාකං පටිසෙවති,** විඳින්නේ ද; **තං කම්මං කතං සාධු,** එබඳු පිංකම් කිරීම යහපති;

විවරණය:-
එක හිතින් ම පින්කම් කළ තැනැත්තා "**ඉධ නන්දති පෙච්ච නන්දති**" ආදී ගාථාවෙන් කියවෙන පරිදි මම මෙබඳු පින්කමක් කළෙමියි මෙලොවදී ඒ පින්කම සිහිවන හැමවිට ම සතුටුවෙයි. ප්‍රීතිවෙයි. කිසිවිටකත් ඒ පිළිබඳ පසුතැවිලි නොවෙයි. පරලොව සුගතියට ගොස් එහි සැප විපාක විඳින අතර වඩ වඩාත් සතුටු වෙයි. එසේ නම් කළ යුත්තේ එබඳු පින්කම් ය.

## 4.5.1.10 උමතු කාමයෙන් පොළොව පලාගෙන නිරයට ගිය තරුණයා

උප්පලවණ්ණා මහ තෙරණිය බුදුරජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවිකාවකි. ඒ තෙරණිය පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සමයෙහි ඒ සඳහා ප්‍රාර්ථනා ඇතිව කල්ප ලක්ෂයක් පෙරුම් පුරමින් දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා අප බුදුරජාණන් වහන්සේගේ සමයෙහි සැවැත් නුවර සිටු කුලයක උපන්නා ය. ඉතා රූමත් සිටු කුමාරිකාවක වූ ඇය නිලුපුල් මල් ගැබක අසිරිය හා සමාන පැහැපත් රූ සපුවකින් හෙබියා ය. නිසි කල වයස පැමිණි කල්හි ඇයට රජවරුන්ගෙන් සිටුවරුන්ගෙන් විවාහ යෝජනා ගලා එන්නට විය. එය පිය සිටුතුමාට මහත් ගැටළුවක් විය. කිසිවකු අමනාප කරගැනීමට නොරිසි වූ හෙතෙම ඇය පැවිදි කරවන්නට සිතී ය. ඒ ගැන විමසූ සැණින් උප්පලවණ්ණා කුමරියගේ සිත ප්‍රීතියෙන් පිනා ගියේ ය. පෙරුම් පුරා අවසන් අත් බවයෙහි ඉපිද සිටි ඇයට පියාගේ ඒ වචනය කණෙහි මී පැණි වත්කරන්නාක් මෙන් විය. අනතුරුව සිටුතුමා ඇය මෙහෙණවරකට කැඳවා ගෙන ගොස් පැවිදි කරවී ය.

පැවිදි වී නොබෝ දිනකින් ම උප්පලවණ්ණා තෙරණියට පොහොයගෙයි වතාවත් පැවරිණි. එතුමිය පොහොය ගේ ඇමැද පහන් දල්වා ඒ පහන් එළිය දෙස ම බලාගෙන තේජෝ කසිණ සමාපත්තිය උපදවා එය ම පාදක කොටගෙන සිව්පිළිසිඹියා සහිත පංච අභිඥාවන්ගෙන් සමන්විත රහත් බවට පැමිණියා ය. පසු කලෙක එතුමිය අන්ධ වනයෙහි වාසය කරන්නට වූවා ය. ඒ වන විට භික්ෂුණීන්ට ආරණ්‍ය වාසය තහනම් කොට නොතිබුණි. එහෙයින් ඇය ද වනයෙහි රෙදිවලින් වටකොට තනාදුන් කුඩා කුටියක පණවාදුන් කුඩා ඇඳක වාසය කළා ය.

දිනක් එතුමිය සැවැත්නුවර පිඬු පිණිස හැසිර පෙරළා සිය කුටියට පැමිණියා ය. මේ අතර ගිහිකල මාමාගේ පුතෙකු වූ ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇතිව සිටි නන්ද නම් තරුණයෙක් රාගයෙන් උමතුව කල් ඇතිව පැමිණ ඇඳයට සැඟවී සිටියේ ය. ඒ බව නොදත් තෙරණිය කුටියට පිවිස දොරවසා ඇඳෙහි හිඳගත්තා පමණි. මේ සාහසිකයා ඇගේ ඇඳ මතට නැගී අනුවණය, ඔබ නොනැසෙව්'යි කියමින් තෙරණිය කොතෙකුත් වළකද්දී ම ඇය දූෂණය කොට පලා ගියේ ය. තෙරණියගේ ගුණ මහිමය නිසා ඇයට කළ මේ පොළොව නුහුලන අපරාධය ඔහුට මගදීම පල දී පොළොව පලාගෙන ගොස් අවීචි මහා නරකාදියෙහි උපන්නේ ය.

එතුමිය මේ පුවත භික්ෂුණීන්ට දැන්වූවා ය. භික්ෂුණීන් එය භික්ෂූන්ට ද භික්ෂූන් වහන්සේලා එය බුදුරජාණන් වහන්සේට ද දැන්වූහ. උන්වහන්සේ ඒ පුවත අසා මහණෙනි, අනුවණ බාලයා පව්කම් කරන විට එය මී පැණි මෙන් මිහිරියැයි සිතා කරයි. එහෙත් විපාක විඳින විට මහා දුකකට වැටේ යැයි පූර්ව අපර සන්ධි ගලපා මෙ ගාථාව වදාළ සේක.

**මධුවා මඤ්ඤති බාලො - යාව පාපං න පච්චති**
**යදා ච පච්චතී පාපං - අථ බාලො දුක්ඛං නිගච්ඡති**

**පදාර්ථ:-**

**යාව**, යම්තාක්; **පාපං න පච්චති**, කෙනෙකු කළ පාපයක් විපාක නොදේ ද එතෙක්; **බාලො;** බාලයා; **මධුවා මඤ්ඤති,;** මී පැණි මෙන් පාපය මිහිරියැයි සිතයි; **යදා ච**, යම් කලෙක; **පාපං පච්චති**, ඒ පාපය විපාක දෙයි ද; **අථ**, එකල්හි; **බාලො දුක්ඛං නිගච්ඡති**, ඒ බාලයා මහත් වූ දුකට පත් වන්නේ ය;

**විවරණය:-**

**කරන කලට පව් මීරිය මී සේ** යනුවෙන් දක්වෙන පරිදි නරක පව්කම් කරන තැනැත්තාට ඒ අවස්ථාවේ දැනෙන්නේ මහා මිහිරකි. සතුටකි. එහෙත් ඔහු හෝ ඇය, ඒ මිහිර විඳින්නේ **ලිපගිනි මොලවන තෙක් දිය සැලියේ** සතුටින් රඟන කකුළුවකු මෙනි. තමා කළ පාපයේ රඟ දැනෙන්නේ එහි විපාක දැනෙන විට ය. විශේෂයෙන් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිල්වතුන් කෙරෙහි කළ පාපය ආනන්තර්ය පාපයක් මෙන් දරුණු ය.

මෙම සිදුවීමෙන් පසු මහජනයා අතරත් පෘථග්ජන භික්ෂූන් අතරත් කටකතා පැතිරෙන්නට විය. රහතන් වහන්සේලා වුවත් කම්සැප ඉවසනවා ඇත. මන්ද ඔවුන් දිඹුල් ගස් වැනි හෝ හුඹස් වැන්නෝ නොවෙති. ලෙයින් මසින් හැදුනෝ නොවේ ද යනුවෙනි.

දම් සභාවට වැඩම කළ බුදුරදුන් මේ කතා බහ අසා මහණෙනි, නෙළුම් පතක වැටුණු දිය බිඳුවක් හෝ ඉඳිකටු තුඩක රඳවන්නට යන අබ ඇටයක් හෝ එහි නොරැඳෙන්නේ යම් සේ ද එසේ ම රහතුන්ගේ සිතෙහිත් වස්තු කාම ක්ලේශ කාම මේ දෙයාකාර කාමයන්ගෙන් එකක්වත් නොරැඳෙන්නේ ය. ඔවුහු එම කාමයන්හි නොඇලෙන්නාහයි.

**වාරිපොක්ඛර පත්තෙ'ව - ආරග්ගෙරිව සාසපො**
**යො න ලිප්පති කාමෙසු - තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං**

යන ධම්මපදයේ බ්‍රාහ්මණ වග්ගයේ එන ගාථාව වදාළ සේක.

අනතුරුව බුදුරජාණන් වහන්සේ කොසොල් රජ කැඳවා මහරජ මේ සසුනේ පැවිදිවන කුල කුමරියන් වන පෙත්හි විසීම සුරක්ෂිත නැත. පව්ටු පුද්ගලයන්ගෙන් ඔවුන්ට අනතුරු සිදුවිය හැක. එහෙයින් නගරය තුළ ම ඔවුන්ට වාසස්ථාන තැනවිය යුතු යයි වදාළහ. රජතුමා එය පිළිගෙන භික්ෂුණීන් සඳහා නගරය තුළ ම ආරාම කරවී ය. එතැන් පටන් භික්ෂුණීන්ට හුදකලාව ආරණ්‍ය වාසය තහනම් විය.

## 4.5.1.11 අනුන් රවටමින් බොරු තපස් රකින්නාට රහත් බව බොහෝ දුර ය.

රජගහ නුවර ජම්බුක නම් ආජීවකයෙක් විසී ය. ආජීවකයෙක් යනු එකල විසූ තවුසෙකි. විශේෂයෙන් පැවිද්ද ජීවන මාර්ගයක් කරගෙන යන අය ආජීවක යන නමින් හඳුන්වති. සෙසු ආජීවකයන් අතර මෙම ආජීවකයාගේ විශේෂත්වය වූයේ නිරුවත් භාවයත් අසූචි අනුභව කිරීමත්, තල් ඇටයකින් කෙස් උදුරා දැමීමත් බිම සැතපීමත් ය. ඔහුට මේ ජීවිතයේ දී එබඳු දුෂ්කර ව්‍රතයක් රකිමින් දුක් විඳින්නට සිදුවූයේ පෙර කාශ්‍යප බුදුරදුන් සමයේ රහතන් වහන්සේ නමකට කළ අරියෝපවාද පාපකර්මයක් නිසා ය. ඒ කෙසේද යත්,

එකල හෙතෙම පැවිදිව එක්තරා ගමක එක් කෙළඹි කෙනෙකු විසින් කරදුන් විහාරයක විසීය. ඒ කෙළෙඹියා ද මුන්වහන්සේට ඉතා මැනවින් සිවුපසයෙන් උපස්ථාන කරයි. දිනක් එක්තරා රහතන් නමක් ඒ ගමෙහි පිඬු පිණිස හැසිරෙමින් මේ කෙළෙඹියාගේ නිවස වෙත ද වැඩම කළහ. උන්වහන්සේගේ ඉරියව් දැක පැහැදුණු මේ කෙළෙඹියා සිය නිවසට වඩමවා ප්‍රණීත ආහාර වැළඳවී ය. උන්වහන්සේගේ දිරාපත් සිවුර දැක සිවුරක් කරගනු පිණිස වටිනා සළුවක් පූජාකර ස්වාමීනි, ඔබ වහන්සේගේ කෙස් වැවී ඇත. එය කප්පවන්නට කරණවැමියෙක් එවමි. සැතපීමට ඇඳක් ද ගෙනෙමි යි කියා උන්වහන්සේට ආරාමයට වඩින්නට ආරාධනා කළේ ය.

ආරාමවාසී භික්ෂූන් වහන්සේට සිය දායක කෙළෙඹියා මේ රහතන් වහන්සේට දක්වන සත්කාර ඉවසන්නට නොහැකි විය. කෙළෙඹියා අවුත් එකී සියලු සත්කාර කොට පිටත්ව ගියේ ය. උන්වහන්සේ රහත් කෙනෙකු බව නොදත් මේ භික්ෂුව සවස් කාලයෙහි ආගන්තුක තෙරුන් වෙත ගොස් ඔබ මේ කෙළෙඹියා දුන් සාටකය අඳිනවාට වඩා නිර්වස්ත්‍රව සිටීම හොඳ ය, කෙළඹියා දුන් ඇඳෙහි නිදනවාට වඩා බිම වැතිරී නිදාගත්තානම් හොඳ ය, ඔහුගේ ආහාර වළඳනවාට වඩා අසූචි වැළඳුවේ නම් හොඳ ය, කරණවැමියා ලවා කෙස් කපනවාට වඩා තල ඇටයෙන් කෙස් ඉදිරුවේ නම් හොඳ ය. යන මේ සතර ආකාරයෙන් බැන වැදුණි.

රහතන් වහන්සේ ද මේ අනුවණයා මා නිසා විනාශ වන්නේ යැයි සළකා පසුදා උදෑසන ම කෙළඹියාටත් නොදන්වා පිටත්ව ගියහ. පසුදා වෙහෙරවැසි තෙරුන් පමණක් පිඬුපිණිස වැඩිය කල අනෙක් ආගන්තුක තෙරුන් කොහේදැයි කෙළඹියා විමසී ය. එවිට තෙරුන් වහන්සේ මම සෑ මළු බෝමළු ඇමදීම් ආදී සියලු වතාවත් කොට පිඬු පිණිස ආවෙමි. ඒ භික්ෂුව කළ කිසිවකුත් නැත. තව ම ඇඳේ වැටී නිදනවා ඇතැයි කීය. කෙසේ වුවත් නුවණැති කෙළඹියා ඒ වදන් විශ්වාස කළේ නැත. වෙහෙර වැසි භික්ෂුවට ප්‍රණීතාකාරයෙන් දන් වළඳවා ආගන්තුක තෙරුන්ට පිළිගන්වන ලෙස තවත් දන් පාත්‍රයක් පුරවා දුන්නේ ය. එහෙත් ඒ භික්ෂූන් වහන්සේ ඊර්ෂ්‍යාව නිසා ම දන් පාත්‍රය අතරමඟ හලා විහාරයට ගියේ ය. ගොස් දොර විවර කොට බලන විට ආගන්තුක තෙරුන් එහි නැත.

මෙම භික්ෂූන් වහන්සේ මීට පෙර අවුරුදු විසි දහසක් එක දිගට මහණදම් පිරූ කෙනෙකි. ඒ භවයේ දී මේ කළ පාපකර්මය හේතුවෙන් මෙවර මහණදම කෙළෙසී ගියේ ය. ආයු කෙළවර අවීචි මහා නරකාදියේ ඉපදී බුද්ධාන්තරයක් ම දුක් විඳ අපේ බුදුරදුන්ගේ සමයෙහි ආහාර පානාදියෙන් පොහොසත් ගෙදරක උපන්නේ ය. රහතුන්ට කළ අපරාධය හේතුවෙන් පා නඟා ඇවිදින කාලයේ පටන් බත් අප්‍රිය කරයි. තමා ම පහකරන මළ අනුභව කරයි. බිම වැතිරෙයි ළදරුකම නිසා මෙසේ කරති'යි මව්පියන් සිතුවත් වැඩිවිය පැමිණි

පසුත් ඔහුගේ හැසිරීම් වෙනස් නොවී ය. නිරුවතින් සිටී, බිම නිදයි. මළ අනුභව කරයි. මොහුගේ මේ අමුතු හැසිරීම් නිසා මාපියෝ මොහු සුදුසු ගිහිගෙට නොවේ ආජීවකයන්ට යැයි තීරණය කොට ආජීවකයන් වෙත ගෙනගොස් පැවිදි කළෝ ය. එතැන් සිට හෙතෙම තල් ඇට කැබලිවලින් කෙස් ගලවයි. බිම වැතිර නිදයි. නිරුවත් ව වෙසෙයි. සෙසු ආජීවකයන් පිඬු පිණිස යාමට කතා කළත් නොයයි. වැසිකිළියෙන් අසූචි ගෙන අනුභව කරයි. මොහුගේ මේ හැසිරීම් පිළිකුල් කළ සෙසු ආජීවකයෝ මොහු පන්නා දැමූහ.

අනතුරුව මිනිසුන් මළපහ කරන ගල්තලාවක වාසයට ගිය හෙතෙම අසූචි අනුභව කරමින් එහි ජීවත් වෙයි. මනිසුන් එනවිට උඩු සුළඟට කට ඇරගෙන සිටී. ඒ මන්දැයි විමසූ විට මම සුළඟ බුදින්නෙක්මි. අන් කිසි ආහාරක් නොගන්නෙමියි කියයි. මෙම රූක්ෂ ප්‍රතිපත්තිය නිසා ඔහු කෙරෙහි වඩාත් පහන් වූ මිනිස්සු මෙබඳු රහතුන් නම් ඉතා දුර්ලභ යැයි කියා කිසි අහරක් නොගන්නා හෙයින් ගිතෙල් මී පැණි වැනි ඉතා අගනා මිහිරි රස ආහාර ගෙනවුත් වළඳන ලෙස පෙරැත්ත කරති. ඔවුන්ගෙන් ගැලවෙන්නට නොහැකි තැන ගෙනෙන ප්‍රණීත ආහාරවල කුසතණ අගිස්සක් තවරා ගත් බින්දුවක් දිව ගා, දැන් මෙය රැගෙනයන්න මට මේ ඇත. මෙපමණකින් ඔබට මහත් ඵල මහා ආනිශංස ලැබේ යැයි කියා පිටත්කර යවා අසූචි ම අනුභව කරයි. මෙසේ හෙතෙම අවුරුදු පනස් පහක් ම නිරුවතින්, අසූචි කමින් කෙස් උදුරමින්, බිම නිදමින් ගත කළේ ය.

දිනක් අලුයම ලොව බලා වදාරණ බුදුරජාණන් වහන්සේගේ දිවැසට ජම්බුක ආජීවකයා හසුවිය. මොහුට සිව්පිළිසිඹියා පත් රහත් බවට පත්වීමට තරම් වාසනාවක් ඇත. මා මොහු වෙත යා යුතු ය. එයින් මොහුටත් තවත් බොහෝ ජනයාටත් සෙතක් වන්නේයැයි සලකා එදා සවස් වේලෙහි ජම්බුක ආජීවකයා සිටි තැනට වැඩම කළහ. එදා උන්වහන්සේ වඩින බව කල් ඇතිව ම දුටු දෙවියෝ ජම්බුක ආජීවකයා වැතිරී සිටි ගල්තලාවේ අසූචි සේදී යන ලෙස මහ වැස්සක් වැස්සවූහ. බුදුරජාණන් වහන්සේ එම ස්ථානයට වැඩමවා ජම්බුක යැයි ඇමතූහ. ජම්බුකයන් කුපිත විය. කවුරුදැ යි ඇසූ කල මම පැවිද්දෙක්මැයි බුදුරදුන් වදාළහ. කුමට ආවේදැයි ඇසූවිට අද රෑට මට විසීමට තැනක් දෙන්නැයි ඉල්ලා සිටියහ. එහෙත් ඔහුගෙන් අවසරයක් නොලැබුණි. අන්තිමේ දී ඒ අසලට ඇති වෙනත් ගල් තලාවක් පෙන්වා එහි වසන්නට අවසර ලබාගෙන එහි වැඩි සේක. එදා රාත්‍රී කාලයේ උන්වහන්සේට උපස්ථාන පිණිස ප්‍රථම යාමයෙහි සතරවරම් දෙව්වරු ද, මධ්‍යම යාමයේ සක්දෙව් රජු ද, පශ්චිම යාමයේ මහා බ්‍රාහ්මයා ද පැමිණියහ. ඒ සෑම විටක ම සතර දිසාව ම ආලෝකයෙන් බැබළී ගියේ ය. ජම්බුකට එය මහත් වූ විස්මය දනවන්නක් විය. එයින් ඔහුගේ ඔදතෙද සිඳී ගියේ ය.

මෙනිසා ම පසු දා අළුයම බුදුරදුන් හමුවට ගිය හෙතෙම සතුටු සාමීචි කතා කොට ඒ වරින්වර පැමිණියේ කවුරුන්දැයි විචාළේ ය. පළමු යාමයේ පැමිණියේ සතරවරම් දෙව්වරු ය. මැදියම පැමිණයේ සක්දෙව් රජු ය. අළුයම පැමිණියේ මහබඹුයැයි වදාළ විට ඔවුන් කුමකට පැමිණියෝදැයි ඇසී ය. තමාට උපස්ථාන පිණිස යයි උන්වහන්සේ වදාළහ. එවිට ජම්බුක මහා ශ්‍රමණය මහා පුදුමයකි. මම පනස් පස් වසරක් මෙහි සුළං බොමින් සිටියෙමි. මේ කිසිවෙක් මට උපස්ථාන පිණිස නොආවාහු යැයි පැවසී ය.

එවිට බුදුරජාණන් වහන්සේ ජම්බුකය. ඔබ සිතන්නේ මෙළොව මෝඩ ජනයා රැවටුනාක් මෙන් මාත් රැවටීමට ද ඔබ පනස් පස් වසරක් අසූචි අනුභව කරමින් ''මම වාතය අනුභව කරමියි මිනිසුන් රැවටුවෙහි''යැයි වදාරා ඔහුට පෙර භවයන්හි කළ වංචාවන් ද සිහිකළ සේක. ඒ අසා ඔහුට මහත් සංවේගයක් ඇතිවිය. තමාගේ නිරුවත්කම පිළිබඳ ව

ලැජ්ජාවක් ද ඇතිවිය. බුදුරජාණන් වහන්සේ වැසිසළුව දුන්හ. ඔහු එයින් විළි වසාගෙන එක් පසකින් හිඳගත්තේ ය. උන්වහන්සේ දහම් දෙසූහ. පෙර ආත්මභාව විසිදහසක් මහණදම් පුරා කළ පෙරුමන් බලයෙන් හෙතෙම ධර්මදේශනා අවසානයේ සිව්පිළිසිඹියා සහිත වූ රහත් බවට පත්විය. හේ පැවිද්ද ඉල්ලා සිටියේ ය. බුදුරජාණන් වහන්සේ ඔහු ඒහි භික්ඛුභාවයෙන් පැවිදි කළ හ.

එදා මහජනයා ජම්බුක ආජීවකයාට පුද සත්කාර ගෙන එන දවසක් විය. බුදුරදුන් එහි වැඩ සිටිනු දුටු ජම්බුක ආජීවකයන් ඇදහූ බැතිමත්හු ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මොහු වෙත පැමිණියේ උන්වහන්සේට වඩා ජම්බුක ආජීවකයා උතුම්වන නිසා යැයි සැක පහළ කළහ. බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ සැක දුරුකරන ලෙස ජම්බුක හිමියන්ට වදාළහ. උන්වහන්සේ සෘද්ධි බලයෙන් අහසට පැන නැගී භාග්‍යවතුන් වහන්සේ මගේ ශාස්තෲවරයා ය. මම උන්වහන්සේගේ ශ්‍රාවක වෙමියි කියා බැස හෙව වැඳ සිටියේ ය. එවිට මහජනයා අහෝ බුද්ධවරයන් වහන්සේලා කොතරම් ආශ්චර්යවත්හු දැයි සිත් පහන් කළෝ ය. අනතුරුව මහජනයා ඇමතූ බුදුරජාණන් වහන්සේ පින්වත්නි, මෙතෙම මෙතෙක් කල් මසක් පාසා ඔබ ගෙන ආ ප්‍රණීත ආහාරය තණ අගින් දිව ගා මම තපස් රකින්නෙමියි ඉවත දැමුවේ ය. මේ ආකාරයෙන් අවුරුදු සීයක් තපස් පිරුවත් විකාලය නිසා හෝ අකැප වතක් නිසා හෝ දන් නොපිළිගන්නා ශ්‍රමණයන් වහන්සේලාගේ තපස් චර්යාවෙන් සොළොස් කලාවෙන් කලාවක් වත් නොවටින්නේ යැයි පූර්වාපර සන්ධි ගලපමින් මෙම ගාථාව දේශනා කළ සේක.

**මාසෙ මාසෙ කුසග්ගෙන - බාලො භුඤ්ජෙථ භොජනං**
**න සො සංඛත ධම්මානං - කලං අග්ඝති සොළසිං**

**පදාර්ථ:-**

**බාලො**, බාලයා; **මාසෙ මාසෙ**, මසක් මසක් පාසා; **කුසග්ගෙන** කුසතණ අගින්; **භොජනං භුඤ්ජෙථ**, බොජුන් වළඳන තපස් රැක්කත්; **සො** හෙතෙම; **සංඛත ධම්මානං**, චතුස් සත්‍ය දැන වදාළ ආර්යයන් වහන්සේලාගේ ගුණයෙන්; **කලං න අග්ඝති සොළසිං**, සොළොස් කලාවෙන් එක් කලාවක් පමණක් වත් නොවටින්නේ ය;

**විවරණය:-**

අසූචි අනුභව කොට දිවිගෙවූ ජම්බුක ආජීවකයාට මහජනයා ආහාර පාන ගෙනාවේ මසකට වරකි. එයින් ඔහු අනුභව කළේ කුසතණ අග තවරාගත් බින්දුවක් පමණි. මෙය ඔහුගේ ව්‍රතයක් බව ඔහු ඇඟවී ය. මෙබඳු ව්‍රත මෙන් ම මහජනයා රවටන වංචාකාරී තපස් ද රකින අය කවදත් සිටිති. ඇතැමෙක් ඒවා සිල් යයි තමන් ම රැවටී සිටින අතර ඇතැමෙක් එමගින් අනුන් රවටති. මේ කවර තපසෙකු වුව ද අරි අටගිමග ගමන් කොට සෝවාන් ආදී මගපල පසක් කරන උතුමන්ගේ මාර්ගය හා දහසින් පංගුවක්වත් නොවටින්නේ ය. මන් ද, ඒ සියල්ල මිථ්‍යා තපස් වන බැවිනි.

## 4.5.1.12. දෙවූ සැණින් කිරි නොමිදේ. කළ සැණින් පව පල නොදේ

දිනක් ලක්ඛණ තෙරණුවන් සමග මුගලන් තෙරණුවෝ රජගහ නුවර පිඬු සිගා වැඩියහ. ගිජුකුළු පව්වෙන් බසින අතර මුගලන් තෙරණුවෝ සිනා පහළ කළහ. ලක්ඛණ තෙරුන් කුමක් නිසා සිනාසුනේ දැයි ඇසූහ. මුගලන් තෙරණුවෝ මේ එය කීමට සුදුසු කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේ හමුවේ දී අසන්නයැයි කීහ. උන්වහන්සේලා පිඬු පිණිස හැසිර බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි වේලෙහි දී ලක්ඛණ තෙරුන් පෙරකී ප්‍රශ්නය විමසූහ. ඇවැත්නි, මම එක් ප්‍රේතයෙක් දැක සිනාසුනෙමි. ඔහුගේ හිස මිනිස් හිසකි. ශරීරය සර්පයෙකුගේ මෙනි. අහිප්‍රේත නම් වූ මොහුගේ සිරුර විසිපස් යොදුනක් පමණ දිග ය. නගුටෙන් නැගෙන ගිනිජාලා හිස දක්වා පැතිරෙයි. මැදින් නැගෙන ගිනිජාලා දෙපස දක්වා විහිදයයි. දෙපසින් නැගෙන ගිනි ජාලා මැද දක්වා නැගෙයි. මෙම අහිප්‍රේතයා දැක සිනා පහළ කළෙමි යි මුගලන් හිමියෝ පැවසූහ. බුදුරජාණන් වහන්සේ ද ඊට සාක්ෂි දරමින් මහණෙනි, මොග්ගල්ලාන කියන්නේ සැබෑවකි. මමත් බුදු වූ දින ම මේ ප්‍රේතයා දුටුවෙමි. එහෙත් අන්‍යයන් එය නොපිළිගන්නා බැවින් එයින් ඔවුන්ට වන අයහපත සලකා මම නොකීවෙමි යි වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා ස්වාමීනී, මෙසේ වීමට මේ ප්‍රේතයා කළ අකුසලය කුමක්දැයි විමසූහ.

ඊට පිළිතුරු දෙමින් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

අතීතයේ බරණැස් නුවර සමීපයෙහි ගං ඉවුරක පසේ බුදුරජාණන් වහන්සේ නමක් උදෙසා මිනිස්සු ආරාමයක් කරවා පූජා කළහ. එම පසේ බුදුරජාණන් වහන්සේ ද එම විහාරයෙහි වැඩවසමින් නිතිපතා නගරයේ පිඬු පිණිස හැසිරෙති. නුවරවාසීන් ද උදේ හවස සුවඳ මල් ආදිය රැගෙන උන්වහන්සේට උපස්ථාන කිරීමට යති. එසේ යන්නවුන් අසල ඇති කුඹුරක් මගින් එය පාගාගෙන යති. කුඹුර හිමි ගොවියා එසේ නොකරන ලෙස කොතෙක් කීවත් ඉන් පලක් නොවී ය. පසුව ඊට උපක්‍රමයක් ගැන සිතූ ඔහු පසේ බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස නගරයට වැඩි වේලෙහි ආවාසයට ගිනි තබා විනාශ කළේ ය. උන්වහන්සේ එය දැක වෙනත් තැනකට වැඩියහ. ජනයා ගිනිගත් ආරාමය දැක ගොවියා විසින් පන්සලට ගිනිතැබූ බව අසා ඔහුට තළලා පෙළලා මරා දැමූහ. හේ අවීචි මහා නරකයෙහි ඉපිද, නිරාදුක් විඳ අප බුදුරදුන් සමයෙහි ගිජුකුළු පව්වෙහි අහිප්‍රේතව උපන්නේ ය.

බුදුරජාණන් වහන්සේ මේ පුවත වදාරා මහණෙනි, පාපය නම් කිරි හා සමාන ය. කිරි නම් දෙවූ සැණින් නොමිදේ. එසේ ම පාපය ද කළ සැණින් පල නොදේ. යම් කලක පැසවා ද එකල මෙබඳු දුකෙන් ශෝක කෙරේ යැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**න හි පාපං කතං කම්මං - සජ්ජු ඛීරං ව මුච්චති**
**ඩහන්තං බාලමන්වෙති - භස්මච්ඡන්නො ව පාවකො**

**පදාර්ථ:-**

**කතං පාපකං කම්මං,** කරන ලද පාප කර්මය; **ඛීරං ඉව,** දෙනගෙන් දොවාගත් සැණින් කිරි නොමිදෙන්නාක් මෙන්; **සජ්ජු,** වහා; **නමුච්චති,** නොපැසවයි, විපාක නොදෙයි; **භස්මච්ඡන්නො පාවකො ඉව,** අළුයට ගිනි පුපුරු මෙන්; **ඩහන්තං,** දවමින්; **බාලං අන්වෙති,** පව්කළ අනුවණයා පසුපස එයි;

**විවරණය:-**
දෙනගෙන් දොවාගත් කිරි මිදෙන්නේ මුහුන් දමා දවසකට පමණ පසුව ය. එසේ ම අනුවණයා පව්කම් කරයි. දිට්ඨධම්මවේදනීය වශයෙන් එවෙලෙහි ම විපාක නොදුනහොත් එහි විපාක නැතැයි සිතා සතුටු වෙයි. නැතහොත් පව් කළාට වන විපතක් නැතැයි වැරදි දෘෂ්ටි ගනියි. එහෙත් ඒවා අළුයට ගිනි පුපුරු මෙන් නොපෙනී තිබී උපපජ්ජවේදනීය හෝ අපරාපරියවේදනීය වශයෙන් ඔහුට කවදා හෝ දුක්ඛ විපාක ගෙන දෙන්නේ ය.

## 4.5.1.13 අනුවණ බාලයාගේ ශිල්පය ඔහුට ම විපතක් වේ

තවත් දිනෙකගිජුකුළු පව්වෙන් බසින අතර මුගලන් තෙරුන් ගේ සිනහ පහළ කිරීමක් පිළිබඳ ව ලක්ඛණ තෙරණුවෝ බුදුරජාණන් වහන්සේ හමුවේ තොරතුරු විමසූහ. මා එහි දී එක්තරා ප්‍රේතයෙකු දුටුවෙමි. ඔහුගේ හිසට ගිනිගෙන දැවෙන රක්ත වර්ණ යකුළු(යකඩ පොළු) දහසක් පමණ වැටි වැටී උඩට විසිවෙයි. ඒ හැම වතාවක ම ඔහුගේ හිස බිඳි බිඳී යළිත් පැහෙයි. මේ ආත්ම භාවයේ දී මෙබඳු ප්‍රේතයෙකු මම දැක නැත, ඒ නිසා සිනහ පහළ කළෙමියි මුගලන් තෙරණුවෝ පැවසූහ. එකල් හි බුදුරජාණන් වහන්සේ මම ද බෝධි මණ්ඩපයේ වැඩ සිටිද්දී මෙය දුටුවෙමි. එය කෙනෙක් විශ්වාස නොකරනු ඇතැයි නොකීවෙමි යි, මුගලන් තෙරුන්ගේ කතාවට සාක්ෂි දැරූහ. එය ඇසූ භික්ෂූහු, ඔහුට මෙසේ වීමට හේතු වූ පෙර කළ කර්මය කුමක් දැයි විමසූහ. එවිට බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

මහණෙනි, අතීතයේ බරණැස් නුවර අතකුරු ගැසීමෙහි නිපුණත්වයට පැමිණි එක් පිළෙක් (කොර මිනිසෙක්) සිටියේ ය. හෙතෙම නුවර දොරටුවේ එක් නුගගසක් යට හිඳ ගල්කැටවලින් විද එම ගසේ කොළ සිදුරු කරයි. ඔහුගේ නිපුණත්වය දන්නා දරුවන් අපට ඇත් රූපයක්, අපට අස් රූපයක් දක්වන්නැයි කීවිට ඔවුන් කැමති රූපය අතකුරුවලින් ගසා විද කපා පෙන්වයි. එසේ කර ඔහු දරුවන්ගෙන් ආහාරපානාදිය ලබයි. දිනක් රජු උයනට යන අතර එතැනට පැමිණියේ ය. දරුවෝ පිළා නුග මුල් අතර සඟවා පලා ගියෝ ය. මධ්‍යාහ්නයෙහි පෙරලා එන රජු ගසේ කොළවල විවිධ රූප කොටා සිදුරු කර ඇති සැටි දැක මෙය කාගේ වැඩක්දැයි ඇසූහ. පිළාගේ වැඩක් යැයි කී කල ඔහු කැඳවා, මගේ පුරෝහිතයා ඉතා මුඛරි ය, වාචාල ය. මා එකක් කී විට ඔහු බොහෝ කතා කිරීම මට හිරිහැරයකි. ඔහු කතා කරන විට නැළියක් පමණ එළුබෙටි ඔහුගේ මුවට විදීමට පුළුවන්දැයි ඇසී ය. එසේය දේවයන් වහන්ස, නැළියක් පමණ එළුබෙටි ගෙන්වා තබා තිරයකින් එහා පැත්තේ සිට පුරෝහිතයා සමග කතා කරන්න. ඉතිරි හරිය මම කරමියි හෝ කීවේ ය.

රජු එකී ලෙස ම කළේ ය. ඔහු තිරයේ කුඩා සිදුරක් තනා රජු සමග කතා කරන පුරෝහිතයා කට අරින විට ම එළුබෙටි එක බැගින් විද්දේ ය. පුරොහිතයා මුවට එන එන එළුබෙටි හැමෙකක් ම රජුට බියෙන් හා ලැජ්ජාවෙන් නිහඬව ම ගිල දැම්මේ ය. පිළා එළුබෙටි අවසන් වූ පසු තිරය සොළවා සඥා කළේ ය. රජතුමා කාරණය දැනගෙන ආචාර්යයෙනි මෙතුවක් කල් මට ඔබේ කතාව සීමා කරන්නට නොහැකි වීමි. ඔබේ මුඛරිකම කොතෙක් ද යත් අද එළුබෙටි නැළියක් ගිලිදමන තුරු ම ඔබ නිහඬ නොවූයේ නොවේ දැයි පැවසීය. එයින් මහත් ලැජ්ජාවට පත් බමුණා එතැන් පටන් පමණට කතාකරන්නට පුරුදුවීය. රජතුමා පිළා කැඳවා මට නුඹ නිසා මහත් පහසුවක් වූයේ යයි තුටු පහටුව සියල්ල අට බැගින් දෙන සබ්බට්ඨක නම් පරිත්‍යාගය කොට නුවර සිව් දිසාවෙන් ගම්වර සතරක් ද දුන්නේ ය.

මේ පිළිබඳ ව දැනගත් එක්තරා පුරුෂයෙක් ඔහු හමු වී ආචාරීනි, ඔබගේ ශිල්පය මට දෙනු මැනවැයි ඉල්ලා සිටියේ ය. දරුව එය දීමට නොහැකි යැයි පිළා ප්‍රතික්ෂේප කළ විට කෙසේ හෝ ඔහු සතුටු කරවා ඉගෙනගනිමි යි සිතා ඔහුගේ අත්පා මෙහෙවර කර නැවත නැවත පෙරැත්ත කළේ ය. අන්තිමේ දී ඔහුගේ ඉල්ලීම බැහැර කළ නොහැකි වූ තැන ඔහුට ශිල්පය දෙන ලදී. මෙය පරීක්ෂාකර බැලීමට, හිමිකරුවෙක් නැති දඬුවම් නොලැබෙන කෙනෙකු සොයමින් සිටි ඔහුට පිණ්ඩපාතයේ වඩින සුනෙත්ත නම් පසේ බුදුවරයන් වහන්සේ හමුවිය. මොහුගේ නම් දෙමව්පිය නෑදෑයන් නැත්තේ යැයි සිතා එක් ගල් කැටයක් ගෙන දකුණු කන් සිදුරට විද්දේ ය. එය වම් කන් සිදුරු පසාරු කරගෙන එළියට ආවේ ය. එයින් අතිශය වේදනාවක් ඇතිවිය. පසුව උන්වහන්සේ ආපසු විහාරයට වැඩමකොට පිරිනිවන් පෑහ. දායකයන් පැමිණ බලා උන් වහන්සේ පිරිනිවන් පා ඇති බව දැක හඬා වැලපී මොහු විසින් එය සිදුකළායැයි ඔහු ම පිළිගත් නිසා තළා පෙළා මරා දැමූහ. එදා ම ඔහු අවීචි මහා නරකයෙහි ඉපිද දුක් විඳ අවුත් අප බුදුරදුන්ගේ සමයෙහි ගිජුකුළු පව්වෙහි සට්ඨිකූථ නම් ප්‍රේතව උපන්නේ යැයි වදාරා, බාලයාට වනාහි ශිල්පයක් හෝ ඉසුරක් ලැබීම අනර්ථයක් ම ගෙනදෙන්නේ යැයි වදාරමින් මේ ගාථාව දේශනා කළ සේක.

> **යාවදෙව අනත්ථාය - ඤත්තං බාලස්ස ජායති**
> **හන්ති බාලස්ස සුක්කංසං - මුද්ධමස්ස විපාතයං**

**පදාර්ථ:-**

**බාලස්ස,** දෙලෝ වැඩ නොදත් බාලයාගේ; **ඤත්තං,** දැනගත් ශිල්ප ශාස්ත්‍ර; **යාව දෙව අනත්ථාය එව ජායති,** ඔහුගේ ම අනර්ථය පිණිස ම පවතී; **අස්ස මුද්ධං,** ඔහුගේ ම හිස හෙවත් ප්‍රඥාව; **විපාතයං,** සිඳගෙන; **බාලස්ස,** බාලයාගේ; **සුක්කංසං,** හොඳ පැත්ත; **හන්ති,** නසා දමයි;

**විවරණය:-**

බොහෝ දෙනාට පෙර පිනෙන් යම් යම් ධන සම්පත්, යස ඉසුරු, දක්ෂකම් ආදිය සහජයෙන් ම ලැබේ. ඒවායින් නිසි ඵල ලබන්නට තරම් නුවණක් හෝ හික්මීමක් නැති අනුවණයන්ට ලැබුණු විට ඔවුන් ඒවා යොදවන්නේ තමාගේත් අනුන්ගේත් විනාශය පිණිස ය. එනිසා එබඳු අයට ඒ පිනට ලැබුණු දෙයින් තමා ම වැනසෙති.

## 4.5.1.14. තෘෂ්ණා මානයෙන් යුතු පැවිද්දට විදසුන් නුවණ නොවැඩේ

මච්ඡිකාසණ්ඩ නුවර චිත්ත නම් ගෘහපතියෙක් වාසය කළේ ය. පස්වග තෙර නමක් වූ මහානාම තෙරුන් පිඩු පිණිස වඩිනු දැක උන්වහන්සේගේ ඉරියව් පැවැත්ම පිළිබඳ පැහැදී පාත්‍රය රැගෙන තම නිවසට වැඩම කරවා දානය පිළිගන්වා දන්වළඳ අවසානයෙහි කළ ධර්මදේශනාව අසා චිත්ත ගෘහපතියා සෝවාන් විය. හේ තමා සතු වූ අම්බාටක වන නම් උයන සංඝාරාමයක් කරවා සතර දිසාවෙන් වඩින සංඝයාට පිදී ය. එම විහාරයෙහි සුධම්ම නම් හිමිනමක් නේවාසිකව වැඩ සිටියේ ය.

පසුකලෙක චිත්ත ගෘහපතියාගේ ගුණ අසා ඔහුට සංග්‍රහ පිණිස අගසව් දෙනාම එහි වැඩම කළහ. චිත්ත ගෘහපතියා උන්වහන්සේලා එහි වඩින පුවත අසා යොදුන් භාගයක් දුරගෙවා ගොස් පිළිගෙන තමන් කරවූ විහාරයට වඩමවාගෙන අවුත් ආගන්තුක සත්කාර කර ස්වාමීනි බණ ටිකක් අසනු කැමැත්තෙමියි කීවේ ය. ධර්ම සේනාපති වූ සැරියුත් තෙරුන් ගමන් විඩාව නොසලකා ධර්මය දේශනා කළහ. බණ අසන අතර ම හෙතෙම අනාගාමී ඵලයට පත් විය. ගෘහපති තෙම අගසවු දෙනමට දහසක් භික්ෂු සංඝයා සමග පසුදා සිය නිවසේ දනට ආරාධනා කළේය. අනතුරුව සුධම්ම හිමියන්ට ද ආරාධනා කළේ ය. තමාට පසුව ආරාධනා කළේයැයි කිපුණු උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. නැවත නැවතත් ආරාධනා කළත් ප්‍රතික්ෂේප කළහ. එසේ නම් ඔබවහන්සේ කරන දෙයින් ඔබවහන්සේ ම කවුදැයි ප්‍රකට වනු ඇතැයි කියා උපාසකතුමා ආපසු තම නිවසට ගොස් දානය සූදානම් කරවි ය.

පසුදින සුධම්ම තෙර චිත්ත ගෘහපතියාගේ දානයේ අසිරි බලමියි සිතා ගොස් ''ගෘහපතිය, සියල්ල තිබේ. එකක් අඩුයැයි කීය. ඒ කුමක්දැයි ඇසූ විට තලගුලි යැයි කීය. තලගුලි යනු ගෘහපතියාගේ පරපුරේ අයට උපහාසයට කියන නමකි. ඉන් ඔහුගේ සිත රිදුණේ ය. මේ කරුණ දැනගත් බුදුරජාණන් වහන්සේ චිත්ත ගෘහපතියා වෙත ගොස් පටිසාරාණීය කර්මය කරන්නට උන්වහන්සේ නියම කළහ. එනම්, භික්ෂුවක් සැදැහැවතෙකුගේ ශ්‍රද්ධාව බිඳෙන සේ ක්‍රියා කළේ නම් උන්වහන්සේ ඔහුවෙත ගොස් උක්කුටිකයෙන් හිඳ සමාව ගැනීමයි. සුධම්ම තෙරුන්ගේ මේ ක්‍රියාව නිමිති කරගෙන බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාළ සේක.

**අසතං භාවන මිච්ඡෙය්‍ය - පුරෙක්ඛාරං ච භික්ඛුසු**
**ආවාසෙසු ච ඉස්සරියං - පූජා පරකුලෙසු ච**

පදාර්ථ:-

(අඥාන භික්ෂු) **අසතං භාවනං,** අභිමි බුහුමන් ද; **භික්ඛුසු පුරෙක්ඛාරං ච,** භික්ෂූන්ගේ නායකත්වය ද; **ඉස්සරියං ච,** ආරාම අධිපතිකම ද; **පරකුලෙසු පූජා ච,** ගිහිගෙවල පුද පූජා ද; **ඉච්ඡෙය්‍ය,** යමෙක් කැමති වන්නේ ද;

**මමෙව කත මඤ්ඤන්තු - ගිහී පබ්බජිතා උභො**
**මමෙව අතිවසා අස්සු - කිච්චාකිච්චෙසු කිස්මිචි**
**ඉති බාලස්ස සඞ්කප්පො - ඉච්ඡා මානො ච වඩ්ඪති**

පදාර්ථ:-

**ගිහී පබ්බජිතා උභො,** ගිහි පැවිදි දෙපාර්ශවය ම; **මමෙව කත මඤ්ඤන්තු,** මේ විහාරයෙහි හැම කටයුත්තක් මා විසින් කරන ලද ඒවා යයි සිතත්වා; **කිච්චාකිච්චෙසු කිස්මිචි මමෙව අතිවසා අස්සු,** කුඩු මහත් සියලු කටයුතු මගෙන් ම අසා කෙරෙත්වා; **ඉති බාලස්ස සංකප්පො,** යම් බාලයෙකුට මෙබඳු සංකල්ප උපදී ද එයින්; **ඉච්ඡා මානො ච වඩ්ඪති,** තෘෂ්ණාව උපදින්නේ ය. මානය ද වැඩෙන්නේ ය;

## 4.5.1.16 ආමිස ලාභය නිවනට මග නොවේ

අගසවු සැරියුත් තෙරුන්ගේ පියා වූ වංගන්ත බමුණාගේ යහළුවෙකු වූ මහාසේන නම් බමුණෙක් රජගහ නුවර වාසය කරයි. දිනක් සැරියුත් තෙරණුවෝ පිණ්ඩපාතය වඩින වේලෙහි තම පියාගේ මිතුරු බමුණා සිහිපත් වී ඔහුට අනුකම්පා පිණිස ඔහුගේ නිවසට වැඩියහ. ඔහු දැන් සම්පත් සිඳීගිය දිළිඳු බමුණෙකි. ඔහු දුරදී ම සැරියුත් හිමියන් දැක මගේ පුතා පිඬු පිණිස වඩිනවා විය යුතු ය. මම දුප්පතෙක්මි. මගේ දිළිඳු බව උන්වහන්සේ නොදන්නවා විය හැකි ය. මා සතුව දියයුතු දෙයක් නැතැයි මුණනොගැසී සැඟවුනේ ය. තෙරණුවෝ තවත් දවසක් එහි වැඩියත් එදින ද ඔහු සැඟවුනේ ය.

පසුව එක් දිනක් යාගහෝම කර්මයකට සහභාගී වී එයින් ලැබුණු දළරෙදිකඩක් හා කිරිබත් තැලියක් ගෙන ගෙට ගොස් සැරියුත් තෙරුන් සිහිපත් කොට මෙය තෙරුන් වහන්සේට පුදන්නට ලැබෙන්නේ නම් මැනවැයි සිතුවේ ය.

එවෙලේ ධ්‍යානයට සමවැදී සමවතින් නැගී සිටි සැරියුත් තෙරණුවෝ දිවැසින් එය දැක ඔහුගේ නිවස ඉදිරිපිටට වැඩි සේක. තෙරුන් වහන්සේ දැක මහත් සේ සතුටට පත් හෙතෙම උන්වහන්සේ නිවස තුළට වඩමවා වඩා හිඳුවා වැඳ පිළිසඳර කතා කොට කිරිබත් තලිය ගෙන උන්වහන්සේගේ පාත්‍රයෙහි බහාලී ය. තෙරුන්වහන්සේ අඩක් පිළිගෙන අතවැසූහ. බමුණා ස්වාමීනි, මේ පායාසය එක් අයෙකුට පමණක් සෑහේ මට පරලොවින් සංග්‍රහ කරන්න මෙලොවින් සංග්‍රහ අවශ්‍ය නැතැයි කියා කිරිබත් සියල්ල පාත්‍රයට බෙදුවේ ය.

තෙරණුවෝ ද එහි ම සිට දානය වැළඳූහ. වළඳ අවසන් වූ පසු හෙතෙම සාටකයත් පූජා කොට වැඳ ස්වාමීනි, ඔබ දුටු දහම මමත් දකින්නට කැමැත්තෙමි යි ප්‍රකාශ කළේ ය. උන්වහන්සේ අනුමෝදනා දේශනා කොට ආපසු වැඩියහ. දිළිඳු කල දුන් දනය අතිශයින් ම බබලන්නේ ය. බමුණා සතුටු සිතින් සැරියුත් තෙරුන් කෙරෙහි ස්නේහ උපදවාගෙන ම පසු කලෙක කලුරිය කළේ ය.

එසේ කළුරිය කළ ඔහු සැවැත් නුවර සැරියුත් තෙරුන්ට උපස්ථාන කරන පවුලක පිළිසිඳගත්තේ ය. ඔහුගේ මවට සැරියුත් හිමියන් ප්‍රමුඛ මහාසංඝයා වහන්සේ 500ක් උදෙසා දිය නුමුසු ක්ෂීරපායාස පිළිගන්වා තමා ද කසාවතක් හැඳ කසාවතක් පොරවා භික්ෂුවන් වහන්සේලාගේ ආසන කෙළවර වාඩි වී උන්වහන්සේලා වළඳා ඉතිරි ආහාර වැළඳීමට දොළදුකක් උපන්නේ ය. එය දරුවා බුදු සසුනේ පැවිදිවන බවට වූ පෙර නිමිත්තකි. අනතුරුව ඇගේ ස්වාමියා ඇතුළු නෑයන් එක්ව එම දොළදුක සංසිඳ වූහ. දරුවා බිහිවෙන තුරුම විවිධ මංගල අවස්ථාවල දී සැරියුත් තෙරුන් ප්‍රමුඛ 500ක් භික්ෂූන්ට මිහිරි ක්ෂීරපායාස ආදි දානයන් දෙන ලදි. මේ සියල්ල ඔහු බ්‍රාහ්මණ කාලයේ දුන් දනයේ ආනිශංස නිසා ලැබුණේ විය.

දරුවා උපන්ද පටන් සත් වසක් යනතුරු ම මෙවැනි විවිධ මංගල සම්මත අවස්ථාවන් හිදී දන මානාදිය සැරියුත් තෙරුන් ප්‍රමුඛ මහා සංඝරත්නය උදෙසා පූජා කරන ලදි. එසේ ම කුමාරයාට තිස්ස යයි නම් ද තබන ලදී. දරුවා සත් හැවිරිදි වියේදී පැවිදි වීමට මවගෙන් අවසර පැතුවේ ය. මව ද ඉතා කැමැත්තෙන් මහත් උත්සවයක් කොට පුතු පැවිදි කළා ය. එසේ ම සත් දිනක් ම දියනුමුසු කීරපායාසය ම පූජා කළා ය. උන්වහන්සේ පැවිදි වී

අටවෙනි දින භික්ෂූන් වහන්සේලා සමග පිණ්ඩපාතයේ වැඩම කළහ. සැවැත්නුවර වැසියෝ අද සාමණේරයන් වහන්සේ පිඬු පිණිස වඩිති අපි උන්වහන්සේට සත්කාර කරන්නෙමු යි ගැල් පන්සීයක බඩු පුරවාගෙන පැමිණ පන්සිය නමකට දෙදිනක් පිණ්ඩපාත දනය පූජා කළහ. එබැවින් උන්වහන්සේ පිණ්ඩපාතදයකතිස්ස නමින් හඳුන්වන ලදි. එක්තරා ශීත කාලයක පෙරවීමට කම්බිලි නොමැති භික්ෂූන් වහන්සේලා ගිනිමැල ගසා ගෙන ශීතල දුරු කරගනු දුටු උන්වහන්සේ ප්‍රමුඛ වී කම්බිලි දහසක් භික්ෂූන් උදෙසා පූජා කරවූහ. එනිසා උන්වහන්සේ කම්බිලිදයකතිස්ස නමින් ද හඳුන්වනු ලැබූහ. එසේ ම මහ වනයට වැදී භාවනා කරන විට වනවාසි තිස්ස නමින් ද ප්‍රකට වූහ. මේ අයුරින් සත් වසක් තුළ නම් හතරකින් ම උන්වහන්සේ හඳුන්වන ලදි. පසුව උන්වහන්සේ ඉතා දුර ඈත ප්‍රදේශය වනයකට ගොස් භාවනා වඩා රහත් වූහ. මෙසේ ගිය ඒ ප්‍රදේශයේදී වුව ද උන්වහන්සේට ප්‍රත්‍ය පහසුකම්වලින් අඩුවක් නොවී ය. තිස්ස සාමණේරයන් දැකීමට ගිය උපාධ්‍යායන් වහන්සසේ වූ සැරියුත් තෙරුන් ඇතුළු දහසක් භික්ෂූන්ට ද ඉතා ප්‍රණීත ආහාර පානාදියෙන් ඒ ප්‍රදේශයේ මිනිස්සු සංග්‍රහ කළහ. භික්ෂූන් මේ තිස්ස හිමියන් කළ දනාදී පිංකම් පිළිබඳ කළ කතා බහ අසා මහණෙනි දනමානාදී ආමිසය ලැබීම එක් දෙයකි, නිර්වාණය ලැබීම නම් වෙනත් දෙයකි යි වදරමින් භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ සේක.

**අඤ්ඤා හි ලාභූපනිසා - අඤ්ඤා නිබ්බාණගාමිනී**
**එවමෙතං අභිඤ්ඤාය - භික්ඛු බුද්ධස්ස සාවකො**
**සක්කාරං නාභිනන්දෙය්‍ය - විවෙක මනුබ්‍රෑහයෙ**

පදාර්ථ:-

**අඤ්ඤා හි ලාභූපනිසා,** ලාභ හෙවත් ලැබීම වෙනත් එකකි; **අඤ්ඤා නිබ්බාණගාමිනී,** නිවන්මග අනෙකකි; **එවමෙතං අභිඤ්ඤාය,** මෙසේ ලාභ උපදවන පිළිවෙතත් නිවන් මාර්ගයත් දැන හැඳින ගන්නා; **භික්ඛු බුද්ධස්ස සාවකො,** බුද්ධ ශ්‍රාවක භික්ෂුව; **සක්කාරං නාභිනන්දෙය්‍ය,** සත්කාරයෙන් සතුටු නොවිය යුතු ය; **විවෙක මනුබ්‍රෑහයෙ,** කාය විවේකාදී ත්‍රිවිධ විවේකය උතුම්කොට වැඩිය යුතු ය;

විවරණය:-

වනවාසී තිස්ස තෙරුන්ගේ ලාභ ලැබීම මහ ඉහලින් ප්‍රසිද්ධ වූ කරුණක් විය. බුදුවරු කවදත් ලාභ සත්කාර ලැබීම මහ දෙයක් කොට නොසලකති. ලාභ ලබන මාර්ගය වෙනත් එකකැයි කීවේ නැති ගුණ පෙන්වීම්, රැවටීම් ආදී උපක්‍රමවලින් ද නැකැත් කීම් යන්ත්‍ර මන්ත්‍ර කිරීම් ආදී වැරදි ජීවිකාවන්ගෙන් ද තමා ලඟ තිබෙන ධර්ම කථිකත්වය ආදී හපන්කම් පෙන්වීමෙන් ද ඇති තරම් ලාභ ඉපදවිය හැකි ය. එහෙත් එය ගිහියන් සේ ම ලෞකික සැප උදෙසා කරන්නාක් මිස නිවන්මග නොවන හෙයිනි. නිවන් මග නම් විවේකයයි.

විවේක තුනකි. **කාය විවේකය** යනු ගිහි සමූහයාගෙන් මෙන්ම පැවිද සමූහයාගෙන් ද වෙන්ව හුදකලාව වාසයයි. **චිත්ත විවේකය** නීවරණ ධර්ම මැඩ පවත්වා සිත කෙලෙසුන්ගෙන් ඈත් කර ගැනීමයි. **උපධි විවේකය** යන සියලු සංස්කාර ධර්මයන්ගෙන් මිදී රහත් බවට පැමිණීමයි. මේ අනුව ලාභ සත්කාර ලැබීමේ ආශාවෙන් පෙළෙන්නාට අවම වශයෙන් කාය විවේකයවත් ලැබිය නොහැකි ය.

**අභ්‍යාස**

01. ධම්මපදය තුළින් ත්‍රිපිටකය ම දැකගත හැකි බවට හේතු සාධක ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
02. ධම්මපදයේ බාල වග්ගය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
03. බාල වග්ගයට අදාළ ගාථා හා අර්ථ වනපොත් කර මතකයෙන් දක්වන්න.
04. බාල වග්ගයේ ගාථාවක් තෝරාගෙන එහි නිදාන කතාව ඇසුරෙන් ධර්ම දේශනාවක් ඉදිරිපත් කරන්න.

# 18 පාඩම
# නුවණැති සත්පුරුෂයා
## (පණ්ඩිත වග්ගය)

**දිට්ඨෙව ධම්මෙ යො අත්ථො යොචත්ථො සම්පරායිකො අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චති.**

යමෙක් මෙලොව දියුණුවත් පරලොව දියුණුවත් යන දෙක ම දන්නේ නම් හෙතෙම පණ්ඩිතයෙකැයි කියනු ලැබේ යනු දහමෙහි පණ්ඩිතයා හඳුන්වා ඇති ආකාරය යි. පණ්ඩිත යන නම ඇසුණු පමණින් අප සිතට නැගෙන්නේ බොහෝ දුරට පිරිපුන් දැනුමක් ඇති බහුශ්‍රැතයෙකු යන්න යි. එහෙත් බුදුරජාණන් වහන්සේ පණ්ඩිතයා යැයි හැඳින්වූයේ එසේ හුදෙක් ලෞකික ශබ්ද ශාස්ත්‍ර ආදිය පිළිබඳ දැනුම ඇත්තෙකු පමණක් නොවන බව ඉහත සඳහන් විග්‍රහයෙන් පෙනී යයි. එම විවරණයට අනුව කිසිම ශිල්ප ශාස්ත්‍රයක් ප්‍රමාණවත් පරිදි නොහදාළ කෙනෙකු වුවද පණ්ඩිතයෙකු විය හැකිය. අවශ්‍ය වන්නේ හොඳ නරක පිළිබඳ දැනුම සහ නරක බැහැර කොට හොඳ තෝරාගෙන ඒ අනුව ජීවත් වන කෙනෙකු වීමේ සමත්කමයි.

ධම්මපදයේ පණ්ඩිත වර්ගය මේ ආකාරයට පණ්ඩිතයෙකුගේ ස්වභාවයත්. ඔහු තමා සකස් වී නිසි මග යන අතර අනුන්ට ද මග පෙන්වන ආකාරයත් පැහැදිලි කරනවා පමණක් නොව එබඳු පණ්ඩිතයන් ඇසුරු කරන ලෙසත් අවවාද ලබාදෙයි. මෙම වර්ගය ගාථා 14කින් හා ධම්මපද අටුවාවේ එන නිදාන කථා 11කින් සමන්විත වේ.

### 4.5.2.1. වරද පෙන්වීම නිධානයක් දක්වීම හා සමාන වේ.

සැවැත්නුවර රාධ නම් බමුණෙක් විය. හේ දුගියෙකි. කාත් කවුරුත් නැති අසරණයෙකි. ජීවත් වීමට ක්‍රමයක් නැති තැන හෙතෙම විහාරස්ථානයට ගොස් භික්ෂූන් වහන්සේගේ පිහිටෙන් ජීවත් විය. හෙතෙම දිනපතා වෙහෙර මළු අමදියි. කුණු කසළ ඉවත් කරයි. භික්ෂූන් වහන්සේලාට සිසිල් පැන් උණු පැන් සැපයීම් ආදී කුදු මහත් කටයුතු කරයි. සංඝයා ද ඔහුට කරුණාවෙන් ඇප උපකාර කළත් පැවිදි කළ යුතුයැයි සිතුවේ නැත. එහෙත් ඔහුගේ ආශාව වූයේ පැවිදි වීමයි. මේ ආශාවෙන් ම ඔහු කෘෂ වී ගියේ ය.

දිනක් බුදුරජාණන් වහන්සේ අළුයම ලෝ බලා වදාරන සේක් මේ රාධ බමුණා දුටහ. ඔහුට රහත් වීමට තරම් පින් ඇති බව දුටු උන්වහන්සේ විහාර චාරිකාවේ හැසිරෙන න්‍යායෙන් බමුණා සිටි වෙහෙරට වැඩියහ. බමුණා හමු වූ උන්වහන්සේ ඔබ මෙහි කුමක් කරන්නේහි දැයි විමසූහ. ස්වාමීනි, මම භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කරමින් වෙසෙමි' යි හේ කීය. ඔබට උන්වහන්සේලා ඊට සංග්‍රහ කරත්දැයි බුදුරජාණන් වහන්සේ විමසූහ.

'ස්වාමීනි, ආහාර ටික නම් ලැබේ. එහෙත් මාව පැවිදි කරගන්නේ නැතැයි' හේ කීය.

බුදුරජාණන් වහන්සේ අනතුරුව මහා සංඝයා රැස් කොට මහණෙනි, ඔබ කාහට හෝ මේ බමුණාගෙන් ලැබුණු විශේෂ උපකාරයක් මතක ඇද්දයි ඇසූහ. එවිට සැරියුත් තෙරණුවෝ ස්වාමීනි, මොහු මට දිනක් මා පිඬු පිණිස යන අතර බත් හැන්දක් පිදූ බවක් මතක ඇතැයි කීහ. එවිට බුදුරජාණන් වහන්සේ සාරිපුත්තය, ඔබට එසේ උපකාර කළ මොහු දුකින් මිදෙව්වොත් නොවටීදැයි ඇසූහ. එවිට සැරියුත් තෙරුන් වහන්සේ 'ස්වාමීනි, මැනවැයි' කියා ඔහු පැවිදි කළ හ.

දන් හලෙහි නිතර ම සංඝයාගේ කෙළවර ආසනය ලැබෙන මේ මහලු තෙරුන්ට ආහාර පාන ලැබෙන්නේත් ටික ය. මේ බව දැනගත් සැරියුත් තෙරණුවෝ උන්වහන්සේ තමන් යන ගමන්වලට කැඳවාගෙන යන්නට පුරුදු වූහ. මහලු වයස දක්වා ආ පුරුදු දුරුකර ගැනීමට නිතර අවවාද අනුශාසනා කළහ. මහණකමෙන් පල ලැබිය හැකි ආකාරය කියා දුන්හ.

රාධ තෙරණුවෝ ඉතා කීකරු ය. දොස් දැක්වූ විට නොකිපෙයි. දෙන අවවාද හිස් මුදුනින් පිළිගනී. ඒ නිසා ම ඒ අවවාද අනුශාසනා පිළිපැද උන්වහන්සේ නොබෝ දිනකින් ම රහත් බවට පත්වූහ. සැරියුත් තෙරුන් වහන්සේගේ මේ කෙළෙහිගුණ සැලකීමත්, දුගී බමුණාට උපකාර කිරීමත්, රාධ තෙරුන්ගේ කීකරු යටහත් පහත් බවත් පිළිබඳ ව දිනක් දම් සභාවේ දී භික්ෂූන් වහන්සේලා අතර කතා බහක් ඇති විය. ඒ වේලෙහි භාග්‍යවතුන් වහන්සේ මේ සාරිපුත්‍ර දැන් පමණක් නොව පෙරත් මෙසේ ම කෙළෙහි ගුණ දන්නා කෙළෙහි ගුණ සලකන කෙනෙකැයි වදාරා අලීන චිත්ත ජාතකය වදාළ සේක. අනතුරුව රාධ තෙරුන්ගේ කීකරුකමත් අවවාද අනුශාසනාවල දී නොකිපෙන සුලු හික්මීමත් නිමිති කරගෙන මේ ගාථාව වදාළ සේක.

**නිධීනං ව පවත්තාරං**
**යං පස්සෙ වජ්ජදස්සිනං**
**නිග්ගය්හවාදිං මෙධාවිං**
**තාදිසං පණ්ඩිතං භජෙ**
**තාදිසං භජමානස්ස**
**සෙය්‍යො හොති න පාපියො**

**පදාර්ථ:-**

**වජ්ජදස්සිනං**, වරද පෙන්වන්නා වූ; **නිග්ගය්හවාදිං**, ඇතැම් වරදකට නිග්‍රහ පවා කොට අවවාද කරන සුලු; **යං මෙධාවිං පස්සෙ**, යම්කිසි ඥාණවන්තයෙකු හමුවුවහොත්; **තාදිසං පණ්ඩිතං භජෙ**, එබඳු පණ්ඩිතයා ඇසුරු කරන්න; **තාදිසං භජමානස්ස**, එබඳු කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්නාට; **සෙය්‍යො හොති න පාපියො**, දියුණුවක් වන්නේ ය පිරිහීමක් නම් නොවන්නේ ය.

**විවරණය :-**

නිධානයක් යනු මතු කලෙක ප්‍රයෝජනය සඳහා ධනවතුන් විසින් පොළොව යට සඟ වන ලද රන්, රිදී, මුතු, මැණික් ආදී කවදත් ප්‍රයෝජනයට ගත හැකි ධනය යි. යම්කිසි හිතවතෙක් දුගී දුප්පතෙකුට එබඳු නිධානයක් පෙන්වන්නේ නම් එය ඔහුට කියා නිම කළ නොහැකි උපකාරයකි. ගුරුවර වැඩිහිටි ආදී කෙනෙකු අපට අපේ දොසක් පෙන්වීමත් එබඳු ය. එය දොස් සහිතව සිටියොත් අනාගතයේ දී මෙලොව පමණක් නොව පරලොව දී හෝ විය හැකි අවමාන දුක් කරදරවලින් අප මුදාගැනීමක් වන්නේ ය. වරද දක්වන විට අමනාප වීම, මුහුණ නරක් කර ගැනීම, දියුණුවෙන තැනැත්තාගේ ලක්‍ෂණ නොවේ. ගුරුවරයාගෙන් වරදරට නිග්‍රහ ලබන්නා, ගුටි බැට ලබන්නා, මතු දවසක ලෝකයාගෙන් පුදපූජා ලබන්නේ ය.

### 4.5.2.2. සත් පුරුෂයෝ අවවාද ප්‍රිය කරන්නෝ ය.

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන එක් සමයෙක දැග සව්වන් වහන්සේලාගේ සද්ධිවිහාරික වූ අස්සජී, පුනබ්බසුක යන භික්ෂූන් දෙදෙනා කීටාගිරියේ වාසය කළ හ. ඔවුහු අලජ්ජී පවිටු භික්ෂූන් ලෙස නම් දරා සිටි ඡබ්බග්ගිය නම් කණ්ඩායමට අයත් දෙදෙනෙක් වූහ. ඔවුහු මල් වවා ගිහියන්ට දීම් ආදී සැදැහැවතුන්ගේ ශ්‍රද්ධාව දූෂණය වන නොයෙකුත් අකටයුතුකම් කරමින් ඒවායෙන් ලැබෙන ලාභයෙන් යැපෙමින් එම ආවාසය සුපේශල ශික්ෂාකාමී භික්ෂූන්ට විසිය නොහැකි තැනක් බවට පත් කළ හ.

බුදුරජාණන් වහන්සේ ඒ පුවත අසා අගසව් දෙනම අමතා ඔබ එහි ගොස් ඔවුන්ට පබ්බාජනීය කර්මය පනවා එය පිළිගන්නා අයට අවවාද අනුශාසනා කරන්න. එසේ කරන අවවාද අනුශාසනා සත්පුරුෂයන්ට ප්‍රිය වන්නේ ය. අසත් පුරුෂයන්ට අප්‍රිය වනු ඇතැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**ඔවදෙය්‍යානුසාසෙය්‍ය**
**අසබ්භා ච නිවාරයෙ**
**සතං හි සො පියො හොති**
**අසතං හොති අප්පියො**

**පදාර්ථ:-**

**ඔවදෙය්‍ය අනුසාසෙය්‍ය,** යමෙක් කෙනෙකුගේ දියුණුව කැමති ව අවවාද අනුශාසනා කරන්නේ ද; **අසබ්භා ච නිවාරයෙ,** අකුසලයන්ගෙන් වළක්වයි ද; **සො,** ඒ කල්‍යාණ මිත්‍රයා; **සතං හි පියො හොති,** සත්පුරුෂයන්ට ම ප්‍රිය වේ; **අසතං අප්පියො හොති,** අසත් පුරුෂයන්ට අප්‍රිය වේ.

**විවරණය:-**

පබ්බාජනීය කර්මය යනු කිසියම් භික්ෂුවක් යම් ආවාසයක භික්ෂූන්ට හිරිහැර වන පරිදි ඒ ආවාසයේ වාසය කිරීමට නොහැකිවන පරිදි කටයුතු කරයි නම් හෝ දායකයාගේ

ශ්‍රද්ධාව නැතිවන ආකාරයේ ගනුදෙනු ආදී කුල දූෂක පව්ටු අකටයුතුකම් කරයි නම් හෝ ඒ භික්ෂුව සංඝයාගේ සම්මතයෙන් එම ආවාසයෙන් නෙරපීම යි. මෙය ද සප්ත අධිකරණ සමථවලින් එකකි. මෙය පණවන ලද්දේ මේ කියන කීටාගිරියෙහි විසූ අස්සජි පුනබ්බසුක දෙනමගේ පව්ටුකම් නිසා ඔවුන් ඒ ආරාමයෙන් නෙරපීමට යි. චුල්ලවග්ග පාළියේ කම්මක්ඛන්ධක යෙහි සඳහන් පරිදි යට කී දේ පමණක් නොව ගිහි ගෙවල් සමග අසීමිත සබඳකම් පවත්වමින් ගිහියන් මෙන් ගනුදෙනු, කෙළි සෙල්ලම්, එකට කෑම් බීම් ආදී නොයෙකුත් අශෝභන අශ්‍රාමණික ක්‍රියා මොවුන් සිදුකර තිබේ.

ඔවුන් අවවාදයෙන් හික්මවිය නොහැකි විය. අවවාද කරන ඇත්තන් පවා ඔවුන්ට අප්‍රිය විය. ඔවුන් කැමති වූයේ තමන්ට රිසිසේ ඒ ඒ කටයුතු කරගෙන විසීම යි. මෙය කවරෙකු විසින් කවර තැනක සිදුකළත් සංඝ ශාසනයටත් බෞද්ධ සමාජයටත් හානියක් ම වන බැවින් එබඳු භික්ෂූන් එම ආවාසවලින් නෙරපන්නට නියමකොට වදාරණ ලදි. මෙය ශාසනික අධිකරණ නියමයකි. අද වුවත් කැමති නම් සංඝයා ට එය ක්‍රියාත්මක කළ හැකි ය.

### 4.5.2.3. ඇසුරට සුදුසු කල්‍යාණ මිත්‍රයෝ

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙති. බෝසත් අවධියෙහි උන්වහන්සේ සමඟ සමීපව සිටි ඡන්න අමාත්‍යවරයා ද පැවිදිව ඒ වෙහෙරෙහි ම විසුවේ ය. පැවිදි වුවත් බුදුරදුන්ගේ සමීපතම පුද්ගලයා තමා ය යන මානයෙන් හෙතෙම දැපී සිටියේ ය. බුදුරදුන් වෙත පසුව පැමිණි ඇත්තන් ශාසන භාරධාරීන් ලෙස වගකිවයුතු තැන්වල සිටිනු දැකීම උන්වහන්සේට නුරුස්සන්නක් විය. ඒනිසා නොහික්මුණු කතා කියමින් සංඝයාට අවමන් කළේ ය. ''එදා මහබිනික්මන් නික්මෙන දවසේ අපේ ස්වාමියා සමඟ සිටියේ මා පමණි. අද සිටින කිසිවෙක් එදා සිටියේ නැත. දැන් නම් මා සාරිපුත්‍ර ය, මා මොග්ගල්ලානය, අපි අගසව්වෝ වෙමු ය කියමින් හැසිරෙන අය බොහෝ ය'' යනාදි වශයෙන් අගසවු තෙරුවරුන්ටත් නිතර ම ආක්‍රෝෂ පරිභව කළේ ය.

බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ කැඳවා කොතෙකුත් අවවාද කරති. ඒ මොහොතේ නිහඬ ව සිටින ඡන්න හිමියෝ නැවතත් ඒ වරද ම කරති. ඒ නිසා අවසානයේ බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ කැඳවා ඡන්න, අගසවු දෙනම ඔබට කල්‍යාණ මිත්‍රයෝ දෙදෙනෙකි. උතුම් පුරුෂයෝ ය. එබඳු කල්‍යාණ මිත්‍රයන්ට දෝෂාරෝපණය නොකොට ඔවුන් ඇසුරු කරන්නැයි අවවාද කරමින් මේ ගාථාව දේශනා කළ සේක.

න භජෙ පාපකෙ මිත්තෙ
න භජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ
භජෙථ පුරිසුත්තමෙ

**පදාර්ථ:-**

**පාපකෙ මිත්තෙ**, පවිටු මිතුරන්; **න භජෙ;** ඇසුරු නොකරන්න; **පුරිසාධමෙ**, අධම හෙවත් ඉතාම නරක පුද්ගලයන්; **න භජෙ**, ඇසුරු නොකරන්න; **කල්‍යාණෙ මිත්තෙ**, සත්පුරුෂ කල්‍යාණ මිත්‍රයන්; **භජෙථ**, ඇසුරු කරන්න; **පුරිසුත්තමෙ**, සීලයෙන්, ගුණයෙන්, තපසින් උතුම් පුරුෂයන්; **භජෙථ**, ඇසුරු කරන්න.

**විවරණය:-**

මෙහි මිත්ත යන්න යෙදී ඇත්තේ කෙනෙකු තමන්ට හිතවත් යැයි තමන්ට හොඳයැයි විශ්වාස කරන, ඇසුරු කරන, අනුගමනය කිරීමට පවා පෙළඹෙන පුද්ගලයන් ගැන ය. කවරෙක් වුවත් තමා නොමග යවන, නොමග දෙසන කෙනෙක් නම් තමාට කොතරම් ප්‍රිය වුවත් ඔහු පවිටු මිතුරකි. බුදුරජාණන් වහන්සේ මේ ලෝකයේ මනුෂ්‍යයාට සසර නොමගට යාමට මූලික ම හේතුව ලෙස අංගුත්තර නිකායේ දසක නිපාතයේ අවිජ්ජා, තණ්හා සූත්‍රවල දී දක්වා ඇත්තේ අසත්පුරුෂ සේවනයත් ඔවුන්ගේ ධර්මයට හෙවත් ඉගැන්නුම් බහට අනුගත වීමත් ය.

බුදුරජාණන් වහන්සේ ඡන්න තෙරුන්ට අවවාද කරන්නේ උන්වහන්සේගේ අදහස්වලට පක්ෂව උන්වහන්සේ අමාරුවේ දමන පවිටු මිතුරන් වෙනුවට සැරියුත් මුගලන් තෙරවරුන් වැනි සත්පුරුෂයන් ආශ්‍රය කරන ලෙස ය. එහෙත් ඡන්න තෙරුන් කිසිදා ඒ අවවාදවල පිහිටියේ නැත. බුදුරදුන් පිරිනිවන්පාන තුරුත් මේ මුරණ්ඩු කමින් ම සිටියේ ය. පිරිනිවන් පාන අවස්ථාවේ දී ඡන්න තෙරුන්ට කුමක් කරන්නදැයි විමසූ විට බ්‍රහ්මදණ්ඩය පණවන ලෙස භික්ෂූන්ට නියම කළහ. බ්‍රහ්මදණ්ඩය යනු සංඝයා සහමුලින් ම උන්වහන්සේ ඇසුරින් ඉවත් වීම ය. කතාබහ පවා නැවත්වීම යි. එයින් සංවේගයට පත් වී භික්මුණු ඡන්න තෙරණුවෝ පසුව සිව්පිළිසිඹියාපත් රහත් බවට පත් වූහ.

## 4.5.2.4 දහම් රස බොන්නා සුවසේ වෙසේ.

මහා කප්පින තෙරණුවෝ අතීතයේ පදුමුත්තර බුදුරජාණන් හමු වේ කළ ප්‍රාර්ථනා ඇති කෙනෙකි. සසර සැරිසරමින් පැමිණි එතුමා බරණැස සමීපයේ පේෂකාර ගමක ගම් දෙටුවා වී උපන්නේ ය. එකල දහසක් පමණ පසේ බුදුවරයන් වහන්සේලා වෙනුවෙන් ගම්වැසියන් හා එක් ව ආරාම කරවා වස්වසවා ගෙන උපස්ථාන කොට වස් අවසානයේ තුන්සිවුරු දහසක් ද පූජා කළේ ය. මේ පිනෙන් සියලු දෙනා මියපරලොව ගොස් තව්තිසා දෙව්ලොව උපන්හ. නැවත කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ සමයෙහි දී බරණැස උපන් ඒ සියලු දෙනා ම එක්ව විහාර කර්මාන්තයක් කර බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාට පූජා කළහ. ඒ වෙනුවෙන් සත්දිනක් මහ දන් පවත්වා තුන් සිවුරු විසි දහසක් ද පූජා කළහ. ආයුෂ කෙළවර නැවත තව්තිසා දෙව්ලොව ම ඉපිද අප බුදුන් සමයෙහි කුක්කුටවතී නගරයේ රජ කුලයක උපන්නේ ය. හෙතෙම නමින් මහා කප්පින නම් විය. සෙසු පිරිස ද එහි ම රජුගේ මැති ඇමති පිරිස ලෙස උපන්හ.

දිනක් එහි පැමිණි වෙළෙඳුන් පිරිසකගෙන් ඔවුන්ට බුදුරජාණන් වහන්සේ ගැන දැනගන්නට ලැබිණ. රජු හා මැති ඇමති පිරිස බුද්ධ යන නම ඇසූ පමණින් සසර පුරුදු පරිදි සැදැහැයෙන් පිරුණු සිත් ඇතිව බුදුරජාණන් වහන්සේ බැහැ දකිනු සඳහා පිටත් වූහ. භාග්‍යවතුන් වහන්සේ එදින හිමිදිරියේ ම මහාකරුණා සමාපත්තියට සමවැදී ලොව බලන වේලෙහි මේ පිරිස දුටුහ. උන්වහන්සේ පෙරමගට වැඩම කරවා එක් නුග ගසක් යට වැඩහ හුන්හ. පිරිස බොහෝ දුර ගෙවා එතැනට පැමිණියහ. එතැනදී ඔවුහු බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා සෝවාන්ව පැවිදි වූහ. එසේ ම ඔවුන්ගේ බිරින්දෑවරුන් ද පසුව පැමිණ එක් භික්ෂුණී ආරාමයකදී පැවිදි වූහ. බිරින්දෑවරුන්ට කළ ධර්ම දේශනාව අසා මහාකප්පින තෙරුන් ඇතුළු පිරිස රහත් වූහ. ඒ රහතන් වහන්සේලා දහස් නම ම අනතුරුව අහසින් ම දෙව්රම් විහාරයට වැඩම කළෝ ය. එහි දී මහාකප්පින තෙරණුවෝ ලැබූ රහත් ඵල සමවත් සුවය පිළිබඳ උදම් අනමින් ''**අහො සුඛං, අහො සුඛං** යයි නිතර ම කියති. මෙය අසා සිටි භික්ෂූන් වහන්සේලා මුන්වහන්සේ නැති වූ රජසැප ගැන මෙනෙහි කරතියි සිතා බුදුරදුන් හමුවේ මේ බව දැන්වූහ. එවිට උන්වහන්සේ කප්පින ඔබ තවමත් රජසැප පිළිබඳ උදම් අනන්නේදැයි විචාළහ. ඒ පිළිබඳ භාග්‍යවතුන් වහන්සේ ම කරුණු පැහැදිලි කරන සේක්වායි තෙරුන් වහන්සේ ආරාධනා කළහ. එවිට උන්වහන්සේ මා පුත් මහාකප්පින කම් සැප හෝ රජ සැප පිළිබඳ නොව ධර්මයෙන් ලත් සුවය ප්‍රකාශ කරති'යි වදාරමින් මේ ගාථාව දේශනා කළ සේක.

**ධම්මපීති සුඛං සෙති**
**විප්පසන්නෙන චෙතසා**
**අරියප්පවෙදිතෙ ධම්මෙ**
**සදා රමති පණ්ඩිතො**

පදාර්ථ:-

**ධම්මපීති,** දහම් රසය පානය කරන තැනැත්තා; **සුඛං සෙති,** සතර ඉරියව්වේදී ම සුවසේ වෙසෙයි; **පණ්ඩිතො,** ප්‍රඥාවන්තයා **සදා,** හැමකල්හි; **විප්පසන්නෙන චෙතසා,** නිකෙලෙස් වූ පහන් සිතින් වෙසෙමින්; **අරියප්පවෙදිතෙ,** බුද්ධාදී ආර්යන් වහන්සේලා විසින් වදාරන ලද; **ධම්මෙ,** සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෙහි; **රමති,** ඇලෙන්නේ ය, සතුටුවන්නේ ය;

විවරණය:-

මෙහි **ධම්මපීති** යන තැන **පීති** යනු ප්‍රීතිය නොව, පා (පානෙ) ධාතුවෙන් නිපන් පානය කරන්නා යන අර්ථයයි. චතුරාර්ය සත්‍යය මුළුමනින් ම අවබෝධ කර ගැනීම එය පානය කිරීම හා සමාන ය.

## 4.5.2.5. පණ්ඩිතයෝ තම සිත දමනය කරති.

සැරියුත් මහරහතන් වහන්සේගේ දායක පවුලක උපන් සත් හැවිරිදි පණ්ඩිත සාමණේරයන් වහන්සේ පැවිදි වී අටවන දිනයෙහි සැරියුත් තෙරුන් සමඟ පිඩුසිඟා වඩිමින් සිටියේ ය. එසේ වඩින අතර මග දී කුඹුරකට දියගෙන යන ඇලක් දැක ස්වාමීනි, මේ කුමක්දැයි සාමණේරයෝ ඇසූහ. උන්වහන්සේ මෙය නම් ඇලකි යි පිළිතුරු දුන්හ. මින් කුමක් කරන්නේදැයි ඇසූ විට මින් ජලය ගෙන යති. එමගින් කුඹුරු වගාවන් කෙරෙති යි තෙරුන් වහන්සේ වදාළහ. මේ ජලයට සිත් ඇද්දැයි අනතුරුව ඇසූහ. නැතැයි කියූ කල මෙසේ සිත් නැති ජලය මිනිස්සු තමන් කැමති තැනකට ගෙන යත් දැයි ඇසී ය. එසේ ය ඇවැත්නි යි වදාළ කල්හි සිත් පිත් නැති ජලය පවා සිත් පිත් ඇති මිනිස්සු අමුණු ආදිය බැඳ තමන් කැමති තැනකට ගෙන ගොස් වගාවන් කෙරෙත්. එසේ නම් තමාගේ සිත තමා වසඟයෙහි තබාගෙන මහණදම් පුරන්නට බැරි ඇයි දැයි සාමණේරයෝ සිතූහ.

තවත් මද දුරක් යන විට හී වඩුවන් හී දඬු ගින්නෙන් තව තවා ඇස් අගින් බල බලා ඇද හරිනු දුටු සාමණේරයන් වහන්සේ මොවුන් කවුරුන් ද? කුමක් කරත්දැයි ඇසූහ. හී දඬු තනන හී වඩුවන් යයි වදාළ කල්හි මිනිසුන් සිත් පිත් නැති හී දඬු පවා ඇදහැර ගනිතත් සිත් ඇත්තවුන්ට සිතේ ඇදහැර ගන්නට බැරි ඇයි දැයි සාමණේරයන්ට සිතුණි.

එසේම තවත් දුරක් යනවිට රථවල නිම්වළලු රහිමින් සකස් කරන්නවුන් දැක පෙරසේ ම ප්‍රශ්න කර සිත් පිත් නැති ලී දඬු පවා නැමිකපා තමන් කැමති ලෙස රවුම්කර සකස් කරත් නම් තම සිත තමාට නවා සකස් කරගන්නට බැරි ඇයි දැයි සාමණේරයෝ සිතූහ.

මෙසේ මේ කාරණා සිත්හි තබාගෙන යන සාමණේරයන් වහන්සේ ස්වාමීනි, ඔබ වහන්සේගේ මේ පාත්‍රා සිවුරු ආදිය ආපසු ගන්නේ නම් මම පෙරලා විහාරයට යමි යි කියූහ. තෙරුන් වහන්සේ ද කාරණා දන්නා හෙයින් තමන්ගේ පා සිවුරු ආපසු ගත්හ. සාමණේරයන් වහන්සේ සැරියුත් තෙරුන්ගේ කුටියට වැද කායානුපස්සනාව මෙනෙහි කරමින් පෙරවරුවේ ම විදසුන් වඩා අනාගාමී වූ සේක. සැරියුත් තෙරුන් ද පිණ්ඩපාතය වැඩම කොට දායක ගෘහයකින් දන් වළඳා සාමණේරයන් වහන්සේට ද පිණ්ඩපාතය රැගෙන ආපසු වෙහෙරට එන්නට පිටත් වූහ. භාග්‍යවතුන් වහන්සේ මේ සියල්ල දිවැසින් දුටහ. සාමණේරයන් වහන්සේට පෙරවරුවෙහි ම රහත්වීමේ හේතු සම්පත් ඇති බවත් සැරියුත් තෙරුන් ඊට පෙර එහි වැඩිය හොත් එයට බාධා පැමිණෙන බවත් දැක උන්වහන්සේ විහාරයේ දොරටුව අභියස වැඩ සිටියහ. ඒ අතර පැමිණි සැරියුත් තෙරුන් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්තය ඔබ කුමක් ලද්දෙහි ද? ආහාරයක් ලදිමි. ආහාරය කුමක් ගෙන දෙයි ද ස්වාමීනි, වේදනාව ගෙන දෙයි. වේදනාව කුමක් ගෙනදෙයි ද, ස්වාමීනි, රූපය ගෙන දෙයි. රූපය කුමක් ගෙන දෙයි ද. ස්වාමීනි ස්පර්ශය යි.

මෙසේ ප්‍රශ්න විසඳා අවසන් වනවාත් සමගම කුටිය තුළ සිටි සාමණේර හිමියෝ රහත් වූ සේක. බුදුරජාණන් වහන්සේ මේ බව දැන, සාරිපුත්‍රයෙනි දන් සාමණේරයන්ට දානය පිළිගන්වන්නැ'යි වදාළ සේක.

එදින දම්සභා මණ්ඩපයෙහි භික්ෂූන් වහන්සේලා අතර මේ අපූරු සිදුවීම පිළිබඳ කතා බහක් ඇති විය.

ඒ නිමිති කරගෙන බුදුරජාණන් වහන්සේ මහණෙනි, දියඇළුවෝ තමන් කැමති තැනකට ඇලවේලි බැඳ දිය ගෙන යති. හී වඩුවෝ ලී දඬු නවා කපා තවා හී දඬු ඉදි කරති. දව වඩුවෝ දවගෙන කපා ඉරා දව අරටු ගෙන ඍජුව හෝ වක්‍රව තමාට අවශ්‍ය පරිදි සකස් කර ගනිති. මේවා අරමුණු කරගෙන පණ්ඩිතයෝ තමාව දමනය කර රහත් බව ලබාගන්නාහයි පූර්වාපර සන්ධි ගලපා මේ ගාථාව දේශනා කළ සේක.

**උදකං හි නයන්ති නෙත්තිකා**
**උසුකාරා නමයන්ති තෙජනං**
**දාරුං නමයන්ති තච්ඡකා**
**අත්තානං දමයන්ති පණ්ඩිතා**

**පදාර්ථ:-**
**නෙත්තිකා**, වාරිමාර්ගකරුවෝ (දියඇළුවෝ); **උදකං නයන්ති හි**, ඇලවේලි බැඳ තමන් කැමති තැනකට දිය ගෙන යති; **උසුකාරා**, ඊ වඩුවෝ; **තෙජනං**, ඊතල; **නමයන්ති**, තමා කැමති පරිදි සකස් කරති; **තච්ඡකා**, වඩුවෝ; **දාරුං**, දව; **නමයන්ති**, ඍජු කිරීම් හෝ වක් කිරීම් හෝ කරති; **පණ්ඩිතා**, පණ්ඩිතයෝ; **අත්තානං දමයන්ති**, සතරමග සතරඵලයට පැමිණීමෙන් තම සිත දමනය කරති;

**විවරණය:-**
පණ්ඩිත සාමණේරයෝ සහජයෙන් ම නුවණැත්තෝ ය. සත් හැවිරිදි වියේ පැවිදි වී ගතවූයේ දින අටකි. සැරියුත් තෙරුන්ගේ පාසිවුරු ගෙන පසුපසින් ගියේ පිඬු පිණිස ය. මග දී දුටු සිද්ධි තුනක් දැක තමා ම තමන් දමනය කර ගත යුතු ආකාරය සිතන්නට තරම් උන්වහන්සේ ප්‍රඥාවන්ත වූහ. පිණ්ඩපාත ගමන නවතා පෙරලා විහාරයට ගොස් දියඇළුවන්ගේ හා හී වඩුවන්ගේ ක්‍රියාව ආදර්ශයට ගෙන කිසිවෙකුගේ උපදේශයකුත් නැතිව තමාගේ සිත තමා විසින් ම දමනය කරගෙන අනාගාමී වූහ. අනතුරුව බුදුරජාණන් වහන්සේ හා සැරියුත් තෙරුන් අතර ඇති වූ ප්‍රශ්න හා විසර්ජන සතර අසා සත්‍යාවබෝධ කොට රහත් වූහ.

## 4.5.2.6. අකම්පිතය පඬිවරු නිකෙලෙස් ය. වාතයෙන් නොසැලෙන පර්වත සේ ය.

"**සෙලො යථා එකඝනො**" යනාදී ගාථාව බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරේ වැඩ වසන සමයක ලකුණ්ඨක භද්දිය තෙරුන් අරබයා දෙසන ලද්දකි.

ලකුණ්ඨක භද්දිය තෙරණුවෝ අසූමහා ශ්‍රාවකයන් අතරින් කෙනෙකි. උන්වහන්සේ මිහිරි හඬ ඇතියන් අතරින් අග තනතුරු ලබා සිටියහ. එහෙත් උන්වහන්සේ සිරුරින් මිටි

කෙනෙකි. මේ නිසා ම උන්වහන්සේ ළාබාල සාමණේරවරුන්ගේ පවා නොයෙකුත් උසුළු විසුළුවලට ලක් වූහ. පෘථග්ජන සාමණේරවරු උන්වහන්සේ දුටු විට හිස පිරිමදිති. කණින්, නාසයෙන් අල්ලති. ඔවුන් උන්වහන්සේට කතා කරන්නේ සුළු පියේ හෙවත් බාප්පේ කියා ය. මේ මහරහතන් වහන්සේ තුළ තිබූ සුවිශේෂ ම ගුණය නම් මේ කිසිදු උසුළු විසුළු ආදියකින් නොකිපීමයි. ඔවුන් උන්වහන්සේට ඒ හැම දෙයක් ම කළේ ද හිරිහැර කරනු පිණිස නොවේ, ආදරයට ය. එහෙත් මෙය සෙසු භික්ෂූන් වහන්සේලා දුටුවේ උන්වහන්සේට කරන හිරිහැරයක් ලෙස ය. ඒ නිසා ම දිනක් දම් සභා මණ්ඩපයෙහි රැස් වූ භික්ෂූන් අතර මේ පිළිබඳ කතා බහක් ඇති විය. ඒවේලෙහි එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ මහණෙනි, මා මෙහි එන්නට පෙර කුමන කතාවකින් යුක්තව සිටියෝ දැයි විමසූහ. එවිට භික්ෂූන් වහන්සේලා අප නොදැහැමි කතාවකින් යුක්තව නොසිටියෙමු. අප කතා කරමින් සිටියේ ලකුණ්ඨක භද්දිය තෙරුන් ගැන ය. උන් වහන්සේට කුඩා සාමණේරවරුන් පවා කරන උසුළු විසුළු මහා හිරිහැරයකි. එහෙත් ස්වාමීනි, ඒවා උන් වහන්සේ වගකටවත් නොගෙන ඉවසන හැටි නම් පුදුමය යි කීහ.

එවිට බුදුරජාණන් වහන්සේ මහණෙනි, එය එසේ ය. රහතන් වහන්සේලා එබඳු හිරිහැරවලින් නොකිපෙති, තරහ නොගනිති. සුළඟින් නොසෙල්වෙන ගල් පර්වතයක් මෙන් නොසෙල්වෙතියි වදාරා මේ ගාථාවෙන් දහම් දෙසූහ.

**සෙලො යථා එකඝනො**
**වාතෙන න සමීරති**
**එවං නින්‍දාපසංසාසු**
**න සමිඤ්ජන්ති පණ්ඩිතා**

**පදාර්ථ:-**

**එකඝනො සෙලො,** ඒක ඝන වූ ගල් පවුවක්; **යථා වාතෙන න සමීරති,** යම් සේ සුළඟින් නොසෙල්වේ ද; **එවං,** එසේ ම; **පණ්ඩිතා,** නුවණැත්තෝ; **නින්‍දා පසංසාසු,** නින්දා ප්‍රශංසාවන්හි දී; **න සමිඤ්ජන්ති,** නොසෙල් වෙති;

**විවරණය :-**

"**ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්ස න කම්පති**"

යනුවෙන් මංගල සූත්‍රයේ දී අටලෝ දහමින් කම්පා නොවීම රහතන් වහන්සේගේ ලක්ෂණයක් ලෙස දක්වා ඇත. මෙහිදී ලකුණ්ඨක භද්දිය තෙරුන් මුහුණදුන් සිද්ධියට අදාළව නින්‍දා ප්‍රශංසා දෙකෙහි දී රහතන් වහන්සේලා කම්පා නොවන බව සඳහන් වුවත් එයින් අටලෝ දහමෙන් ම කම්පා නොවන්නේ ය යනු අදහස් කෙරෙන බව දත යුතු ය.

## 4.5.2.7. නුවණැත්තෝ පිරිසිදු ගැඹුරු ජලය මෙන් ප්‍රසන්න ය.

සැවැත් නුවර කාණමාතාව නම් උපාසිකාවක් සිටියා ය. කාණා නම් වූ ඇගේ දියණිය මවුපියන් දකින්නට පැමිණ ආපසු පතිකුලයට යන වේලෙහි දියණිය හිස් අතින් යැවීම නොයුතුයැයි කියා කාණ මාතාව කැවුම් පිසින්නට වූවා ය. මේ අතර භික්ෂූන් වහන්සේ නමක් පිඬු පිණිස එහි වැඩියහ. ඇය මුලින් පිළියෙල කළ කැවුම් උන්වහන්සේට පිදුවා ය. උන්වහන්සේ එය පිළිගෙන ගොස් තවත් භික්ෂුවකට ඒ බව දැන්වූහ. එහි වැඩම කළ උන්වහන්සේට ද කාණ මාතාව කැවුම් පිදුවා ය. මේ ආකාරයෙන් ආරංචිය පැතිර ගොස් කිහිප නමක් ම පිඬු පිණිස වැඩීම නිසා ඇය එදා පිළියෙල කළ කැවුම් අවසන් විය. මෙයින් එදින කාණාගේ ගමන වැලකුණි.

මේ අතර ඈ පමා වීම නිසා සැමියා පණිවිඩයක් ද එවී ය. දෙවෙනි දවස ද ඇයට ගෙන යාමට මව කැවුම් පිසින්නට වූවා ය. එදින ද පෙරසේ ම භික්ෂූන් වහන්සේලා, පිඬු පිණිස වැඩම වීම නිසා කැවුම් අවසන් විය. දුවගේ ගමන යළිත් වැලකුණි. සැමියා නැවත පණිවිඩයක් එවී ය. තුන්වන වර ද දුව හිස් අතින් යවන්නේ කෙසේ දැයි කියා මව කැවුම් පිසින්නට වූවා ය. එවර ද පෙර කී ආකාරයෙන් ම පිණ්ඩපාතයට පුදා කැවුම් අවසන් විය. පණිවිඩ තුනක් යවාත් කාණාගේ නොපැමිණීම ගැන කිපුණු සැමියා වෙනත් බිරියක කැඳවාගෙන ආවේ ය. මෙය ආරංචි වූ කාණා මොවුන් මාගේ විවාහය කඩාකප්පල් කරන ලදැයි කියා දුටු දුටු තැන භික්ෂූන්ට පරිභව කරන්නට වූවා ය. උන්වහන්සේලාට ඒ මග වත් යන්නට නොහැකි තත්වයක් උදා විය. මේ බව සැළවූ බුදුරජාණන් වහන්සේ එහි වැඩම කළහ.

මේ අතර කාණා ලැජ්ජාවෙන් සැඟවී හඬමින් සිටියා ය. බුදුරජාණන් වහන්සේ ඊට හේතුව විමසූ කල කාණ මාතා සියලු තොරතුරු කීවා ය. එවිට උන්වහන්සේ ''කාණමාතාවෙනි, මගේ ශ්‍රාවකයන් ගත්තේ ඔබ දුන් දෙයක් ද? '' නොදුන් දෙයක් ද? ස්වාමීනි, අප දුන් දේ යැයි කාණ මාතාව පැවසුවා ය. එවිට කාණාව කැඳවූ බුදුරජාණන් වහන්සේ. කාණාවෙනි, මගේ ශ්‍රාවකයන් පිඬු පිණිස ඔබේ දොරකඩට පැමිණි කල්හි ඔබේ මව සිය කැමැත්තෙන් ම කැවුම් පුදා තිබේ. එසේ ඇති කල්හි මාගේ ශ්‍රාවකයන් කළ වරද කුමක්දැයි ඇසූහ. එවිට කාණා ස්වාමීනි, ආර්යයන් වහන්සේලාගේ දොසක් නැත. වරද මගේ ම යැ යි කියා බුදුන් වැඳ කමා කරවා ගත්තා ය. අනතුරුව උන්වහන්සේ දහම් දෙසූහ. එයින් ඇය සෝවාන් ඵලයට පත් වූවා ය. බුදුරජාණන් වහන්සේ පෙරලා විහාරය බලා වැඩම කළ සේක.

බුදුරජාණන් වහන්සේ රජ මිදුලෙන් වඩින බව දැනගත් කොසොල් රජතුමා වහා පැමිණ උන්වහන්සේ වැඳ ස්වාමීනි, කොහි වැඩි සේක්දැයි ඇසී ය. මහරජ කාණ මාතාවගේ ගෙට ගියෙමි. කුමක් නිසාදැයි ඇසූ කල ඇගේ දියණිය කාණා භික්ෂූන්ට ආක්‍රෝෂ පරිභව කරතියි අසා ගියෙමියි වදාළහ. ස්වාමීනි, කළ පිළියම කුමක්දැයි ඇසූ කල මහරජ ඇය යළි කිසිදිනක භික්ෂූන්ට ආක්‍රෝෂ පරිභව නොකරන්නට ලොව්තුරා පවුලේ හිමිකාරියක කොට ආවෙමියි වදාළහ.

කොසොල් රජතුමා පසුව කාණාව ගෙන්වා තමාගේ දියණියක බවට පත්කොට නම් ප්‍රසිද්ධ කරවා මහාමාත්‍යවරයෙකුට විවාහ කර දී සියලු සම්පත් ද දෙවා රිසිසේ පින්කම් කරන්නැයි පිටත් කළේ ය. එතැන් පටන් කාණා දන් පිළියෙල කොට පුදන්නට පුරුෂයන් යොදවා භික්ෂු භික්ෂුණීන් සොය සොය දන් දෙන්නට වූවා ය.

දිනක් දම් සභා මණ්ඩපයේ භික්ෂූන් අතර මේ පුවත කතා බහට ලක් විය. එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ කරුණු විමසා මහණෙනි, මේ භික්ෂූන් සතර දෙනා නිසා මේ කාණාව ම වියවුලට පත් වූයේ අද පමණක් නොව පෙරත් මෙසේම වී යයි ''**බබ්බු ජාතකය**'' වදාළ සේක. එදා බළලුන් සතරදෙනා වූයේ මේ භික්ෂූහු ම ය. මීයා වූයේ කාණා ය, මැණික්කරු වූයේ මම'ය යි පූර්වාපර සන්‍ධි ගලපා එදත් සිත්වේදනා ලැබූ මේ කාණා මගේ වචනයෙන් ප්‍රසන්න දිය විලක් මෙන් පහන් සිත් ඇත්තියක වූවා යයි වදාරා මේ ගාථාවෙන් දහම් දෙසූ සේක.

**යථා පි රහදො ගම්භීරො**
**විප්පසන්නො අනාවිලො**
**එවං ධම්මානි සුත්වාන**
**විප්පසීදන්ති පණ්ඩිතා**

**පදාර්ථ:-**
**යථා අපි**, යම් සේ; **ගම්භීරො රහදො**, ගැඹුරු නීල මහා සාගරය; **විප්පසන්නො**, ඉතා පහන් වූ දිය ඇත්තේ වේ ද; **අනාවිලො**, නොකැළඹුණේ වේ ද; **එවං**, එසේ ම; **පණ්ඩිතා**, නුවණැත්තෝ; **ධම්මානි සුත්වාන**, සම්බුදු බණ අසා; **විප්පසීදන්ති**, සෝවාන් ආදී මගපල ලබා කෙලෙසුන්ගෙන් තොර පහන් සිත් ඇත්තෝ වන්නාහ.

**විවරණය:-**
මෙහි **රහදො** යන්නෙන් අදහස් කරන්නේ සාගරය මැද ඇති ගැඹුරු මහ මුහුදයි. එය නීල මහා සාගරය යනුවෙන් ද හැඳින්වේ. වෙරළාසන්න සාගරය කැළඹීම් සහිත වුවත් එහි මැද ජලයේ සෙලවීමක් නැත.

කාණාවගේ මේ සිද්ධියේ දී භික්ෂූන් අත ඇති වරද කුමක්දැයි ඇසුවත් බුදුරජාණන් වහන්සේ පසුව යම් කිසි නිවසකින් පාත්‍ර දෙකතුනකට පිණ්ඩපාතය බෙදූ පසු නැවත එහි නොයා යුතු බවත්, ලැබුණු දේ බෙදාගෙන වැළඳිය යුතු බවත් නියම කොට, එතැනින් දෙතුන් පාත්‍රයක් ලැබුණු බව අනෙක් භික්ෂූන්ට ද දැන්විය යුතු අතර දෙතුන් පාත්‍රයකට වඩා පිළිගතහොත් පචිති වේ යයි පාචිත්‍ය ශික්ෂා පදයක් ද පණවා වදාළ සේක.

## 4.5.2.8. පණ්ඩිතයන්ට දුක සැප දෙකෙහි වෙනසක් නැත.

බුදුරජාණන් වහන්සේ බුදු වී මුල් අවධියේ ම වරක් මහසඟන පිරිවරා වේරඤ්ජා නුවර චාරිකාවේ වැඩිසේක. උන්වහන්සේලා දක පහන් වූ වේරඤ්ජාවේ ප්‍රධාන බමුණා වස් කාලය එළඹ තිබුණු බැවින් එහි වස්වසන ලෙස බුදධ ප්‍රමුඛ මහා සංඝයාට ආරාධනා කළේ ය. තුන් මාසය පුරා සිව්පසයෙන් උවටැන් කරමියි පොරොන්දු වී ගියත් මාරයා ඔහුගේ සිත අවුල් කළ නිසා ඔහුට වස් ආරාධනා කළ බව වත් මතක නැති විය.

මේ අවධියේ වේරඤ්ජා නුවර මහා දුර්භික්ෂයක් විය. පිඬු පිණිස ගියත් ප්‍රමාණවත් ආහාරයක් නොලැබීම නිසා භික්ෂූන් වහන්සේලා ක්ලාන්ත වී අපහසුවට පත් වූහ. මේ අතර අස් වෙළෙඳුන් පිරිසක් ඒ නුවර වාඩිලා සිටියහ. ඔවුහු අශ්වයන් සඳහා ගෙන ආ යව හාල් ස්වල්පය බැගින් පිදූහ. බුදුරදුන් හා සංඝයා ඒවායින් දුක සේ යැපුණාහ. එහි දී මුගලන් තෙරුන් සෘද්ධි බලයෙන් උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය සපයන්නට සූදානම් වූ නමුත් බුදුරජාණන් වහන්සේ වැළැක්වූහ. වස් තුන් මාසය යව හාලින් ගතකොට වස් අවසානයේ බුදුරජාණන් වහන්සේ සංඝයා ද සමග වේරඤ්ජා බමුණාගේ නිවසට වැඩම කළහ. බමුණාට තම ආරාධනය සිහිපත් වූයේ එවිට ය. ඔහු සමාව ගෙන බුද්ධ ප්‍රමුඛ සංඝයාට ප්‍රණීත ආහාරපාන ආදියෙන් සංග්‍රහ කළේ ය. බුදුරජාණන් වහන්සේ ඔහුට පින් අනුමෝදන් කොට පෙරලා සැවැත්නුවරට ම වැඩි සේක. සැවැත්නුවර වැසියෝ බුද්ධ ප්‍රමුඛ සංඝයාට මහ දන් දී සංග්‍රහ කළෝ ය.

වේරඤ්ජා ප්‍රදේශයේ දුර්භික්ෂයෙන් පෙළෙමින් සිටි යාචකයන් පිරිසක් ද සංඝයා පසු පසින් අවුත් දෙව්රම් වෙහෙර අසල ම ලැගුම් ගත්හ. ඔවුහු භික්ෂූන් වළඳා ඉතිරි වූ ප්‍රණීත ආහාර රිසිසේ අනුභව කොට මත් වී නිදා පිබිදී ගං තෙරට ගොස් කෑකෝ ගසමින් කල්ලි ගැසී මල්ලව පොර කරති. ජේතවන විහාරය තුළත් ඉන් පිටතත් නොයෙක් නොහික්මුණුකම් කරමින් හැසිරෙති. මේ පිළිබඳ දිනක් දම් සභා මණ්ඩපයේ භික්ෂූන් අතර මෙබඳු කතා බහක් ඇති විය. ''බැලුව මැනවි මොවුන් වේරඤ්ජාවේ දුර්භික්ෂ කාලයේ මේ කිසිදු විකාරයක් නැතිව සිටියෝ ය. දැන් ප්‍රණීත ආහාරපාන ලැබී මත් වී විකාර කරමින් දඟලති'' යනුවෙනි. දම් සභාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ මේ පුවත අසා, මහණෙනි, දැන් පමණක් නොව පෙරත් මොවුහු කොටළුවන් ව ඉපිද සිටිය දී අජානීය අශ්වයන් සඳහා දුන් මිදි යුෂ පෙරා ගෙන ඉතිරි වූ රොඩු මණ්ඩි දිය කර දුන් පානය බී මිදියුෂ බිව්වන් සේ මත් වී විකාර කළෝයයි **වාලෝදක ජාතකය** විස්තර කොට වදාළහ. අනතුරුව ධර්ම දේශනා කරන සේක් මහණෙනි, සත් පුරුෂයෝ ලෝභය දුරු කොට සුඛිත කාලයේදීත් දුඃඛිත කාලයේදීත් කිසිදු විකාරයකින් තොරව වසන්නාහයි පූර්වාපර සන්ධි ගලපා මේ ගාථාව දේශනා කළ සේක.

**සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති**
**න කාමකාමා ලපයන්ති සන්තො**
**සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන**
**නොච්චාවචං පණ්ඩිතා දස්සයන්ති**

පදාර්ථ:-
**සප්පුරිසා,** සත් පුරුෂයෝ; **සබ්බත්ථ,** සියලු දෙයහි ම; **වජන්ති,** ඇල්ම දුරු කරති; **කාම කාමා,** කැමති කැමති දේ ලබාගනු කැමති ව; **සන්තො,** සත්පුරුෂයෝ; **න ලපයන්ති** අනුන්ට නොකියති; **සුඛෙන ඵුට්ඨා අථවා දුඛෙන,** සැප ලැබුණත් දුක් ලැබුණත්; **පණ්ඩිතා,** නුවණැත්තෝ; **න උච්චාවචං දස්සයන්ති,** උස් පහත් බවක් නොදක්වති;

විවරණය:-
මෙහි බුද්ධා දී සත්පුරුෂයන් වහන්සේලාගේ ගුණ තුනක් පිළිබඳ කිය වේ. උන්වහන්සේලා මේ පංචස්කන්ධයේ පටන් සියලු දේ පිළිබඳ ආශාව දුරු කරති. එසේ ම උන්වහන්සේලා චීවරාදී සිව්පස ලාභය පතා කිසිවෙකුට කිසිවක් නොකියති. අනුන් ලවාවත් නොකියවති. එසේ ම තමන්ට ලාභ අලාභ ආදී අටලෝ දහමින් කුමක් විඳින්නට සිදු වුනත් සැපයෙහි දී උඩඟු බවක් හෝ දුකෙහි දී කම්පාවක් හෝ නොදක්වති.

## 4.5.2.9 සීලයෙන් නුවණින් පිරිපුන් ධාර්මිකයෝ

සැවැත්නුවර එක් ධම්මික නම් උපාසකයෙක් දැහැමින් සෙමෙන් ගිහිගෙයි ගත කරයි. දිනක් ඔහුට පැවිදි වීමේ අදහසක් ඇති වී සුහද කතා බහක යෙදී සිටින අතර තම භාර්යාවට ඒ බව දන්වී ය. ඒ වන විට ගැබ්බර ව සිටි ඇය ස්වාමීනි, දරුවා බිහිවන තුරු ඉන්නැයි කීවා ය. දරුවා බිහි වී ඇවිදින සමයෙහි යලිත් හේ තම අදහස බිරියට කීවේ ය. දරුවා තරමක් වැඩෙන තුරු ඉවසනු මැනවැයි ඇය කීවා ය. එහි දී හෙතෙම දැන් මොවුන් ගැන බැලීමෙන් හෝ නොබැලීමෙන් මට කාරියක් නැත. මම මගේ ගමන යමියි කියා පිටත්ව ගොස් පැවිදි විය. ධම්මික තෙරණුවෝ කමටහන් ගෙන වෙරවෑයම් කොට මාර්ග ඵල ලබා නැවත ඤාතීන් බැලීමට නිවසට වැඩියහ. එහි දී පුතුට උන්වහන්සේ කළ ධර්ම කතාව අසා පුතු ද ගිහිගෙයින් නික්මී පැවිදි වී නොබෝ කලකින් රහත් විය. දෙදෙනා ම පැවිදි වූ පසු මා පමණක් ගිහි ගෙයි විසීමෙන් ඇති කාරිය කුමක් දැයි කියා බිරිය ද මෙහෙණවරකට ගොස් පැවිදි වී නොබෝ කලකින් රහත් වූවා ය.

දිනක් මේ ධම්මික උපාසකතුමාගේ හා එම පවුලේ මේ අපූරු පුවත දම් සභා මණ්ඩපයෙහි භික්ෂූන් වහන්සේලාගේ කතාබහට මාතෘකාව විය. එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ උන්වහන්සේලාගේ අදහස් අසා මහණෙනි, පණ්ඩිතයා විසින් තමා නිසාවත් අනුන් නිසාවත් අධර්මයෙන් දියුණුව අපේක්ෂා නොකළ යුතු ය. ධර්මයේ පිහිටෙන් ම පැවතිය යුතු යයි මේ ගාථාව වදාළ සේක.

න අත්තහෙතු න පරස්ස හෙතු
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධි මත්තනො
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා

පදාර්ථ:-

(යමෙක්) **න අත්තහෙතු,** තමා නිසා වත්; **න පරස්සහෙතු** අනුන් නිසාවත්; පවුකම් නොකරයි ද; **න පුත්තං ධනං වා රට්ඨං වා,** පුත්‍රයෙකු හෝ ධනය හෝ රටක් හෝ **න ඉච්ඡෙ,** පව්කම්වලින් බලාපොරෙත්තු නොවේ ද, **අත්තනො සමිද්ධිං,** තමාගේ දියුණුව, **න අධම්මෙන ඉච්ඡෙය්‍ය,** අධර්මයෙන් බලාපොරොත්තු නොවේ ද, **ස සීලවා,** හෙතෙම සිල්වතෙක් ද, **පඤ්ඤවා,** නැණවතෙක් ද **ධම්මිකො,** දැහැමියෙක් ද **සියා** වන්නේ ය.

විවරණය:-

මෙහි සිල්වතා ය, නැණවතා ය, දැහැමියා ය යන මෙම හැඳින්වීම්වලට ධර්මානුකූල තේරුමක් දී තිබේ. එහි අදහස කෙනෙක් තමාගේ කෙනා ය, පුතුන් ය, ධනය ය, රටේ බලය ය නැතහොත් තම දියුණුව ය යන මේ කිසිම කාරණයක් නිසා තමාගේ සීලය පාවාදී දුසිල් කම් නොකරයි. ඒ තාවකාලික ලාභ පතා සසර දුකට හෙලා ගැනීමේ අනුවණකම නොකරයි. මේ කිසිවක් නිසා තම දැහැමිකම පාවා දී අදැහැමියෙක් නොවේ.

## 4.5.2.10 එතෙර වන්නේ අල්ප ය, ඉවුරෙහි රැඳෙන්නෝ බොහෝ ය.

සැවැත් නුවර එක් වීදියක විසූ ජනයා සියලු දෙනා සමගියෙන් එකට එකතු වී දානයක් දී මුළු රැය පුරා ධර්මදේශනාමය පිංකමක් පැවැත්වූහ. එහෙත් මුළු රෑ පුරා දහම් ඇසීමට හැම දෙනාට ම නොහැකි විය. ඇතැමෙක් කාමාශාවන් නිසා අතර මැද දී ගෙදර ගියහ. ඇතැමෙක් අප්‍රසාදය හෙවත් ද්වේශය නිසා ගෙදර ගියහ. ඇතැමෙක් එහි ම රැඳී සිටියත් ථීනමිද්ධය නිසා නිදිකිරා වැටීමෙන් බණ මැනවින් අසා ගැනීමට අසමත් වූහ. පසුදින දම් සභාවේ භික්ෂූන් වහන්සේලා අතර මිනිසුන්ගේ මේ විවිධ හැසිරීම් සාකච්ඡාවට බඳුන් විය. දම් සභාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ඒ නිමිති කරගෙන මහණෙනි, මේ සත්ත්වයෝ බොහෝ සෙයින් මේ සංසාරයෙහි ම ඇලී ගැලී සිටින්නෝ ය. එතෙර වන්නට සූදානම් නැත්තෝ ය. එතෙර වන්නෝ ඉතා අල්ප වෙතියි, පූර්වාපර සන්ධි ගලපා මේ ගාථාව දේශනා කළ සේක.

අප්පකා තෙ මනුස්සෙසු - යෙ ජනා පාරගාමිනො
අථායං ඉතරා පජා - තීරමෙවානුධාවති

පදාර්ථ:-

**මනුසෙසසු,** මිනිසුන් අතුරෙහි; **පාරගාමිනො,** සසර සයුරෙන් එතෙර වන කෙනෙක් වෙත් නම්; **අප්පකා,** ස්වල්ප දෙනෙකි; **අථ අයං ඉතරා පජා,** මේ ඉතිරි සියලු ම දෙනා; **තීරං එව අනු ධාවති,** මේ පංචස්කන්ධය හා බැඳුණු පංචකාමය නැමති, මෙගොඩට ම ආපසු දිව එන්නේ ය;

**යෙ ච ඛො සමමදකඛාතෙ**
**ධමෙම ධමමානුවතතිනො**
**තෙ ජනා පාරමෙසසනති**
**මචචුධෙයයං සුදුතතරං**

පදාර්ථ:-

**යෙච,** යම් කෙනෙක්; **සම්මා+ආක්ඛාතෙ ධමෙම,** තථාගතයන් වහන්සේ විසින් මනාකොට දෙසන ලද ධර්මයෙහි; **ධමමානුවතතිනො,** ධර්මානුකූලව පිළිපැද ඒ අනුව මාර්ග ඵල අවබෝධය කරන්නෝ වෙත් ද; **තෙ ජනා,** එබඳු ජනයා, **සුදුතතරං,** තරණය කිරීමට අපහසු, **මචචු ධෙයයං,** මාර වසඟයෙන් හෙවත් මේ සංසාරයෙන්; **පාර මෙසසනති,** පරතෙරට යන්නෝය.

විවරණය:-

මෙහි පළමු ගාථාවෙන් පැවසෙන්නේ බුදුවරු පහළ වී කොතරම් කරුණු කියා දුන්නත් සසර බියකරු බව අවබෝධ කරගන්නෝ ඉතා අල්ප ය. වැඩි දෙනෙක් ඒ බියකරු සසරට ම කැමති වන්නන් බව ය. දෙවන ගාථාවෙහි මචචුධෙයය යනු සසර මැරි මැරී ඉපදීමට හේතුවන කෙලෙස් ය. ඒවා ප්‍රහීන කිරීම ඉතා අපහසු ය. කෙලශ මාරයායයි හඳුන්වන්නේ ඒ නිසා ය. මෙයින් එතෙර වන්නේ ස්වාක්ඛාත ධර්මය මැනවින් පිළිපැද මාර්ග ඵල අවබෝධය දක්වා යාමට සමත් වීර්යවන්ත ජනයා පමණි.

## 4.5.2.11 අකුසල් නසා කුසල් වඩා නිවන් ලැබූවෝ

කොසොල් රට වැසි පන්සීයක් පමණ භික්ෂූන් වහන්සේලා පිරිසක් වස් වැස පවාරණය කොට බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට දෙව්රම් වෙහෙරට ගියෝ ය. බුදු රදුන්ට වැඳ එකත් පසෙක හිඳගත් උන් වහන්සේලාගේ චරිතවල දුර්වල කම් සලකා බැලූ භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ චරිතානුකූල දහමක් දෙසනු පිණිස මේ ගාථාවන් දේශනා කොට වදාළ සේක.

**කණ්හං ධම්මං විප්පහාය**
**සුක්කං භාවෙථ පණ්ඩිතො**
**ඔකා අනොකං ආගම්ම**
**විවෙකෙ යත්ථ දූරමං**

පදාර්ථ:-

**පණ්ඩිතො,** නුවණැත්තා; **කණ්හං ධම්මං විප්පහාය,** අකුසල ධර්ම දුරුකොට; **සුක්කං භාවෙථ,** කුසල ධර්ම වැඩිය යුතු ය; **ඔකා** ආලය හෙවත් මේ පංචස්කන්ධය හා බැඳුනු රාගයෙන් ඉවත් වී; **අනොකං ආගම්ම,** අනාලය හෙවත් නිවන වෙත නැඹුරු වී නිවන පතන්නෙකු වී; **යත්ථ,** යම් තැනක; **දුරමං,** සාමාන්‍ය ජනයාගේ සිත් පහසුවෙන් නො ඇලේ ද; **විවෙකෙ,** ඒ අනාලය නම් වූ යම් නිර්වාණ විවේකයක් වේ නම්;

**තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය**
**හිත්වා කාමෙ අකිඤ්චනො**
**පරියොදපෙය්‍ය අත්තානං**
**චිත්තකෙලසෙහි පණ්ඩිතො**

පදාර්ථ:-

**තත්‍ර,** ඒ විවේකයෙහි; **අභිරතිං ඉච්ඡෙය්‍ය,** ඇළුම් ඇතිකරගත යුතු ය; **කාමෙ හිත්වා,** පංචකාම වස්තු නම් වූ වස්තු කාමයත් ඒ පිළිබඳ ඇතිවන රාගාදී ක්ලේශ කාමයන් දුරු කොට; **අකිඤ්චනො,** කිඤ්චන හෙවත් රාගාදී කෙලශයන්ගෙන් හෝ අඹුදරු; ධන ධාන්‍යාදී කරදරවලින් මිදී; **පණ්ඩිතො,** ඤාණවන්තයා; **චිත්තකෙලසෙහි,** පංච නීවරණ යන්ගෙන් සිත; **පරියොදපෙය්‍ය,** පිරිසිදු කරගත යුතු ය;

**යෙසං සම්බොධි අඞ්ගෙසු**
**සම්මා චිත්තං සුභාවිතං**
**ආදාන පටිනිස්සග්ගෙ**
**අනුපාදාය යෙ රතා**
**ඛීණාසවා ජුතීමන්තො**
**තෙ ලොකෙ පරිනිබ්බුතා**

පදාර්ථ:-

**යෙසං චිත්තං,** යමෙකුගේ සිත; **සම්බොධි අඞ්ගෙසු,** සප්ත බෝධි අංගයන්හි හෝ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්හි; **සම්මා සුභාවිතං,** ක්‍රමවත් ව මනාව වඩන ලද ද; **අනුපාදාය,** පංචස්කන්ධ ආදී කිසිවක් සතර ආකාර උපාදානයෙන් දැඩිව නොගෙන; **ආදාන පටිනිස්සග්ගෙ,** ග්‍රහණයෙන් මිදීම යයි කියන නිවනෙහි; **යෙ රතා,** යමෙක් ඇළුනාහු ද;

**තෙ පුතීමනතා ඛීණාසවා,** ඒ ආනුභාව සම්පන්න රහතන් වහන්සේලා; **ලොකෙ පරිනිබ්බුතා,** මේ ස්කන්ධ ධාතු ආයතනාදී ලෝකයෙහි පිරිනිවියාහු නම් වෙති.

**විවරණය:-**

| | |
|---|---|
| **කණ්හ සුකක** | - අකුසල ධර්ම හා කුසල ධර්ම |
| **ඔක** | - ආලය, ගෘහය, (දේව ආලය, දේව ගෘහය) එනම් පංචස්කන්ධයයි. |
| **අනොක** | - අනාලය, එයින් මිදීම |
| **අකිඤ්චන** | - කෙලෙස්, කාමවස්තු (වස්තු කාම, ක්ලේශ කාම) ආදියෙන් මිදුණු, කිසිවක් නැති. |
| **සමෙබාධි අංග** | - සප්ත බෝධ්‍යංග, සත්තිස් බෝධි පාක්ෂික ධර්ම |
| **උපාදාන සතර** | - කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද |
| **ආදාන පටිනිසසගග** | - පංචස්කන්ධය මමය මාගේ යයි ගැනීම ආදාන නම් වේ. පටිනිස්සග්ග යනු දුරු කිරීම. එම ග්‍රහණය දුරුකරන නිසා කියන නිවනට ආදාන පටිනිස්සග්ග යැයි කියනු ලැබේ. |

**අභ්‍යාස**

01. පණ්ඩිත වග්ගයේ සඳහන් ආකාරයට පණ්ඩිතයා කෙබඳු කෙනෙක්දැයි විස්තර කරන්න.
02. පණ්ඩිත වග්ගයට අදාළ ගාථා හා අර්ථ වනපොත් කර මතකයෙන් දක්වන්න.
03. පණ්ඩිත වග්ගයේ ගාථාවක් තෝරාගෙන එහි නිදාන කතාව ඇසුරෙන් ශිෂ්‍ය සමිතියේදී ධර්ම දේශනාවක් පවත්වන්න.

19
පාඩම

# කෙලෙසුන් නැසූ උතුමෝ
## (අරහන්ත වග්ගය)

අප ඉපදී මැරි මැරී යන ගමන සංසාරය නම් වේ. එනම් සැරි සැරීම යි. මේ ගමනේ දී අප මේ මිනිස් ලොව දී කරගන්නා හොඳ කර්ම නිසා දිව්‍යලෝක බ්‍රහ්මලෝකවල සැරි සැරීමට ඉඩ සැලසේ. නරක කර්ම නිසා සතර අපායේ සැරි සැරීමට සිදු වේ. මිනිස් ලොවදී හොඳ කර්ම නිසා සැප විපාකත් නරක කර්ම නිසා දුක් විපාකත් මිශ්‍රව විඳින්න ට සිදු වේ. අපගේ නොදැනුවත්කම හා නොසැලකිල්ල නිසා අතරින් පතර හොඳ නරක දෙක ම අඩු වැඩි වශයෙන් චක්‍රයක් මෙන් සිදු කරන්නෙමු. ඒ නිසා ම මේ සසර ගමනේ දී සුගති දුගතිවල සැරි සැරීම චක්‍රාකාරයෙන් සිදුවේ. දුකෙන් සැපටත් සැපෙන් දුකටත් වැටි වැටී ගමන් කෙරේ. සසර සැරිසරන තාක් කල් ලෙඩවීම, මහළුවීම, මරණය, සෝදුකින් වැළපීම, ජීවිතය ගැටගසා ගැනීම සඳහා වෙහෙසීම වැනි දුක්වල කෙළවරක් ද නැත.

එසේ නම් මේ දුකින් මිදීමට අප කළ යුතුව ඇත්තේ මේ ඉපදීම නැවැත්වීමයි. එය මේ පස්කම් සැප විඳීමටත් භවයෙන් භවය හොඳ තැන් සොය සොයා ඉපදීමටත් ඇති ආශාව දුරුවන තුරු කළ නොහැකි ය. හොඳ හෝ නරක කර්ම රැස්කරන තුරු කළ නොහැකි ය. අප එසේ ආශා කරන්නේත් ඉපදීමට හේතුවන කර්ම රැස් කරන්නේත් අපේ සිතේ ඉබේම ඇතිවන ලෝභ, ද්වේෂ, මෝහ, ඊර්ෂ්‍යාව, මසුරුකම, මානය, වැනි කිළිටි සිතුවිලි නිසා ය. ඒවාට කෙලෙස් යයි කියනු ලැබේ. මේ ගමන නැවතීමේ ක්‍රියාවේදී මේ කෙලෙස් එකින් එක ටිකෙන් ටික නසාගෙන ගොස් සහමුලින් ම නැසිය යුතු ය.

ඒ සියලු කෙලෙසුන් නැසීම නිර්වාණ මාර්ගයේ දී සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් යන පියවර හතරකින් සිදු කරනු ලැබේ. එයින් අවසාන පියවර රහත් ඵලය යි. රහතන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ නිසා ඛීණාසව (ක්ෂීණාශ්‍රව) නමින් හඳුන්වනු ලැබේ. රතන සූත්‍රයේ අවසාන ගාථාවෙන් ප්‍රකාශ වන පරිදි උන්වහන්සේ මෙතෙක් රැස්කරගත් සියලු පැරණි කර්ම නැසූ සේක. අළුතින් කර්ම රැස් කිරීමක් ද නැත. නැවත භවයක ඉපදීමේ ආශාව ද සහමුලින් ම සිඳ දමා ඇත. උන්වහන්සේ නැවත සසර උපදින්නට හේතුවන බීජ ශක්තිය හෙවත් කර්ම ශක්තිය නසා ඇත. නැවත ඉපදෙන තණ්හාව නැසූ උන්වහන්සේ පහනක් නිවී යන්නා සේ මෙහිදී ම දුක් ගිනි නිවා සසර දුක් ගමන නිමවා නිවී යන සේක. නිවන් දැකීම යනු මෙයයි. මෙලොව නිවන් දකින එකම පුද්ගලයා රහතන් වහන්සේ ය. නිවන් දකින එකම ක්‍රමය රහත්වීම යි. බුදු, පසේ බුදු, උතුමන් පවා පළමු කොට නිවන් දකින්නේ රහත් වීමෙනි. උන්වහන්සේලාට අරහං යයි කියන්නේ ඒ නිසා ය. බුදු බව, පසේ බුදු බව පාරමිතා පිරීමේ විශේෂත්වය අනුව ලැබෙන රහත් බවින් ඔබ්බට ගිය විශේෂ ගුණයන් ය.

රහතන් වහන්සේ නමක් දුටු පමණින් හඳුනාගත නොහැකි ය. අහසින් යාම දිවැසින් දැකීම ආදී ප්‍රාතිහාර්ය රහත් බව නොවේ. ඒවා රහත් නොවූ අයටත් ධ්‍යාන බලයෙන් ලැබිය හැකි ය. ඉතා ම සංවරව හැසිරීම, අමුතු සිවුරු පෙරවීම, දුෂ්කර පිළිවෙත් පිරීම, අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීම, යනාදී ඉතාම හොඳ යයි පෙනෙන ලක්ෂණ තිබුණු පමණින් කෙනෙකු රහතන් වහන්සේ කෙනෙක් නොවේ. ලාභ සත්කාර ලැබීම, කීර්ති ප්‍රශංසා දිනා ගැනීම,

මහාශ්‍රාවක පිරිසක් ඇති කරගෙන මහා ශාස්තෘවරයෙකු සේ වැජඹීම වැනි පවිටු දීන, ආශාවන්ගෙන් පෙළෙන පිරිසක් අදත් රහතන් වහන්සේලා සේ රඟපාති. ඔවුහු ධර්මයේ මහජනයාට නොවැටහෙන ඉතා ගැඹුරු තැන් තෝරාගෙන ඒවාට තමාට හිතු හිතු අර්ථ සපයති. නූතන තාක්‍ෂණයෙන් විවිධ රූප එකට ගලපා මාධ්‍යවල පළ කොට පුද්ගල චරිත ඝාතනය කරන සාහසිකයන් සේ මොවුහු ද ධර්මයේ තැනින් තැන තිබෙන කරුණුවලින් කොටස් උපුටාගෙන තමන්ගේ අදහස තහවුරු කිරීමට අවශ්‍ය පරිදි වැරදි පිළිවෙලට ගලපා ධර්මයේ මුල, මැද, අග යහපත් සුධර්ම ගුණය සාහසික ලෙස ඝාතනය කරති. බුද්ධ දේශනාව ම එසේ විකෘති කරන අතර අටුවාව බුද්ධඝෝෂ හිමියන්ගේ රචනයක් යයි මිථ්‍යාමතයක් පතුරුවමින් සැරියුත් මාහිමියන්ගෙන් ආරම්භ වූ අටුවා හෙවත් ධර්මයේ අර්ථ දැක්වීමේ සම්ප්‍රදාය සම්පූර්ණ වැරදියයි බැහැර කරති. හිටි හැටියේ සිවුරු පොරවාගත් මේ පුද්ගලයෝ මෙතෙක් තිබුණු ශාසනය වැරදි ය, තමන් කියන දේ නිවැරැදියැ යි මිනිසුන්ට ඒත්තු ගන්වති. ඒ නිසා ඔවුන් අද බොහෝ ජනයා අතර රහතන් වහන්සේලා ලෙස පිළිගැනීමට ලක්ව ඇත.

අප රහතන් වහන්සේ කවුරුදැයි හඳුනා ගැනීම අත්‍යාවශ්‍ය වන්නේ මේ නිසා ය. එවිට අපට මොවුන් රහතුන් නොව අරහන්ත ඝාතකයන් බව වටහා ගත හැකි ය. මහජනයාට කියාදිය හැකි ය. ශාසනය මේ විනාශකාරීන්ගෙන් ගලවා ගත හැකි ය. ඔවුන් පසු පස ගොස් අපාගත වන මිනිසුන් ඉන් මුදා ගත හැකි ය.

ධම්ම පදයේ අරහන්ත වර්ගය මේ සඳහා ඉතා ප්‍රයෝජනවත් වන ධර්ම සංග්‍රහයකි. සංයුත්ත නිකායේ එන කෝසල සංයුත්තයේ සත්ත ජටිල සූත්‍රයේ දී කෙනෙකු රහත් ද නොරහත් දැයි වටහා ගැනීම එක්වර කළ හැක්කක් නොව එය කෙනෙකු දිගුකලක් ඇසුරු කිරීමෙන් කළ යුත්තක් බවත් එයට තමාට නුවණ ද තිබිය යුතු බවත් වදාරා තිබේ. ඒ ක්‍රමය අනුව රහත් පුද්ගලයෙකු දෙස දිගුකලක් විමසිල්ලෙන් බැලිය යුතු ය. රහතන් වහන්සේ ගැන කරුණු රාශියක් මෙම අරහන්ත වර්ගයේ දක්නට ලැබේ. කිසිවකට ශෝක නොකිරීම, කිසිදු සම්පතක් රැස් නොකිරීම සියලු දේ අතහැර යාමට හැකිවීම, ආහාරයෙහි ගිජු නොවීම අටලෝ දහමින් කම්පා නොවීම, කයෙන් වචනයෙන් සිතින් කිසිදු දුශ්චරිතයක නො යෙදීම යනාදිය මෙහි එන රහතුන් වහන්සේගේ ලක්‍ෂණවලින් කීපයකි.

### 4.5.3.1 රහතන් වහන්සේට කායික මානසික දුර්වලකම් නැත.

බුදුරජාණන් වහන්සේ කෙරෙහි වෛර බැඳ ගත් දෙව්දත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ නැසීමට තීරණය කිරීමට තරම් දරුණු වූහ. ඒ සඳහා දෙව්දත් තෙර බිම්බිසාර මහ රජුගේ පුත් අජාසත් කුමරු සමඟ මිත්‍ර වී ඔහුගේ සහාය ලබා ගැනීමට සිතුවේ ය. ඒ අනුව දෙදෙනා අතර කතිකාවක් ඇති විය. එනම් තමන් බුදුන් මරා බුදුවන බවත් අජාසත් කුමරුට පියා මරා රජ වෙන ලෙසත් ය. කෙසේ හෝ අජාසත් කුමරු පියා දඟගෙයි දමා මරවා රජ විය. ඔහුගේ සහාය ඇතිව දෙව්දත් තෙර බුදුන් මැරවීමට නාලාගිරි ඇතු මෙහෙයවීම, දුනුවායන් යෙදවීම වැනි උපක්‍රම කීපයක් ම ක්‍රියාත්මක කළත් ඒවා අසාර්ථක විය. අන්තිමේ දී ඒ තෙරණුවෝ තමන් ම බුදුරදුන් නසන්නට තීරණය කළේ ය. ඒ අනුව දෙව්දත් තෙර ගිජුකුළු පව්වට නැග පර්වත පාමුල සක්මන් කරමින් සිටි බුදුරජාණන් වහන්සේ ගේ හිස මතට වැටෙන සේ මහ ගලක් පෙරලී ය. ඒ ගල පහතට වැටීමට පෙර බුද්ධ ගුණානුභාවයෙන් මතු වී ආ ගල්කුළු දෙකක් අතර හිර වී නැවතුණි. ඒ ගල් කුළුවල

ගැටීමෙන් බිඳී විසි වූ ගල් පතුරක් වැදී උන්වහන්සේගේ සිරිපතුල තුවාල වී ලේ ගැලී ය. එයින් දරුණු වේදනාවක් ඇති විය. වහා එතැන රැස් වූ භික්ෂූහු උන්වහන්සේව ජීවක වෛද්‍යවරයාට දැක්වීමට ජීවක අඹ වනයට වැඩමවාගෙන ගියහ.

ඇතුළු නුවර රෝගියෙකුට වෙදකම් කරමින් සිටි ජීවක වෛද්‍යවරයා ඒ පුවත අසා වහා පැමිණියේ ය. ඉතා තියුණු බෙහෙතක් යොදා තුවාලය බැඳ ස්වාමීනි, මම ඇතුළු නුවර රෝගියාගේ පිළියම නිමකොට පෙරලා එමි, එතෙක් මෙම බෙහෙත බැඳි ආකාරයෙන් ම තිබෙන්නට හරින්නැයි කියා ගියේ ය. එහෙත් ඔහු ගොස් ඒ රෝගියාගේ පිළියම නිමා කොට එනවිට නුවර වාසල් දොරටු වසා තිබුණි. එහෙයින් ඔහුට නගරයෙන් පිටත තිබූ ඔහුගේ අඹවනයට යාමට රෑ පහන් වනතුරු ඇතුළු නුවරට වී බලා සිටීමට සිදු විය. මේ අතර ඔහුට ''අහෝ මා විසින් මහා බරපතල වරදක් කරන ලදී. සාමාන්‍ය මිනිසෙකුට මෙන් තථාගතයන් වහන්සේගේ පාදයට ද තියුණු බෙහෙතක් දමා තුවාලය බැන්දෙමි දැන් ඒ බැමි මුදාහැරිය යුතු වේලාවයි එසේ නො කළහොත් උන්වහන්සේගේ ශරීරයේ රෑ පුරා ම මහා දැවිල්ලක් ඇති විය හැකියැයි'' සිත් වේදනාවක් ඇති විය.

ඔහුගේ අදහස පරසිත් දන්නා නුවණින් දුටු බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් අමතා ආනන්දය, ජීවක වෛද්‍යවරයාට රෑ බෝ වීම නිසා නුවරින් පිටතට එන්නට නොහැකි වී ඇත. මේ තුවාලයේ බැඳුම් මුදාලන වේලාව පැමිණ ඇතැයි ඔහු සිතයි. ආනන්ද එය ලිහා දමන්න යයි වදාළහ. ආනන්ද තෙරණුවෝ එය ලිහා දැමූහ. ගසක පතුරක් ගැලවී යන්නා සේ තුවාලයේ කබළ ගැලවී සුව වී ගියේ ය.

ජීවක වෛද්‍යවරයා ද අරුණ නැගී වාසල් දොර විවර වූ සැණින් බුදුරදුන් වෙත වේගයෙන් අවුත් සිදු වූ ප්‍රමාදයට සමාව ගෙන ස්වාමීනි, කෙසේ ද ඔබ වහන්සේගේ සිරුරෙහි දැවිල්ලක් හට ගත්තේ දැයි ඇසී ය. එවිට බුදුරජාණන් වහන්සේ ජීවකය, බෝ මැඩදී ම තථාගතයන් වහන්සේගේ සියලු දැවිලි සන්සිඳුනේ යයි වදාරා පූර්වාපර සන්ධි ගලපා දහම් දෙසමින් මේ ගාථාව වදාළ සේක.

**ගතද්ධිනො විසොකස්ස**
**විප්පමුත්තස්ස සබ්බධි**
**සබ්බ ගන්ථප්පහීනස්ස**
**පරිළාහො න විජ්ජති**

**පදාර්ථ:-**

**ගතද්ධිනො,** සසර ගමන නිම කළා වූ; **විසොකස්ස,** ශෝකය ප්‍රහීණ කළා වූ; **සබ්බධි විප්පමුත්තස්ස,** ස්කන්ධ ආදී සියලු ධර්මයන් හි නොඇලී ඉන් මිදුනා වූ; **සබ්බ ගන්ථ පහීනස්ස,** සියලු ගැට දුරුකළා වූ රහතන් වහන්සේට; **පරිළාහො න විජ්ජති,** කායික හෝ මානසික දැවිල්ලක් නැත;

**විවරණය:-**

**ගත අද්ධිනො,** යන මෙහි අද්ධ හෝ අද්ධාන නමින් හැඳින්වෙන්නේ, මාර්ගය හෝ කාලයයි. ඒ අතරින් මෙහි මාර්ගය යන අර්ථය ගැනේ. එනම් සංසාරය නැමැති දීර්ඝ මාර්ග යයි ඒ ගමන නිම කළ හෙයින් **ගත අද්ධිනො** නම් වෙයි. කාමය ඉටු නොවීම නිසා ශෝක වීම

පෘථග්ජන ස්වභාවය යි. රහතන් වහන්සේට කාමය පිළිබඳ ආශාවක් හෝ බැඳීමක් නැති නිසා ශෝකයක් නැත.

**සබ්බධි** යනු පංචස්කන්ධය ඇතුළු සියලු සංස්කාරයන්ට කියන නමකි. රහතන් වහන්සේ ඉන් මිදුණු සේක.

**සබ්බ ගන්ථ :** සබ්බ ගන්ථ යනු සත්වයාගේ නාම, රූප කාය, චුති, ප්‍රතිසන්ධි වශයෙන් සසර ගැට ගසන කාය ග්‍රන්ථ හතර යි. **ධම්ම සංගිනී** ප්‍රකරණයේ සඳහන් පරිදි ඒ හතර මෙසේ ය.

1. **අභිජ්ඣා කායගන්ථ** : පුනර්භවය හෙවත් නැවත ඉපදීම ඇති කරවන නන්දිරාග හෙවත් සතුටුවීමෙන් ඇලීම ඇති කරන ලැබෙන ලැබෙන රූපාදී අරමුණෙහි ඇලෙන තෘෂ්ණාව යි.

2. **ව්‍යාපාද කායගන්ථ** : ව්‍යාපාද කාය ගන්ථ යනු ආඝාත, පටිඝ, කෝධ, දෝස යන විවිධ නම්වලින් හැඳින්වෙන අරමුණු පිළිබඳ ගැටීමයි, අකමැති අප්‍රිය අරමුණෙහි තරහ ඇති කර ගැනීම වෛර බැඳ ගැනීම හෝ නැසීමට තරම් දරුණු වන ක්‍රෝධය යි.

3. **සීලබ්බත පරාමාස කායගන්ථ** : මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් බැහැර වෙනත් ආගම්වල ඇති සීල ව්‍රතවලින් සසරින් මිදිය හැකියයි. සිතා ඒ මිථ්‍යා සිල් හා ව්‍රත අනුගමනය කිරීම.

4. **ඉදං සච්චාභිනිවෙස කායගන්ථ** : ශාස්වත දෘෂ්ටි, උච්ඡේද දෘෂ්ටි යන අංශ දෙකට අයිති වන මිථ්‍යා දෘෂ්ටිවලින් කුමක් හෝ තමන් අදහන දෘෂ්ටිය ම සත්‍යය යි. අනෙක් සියල්ල බොරුයයි ඇදහීමයි.

මේ ග්‍රන්ථ හෙවත් ගැට හතරෙන් ම සත්ත්වයා කාය වශයෙන් පංචස්කන්ධ වශයෙන් සසර පැටලෙන නිසා මේවා චතුර්විධ කාය ග්‍රන්ථ නමින් හැඳින් වේ.

## 4.5.3.2. විල හැරයන හංසයන් මෙන් සසර හැරයන රහතන් වහන්සේ

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වස් වැස වස් පවාරණය කොට අඩ මසකින් පමණ චාරිකාවෙහි හැසිරෙන්නෙමියි භික්ෂූන් වහන්සේලාට දැන්වූහ. භික්ෂූන් වහන්සේලා සමග චාරිකාවෙහි හැසිරීම බුදුවරයන් වහන්සේලාගේ සිරිතකි. මෙම පණිවිඩය ලද භික්ෂූන් ගමනට සූදානම් වෙමින් පාත්‍රා පිස සිවුරු සෝදා පඬු පොවා ගැනීම් ආදිය කරන අතර මහා කාශ්‍යප තෙරණුවෝ ද සිවුරු සෝදමින් සිටියහ. මෙය දුටු භික්ෂූහු මහ'කසුප් තෙරණුවෝ' කුමක් නිසා සිවුරු සෝදත් ද. මේ නුවර ඇතුළත් පිටතත් අටළොස් කෙළක් පමණ මිනිස්සු සිටිති. ඒ සියල්ලෝ ම වාගේ උන්වහන්සේගේ නෑයෝ නොවෙත් නම්

දායකයෝ වෙති. ඒ අය තෙරුන්ට සත්කාර සම්මාන නො කෙරෙත් ද මෙතරම් උපකාර තියෙද්දී ඒවා අතහැර මුන් වහන්සේ කොහි යන්නාහු දැයි කියන්නට වූහ.

චාරිකාව ආරම්භ කරමින් භාග්‍යවතුන් වහන්සේ මේ නුවර අටළොස් කෙළක් පමණ ජනයා වසති. ඔවුන්ගේ මඟුල් අවමඟුල් අවස්ථා සඳහා භික්ෂූන් යා යුතු ය. විහාරය හිස් කිරීමත් නුසුදුසු ය. මෙහි කවුරුන් නම් නවතා යන්නෙම් ද? කාශ්‍යපට නෑදැයෝත් දායකයෝත් මෙහි සිටිති. එහෙයින් උන්වහන්සේ නවතා යන්නෙමියි සිතා කාශ්‍යප ඔබේ පිරිසත් සමඟ ඔබ මෙහි නවතින්නැයි කීහ. එසේ ය ස්වාමීනි'යි කියා උන්වහන්සේ එහි නැවතුනහ.

භික්ෂූහු, ඇවැත්නි, අප කී දෙය එලෙසින් ම සිද්ධවූවා නොවේදැයි කීහ. එය ඇසුණු බුදුරජාණන් වහන්සේ මහණෙනි, මහකසුප් තෙරුන් කුලයෙහි හා ප්‍රත්‍යයෙහි ඇළුණු කෙනෙකැයි නොකියන්න. උන්වහන්සේ නැවතුනේ මගේ වචනය ඉටු කරන්නට ය. මෙතෙම පෙරත් පදුමුත්තර බුදු සමයෙහි දී ම කුලයෙහි මෙන් ම සිව්පසයෙහි නොඇළී සඳ මෙන් කුලයන් වෙත එළඹෙන්නට සමර්ථ වන්නෙම්වායි ප්‍රාර්ථනා කළ කෙනෙකි. මම චන්ද්‍රූපම ප්‍රතිපදාවත් අරියවංශ ප්‍රතිපදාවත් උන්වහන්සේ වැන්නවුන් නිසා ම දේශනා කළෙමියි වදාරා, මහණෙනි, කාශ්‍යප තෙරුන් දිය පිරුණු විලක බැස පීනා එයින් ඉගිලී කිසිවක නොඇළී නොලැග යන රාජ හංසයෙකු මෙනි. මගේ පුත්‍රයාගේ පිළිවෙල ද එය වන්නේයැ යි පූර්වාපර සන්ධි ගලපා දහම් දෙසමින් මේ ගාථාව දේශනා කළ සේක.

**උය්‍යුඤ්ජන්ති සතීමන්තො**
**න නිකෙතෙ රමන්ති තෙ**
**හංසා'ව පල්ලලං හිත්වා**
**ඔකමොකං ජහන්ති තෙ**

**පදාර්ථ:-**

**සතීමන්තො,** සිහිය දියුණු කළ රහතන් වහන්සේලා; **උය්‍යුඤ්ජන්ති,** තමා අවබෝධ කළ ධ්‍යාන හා විදර්ශනා සමාපත්තිවල යෙදී සිටිති; **තෙ න නිකෙතෙ රමන්ති,** උන්වහන්සේලා, පංචකාම ගුණයෙහි හෝ ගිහි ගෙයෙහි නො ඇලෙති; **පල්ලලං හිත්වා හංසා ඉව,** විලහැර යන හංසයන් මෙන්; **ඔකං ඔකං ජහන්ති,** ආලයෙන් ආලය හෙවත් සියලු සංසාර වාසස්ථාන අපේක්ෂා රහිතව ම හැර යති;

**විවරණය:-**

මෙහි '**උය්‍යුඤ්ජන්ති**' යයි කීවේ රහතන් වහන්සේලාට රහත් වීමෙන් පසු අමුතුවෙන් යෙදිය යුතු බණ භාවනාවක් නැති බැවින් තමා ලැබූ අර්හත් ඵල සමාපත්තියට හෝ ධ්‍යාන ආදියට සම වැදී වාසය කිරීම යි. **නිකෙත,** ආලය සහ **ඔක** යන වචනයෙන් හැඳින්වෙන්නේ වාසස්ථානය යි. ඒ පිළිබඳ ඇල්ම ද ආලය නමින් හැඳින්වේ. මුලින් ම ගිහි ගෙය, කම්සැප, පිළිබඳ ආලය දුරු කළ රහතන් වහන්සේ අවසානයේ දී මේ පංචස්කන්ධ නැමති නිවාසයත්, කාම, රූප, අරූප භවයන් පිළිබඳ ආලයත් දුරු කර ඒ සියල්ල හැරයන බැවින් **ඔකං ඔකං ජහන්ති** යයි කියනු ලැබේ.

## 4.5.3.3. රහතන් වහන්සේලාගේ රැස්කිරීම් නැත.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙහි බෙල්ලට්ඨිසීස නම් රහතන් වහන්සේ නමක් විසූහ. උන්වහන්සේ පිඬු සිඟා වැඩම කොට පිණ්ඩපාත දානය වළඳා නැවත වෙනත් වීථියකට වැඩම කොට වියලි ආහාර ලබා විහාරයට ගෙනගොස් තැන්පත් කොට තබයි. නිතර පිඬුසිඟා යාම කරදරයකැයි සිතා කීප දිනක් ම ධ්‍යාන සුවයෙන් වැඩ සිට අවශ්‍ය වන විට ඒ තැන්පත් කළ ආහාර වළඳති. භික්ෂූහු මේ බව දැක භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. උන් වහන්සේ ඒ කරුණ නිමිති කරගෙන මින් මතු සන්නිධිකාර පරිභෝජනය හෙවත් ආහාර රැස්කොට තබාගෙන පරිහරණය කිරීම නොකළ යුතු යයි ශික්ෂා පදයක් පැනවූහ. එම ශික්ෂා පදය පැණවීමට පෙර සිදු කළ නිසාත්, එසේ ම එය උන්වහන්සේගේ අල්පේච්ඡතා ගුණය නිසාත් සිදු වූවක් බැවිනුත් බෙල්ලට්ඨිසීස තෙරුන්ගේ දෝෂයක් නැති බව පැහැදිලි කරමින් මේ ගාථාවෙන් දහම් දෙසා වදාළ සේක.

**යෙසං සන්නිචයො නත්ථි**
**යෙ පරිඤ්ඤාත භොජනා**
**සුඤ්ඤතො අනිමිත්තො ච**
**විමොක්ඛො යස්ස ගොචරො**
**ආකාසෙ'ව සකුන්තානං**
**ගති තෙසං දුරන්නයා**

පදාර්ථ:-
**යෙසං**, යමෙකුගේ; **සන්නිචයො නත්ථි**, කර්ම රැස් කිරීමක් හෝ ප්‍රත්‍ය රැස්කිරීමක් නැත් ද; **යෙ**, යමෙක්; **පරිඤ්ඤාත භොජනා**, පිරිසිඳ දැන ආහාරය වළඳන සේක් ද; **යස්ස**, යමෙකුට **සුඤ්ඤතො අනිමිත්තොච විමොක්ඛො ගොචරො**, ශූන්‍යත, අනිමිත්ත, අප්පණිහිත යන ලක්ෂණ ඇති නිර්වාණය අරමුණු වේ ද; **ආකාසෙව සකුන්තානං ගති එව**, අහසෙහි පක්ෂීන් ගිය මග මෙන්; **තෙසං ගති**, ඒ රහතන් වහන්සේලා ගිය මග ද; **දුරන්නයා**, නොදත හැකි ය. (නැවත ගමනක් නැත යන අදහස යි)

විවරණය:-
**සන්නිචයො** යනු රැස් කිරීම යි. රැස් කිරීම් දෙකකි. කර්ම රැස් කිරීමත් ප්‍රත්‍ය පිරිකර රැස් කිරීමත් ය. රහතන් වහන්සේගේ මේ රැස් කිරීම් දෙක ම නැත.

**සන්නිධිකාර** යනු රැස්කොට තබා ගැනීම යි. භික්ෂූන් වහන්සේට චීවර පිණ්ඩපාත ආදී කිසිවක් රැස් කර තබා ගැනීම විනයෙන් තහනම් ය. සන්නිධිකාර පරිභෝජනයෙන් පචිති ඇවැතක් සිදු වේ. ඒ ඇවැතින් ගැලවීමට සංඝික ක්‍රමයට අනුව සඟ සතු දේ පොදුවේ ගබඩා කර හෝ තැන්පත් කර තැබීමට විධිවිධාන විනයේ සලසා ඇත.

**පරිඤ්ඤාත භොජනා** - මෙහිදී පරිඤ්ඤා හෙවත් පිරිසිඳ දැන ගැනීම් තුනකි. එනම්,

1. **ඤාත පරිඤ්ඤා** - තමාට ලැබෙන ආහාර මොනවාද? ඒවායේ ඒවා දැහැමි ද? නොදැහැමි ද? දැන ගැනීම.

2. **තීරණ පරිඤ්ඤා** - ආහාරයෙහි පිළිකුල් බව දැන ගැනීම.

3. **පහාන පරිඤ්ඤා** - ආහාරයෙහි ආශාව දුරුකොට නුවණින් දැන වැළඳීමයි.

**ත්‍රිවිධ විමොක්ෂ**

1. **සුඤ්ඤත විමොක්ඛ** - නිර්වාණය රාග, ද්වේශ, මෝහයන්ගෙන් තොර හෙයින් ශූන්‍යය.
2. **අනිමිත්ත විමොක්ඛ** - නිර්වාණය රාගාදී අරමුණු නිමිති සලකුණුවලින් ද තොර බව ය.
3. **අප්පණිහිත විමොක්ඛ** - රාගාදී ප්‍රාර්ථනාවලින් නිර්වාණාවබෝධය කළ රහතන් වහන්සේලා මිදුණු බවය.

### 4.5.3.4. පක්ෂියෙකුගේ පාසටහන් අහසෙහි නැත්තා සේ රහතන් වහන්සේගේ ගමන් මග දැකිය නොහැකි ය.

බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ වසන සේක. එකල අනුරුද්ධ මහ රහතන් වහන්සේ තම සිවුරු දිරාපත් ව ගිය බැවින් සිවුරක් කරගැනීම පිණිස පාංශුකූල රෙදි සොයති. මෙයින් තෙවෙනි භවයෙහි උන්වහන්සේට පුරාණ භාර්යාව වූ තවුතිසා දෙව්ලොව වැසි ජාලිනී නම් දෙව්දුවක් සිටියා ය. ඇය තෙරුන් වහන්සේ සිවුරක් සොයනු දැක දිගින් තෙළෙස් රියනක් පමණ වූ ද පළලින් සතර රියනක් පමණ වූ ද දිව්‍ය සළු තුනක් රැගෙන මේවා මේ අයුරින් ම දුනහොත් තෙරුන් වහන්සේ නොපිළිගනිති යි සිතා උන් වහන්සේ වඩින මාර්ගයෙහි ඉදිරියෙන් වූ එක් කසල ගොඩක රෙදි කෙළවර පමණක් පෙනෙන සේ තැබුවා ය. තෙරණුවෝ එය දැක මෙය කසල ගොඩක දමා ඉවත ලූ පාංශකූලයක් ය, යන සංඥාවෙන් රැගෙන වැඩියහ.

උන්වහන්සේ සිවුරු මසන දිනයෙහි භාග්‍යවතුන් වහන්සේ පන්සීයක් භික්ෂූන් පිරිවරා එහි වැඩම කොට චීවර කරන කටයුත්තට උදව් කළහ. එකල දෙව්දුව ද සිවුරු කරන අසූමහා ශ්‍රාවකයන් වහන්සේලා ඇතුළු මහ සඟරුවනට කැඳ බත් ආදී දානය ඇතුළු ගමෙහි මිනිසුන් අත යැව්වා ය. පන්සීයක් පමණ භික්ෂූන් වහන්සේලාත් වළඳා දානය විශාල ප්‍රමාණයක් ඉතිරි විය. මෙය දුටු භික්ෂූහු අනුරුද්ධ තෙරුන් මෙපමණ විශාල ප්‍රමාණයක් දානය පිළියෙල කරවූයේ කුමකට ද? භික්ෂූන් වහන්සේලාගේ පමණට දානය ගෙනාවේ නම් ප්‍රමාණවත් නොවේදැයි දොස් කියන්නට වූහ. ඒ බව ඇසූ භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, මේ දාන සම්භාරය අනුරුද්ධ තෙරුන් විසින් ගෙන්වන ලදැයි සිතන්නහු ද? එසේ නැත. මාගේ පුත්‍ර අනුරුද්ධයන් මෙබන්දක් ඉල්ලන්නේ නැත. රහත්හු ප්‍රත්‍ය පිළිබඳ කතා නොකරති. මේ වනාහි දේවානුභාවයෙන් උපන්නේයයි පූර්වාපර සන්ධි ගලපා වදාරා මෙම ගාථාවෙන් දහම් දෙසූ සේක.

> **යස්සාසවා පරික්ඛීණා**
> **ආහාරෙ ච අනිස්සිතො**
> **සුඤ්ඤතො අනිමිත්තො ච**
> **විමොක්ඛො යස්ස ගොචරො**
> **ආකාසෙව සකුන්තානං**
> **පදං තස්ස දුරන්නයං**

**පදාර්ථ:-**

**යස්ස,** යම් රහතන් වහන්සේ නමකගේ; **ආසවා පරික්ඛීණා** ආශ්‍රවයන් දුරු වූයේ වේ ද; **ආහාරෙ ච අනිස්සිතො,** කබලිංකාර ආහාරයෙහි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ඇලීමක් නැද්ද; **යස්ස,** යමෙකුට; **සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො ගොචරො,** ශූන්‍යත, අනිමිත්ත, අප්‍රණිහිත ලක්ෂණ ඇති නිර්වාණය අරමුණු වේද හෙවත් එය අරමුණු කොට වෙසේ ද; **ආකාසේ සකුන්තානං පදං ඉව,** අහසෙහි පක්ෂීන්ගේ පිය සටහන් මෙන්; **තස්ස පදං** උන් වහන්සේ ගිය තැන ද; **දුරන්නයං,** දත නොහැකි ය (ගිය තැනක් නැත);

**විවරණය:-**

**ආසවා** 1. **කාමසව** යනු ඉන්ද්‍රිය සයට ලැබෙන අරමුණු කෙරෙහි ඇතිවන කාම රාගය.
2. **භවාසව** යනු කාම, රූප, අරූප වශයෙන් සසර පැවතීමට ඇති ඇල්ම.
3. **දිට්ඨාසව** (යනු තමාගේ රූප වේදනා ආදී පංචස්කන්ධය සහ බාහිර රූපාදී ධර්මයන් පිළිබඳ ව නිත්‍ය ය, සුභ ය, සැප ය, ආත්ම යයි පවතින මිථ්‍යා දෘෂ්ටියයි.
4. **අවිජ්ජාසව** (යනු රූපාදී ස්කන්ධ ධර්මයන් පිළිබඳ අනිත්‍ය දුක්ඛ අනාත්ම යන සැබෑ තත්ත්වය වසාලන මෝහයයි.

ඇස කණ ආදී ඉන්ද්‍රියයන්ට අරමුණු මුණගැසීමේ දී වැගිරෙන්නේ ය. මතු වී එන්නේ ය යන අර්ථයෙන් ද කාම රූප අරූප යන මුළු භවය පුරාමත් සෝවාන් මාර්ගයට පත්වන තුරාමත් වැගිරෙමින් පවත්නා නිසා ද අරිෂ්ටාසව, සුරාසව, මෙන් සසර අනාදිමත් කාලයක් සත්ත්වයාගේ සිත්සතන් තුළ පැසව පැසවා පවතින හෙයින් ද මේවාට ආසව (ආශ්‍රව) යයි කියනු ලැබේ.

### 4.5.3.5. දෙවියන්ට ප්‍රිය වූ රහතන් වහන්සේ

බුදුරජාණන් වහන්සේ එක් වස් පවාරණ දිනයක මිගාර මාතෘ ප්‍රාසාදයෙහි පහත මාලයෙහි මහා ශ්‍රාවකයන් වහන්සේලා පිරිවරා වැඩහුන් සේක. ඒ වන විට මහා කච්චායන තෙරුන් වහන්සේ අවන්තියෙහි වැඩ වෙසෙති. උන්වහන්සේ දුරබැහැර සිට පවා දහම් ඇසීමට පැමිණීම සිරිත ය. ඒනිසා ම භික්ෂූහු මහාකච්චායන තෙරුන්ට අසුනක් වෙන්කර තබා ම වැඩ හුන්හ. සක් දෙව්රජු දෙදෙව්ලොව පිරිස ද සමඟ දිව්‍යමය සුවඳ මල් ආදිය ගෙන අවුත් බුදුරජාණන් වහන්සේට පූජා කර මහාකච්චායන තෙරුන් නොදක උන්වහන්සේ කොහි ද දූන්ම වඩිත් ද එසේ වඩින්නේ නම් යෙහෙකැයි සිතමින් සිටියේ ය. එසේ සිතත් ම උන්වහන්සේ පැමිණ පණවන ලද ආසනයේ වැඩ සිටියහ. සක් දෙවිඳු වහා ගොස් උන්වහන්සේගේ දෙපා ගොප්මස අල්ලාගෙන අනේ මම ඔබවහන්සේ වඩිතියි බලාපොරොත්තුවෙන් සිටියෙමියි කියා සුවඳ මල් ආදියෙන් පුදා වැඳ එකත් පසෙක සිටියේ ය. එය දුටු සෙසු පෘථග්ජන භික්ෂූන් වහන්සේලා සක් දෙවිඳු මුහුණ බල බලා

පුදසත්කාර කරන්නේ ය, මහා ශ්‍රාවකයන් වහන්සේලා, වැඩ සිටිය දී කච්චායන තෙරුන් වඩින තුරු ම බලා හිඳ උන්වහන්සේට ම පුද සත්කාර කළා නොවේදැයි දෝෂාරෝපණ මුඛයෙන් කතා කළහ. භාග්‍යවතුන් වහන්සේ එය අසා මහණෙනි, ඔබේ අදහසත් කතාවත් වැරදි සහගත ය. මා පුත් මහාකච්චායන වැනි හික්මු වූ ඉඳුරන් ඇති රහතන් වහන්සේලා මිනිස්සුන්ට වාගේ ම දෙවියන්ටත් ප්‍රියය යි වදාරා මෙම ගාථාව දේශනා කළ සේක.

**යස්සින්ද්‍රියානි සමථං ගතානි**
**අස්සා යථා සාරථිනා සුදන්තා**
**පහීනමානස්ස අනාසවස්ස**
**දෙවා පි තස්ස පිහයන්ති තාදිනො**

**පදාර්ථ:-**

**සාරථිනා,** දක්ෂ රියදුරෙකු විසින්, **යථා අස්සා සුදන්තා,** අශ්වයෝ මනාසේ දමනය කරනු ලබන්නා සේ; **යස්ස,** යම් රහතන් වහන්සේ නමකගේ; **ඉන්ද්‍රියානි,** චක්ෂුර් ආදී ඉන්ද්‍රියයන්; **සමථං ගතානි,** සංවරයට පත්වූයේ වේද; **පහීන මානස්ස,** මානය දුරු වූ; **අනාසවස්ස,** ආශ්‍රවයන් නැති; **තස්ස තාදිනො,** අෂ්ටලෝක ධර්මයෙහි නොසැලෙන ඒ රහතන් වහන්සේට; **දෙවා අපි පිහයන්ති,** දෙවියොත් ප්‍රිය කරති.

**විවරණය:-**

ඉන්ද්‍රිය සමථය යනු රූප ශබ්ද ආදී අරමුණු පිළිබඳ ව රාග වශයෙන් ඇලීමක් හෝ ද්වේෂ වශයෙන් ගැටීමක් නැතිව ඉඳුරන් සංසිඳුවා ගැනීමයි. මානය යනු මැනීමයි. සෙය්‍ය මානය හෙවත් තමා උසස්යයි මැනීම, සදිසමාන හෙවත් තමා හා සමානයයි මැනීම. හීන මාන හෙවත් තමා පහත්යයි මැනීම. යනුවෙන් මානය ත්‍රිවිධ ය. මෙය අනාගාමී වීම දක්වා ම පවතී. එය නැසෙන්නේ රහත් වීමෙනි.

### 4.5.3.6. රහතන් වහන්සේ මඩ නැති විලක් සේ පිරිසිදු ය.

එක් සමයෙක සැරියුත් මහරහතන් වහන්සේ වස් අවසානයේ චාරිකාවේ යෙදෙනු කැමැතිව බුදු රජාණන් වහන්සේගෙන් වැඳ අවසර ගෙන තමාගේ පිරිවර භික්ෂූන් වහන්සේලා සමඟ පිටත් වූහ. වෙනත් බොහෝ භික්ෂූන් වහන්සේලා ද උන්වහන්සේ සමඟ ගමනට එකතු වූහ. සැරියුත් මහරහතන් වහන්සේ නම්ගොත් වශයෙන් ප්‍රකට භික්ෂූන් වහන්සේලාට ඒ ඒ නම්ගොත්වලින් අමතා උන්වහන්සේලාගේ ගමන නැවැත්වූහ. එසේ නමින් එතරම් ප්‍රකට නොවූ භික්ෂූන් වහන්සේ නමක් අනේ තෙරුන් වහන්සේ මාවත් නමින් අමතා කතා කොට නවත්වන්නේ නම් යෙහෙකැයි සිතී ය. සැරියුත් තෙරුන් වහන්සේට එතරම් මහා භික්ෂු පිරිසක් මැද ඒ භික්ෂුවගේ සිතිවිල්ල පිළිබඳ සැලකිල්ලක් ඇති නොවී ය. ඒ භික්ෂුව තෙරුන් වහන්සේ අනික් අය මෙන් මා ගණන් නොගන්නේ යැයි වෛර බැඳගත්තේ ය. මේ අතර මහතෙරුන් අසලින් යන මේ භික්ෂුවගේ සිරුරේ තෙරුන්ගේ සිවුරු කොණ වැදිණ. එයින් උන්වහන්සේගේ තරහ තවත් වැඩි විය. සැරියුත් මහ තෙරුන් විහාර සීමාවෙන් පිටවෙනවාත් සමග ම මේ භික්ෂුව බුදුරජාණන් වහන්සේ වෙත ගොස් ස්වාමීනි, සැරියුත් මහතෙරුන් වහන්සේ තමා අගසව් වෙමියි කියා මගේ කණ පුපුරණ තරම් පහරක් දී සමාව ද නොගෙන පිටත්ව ගියේ යයි පැමිණිලි කළේ ය. බුදුරජාණන් වහන්සේ සැරියුත් මහතෙරුන් ආපසු කැඳවූහ.

මේ අවස්ථාවේ අනඳ තෙරුන් හා මහමුගලන් තෙරුන් වහන්සේලා අපේ වැඩි මහලු සොහොයුරාණන් වහන්සේ මේ භික්ෂුවට පහරක් නොදුන් බව ශාස්තෘන් වහන්සේ නොදන්නා සේක් නොවේ. එහෙත් මේ අධිකරණ විනිශ්චය කරන්නේ සැරියුත් මහ තෙරුන්ගේ සිංහනාදය අසන්නට විය යුතු යයි නිගමනය කොට සියලු භික්ෂූන් වහන්සේලා එහි රැස් කර වූහ. බුදුරජාණන් වහන්සේ ඒ සා මහත් මහසඟන මැද මහ තෙරුන්ගෙන් මෙම චෝදනාව සැබෑදැයි විමසූහ. එහිදී සැරියුත් මහරහතන් වහන්සේ තමන් එවැනි පහර දීමක් නොකළ බව නොපවසා තමන්ගේ ඉවසීම කොතරම් ද යනු, තමාගේ සිත පිරිසිදු දෙත් අපිරිසිදු දේත් සමව භාරගන්නා මහ පොළව වැනි ය. ජලය, සුළඟ, ගින්න වැනි ය යනාදී වශයෙන් උපමා නවයකින් විස්තර කළහ. උන්වහන්සේගේ එම දේශනාව අසා පෘථග්ජන භික්ෂූන් වහන්සේලාගේ ඇසින් කඳුළු වැගිරුණි. රහතන් වහන්සේලාට ධර්ම සංවේගය පහළ වුණි. චෝදනා කළ භික්ෂුවගේ මුළු සිරුර ම දැවෙන්නාක් මෙන් විය. උන්වහන්සේ වහා බුදුරදුන්ගේ පාමුල වැටී තමා කළ වරද පිළිගත්තේ ය.

අනතුරුව බුදුරජාණන් වහන්සේ උන්වහන්සේට සමාව දෙන්නැයි සැරියුත් තෙරුන්ට වදාළහ. තෙරණුවෝ උක්කුටිකයෙන් හිඳ බුදුරදුන් දෙස ඇඳිලි බැඳගෙන ස්වාමීනි, මම උන්වහන්සේට සමාව දෙමි. මා අත යම් දොසක් වේ නම් ඊට උන්වහන්සේ ද කමා කෙරෙත්වායි වදාළහ. තමා කෙරෙහි අභූත චෝදනාවක් කළ භික්ෂුවට පවා අල්පමාත්‍ර වූ හෝ කෝපයක් ද්වේෂයක් ඇති කර නොගෙන උක්කුටිකයෙන් හිඳ කමා කළ සැරියුත් මහ තෙරණුවෝ නම් මහ පුදුම කෙනෙකැයි උන්වහන්සේගේ නිවාත ගුණය පිළිබඳ ව දම්සභා මණ්ඩපයේ රැස් වූ භික්ෂූන් අතර කතා බහක් ඇති විය. බුදුරජාණන් වහන්සේ එය අසා මහණෙනි, සාරිපුත්ත තෙරුන් වැනි ඇත්තෝ මහ පොළොව බඳු ඉවසන, ඉන්ද්‍රඛීලයක් සේ නොසැලෙන ඇත්තෝ ය. ඔවුන් තුළ කෝපයක් ඇති කළ නොහැකි යැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**පඨවිසමො නො විරුජ්ඣති**
**ඉන්දඛීලූපමො තාදි සුබ්බතො**
**රහදොව අපෙත කද්දමො**
**සංසාරා න භවන්ති තාදිනො**

**පදාර්ථ:-**

**පඨවිසමො,** මහ පොළොව මෙන්; **නො විරුජ්ඣති,** සත්කාර අසත්කාර දෙකේදී අනුරෝධ විරෝධ නැතිව නැතිව සමසේ පිළිගනී; **ඉන්දඛීලූපමො** ඉන්ද්‍රඛීලයක් හෙවත් කුණාටුවකින්වත් නොසැලෙන නගර මැද සිටවූ කුළුණක් මෙන්; **තාදී** අටලෝ දහමින් කම්පා නොවන සුලු වූ; **සුබ්බතො,** මනා පිළිවෙතින් සපිරි රහතන් වහන්සේ; **අපෙත කද්දමො රහදො ඉව,** මඩනැති විලක් මෙන් ප්‍රසන්න ය; **තාදිනො,** ඒ අකම්ප්‍ය ගුණ ඇති හෙයින් රහතන් වහන්සේට; **සංසාරා න භවන්ති.** නැවත සසර සැරිසැරීම් නැත.

**විවරණය:-**

මෙහි ඉන්ද්‍රඛීල යනු රාජ්‍යයක ආනුභාවය සහ අභිමානය ප්‍රකට කිරීම සඳහා නගර මැද උස්ව හා ඍජුව පිහිටුවන කණුව හෝ කුළුණ යි. අශෝක රජතුමාගේ සිංහ කුළුණ හා පැරීසියේ අයිෆල් කුළුණ ඊට නිදසුන් ය. **තාදි** යනු අටලෝ දහමෙන් කම්පා නොවීමේ ගුණය යි. **සංසාරා න භවන්ති** යනුවෙන් කියවුණේ නැවත සුගති දුගතිවල සැරිසැරීමක් නැති බවයි.

## 4.5.3.7. තිදොර සංවර වූ රහතන් වහන්සේ

කොසඹෑ නුවර වැසි එක්තරා කුලපුත්‍රයෙක් සසුනෙහි පැවිදි උපසම්පදාව ලබා කෝසම්බිවාසී තිස්ස තෙර යයි ප්‍රසිද්ධව සිටියේ ය. වරක් වස් අවසානයේ කැපකරු දායක උපාසකතුමා තුන් සිවුරක් සහ ගිතෙල් මී පැණි ආදිය ද ගෙනවුත් උන්වහන්සේ පාමුල පිදුවේ ය. උන් වහන්සේ මට මෙයින් පලක් නැතැයි කියා එය පිළිගැනීමට අකමැති වූහ. උපාසකතුමා ඒ මන්දැයි විමසූ විට කැපකරුවෙකුවත් නැති මට මේවා පරිහරණය කිරීම කරදරයකැයි කීහ. එවිට උපාසක තැන ඉතා සතුටුව ස්වාමීනි, ඔබ වහන්සේට කැපකරු සහායකයෙකු ලෙස මගේ පුතා පැවිදි කරන්නට කැමැත්තෙමියි කීය. තෙරණුවෝ එම අදහසට එකඟ වූහ. උපාසක තුමා තමාගේ සත්හැවිරිදි පුතා උන්වහන්සේට භාර කළහ. තෙරුන් වහන්සේ ඔහුගේ හිස තෙමා තචපඤ්චක කර්මස්ථානය දී හිස බූ ගා අවසන් කරන විට ම කුමරුවා සිව් පිළිසිඹියාපත් රහත් බවට පත් විය. ඒ බව නොදත් ඔහු පැවිදි කරගත් තෙරුන් වහන්සේ අඩමසකට පමණ පසුව සාමණේරයන් සමග බුදුරජාණන් වහන්සේ දකීමට යාමට පිටත් වූහ. අතර මග දී උන් වහන්සේලාට එක් විහාරයක රෑ ගත කරන්නට සිදුවිය. තම උපාධ්‍යායන් වහන්සේට සෙනසුන පිළියෙල කිරීමට රෑ බෝ වූ බැවින් සාමණේර නමට සෙනසුනක් පිළියෙල කරගන්නට නොහැකි විය. ඒ පිළිබඳව තෙරුන් වහන්සේට කී විට නුපුරුදු තැනක එළිමහනේ විසීම නුසුදුසු බැවින් තම කුටියේ ම නිදන්නැයි කීහ.

තවමත් පෘථග්ජනයෙකු වූ තෙරුන් වහන්සේ ඇලවූ සැණින් නින්දට වැටුණහ. මෙසේ දින තුනක් ගත විය. තුන්වන දිනයේ සාමණේර නම අද දිනත් මා උපාධ්‍යායන් වහන්සේ සමග එක ම සෙනසුනේ විසුවොත් උන්වහන්සේට ඇවැත් සිදු වන්නේ යැයි සිතා මුළු රැය ම උපාධ්‍යායන් වහන්සේගේ ඇඳ අසල පර්යංකයෙන් හිඳගෙන ම ගත කළේ ය. තෙරුන් වහන්සේට ද අරුණට පෙර සිකපදය ගැන සිහි වී සාමණේර නම පිටත් කිරීමට විජිනිපත ගෙන එහි මිටේ අගිස්සෙන් පැදුරට තට්ටු කරන අදහසින් දුන් පහරින් සාමණේරයන් වහන්සේගේ ඇස තුවාල විය. ඒ බව නොකියා ස්වාමීනි, කිමදැයි ඇසූ විට පිටතට යන්නැයි තෙරණුවෝ කීහ.

සාමණේර නම තම ඇස එක අතකින් වසාගෙන පිටතට ගොස් එක අතකින් ම සියලු වතාවත් කරන්නට විය. උපාධ්‍යායන් වහන්සේට දැහැටි දඬු දුන්නේ ද එක අතකිනි. එයින් නොසතුටු වූ උපාධ්‍යායන් වහන්සේ ආචාර්ය උපාධ්‍යායන්ට වතාවත් කරන හැටි නොදන්නෙහිදැයි ඇසූහ. ස්වාමීනි, දනිමියි කියූ සාමණේර නම එසේ කිරීම හේතුව විස්තර කළේ ය. එය අසා උපාධ්‍යායන් වහන්සේට මහත් සංවේගයක් ඇති විය. උන් වහන්සේ වහාම උක්කුටිකයෙන් හිඳ සත්පුරුෂය නොදැන වූ වරදට සමාවනු මැනවැයි කීහ. එවිට සාමණේර නම සිය උපාධ්‍යායන් වහන්සේ අස්වසමින් ස්වාමීනි, මෙය ඔබේ දෝෂයක් නොවේ. මෙය මට සිදු වූයේ සසර කළ වරදකිනි. ඔබ වහන්සේගේ සිත කළඹල වන නිසා ඒ බව ඒ බව නොකීවේ මම ය. එබැවින් ඒ ගැන බරපතල ලෙස නොසිතනු මැනවැයි කීහ. කොතෙක් කරුණු කීවත් තෙරුන්ට සිත හදාගන්නට නොහැකි විය. උන් වහන්සේ සාමණේර නමගේ සිවුරු පිරිකරත් තමා ම ගෙන බුදුරදුන් වෙත කැඳවාගෙන ගියහ.

සියලු පුවත් දිවැසින් දුටු බුදුරජාණන් වහන්සේ උන්වහන්සේලා පැමිණ තමාට වැඳ එකත් පසෙක හුන් කල්හි සුව දුක් විමසූහ. එවිට තෙරණුවෝ, ස්වාමීනි, මට අමුතු අපහසුවක් නැත. එහෙත් මේ කුඩා සාමණේර නම තරම් උතුම් ගුණ ඇති වෙන කිසිවෙකු

මා දක නැතැයි සියලු තොරතුරු විස්තර කොට කීහ. එවිට බුදුරජාණන් වහන්සේ මහණ, රහතන් වහන්සේලා වනාහි කිසිවෙකුටත් කෝප නොකරති. ද්වේෂ නොකරති. සන්සුන් ඉඳුරන් ඇත්තෝ ය. සන්සුන් සිත් ඇත්තෝ යයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**සනතං තසස මනං හොති**
**සනතා වාචා ච කමම ච**
**සමමදඤඤා විමුතතසස**
**උපසනතසස තාදිනො**

**පදාර්ථ:-**

**සමමදඤඤා විමුතතසස,** චතුරාර්ය සත්‍යය මනාව දැනගෙන පංචවිධ විමුක්තියෙන් කෙළෙසුන්ගෙන් මිදුනා වූ ද; **උපසනතසස,** සිතේ රාගාදිය නැසුණු හෙයින් සංසිඳුනා වූ ද; **තාදිනො,** අට ලෝ දහමින් නොසැලෙන්නා වූ ද; **තසස,** ඒ රහතන්වහන්සේගේ; **මනං සනතං හොති,** සිත සන්සුන් වූයේ වෙයි; **වාචා ච කමම ච,** වචනයත් ක්‍රියාවත් සන්සිඳුනේ වෙයි.

**විවරණය:-**

පංච විමුක්තිය නම් කෙළෙසුන්ගෙන් මිදෙන ආකාර පහකි.

### 1. තදංග විමුක්තිය

යනු අලෝභයෙන් ලෝභය, අදෝසයෙන් දෝසය, අමෝහයෙන් මෝහය යනාදී වශයෙන් එක් එක් කුසලාංගයකින් අකුසලය යටපත් කොට කෙළෙසුන්ගෙන් මිදීමයි. පහන් එළියෙන් අඳුර දුරු කිරීම මෙන් එය තාවකාලික වශයෙන් සිත කෙළෙසුන්ගෙන් මිදෙන ලෞකික කාමාවචර ක්‍රමයකි. එහි විපාකයෙන් කාමභවවලින් ඔබ්බට යා නොහැකි ය.

### 2. වික්ඛම්භන විමුක්තිය

යනු සමථ භාවනාවෙන් නීවරණ මැඩ පවත්වා ධ්‍යාන උපදවා ගැනීමෙන් කෙළෙසුන්ගෙන් සිත මිදීම යි. කළයෙන් ගසා ඉවත් කරන ලද දිය මතු පිට ඇති සෙවෙල් පරඬැල් නැවත එක් රැස් වෙන්නා සේ තාවකාලික ය. ලෞකික ය, එයින් ලැබිය හැක්කේ රූපාවචර හෝ අරූපාවචර බ්‍රහ්මලෝක විපාක පමණි. මෙළොව දී ම ධ්‍යානයන්ගෙන් පිරිහීමෙන් හෝ පරලොව දී බඹලොව ආයුෂ ගෙවීමෙන් එම කෙළෙසුන්ගෙන් මිදීම අවසන් වේ.

### 3. සමුච්ඡේද විමුක්තිය

යනු සෝවාන් ආදී මාර්ග ඵලවලින් සක්කාය දිට්ඨි ආදී අදාළ කෙළෙසුන් සහ මුලින් ම නසමින් ගොස් රහත් මාර්ගයෙන් සියලු කෙළෙසුන් නැසීම යි. එය කරටිය කැඩුණු තල් පොල් වැනි ගසක් නැවත නොලියලන්නා වැනි ය. එය ලෝකෝත්තර ය, නැවත ඉපදීමක් නැත.

### 4. පටිප්පස්සද්ධි විමුක්තිය

යනු මාර්ගයෙන් කෙළෙසුන් නැසූ පසු ඵල සිතෙන් කෙළෙස් පුරුදුවලින් සිත මිදීම යි. එය ගිනි දල්වා තිබී ගිනි ඉවත් කළ තැනක තිබෙන උණුසුම දිය ඉස නිවීමක් වැනි ය.

### 5. නිස්සරණ විමුක්තිය

නිස්සරණ යනු යමකින් නික්මීම යි. එහි පිහිට අත හැරීමයි. ඒ අනුව සියලු භවයන්ගෙන් නික්මුණු හෙයින් ද ලෞකික අරමුණු අතහැර මාර්ගඵල සිත්වලින් නිර්වාණය අරමුණු කිරීම සිදු කරන හෙයින් භවය සම්බන්ධ සියලු දෙයින් මිදීම යන තේරුමෙන් නිර්වාණ තත්ත්වයට කියන නමකි.

සැකෙවින් කිවහොත් කාමාවචර කුසල සිත් පහළ වීම තදංග විමුක්තිය යි. රූපාවචර අරූපාවචර කුසල් සිත් ඉපදවීම වික්ඛම්භන විමුක්තිය යි. මාර්ග සිත් ඉපදවීම සමුච්ඡේද විමුක්තිය යි. ඵල සිත් පහළ වීම පටිප්පස්සද්ධි විමුක්තිය යි. නිර්වාණය නිස්සරණ විමුක්තිය යි.

## 4.5.3.8. උත්තම පුරුෂයා රහතන් වහන්සේ ය.

එක් දවසක් තිස්නමක් පමණ වූ වනවාසී භික්ෂූන් වහන්සේලා පිරිසක් බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ වැඳ එකත්පසක හුන්හ. බුදුරජාණන් වහන්සේ උන්වහන්සේලාට සිව්පිළිසිඹියා පත් රහත් බව ලැබීමට වාසනාව ඇති බව දැක උන්වහන්සේලාට අසා සිටින්නට සැරියුත් මහතෙරුන් සමග සාකච්ඡාවක් ආරම්භ කළ සේක.

සාරිපුත්‍රයිනි, සද්ධා ඉන්ද්‍රිය වැඩීමෙන්, එය නිරතුරුව ම ප්‍රගුණ කිරීමෙන්, නිවනට බැස ගැනීමට නිවනින් කෙළවර වීමට පුළුවන් බව ඔබ පිළිගන්නෙහි ද?

එසේ ම සති, විරිය, සමාධි, පඤ්ඤා ඉන්ද්‍රියයන් වැඩීමෙන් නිතර පුරුදු පුහුණු කිරීමෙන් නිවනට බැස ගැනීම නිවනින් කෙළවර වීම වන බව පිළිගන්නේදැයි මෙසේ පංච ඉන්ද්‍රියයන් පිළිබඳ ව ම විමසූ සේක.

එවිට සැරියුත් තෙරණුවෝ ඊට පිළිතුරු සපයමින් ස්වාමීනි, මම සද්ධා, සති, විරිය, සමාධි, පඤ්ඤා වැඩීමෙන් නිතර පුරුදු පුහුණු කිරීමෙන් නිවනට බැස ගැනීම නිවනින් කෙළවර වීම කළ හැකියැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඇති ශ්‍රද්ධාව නිසා පමණක් නොපිළිගනිමි. මන්ද ස්වාමීනි, යම් කෙනෙකුට ඒ කාරණය එසේ වන බව ප්‍රඥාවෙන් දැනගනු නොහැකි වෙයි ද. එය ප්‍රඥාවෙන් නොදුටු නොදන්නා ප්‍රත්‍යක්ෂ නොකළ හෝ ස්පර්ශ නොකරන ලද්දක් වෙයි නම් එවිට ඔවුන් ඒ කාරණය විශ්වාස කරන්නේ ශ්‍රද්ධාව නිසා පමණක් වන හෙයිනි යි වදාළහ.

එය අසා සිටි සෙසු භික්ෂූන් වහන්සේලා මේ සැරියුත් තෙරණුවන් තමන්ගේ වැරදි පිළිගැනීම් හෝ මත තව අත්හැර නැත. අදත් සම්මා සම්බුදුරදුන්ගේ වදන් නො අදහතියි කියන්නට වූහ. එය අසා බුදුරජාණන් වහන්සේ, මහණෙනි, ඔබ මේ පවසන්නේ කුමක් ද? මා සාරිපුත්‍රයන්ගෙන් විමසූවේ පංච ඉන්ද්‍රිය ධර්ම නොවඩා එසේ ම සමථ විදර්ශනා

නොවඩා මග පල සාක්ෂාත් කරන්නට සමතෙකු ඇතැයි ඔබ විශ්වාස කරනවා ද කියා යි. උන්වහන්සේ මට කීවේ එසේ සාක්ෂාත් කරන්නෙක් ඇතැයි කියා විශ්වාස නොකරමියි කියා ය. මහණෙනි, දුන් දෙයක හෝ කරන දෙයක ඵල විපාක විශ්වාස නොකරන කෙනෙක් බුද්ධාදී උතුමන් වහන්සේලාගේ ගුණ ද විශ්වාස නොකරති. මේ සැරියුත් තෙරුන් වහන්සේ ධ්‍යාන විදර්ශනා මාර්ගඵල ධර්ම පිළිබඳ තමා ම අවබෝධ කරගෙන සිටිති. අනුන් කී නිසා පිළිගන්නා කෙනෙක් නොවෙති. උන් වහන්සේගේ ප්‍රකාශයෙන් කියවුනේ එයයි. ඒ නිසා උන්වහන්සේගේ ප්‍රකාශය අපවාදයට ලක් කිරීම සුදුසු නොවේ යයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**අස්සද්ධො අකතඤ්ඤු ච**
**සන්ධිච්ඡෙදො ච යො නරො**
**හතාවකාසො වන්තාසො**
**ස වෙ උත්තම පොරිසො**

පදාර්ථ:-

**අස්සද්ධො,** (තමාම කරුණු අවබෝධ කරගත් බැවින්) අනුන් කී නිසා නො අදහන්නා වූ ද; **අකතඤ්ඤු,** (කිසිවෙකු විසින් කරන ලද්දක්, මවන ලද්දක් නොවන හෙයින්) **අකත** නම් වූ නිවන දැනගත්තා වූ ද; **සන්ධි ච්ඡෙදො,** සංසාර සන්ධි හෙවත් ගැට ගැසීම් සිඳ දැමුවා වූ ද; **හතාවකාසො,** නැවත ඉපදීමට ඇති ඉඩ නැසුවා වූ ද; **වන්තාසො,** සියලු ආශාවන් වමාරා දැමුවා වූ ද; **යො නරො,** යම් පුද්ගලයෙක් වේ නම්; **සවෙ උත්තම පොරිසො,** හෙතෙම ඒකාන්තයෙන් ම උත්තම පුරුෂයෙකි.

විවරණය:-

මෙම ගාථාව ප්‍රහේලිකාවක ආකාරයෙන් දේශනා කරන ලද්දකි. **අස්සද්ධො** යන්නෙහි උඩින් පෙනෙන අදහස ශ්‍රද්ධාව නැති යන්නයි. එය බෞද්ධ ශ්‍රාවකයෙකුගේ ලක්ෂණය නොවේ. මෙහි **අස්සද්ධො** යනු **පච්චත්තං වෙදිතබ්බො** යි කී ආකාරයෙන් රහතන් වහන්සේ තමන්ම සත්‍ය වටහාගනු මිස අනුන් කී නිසා නො අදහන බව ය.

**අකතඤ්ඤු** කී සැණින් අපට හැඟෙන්නේ කෙලෙහි ගුණ නොදන්නා යන අර්ථයයි. එහෙත් මෙහි අකත යනු නොකළ, නොතැනූ යන අදහසයි. ලොව ඇති සියල්ල හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් හෝ නිර්මාණ ශිල්පීන් විසින් නිමවන ලද්දේ ය. ඇතැමෙක් ඒවා දෙවියන් විසින් මවන ලදැයි විශ්වාස කරති. ලෝකෝත්තර නිවන යනු නැවත සකස් වීමක් නැති බවයි. එනම් **අකත** බවයි. රහතන් වහන්සේ එය දැන ගන්නා බැවින් **අකතඤ්ඤු** නම් වෙති. එනම් නිර්වාණාවබෝධයයි.

**සන්ධිච්ඡෙදො,** මෙය ගෙවල් බිඳීමට කියන නමකි. රහතන් වහන්සේ කුසල අකුසල කර්ම බීජ නැසූ හෙයින් නැවත ඉපදීමක් නැත. සසර සමග ඇති සන්ධි සිඳින ලද්දේ ය යන අර්ථය මෙයින් කිය වේ.

## 4.5.3.9. රහතුන් වහන්සේ වෙසෙන තැන සිත්කළු ය.

සැරියුත් තෙරුන්ගේ සහෝදර සහෝදරියෝ හය දෙනෙකි. ඒ අතරින් චුන්ද, උපසේන යන සහෝදරයන් දෙදෙනාත් චාලා, උපචාලා, සිසුපචාලා යන සහෝදරියන් තිදෙනාත් කලකදී බුදු සසුනේ පැවිදි වූහ. ගෙදර ඉතිරි වූයේ හත් හැවිරිදි රේවත කුමාරයා පමණි. දරුවන් හයදෙනෙක් ම පැවිදි වූවත් ඔවුන්ගේ මව්පියන් බුදුදහම වැළඳ නොගත්හ. හිඳු භක්තිකයෝ ම වූහ. මේ නිසා ම තමාගේ සොහොයුරු රේවත කුමාරයන් පැමිණියහොත් වහා ම පැවිදි කරන්නැයි ද මව්පියන්ගෙන් විමසන්නට අවශ්‍ය නැත. ඔවුහු තවමත් මිථ්‍යා දෘෂ්ටිකයෝ ය, රේවත කුමාරයාට මවටත් පියාටත් සිටින්නේ තමායයි සැරියුත් තෙරුන් කල් ඇතිව ම සංඝයාට දැනුම් දී තිබුණි.

මේ අතර සැරියුත් තෙරුන්ගේ මව ''දරුවන් හය දෙනෙක් ම ගිහිගෙය හැර ගියෝ ය. මේ කුමාරයාත් ගියහොත් පරම්පරාව නැසේනේ'' යයි සිතා කුමරුවන් සත්හැවිරිදි වියේදී ම ආවාහ විවාහය නියම කොට ගිහිගෙදර බැඳුමෙන් බැඳ තබන්නට තීරණය කළා ය. ඒ අනුව සුදුසු කුමාරිකාවක් තෝරාගෙන දින නියම කරගෙන මංගලෝත්සවය සූදානම් කරන ලදී. එම කුමරියට අවුරුදු එකසිය විස්සක් ආයු ඇති දත් හැලුණු කෙස් පැහුණු, ඇඟිලි වැටුණු සිරුරේ ලප කැළැල් හටගත් වහලක් මෙන් කුදු වී වක ගැහැණු මිත්තනියක් සිටියා ය. මංගලෝත්සවයට ගිය රේවත කුමාරයාට  ඇය දකින්නට ලැබුණි. එය ඔහු එබඳු කෙනෙකු දුටු පළමු වතාව විය. ඒ නිසා ම ඒ කවුරුදැයි විමසූ කල ඇය මහලු වූ මිත්තනියකැයි කීහ. ඇයට මේ සිදුවී ඇත්තේ කුමක්දැයි ඇසූ විට අප කාටත් කලකදී සිදුවන දේ තමායි යයි සෙස්සෝ කීහ. මේ විපත තමන්ටත් සිදු වේ යයි දැනගත් සසර පින්පුරා සිටි රේවත කුමාරයාට මහත් තැති ගැනීමක් ඇති විය. එසේ නම් මගේ වැඩිමහළු සොයුරු උපතිස්ස දැක තිබෙන්නේ එයයි. මමත් අද ම මේ උගුලෙන් ගැලවී පැවිදි විය යුතු යයි හෙතෙම තීරණය කළේ ය.

කුමාරිකාව කැන්දාගෙන ආපසු එන අතර මගදී සිරුර කිසක් කරන්නට අවශ්‍යයි කියා මදක් කැලයේ වහන්ව රැඳී සිට ආපසු ආවේ ය. මෙසේ තැන් තැන්වලදී තෙවරක් ම කැලයට ගොස් ආපසු අවුත් නෑයන්ට අමුතු සැකයක් නැතැයි දැනුණු හෙයින් ඊළඟ වතාවේ කැලෑවැදී වහන් වී පලා ගියේ ය. එසේ පලා යන විට තිහක් පමණ භික්ෂූන් වාසය කරන වෙහෙරක් හමු විය. එහි විසූ භික්ෂූන් වෙත ගිය හෙතෙම තමා පැවිදි කරන ලෙස ඉල්ලා සිටියේ ය. සැරසී සිටි ආභරණ නිසා මොහු රාජ කුමාරයෙක් ද ඇමති පුතෙක් ද'යි භික්ෂූන්ට සැකයක් ඇති විය. එහි දී තමා සැරියුත් තෙරුන්ගේ බාල සහෝදරයා යි හඳුන්වා දුන් පසු සැරියුත් තෙරුන්ගේ අනුමැතිය ලැබී තිබූ බැවින් වහා ම ඔහු පැවිදි කරන ලදි.

එසේ පැවිදි කොට උන්වහන්සේලා සැරියුත් තෙරුන්ට දන්වා යැවූහ. එවිට සැරියුත් තෙරණුවෝ ස්වාමීනි, අරණ්‍යයක භික්ෂූන් වහන්සේලා, මා සොයුරු රේවත පැවිදි කොට ඇත. මම ඔහු හමු වී එන්නට යනු කැමැත්තෙමියි බුදුරදුන්ගෙන් අවසර ඉල්ලා සිටියහ. බුදුරජාණන් වහන්සේ කිහිප දවසක් ඉවසන ලෙස දන්වා සිටියහ. දෙවනුව ද සැරියුත් තෙරණුවෝ එම ඉල්ලීම කළහ. එවර බුදුරජාණන් වහන්සේ සාරිපුත්‍ර ඒ ගමනට මමත් එමි එතෙක් ඉවසන්නැයි වදාළහ. මෙසේ වස් කාලය ද ළං විය. රේවත සාමණේරයෝ ද තමා එහි සිටියහොත් නෑ හිතවතුන් පැමිණ ආපසු රැගෙන යනු ඇතැයි සිතා ඒ භික්ෂූන් වහන්සේලාගෙන් කමටහන් ඉගෙන පා සිවුරු ගෙන යොදුන් තිහක් පමණ දුර

පා ගමනින් ගොස් කිහිරි වනයක වාසය කරන්නට වූහ. වස් තුන් මාසය ඇතුළත ම උන්වහන්සේ කමටහන් වඩා සිව්පිළිසිඹියාපත් රහත් බවට පත් වූහ. කිහිරි වනයේ විසූ නිසා උන්වහන්සේ ඛදිරවනිය රේවත නමින් ප්‍රකට වූහ.

වස් අවසානයේ සැරියුත් තෙරණුවෝ නැවත රේවත සාමණේරයන් දැකීමට යාමට බුදුරදුන්ගෙන් අවසර පැතූහ. එදා බුදුරජාණන් වහන්සේ ද පන්සීයක් භික්ෂූන් සමග සැරියුත් තෙරුන් හා ගමනට පිටත් වූහ. ඒ කිහිරි වනයට ගම්මාන මැදින් යන මාර්ගය හැටයොදුන් දික් මගකි. තිස් යොදුන් කෙටි මාර්ගය ගෙයක් දොරක් ගම්මානයක් නැති දුෂ්කර වනගත මාර්ගයක් විය. ආනන්ද තෙරුන් ඒ බව භාග්‍යවතුන් වහන්සේට දැන් වූ විට උන්වහන්සේ ආනන්ද සීවලී තෙරුනුත් අප සමග පැමිණියේ දැයි විමසූහ. එසේ ය ස්වාමීනි'යි කීකල්හි එසේ නම් අපි කෙටි මගින් යමුයි පිටත් වූහ. කිහිරි වනයට ළඟාවන තුරු ම සීවලී තෙරුන්ගේ පුණ්‍යානුභාවයෙන් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට සියලු පහසුකම් දෙවියන් විසින් සපයනු ලැබී ය. බුදුරජාණන් වහන්සේ සීවලී තෙරුන්ට ඒ අවස්ථාව සැළසුවේ සීවලී තෙරුන්ගේ විශේෂ පුණ්‍යානුභාවය වන ලාභීන් අතර අග්‍රස්ථානය කාටත් ප්‍රකට වනු පිණිස ය. සීවලී පිරිතේ සඳහන් වන්නේ ද මේ ගමන පිළිබඳ පුවත යි.

බුදුරජාණන් වහන්සේ මාසයක් පමණ භික්ෂූන් සමග එහි වැඩ විසූහ. නැවත ඉන් පිටත්ව මසක් පමණ ඇතුළත පෙරළා සැවැත්නුවරට වැඩමවා එහි පූර්වාරාමයට වැඩියහ. ඒ වන විට බුදුරජාණන් වහන්සේ කිහිරි වනයට වැඩි පුවත සැවැත්නුවර කා අතරත් පැතිර තිබුණි. විශාඛාව ද සිය නිවසට වැඩම වූ ආගන්තුක මහලු භික්ෂූන් දෙනමකගෙන් කෙසේ ද ස්වාමීනි, රේවත තෙරුන් වැඩ සිටින තැන රමණීය තැනක්දැයි ඇසූහ. ඒ ගමන ගැන එතරම් සිත් මනාපයක් නොතිබූ උන් වහන්සේලා, උපාසිකාවෙනි, මොන රමණීය කමක් ද? සුදු කටු පිරුණු කිහිරිගස් වදුලකි. එය ප්‍රේතයන් වසන තැනක් වැනි යයි කීය. නැවත විශාඛාව සිය නිවසට වැඩම වූ තරුණ භික්ෂූ දෙනමකගෙන් ඒ ගැන විමසූ විට උපාසිකාවෙනි, එය වර්ණනා කොට නිම කළ නොහැකි රමණීය තැනකැයි කීය. විශාඛාවට මේ දෙපිරිසගේ පරස්පර කතාව මහත් කුතුහලයක් විය. බුදුරජාණන් වහන්සේ එහි වැඩම වූ අවස්ථාවක ස්වාමීනි, මෙහි පැමිණි භික්ෂූන් දෙනමක් රේවත තෙරුන් වසන කිහිරි වනය මහ දුෂ්කර වනගහණයක් යයි කිව්වෝ ය. තවත් දෙනමක් එය ඉතා රමණීය තැනකැයි කිව්වෝ ය. ස්වාමීනි, මේ කතාව කුමක් දැයි ඇසුවා ය. එවිට බුදුරජාණන් වහන්සේ උපාසිකාවෙනි, ගමක් හෝ වේවා කැලයක් හෝ වේවා යම් තැනක රහතන් වහන්සේ නමක් වෙසේ නම් එතැන ඒ නිසාම රමණීය වේයයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**ගාමෙ වා යදි වා රඤ්ඤෙ**
**නිනෙන වා යදි වා ථලෙ**
**යත්ථාරහන්තො විහරන්ති**
**තං භූමිං රාමණෙය්‍යකං**

**පදාර්ථ:-**

**ගාමෙ වා**, ගමක හෝ; **යදි වා අරඤ්ඤෙ**, වනාන්තරයක හෝ **නිනෙන වා**, වල සහිත තැනක හෝ; **යදි වා ථලෙ**, ගොඩැලි බිමක හෝ; **යත්ථ**, මේ කුමන හෝ තැනක; **අරහන්තො විහරති** රහතන් වහන්සේලා වෙසෙත් නම්; **තං භූමිං**, එම භූමිය; **රාමණෙය්‍යකං**, සිත් අලවා

විසීමට සුදුසු ය. සිත් කළු ය.

**විවරණය:-**

ගමෙහි ජනයා ගැවසෙන හෙයින් රහතන් වහන්සේටවත් කාය විවේකයක් නම් නැත. එහෙත් කෙලෙසුන්ගෙන් මිදුණු හෙයින් චිත්ත විවේකය නම් ඇත. ආරණ්‍යයේ කාය විවේකය හා චිත්ත විවේකය යන දෙක ම ඇත. මේ කොතැනක වුවත් රහතන් වහන්සේ වෙසේ නම් උන්වහන්සේ නිසා ම ඒ පෙදෙස රමණීය තැනක් වන්නේ ය.

## 4.5.3.10. කාමභෝගියෝ වනයට ප්‍රිය නොකරති.

එක්තරා පිණ්ඩපාතික භික්ෂූන් වහන්සේ නමක් බුදුරදුන්ගෙන් කමටහන් ගෙන එක් දිරාපත්ව ගිය උයනකට වී මහණදම් පුරන්නට විය. මේ අතර එක්තරා වෙසඟනක් පුරුෂයෙකුට අසවල් තැන දී හමුවෙන්නැයි තැනක් සඳහන් කොට අවුත් එතැනට වී සිටියා ය. එහෙත් ඒ පුරුෂයා එහි නො ආවේ ය. ඔහු එනතුරු බොහෝ වේලා මග බලා සිටි ඇය නෙපැමිණි පුරුෂයා වෙත අමනාපයෙන් ඒ මේ අත ඇවිදින අතර ඒ උයනට පිවිසියා ය. එහි පලක් බැඳ සිටින ඒ තෙරුන් හැර වෙන කෙනෙකු නොදැක, රාගයෙන් මත්ව සිටි ඇය මේ පුරුෂයාවත් පොළඹවා ගන්නෙමි යි සිතා උන්වහන්සේ ඉදිරියේ සිට නොයෙක් විකාර දක්වන්නට වූවා ය. වරෙක ඇය ඇඳිවත ලිහා ගැට ගසයි. කෙස් මුදාහරියි, නැවත බඳියි, අත්පොලසන් දී සිනාසෙයි. තෙරුන් වහන්සේට මේ උසුළු විසුළු දැනී සිතේ සංවේගයක් ඉපදී, එය ශරීරය පුරා ද පැතිර ගියේ ය.

මේ අතර බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ වෙතින් කමටහන් ගෙන මහණදම් පිරීමට ගිය භික්ෂුවගේ තොරතුරු කෙසේදැයි බැලූහ. එවිට ඒ ස්ත්‍රිය ද ඇයගේ නොමනා හැසිරීම් ද දැක තෙරුන්ට උපන් සංවේගය ද දැන ගඳකිළියේ හිඳිමින් ම සෘද්ධියෙන් භික්ෂුව ඇමතූ සේක. මහණ, කම්සුව සොයන්නන් ප්‍රිය නොකරන තැන් වීතරාගීන් ප්‍රිය කරන තැන් වේය යි වදාරා ආලෝකයක් පතුරුවා උන්වහන්සේට දහම් දෙසමින් මේ ගාථාව දේශනා කොට වදාළ සේක.

**රමණීයානි අරඤ්ඤානි**
**යත්‍ථ න රමතී ජනො**
**වීතරාගා රමෙස්සන්ති**
**න තෙ කාමගවෙසිනො**

**පදාර්ථ:-**

**රමණීයානි අරඤ්ඤානි** ගස්වැල් මල් ඵල ආදියෙන් සැදුණු අරණ්‍යයෝ සිත් කළු ය; **යත්‍ථ න රමති ජනො,** ඒවා කම්සැප සොයන ජනයා නොයැලෙන තැන් ය; **වීතරාගා රමෙස්සන්ති,** රාගය නැසූ රහතන් වහන්සේලා එහි ඇළුම් කරති; **න තෙ කාම ගවෙසිනො** උන්වහන්සේලා, පස්කම් සුව සොයන්නන් නොවන හෙයිනි;

**විවරණය:-**

බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ නාගිත සූත්‍රයේ දී යම් භික්ෂුවක් ධ්‍යානලාභීව ගමෙහි හෝ නගරයෙහි වෙසේ නම් තමන් වහන්සේ ඊට කැමති නැත. මන්ද

එහි සිටින කවුරු හෝ කෙනෙකු නිසා උන්වහන්සේ ධ්‍යානයෙන් වුවත් පිරිහෙන්නට ඉඩ ඇති නිසායැයි වදාරති. එසේ ම යම් භික්ෂූන් වහන්සේ කෙනෙක් වනගතව නිකම් නිදිකිරමින් සිටියත් තමන් ඊට කැමති ය. මන්ද ඒ භික්ෂූන් වහන්සේට ගමෙහි හෝ නගරයෙහි මෙන් මහණකමට බාධාවන දේ එහි නැත. ඒ නිසා කවර මොහොතක හෝ ඒ නිදිමත දුරු කොටගෙන අරණ්‍යසංඥාවෙන් වාසය කොට මහණ දම් සපුරා ගනු ඇති බැවිනැයි වදාරා තිබේ. මේ අනුව රාගය දුරුකරන්නන්ට සුන්දර තැන වන්නේ ගම නගරය නොව වනපෙත ය.

**අභ්‍යාස**

01. ධම්මපදයේ අරහන්ත වග්ගයේ රහතන් වහන්සේ පිළිබඳ එන කරුණු වගුගත කරන්න.
02. අරහන්ත වග්ගයට අදාළ ගාථා හා අර්ථ වනපොත් කර මතකයෙන් දක්වන්න.
03. ඛදිරවනිය රේවත තෙරුන්ගේ කතාව ශිෂ්‍ය සමිතියට ඉදිරිපත් කරන්න.

20 පාඩම

# කමටහන් උගනිමු

## (සම සතළිස් කර්මස්ථාන)

කර්මස්ථාන යනු භාවනාව සඳහා යොදා ගැනෙන අරමුණු හෙවත් නිමිති ය. සමථ භාවනාව වැඩීම සඳහා සුදුසු වූ අරමුණු හතළිහක් බුදුදහමෙහි දැක් වේ. ඒවා සමසතළිස් කමටහන් නමින් හැඳින් වේ.

ආනාපාන සතිය හැර සෙසු අනුස්සති භාවනාත්, බ්‍රහ්මවිහාර භාවනාත් යන ඒවා සැම තැනකදී ම, කිසිදු භේදයකින් තොරව සැම අයෙකුට ම වැඩිය හැකි කර්මස්ථානයෝ ය.

සමසතළිස් කර්මස්ථාන අතුරින් සෙසු භාවනා සියලු පුද්ගලයන්ට එක සමානව ගෙන භාවනා කිරීමට නොහැකි ය. ඒ ඒ පුද්ගලයාට උචිත, කර්මස්ථානය හඳුනාගෙන භාවනාව සඳහා යොදා ගත යුතු ය. ඒ අනුව කර්මස්ථාන ප්‍රභේද දෙකකි.

සබ්බත්‍ථක කම්මට්ඨාන - භේදයකින් තොරව වැඩිය හැකි කමටහන්
පාරිහාරිය කම්මට්ඨාන - ඒ ඒ පුද්ගලයන්ට සුවිශේෂ වූ කමටහන්

අපි දැන් පොදුවේ සමසතළිස් කමටහන් හඳුනා ගනිමු:

| | |
|---|---|
| 1. කසිණ | 10 |
| 2. අසුභ | 10 |
| 3. අනුස්සති | 10 |
| 4. බ්‍රහ්මවිහාර | 04 |
| 5. ආරුප්ප | 04 |
| 6. සඤ්ඤා | 01 |
| 7. වවත්ථාන | 01 |

| දස කසිණ | |
|---|---|
| 1. පඨවි කසිණය | 6. පීත කසිණය |
| 2. ආපෝ කසිණය | 7. ලෝහිත කසිණය |
| 3. තේජෝ කසිණය | 8. ඕදාත කසිණය |
| 4. වායෝ කසිණය | 9. ආලෝක කසිණය |
| 5. නීල කසිණය | 10. ආකාස කසිණය |

සිත එක් තැන් කිරීමට, සන්සුන් කිරීමට, සමාධි ගත කිරීමට බුද්ධ කාලයට පෙරසිට ම විවිධ උපක්‍රම භාවිත කර ඇත. ඒ සඳහා කසිණ භාවනාව ද ප්‍රකට වූවකි. සිත එකඟ කරගැනීමේ අරමුණක් ලෙස යොදාගන්නා පඨවී ආදී සංකේත කසිණ නමින් හැඳින් වේ. ඒ සඳහා සකස් කරගත් සංකේතාත්මක වස්තුව පුවරුව හෝ රූපය කසිණ මණ්ඩලය නමින් හැඳින්වේ. ඒ අනුව එයට ගැලපෙන සේ කසිණ මණ්ඩලයක් සකසා ගත යුතු ය. එය ඉගෙනුම් උපකරණයක්, දෘශ්‍යාධාරකයක් වැනි ය.

පඨවි කසිණ භාවනාව යනු පඨවි ධාතුව අරමුණු ගෙන භාවනා කිරීම යි. පඨවි ගතිය සංකේතවත් වන ලෙස අරුණුවන් මැටියෙන් (අරුණාලෝකයෙහි පැහැය ඇති මැටි) තැටියක් වැනි රවුමක් තනා ගත යුතු ය. බෙර ඇසක් මෙන් එක් වියත් සතර අඟලක් පමණට කවාකාර ලෙස සකසා ගත් එය පඨවි කසිණ මණ්ඩලය යැයි හඳුන්වනු ලැබේ. ඒ කසිණ මණ්ඩලය දෙස බලා **පඨවි..... පඨවි** යනුවෙන් යෝගියා භාවනාවේ යෙදෙයි. මේ අනුව එයින් අරමුණු කරන පඨවි ධාතුවත් එම කසිණ මණ්ඩලයත් එම කමටහන් භාවනාවත්, උපදවා ගන්නා ධ්‍යානයත් **පඨවි කසිණ** නමින් හැඳින් වේ.

ජලය අරමුණු කරගැනීමෙන් ආපෝ කසිණ භාවනාව සිදු කරයි. ඒ සඳහා පාත්‍රයක් වැනි රවුම් මුව ඇති භාජනයකට ජලය පුරවාගෙන ඒ දෙස බලා සිටිමින් ආපෝ කසිණය වැඩිය හැකි ය.

තේජෝ කසිණය වඩන්නේ ගින්න අරමුණු කොට ගෙන ය. එහි දී දරවලින් ගිනිගොඩක් හෝ පහනක් පිළියෙල කොට කවාකාර සිදුරක් ඇති තහඩුවක් වැනි යමක් ඒ සමීපයෙහි තබා ඒ සිදුරෙන් පෙනෙන ගින්න අරමුණු කොටගෙන භාවනාවේ යෙදිය හැකි ය.

වායෝ කසිණය වඩන්නේ සුළඟ අරමුණු කොට ගෙන ය. එහි දී සුළඟ නොපෙනෙන බැවින් මඳ සුළඟින් සෙලවෙන තම ඇස් මට්ටමේ තිබෙන ගහ, කොළ, දළු වැනි යමක් උපයෝගී කරගත හැකි ය.

නීල, පීත, ලෝහිත, ඕදාත යන වර්ණ අරමුණු කරගෙන වර්ණ කසිණ භාවනාව වඩනු ලැබේ. වර්ණ කසිණ මණ්ඩලයක් සකසා ගැනීමේ දී නිල්, කහ, රතු හා සුදු පාට ඇති රෙදි කඩක් හෝ එම වර්ණ ඇති සායම් පුවරුවක ආලේප කොට එක් වියත් සතර අඟලක ප්‍රමාණයේ රවුමක් පිළියෙල කරගනු ලැබේ. නීල කසිණ භාවනාව වඩන්නා නිල්පාට කසිණ මණ්ඩලය ආදී වශයෙන් ඒ ඒ යෝගාවචරයා වෙන වෙන ම වර්ණ කසිණ මණ්ඩල භාවිත කරයි. සකසාගත් කසිණ මණ්ඩලය දෙස බලා ගෙන එම වර්ණය මෙනෙහි කරයි.

ආලෝකය අරමුණු කොටගෙන ආලෝක කසිණය වඩයි. එහි දී බිමට හෝ බිත්ති ආදී යම් තැනකට සිදුරකින් වැටෙන හිරු එළිය, සඳ එළිය, පහන් එළිය වැනි ආලෝකයක් දෙස බලමින් ආලෝක කසිණය වඩයි.

ආකාස කසිණ භාවනාව යනු ආකාශය අරමුණු කරගෙන භාවනා කිරීම යි. ආකාස කසිණයේ දී යම් කිසිවක නියමිත ප්‍රමාණයේ සිදුරක් කිසියම් පුවරුවක සකසාගෙන ඒ තුළින් පෙනෙන අවකාශය බලමින් ආකාස කසිණය වඩයි.

| දස අසුභ | |
|---|---|
| 1. උද්ධුමාතක | 6. වික්ඛිත්තක |
| 2. විනීලක | 7. හත වික්ඛිත්තක |
| 3. විපුබ්බක | 8. ලෝහිතක |
| 4. විච්ඡිද්දක | 9. පුලවක |
| 5. වික්ඛායිතක | 10. අට්ඨික |

මෘත ශරීරයක විවිධ අවස්ථා අරමුණ කොටගෙන භාවනා කිරීම දස අසුභ භාවනාව යි. මොහොතින් මොහොත වෙනස්වන මළ සිරුරෙහි ස්වභාවය නුවණින් දැකීම මෙහි දී සිදු කරයි. එවිට ශරීරයේ අසුභ ස්වභාවය අවබෝධ වේ. ජීවිතයෙහි ඇති අසාර බව අවබෝධ වේ. මෙම භාවනාවේ දී අමුසොහොනක දැමූ මළසිරුරක් උපයෝගී කරගනු ලැබේ. මෙය ප්‍රායෝගිකව කළ නොහැකි බැවින් ඒ සඳහා ඒ ඒ අවස්ථාවන් නිරූපනය කරන රූප, සිතුවම් ආදිය භාවනාවට යොදාගත හැකි ය.

උද්ධුමාතක - ඉදිමීගිය මළසිරුර
විනීලක - ඉදිමී නිල්පැහැ ගැන්වුණු මළසිරුර
විපුබ්බක - සැරව වැගිරෙන මළසිරුර
විච්ඡිද්දක - සිදුරු වී ගිය මළසිරුර
වික්ඛායිතක - සතුන් විසින් කඩා කන ලද මළසිරුර
වික්ඛිත්තක - සතුන් විසින් ඇද ඉහිරුණු මළසිරුර
හත වික්ඛිත්තක - කැබලි කැබලි තැන තැන විසුරුණු මළසිරුර
ලෝහිතක - ලේ වැගිරෙන මළසිරුර
පුලවක - පණුවන් වැහුණු මළසිරුර
අට්ඨික - ඇට සැකිලි බවට පත් මළසිරුර

| දස අනුස්සති | |
|---|---|
| 1. බුද්ධානුස්සති | 6. දේවතානුස්සති |
| 2. ධම්මානුස්සති | 7. උපසමානුස්සති |
| 3. සංඝානුස්සති | 8. මරණානුස්සති |
| 4. සීලානුස්සති | 9. කායගතාසති |
| 5. චාගානුස්සති | 10. ආනාපානසති |

නැවත නැවත සිහිපත් කිරීම අනුස්සතිය යි. සිත වැඩීම පිණිස අනුස්සති කර්මස්ථාන දහයක් ඇත. එහි පළමු වැන්න බුදුගුණ මෙනෙහි කිරීම හෙවත් බුද්ධානුස්සතිය යි. අනන්ත වූ බුදුගුණයන්ගේ ස්වභාවය අතිමහත් ය. එබැවින් අපට වැටහෙන ප්‍රමාණයේ සිට බුදුගුණ සිහිකළ යුතු ය. නව අරහාදී බුදුගුණ අතරින් ''අරහං'' ආදී බුදුගුණ එකක් එකක් ගෙන අර්ථ සහිතව දීර්ඝ කාලයක් වැඩිය යුතු ය.

ධම්මානුස්සති භාවනාව නම් දහම්ගුණ මෙනෙහි කිරීම යි. ධර්මයෙහි ගුණ හයකි. එය ස්වාක්ඛාතො භගවතා ධම්මො යනාදී වශයෙන් එක් එක් ගුණය වැඩිය යුතු ය.

සංඝානුස්සති භාවනාවේ දී ආර්ය මහාසංඝරත්නයෙහි ගුණ මෙනෙහි කරයි. සඟ ගුණ නවයකි. සුපටිපන්නො ආදී එක් එක් ගුණය වෙන වෙන ම ගෙන අර්ථ සහිතව වැඩිය යුතු ය.

සීලානුස්සති භාවනාව නම් තමා පිහිටියා වූ සීලය පිළිබඳ ව මෙනෙහි කිරීම යි. තමන් සමාදන් වූ සීලයේ සිකපද මුලින්, මැදින් හෝ අගින් සිඳී ඇද්ද, නුවණැතියන්ගේ ප්‍රශංසාවට ලක්වන තරමින් සීලය රැකී ඇද්ද, සමාධියට පත්වීමට තරම් සීලය වැඩී ඇද්දැයි මෙනෙහි කිරීම යි.

චාගානුස්සති භාවනාව නම් තමාගේ පරිත්‍යාග ගුණය පිළිබඳ නිරතුරුව මෙනෙහි කිරීම යි. මසුරුකම් දුරුකොට දෙන කිසිවක් පිළිබඳ කිසිදු අපේක්ෂාවක් නොකොට අතහැරීමෙන් දන් දෙයි. පරිත්‍යාගයෙහි ඇලුණු සිතින් වාසය කරයි. පරිත්‍යාගයෙහි අනුසස් මෙනෙහි කරයි. ඉල්ලීමට සුදුස්සෙකු වෙයි. දීමෙහි බෙදාහදා ගැනීමෙහි හුරුපුරුදු අයෙකු වෙයි. මෙසේ තමාගේ ත්‍යාග ගුණය මෙනෙහි කොට සතුටු වීම චාගානුස්සතිය යි.

දේවතානුස්සති භාවනාව නම් දෙවියන් තුළ පවත්නා යහපත් ගුණ තමා තුළ උපදවා ගනිමින් ඒ පිළිබඳ මෙනෙහි කිරීම යි. ශ්‍රද්ධා, සීල, සුත, ත්‍යාග, ප්‍රඥා යන ගුණ දේවත්වය ලැබීමට හේතු වේ. තමා තුළ පවත්නා එබඳු ශ්‍රද්ධාදී ගුණ දෙවියන් තුළ පවත්නා ගුණයන්ට සමාන වශයෙන් ගෙන සිහිපත් කරයි. ඒ ගුණධර්ම තමා වෙත දියුණු කරගැනීමට වෑයම් කිරීම යි.

උපසමානුස්සති භාවනාව යනු නිර්වාණාවබෝධයෙන් දුක් සන්සිඳෙන බව මෙනෙහි කිරීම යි. නිර්වාණයෙහි ඇති ශාන්ත සුඛ ලක්ෂණය මෙනෙහි කිරීම යි.

මරණානුස්සති භාවනාව යනු මරණය ගැන සිහිකිරීම යි. මිනිසුන්ගේ ආයුෂය ඉතා අල්ප බවත් මරණයෙන් කෙළවර වන බවත්, වෙනත් විපතක් සිදු නොවුව හොත් මහලු වී හෝ මිය පරලොව යන බවත් මෙනෙහි කිරීම යි.

මිනිස් සිරුරෙහි පවත්නා යථා ස්වභාවය නුවණින් මෙනෙහි කිරීම කායගතා සති භාවනාව යි. තමාගේ සිරුර කිසිදු හරයක් නැති පිළිකුල් සහගත වස්තුවක් බවත්, දෙතිස් කුණපයකින් පිරුණු නව දොරකින් අසුචි වැගිරෙන මහා වනයක් ලෙසත් මෙනෙහි කිරීම යි.

ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳ සිහිය පිහිටුවාගෙන සිත එකඟ කරගැනීම ආනාපාන සති භාවනාව නමින් හැඳින් වේ.

| සතර බ්‍රහ්මවිහාර | |
|---|---|
| 1. මෙත්තා | 3. මුදිතා |
| 2. කරුණා | 4. උපෙක්ඛා |

බ්‍රහ්මයන් තුළ පවත්නා උතුම් ගුණ විශේෂයන් බ්‍රහ්මවිහාර ලෙස හැඳින් වේ. මෙම භාවනා සතර වැඩීමෙන් බඹලොව ඉපදීමට හැකිවන බැවිනුත් බඹලොව වැසියන් නිතර ම මේ ගුණ ධර්ම හතරින් යුතුව වාසය කරන බැවිනුත්, මේ ලොව කෙනෙකු හුරු පුරුදු කළ යුතු ගුණ ධර්ම අතර උතුම් ම ගුණ ධර්ම හතරක් වන බැවිනුත් මේවා බ්‍රහ්මවිහාර නමින් හැඳින් වේ. මෙම භාවනාව කිරීමේ දී මේ ධර්ම සතර කිසි ම විශේෂයක් නැතිව, සීමාවක් නැතිව මුළුලොව කෙළවර දක්වා සියලු අප්‍රමාණ සත්ත්වයන් වෙත වැඩිය යුතු හෙයින් අප්පමඤ්ඤා යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

මෙත්තා භාවනාව නම් මෛත්‍රිය යි. සියලු සත්ත්වයන් කෙරෙහි හිත සුව පැතීම යි. කරුණා භාවනාව නම් දුක්ඛිත සත්ත්වයන්ගේ දුකෙහි කම්පාවෙමින් ඔවුන් දුකින් මිදෙත්වායි ඉතසිතින් පතමින් කරන භාවනාව ය. මුදිතා භාවනාව නම් සුඛිත සත්වයන්ගේ සැප දැක ඊර්ෂ්‍යා නොකොට සතුටුවෙමින් ඉතා සුවපහසු ලෙස බොහෝ සම්පත් ඇතිව වාසය කරන පුද්ගලයන් කෙරෙහි පවා සතුටු ඇසින් බලමින් කරන භාවනාවයි. උපෙක්ඛා යනු සිතෙහි පවත්නා මැදහත් ස්වභාවය යි. තමන්ට ප්‍රිය පුද්ගලයන්ට මෙන් ම අප්‍රිය අමනාප අය කෙරෙහි ද මැදහත් සිතින් සත්වයන්ගේ සැප දුක් දෙක කර්මානුරූපව සිදුවන බව දැක මැදහත්ව කරන භාවනායි.

| සතර ආරුප්ප | |
|---|---|
| 1. ආකාසානඤ්චායතනය | 3. ආකිඤ්චඤ්ඤායතනය |
| 2. විඤ්ඤාණඤ්චායතනය | 4. නේවසඤ්ඤානාසඤ්ඤායතනය |

සතර ආරුප්ප යනු රූපය පිළිබඳ ඇල්ම, බැඳීම දුරුකොට ආකාසය ආදී අරූප අරමුණු ඔස්සේ සිත වැඩීම යි. එමගින් අරූපාවචර ධ්‍යාන ලැබීම යි. ආකාසානඤ්චායතනය යනු කසිණ වැනි නිමිත්ත ඉවත් කළ පසු එහි පවතින අරූපී ආකාසය අනන්ත යැයි භාවනා කිරීම යි.

විඤ්ඤාණඤ්චායතනය යනු ඒ ආකාසයත් බැහැර කොට එම ආකාසය ගැන මෙනෙහි කළ සිත අරමුණු කොට ගෙන භාවනා කිරීම යි. එයින් විඤ්ඤාණඤ්චායතනය ධ්‍යානයට පත් වීම යි.

ආකිඤ්චඤ්ඤායතනය යනු ආකාසයත් නැත, එය වැඩූ විඤ්ඤාණයත් නැත දැන් කිසිවක් නැතැයි මෙනෙහි කරමින් භාවනා කිරීම යි. එමගින් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පත්වීම යි.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යනු ඒ විඤ්ඤාණ ආරම්මණය ද දුරු කොට සඤ්ඤාවක් ඇත්තේත් නැතැයි. නැත්තේත් නැතැයි භාවනා කිරීම යි. එමගින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට පත්වීම යි.

### ආහාරෙ පටික්කුලසඤ්ඤා

ආහාරෙ පටික්කුලසඤ්ඤා භාවනාව යනු ශරීරයෙහි පැවැත්මට ගන්නා කබලිංකාර ආහාරයෙහි පිළිකුල් බව මෙනෙහි කිරීම යි. එනම්, පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාවෙහි සඳහන් පරිදි මෙම ආහාරය පඨවී ආදී ධාතු මාත්‍රයක් පමණක් බවත්, මෙය වළඳන පුද්ගලයාත්, ධාතු මාත්‍රයක් මිස සත්වයෙකු හෝ පුද්ගලයෙකු නොවන බවත්, මෙම පිරිසිදු ආහාරය මේ කුණුකය තුළට වැද ඉතා අපිරිසිදු අසුචියක් බවට පත්වන බවත් මෙනෙහි කිරීම යි.

### චතුධාතු වවත්ථාන

ධාතු මනසිකාරය නැතහොත් චතුධාතු වවත්ථාන භාවනාව යනු ජීව අජීව සියල්ල පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු වශයෙන් සතරට බෙදමින් යෝනිසොමනසිකාරයෙන් බැලීම යි. සත්වයන් ය, පුද්ගලයන් ය, ගහකොළ ය, ගේ දොර ය, ඉඩ කඩම් ය ආදී වශයෙන් සම්මත කරගෙන සිටින මුළු ලෝක ධාතුව ම අවසාන වශයෙන් බලනවිට පඨවී, ආපෝ, තේජෝ, වායෝ යන සතර ධාතුන්ගෙන් සකස් වූ ඒ ධාතුන්ගේ උපකාරයෙන් පවතින දේ බව මෙනෙහි කිරීම යි.

මෙසේ සමථ භාවනාවට අයත් කමටහන් සියල්ල වර්ග තුනකට බෙදා දැක්විය හැකි ය.

1. **ස්වභාවික ද්‍රව්‍යයක් හෝ වර්ණයක් අරමුණු කිරීම.**
2. **ශාරීරික ද්‍රව්‍යයක් අරමුණු කිරීම.**
3. **යහපත් හෝ සංවේදී සිතුවිල්ලක් අරමුණු කිරීම.**

| | |
|---|---|
| 1 වර්ගය | දස කසිණ (මැටි, ජලය, ගින්න, සුළඟ, - නිල්, රතු, කහ, සුදු ආදී වර්ණ - ආලෝකය, ආකාශය) |
| 2 වර්ගය | ආනාපාන සතිය (හුස්ම ගැනීම හා හෙළීම) දස අසුභ, මරණානුස්සතිය, (මල මිනී, ඇට සැකිලි) කායගතා සතිය (හිස කෙස් ආදී කුණප කොටස්) චතුධාතු වවත්ථානය. |
| 3 වර්ගය | බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දේවතානුස්සති, උපසමානුස්සති, අප්පමඤ්ඤා (මෙත්තා,කරුණා,මුදිතා) |

මෙහි පළමු වර්ගයේ හා දෙවන වර්ගයේ භාවනා සඳහා හොඳ පළපුරුදු ගුරු උපදේශයක් අනුව කටයුතු කළ යුතු ය. තෙවන වර්ගයට අයත් භාවනා ඔබට එදිනෙදා භාවිතයට ගතහැකි ය. අපි මෙම භාවනා කමටහන් අනුව භාවනා කර එහි සුවය අත්විඳිමු.

## ධම්මානුස්සති භාවනාව

දහම්ගුණ මෙනෙහි කිරීම ධම්මානුස්සති භාවනාව යි. දහම්ගුණ හය එකවිට ම සිහි කිරීමෙන් චිත්ත සමාධිය ඇති නොවේ. එක් එක් ගුණය වෙන වෙන ම ගෙන භාවනා කළ යුතු ය.

1. මාගේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය මුල, මැද, අග යන තුන් තැන ම මැනවින් දෙසූ හෙයින් ද, ත්‍රිපිටක ධර්මයත් නව ලෝකෝත්තර ධර්මයත් මනා කොට දේශිත හෙයින් ද ස්වාක්ඛාත වන සේක.

2. මාගේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය තමාගේ සන්තානයෙහි ඇති රාගාදී කෙලෙසුන් නැති කොට, තමා විසින් දකින හෙයින් සෝවාන් ආදී ආර්ය මාර්ග ධර්මය සන්දිට්ඨික වන සේක.

3. මාගේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය සෝවාන් ආදී ආර්ය මාර්ග ධර්ම අවබෝධ කරගත් ඇසිල්ලෙහි ම සෝවාන් ආදී ඵලධර්ම ලබා දෙන නිසා අකාලික වන සේක.

4. මාගේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය කවරෙකුට වුව ද එව බලව යනුවෙන් කැඳවා ඉදිරිපත් කළ හැකි තරම් ඉතා සාරවත් වූ හෙයින් ඒහිපස්සික වන සේක.

5. මාගේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය තම තමන්ගේ සිතට අරමුණු කර ගැනීමට ඉතා සුදුසුවන හෙයින් ඕපනයික වන සේක.

6. මාගේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය නුවණැතියන් තම තමන් විසින් ම අවබෝධ කරගත යුතු හෙයින් පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී වන සේක.

## සංඝානුස්සති භාවනාව

සංඝානුස්සති භාවනාවේ දී ආර්ය මහා සංඝරත්නයෙහි ගුණ මෙනෙහි කරයි. සඟ ගුණ නවයකි. එය සුපටිපන්නො ආදී සඟගුණ පාඨයෙහි දැක්වේ.

1. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය මනාවූ පිළිවෙතට පැමිණි හෙයින් සුපටිපන්න වන සේක.

2. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය නිවන පිණිස සෘජු මාර්ගයට පැමිණි හෙයින් උජුපටිපන්න වන සේක.

3. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය සිව්සස් අවබෝධය පිණිස ආර්ය අෂ්ටාංගික මාර්ගයට යොමු වූ බැවින් ඤායපටිපන්න වන සේක.

4. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය ගරු බුහුමන් ලැබීමට සුදුසු වන හෙයින් සාමීචිපටිපන්න වන සේක.

5. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය දුර සිට ගෙනවුත් පිරිනමන සිව්පසය පිළිගැනීමට සුදුසුවන හෙයින් ආහුනෙය්‍ය වන සේක.

6. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය ආගන්තුක දානය පිළිගැන්වීමට සුදුසු වන හෙයින් පාහුනෙය්‍ය වන සේක.

7. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය පින් සලකා දෙන දක්ෂිණාවන් පිළිගැනීමට සුදුසුවන හෙයින් දක්ඛිණෙය්‍ය වන සේක.

8. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය නළලෙහි ඇඟිලි බැඳ නමස්කාර කිරීමට සුදුසු වන හෙයින් අඤ්ජලිකරණීය නම් වන සේක.

9. මාගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ මහා සංඝරත්නය ලෝකයාගේ කුසල් වඩා ගැනීමට පින් කෙතක් හෙයින් අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත වන සේක.

## පැවරුම්

01. කසිණ භාවනාවට උචිත ඔබ කැමති කසිණ මණ්ඩලයක් නිර්මාණය කරන්න.
02. ධම්මානුස්සති භාවනාවට හා සංඝානුස්සති භාවනාවට අදාළ කරුණු ලැයිස්තුවක් පිළියෙල කරන්න.
03. කායගතාසති භාවනාවට අදාළ පින්තූර එකතුවක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
04. සතර බ්‍රහ්මවිහාර භාවනා ගැන ලිපියක් බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරන්න.
05. භාවනානුයෝගී ගුරුවරයෙකු වඩම්මවාගෙන ඔබට මෙතෙක් භාවනාවෙන් ලැබී ඇති අත්දැකීම් සාකච්ඡා කරන්න.

21 පාඩම

# සිත එකඟ කරන හැටි

## (සමථ භාවනාව)

සිත රාගාදියෙන් කිළිටි නොවූ ශාන්ත වූ කුසල් අරමුණක බොහෝ වේලාවක් රඳවා තබා ගැනීම සමථ භාවනාවේ ස්වරූපය යි. සමථ භාවනාව සඳහා චිත්ත භාවනා, සමාධි භාවනා යන නම් ද භාවිත කෙරේ. සමථ භාවනාවෙන් සිදුකරන්නේ සිත වික්ෂිප්ත කරන, නොසන්සුන් කරන, විවිධ අරමුණු කරා ගොස් සිත කිළිටි කරන නීවරණ ධර්මයන් යටපත් කොට සිත සාමකාමී සන්සුන් ස්වභාවයට පත් කිරීම යි. නීවරණ ධර්ම පහකි. ඒවා සමනය කරනුයේ සමථ භාවනාව මගිනි.

**පච්චනික ධම්මෙ සමෙතීති සමථො**

කාමච්ඡන්දාදී විරුද්ධ ධර්ම සමනය කරන්නේ සමථය යි. යනු විග්‍රහය යි.

සිත නිවන් මගින් බැහැර කරන්නේ නීවරණ ධර්මයෝ ය. නීවරණ ධර්මයන්හි පළමු වැන්න කාමච්ඡන්දය යි. කාම වස්තූන්හි ඇලීම කාමච්ඡන්දය යි. අරමුණු සුභ වශයෙන් බලන විට බලවත් ආශාව ඇති වේ. ඇලීම ඇතිවූ දෙය මම මගේ යැයි දැඩි කොට ගැනීම කාමච්ඡන්දයෙහි ස්වභාවය යි.

යම් අරමුණක් කෙරෙහි අප්‍රිය, අමනාප, විරුද්ධ ස්වභාවය ව්‍යාපාදය යි. එය දෙවැනි නීවරණය යි. කෝපය, වෛරය, ක්‍රෝධය, ද්වේශය යනුවෙන් හැඳින්වෙන්නේ ද ව්‍යාපාද නීවරණය යි.

තෙවැන්න ථීනමිද්ධය යි. ථීන - මිද්ධ නම් චිත්ත හා චෛතසිකයන්ගේ මැලි ගතිය යි. මෙම අකුසල චෛතසික දෙක එකට බැඳී සිටින අතර කුසල ධර්ම ආවරණය කරයි. එබැවින් ථීනමිද්ධය නීවරණයකි.

සිව්වැන්න උද්ධච්චකුක්කුච්චය යි. උද්ධච්චකුක්කුච්ච යනු ද චෛතසික දෙකකි. උද්ධච්ච නම් සිතේ නොසන්සුන් ගතිය යි. කුක්කුච්ච නම් සිතේ පසුතැවිලි ගතිය යි. මේ චෛතසික දෙක එකට යෙදුන විට උද්ධච්චකුක්කුච්ච නීවරණය ලෙස හැඳින් වේ.

පස්වැන්න විචිකිච්ඡාව යි. බුද්ධාදී අටතැන්හි සැක කිරීම විචිකිච්ඡාව යි. මෙය කුසල, ධ්‍යාන, මාර්ග ඵල ආදිය ලැබීමට බාධා කරන බැවින් නීවරණයකි.

සමථ භාවනාව වැඩීමෙන් මෙම නීවරණ පහ යටපත් කොට සිත සමනය කරගත හැකිය. එයින් සිත සමාධිගත වෙයි.

## කුසල චිත්තස්ස එකග්ගතා සමාධි

සිත යම් කුසල් අරමුණක් විෂයෙහි පැවැතීම, නැවතී සිටීම සමථය නම් වේ.

නොසන්සිඳුණු, විසිරී ගොස් පවතින සිතට කිසිදු ශක්තියක් හෝ බලයක් නැත. සන්සිඳුණු, ඒකාග්‍ර වූ සිතට ප්‍රබල ශක්තියක් ඇති වේ. සමථ භාවනාව මගින් ප්‍රථමධ්‍යානය, ද්විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය යන රූපාවචර ධ්‍යාන සතරත්, ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන අරූපාවචර ධ්‍යාන සතරත් යන අෂ්ටසමාපත්ති ලැබිය හැකි ය.

එසේ ම,

| | |
|---|---|
| **ඉද්ධිවිධ ඤාණය** | **(විවිධ වූ සෘද්ධි බල පෑ හැකි නුවණ)** |
| **දිබ්බසෝත ඤාණය** | **(පියවි කණින් ඇසිය නොහැකි ශබ්ද ඇසීමේ නුවණ)** |
| **පරචිත්තවිජානන ඤාණය** | **(පරසිත් දන්නා නුවණ)** |
| **පුබ්බේ නිවාසානුස්සති ඤාණය** | **(පෙර ආත්මභාව සිහිකිරීමේ නුවණ)** |
| **දිබ්බචක්ඛු ඤාණය** | **(පියවි ඇසින් දැකිය නොහැකි දේ දැකිය හැකි දේ දැකීමේ නුවණ)** |

යන පංච අභිඥා උපදවා ගැනීමට ද හැකි ය.

මේ අනුව සමථ භාවනාවේ ආනිසංස වශයෙන් මේ ආත්ම භාවයේ දී ම සැප විහරණ ලබයි. පෘථග්ජනයන්ට සමථ භාවනාව විදර්ශනා ඥානය උපදවා ගැනීමට උපකාරී වෙයි. අෂ්ට සමාපත්ති පංච අභිඤ්ඤා ලබාගත හැකි වෙයි. බ්‍රහ්ම ලෝකවල උත්පත්තිය ලැබීමට හැකිවෙයි. රහතන් වහන්සේලාට සහ අනාගාමී ආර්යයන්ට නිරෝධ සමාපත්තියට සම වැදීමට ද උපකාරී වෙයි.

බුදුදහම උගන්වන්නේ සමථයේ හෙවත් සමාධියේ රැඳී නොසිට එය පදනම් කරගෙන විදර්ශනාව වඩා නිවන් අවබෝධ කිරීම ය. ආලාරකාලාම, උද්දකරාමපුත්ත යන තවුසන් දෙදෙනා සමථ භාවනාවේ ඉහළ ම තලයට ගිය ඇත්තෝ වූහ. බෝසතාණන් වහන්සේ ඔවුන් අතහැර යන්නේ සමථ භාවනාවෙන් පමණක් නිවන් ලැබිය නොහැකි නිසා ය. මේ අනුව සමථ භාවනා විධි බුද්ධ කාලයට පෙර සිට ම භාරතයේ යෝගීන් විසින් භාවිතකර තිබේ. එම භාවනා ක්‍රම මගින් දඹදිව තවුසන් අභිඥා, සමාපත්ති ලාභීව සිට ඇත. බුදුදහමෙහි දැක්වෙන සමථ භාවනාව අභිඥා, සමාපත්ති ලැබීමට පමණක් සීමා නොවීම විශේෂයකි. එය විපස්සනා ඤාණය උපදවා ගැනීමට ඉවහල් කරගනු ලැබේ.

භාවනා කිරීමට යොමුවීමේ දී ඒ ඒ පුද්ගලයාට සුදුසු කමටහන හඳුනාගැනීම ද වැදගත් ය. භාවනාවට සිත පුරුදු කිරීම සඳහා අපි පොදුවේ බොහෝ කමටහන් භාවිත කිරීමට පෙළඹෙමු. එසේ වුවත් අපගේ චරිත ස්වභාවයට අනුකූල කමටහන හඳුනාගනු ලබන්නේ කම්මට්ඨානාචාර්යවරයා විසිනි. භාවනාවේ දී ගුරුවරයෙකුගේ ඇසුර සහ මග පෙන්වීම අනිවාර්යයෙන් ම අවශ්‍ය වේ. උන්වහන්සේ මෙබඳු ගුණයෙන් පිරිපුන් අයෙකු විය යුතු ය.

කම්මට්ඨානාචාර්යවරයාණන් වහන්සේ,

**පියො ච ගරු භාවනීයො - වත්තා ච වචනක්ඛමො**
**ගම්භීරං ච කථං කත්තා - නොචට්ඨානෙ නියොජයෙ**

එනම්, උන්වහන්සේ සීල සම්පත්තියෙන් යුක්ත, සැමට ප්‍රිය වූ, ගල් පියස්සක් සේ බරසාර වූත්, වරදට අවවාද කරනසුලු වූත්, ප්‍රශ්න හා චෝදනා ඉවසනා සුලු වූත්, ගැඹුරු ධර්ම කථා කරන්නා වූත්, ඇසුරු කරන්නන් නොමග නොයවන සුලු වූත් කෙනෙකු විය යුතු ය.

උන්වහන්සේ මගපල ලැබූවෙකු හෝ ධ්‍යාන ලැබූවෙකු නොවේ නම් පෘථග්ජනයෙකු වුවත්, ත්‍රිපිටකධාරී හෝ ඒක පිටකධාරී හෝ අටුවා සහිතව එක් නිකායක් වත් දරන ශික්ෂාපද ගරු කරන කෙනෙකු විය යුතු අතර පෙළ, අටුවා, ආචාරය මත ගරු කරන කෙනෙකු විය යුතු ය. අත්තනෝමතික නොවිය යුතු යයි විශුද්ධි මාර්ගයේ දී අවධාරණය කර ඇත.

## චරිත වර්ග සය

අපට මුණගැසෙන පුද්ගලයන් විවිධාකාර ය. එසේ වන්නේ ඔවුන්ගේ චරිත ලක්ෂණ, ඇවතුම් පැවැතුම්, සිතුම් පැතුම් ආදී කරුණු අනුව ය. මෙලොව දී මෙන් ම පූර්ව ජාතීන්හි දී ඇතිකර ගත් පුරුදු ආදිය හේතුවෙන් මෙසේ විවිධ චරිත ගොඩ නැගෙනු ඇත. භාවනාවට උපදෙස් දෙන ගුරුවරයා, කම්මට්ඨානාචාර්යවරයා දිගු කාලයක් තුළ ලබන අත්දැකීම් අනුව මෙම පුද්ගලයන්ගේ ස්වරූප වෙන වෙන ම හඳුනාගැනීමට සමත් විය යුතු ය. ඒ අනුව ඒ ඒ පුද්ගලයාට ගැලපෙන සේ කමටහන් දෙනු ලැබේ.

මෙලොව අසහාය කම්මට්ඨානාචාර්යයන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේ මුළු ලෝකයේ ම පුද්ගල චරිත බුදු නුවණින් හඳුනාගෙන චරිත හයකට බෙදා දක්වා වදාළහ.

| | |
|---|---|
| **රාග චරිතය** | **සද්ධා චරිතය** |
| **ද්වේෂ චරිතය** | **බුද්ධි චරිතය** |
| **මෝහ චරිතය** | **විතර්ක චරිතය** |

යනුවෙනි.

## චරිත ලක්ෂණ

රාග චරිතයා ලස්සන දෙයට ප්‍රියකරයි, ඇලුම් කරයි. ඔහු පුද්ගලයන්ට හා වස්තූන්ට තදින් ඇලෙයි. ඔහුගේ ඉරියව් ප්‍රසන්න ය. ඔහු කරන කියන කටයුතු ද ඉතා පිරිසිදු ය, ක්‍රමානුකූල ය. රාග චරිතයා ගමන් කරන විට සෙමෙන් පා තබමින් අන්‍යයන්ට ප්‍රිය උපදවන අයුරින් ගමන් කරයි. සිටීම සහ හිඳීමේ දී ද ප්‍රසන්න ය. නිදන විට ද පිළිවෙළට නිදා ගනියි. පිබිදෙන විට සතුටින් පිබිදෙයි. ඇමදීම ආදී කටයුතු සිත්ගන්නා සුලු පරිදි සිදු කරයි. ආහාර ගැනීමේ දී රස විඳිමින් අහර ගනියි. මිහිරි ආහාරයට ප්‍රිය කරයි. ප්‍රිය මනාප රූපයක් දුටුවිට එහි තදින් ඇලෙයි.

ද්වේෂ චරිතයා නිතර කිපෙන සුලු තැනැත්තෙක් වෙයි. ද්වේෂ චරිතයාගේ ගමන බිමන නොසන්සුන් ය. පා තදින් පොළවේ ගටා ගමන් කරයි. සිටීම් හිඳීම් ඉරියව් අන්‍යයන්ට ප්‍රිය නොවේ. නිදාගැනීමේ දී අපිළිවෙළින් යුතු වේ. අවදිවෙන විට තරහයෙන් යුක්ත වේ. ඇමදීම් ආදිය කරනවිට පිළිවෙලක් නැත. දූවිලි විසුරුවමින්, හඬ නැගෙන සේ අමදියි. ආහාර ගැනීම අසෝභන ය. කටුක ආහාරවලට කැමැති ය. යමක් පිළිබඳ අවධානය යොමුකළ හැක්කේ කෙටි වේලාවක් පමණි. සුළු වරදක් දුටුවිට ද ඒ හා ගැටෙයි.

මෝහ චරිතයාට කරුණු වටහා ගැනීමට අපහසු ය. රැවටෙනසුලු ය. මෝහ චරිතයා තැතිගත්තෙකු මෙන් ගමන් කරයි. ඇවැතුම් පැවැතුම් අවුල් සහගත ය. ඇතැම්විට හාස්‍යයට ලක්වේ. ඔහු නිදන විට මුණින් වැටී නිදයි. අවදිවන විට ඒ මේ අත පෙරළෙමින් මැලිකමක් දක්වයි. ඇමදීම් ආදිය කරන විට පිළිවෙළක් නැත. වැලි විසුරුවමින් අමදියි. ආහාර අනුභවයේ දී පිළිවෙළකින් තොරව බත්හුළු විසුරුවමින් අනුභව කරයි. මෝහ චරිතයාට කිසිවක් පිළිබඳ ස්වාධීන අදහසක් නැත. අනුන්ගේ අදහස් අනුව කටයුතු කරයි.

සද්ධා චරිතයාගේ ඉරියව් බොහෝවිට රාග චරිතයාට සමාන යි. ඔහු තෙරුවන් කෙරෙහි ඇලුම් කරයි. දහම් ඇසීමට කැමති වෙයි. ගුණවතුන් දැකීමට කැමති වෙයි. පරිත්‍යාගශීලී වෙයි. වහා පැහැදෙයි.

බුද්ධි චරිතයා ගැඹුරු දේ තේරුම් ගැනීමේ නුවණ ඇත්තෙකි. බාහිර ඉරියව්වලින් ද්වේෂ චරිතයාට සමාන යි. සිහිනුවණින් වෙසෙයි. වීර්ය සම්පන්න යි. විමසා කටයුතු කරයි.

විතර්ක චරිතයා නොයෙක් දේ නිතර කල්පනා කරයි. දොඩමළු ස්වභාවයෙන් යුක්ත වෙයි. කණ්ඩායම් වශයෙන් සිටීමට කැමැති වෙයි. ඉක්මනින් අදහස් වෙනස් කරයි. එක දිගට යමක් කිරීමට ශක්තියක් නැත. ඉරියව්වලින් මෝහ චරිතයාට සමාන වෙයි.

භාවනා කම්මට්ඨානාචාර්ය වරයාණන් වහන්සේ මෙසේ විවිධ ගති ලක්ෂණවලින් යුත් චරිත ස්වභාවයන් ඇති යෝගාවචරයාට, වඩාත් ගැලපෙන කමටහන් හඳුනාගත යුතු ය.

ඒ ඒ චරිතයට ගැලපෙන කමටහන මෙම වගුවෙහි දැක්වේ.

| චරිතය | ගැලපෙන කමටහන |
|---|---|
| රාග චරිතය | දස අසුභය, කායගතාසතිය |
| ද්වේෂ චරිතය | බ්‍රහ්මවිහාර සතර, වර්ණ කසිණ සතර, |
| මෝහ චරිතය, විතර්ක චරිතය | ආනාපාන සතිය |
| සද්ධා චරිතය, | බුද්ධ, ධම්ම, සංඝ, සීල, චාග, දේවතානුස්සති |
| බුද්ධි චරිතය, | මරණානුස්සති, උපසමානුස්සති, ආහාරෙ පටික්කූල සඤ්ඤා, ධාතු මනසිකාර |

දස කසිණ අතරින් වර්ණ කසිණ සතර හැර ඉතිරි කසිණ හයත්, ආකාසානඤ්චායතන ආදී සතර ආරුප්පත් සෑම චරිතයකට ම අනුකූල වේ.

භාවනා කිරීමට සුදුසු ස්ථානයක් තෝරාගැනීම ද වැදගත් කරුණකි. ඒ සඳහා සලකා බැලිය යුතු කරුණු පහකි. ප්‍රත්‍ය පහසුව සපයා ගැනීමට පහසුවන සේ ගොදුරු ගම ආසන්න දුරකින් පිහිටා තිබීම. දහවල් කාලයෙහි මහජනයා භාවනා කරන ස්ථානයට නොපැමිණීමත්, රාත්‍රී කාලයෙහි මහජනයාගේ ශබ්ද නැති තැනක් වීම. අවු වැසි සුළඟින්, මැසි මදුරුවන්ගෙන් හා සර්පයන්ගෙන් කරදර නොවීම. සිව්පසය ලැබීම. ධර්මධර, විනයධර තෙරුන් වහන්සේලා වැඩසිටීම යන මෙම අංග පසෙන් යුක්ත ස්ථානය භාවනා වැඩීමට සුදුසු ය.

සමාධි භාවනාවට යොමුවන යෝගාවචරයාට අහිතකර වන, බාධා ඇතිකරවන පළිබෝධ දහය ද හඳුනා ගත යුතු ය. පළිබෝධවලින් හැකිතාක් දුරුවීම භාවනාව දියුණු කරගැනීමට උපකාරී වේ. ඒ දස විධ පළිබෝධ මෙසේය.

1. **ආවාස** - ආවාසය පිළිබඳ වගකීම හෝ අපේක්ෂා තිබීම.
2. **කුල** - ඥාති කුල, දායක කුල ආදීන් සමීපව ඇසුරු කිරීම.
3. **ලාභ** - සිවුපස බහුලව ලැබෙන විට ආශාව ඇතිවීම. රැකබලා ගන්නට වීම. අනුමෝදනා කටයුතු අධිකවීම.
4. **ගණ** - තමා හමුවීමට පැමිණෙන පිරිස්, කණ්ඩායම් බහුල වීම.
5. **කර්ම** - නව ඉදිකිරීම් හා අලුත් වැඩියා කිරීම් ආදිය බහුල වීම.
6. **අද්ධාන** - නිතර නිතර ගමන් බිමන් යාමට පුරුදු වීම.
7. **ඥාති** - ගිහි ඥාතීන් හෝ එකට වසන භික්ෂූන් පිළිබඳ රෝග ආදී කාරණාවල නිරතවන්නට සිදුවීම.
8. **ආබාධ** - තමන් නිදන්ගත රෝගාබාධ බහුල කෙනෙකු වීම.
9. **ග්‍රන්ථ** - පොත පත, ලේඛන කටයුතුවල නිරත වීම.
10. **ඉද්ධි** - ලැබූ සෘද්ධි රැක ගැනීමට වෙහෙසීම.

සමථ භාවනාව වැඩීමට යොමුවී සිත දියුණු කරගැනීමට කැමති ඔබ ද සිල් පිරිසිදු කරගෙන, කල්‍යාණමිත්‍ර ගුරු ඇසුරකින්, චරිතයට ගැලපෙන කමටහන් ලබාගෙන, දස පළිබෝධයෙන් මිදී, සුදුසු සෙනසුනක් තෝරාගෙන, ඒ කර්මස්ථානයට අදාළ නිවැරදි පිළිවෙළට අනුව භාවනා කිරීමෙන් ලැබිය හැකි මානසික සුවය අත්විඳින්න.

**ක්‍රියාකාරකම**

01. සමථ භාවනාවෙන් සිදුවන ප්‍රධාන කාර්යය කුමක් ද?
02. සමථ භාවනාව සමාධි භාවනාව යනුවෙන් හඳුන්වන්නේ ඇයි?
03. සද්ධා චරිතයාගේ ස්වභාවය පැහැදිලි කරන්න.
04. භාවනා කිරීමට සුදුසු සෙනසුනක් තෝරාගැනීමට අදාළ කරුණු විස්තර කරන්න.
05. භාවනාව සඳහා ඇතිවන පළිබෝධ ගැන විස්තර කරන්න.
06. සමථ භාවනාවේ ආනිසංස මොනවා දැයි දක්වන්න.

22
පාඩම

# බුදුමග පහන් එළි

## 1. චතුරාර්ය සත්‍යය

අරියසච්ච යනු උතුම් සත්‍යය යන අර්ථය යි. පරමසච්ච යනුවෙන් ද මෙය අර්ථවත් කෙරේ. බුධ (බෝධනේ) ධාතුවෙන් නිපන් බුද්ධ ශබ්දයෙන් ද අර්ථවත් වන්නේ ආර්යසත්‍ය සතර අවබෝධ කරගත් බව යි. මෙය තවත් අයෙකුගේ ආධාර උපකාර නොමැතිව ගෞතම බුදුරදුන් විසින් ම දැන අවබෝධ කරගත් බැවින් මෙයට සාමුක්කංසික දේශනාව යයි ව්‍යවහාර කරනු ලැබේ. චතුරාර්ය සත්‍යය නම්,

1. **දුක්ඛ ආර්ය සත්‍යය**
2. **දුක්ඛසමුදය ආර්ය සත්‍යය**
3. **දුක්ඛනිරෝධ ආර්ය සත්‍යය**
4. **දුක්ඛ නිරෝධගාමිණී පටිපදාර්යසත්‍යය** යනුයි.

මෙය දුක, දුකට හේතුව (තෘෂ්ණාව) දුක නැති කිරීම (නිවන) දුක නැති කිරීමේ මාර්ගය (ආර්ය අෂ්ටාංගිකමාර්ගය) ලෙස ද කෙටියෙන් හැඳින්විය හැකි ය.

චතුරාර්ය සත්‍යය බුදුදහමේ හදවත බඳු ය. ලොව එදා අසත්‍යය මුසාව රජයන යුගයක බුදුරදුහු නිවැරදි පරම සත්‍යය යනු කුමක් දැයි ලොවට හෙළි කළහ. ඒ නිසා අසත්‍ය නම් මායා පටලයෙන් ලෝක සත්ත්වයාට නිවැරදි සත්‍යය පහදා දුන් නිසා මෙය අරියසච්ච නමින් හැඳින් වේ. සංයුත්තනිකායේ ධම්මචක්කප්පවත්තන සූත්‍රය මජ්ඣිම නිකායේ සච්ච විභංග සූත්‍රය, ඇතුළු දීඝනිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය යන ග්‍රන්ථාගත සූත්‍රවල චතුරාර්ය සත්‍යය නන් අයුරින් විස්තර කොට ඇත.

සංසාරගත දුකත් සමාජගත දුකත් එය හටගන්නා බලවේගත් ඉන් මිදෙන නිවන සහ මැදුම් පිළිවෙතත් ගැන කියවෙන සිද්ධාන්තයක් නිසා චතුරාර්ය සත්‍යය සමස්ත බුද්ධ ධර්මයේ අනන්‍යතාව ප්‍රකාශ වන දාර්ශනික සිද්ධාන්තයක් ලෙස දැක්විය හැකි ය.

චතුරාර්ය සත්‍යය දාර්ශනික මට්ටමෙන් සෙසු නිකාය ග්‍රන්ථවල විග්‍රහ කෙරෙන අතර සංයුත්තනිකායේ සච්චසංයුක්තයේ එන කුඩා අනුකුඩා සූත්‍ර ගණනාවක එහි අර්ථාන්විත වටිනාකම පැහැදිලි කර ඇත.

"සත්වයා දිගු කලක් සසර සැරිසරන්නේ චතුරාර්ය සත්‍යය අවබෝධ නොකිරීම නිසාවෙනි." (සංයුත්ත නිකායේ කෝටිගාම සූත්‍රය)

"චතුරාර්ය සත්‍යය දැකීම විජ්ජා නම් වේ. චතුරාර්ය සත්‍යය නොදැනීම අවිජ්ජා හෙවත් අවිද්‍යා නම් වේ." (සංයුත්ත නිකායේ අවිජ්ජා සූත්‍රය)

අවිජ්ජා පච්චයා සංඛාරා යන්නෙන් ද එය පැහැදිලි වේ.

"බුදුරදුන් වදාළ මෙම ආර්යසත්‍ය හතර කිසිදා කිසි ම අයුරකින් වෙනස් නොවේ. හිස් නොවේ. විපර්යාසයකට භාජනය නොවේ." (සංයුත්ත නිකායේ තථ සූත්‍රය)

දුක්ඛ ආර්ය සත්‍යය පිරිසිඳ දැනගත යුතු ය. (පරිඤ්ඤෙය්‍ය)

දුක්ඛ සමුදය ආර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතු ය. (පහාතබ්බං)

දුක්ඛ නිරෝධය සාක්ෂාත් කළ යුතු ය. (සච්ඡිකාතබ්බං)

දුක්ඛ නිරෝධගාමිණී පටිපදාව වැඩිය යුතු ය. (භාවේතබ්බං) (සංයුත්ත නිකායේ පරිඤ්ඤෙය්‍ය සූත්‍රය)

දිනක් බුදුරදුහු භික්ෂු පිරිස සමග කොසඹෑනුවර ආසන්නයේ සිංසපා (ඇට්ටේරියා) වනයට වැඩම කළ සේක. ඇට්ටේරියා කොළ මිටක් අතට ගත් බුදුරදුහු බිම විසිරී තිබෙන ඇට්ටේරියා පත්‍ර ප්‍රමාණය වැඩි බවත්, අතට අහුලා ගත්තේ ස්වල්පයක් බවත් පෙන්වා එසේ ම, තමන් ලෝක සත්ත්වයාට චතුරාර්ය සත්‍යය දේශනා කළ බවත් දේශනා නොකළ තවත් බොහෝ දේ තිබෙන බවත් වදාළ සේක. **(සංයුත්ත නිකායේ සිංසපා සූත්‍රය)**

## දුක්ඛ ආර්ය සත්‍යය

චතුරාර්ය සත්‍යයෙහි ඉගැන්වෙන පළමු ආර්ය සත්‍යය නම් දුක්ඛ ආර්ය සත්‍යය යි. මෙය පිරිසිඳ දතයුතු බව (පරිඤ්ඤෙය්‍ය) සඳහන් විය. ලොව රඳා පවතින්නේ දුක මත ය යන සංකල්පය සමාජය අතර ආගමික වශයෙන් මුල් බැසගෙන ඇත. මේ නිසා දුක යනු කුමක් දැයි විමසා බැලිය යුතු ය. "ඉපදීම දුකකි. ජරාවට (මහලු බව) පත්වීම දුකකි. ලෙඩරෝග වැළඳීම දුකකි. මරණය දුකකි. ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකකි. අප්‍රියයන් සමග එකතුවීම ද දුකකි. කෙටියෙන් ම පංච උපාදානස්කන්ධය ම දුකකි."

**ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.**

**(සංයුත්ත නිකායේ ධම්මචක්කප්පවත්තන සූත්‍රය)**

දුක්ඛ යන්නෙහි අර්ථය දාර්ශනික වශයෙන් ගෙන බලනවිට පාලනය කරගත නොහැකි බව, හිස් බව, අසාරකම යන අරුත් එහි ගැබ් වී පවතී. චතුරාර්ය සත්‍යයේ පදනම දුක්ඛ සංකල්පය යි. සමස්ත චතුරාර්ය සත්‍යය තිපරිවට්ට හෙවත් වෘත්ත තුනකින් සමන්විත වූ දොළොස් ආකාරයකට විග්‍රහ කොට ඇත. එනම්,

- සත්‍යඥාන
- කෘත්‍යඥාන
- කෘතඥාන

යනුවෙනි.

මෙය සමුදය, නිරෝධ, මග්ග සත්‍යවලට ද එක සේ අදාළ වේ. ලොව සියලු දෙනා සැප විඳීමට කැමති ය. සැප විඳීම යනුවෙන් ලෞකික සමාජය අපේක්ෂා කරන්නේ චක්ඛු (ඇස) - රූප, සෝත (කණ) - ශබ්ද, ඝාණ (නාසය) - ගන්ධ, ජිව්හා (දිව) - රසය, කාය (ශරීරය) - ස්පර්ශය යනු පංච ඉන්ද්‍රියයන් මගින් ඒවාට විෂය වන අරමුණු වින්දනය කිරීම වේ. දුක්ඛ සංකල්පනාව ලොවට විෂය වන ආකාර තුනක් පිළිබඳ ව මූලික අධ්‍යයනයේ දී හෙළි වේ.

- දුක්ඛ දුක්ඛතා
- විපරිණාම දුක්ඛතා
- සංඛාර දුක්ඛතා

යනුවෙනි.

ජාති, ජරා, ව්‍යාධි, මරණවලට ගොදුරු වෙමින් සත්ත්වය එදිනෙදා විඳින දුක දුක්ඛදුක්ඛතා නම් වේ. විපරිණාම දුක්ඛ යනු වෙනස්වීම නිසා ඇතිවන දුක වේ. නිරෝගී අයකු රෝගියෙකු වීම තරුණ අයකු මහලු වීම ආදී විපර්යාස පදනම් කරගත් දුක මෙයට අයත් වේ. සංඛාර දුක්ඛතා යනු දාර්ශනික විවරණයකි. මම යන සම්මුතිය පඤ්ච උපාදානක්ඛන්ධ ලෙස විග්‍රහ කිරීමෙන් හෙළිවන්නේ සංඛාර දුක්ඛය යි. **(සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා)** යනුවෙනි. දම්සක්පැවතුම් සූත්‍රයේ අංග අටකින් විග්‍රහ කෙරෙන දුක මජ්ඣිම නිකායේ සච්ච විභංග සූත්‍රයේ ද දුක අංග දහයකින් විග්‍රහ වේ.

### දුක්ඛසමුදය ආර්ය සත්‍යය

දුකට බලපාන හේතුව දුක්ඛසමුදය නම් වේ. මෙයින් ප්‍රකට වන්නේ ද හේතු-ඵල න්‍යායයි තෘෂ්ණාව නම් හේතුව නිසා දුක නමැති ඵලය උපදී. "මහණෙනි, මේ දුක්ඛ සමුදය ආර්ය සත්‍ය නම් තෘෂ්ණාව යි. තෘෂ්ණාව පුනර්භවය ඇති කරවයි. නන්දිරාගය සමග එක්වෙයි. ඒ ඒ භවයෙහි ඇලෙයි. ඒ නිසා දුකට හේතුවන තෘෂ්ණාව ප්‍රහාණය කළ යුතු යයි (පහාතබ්බං) බුදුදහම අවධාරණය කරයි. තෘෂ්ණාව තෙවැදෑරුම් වේ.

- කාමතණ්හා
- භවතණ්හා
- විභවතණ්හා

යනුවෙනි.

දුක හටගැනීම කෙසේ සිදුවේ ද? ඇසත් රූපයත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. මේ තුන ම එකතුවීම නිසා ස්පර්ශය ගැටීම ඇති වේ. ස්පර්ශය නිසා වේදනාව, වින්දනය ද වේදනාව නිසා තණ්හාව ද උපදී. මෙය දුක හට ගැනීම නම් වේ යැයි. සංයුත්ත නිකායේ දුක්ඛ සූත්‍රයේ සඳහන් වේ.

එහි කාම තණ්හා යනු ඇස, කන, නාසය, දිව, ශරීරය යන පංච ඉන්ද්‍රියයන්ට විෂය වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යනාදිය පිළිබඳ ඇල්ම, ආශා කිරීම, ඒවා පිනවීමේ කැමැත්තයි.

භවය සදාකාලික ලෙස සිතීම, භවයට ආශා කිරීම සදාකාලික ලෙස ජීවත්වීමට කල්පිත කිරීම භවතණ්හා නම් වේ. එය බුදුදහමේ ඉගැන්වෙන්නේ ශාස්වත දෘෂ්ටියට බැස ගැනීමක් ලෙස ය.

මරණින් මතු සත්වයාගේ ඉපදීමක් නැතැයි සිතා භවයෙන් නිදහස් යයි කල්පනා කිරීම විභවතණ්හා නම් වේ. එය උච්ඡේද දෘෂ්ටියට අනුගත වීමකි. තණ්හාව විවිධ අයුරින් මිනිසා මුළා කරන බව ත්‍රිපිටක සාහිත්‍යය තුළින් අනාවරණය වේ. රාගය, කාමය, ආශාව, ආලය, විෂමලෝභය (අභිජ්ඣා) බවට පරිවර්තනය වන්නේ ද මෙම තෘෂ්ණාව ම වේ.

**මේ ලෝවැසියා ඌන ය අතෘප්තිමත් ය. තණ්හාවට දාසයෙකි.**
**(ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො (මජ්ඣිම නිකායේ රට්ඨපාල සූත්‍රය)**
**ලොව තෘෂ්ණාවෙන් පමුණුවනු ලැබේ. තණ්හාවෙන් එහෙ මෙහෙ ඇදගෙන යනු ලැබේ.**
**(සංයුත්ත නිකායේ තණ්හා සූත්‍රය)**

## දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය

දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය යනු දුක නැතිකිරීම වේ. සමාජගත දුකින් මෙන් ම පඤ්චස්කන්ධ සංඛ්‍යාත සංසාර දුකින් ද නිදහස් වීම දුක්ඛ නිරෝධය යි. එය බුදුදහමේ ඉගැන්වෙන පරම නිෂ්ටාව වේ. මුලින් සඳහන් කළ තෘෂ්ණාව ඉතිරි නොකොට ඉවත් කිරීම, නැති කිරීම අත් හැරීම මුළුමනින් ම ඉවත දැමීම ඉන් මිදීම සහ නොඇලීම දුක්ඛ නිරෝධ සත්‍යය නම් වේ.

ඒ අනුව දුක්ඛ නිරෝධය පිණිස තණ්හාව දුරුකළ යුතු වේ. රාගය, ද්වේෂය, මෝහය දුරු කිරීම ද නිවන නම් වේ (රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො නිබ්බානං) යයි සං.නි. සමථ විපස්සනා සූත්‍රයේ සඳහන් වේ.

පංච උපාදානස්ඛන්ධය පිළිබඳ ඡන්ද රාගය දුරු කිරීම, නැති කිරීම නිර්වාණය වන බව ද ඉගැන්වේ. නිවන ප්‍රඥාවෙන් අවබෝධ කළයුතු ධර්මයකි. එය වින්දනය නොකළ හැකි ය. හේතු-ඵල දහමට අයත් නොවේ. ඒ නිසා නිවන අසංඛත දහමකි. හේතු-ප්‍රත්‍යයන්ගෙන් උපදින දේවල් සංඛත නම් වේ.

ප්‍රත්‍යයන්ගෙන් සකස් නොවූ, (අසංඛත) කෙළවර, රතියේ අභාවය, (අරති) ආශ්‍රව රහිත, (අනාසව) පරම සත්‍යය, (පරමසච්චං) භව චක්‍රයෙන් එතෙරවීම, (පාරං) සියුම් ධර්මය, (නිපුණං) දැකීමට අපහසු, (සුදුද්දසං) ජරාවෙන් තොර, (අජරං) මරණ රහිත (අමතං) ආදී වශයෙන් විවිධ දාර්ශනික වචන තෙතිසකින් නිවන හඳුන්වා ඇති ආකාරය සං.නි. අසංඛත සංයුත්තයෙන් හෙළි වේ.

1. සෝපාදිශේෂ පරිනිර්වාණ ධාතුව (පංචස්කන්ධය සහිතව කෙලෙසුන්ගේ පිරිනිවීම)
2. අනුපදිශේෂ පරිනිර්වාණ ධාතුව (බිඳීයාම හෙවත් මරණය)

යනුවෙන් පඤ්චස්කන්ධය දුක්ඛනිරොධය හෙවත් පිරිනිවීම දෙයාකාර ය.

## දුක්ඛ නිරෝධගාමිණී පටිපදාර්යසත්‍යය

නිර්වාණය අවබෝධ කිරීමෙන් සංසාර දුක අවසන් වේ. ඒ සඳහා දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාවට අදාළ මාර්ගය වැඩිය යුතු ය. (භාවෙතබ්බං) ඒ අනුව චතුරාර්ය සත්‍යයේ අවසාන සත්‍යයෙන් නිවන් මග ප්‍රකාශ වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ මධ්‍යම ප්‍රතිපදාව (මජ්ඣිමා පටිපදා) මේ සඳහා අනුගත ඒකායන මාර්ගය වේ. ග්‍රාම්‍ය වූ පෘථග්ජනයාට අයත් අනාර්ය වූ අනර්ථකර වූ ශරීරයට අධික සැපදීම නම් වූ කාමසුඛල්ලිකානුයෝගය ද, ශරීරයට අධික දුක් දීම නම් වූ අත්තකිලමථානුයෝගය ද යන අන්ත දෙකින් මිදුණු ප්‍රතිපදාව මධ්‍යම ප්‍රතිපදාව හෙවත් මැදුම් පිළිවෙත බව ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සඳහන් වේ. මෙම ප්‍රතිපදාව නෙත් පාදන (චක්ඛුකරණී) ඥානය වඩන (ඤාණකරණී) සංසිඳීමට (උපසමාය) විශේෂ ඥානය පිණිස (අභිඤ්ඤාය) මනා අවබෝධය පිණිස (සම්බොධාය) කෙලෙස් නිවීම පිණිස (නිබ්බාණාය) හේතු වන බව ද එහි වැඩි දුරටත් සඳහන් වේ. ඒ අනුව මෙය දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාර්ය සත්‍යය නම් වේ. එනම්, ආර්ය අෂ්ටාංගික මාර්ගය යි.

| | | |
|---|---|---|
| සම්මා දිට්ඨි - නිවැරදි දැකීම | | ප්‍රඥා |
| සම්මා සංකප්ප - නිවැරදි සංකල්පනා | | |
| සම්මා වාචා - නිවැරදි වචන | | සීල |
| සම්මා කම්මන්ත - නිවැරදි කර්මාන්ත | | |
| සම්මා ආජීව - නිවැරදි දිවිපැවැත්ම | | |
| සම්මා වායාම - නිවැරදි උත්සාහය | | සමාධි |
| සම්මා සති - නිවැරදි සිහිය | | |
| සම්මා සමාධි - නිවැරදි සමාධිය | | |

යම් ශාසනයක ආර්ය අෂ්ටාංගික මාර්ගය පවතී නම් එම ශාසනයේ සෝවාන් සකදාගාමී, අනාගාමී, අරහත් යන පුද්ගලයන් සිවුදෙනා ම සිටින බව සුභද්ද භික්ෂුව අමතා බුදුරදුහු වදාළ සේක. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි පිළිවෙත් පිරීම නිසා පිරිසිදු කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම සිදු වේ. ආර්ය මාර්ගයේ යහපත් වූ අංග අට සම්පූර්ණ කිරීමෙන් සියලු දේ පිළිබඳ සත්‍යතාව වැටහීමෙන් සම්මාඤාණය පහළ වේ. ඒ සමග සංසාරය හා බැඳුණු සියල්ලෙන් මිදී සම්මා විමුක්තිය උදාවීමෙන් මෙම ආර්ය මාවතේ ඵල සිද්ධිය ද උදාවේ. සම්මා දිට්ඨි ආදී මෙම විමුක්ති මාර්ගයේ ගමන් කරන පුද්ගලයාට සතර සතිපට්ඨාන සතර සම්‍යක්ප්‍රධාන සතර ඍද්ධිපාද පංචඉන්ද්‍රිය පංචබල සප්තබොජ්ඣංග ද සඵල වන බව මජ්ඣිමනිකායේ මහා සළායතනික සූත්‍රයේ සඳහන් වේ.

## 2. පටිච්චසමුප්පාදය

පටිච්චසමුප්පාදය යනු හේතු-ඵල දහම යි. ගෞතම බුදුරදුන් සම්බෝධි ඥානය ලබා අනතුරුව සත්සතිය ගත කරද්දී පළමුවන සතියේ අවසාන දින රාත්‍රියෙහි පටිච්චසමුප්පාද ධර්මය අනුලෝම - පටිලෝම වශයෙන් මෙනෙහි කළ බව බුද්දකනිකායේ උදාන පාළි, පඨමබෝධි හා දුතියබෝධි සූත්‍රවල සඳහන් වේ.

බුදුරදුන් දේශනා කළ මෙම හේතු-ඵල දහම දීඝනිකායේ මහානිදාන සූත්‍රයේ ද, මහාවග්ග පාළියේ ද මජ්ඣිමනිකායේ චූලසකුළුදායී සූත්‍රයේ ද මැනවින් විවරණය වේ.

''අවිජ්ජා පච්චයා සංඛාරා'' යනුවෙන් මෙනෙහි කිරීම අනුලෝම න්‍යාය ලෙස ද, ''අවිජ්ජා නිරෝධා සංඛාර නිරෝධො'' යනුවෙන් මෙනෙහි කිරීම පටිලෝම න්‍යාය ලෙස ද හැඳින් වේ.

එහි අදහස අවිජ්ජා ආදි ධර්ම එකින් එක අනෙක් ධර්ම පහළවීමට හේතු වෙයි. එසේ හටගැනීමෙන් මේ මහා දුක් කඳ පහළවෙයි.

අවිජ්ජාවේ පටන් එක් එක් ධර්මය නැසීමෙන් සෙසු ධර්ම නැසී යයි. එයින් මේ මහා දුක්කඳ කෙළවර වෙයි යනු ය.

ප්‍රාග් බෞද්ධ ජන සමාජයේ තිබූ ලෝකය දෙවියන්, බ්‍රහ්මුන් විසින් මවන ලදැයි කියන ඊශ්වර නිර්මාණවාදය, සියල්ල කර්මයෙන් ම සිදුවේ යැයි කියන පුබ්බේකතහේතුවාදය සියල්ල ඉබේ පහළ වේ යැයි කියන අධිච්ච සමුප්පන්නවාදය ආදී වාද සියල්ල මේ නිසා ප්‍රතික්ෂේප වූ බව පැහැදිලි ය. පටිච්චසමුප්පාදය අංග දොළොහකින් සමන්විත වේ.

අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා මරණ වශයෙනි. යමෙක් පටිච්චසමුප්පාදය දකියි ද හෙතෙම ධර්මය දකියි. (යො පටිච්චසමුප්පාදං පස්සති - සො ධම්මං පස්සති) යනුවෙන් මජ්ඣිම නිකායේ මහාහත්ථිපදෝපම සූත්‍රයේ සඳහන් වේ. එයින් අදහස් වන්නේ බුදුදහම යනු හේතුඵල න්‍යාය පදනම් කරගත් ඉගැන්වීමක් බවයි.

අස්සජි තෙරුන් හමුවූ උපතිස්ස පරිබ්‍රාජකයා බුදුරදුන්ගේ නව දහමේ ස්වභාවය කවරේ දැයි විමසූ කල්හි උන්වහන්සේ මෙසේ වදාළ සේක.

**"යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතුං තථාගතො ආහ.**
**තෙසං ච යො නිරොධො - එවං වාදි මහා සමණො."**

යමක් හේතුන්ගෙන් හටගනී ද ඒවායේ හේතුව තථාගතයන් වහන්සේ වදාළහ. ඒ හේතු නැසීමෙන් එහි ඵලය ද නැසෙන බවත් මහා ශ්‍රමණයන් වහන්සේ වදාරති.

යනුවෙනි.

පටිච්චසමුප්පාදයට අදාළ මූලික සූත්‍රය ලෙස සලකන්නේ මෙම දාර්ශනික සංකල්පනාව යි.

1. අස්මිං සති ඉදං හොති — (මෙය ඇති කල්හි මෙය පවතී)
2. ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති — (මෙය ඉපදීමෙන් මෙය උපදී)
3. ඉමස්මිං අසති ඉදං න හොති — (මෙය නැති කල්හි මෙය නොවේ)
4. ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති — (මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ)

**(මජ්ඣිම නිකාය, චූලසකුළුදායි සූත්‍රය)**

**දිනක් ආනන්ද තෙරණුවෝ බුදුරදුන් හමු වී පටිච්චසමුප්පාද ධර්මයේ ගම්භීරතාව ගැන සාකච්ඡා කළහ. මෙම හේතු-ඵල සිද්ධාන්තය කොතරම් ගැඹුරු පෙනුමක් තිබුණත් තමන්ට එය සරලව වැටහෙන බව එහිදී ආනන්ද තෙරුන් වහන්සේ වදාළ සේක. එවිට ආනන්දය, එසේ නොපවසන්න. පටිච්චසමුප්පාදය ඉතා ගැඹුරු ය. ගැඹුරු සේ පෙනේ. මේ ධර්මය අවබෝධ නොකිරීමෙන් මේ සත්ත්වයා තවදුරටත් සසර සැරිසරයි. නූල් පන්දුවක් මෙන් අවුලක පැටලී සිටී යයි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.**

**(දීඝ නිකාය මහානිදාන සූත්‍රය)**

එහි අදහස නම් මෙලොව කොතරම් ආගම් ධර්ම තිබුණත් ඒ කිසි දහමක් මේ දුකට නියම හේතුව නොකියන බැවින් මෙලොව සැබෑ තත්ත්වය වටහා ගත නොහැකි ව සත්ත්වයා අතරමං වී සිටින බව ය.

## කර්මය

කර්ම සංකල්පයට ප්‍රාග් බෞද්ධ ජන සමාජයේ ද ඉඩක් තිබුණි. ක්‍රි.පූ. 7 සියවසේ පමණ පහළ වූ උපනිෂද් චින්තන ධාරාවේ හොඳ-නරක ක්‍රියා හා මරණින් මතු සත්ත්වයාගේ ස්වභාවය පිළිබඳ සාකච්ඡා කර තිබූ බව උපනිෂද් සාහිත්‍ය ග්‍රන්ථවලින් හෙළි වේ.

කර්මය පිළිබඳ බෞද්ධ නිර්ණායකය වන්නේ චේතනාව කර්මය බවත් සිතින් සිතා කයෙන් වචනයෙන් සහ මනසින් ක්‍රියාකරන බවත් ය. (චේතනාහං භික්ඛවේ කම්මං වදාමි චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා - අංගුත්තර නිකාය, නිබ්බේධික සූත්‍රය)

ඒ අනුව චේතනාව කර්මය බවත් සිත, කය, වචනය යන තිදොර ඔස්සේ එය ක්‍රියාකාරී වන බවත් පැහැදිලි කර ඇත. තෝදෙය්‍යපුත්‍ර සුභ මාණවකයා දිනක් බුදුරදුන් හමු වී විමසන්නේ සමාජය තුළ පවතින විෂමතාව, දුප්පත් පොහොසත්, රූප, වර්ණ, දුර්වර්ණ, අංග විකල ආදිය පිළිබඳ ගැටලුව කුමක් ද යනුවෙනි.'' එහිදී සත්වයා කර්මය ස්වකීයකොට, කර්මය දායාද කොට, කර්මය උත්පත්ති ස්ථාන කොට, කර්මය ඤාති කොට කර්මය පිළිසරණ කොට පවතින බවත් සත්ත්වයා හීනප්‍රණීත වශයෙන් බෙදීමේ දී කර්ම විෂය බලපාන බවත් බුදුරදහු වදාළ සේක. (කම්මස්සකා මානව සත්තා කම්මදායාදා කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණා, කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය - මජ්ඣිම නිකාය චූල්ලකම්ම විභංග සූත්‍රය)

**සියල්ල කර්මයෙන් සිදු නොවේ.**

කර්මය පුද්ගල ජීවිතයට බලපාන ප්‍රත්‍ය විසි හතරෙන් එකකි. (කම්ම පච්චය) ජීව-අජීව සියල්ලට බලපාන නියාම ධර්ම පහක් ද වේ. එනම්,

1. **උතු නියාම**
2. **බීජ නියාම**
3. **චිත්ත නියාම**
4. **ධම්ම නියාම**
5. **කම්ම නියාම** යනු යි.

මේ අනුව ලොව බොහෝ දේ සිදුවන්නේ විවිධ නියමයන්ට අනුවය. කර්මය නිසා ම නොවේ. කර්මය යනු එම නියම පහෙන් එකක් පමණි.

අඹ බීජයකින් අඹ පැළයක් හට ගනී. ස්ත්‍රී බීජයකින් ස්ත්‍රියක් ද, පුරුෂ බීජයකින් පුරුෂයෙක් ද හටගනී. එය බීජ නියාමයයි.

ඒ හටගත් ගහවැල හෝ සත්ත්වයා, ආහාර, අව්ව වැස්ස ආදී පාරිසරික ප්‍රත්‍ය නිසා වැඩේ. ඒ උතු නියාමයයි.

හොඳ කෙනෙක් හිත නරක් වීමෙන් නරක වැඩක් කරයි. නරක කෙනෙක් හිත වෙනස් වී හොඳ වැඩ කරයි. ඒ චිත්ත නියාමයයි.

ලොව අප කිසිවෙකුට වෙනස් කළ නොහැකි ඉර පෑයීම, සඳ පෑයීම, රෑ දවල් ආදී ධර්මතා තිබේ. ඒ ධම්ම නියාමයයි. සියලු දේට පොදු අනිත්‍යතාව දුක්ඛතාව ආදිය ධම්ම නියාමය ම යි.

මේ සියල්ල අතර අප පෙර කළ කර්ම හෝ දැන් කරන කර්මවල විපාක ද විඳීමට සිදුවේ. එය කම්ම නියාම ය යි.

බෞද්ධ කර්ම සංකල්පය ගැන සාකච්ඡා කරන විට එහි ප්‍රධාන කොටස් දෙකක් තිබෙන බව මජ්ඣිම නිකායේ මහා කම්මවිභංග සූත්‍රයෙන් හෙළි වේ.

1. **දස කුසලකර්ම**
2. **දස අකුසලකර්ම**

මේවා තිදොර හා සම්බන්ධ වේ.

| | | |
|---|---|---|
| ප්‍රාණඝාත<br>අදත්තාදාන<br>කාමමිථ්‍යාචාර | } | කය - අකුසල |
| මුසාවාද<br>පිසුණාවාචා<br>ඵරුසාවාචා<br>සම්ඵප්පලාප | } | වචන - අකුසල |
| අභිධ්‍යා (විෂම ලෝභය)<br>ව්‍යාපාද<br>මිථ්‍යා දෘෂ්ටි | } | සිත - අකුසල |

මේ අනුව කුසල, අකුසල කර්ම සිදු කිරීම පුද්ගලයා සසර කරන ක්‍රියාදාමයකි. යම් බීජයක් රෝපණය කළේ නම් එබඳු ආකාර ප්‍රතිඵල ලැබේ. යහපත කරන්නා යහපත් ප්‍රතිඵලත් අයහපත කරන්නා අයහපත් ප්‍රතිඵලත් වින්ද යුතු ය.

යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං
කල්‍යාණකාරී කල්‍යාණං - පාපකාරී ච පාපකං

## පුනර්භවය

පුනර්භවය හා නිර්වාණය ගැන කරුණු අධ්‍යයනයේ දී කර්මවල බලපෑමත් සෘජුව ම එයට දායක වේ. සත්වයා සසර යළි උපදින්නේ (පුනරුත්පත්ති) හෝ නැවත නැවත භව චක්‍රයට එළඹෙන්නේ (පුනර්භව) හොඳ නරක කර්ම රැස්කිරීම නිසා ය. බුදු, පසේබුදු මහරහත් උතුමෝ කර්ම රැස් නොකරති. ඒ පිරිසට රාග, ද්වේෂ, මෝහ කෙලෙස් නොමැත. පුරාණ කෙලෙස් දුරුකළ ආර්ය උතුමෝ අළුත් කර්ම රැස් නොකරති. මතු භවය කෙරෙහි ඒ උතුමන්ගේ ඇල්මක් නොමැති බව සුත්ත නිපාතයේ රතන සූත්‍රයේ සඳහන් වේ.

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
(රතන සූත්‍රය)

අප සංසාරයේ යළි උපදින්නේ තෘෂ්ණාව නිසා ය. කිසියම් ගසක මුල උපද්‍රව රහිත ව තිබේ නම් ඒ ගස යළි යළිත් ලියලා දළු දමයි. එපරිදි මේ සත්ත්වයා ද තෘෂ්ණා මූලය උදුරා දමන තුරු යළි යළිත් සාංසාරික දුකට පත් වේ. තණ්හාවට දාසව තණ්හා දැලෙහි ඇලුණු බැඳුණු අඳුරෙහි අතරමං වූ සත්ත්වයා සංසාරය දීර්ඝ කරගෙන පුනර්භවය ද ඇතිකර ගනියි. අවිද්‍යාව දුරු නොකළ තෘෂ්ණා සංයෝජන ඇති පුද්ගලයා මතු පුනර්භවයක උපදින බව අංගුත්තර නිකායේ අඤ්ඤා සූත්‍රයේ සඳහන් වේ.

පටිච්චසමුප්පාද න්‍යාය තුළ නිරූපනය වන සංසාර චක්‍රය තුළින් සත්ත්වයා නිවන් දක්නා තුරු සංසාරයේ ඉපදෙමින් මියයමින් සැරිසරන ආකාරය පැහැදිලි ය. බෝසත් ජාතක කථා වස්තු තුළින් ද සංසාරයේ පුනර්භව සිද්ධාන්තය සිදුවන ආකාරය තහවුරු වේ.

සත්ත්වයා මිය යන අවස්ථාවේ පහළ වන්නේ චුති සිත යි. යළි සසර ඉපදීම ප්‍රතිසන්ධි සිතක් පහළ වීම යි. අපේ භෞතික ශරීරයෙන් අප මියයන විට පළමුව ඉවත් වන්නේ විඤ්ඤාණය යි. ශරීරයේ උණුසුම හා වාතය ස්වල්ප වේලාවක් භෞතික ශරීරය තුළ පවතී. යළි පිළිසිඳ ගන්නේ ද විඤ්ඤාණය යි. එම විඤ්ඤාණයේ පැවැත්ම සඳහා භෞතික රූපයක් අවශ්‍ය වේ. එසේ යළි උපදින්නේ මිය ගිය පුද්ගලයාත් නොවේ. වෙන අයෙකුත් නොවේ. **(න ච සො න ච අඤ්ඤො)** මෙය දාර්ශනික සිද්ධාන්තයකි. කුඩා දරුවා තරුණයකු මහල්ලකු ජරා ජීර්ණ අයකු බවට පත් වේ. මහලු වූ පුද්ගලයා අර පළමුව උපන් දරුවා ම නොවේ. වෙනකෙනෙකුත් නොවේ. එහෙත් හැඩරුව ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය වෙනස් වේ.

මේ බුදුදහමේ ඉගැන්වෙන අනිත්‍ය සංකල්පනාව විපරිණාමය ආදියට සාපේක්ෂ වේ. මූලික බුදුදහමට අනුව මියයන පුද්ගලයා කර්ම නොසිඳී පවතිනතුරු යළි සසර උපත ලබයි. මෙය සනාතනික ධර්මතාවකි. බුදුරදුන් සතු මහා ප්‍රඥාව මගින් අවබෝධ කරගත් සත්‍ය සිද්ධාන්තයකි. මෙය අපට නොවැටහෙන්නේ අවිද්‍යාව (අවිජ්ජා) නිසා ය. අපගේ භෞතික ශරීරය (රූප) විනාශ වේ. එය ප්‍රත්‍යක්ෂ දෙයකි. එහෙත් නාම හෙවත් සිත චිත්ත පරම්පරාවක් ලෙස සසර සැරිසරයි. සමුදුරු රැල්ලක් වෙනත් රැල්ලක් මතුකොට තමා බිඳී යන්නාක් සේ චුතිසිත ප්‍රතිසන්ධි සිතක් ඇති කොට නැසී යයි.

**අභ්‍යාස**

01. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රි ශික්ෂාවලට බෙදන්න
02. බෞද්ධ කර්ම සංකල්පය විග්‍රහ කොට ඇති ආකාරය පහදන්න.
03. පටිච්චසමුප්පාදයට අදාළ අංග දොළොස නම් කරන්න.

**පැවරුම**

01. බුදුදහමේ ඉගැන්වෙන මූලික දාර්ශනික සංකල්ප එකිනෙක කෙටියෙන් හඳුන්වා යහපත් ජීවිතයක් ගත කිරීමට ඒවා උපයෝගී වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

**භාවිතයට**

**වනං ඡින්දථ මා රුක්ඛං - වනතො ජායතී භයං**
**ඡෙත්වා වනං ච වනථං ච - නිබ්බනා හොථ භික්ඛවො**

මහණෙනි, ගස නොව කෙලෙස් වනය කපව්. කෙලෙස් වනයෙන් භය ඇති වේ. ලොකු කුඩා කෙලෙස් නමැති වනයත් වනථයත් (කෙලස් ගතිය) කපා දමා, කෙලෙස් නැත්තෝ වව්.

23
පාඩම

# ලෝකයේ ප්‍රධාන ලක්ෂණ තුන

මම ය මාගේ ය යන වචන දෙක අපට නිතර ම සිතෙන අප නිතර කියන වඩාත් ම හුරු පුරුදු වචන දෙක යි. මේ වචන දෙකෙන් කුමක් අදහස් කරන්නේ දැයි මොහොතකට සලකා බලමු. පළමුකොට ම ඔබ ඔබව හඳුන්වා ගැනීම සඳහා ''මම'' යන වචනය භාවිත කරනු ඇත. ඔබ ඒ මම යැයි කීවේ ඔබේ ශරීරයටත්, ඒ ශරීරය සමග බැඳුණු සිත, හදවත, මොළය ආදී සියලු ම ඉන්ද්‍රියන්ට නැතහොත් කෙස්, ලොම් ආදී භෞතික ධර්මවලට හා සිතුම් පැතුම් ආදී අභෞතික ධර්මයන්ට ය. එය එසේ නම් ඔබ මම යැයි කීවේ මෙයින් කුමකට ද? මේ මම යැයි කියන්නා සමස්තයක් ලෙස ගත් විට එවැනි අයෙකු ඔබ තුළ සිටී ද අපට තිබෙන පළමුවන ගැටලුව මෙය යි.

අපගේ දෙවන ව්‍යවහාරය මගේ යන්න යි. ඔබ නිකමට සිතා බලන්න. ඔබෙන් කවුරු හෝ විමසුවහොත් ඔය ශරීරය කාගේ ද කියා ඔබ ''මගේ යැයි'' පිළිතුරු දෙනු ඇත. ඒ ආකාරයෙන් ම සිත, කය, වචනය, අදහස්, මතවාද, හදවත, මොළය ආදියට ද මගේ යැයි කියනු ඇත. ඇත්තෙන් ම ඒවා මගේ ද? මගේ යැයි කීමට ඇති සාධක මොනවා ද?

මෙතෙක් අප කතාබහ කළ කරුණු අනුව මම කියන කෙනෙක් නැතැයි යන්න පිළිතුර විය හැකි ය. එසේ නම් අප මම ය මාගේ යැයි ප්‍රකාශ කරන්නේ ඇයි? බුදුරජාණන් වහන්සේ මේ ප්‍රකාශය පිළිබඳ අපට කරුණු පැහැදිලි කරන්නේ හේතුඵල ධර්මතාව පදනම් කර ගනිමිනි.

රථය හෙවත් වාහනය අප ගමනාගමනය සඳහා යොදා ගන්නා වස්තුවට කියන නම යි. එහෙත් රථය කියා තනි ව ගත හැකි වස්තුවක් නොමැත.

''යථාහි අංග සම්භාරා
හොති සද්දො රථො ඉති
එවං ඛන්ධෙසු සන්තෙසු
හොති සත්තොති සම්මුති''

යන විග්‍රහයට අනුව අංග හෝ උපකරණ රාශියක් එකතු වී සකස් වූ දෙයට රථය යැයි කියනු ලැබේ. ඒවා නැවත කොටසින් කොටස වෙන් කළ විට එහි රථයක් කියා දෙයක් නොමැත. එය ඒ ඒ අංගයන්ට භාවිත කරන නම යි. මම යන පදය ද එසේ ය. රූප යැයි කියන මෙම ශරීරයත් වේදනා යැයි කියන ඊට දැනෙන දෙයත් සංඥා යැයි කියන යමක් හඳුනා ගැනීමට ඇති ශක්තියත් සංඛාර යැයි කියන සිතිවිලිත් විඤ්ඤාණ යැයි කියන සිතීමේ හැකියාවත් එකට එකතු වූ විට මම යැයි සම්මතයක් අපට ඇති වේ. මේ එකතුවට

ධර්මයේ දී පවසන්නේ පංචස්කන්ධය යනුවෙනි. අංග රැසක් රථය වීමටත් පංචස්කන්ධය මම වීමටත් බලපාන්නේ මෙම එකතුව යි. මේ එකතු වී සකස්වීම සංස්කරණය යි. ඒ නිසා ම ඒ එකතු වූ රථයට හෝ මට සංස්කාර යැයි කියනු ලැබේ.

මෙම පංචස්කන්ධයේ ප්‍රධාන කොටස් දෙකක් තිබේ. එනම්, පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආදී භූතරූප සහ ඒවායින් හටගන්නා කෙස්, ලොම් ආදී කොටස් තිස් දෙකකින් සමන්විත කුණපය යි. දෙවැන්න එසේ පඨවි ආදියෙන් හට නොගන්නා වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ධර්ම හතර යි. එයින් භෞතික රූපයට රූප යන ව්‍යවහාරය ද ඇසට නොපෙනෙන කණට නොගැටෙන වේදනා ආදී ධර්මවලට නාම යන ව්‍යවහාරය ද යෙදේ.

මෙසේ පංචස්කන්ධයේ එකතුවට හෙවත් සංස්කරණයට මම ය, මාගේ ය, සත්වයා ය යන නම් අපි භාවිත කරමු.  මෙලොව දී භෞතික රූපයන් සකස්වන ආකාරය අපට සිතාගත හැකි ය. එහෙත් මෙම රූපය ඇසුරුකොට පවතින සත්වයන් හෙවත් මම සකස් වී ආවේ කෙසේ දැයි සලකා බැලිය යුතු වේ. එය සිදුවන්නේ ද සංස්කාර ක්‍රමයට යි. එනම්, සකස්වීමේ ක්‍රමයට යි. අපි මෙහි ජීවත්වන අතර පින් පව් යන කර්ම රැස් කරමු. එම කර්ම නිසා නැවත නැවත තවත් තැනක උපතක් සිදුවේ. මෙම උපත ලැබූයේ ද කර්ම රැස් කිරීම නිසා ය. එබැවින් කර්මය ද සංස්කාර ලෙස හඳුන්වයි. එහි කර්ම නම් කුසල හා අකුසල සිතිවිලි ය. ඒවා සිත, කය, වචනය යන තුන්දොර ඇසුරින් රැස්කරගනු ලැබේ. අපගේ පංචස්කන්ධයෙහි සංස්කාර ස්කන්ධයක් ඇත. ඒ සිතිවිලි නැතහොත් කර්මයන් ය.

අප මම ය, මාගේ යැයි ඇලෙන්නේ, බැඳෙන්නේ මේවා සංස්කාර බව හෝ සංස්කාර ස්වභාවය හෝ නොදන්නා නිසා ය. එසේ නැවත නැවත උපදිනවිට සසර දික් වේ. නිවන දුර වෙයි. එබැවින් නිවන් දකිනු කැමති අය විසින් සංස්කාරයන් හඳුනාගත යුතු වේ. සංස්කාරයන්ගේ ස්වභාවය හඳුනාගත යුතු වේ. ත්‍රිලක්ෂණය නම් එම සංස්කරණයන්ගේ සැබෑ ලක්ෂණ තුන යි.

සංස්කාරයන්ගේ හෙවත් රැස්වී එකතු වී සකස්වන ධර්මයන්ගේ ප්‍රධාන ලක්ෂණ තුනකි.

| | | |
|---|---|---|
| **උප්පාදො පඤ්ඤායති** | - | **හටගැනීමක් පෙනේ** |
| **වයො පඤ්ඤායති** | - | **නැසීමක් පෙනේ** |
| **ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති** | - | **තිබූ දෙය වෙනස් වූ බවත් පෙනේ** |

## අනිච්ච (අනිත්‍යය)

"සබ්බෙ සංඛාරා අනිච්චාති
යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දතී දුක්ඛෙ
එස මග්ගො විසුද්ධියා"

යමෙක් සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බව විදර්ශන නුවණින් දකී ද හෙතෙම සසර දුකෙහි කලකිරේ. එය ඔහුගේ නිවනට මග යි.

මෙම දේශනාව අනුව ඉහත සඳහන් කරන ලද භූත රූපයන්ගේ එක්වීමෙන් සෑදෙන භෞතික සංස්කාරයත් කායසංඛාර (කාය කර්ම) වචීසංඛාර (වාග් කර්ම) මනො සංඛාර (මනෝ කර්ම) යනුවෙන් ගැනෙන කර්ම හා සිතිවිලි නම් වූ සංස්කාරත් යන මේ සියල්ලේ මූලික ස්වභාවය අනිත්‍ය ස්වභාවය යි.

සත්ත්වයා හෝ මම හෝ කියන පංචස්කන්ධය හා සියලු ජීව අජීව ධර්මතා නැසීයන ස්වභාව ඇති බැවින් අනිත්‍යය යි. ළදරුවෙක්, ළමයෙකු, තරුණයෙකු බවට වැඩිහිටියෙකු, බවට මහල්ලෙකු හා මළ මිනියක බවට වෙනස් වී යන ස්වභාවය මෙම අනිත්‍යතාව ප්‍රකට කිරීමට සරල උදාහරණයකි. සංස්කාර ලෙස ගැනෙන සිත හා සිතිවිලි මෙන් ම මේ ශරීරයේ සෑම කොටසක් ම ලෝකයේ ඇති ජීව අජීව සෑම දෙයක් ම මොහොතක් පාසා ඇති වී නැති වී යාමේ ස්වභාවයෙන් යුක්ත බැවින් තාවකාලික ය. අප ශරීරයේ සෑම සෛලයක් ම මැරි මැරී අලුත් සෛල උපදී. අපගේ මහලු වීම වයසට යාම පෙනෙන්නේ මේ නිසා ය. සිතිවිලි තාවකාලික ය. ශරීරය තාවකාලික ය, ලොව ඇති අන් සියලු දේ ද තාවකාලික ය. තාවකාලික හෙයින් සියලු සංස්කාර අනිත්‍යය ය.

කිසිවක් නිත්‍ය යැයි ස්ථිර යැයි කීමට, එක් අයුරකින් පවතින්නේ යැයි කීමට මේ අනුව හැකියාවක් නැත. ඒ නිසා සියලු සංස්කාරයන්ගේ නිත්‍ය ස්වභාවය අනිවාර්යයෙන් ප්‍රතික්ෂේප වන බැවින් අනිත්‍ය යි. උප්පාදෝ පඤ්ඤායති ආදී වශයෙන් සංස්කාරයන්ගේ ලක්ෂණයෙන් ප්‍රකාශ වූයේ ද මෙම අනිත්‍යය ස්වභාවය යි.

## දුක්ඛ (දුක)

සංස්කාරයන්ගේ දෙවැනි ලක්ෂණය දුක්ඛ ස්වභාවය යි. දුක යැයි කී සැණින් අපගේ සිතට නැගෙන්නේ වේදනාකාරී බවකි. වේදනාකාරී බව දුක්ඛ යන්නෙහි එක් අංශයකි. එය හඳුන්වන්නේ දුක්ඛ දුක යනුවෙනි. විපරිණාම දුක්ඛ යනු මෙම දුක්ඛ ස්වභාවයේ තවත් පැතිකඩකි. විපරිණාම දුක්ඛ නම් පෙරළෙනසුලු, වෙනස්වනසුලු යන්න යි.

සංඛාර දුක්ඛ යනු නිවන හැර සියලු සංඛතයන්ට හෙවත් හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් දේවලට ආවේණික ස්වභාවය යි. එම ධර්ම එකින් එක විමසා බලමු.

## දුක්ඛ දුක්ඛ

මෙය දුකක් වන්නේ පීළනාර්ථයෙන් හෙවත් පීඩාකාරී බව යන අර්ථයෙනි. දම්සක් පැවතුම් සූත්‍රයේ දුක්ඛ සත්‍ය විවරණයේ දී ජාති, ජරා, ව්‍යාධි, මරණ, අප්පිය සම්පයෝග, පියවිප්පයෝග, කැමති දෑ නොලැබීම, අකැමැති දෑ ලැබීම යනුවෙන් දුක අට ආකාරයකින් දක්වා ඇත. මේ අටෙහි ම පීඩාකාරී බව දුක්ඛ වේදනාව ඇතිබව පැහැදිලි ය. මේ සංසාර ජීවිතයේ පීඩාකාරී බව දුකෙහි පළමු ලක්‍ෂණය යි. වහා දැනෙන ලක්‍ෂණයත් එය යි. වේදනාව ගත් විට සුඛ වේදනා දුක්ඛ වේදනා අදුක්ඛමසුඛ වේදනා වශයෙන් තුන් ආකාර වේ. මේ අතරින් දුක්ඛ දුක්ඛ අයත් වන්නේ දුක්ඛ වේදනාවට යි.

## විපරිණාම දුක්ඛ

''**යදනිච්චං තං දුක්ඛං**'' යමක් අනිත්‍ය නම් එය දුක ය යනු බුද්ධ දේශනාව යි. ඒ අනුව අනිත්‍ය බව, වෙනස් වන සුලු බව විපරිණාම නම් වේ. එය ම එහි ඇති දුක යි. **යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං**. අප යමක් කැමති වන විට එය ඒ ආකාරයෙන් සිදු නොවන්නේ නම් දුකකි. සැරියුත් මහරහතන් වහන්සේ ඒ බව සච්චවිභංග සූත්‍රයේ දී මෙසේ දේශනා කරති. ඉපදීම (ජාති) මහලු වීම (ජරා) මරණය (මරණ) ආදිය ස්වභාව කොට ඇති අපි ඒ දුක් අප වෙත නො එන්නේ නම් මැනවැයි සිතමු පතමු, එහෙත් ඒ සිතුම් පැතුම් එසේ සිදු නොවේ. කර්මය කෙළවර නොකළ අය නැවත උපදිති. උපන් අය ලෙඩ වෙති. මහලු වෙති, මැරෙති. මෙය විපරිණාමය යි. අනිත්‍යය යි. මේ සසරට ආවේණික විපරිණාම දුක්ඛය නම් මෙය යි. ධර්ම විග්‍රහයේ දී සුඛ වේදනාවට ද විපරිණාම දුක්ඛ යැයි කියනු ලැබේ. ඒ මන්ද යත්? සුඛ වේදනාව ආරම්භයේ දී සුවයක් සේ දැනුනත් ක්‍රමයෙන් දුක්ඛ වේදනාවට පෙරළෙන බැවිනි. මෙයින් පැහැදිලි වන්නේ සැප කියා ස්ථාවර දෙයක් සංස්කාර ලෝකයේ නොමැති බව යි.

## සංඛාර දුක්ඛ

සියලු සංස්කාරයන්ට පොදු ස්වභාව ලක්‍ෂණය නම් දුක යි. සැප නොවේ. ලෝකයේ ස්වභාවයෙන් ම පවතින්නේ අඳුර යි. ආලෝකය නොවේ. ආලෝකය කෘතිම ව ම දල්වා ගත යුතු දෙයකි. එය නිවී ගිය විට ආපසු ඉතිරි වන්නේ අඳුර යි. ලෝකය හෙවත් සියලු සංස්කාරයන්ගේ ස්වභාවය ද මෙය යි. එහි ස්වභාවයෙන් ම ඇත්තේ දුක යි. සැපය ආයාසයෙන් උපදවා ගත යුතු දෙයකි. කුස ගින්න දුකකි. ආහාර ගැනීම සැපයකි. එය දිරවූ වූ සැණින් ආපසු දුකක් පැමිණේ. සත්වයා උපදින විට රැගෙන එන්නේ කුසගින්න මිස ආහාර නොවේ. එසේ නම් ලෝකයේ සෑම දෙයක ම ආවේණික ලක්‍ෂණය දුක බව පැහැදිලි ය. සංස්කාරයන්ගේ ආවේණික ලක්‍ෂණය වන බැවින් සංඛාර දුක්ඛ යැයි කියනු ලැබේ. වේදනා අතරින් අදුක්ඛමසුඛ වේදනාව යැයි කියන අමුතු සැපතක් හෝ අමුතු දුකක් නොමැති අවස්ථාව ගැනෙන්නේ සංඛාර දුක්ඛ අවස්ථාවට ම ය. මන්ද යත් එම අවස්ථාව සැපතක් නොවන බැවිනි. නිරායාසයෙන් ලොව පවතින දුක සංඛාර දුක්ඛය යි.

## අනත්ත (අනාත්ම)

අත්ත (පාලි) ආත්ම (සංස්කෘත) යන්නේ විරුද්ධාර්ථවත් පදය අනත්ත > අනාත්ම යනු යි. පාලි අත්ත ශබ්දයෙහි අර්ථ දෙකක් කියවෙයි. පළමු වැන්න 'තමා' යන්න යි. එය යොදන්නේ කෙනෙකු හැඳින්වීම සඳහා බව සිංහල අර්ථයෙන් ම පැහැදිලි ය.

'මම' යයි කියන විට සැබවින් ම මම කියා කෙනෙකු ඇතැයි අපට සිතේ නම් එය වැරදි පිළිගැනීමකි. වැරදි නිගමනයකි. වැරදි දෘෂ්ටියකි. එම දෘෂ්ටියටත් අත්ත හෙවත් ආත්මයැයි කියනු ලැබේ. මේ ත්‍රිලක්ෂණයේ දී අනාත්ම යැයි කියන්නේ එසේ මම කියා කෙනෙකු ඇතැයි පිළිගැනීම වැරදි ය. එහෙම කෙනෙකු නැතැයි කීම සඳහා ය.

'මම' යැයි කීම 'අහංකාර' නමින් ද හැඳින්වේ. (මෙය සිංහලයෙන් කියන ආඩම්බර යන අර්ථය නොවේ.) අහං+කාර - මම යැයි කීම යන අර්ථය යි. 'අහං' (මම) යනු සර්වනාම පදයකි නාමයක් යනු යමෙකු හෝ යමක් හැඳින්වීම සඳහා සම්මත කරගන්නා පදයකි. ඔබටත් මටත් කවුරුන් හෝ විසින් තබන ලද එබඳු නමක් ඇත. ''අහං'' (මම) යනු ද එවැන්නකි. එය කාටත් පොදුවේ භාවිත කළහැකි බැවින් සර්වනාම යැයි කියනු ලැබේ. එසේ තමන් හඳුන්වා ගැනීම සඳහා ''අහං'' (මම) යන්න යොදා ගැනීම දෘෂ්ටියක් නොවේ. එහි වරදක් නැත. බුදුවරු පවා එම අර්ථයෙන් ''අහං'' යන්න භාවිත කරති.

වැඳිරියකගේ බඩ බැඳගෙන (බදාගෙන) සිටින වඳුරු පැටියෙකු සේ අප මේ ලෝකය අල්ලා ගෙන සිටින්නේ තණ්හා, මාන, දිට්ඨි යන අදහස් (සිතිවිලි) තුනෙනි. තමා දරාගෙන සිටින මේ රූප, වේදනා සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය අනෙක් අයගෙන් වෙන්කර මතුකර පෙන්වීම සඳහා මම යැයි කීම මානයකි (මැනීමකි). ඒ පඤ්චස්කන්ධය ම මම වෙමි නැත හොත් එහි මම වෙමි යි, මම කියා කෙනෙකු ඇතැයි පිළිගැනීම දෘෂ්ටියකි. බුදුන්, රහතුන් හා අප අතර වෙනස මෙය යි. උන්වහන්සේලා තමන්ට නමක් ලෙස මම යැයි කියා ගන්නා අතර අප මානයෙන් හා දෘෂ්ටියෙන් මම යයි කියාගැනීම ය.

අප ''මම'' යැයි පිළිගන්නවාත් සමග ම එසේ පිළිගැනීමට අපට හේතු වූ මේ පඤ්චස්කන්ධයටත් එය වටා ඇති පණ ඇති, හෝ පණ නැති සියලු දේටත් අප යොදන තවත් නමක් ඇත. එනම්, ''මගේ'' යන්න යි. පාලියෙන් එයට 'මම' යයි කියනු ලැබේ. මගේ යයි අප කුමකට කීවත් කියන්නේ 'මම' ඇතැයි සිතුවා සේ ම ඒවාත් සැබවින් ම ඒ ආකාරයෙන් ම ඇතැයි යන විශ්වාසයෙනි. එය මමංකාර දෘෂ්ටිය යි. අනුන්ගේ දෙයින් වෙන්කර හුවා දක්වීමට මගේ යැයි කියන නිසා එහි මානයක් ද ඇත. එපමණක් නොව ඒවා මට අයිති යයි ආශාවෙන් අල්ලාගෙන තිබෙන බැවින් මගේ යන්නෙහි තණ්හාවක් ද ඇත.

මෙසේ තණ්හා, මාන, දිට්ඨි යන සිතිවිලි පදනම් කරගෙන මම ය මගේ යැයි කියා ගැනීම හෙවත් අහංකාරය හා මමංකාරය ආත්ම දෘෂ්ටිය හෝ ආත්මවාදය යි. කියනු ලැබේ. (වාදය යනු කීම යි.) සක්කායදිට්ඨිය යනු ද මෙය ම යි.

අප 'මම' යැයි කියන්නේ මේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන කඳු හෙවත් ගොඩවල් පහේ එකතුවට යි. ඇඟිලි පහේ එකමුතුවට මිට යැයි කියන්නා සේ ය. අත්ල දිග හැරිය විට මිට කියා දෙයක් නැතුවා සේ ස්කන්ධ පහ වෙන්කළ විට මම කියා කෙනෙකු නැත.

මෙහි රූප යනු පින්තූර නොවේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනු සතර ධාතුන් ගෙන් සැදුණු මේ ශරීරයයි. වේදනා යනු ඒ කයට හෝ සිතට දැනෙන සැප, දුක් වින්දනයන් ය. සඤ්ඤා යනු ඇසූ, දුටු, දැනුණු යමක් හඳුනා ගැනීමට හෝ යමක් සිහිපත් කර ගැනීමට ඇති හැකියාව යි. සංඛාර යනු සිතට නැගෙන හොඳ හෝ නරක සිතිවිලි ය. විඤ්ඤාණ යනු මෙකී වේදනා, සඤ්ඤා, සංඛාර මගින් ඒ ඒ දේ දැනගෙන, හඳුනාගෙන සිතන මතන ශක්තිය යි. මොළයත් හදවතත් ඇසුරු කරගෙන පවත්නා මේ සිතීමේ ශක්තිය හෙවත් සිත සිතන්නේ ඇස, කණ, නාසය, දිව, ශරීරය යන ඉඳුරන්ගෙන් ලැබෙන අරමුණු ඔස්සේ ය. ඒ කිසිවකින් හෝ ලැබුණු අරමුණක් නැතිව සිතට සිතන්නට බැරි ය. අතීතය ගැන සිතුවත් සිතන්නේ එසේ ඉඳුරන් මගින් දැනගත් දේ ගැන ය.

මේ කීවේ පඤ්චස්කන්ධයේ සැටි යි. මෙයින් රූපය හෙවත් කය අප මැරුණු විට අවසන් වෙයි. කායික වේදනාත් එතැනින් අවසන් ය. එහෙත් සිත වෙනත් ලෝකයක රූපයක් අල්ලාගෙන වෙනත් තැනකට පා තබයි. මෙතැනින් මැරෙන විට පහළ වන සිත මේ ජීවිතය අත්හරින සිත යි. එයට චුති සිත යැයි කියනු ලැබේ. වෙනත් තැනකට පා තබන සිත එහිදී ඒ රූපය අල්ලා ගන්නා සිත යි. එයට ප්‍රතිසන්ධි සිත යැයි කියනු ලැබේ. මේ සිත් දෙක වෙන් වෙන් සිත් දෙකකි. පියා සහ පුතා මෙනි.

ඒ අනුව රූපය කිසිසේත් පරලොවට යන්නේ නැත. වේදනාව යන්නේත් නැත. සඤ්ඤා ද මැකී යයි. මෙලොව දී පහළ වූ අන්තිම සිතත් එහි යෙදී තිබුණු සංස්කාර හෙවත් හොඳ නරක සිතිවිලිත් නිසා පරලොව පළමු සිත වන ප්‍රතිසන්ධි සිත පහළ වේ. මෙහි දී පහළ වූ චුති සිතේ තිබුණු සිතිවිලි, කර්ම සිතිවිලි ය. මතුභවයේ පහළ වන පළමු සිතේ පහළ වන්නේ ඒ කර්මවල විපාක සිතිවිලි ය. එහි දී ලැබෙන රූපයත් ඒ කර්මවල විපාකයකි. හොඳ කර්මවලට හොඳ ප්‍රතිඵලත් නරක කර්මවලට නරක විපාකත් ලැබෙන්නේ එසේ ය. මේ චුති සිතත් ප්‍රතිසන්ධි සිතත් අතර සම්බන්ධය අඹ ඇටයක් නිසා අඹ පැලයක් පැලවීම වැනි ය. එක් අඹ ගහක් තිබුණේ ය. එයින් වැටුණු ගෙඩියක ඇටය තවත් අඹ පැලයක් පැල කර නැසී ගියේ ය. ඒ මුල් අඹ ගහත් නැසී ගියේ ය. එම අඹ ගහ වෙනත් එකකි. පැලවුණු අඹගහ තවත් එකකි. පෙනෙන කිසි දෙයක් මේ ගසෙන් ඒ ගසට ගියේ නැත. ගිය එක ම දෙය බීජ ශක්තිය පමණි.

එසේ නම් මෙහි මැරුණු කෙනාත් එහි උපන් කෙනාත් එක් කෙනෙකු නොවේ. මොහු ළඟ තිබූ කිසිදෙයක් ඔහුට ගියේ නැත. ගියේ බීජ ශක්තිය පමණි. එනම්, කර්ම ශක්තිය යි. එය චිත්ත ශක්තියකි. විඤ්ඤාණ ශක්තියකි. එහෙත් ඒ දෙදෙනා පහළ වූ විඤ්ඤාණ දෙකත් දෙකක් බව පැහැදිලි ය. මෙහි තිබුණේ කර්ම සිත යි. එහි පහළ වූයේ විපාක සිත යි.

ආත්මදෘෂ්ටිය යනු ස්ථිර, සදාකාලික, වෙනස් නොවන ආත්මයක් අපට ඇත. එය භවයෙන් භවයට යනවාය යන පිළිගැනීම ම යි. අප සතුව ඇත්තේ ස්කන්ධ පහකි. ඒ පහේ ම එක දිගට, එක ලෙස පවතින කිසිවක් නැති බව දැන් අපි දනිමු. කිසිවක් ඒ ආකාරයෙන් ම පරලොවට නොයන බවත් අපි දැන ගතිමු.

මෙයට ප්‍රධාන හේතුව සියල්ලේ ම ඇති අනිත්‍ය බව යි. මේ සියලු දේ හැම මොහොතක ම වෙනස් වෙයි. මම යැයි කීමට ස්ථිර රූපයක්, වේදනාවක්, සඤ්ඤාවක්, සංස්කාරයක් හෝ විඤ්ඤාණයක් නැත. ඉතින් අප මම කියන්නේ මෙයින් කුමකට ද පළමු ''ම'' යන්න කියවා දෙවැනි ''ම'' යන්න කියන විටත් මේ ස්කන්ධ පහ ම වෙනස් වී හමාර ය. වැඩි කාලයක් එක ආකාරයකින් තිබෙනවා වගේ පෙනෙන්නේ රූපය යි. එනම්, මේ කයයි. එහෙත් එහි ද සියලු සෛල මොහොතක් පාසා වෙනස් වෙයි. අප වයසට යන්නේ මේ නිසා ය. ළමා කාලයේ ගත් ඡායා රූපයක් දැන් රූපයට වඩා වෙනස් වන්නේ මේ නිසා ය.

ආත්ම දෘෂ්ටිය සමග අපට එන අනෙක් හැඟීම නම් සුඛ හෙවත් සැප විඳීමේ අදහස ය. මෙලෝ වශයෙන් මෙන් ම පරලෝ වශයෙන් ද අප සියලු දෙනාගේ එක ම පැතුම එය යි. අපි යම් යම් දේවල්වලට සැප යැයි කියමු. එහෙත් ඒවායේ සුවය විඳින්නට යන විට ම එය වෙනස් වී යයි. සමහර ඒවා ඇද වෙයි, කැත වෙයි, දිරා පත් වෙයි, රිදෙයි, දුක් වේදනාවට වැටෙයි. නිදසුනක් ලෙස සිට ගෙන සිටිය කෙනෙකුට ඉඳ ගැනීම සුවයකි. එහෙත් මද වේලාවක් යන විට ඉඳ ගෙන ඉඳීම දුකක් වෙයි. සිට ගැනීමට සිතේ. මෙසේ වන්නේ ආසනයේ ඇති වරදක් නිසා නොව වේදනාව අනිත්‍ය නිසා ය. වේදනාව අනිත්‍ය වූයේ අප  සැප විඳීමට පාවිච්චි කරන මේ ශරීරයේ ස්වභාවයත් අනිත්‍ය නිසා ය. වෙනස් වන සුලු නිසා ය. සුඛ වේදනාව නැති වන විට අපේ සිතේ තිබුණු සැප ය කියන සඤ්ඤාත් වෙනස් වී දුක යි කියන සඤ්ඤාව උපදී. සඤ්ඤාවත් අනිත්‍ය ය. එයින් සිතේ අපහසුවක්, නොරුස්නා ගතියක්, ඇතැම්විට තරහක් වැනි දෙයක් ඇති වේ. සැප ලැබෙන විට තිබුණේ හොඳ සිතිවිලි ය. දැන් පහළ වන්නේ නරක සිතිවිලි ය. එයින් කියවෙන්නේ සංස්කාරත් අනිත්‍ය බව ය. දැන් මේ සියල්ල එකමුතු කරගෙන ගිය සිත වෙනස් වූ බව අමුතුවෙන් කිවයුතු නැත. එසේ නම් විඤ්ඤාණයත් අනිත්‍ය ය. මේ උදාහරණයෙන් පෙනී ගියේ අනිත්‍ය බව නිසා සැම සැපයක් ම දුකට වැටෙන බව යි. කෙටියෙන් කිවහොත් අනිත්‍ය නිසා දුක ය.

එසේ නම් සදාකාලික යැයි කියන ආත්මයක් කොයින් ද?

**යදනිච්චං (යං+අනිච්චං) තං දුක්ඛං - යං දුක්ඛං තදනත්තා (තං+අනත්තා)** යමක් අනිත්‍ය නම් එය දුක ය. යමක් දුක නම් එය ආත්ම නොවේ යැයි බුදුරදුන් වදාළේ මේ නිසා ය.

**අභ්‍යාස**

01. ''සත්ත්වයා යනු අංග රැසක එකතුවකි'' ධර්මානුකූල ව විමසන්න.
02. සංස්කාරයන්ගේ ලක්ෂණ මොනවා ද යි පැහැදිලි කරන්න.
03. පංචස්කන්ධය නාම - රූප වශයෙන් බෙදා දක්වන්න.
04. දුක්ඛ ලක්ෂණය පැහැදිලි කරන්න.
05. ආත්ම දෘෂ්ටිය ඇතිවීමට බලපාන සාධක මොනවා ද යි විස්තර කරන්න.

24
පාඩම

# සසර බැඳ තබන බැම් දහය

සංයෝජන යයි කියන්නේ බැඳීම්වලට යි. අප මැරි මැරී ඉපදි ඉපදී යන ඉමක් කොනක් නැති ගමන සංසාරය හෙවත් සසරයි. මේ සසර වෙසෙන තුරා අපට ජාති, ජරා, ව්‍යාධි, මරණ දුක්, අපාදුක්, ජීවත් වීමේ දුක් ආදී අපමණ දුක් කන්දරාවක් විඳින්නට සිදු වේ. දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝක වැනි කලකට සැප වින්දහැකි තැන් ඇතත් ඒවායේ ඉපදීමට කරන පින හෝ එහි ආයුෂ ගෙවුණු පසු නැවත සමහර විට අපායට පවා ඇද වැටිය හැකි ය. ඒ නිසා සදාකාලික සැප ඇති තැනක් මේ සංසාරයේ නැත.

මේ සසර දුක කෙළවර කිරීමේ ක්‍රමයක් තිබේ. එනම් ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කොට රහත් වී නැවත නූපදින තත්ත්වයට පත් වීමයි. එහෙත් මේ සසර කාමයෙහි ඇලී ගැලී වෙසෙන අයට එය ඉතා අමාරු දෙයකි.

**"සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච යං වෙ හිතඤ්ච සාධුං ච තං වෙ පරම දුක්කරං"**

"තමාටත් අහිත කර නරක දේ කිරීමට පහසු ය. හිතකර හොඳ දේ කිරීම ඉතා අපහසු ය." යන මේ බුද්ධ දේශනාවෙන් පැහැදිලි කෙරෙන්නේ ලෝකයාගේ සාමාන්‍ය ස්වභාවය යි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ සැණින් ධර්ම දේශනා කිරීමට මදක් ප්‍රමාද වූයේ ද සත්වයාගේ මේ ස්වභාවය නිසා ය. එදා උන්වහන්සේ කල්පනා කළේ

**"කාම සොක පරෙතෙහි**
**නායං ධම්මො සුසංබුධො"**

කාමයෙහි හා සෝකයෙහි ගැලී සිටින මේ සත්ත්වයන්ට මේ ධර්මය වටහා ගැනීම පහසු කාර්යයක් නොවේ යනුවෙනි.

සත්වයන්ගේ මේ ආවේනික ලක්‍ෂණය නිසා ම ආර්ය මාර්ගයට පිවිසෙන අය ඉතා අල්ප ය. පිවිසුණත් එක දිගට ගමන් කරන අය ඉතා අල්ප ය. මේ සසර කොතරම් දුක් සහිත වුවත් තාවකාලික කම් සුවයට ඔවුන්ගේ තිබෙන ඇල්ම නිසා ම අප කාටත් මේ සංසාරයේ තිබෙන ආදීනව, අවදානම නොපෙනේ. හොඳ මග ගමන් කිරීමට වෑයම් කරනවාට වඩා පහසු, නරක මග, වැරදි මග තෝරා ගැනීම අනුගමනය කිරීම අපගේ ස්වභාවය යි. ඒ නිසා මේ සසර දුක දුකක් ලෙස දකින අය ඉතා අල්ප ය. අපට සිතෙන්නේ මේ දුක සැපක් ලෙස වැරදි ආකාරයට ය. ඒ නිසා ඒ දුකින් මිදීමට වුවමනාවක් නැත. උත්සාහයකුත් නැත. අඩු තරමින් එසේ මිදිය යුතු යයි වැඩි දෙනෙක් සිතන්නේවත් නැත.

තිරිසන් සතුන්ගේ ජීවිතය ම දුකකි. වෙදකමක් පිළියමක් නැතිව විඳින රෝග පීඩාවල ද කෙළවරක් නැත. එහෙත් ඔවුන්ට එය දුක් ලෙස වටහා ගෙන ඉන් මිදීමක්

ගැන සිතන්නට නුවණක් නැත. නිරාගත සත්ත්වයන්ගේ බලාපොරොත්තුව කවදා හෝ එයින් මිදී සැපවත් වීම මිස දුකින් මිදීමක් නොවේ. මනුෂ්‍යයන් සැප දුක දෙක ම එක ම අවස්ථාවක මිශ්‍රව විඳින අයයි. ඔවුන් නිතර ම කල්පනා කරන්නේ කුස ගින්න ආහාරයෙන් නිවා ගන්නා සේ නිතර ම දුක සැපෙන් යටපත් කරගෙන සිටීමට යි. සසර දුක වටහා ගෙන එයින් මිදීමේ මාර්ගය පිළිපැදිය හැකි එක ම තැන වන මිනිස් ලොව වෙසෙන්නන්ගෙ නුත් වැඩි දෙනෙක් තිරිසනුන් මෙන් ම මිදීමක් ගැන අවබෝධයක් නැතිව සිටීම පුදුම සහගත ය. මිනිසුන් වශයෙන් අප වැඩි දෙනාගේ බලාපොරොත්තුව සැපවත් තැන් සොය සොයා මේ සසර ම ඉපදීම ය. නැතිනම් හොඳින් හෝ නරකින් සැප අත්පත් කරගැනීම ය.

දිව්‍යලෝකවල හා බ්‍රහ්ම ලෝකවල සිටින අයට ද මේ සැබෑ තත්ත්වය නොවැටහෙන නිසා ඒ සැපත සදාකාලික යයි සිතා එහි ම ඇලී ගැලී වෙසෙති. ඒ නිසා දුකින් මිදීමේ අදහසක් ඔවුන්ට ද නැත. මෙසේ මේ සසර සත්වයන් දුක් විඳින අවස්ථාවේ මේ සසරේ ම සැප සොයන අතර සැප විඳින අවස්ථාවේ ඒ සැපත සදාකාලිකයයි සලකා මේ සසරට ම ඇලෙති. මෙසේ මේ සෑම වර්ගයක ම සත්වයන් මේ සසර දුකින් මිදීමට කිසි ම උවමනාවක් නැතිව ඊට ම ඇලී එහි ම බැඳී සිටීම සංයෝග නම් වේ.

### සංයෝජනීය වස්තු

සත්වයන් මේ සසරට ඇලෙන්නේ මූලික වශයෙන් ම දැනට පෙනෙන දැනෙන සැපය නිසා ය. එනම් ඇසට පෙනෙන රූපත් කණට ඇසෙන ශබ්දත් නාසයට දැනෙන සුවඳත් දිවට දැනෙන රසත් ශරීරයට දැනෙන සුව පහසත් නිසා ය. ඒ නිසා පසිඳුරන්ට ගොදුරුවන මේ අරමුණු පහ සත්ත්වයන්ගේ සිත් අලවන ධර්ම හෙවත් සංයෝජනීය වස්තු නම් වේ. මේ සංයෝජනීය වස්තු කෙරෙහි සත්වයා ඇලෙන්නේ සත්වයා තුළ හෙවත් අප තුළ පවතින දුර්වල ධර්ම දහයක් නිසා ය. මේවා අකුසල ධර්මය යි කීවත් වරදක් නැත. මේ දහය ම පවතින්නේ අපගේ සිතෙහි ය. මේ දහය නිසා අප සිතින් ඉහත කී රූපාදී සංයෝජනීය වස්තුවල ඇලෙමු. ඊට ආශා කරමු ඒවා රැස් කිරීමට මිස අත්හැරීමට නොසිතමු. කිඹුලා කට ඇරිය විට දැස් නොපෙනෙන්නා සේ අපටත් මේවා කෙරෙහි කාමයෙන් බැඳුණු විට හොඳ නරක, මග නොමග නොපෙනේ. මෙසේ අපේ ඇත්ත ඇති සැටියෙන් දැකීමේ නුවණ වසන් කොට අප සසර දුකෙහි හිරකර තබන මළපුඩු වැනි වූ මේ ධර්ම දහය **දස සංයෝජන** නම් වේ. එනම්, සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග පටිඝ, රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන දහයයි.

### සක්කාය දිට්ඨි

කාය හෙවත් රූප වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන මේ පඤ්චස් කන්ධය පිළිබඳ ව මම ය මාගේ ය යනුවෙන් අප තුළ ඇතිවන දෘෂ්ටිය සක්කාය දිට්ඨියයි. දෘෂ්ටිය යනු දැකීමයි. අප අප ගැනත් ලෝකය ගැනත් දකින ආකාරය යි. පිළිගන්නා ආකාරය යි සත්වයන් දිව්‍ය මනුෂ්‍ය වැනි සුගතියක වේවා නිරය, ප්‍රේත වැනි දුගතියක වේවා කවර භවයක උපන්නත් එහි දී තමාට ලැබුණු ආත්ම භාවය හෙවත් ශරීරය හෝ කය පිළිබඳ ව මම ය යන පිළිගැනීමක්, බැඳීමක් ඇතිකර ගැනීම ස්වභාවය යි. මම ය මගේ ය යන මේ බැඳීම තිබෙන තුරු කෙනෙකුට මේ සසර දුකින් මිදීමක් නම් නැත. මෙය සංයෝජනයකැයි කියන්නේ ඒ නිසා ය. මේ බැඳීම අවසන් වන්නේ ආර්ය මාර්ගයේ පළමුවන පියවර වන සෝවාන් ඵලයට පත්වීමෙනි.

## විචිකිච්ඡා

තමා පිළිබඳ ව හෝ මෙලොව පරලොව ඇතුලු සියලු දේ පිළිබඳව හරි වැටහීමක් නැති නිසා හැම දෙයක් පිළිබඳ ව ම අප තුළ ඇත්තේ සැකයකි. බුදුවරු ලොව පහළ වී මේ සියල්ල පිළිබඳ සැබෑ තත්වය පිළිබඳ කියාදුන්නත්, දුක් කෙළවර කිරීමෙන් ලැබෙන නිවනක් ඇති බවත් ඊට මාර්ගයක් ඇති බවත් කියා දුන්නත් එහි ඇත්තේ ද සැකයකි. වැඩි දෙනෙක් ඒ බුදුරදුන් හෝ උන්වහන්සේ දෙසන මග හෝ විශ්වාස නොකරති. ඇතැමෙක් පරලොවක් ඇතැයි විශ්වාස නොකරති. පවුකරන බොහෝ දෙනා ඒ කර්මවල විපාක ඇතැයි විශ්වාස නොකරති. විචිකිච්ඡාව යයි කියන්නේ මෙයයි. එය ආකාර අටකින් ඇති වේ.

1. බුද්ධෙ කඞ්ඛති - බුදුන් ගැන සැක කරයි.
2. ධම්මෙ කඞ්ඛති - බුද්ධ දේශනාව කෙරෙහි සැක කරයි.
3. සංඝෙ කඞ්ඛති - මහ සඟ රුවන කෙරෙහි සැක කරයි.
4. සික්ඛාය කඞ්ඛති - ශීලය ගැන ශික්ෂාපද රැකීම ගැන සැක කරයි.
5. පුබ්බන්තෙ කඞ්ඛති - පෙර තමා සසර ඉපද සිටියේ දැයි සැක කරයි.
6. අපරන්තෙ කඞ්ඛති - නැවත පරලොව උප දීය යන්න සැක කරයි.
7. පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති - එළොවින් චුතව මොලොව උපන්නේ ය මෙලොවින් චුතව පරළොව උපදින්නේ ය යන දෙක ම ගැන සැක කරයි.
8. ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදෙ කඞ්ඛති - හේතුඵල ධර්මය වන පටිච්ච සමුප්පාදය පිළිබඳ සැක කරයි.

මේ සැකය නිසා අප වැඩි දෙනෙකුට සැබෑ තත්ත්වය හරිහැටි නිගමනය කරගැනීමට නොහැකි වෙයි. ඒ නිසා ම හොඳ දේට හොඳ විපාක ලැබේ ය. නරක දෙයට නරක විපාක ලැබේ ය, යන කාරණය ගැන හෝ කම්සැපයෙහි ඇලී ගැලී සිටීමෙන් සසර දික් වේ, සීල සමාධි පඤ්ඤා වැඩීමෙන් සසර කෙටි වේ යන මේ කාරණය ගැන හෝ අපට හරි විශ්වාසයක් හෝ වැටහීමක් නැත. පින් පවු කරමින් දෙව් මිනිස් ගති වැනි සුගතිවලත් නිරය තිරිසන් වැනි දුගතිවලත් සැරි සරමින් මේ සසරට ම බැඳී සිටිමු. එහෙයින් විචිකිච්ඡාව ද සංයෝජනයකි.

## සීලබ්බත පරාමාස

බුදු දහමේ පන්සිල් අටසිල් දසසිල් මෙන් වෙනත් ආගම්වල ද නොයෙකුත් සිල් තිබේ. නිදසුනක් ලෙස නිගණ්ඨ ශාසනයේ ගහකින් කොළයක්වත් කැඩීම වරදකි. ජලයේ සතුන් ඇති නිසා දිය පෙරා පානය කළ යුතු ය. මේ ඔවුන්ගේ ප්‍රාණඝාතයෙන් වැළකීමේ සීලය යි. දීඝ නිකායේ සීහනාද සූත්‍රයේ විවිධ තවුසන් අනුගමනය කළ සිල් සියයක් පමණ සඳහන් වේ.

ව්‍රත යනු එසේ පිරිසිදුවේ යයි සලකා පිළිපදින දුෂ්කර පිළිවෙත් ය. ගවයෙකු සේ දිවි ගෙවන **ගෝ ව්‍රතය** හා බල්ලෙකු සේ දිවිගෙවන **කුක්කුර ව්‍රතය** එවැනි ව්‍රත දෙකකි. ඔවුන් ඒවා පිළිපදින්නේ දුකින් මිදීමට නැතහොත් කෙළෙසුන් නැසීමට ය. එහෙත් ඒවා

කිසිදු අර්ථයක් නැති නිෂ්ඵල සිල් ය, ව්‍රතයන් ය. ඒවායින් තමන් පිරිසිදු වේය කියා හෝ දුකින් මිදේ ය කියා සිතයි නම් මිථ්‍යා දෘෂ්ටියකි. දුකින් මිදීමට උවමනාවක් හෝ උනන්දුවක් නැති කම සසරෙහි දිගට ම රැඳීමට හේතුවනවා සේ ම දුකින් මිදීමට යයි කියා වැරදි පිළිවෙත් අනුගමනය කිරීම ඊටත් වඩා සසර දික් වීමට හේතු වන බව මජ්ඣිම නිකායේ කුක්කුරවතිය සූත්‍රයේ සඳහන් වේ. මන්ද, මිථ්‍යා දෘෂ්ටිය අපාගතවන තරම් බරපතල පාපකර්මයක් වන බැවිනි. නිරයට ගිය කෙනෙක් නැවත කොපමණ කලකින් ගොඩ ඒ දැයි කිව නොහැකි ය. එහෙයින් මේ සීලබ්බත පරාමාසය මිථ්‍යා දෘෂ්ටිය නිසා සත්ත්වයා සසර බැඳ තබන සංයෝජනයකි. මෙහි සීල යනු ශික්ෂා පද ලෙසින් සමාදන්ව රකින සීලයයි. ව්‍රත යනු ජීවන ක්‍රමයක් ලෙස පවත්වන ක්‍රියාවන් ය.

**කාමරාග**

අප ඇසින්, කණින්, නාසයෙන්, දිවෙන් ශරීරයෙන් විඳින රූපාදී අරමුණු පිළිබඳව අපසිත තුළ ඇතිවන රාගය හෙවත් ඇල්ම කාම රාගය යි. කාම යන්නෙන් කාම වස්තු පිළිබඳ අපගේ කැමැත්ත හෝ ආශාව කියවෙන අතර රාග යන්නෙන් ඒ පිළිබඳ ඇල්ම කිය වේ. එකී කාම වස්තු අප දකින්නේ සුභ වශයෙනි, සැප වශයෙනි, සාර වත් දේ වශයෙනි. එසේ දකින දකින තරමට ඒ පිළිබඳ ඇල්ම ද තව තවත් වැඩි වේ. දෙව් මිනිස් සැපය යි කියා අප පතන්නේ ද මේ කාම වස්තු ම ය. පල සොයා ගසින් ගසට පනින වඳුරා මෙන් ඒ කම් සුව පතාගෙන භවයෙන් භවයට ගමන් කිරීමට ම කැමති වනවා මිස කාමයෙහි ඇළුණු කෙනෙකුට එය අත් හැරීමට නම් කැමැත්තක් ඇති නොවේ. මෙය අප සසරෙහි බැඳ තබන ප්‍රධාන සංයෝජනයක් වන්නේ මේ නිසා ය. මේ කාම රාගය බලවත් ව තිබෙන තුරු සත්ත්වයා නිතර ම රැඳෙන්නේ සසර මුල ම ය. එනම් සතර අපාය දිව්‍ය ලෝක හය සහ මනුෂ්‍ය ලෝකය යන එකොළොස් කාම භවයෙහි ය. ඉන් ඔබ්බට ඔහුට යා නොහැකි ය. එසේ කාම රාගය නිසා කාම දුගතිවල හෝ කාම සුගති වල වැටෙමින් සැරිසරන සත්ත්වයාට සසරින් මිදීමක් කවදා සිදුවේදැයි කිව නොහැකි ය. සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් ලැබිය යුතු නිවන ඒ තරමට ම ඔවුන්ට දුර ය.

**පටිඝ**

අප කැමති දේ ඒ ලෙස ම ඉටු වේ නම් අපට සතුටු ය. එහෙත් එය එසේ නොවන විට බාධා ඇතිවන විට අකමැති දේ ලැබෙන විට අකමැති දේ විඳින්නට සිදුවන විට ඇතිවන්නේ අමනාපයකි. අසතුටකි. ඒ හා සම්බන්ධ අය ගැන හෝ සිද්ධි ගැන හෝ ගැටීමකි. එය පටිඝ නමි. එම පටිඝය හෙවත් සිත තුළ ඇතිවන ගැටීම පිටතට ප්‍රකාශ වන විට ද්වේශය ක්‍රෝධය ව්‍යාපාදය යනාදී නම්වලින් හැඳින් වේ. එය වචනයෙන් ප්‍රකාශ කිරීමේ දී අපහාස බැණුම් හෝ පරුෂ වචන බවට පෙරලේ. කයින් ප්‍රකාශ වීමේ දී රැවීම් ගෙරවීම් හිංසා කිරීම් පහරදීම් පමණක් නොව මරණයට පත් කිරීම තරම් දරුණු බවට පත් වේ. මේ පටිඝය හෙවත් ද්වේශය පහළ වන්නේ ද කාමය මුල්කරගෙන යි. එනම් කැමති දේ ඉටු නොවීමත් අකමැති දේ සිදුවීමත් නිසා ය.

සාමාන්‍යයෙන් පටිඝය ආවේගශීලී ක්ලේශයකි. ඒ හේතුවෙන් කිපුණු කෙනෙකුට හොඳ නරක පෙනෙන්නේ නැත ගුණධර්ම පෙනෙන්නේ නැත. කාම රාගය වැනි කෙළෙස් නිසා කෙනෙකුගෙන් අනුන්ට යහපත් දේවල් ද සිදු විය හැකි ය. එහෙත් පටිඝය නිසා

කිසිදාක යහපතක් නම් සිදු විය නොහැකි ය. සිදුවන්නේ පාපයක් ම ය. යහපතක හොඳ විපාකයට වඩා පාපයක නපුරු විපාකයකින් ගැලවීමට සත්ත්වයාට සසර වැඩිකාලයක් ගෙවීමට සිදු වේ. නිදසුනක් ලෙස රූමත් ව උපන් කෙනෙකු කාටත් ප්‍රිය වන නිසා ඔහු හෝ ඇය වෙසෙන්නේ සතුටිනි. එහෙයින් ඔහුගෙන් හෝ ඇයගෙන් සිදුවන නපුරුකම් අඩු ය. ඒ නිසා ම දුගතියට යාමට ඇති ඉඩ ද අඩු ය. එහෙත් පටිඝය හෝ කෝපය නිසා විරූපව උපන් කෙනෙක් සමාජයේ අපහාසයට උපහාසයට නොසැලකිල්ලට ලක්වන විට ඔහුගේ හෝ ඇයගේ සිත නැවත නැවතත් නපුරු වේ. ඊර්ෂ්‍යාව බලවත් වේ. නපුරුකම් බහුල වේ. ඒ නිසා මීටත් වඩා දුගති ස්ථානයකට යාමට ඇතැම් විට සිදු වේ. මේ අනුව පටිඝය පාපයට ම හේතුවන අකුසල ධර්මයක් බැවින් සසරෙහි වැඩිකාලයක් බැඳී සිටීමට සිදුවන සංයෝජනයක් වන්නේ ය. මීට හොඳ ම නිදසුන බුදුරදුන්ට එතරම් සමීපතමයෙකු වූ දෙව්දත් තෙරුන්ට අත් වූ ඉරණම යි.

### රූප රාගය

පංචකාමය පිළිබඳ ව ඇතිවන ඇල්ම හෝ රාගය කාම රාගය බවත් එම රාගයෙන් යුතුව කුසලා කුසල කර්ම කරන අය එකොළොස් කාමභවයේ උපදින බවත් කලින් කියන ලදී. එපමණක් නොව කාම වස්තූන්ට ඇලී ගැලී සිටීම ඉතා ම ප්‍රාථමික හීන බොළඳ ක්‍රියාවකි. ඔවුන් සිටින්නේ සිත දියුණු කිරීමේ මට්ටමින් ඉතා පහළ ම තැන ය. මන්ද, කාම යනු එතරම් ම හිස් නිසරු දේවල් ය. නුවණැති අය මේ බව වටහාගෙන මේ කාමයන් පිළිබඳ ආශාව අත්හැර තවුස් දම් පුරමින් භාවනාවේ යෙදී ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතියධ්‍යාන චතුර්ථධ්‍යාන ලබති. ඒ ධ්‍යානයන්ගෙන් නොපිරිහී කළුරිය කරන ඔවුහු බ්‍රහ්ම පාරිසජ්ජ ආදියේ පටන් ආභස්සර දක්වා ඇති බ්‍රහ්ම ලෝකවල උපදිති. ඔවුන්ට දැන් කාමයන් පිළිබඳ ආශාවන් නැත. එහෙත් රූපය පිළිබඳ ආශාව තවදුරටත් එසේ ම පවතී. පඤ්චස්කන්ධයෙන් වඩාත් දැනෙන ස්කන්ධය නම් රූපස්කන්ධ යයි. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ හතරට වඩා අපගේ වැඩි ඇල්මක් ඇත්තේ වැඩි බැඳීමක් ඇත්තේ ද මේ රූපයට යි. එයට රූප රාගය යයි කියනු ලැබේ. කාම රාගය යටපත් කොට රූපාවර බ්‍රහ්ම ලෝකයේ උපන් ඇත්තන්ට කාම රාගය නැති නමුත් රූප රාගය එලෙස ම පවතී. සෝවාන්, සකදාගාමී, අනාගාමී යන මාර්ගඵලවලට පත්වුවත් මේ රූප රාගය සංසිඳෙන්නේ නැත. එය රහත්වන තුරු ම පවතී. රහත්වන තුරු සත්ත්වයෙක් කාම ලෝකයේ නූපන්නත් රූපාවචර බ්‍රහ්ම ලෝකවල හෝ ඉපිද සසර රැඳීමට හේතුවන බැවින් මේ රූප රාගය තවදුරටත් සංයෝජනයකි.

### අරූප රාගය

මීළඟට ඔහු ඒ රූපය පිළිබඳ ආශාවත් දුරු කොට **ආකාසානඤ්චායනතන, විඤ්ඤානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නෙව සඤ්ඤා, නාසඤ්ඤායතන** යන අරූප ධ්‍යාන වඩයි. දැන් ඔහු වෙත රූප රාගය ද නැත. එහෙත් අරූපීව හෙවත් රූපයක් නැතිව සිටීමේ රාගය තව ම ඇත. ඔහු එයට ඇළුම් කරයි. එයට කැමති වේ. ඒ අරූපී භාවයට ඇති ඇල්ම අරූප රාගය නම් වේ. උප්පත්ති වශයෙන් ඔහු කාම රූප භවයන්හි උපදින්නේ නැත. ඉපදුනොත් උපදින්නේ එකී අරූප තල හතරෙහි ය. කුමක් වුවත් එය රාගයක් වන බැවින් එය තිබෙන තුරු සසර කලකට හෝ රැඳෙන්නේ ය. එහෙයින් එය සසර බැඳ තබන සංයෝජනයකි.

## මාන

මාන යනු මැනීමයි. ලක්ෂණ වශයෙන් හෝ ගුණ වශයෙන් හෝ යමකින් යමක් විශේෂ කොට දක්වීමට මැනීම කරනු ලැබේ. අපගේ සිතෙහි ද මෙබඳු මැනීමක් ඇත. එය **සෙය්‍ය මාන** - තමා උසස් කොට මැනීම **සදිස මාන**- තමා හා සමාන කොට මැනීම. **හීන මාන** - තමාට වඩා පහත් කොට මැනීම යනුවෙන් තුන් ආකාර වේ. එය ම නැවත තමා උසස් කෙනාට වඩා උසස් ය. උසස් කෙනා හා සමානය උසස් කෙනාට වඩා පහත් ය යන තුන් ආකාරයකින් මැනීමේ දී මානය නව ආකාර වේ. මෙයින් පෙනෙන්නේ මේ මානය යනු උඩඟුකම නොව තමා හා අනුන් සසඳා බලන ආකාරය බව යි. මා මිනිසෙක් ය. පුරුෂයෙක් ය, ගැහැණියක් ය, උස ය, මිටි ය ආදී වශයෙන් තමාගේ හෝ අනුන්ගේ උසස්කම් සමානකම් පහත්කම් මනින මිණුම් තිබේ. මේ සියල්ලකින් ම ප්‍රකාශ වන්නේ තම සිතේ ඇති මානය නැමති අකුසලයයි. මෙම මානය නැමැති සිතුවිල්ල සෝවාන් වන තුරු අත්තුක්කංසන හෙවත් තමා හුවා දක්වීම වශයෙන් ද පරවම්භන හෙවත් අනුන් අනුන් හෙළා දකීම වශයෙන් ද පෘථග්ජන අප කාගේත් සිත් තුළ පවතී. සෝවාන් වීමේ දී සක්කාය දිට්ඨිය තුරන් වන නිසා මානයේ ඒ අකුසල පක්ෂය තුරන් වී යයි. ඒ නිසා සෝවාන්, සකදාගාමී, අනාගාමී ඇත්තන්ට ආත්ම දෘෂ්ටිය නිසා හටගත් මම ය මාගේ ය යන මානය නැත. එහෙත් තමා හඳුන්වා දීමට පමණක් අස්මි මානය හෙවත් මම වෙමි යන මානය භාවිත වෙයි. සැකෙවින් කියතොත් මම ය යන ආත්ම දෘෂ්ටිය සෝවාන් මාර්ග යේ දී ම නැසේ. එහෙත් මම වෙමි යන මානය හෙවත් මැනීම රහත් වනතුරු ම පවතී. මෙසේ අනාගාමී පුද්ගලයා පවා රහත්වන තුරු මෙම සසරෙහි රඳවා තබන්නට හේතු වන දුබලතාවක් වන බැවින් මෙම මානය ද සංයෝජනයකි.

## උද්ධච්ච

සිත එක අරමුණක රඳවා තබා ගැනීමට අපහසු තත්ත්වය උද්ධච්චය යි. නොයෙකුත් කෙලෙසුන්ගෙන් සිත කිලිටි ව පවතින විට සිත අයාලේ ගමන් කරයි. විසිරෙයි. තැන්පත් බවට පත් නොවේ. එකඟ නොවන සිතට, සිදු වන දේ ඒ හැටියෙන් දක ගැනීමට නුපුළුවන. නුවණින් මෙනෙහි කිරීමට නොහැකි වේ. එය සත්‍යය වටහා ගැනීමට බාධාවකි. උද්ධච්චය, කුක්කුච්චය සමඟ නීවරණයක් ලෙස ද සඳහන් වේ. සිත වසා දැමීම, නිවන් මඟ අවුරා සිටීම නීවරණයක ලක්ෂණය යි. එය සම්මා සමාධිය ලබා ගැනීමට විශාල බාධාවකි. සම්මා සමාධියෙන් තොර ව සංයෝජන ප්‍රහාණය කිරීමට නුපුළුවන. මෙනිසා උද්ධච්චිය ද සසර බැම්මකි. සංයෝජනයකි.

## අවිජ්ජා

අවිද්‍යාව යනු නොදක්ම යි. නොවැටහීම යි. අනවබෝධය යි. මුළාව යි. මේ නොදැනීම නම්, යම් යම් විෂයයන් සම්බන්ධ කරුණු නොදැනීම නොවේ. මිනිසා පත් ව සිටින අසහනකාරී තත්ත්වය හෙවත් දුකත්, එය ඇති වන හේතුවත්, දුක නැති කිරීමේ සුවයත්, ඒ සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්තියත් යන චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීම අවිද්‍යාව යි.

කෙතරම් දුක් විඳිමින් සිටියත් අසහනකාරී තත්ත්වයට පත් ව සිටියත් මිනිස්සු තමන් දුකෙහි ගැළී සිටින බව නොදනිති. යම් තරමකින් දන ගත්තත් ඔවුනට දනෙන්නේ ශාරීරික ව ඇති වන වේදනාවනුත්, ශෝකය, දොම්නස, අම්හිරි බව වැනි මානසික ව ඇති වන අප්‍රසන්න වේදනාවනුත් පමණ ය. එහෙත් දුක්ඛ ආර්ය සත්‍යය මේ වේදනා දැනීමට සීමා වූවක් නොවේ. කෙටියෙන් කියතොත් පංචුපාදානස්ඛන්ධය ම දුක යැයි බුදුරජාණන් වහන්සේ වදාළ හ. අප වටහාගත යුත්තේ එය යි. උපාදානස්කන්ධ දුක වටහා ගන්නා තාක් දුක තේරුම් ගැනීමක් සිදු නොවේ.

උපාදාන යනු දැඩි ලෙස සිතින් අල්ලා ගැනීම ය. මෙසේ අල්ලා ගන්නේ කුමක් ද? රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ ය. එසේ අල්ලා ගන්නේ ඒවා අනිත්‍ය, අසාර බව නොපෙනෙන නිසා ය. ඒවා පවතින, නොවෙනස් වන, ස්ථිර, හරයක් ඇති දේවල් ලෙස සිතන නිසා ය.

මේ නොදැනීම නිසා ඇල්ලීමට ගන්නා උත්සාහය නම් වූ තණ්හාව, උපාදානයට මඟ පාදයි. මේ තණ්හාව දුක ඇති කරන දෙවන හේතුව ය. මෙසේ, නොදැනීම ද, තණ්හාව ද නිසා දුක ඇති වේ. නිදහස හෙවත් විමුක්තිය යනු මේ අවිද්‍යාව ද, එනිසා හට ගැනෙන තණ්හාව ද මුලසුන් කිරීම ය. නිවන නමින් හැඳින්වෙන්නේ එය යි. තණ්හාවේ ද, අවිද්‍යාවේ ද අවසානය යි.

මේ සඳහා ක්‍රමානුකූල ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු ය. ආර්ය අෂ්ටාංගික මාර්ගය නමිනුත්, ත්‍රිශික්ෂාව නමිනුත් බුදුදහම ඉදිරිපත් කරන්නේ ඒ ප්‍රතිපත්තිය යි. එය විමුක්ති මාර්ගය යි, නිවන් මගයි.

මෙසේ ආර්ය සත්‍ය සතර නොදැකීම නම් වූ අවිද්‍යාව සත්ත්වයා තුළ තිබෙන තාක් සසර ගමන නිම නොවෙයි. සත්ත්වයා සසරෙහි ම බැඳී සිටියි. එනිසා අවිද්‍යාව සංයෝජනයක් වෙයි. අර්හත්වයේ දී අවිද්‍යාව සම්පූර්ණයෙන් නැසෙන හෙයින් සියලු කෙලෙස්, සියලු ආශ්‍රව නැසී යයි. එනිසා සසර ගමන නැවතෙයි.

මෙම සංයෝජන දහය අතුරින් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාම රාග, පටිඝ යන සංයෝජන පහ නිසා සත්ත්වයා දිව්‍ය -ලෝකය, මිනිස් ලොව සහ සතර අපාය යන කාමභවයන්හි රැඳෙන බැවින් ඒවා **ඕරම්භාගිය සංයෝජන** නම් වේ.

කාමභවයන්ගෙන් මිදුණත් රූප අරූප භවයන්ගෙන් රැඳීමට හේතුවන බැවින් රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන සංයෝජන පහ **උද්ධම්භාගිය සංයෝජන** නම් වේ.

**අභ්‍යාස**

01. සංයෝජන ධර්ම සත්ත්වයාට සසරින් ගැලවීමට බාධක වන අයුරු පැහැදිලි කරන්න.
02. බුද්ධාදි අටතැන්හි සැකය මතකයෙන් කියන්න.
03. දසසංයෝජන නම්කොට එහි අදහස පැහැදිලි කරමින් ලිපියක් සකස් කරන්න.

25 පාඩම

# බුදුන් දවස දඹදිව වෙනස

ක්‍රි.පූ. 06 වන සියවසෙහි භාරතීය ආගමික පසුබිම විමසා බැලීමේ දී බ්‍රාහ්මණ හා ශ්‍රමණ යනුවෙන් ආගමික සම්ප්‍රදායන් දෙකක් දක්නට ලැබේ. ඍග්, යජුර්, සාමන් යන ත්‍රිවේදය ගුරු කොට ගනිමින් විකාශනයට පත් වූ සම්ප්‍රදාය බ්‍රාහ්මණ නමින් හඳුනා ගත හැකි ය. බ්‍රාහ්මණ ආගම මගින් සමකාලීන භාරතයේ සමාජ, ආර්ථික, දේශපාලනික, ආගමික ක්ෂේත්‍ර කෙරෙහි අධිකාරීමය බලයක් පතුරුවා තිබුණි. ලෞකික, ලෝකෝත්තර අභිමතාර්ථ ඉටුකර ගැනීමට යාගවිධි කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව කටයුතු කිරීම බ්‍රාහ්මණ සම්ප්‍රදායේ මූලික ලක්ෂණයකි. මෙම තත්ත්වයට එරෙහිව පැන නැගුණු විකල්ප ආගමික සම්ප්‍රදාය ශ්‍රමණ සම්ප්‍රදාය වශයෙන් හැඳින්විය හැකි ය. බ්‍රාහ්මණ සම්ප්‍රදායේ ම ක්‍රම විකාශනයේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රමණ සම්ප්‍රදාය බිහි වූ බව ඇතැම්හු පිළිගනිති. අරණ්‍යක, උපනිෂද් වැනි යුගවල දී බ්‍රාහ්මණයින්ගේ යාග සංකල්පයට වඩා භාවනානුයෝගීව ආධ්‍යාත්මික සංවර්ධනය ළඟාකර ගැනීම කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්නට ලැබීම ඊට සාධක වශයෙන් ගෙනහැර දක්වති. බ්‍රාහ්මණ ආශ්‍රම ධර්ම පිළිබඳ ඉගැන්වීමේ දී වානප්‍රස්ථ, සන්‍යාසි, ආශ්‍රම ධර්මවල දී ද ශ්‍රමණ වෘත්තිය කෙරෙහි නැඹුරුතාවක් දක්නට ලැබේ. එසේ නම් බ්‍රාහ්මණ සම්ප්‍රදායේ ම ක්‍රමවිකාශනයේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ බ්‍රාහ්මණ සම්ප්‍රදායට එරෙහිව හෝ ක්‍රි.පූ. 06 වන සියවසයේ දී භාරතයේ දී පැනනැගුණු ආගමික සම්ප්‍රදාය ශ්‍රමණ සම්ප්‍රදාය වශයෙන් දැක්විය හැකි ය.

## ෂට් ශාස්තෘවරු

ලෝක ඉතිහාසයේ විශිෂ්ටතම දාර්ශනික පුනරුදයකට මගපෑදූ බුදුරජාණන් වහන්සේගේ පහළවීමට තුඩුදුන් ආගමික වටපිටාව පිළිබඳ සැලකීමේ දී බ්‍රාහ්මණ සම්ප්‍රදායට එරෙහිව චින්තන විප්ලවයක් සිදුකළේ ශ්‍රමණ සම්ප්‍රදාය යි. බ්‍රාහ්මණයන්ගේ සමාජ, ආගමික චින්තාවන් ද බැහැර කරමින් යාගහෝමාදිය සැකයටත් විවේචනාත්මක ව විරෝධයටත් ලක්කිරීම ශ්‍රමණ සම්ප්‍රදායේ මූලික ලක්ෂණයකි. කර්ම මාර්ගය හෙවත් පුදපූජා විධි වෙනුවට ඥාන මාර්ගය හෙවත් ආචාරාත්මක ශික්ෂණයකට යටත්ව, ආධ්‍යාත්මික දියුණුව ඔස්සේ උසස් ඥානයක් ලබාගත හැකිය යන්න ඔවුන්ගේ මූලික ප්‍රතිපදාව විය. ඉන්දුනිම්න ශිෂ්ටාචාර යුගය තරම් ඈතට ශ්‍රමණ සම්ප්‍රදායේ ඉතිහාසය දිවෙන බව විද්වත් පිළිගැනීම ය.

බුදුරදුන්ට සමකාලීනව භාරතයේ විසූ ශාස්තෘවරු හය දෙනෙකු පිළිබඳ තොරතුරු ත්‍රිපිටක මූලාශ්‍රයවල දක්නට ලැබේ. පූරණකාශ්‍යප, මක්ඛලීගෝසාල, අජිතකේසකම්බලී, පකුධකච්චායන, සංජයබෙල්ලට්ඨිපුත්ත, නිගණ්ඨනාථපුත්ත යනුවෙනි.

මෙම ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් පිළිබඳ ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රය දැක්විය හැකි ය. මජ්ඣිම නිකායේ මහා සකුලුදායි, අපණ්ණක, සන්දක ආදී සූත්‍රවලින් ද ඒ සම්බන්ධ ආලෝකයක් සපයාගත හැකි ය. දීඝනිකායේ බ්‍රහ්මජාල

සූත්‍රයේදී මොවුන්ගේ ඉගැන්වීම් ද ඇතුළුව ලොව පවතින විවිධ මතවාද 62ක් මිථ්‍යාදෘෂ්ටි වශයෙන් සලකා තිබේ. මේවා නිවනට අදාළ නොවන ඉගැන්වීම් වශයෙන් ප්‍රතික්ෂේප කොට ද තිබේ.

බුද්ධකාලීන භාරත සමාජයේ විශාල අනුගාමික පිරිසක් ඇතිව මහජනයාගේ සම්භාවනාවට ලක්වූ ශාස්තෘවරු වශයෙන් මොවුන් දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ දී හඳුන්වා තිබේ. ඒ මෙසේ ය.

"සංඝීචෙව ගණී ච ගණාචරියො ච, ඤාතො යසස්සී, තිත්ථංකරො සාධු සම්මතො බහුජනස්ස, රත්තඤ්ඤු, චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො"

ඔවුහු විශාල පැවිදි සමූහයක් ඇති, පැවිදි ගණයා පෙරටු කොට විශාල පිරිසකට ආචාර්ය වූ, චිර ප්‍රසිද්ධ වූ, කීර්ති ප්‍රශංසාවට භාජනය වූ එමෙන් ම බොහෝ ජනතාව විසින් යහපත් ශාස්තෘවරුන් යැයි පිළිගත්, ප්‍රසිද්ධ තීර්ථංකර හෙවත් සසර දුකින් එතෙර කරම්හ යි කියන්නෝ වූහ. ඒ අනුව ෂට් ශාස්තෘන් වහන්සේලා එදා සමාජයේ කොතරම් සම්භාවනාවට පාත්‍ර වී සිටියාහු දැයි සිතා ගත හැකි ය.

## පූරණකාශ්‍යප

මොහුගේ උත්පත්ති කතාව ලෙස ජනප්‍රවාදයේ එන අපූරු කතාවක් දීඝනිකාය අටුවාවෙහි සඳහන් වේ. එනම්, මොහු ඉපදෙන්නේ වහල් ස්ත්‍රියකගේ කුසිනි. මොහුගේ ඉපදීමත් සමග මව සේවය කළ ගෙදර දාසියන්ගේ සංඛ්‍යාව සියයක් සම්පූර්ණ විය. එහෙයින් ගෝත්‍රයෙන් කාශ්‍යප නම් වූ ඔහු පූරණකාශ්‍යප නම් විය. වැඩිවියට පැමිණ තම දාස ජීවිතය පිළිබඳ කළකිරී නිවසින් පලායන මොහුගේ වස්ත්‍ර සොරුන් විසින් පැහැර ගන්නා ලදි. විලි වසා ගැනීමේ වෙනත් ක්‍රමයක් නැතිව ඔහු නිරුවත්ව ගමෙහි හැසිරුණේ ය.

මේ තැනැත්තා අල්පේච්ඡ වූ උතුම් ශ්‍රමණයෙකු යැයි සිතා ඇතැම්හු සත්කාර කරන්නට වූ හ. එහෙත් ඉන්දීය මහාචාර්යවරයෙකු වූ බරුවා මහතා සඳහන් කරන පරිදි මොහු බ්‍රාහ්මණ වංශිකයෙකි. කස්සප යනු ගෝත්‍ර නාමය යි. ඤාණයෙන් ද සම්පූර්ණ වූ බැවින් පූර්ණකස්සප නම් විය. ඒ අනුව එතුමා බ්‍රාහ්මණ වංශයෙන් ශ්‍රමණ සම්ප්‍රදායට ඇතුළත් වූ අයෙකු සේ සැලකිය යුතු ය.

දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වෙන ආකාරයට,

කරන්නෙක්, කරවන්නෙක්, සිඳින්නෙක්, සිඳවන්නෙක් නැත. සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එක ම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් ඇතිවන පාපයක් නැත. දන්දෙමින් දන් දෙවමින්, යාග කරමින්, යාගකරවමින්, ගංගා නම් ගඟේ දකුණු තීරයේ සිට උතුරු තීරය දක්වා ගියේ නමුත් එයින් සිදුවන පිනක් නැත. දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන්, සත්‍ය වචනයෙන්, සිදුවන පිනක් නැත, යන්න ඔහුගේ ඉගැන්වීම විය. ඒ අනුව මොහු පින්පව් දෙක ම ප්‍රතික්ෂේප කරන හෙයින් අකිරියවාදියෙකු ලෙස හැඳින් වේ.

මෙම ඉගැන්වීම සදාචාර විරෝධී ඉගැන්වීමක් ලෙස ද සැලකේ. කර්මවාදය, පුනර්භවය, පුණ්‍ය, පාප වැනි සංකල්ප පිළිගන්නා බුදුදහම මෙතුමාගේ ඉගැන්වීම් නිවන් මග අහුරාළන සසර දුක වැඩිකරවන පහත් ඉගැන්වීම් වශයෙන් ප්‍රතික්ෂේප කරයි.

### මක්ඛලීගෝසාල

දීඝනිකාය අටුවාවේ එන ප්‍රවාදයට අනුව මක්ඛලි යනු මොහුගේ මුල් නම යි. ධනපතියෙකු ළඟ සේවය කළ වහලෙකි. දිනක් හෙතෙම තෙල් කළයක් රැගෙන ස්වාමියා සමඟ ගියේ ය. මොහු පය පැකිලී වැටෙන්නට යනු දුටු ස්වාමියා 'මා ඛලී' හෙවත් දරුව නොපැකිලෙව නොපැකිලෙව යැයි කෑ ගැසුවේ ය. එසේ කියද්දී ම පය පැකිලී වැටුණේ ය. බියෙන් පලායාමට සැරසෙන විට ම රෙදිකොණෙන් අල්ලා ගැනිණි. හෙතෙම එය ද ලිහා දමා පලා ගියේ ය. ඔහු නිරුවත්ව විසී ය. ඒ දුටු ජනයා මොහු උග්‍ර තපස් ඇත්තෙකැයි සලකා ගරු සත්කාර කිරීමට උනන්දු වූහ. එබැවින් ඔහු ශාස්තෘවරයෙකු වී තිබේ. මක්ඛලී ගව මඩුවක උපන් නිසා ගෝසාල යන නම් වූ ඔහු මාඛලී කියද්දී පැන දිවූ නිසා මක්ඛලී වූ බව එම ප්‍රවාදයෙහි කිය වේ. එහෙත් මහාචාර්ය බරුවා මහතා සඳහන් කරන්නේ දණ්ඩක් අතෙහි දැරීමත් (මස්කරින්) ස්වච්ඡන්දතාව ප්‍රතික්ෂේප කිරීමත් නිසා මක්ඛලීගෝසාල යන නම ලැබුණ බව යි.

ආජීවක සම්ප්‍රදායේ බුද්ධකාලීන නායකයා වශයෙන් මෙතුමා හඳුනා ගැනීම නිවැරදි ය. ඔහු වර්ෂ හයක් පමණ නිගණ්ඨනාථපුත්තතුමන් සමග එකට වාසය කොට මතවාදී ගැටලුවක් මත එතුමාගෙන් වෙන්ව ආජීවක සම්ප්‍රදායේ නායකයා වූ බව විද්වත් පිළිගැනීමකි.

උත්සාහය, වීර්යය, අධිෂ්ඨානය, පුරුෂබලය, පුරුෂ පරාක්‍රමය ප්‍රතික්ෂේප කරන මොහු සියලු සත්ත්වයන්, සියලු ප්‍රාණීන්, වීර්ය රහිත, බල රහිත ස්වකැමැත්තට අනුව කටයුතු කළ නොහැකි පිරිසක් බැවින් සත්ත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හේතු ප්‍රත්‍යයක් නැතැයි ඉගැන් වූ අතර ඒ නිසා ම අහේතු අප්‍රත්‍යවාදියෙකු බවට පත් වේ.

ස්වභාව නියතියකට අනුව සත්ත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදුවේ යැයි පවසන මෙතුමා නියතිවාදියෙකි. සියල්ල ඉබේ සිදුවේ යැයි පිළිගත් නිසා අධිච්ච සමුප්පන්නවාදියෙකි.

බුදුදහමට අනුව සියල්ල හේතුඵල ධර්මයට අනුව සිදුවන්නේ ය. සියලු ආකාරයේ පුබ්බේකත හේතුවාද, අහේතු අප්‍රත්‍යවාද බැහැර කෙරේ. ස්වච්ඡන්දතාව පිළිගන්නා බුදුදහම පුද්ගලයාගේ හොඳ නරක මැනවින් තෝරා බේරා ගෙන කටයුතු කිරීමේ හැකියාව පිළිග න්නා අතර සචේතනික ක්‍රියාවල වගකීම කරන්නා වෙත ම පැවරේ. මේ නිසා ගෝසාලගේ ඉගැන්වීම අධෛර්යමත් අකර්මන්‍ය පුද්ගලයන් බවට පත් කරවන දර්ශනයක් හෙයින් සසර සයුරේ රඳවන කෙමනක් ලෙස බුදුරදුන් විසින් හඳුන්වාදී තිබේ.

### අජිතකේශකම්බල

අජිත යනු මොහුගේ මුල් නම යි. කෙස්වලින් සාදන ලද කම්බිලියක් දැරීම නිසා අජිතකේශකම්බල යන නාමය ලැබුණු බව සාමඤ්ඤඵල සූත්‍ර අටුවාවෙහි සඳහන් වේ. එම සූත්‍රයට අනුව මොහුගේ ඉගැන්වීම් මෙසේ ය.

දානයේ ඵල නැත. යාගයේ ඵල නැත. හෝමයේ ඵල නැත. හොඳ නරක ක්‍රියාවලියට වෙන් වූ විපාක නැත. එලොවින් මෙලොවට පැමිණීමක් නැත. මෙලොවින් පරලොවට යන කෙනෙක් ද නැත. මව යැයි කියා ගරු කිරීමක් ද අවශ්‍ය නැත. පියා යැයි කියා ගරු කිරීමක් අවශ්‍ය නැත. මැරෙන ඉපදෙන සත්ව කෙනෙක් නැත. යනමග අවබෝධ කරගෙන ලෝකයාට කියාදෙන ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ද නැත. යනු ඔහුගේ ප්‍රධාන ඉගැන්වීම වේ. මෙය බුදුදහමේ දී දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය ලෙසින් හැඳින් වේ.

නියත මිථ්‍යාදෘෂ්ටිය යැයි කියන මේ දරුණු මිථ්‍යාදෘෂ්ටිය දේශනා කළ ප්‍රධාන ශාස්තෘවරයා ද මොහු ය. මේ හැරුණු විට හෙතෙම මේ සත්ත්වයා සතර මහාභූතයන්ගෙන් හටගත් බවත්. ඔහු මිය පරලොව යන විට පඨවි, ආපෝ, තේජෝ, ධාතු ඒ ඒ ධාතුවලට ම එකතු වන බවත් සෙසු ඉන්ද්‍රියයන් අභාවයට යන බවත් කියයි. ඒ නිසා හෙතෙම භෞතිකවාදියෙකි.

බුදුදහම හේතුඵලවාදී න්‍යාය මගින් මොහුගේ උච්ඡේදවාදී ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරයි. පුනර්භවය පිළිගැනීම තුළින් ද ඒ බව තහවුරු වේ. දානාදී පුණ්‍ය ක්‍රියාවන් හි ඵල විපාක අවිශ්වාස කිරීම සමාජ සදාචාරයට පටහැනි ක්‍රියාවක් ලෙස ද පැහැදිලි කරයි.

### පකුධකච්චායන

දීඝනිකාය අටුවාවට අනුව කච්චායන යනු මොහුගේ ගෝත්‍ර නාමය යි. දුගී ස්ත්‍රියක වූ මව කුඹුක් ගසක් මුල දී මොහු බිහිකළ බැවින් පකුධ යන ව්‍යවහාරය ඇතිවිය. මව විසින් දරුවා ගස මුල දමා ගිය අතර බ්‍රාහ්මණයෙකුගේ රැකවරණය යටතේ ඇතිදැඩි විය. බ්‍රාහ්මණයාගේ ඇවෑමෙන් ජීවත්වීමට මගක් නොමැතිව පැවිදි වූ බව අටුවාවේ සඳහන් වේ.

සාමඤ්ඤඵල සූත්‍රයට අනුව මෙතුමා ස්වාධීන වූ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනුවෙන් නිත්‍ය පදාර්ථ හතක් ලෝකයේ ඇතැයි උගන්වා තිබේ. එබැවින් ඔහු සප්තකාය වාදියෙකි. ලෝකයේ සත්ත්වයෙකු පුද්ගලයෙකු නැත. ඇත්තේ මේ පදාර්ථ පමණි. සියලු ම ක්‍රියාවන් තනිකර ම සප්ත කායන්ගේ කාර්යාවන් ය. ඒ කිසිවක් උනුන්ට බාධක නොවෙයි. කිසිවක් කිසිවෙකුට සැපදුක් දීමට සමත් නොවෙයි. එහෙයින් මේ සප්තකාය තුළ නසන්නෙක් නස්වන්නෙක් අවවාද අනුශාසනා අසන්නෙක් හෝ අසවන්නෙක් හෝ අවබෝධ කරවන්නෙක් හෝ කරන්නෙක් නැත. කෙනෙක් කෙනෙකුගේ හිස සිඳීම යනු සප්තකායන් අතරින් ආයුධය ගමන් කිරීමක් පමණි. එනිසා මොහු අකිරියවාදියෙක් මෙන් ම භෞතිකවාදියෙක් ද වෙයි.

බුදුදහම හේතුඵලවාදය මගින් සප්තකාය වාදය බැහැර කරයි. සචේතනික ක්‍රියා පිළිබඳ පුද්ගල වගකීම බුදුදහම අවධාරණය කරයි. සමාජ - පුද්ගලයා සදාචාරයට ද එමගින් පොළඹවයි. පකුධකච්චායනගේ මේ අකිරිය දර්ශනය පුද්ගලයාගේ ධෛර්යය හීන කරවන කර්මය හා විපාක පිළිබඳ මිථ්‍යාවන් උගන්වන දර්ශනයකි. එය සමාජ ගැටලු අවුල් කරනු මිස විසඳීමක් නොකරයි.

## සංජයබෙල්ලට්ඨිපුත්ත

සංජයබෙල්ලට්ඨිපුත්තතුමා පරිබ්‍රාජකයෙකි. කීර්තියෙන් ෂට් ශාස්තෘවරුන් අතර නිගණ්ඨනාථපුත්ත තුමාට පමණක් දෙවෙනි වූ ප්‍රකට ශාස්තෘවරයෙකි. උපතිස්ස-කෝලිත දෙදෙනා පරිබ්‍රාජකයන් වශයෙන් පැවිදිව සිටියේ ද මේ සංජයතුමා වෙත ය. බ්‍රහ්මජාල සූත්‍රයට අනුව ''එවංතිපි මෙ නො, තථාතිපි මෙ නො, අඤ්ඤථාතිපි මෙ නො, නොතිපි මෙ නො, නො නොතිපි මේ නො'' යනාදී වශයෙන් මොහුගේ දර්ශනය අමරාවික්ඛේපවාදයක් (අමරාවික්ඛේප යනු ආඳා මෙන් ලිස්සා යාමයි) ලෙස උගන්වා තිබේ. සාමඤ්ඤඵල සූත්‍රයේ දී ඒ පිළිබඳ මෙසේ පැහැදිලි කෙරේ. 'පරලොවක් ඇද්දැයි මගෙන් ඇසුවොත් පරලොවක් ඇතැයි හිතුණොත් ඇතැයි මම කියමි. එහෙත් එබඳු අදහසක් මට නැත. පරලොවක් නැතැයි යන අදහසක් ද නැත. පරලොවක් නැත්තේ නොවේ යන අදහසක් ද නැත. ඊට වෙනස් වූ අදහසක් ද නැත. යනු ඔහුගේ දර්ශනයයි. මෙලෙස ස්ථිර නිගමනයකට නොඑළඹ පිළිතුරු ලබාදීමට අදාළ හේතු හතරක් බ්‍රහ්මජාල සූත්‍රයේ දක්වා තිබේ.

- **මුසාවාදයක් සිදුවේ ය යන භය හා ඊට ඇති අකමැත්ත**
- **පිළිතුර අනුව නැවත ප්‍රශ්න කළහොත් යන භය හා ඊට ඇති අකමැත්ත**
- **නුවණ මඳ නිසා එවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීමේ ශක්තියක් නොමැතිකම**

යනුවෙනි.

බෞද්ධ විග්‍රහයට අනුව මෙම ක්‍රමවේදය වචන හරඹයක් පමණි. එසේ ම අපැහැදිලි වූත් බුද්ධිගෝචර නොවූත් ඉගැන්වීමකි. පඤ්චනීවරණ පිළිබඳ ඉගැන්වීමේ දී සැකය, විමතිය නිවන වළකාලන ධර්ම වශයෙන් උගන්වා ඇති බැවින් මොහුගේ ඉගැන්වීම නිවනට බාධකයක් වශයෙන් සැලකිය හැකි ය. බරපතල ම කාරණය වන්නේ සදාචාර ධර්ම පිළිබඳව කිසිදු අනුබලයක් මෙම ඉගැන්වීම් තුළින් නොලැබීම ය.

## නිගණ්ඨනාථපුත්ත

වජ්ජි සමූහාණ්ඩුව පාලනය කළ ගෝත්‍ර අට අතරින් නාථ ගෝත්‍රයේ සිද්ධාර්ථ නම් පාලකයා මොහුගේ පියා වූ අතර ත්‍රිශාලා නම් දේවිය මව වූවා ය. ක්ෂත්‍රිය වංශිකයෙකු වූ මෙතුමා යශෝධා නම් කුමරිය සමග විවාහව අනෝජා නම් දියණියක ලැබීය. වයස අවුරුදු තිහේදී (30) අභිනිෂ්ක්‍රමණය කොට ජෛන දහමේ බුද්ධකාලීන ශාස්තෘවරයා බවට පත් වීය. දීර්ඝ ඓතිහාසික ප්‍රභවයක් ඇති ජෛන නිගණ්ඨ ගුරුකුලයේ (23) වැනි ශාස්තෘවරයා පාර්ශවනාථතුමා ය. ජෛන පරපුරේ විසි හතරවැනි (24) ශාස්තෘවරයා වූයේ මෙතුමා ය. වසර දොළහක් (12ක්) දුෂ්කරක්‍රියා කොට භාවනාවේ නිරත වූ එතුමා ජින තත්ත්වයට

හෙවත් කේවලත්වයට පත් වූ බව පිළිගැනේ. මෙතුමාගේ චරිතයේ බොහෝ දේ බෝසත් චරිතයට බුදුරදුන්ට සමානව දක්වෙන බවක් පෙනේ.

වංශයෙන් ක්ෂත්‍රිය ය. ගිහිගෙය පිළිබඳ තොරතුරුවලින් ද කතාපුවත් දෙක ම තරමක් සමාන වෙයි. බුදුරජාණන් වහන්සේ විසි අටවන බුදුරදුන් ය. නාථපුත්ත තුමා 24 වෙනි ශාස්තෘවරයා ය. බුදුරදුහු සර්වඥතා ඥානය අවබෝධ කළ හ. නාථපුත්ත තුමා කෙවලඥානය අවබෝධ කළේ ය.

එතුමාගේ ධර්මයේ සුවිශේෂ ලක්ෂණය වූයේ පරම අවිහිංසාවාදය යි. සාමඤ්ඤඵල සූත්‍ර දේශනාවට අනුව සිහිල් දියෙන් වැළකීම, සියලු සංවරයෙන් යුක්ත වීම, වැළකිය යුතු සියලු පව් වළකා දැමීම හා මෝක්ෂය ස්පර්ශ කිරීම මොහුගේ ප්‍රතිපදාව යි. එය චතුයාමසංවරය නමින් ද හැඳින්වේ. පරම අවිහිංසාවාදියෙකු වූ එතුමා බෞද්ධ පඤ්චශීල ප්‍රතිපදාවට සමාන විරති පහක් ඉදිරිපත් කළේ ය. සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙන් වෙන්වීම, බොරු නොකීම, ලෞකික සම්පත් අත් හැරීම යනුවෙනි. මෙයින් පළමු කරුණ පිළිබඳ ජෛන දහමේ දැඩි අවධානයක් යොමු කොට තිබේ. පරිසරයේ අසීමිත ජීවීන් ඇතැයි පිළිගන්නා ජෛනයන් ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ දී පවා එම ජීවීන් මිය යෑමට ඉඩ ඇති හෙයින් මුඛවාඩම් බැඳීම අනුගමනය කර ඇත. ගස්වැල් සිඳීම පවා පාපයක් වශයෙන් පිළිගන්නා ලදී. මාර්ගයේ ගමන් කරන විට දී මාර්ගය අතුගෑම ද මීට අදාළ ප්‍රතිපදාවකි. බුදුරදුන්ට පවා ගස්කොළන් කැඩීම පිළිබඳ සිකපද පැණවීමට ද වස්කාලයෙහි අලුත් තණ පාගමින් නොගොස් ආරාමවලට වී වාසය කිරීම නියම කිරීමට ද සිදුවූයේ එම පරම අවිහිංසාවාදය මගින් ජන සමාජයට කර තිබූ බලපෑම නිසා ය.

ජෛන මහාවීරතුමාගේ ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ ආකල්පය විමසා බැලීමේ දී 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' යන ඉගැන්වීමෙන් සචේතනික ක්‍රියා පමණක් කර්මය ලෙස සැලකේ. එමගින් ජෛන පරම අවිහිංසාවාදය ප්‍රායෝගික නොවන්නක් වශයෙන් බැහැර කෙරේ. දම්සක්පැවතුම් සූත්‍රයට අනුව අත්තකිලමථානුයෝගය නිරර්ථක දුක්සහගත අනාර්ය වූ ක්‍රියාවකි. සියල්ල පෙර කරන ලද කර්මය අනුව සිදුවන්නේ ය, යන විශ්වාසය ඇතිකරගත් කල්හි මෙය කළයුතු ය මෙය නොකළ යුතු ය, යන කැමැත්ත හෝ විශ්වාසය ඇති නොවේ. එකල්හි සිහිමුලා වී ඉන්ද්‍රිය සංවරය බිඳ වැටේ.

සමස්තයක් වශයෙන් විමසා බලන කල්හි සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය, වේදය, පරම සත්‍යය, ලෞකික-ලෝකෝත්තර සැප පිණිස යාග කළ යුතු ය, යනාදී බ්‍රාහ්මණ ඉගැන්වීම් බැහැර කරමින් විමුක්තිය පිණිස ඥානමාර්ගය වැඩීම, බ්‍රහ්මචර්යාව හා අනගාරික ප්‍රතිපදාව අවධාරණය කිරීම තත්කාලීන ශ්‍රමණ සම්ප්‍රදායේ ප්‍රතිපත්තිය විය. දේව වාක්‍යයන් සේ සැලකෙන ග්‍රන්ථවලට හෝ දේවධර්මවලට කොටු නොවී ක්‍රියා කළයුතු බව ශ්‍රමණ සම්ප්‍රදාය විසින් තහවුරු කරනු ලැබී ය.

ඒකාකාරී නොවී සිතන්නට පටන් ගැනීම, කාන්තාවන්ටත් ආගමික නිදහස ලැබීම, වර්ණ ධර්මයට පටහැනිව යෑම මේ සම්ප්‍රදායේ කැපී පෙනෙන ලක්ෂණයන් ය.

| ශාස්තෘවරයා | ඉගැන්වීම |
|---|---|
| පූරණකාශ්‍යප | අකිරියවාදය |
| මක්ඛලීගෝසාල | නියතිවාදය, අහේතු අප්‍රත්‍යවාදය |
| අජිතකේශකම්බලී | අකිරියවාදය, උච්ඡේදවාදය |
| පකුධකච්චායන | සප්ත පදාර්ථවාදය - ශාස්වතවාදය |
| සංජයබෙල්ලට්ඨිපුත්ත | අමරාවික්ඛෙපවාදය - සංශයවාදය |
| නිගණ්ඨනාථපුත්ත | පරම අවිහිංසාවාදය, පුබ්බේකතහේතුවාදය, ත්‍රි දණ්ඩවාදය, චතුයාමසංවරය, ආත්මවාදය, අත්තකිලමථානුයෝගය |

වශයෙන් උන්වහන්සේලාගේ ඉගැන්වීම් සම්පිණ්ඩනය කළ හැකි ය.

### සාරාංශය

ක්‍රි. පූ. 6 වෙනි සියවසේ භාරත සමාජයේ පැවති බ්‍රාහ්මණ අධිකාරියට එරෙහිව පැනනැඟුණු ස්වාධීන චින්තන සම්ප්‍රදායක් වශයෙන් පරිබ්‍රාජක, ආජීවක, නිගණ්ඨ ආදී ශ්‍රමණ සම්ප්‍රදායන් හඳුනාගත හැකි ය. ජෛන මහාවීරතුමා හැරුණු කොට අනෙක් ශාස්තෘවරු පස්දෙනා ම අකිරියවාදී ස්වරූපයක් ගනු ලැබුයේ බ්‍රාහ්මණ යාගයේ හා සමාජ ධර්මයේ ඇති අසාධාරණභාවය පිටුදැකීමේ උවමනාව නිසා ය. ත්‍රිපිටකගත බොහෝ දේශනාවලින් ෂඩ්ශාස්තෘන් පිළිබඳ කරුණු උකහා ගත හැකි අතර උන්වහන්සේලා සමකාලීන සමාජයේ ඉහළ සම්භාවනාවකට ලක් වූ පුද්ගලයෝ ය.

### ක්‍රියාකාරකම

01. පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට (3) බෙදී ෂට් ශාස්තෘවරුන් අතරින් දෙදෙනා බැගින් තෝරාගෙන ඔවුන්ගේ විශේෂතා ලයිස්තුවක් පිළියෙල කරන්න.
02. ෂට් ශාස්තෘන් පිළිබඳ කරුණු ඇතුළත් සූත්‍ර දේශනා පිළිබඳ ගුරුතුමා සමග සාකච්ඡාවක නිරත වන්න.

### පැවරුම

01. ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් පිළිබඳ දේශනා පාඨ ඇතුළත් පුවරුවක් සකසා ප්‍රදර්ශනය කරන්න.

26
පාඩම

# සාසන සංවිධාන සමුළු තුන

## ධර්ම සංගායනාවක් යනු කුමක් ද?

ධර්මය සංගායනා කිරීම හෙවත් ධර්මසංගීති යන්න බුදුරජාණන් වහන්සේ විසින් ම අනුමත කරන ලද්දකි. අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ සද්ධම්ම සම්මෝස සූත්‍රවල දී හදාරා ධාරණය කරගත් ධර්මය සජ්ඣායනා නොකිරීම ධර්මය සහමුලින් ම සුන්වී යාමට හේතුවක් බව වදාරා තිබේ. සංගායනාවේ දී ධර්ම ධරයන් ධාරණය කරගත් ධර්මය සසඳා බලමින් සාකච්ඡා කිරීමත් සියලුදෙනාගෙන් සම්මත වූ ධර්මය සජ්ඣායනා කොට තහවුරු කිරීමත් සිදුකෙරේ. තව ද සාසනාභිවෘද්ධිකාමී මහ තෙරවරුන් විසින් බුද්ධභාෂිත ධර්මය හා විනය ඒකරාශී කරමින් පිළිවෙත් සදොස් තැන් නිවැරදි කරමින් ශාසන ශෝධනයක් ඇති කිරීම සඳහා කරනු ලබන ශාසනික කාර්යය ධර්ම සංගායනාවක් වශයෙන් හඳුන්වනු ලැබේ. සසුන් බඹසර දිගු කලක් පැවැතීමට නම් සියලු භික්ෂූන් එක්ව ස්ව අර්ථයෙන් අර්ථය, ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය, සංගායනා කළ යුතු ය, විවාද නොකළ යුතු යැයි දීඝ නිකායෙහි පාසාදික සූත්‍රයේ සඳහන් වේ.

බුද්ධකාලීන භික්ෂූන් වහන්සේලා අතර ධර්මය හා විනය පිළිබඳ විවිධ මතවාද ඇති විය. එහිලා භික්ෂූන් වහන්සේලා පිරිස වශයෙන් අධික වීම, බහුශ්‍රැතයන් බහුල වීම, ශාසනය ආරම්භ වී කලක් ගතවීම, ලාභ සත්කාර අධික වීම, උගතුන් බහුල වීම, වැනි කරුණු ප්‍රධාන වශයෙන් බලපා ඇත. ඒ අනුව බුදුරදුන් දවස භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ මතවාද කිහිපයක් පහත දක් වේ.

## දේවදත්ත තෙරුන්ගේ පඤ්චවරය

- **භික්ෂූන් ජීවිතාන්තය තෙක් අරණ්‍යක විය යුතුයි**
- **භික්ෂූන් ජීවිතාන්තය තෙක් පිණ්ඩපාතික විය යුතුයි**
- **භික්ෂූන් ජීවිතාන්තය තෙක් පාංශුකූලික විය යුතුයි**
- **භික්ෂූන් ජීවිතාන්තය තෙක් වෘක්ෂමූලික විය යුතුයි**
- **භික්ෂූන් ජීවිතාන්තය තෙක් මත්ස්‍ය මාංශයෙන් වැළකිය යුතුයි**

යනු යි. මේ වර පහ ම බුදුරදුන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එයින් කිපුණු දෙව්දත් තෙර භික්ෂූන් වහන්සේ අතර සංඝභේදයක් ද සිදු කළේ ය.

## කොසඹෑනුවර ධර්මධර විනයධර භික්ෂූන් අතර ඇති වූ ගැටලුව

බුදුරදුන් දවස කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි ධර්මධර විනයධර භික්ෂූන් අතර ඇති වූ විනය ගැටලුව මහත් ආන්දෝලනාත්මක වූවකි. ධර්මධර භික්ෂුවක් වැසිකිළි භාවිත කිරීමෙන් අනතුරුව භාජනයෙහි ජලය ඉතිරිකර පැමිණියේ ය. මෙය දුටු විනයධර භික්ෂුවක් එහි ඇති නොගැලපෙන තත්ත්වය පැහැදිලි කරදීමට යාමේ දී මෙම මත ගැටුම ඇති වී තිබේ. බුද්ධ වචනය පවා ගණනකට නොගෙන දායකයන් පවා නොමඟ යවමින් පැවැති මෙම මත ගැටුම සමනය වූයේ බුදුරදුන් සඟ පිරිස අතහැර හුදෙකලා වාසයට යාමත් එනිසා උපන් මහජන උද්ඝෝෂණයත් නිසා ය.

තව ද,

- අරිට්ඨ, සුනක්ඛත්ත, සාති වැනි භික්ෂූන් ධර්ම විනය වැරදි ලෙස විග්‍රහ කිරීම.
- ඡන්න, ඡබ්බග්ගිය, උදායි වැනි භික්ෂූන්ගේ නොහික්මුණු ක්‍රියාකලාපයන් සහ විනය ශික්ෂා උල්ලංඝනය කිරීම වැනි තවත් යම් යම් කරුණු බුදුරදුන් ජීවමාන සමයේ දී උද්ගත විය. ඒවා ඒ ඒ අවස්ථාවල බුදුරදුන් විසින් සමථයට පත් කරන ලදී. එහෙත් එබඳු අදහස් සහ ඒවා දරූ පුද්ගලයන් බුදුරදුන් පිරිනිවන්පාන විටත් සිටි බවට සුභද්‍ර භික්ෂුව එක් නිදසුනකි.

## ප්‍රථම ධර්ම සංගායනාව

පළමු ධර්මසංගායනාව පිළිබඳ පැරණිතම තොරතුරු චුල්ලවග්ග පාළියේ පඤ්චසතිකක්ඛන්ධකයේ හමුවේ. විනය සංගීතිය, මහාකාශ්‍යප ථේර සංගායනාව, පඤ්ච සතික යන නම්වලින් පළමු සංගායනාව හඳුන්වා ඇත. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු ප්‍රධාන කොටස් දෙකකට වෙන්කර දැක්විය හැකි ය. එනම්,

- ආසන්න හේතු
- දුරස්ථ හේතු

යනුවෙනි.

### ආසන්න හේතු

මහලු කල පැවිදි වූ සුභද්‍ර නම් භික්ෂුවක විසින් ප්‍රකාශ කළ අභද්‍ර වචනය පළමු ධර්ම සංගායනාව සඳහා බලපෑ ආසන්නතම හේතුව වශයෙන් පෙන්වාදිය හැකි ය. "අලං ආවුසො මා සොචිත්ථ මා පරිදෙවිත්ථ සුමුත්තා මයං තෙන මහා සමණෙන, උපද්දුතා ච මය හොමං ඉදං වො කප්පති ඉදං වො න කප්පතීති. ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම. යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාම." "ඇවැත්නි, නොහඬන්න, නොවැළපෙන්න, මෙය තොපට කැප ය, මෙය තොපට අකැප ය, යනාදී වශයෙන් නීති පැනවූ ඒ මහා ශ්‍රමණයන්ගෙන් අප සහමුලින් ම මිදුණෙමු. දැන් අපි කැමති දෙය කරමු. අකමැති දෙයක් නොකරමු" යනුවෙන් සුභද්‍ර භික්ෂුව බුද්ධ පරිනිර්වාණය පිළිබඳ තම මතය සමස්ත භික්ෂු ප්‍රජාව ඉදිරියේ ප්‍රකාශ කළේ ය.

## දුරස්ථ හේතු

- විසිරී පැවැති ධර්මය හා විනය ඒකරාශී කිරීම හා එය ක්‍රමානුකූලව සකස් කිරීම
- ධර්ම විනය ශාස්තෘවරයා වශයෙන් සැළකිය යුතුය යන බුදුවදන සඵල කර ගැනීම
- ධර්ම විනයට එරෙහිව නැගෙන අභ්‍යන්තර හා බාහිර බලවේග මැඩලීම
- ශාසනයේ චිර පැවැත්ම සහතික කිරීම
- අධර්මය හා අවිනය රජවීම වළක්වා ධර්මය හා විනය බැබළවීමට සැලැස්වීම යනු යි.

මෙම ආසන්න හා දුරස්ථ හේතු පදනම් කරගෙන බුද්ධ පරිනිර්වාණයෙන් විසි එක්වන දා සර්වඥධාතු බෙදා දෙන ස්ථානයේ දී මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ධර්ම සංගායනා කිරීමේ අවශ්‍යතාව පැවසූහ. මේ අදහසට එකඟ වූ භික්ෂූහු සුදුසු භික්ෂූන් තේරීම මහාකාශ්‍යප හිමියන්ට භාර කළ හ.

මහාකාශ්‍යප තෙරණුවෝ සිව්පිළිසිඹියාපත් රහතන් වහන්සේලා එකුන් පන්සියයක් දෙනා තෝරා ගත් හ. මේ වනතුරු රහත්භාවයට පත්වී නොසිටි අනඳ හිමියන්ට රහත් බව ලබා සංගීතියට සහභාගිවීමට ඉඩතබා තිබිණ.

පළමු ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය මහාකාශ්‍යප මහරහතන් වහන්සේ දැරූහ. බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසු සිදුකළ මෙම ධර්ම සංගායනාවට රහතන් වහන්සේලා පන්සියයක් දෙනා සහභාගී වූ හ. ධර්ම භාණ්ඩාගාරික අනඳ හිමියන් මේ සඳහා සහභාගීවීමේ විශේෂතාවක් විය. ''පින් කළ ඔබ නොබෝ දිනකින් රහත් වන්නෙහි යැ'' යි පවසා තිබූ බුද්ධ වචනය පසක් කරමින් අනඳ හිමියෝ කායගතාසති භාවනාව වඩා රහත් ව මෙම සංගායනාවට සහභාගී වූ හ. රජගහනුවර වේභාර නම් පර්වත පාමුල සප්තපර්ණී ගුහාව අබියස සාදන ලද අලංකාර මණ්ඩපයෙහි සත්මසක් මුළුල්ලේ සිදුකළ සංඝායනාවට අජාසත්ත රජු විසින් දායකත්වය ලබා දී තිබේ.

සංගායනාව ආරම්භ කිරීමට පෙර අවශ්‍ය මූලික සංවිධාන කටයුතු මහාකාශ්‍යප තෙරුන් විසින් සිදු කරන ලදී. '' **විනයො නාම සාසනසස ආයු**'' විනය ශාසනයේ ආයුෂය යැයි පෙන්වා දෙමින් ප්‍රථමයෙන් විනය සංගායනා කළයුතු බව තීරණය කරන ලදී. ඒ අනුව විනය දේශනා කිරීමට විනයධරයන් අතර අගතැන්පත් උපාලි තෙරුන්ට භාර කෙරිණි. බුදුන් වහන්සේ විසින් පනවන ලද සියලු විනය ශික්ෂාපද ප්‍රශ්නෝත්තර ක්‍රමයට නිදාන, පුද්ගල, වස්තු, ආපත්ති හෙවත් ඇවැත් ආදී වශයෙන් මහාකාශ්‍යප තෙරුන් විසින් ප්‍රශ්න කරන ලද අතර උපාලි තෙරුන් විසින් ඒවා විසඳන ලදී. අනතුරුව සියලු භික්ෂූන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් විනය සජ්ඣායනාව සිදුවිය. එම විනය ශික්ෂාපද **උභතො විභංග, ඛන්ධක, පරිවාර** වශයෙන් බෙදා ඒවා මුඛ පරම්පරාවෙන් රැගෙන යාමේ වගකීම උපාලි තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට භාර කරන ලදී. සජ්ඣායනා කොට කරන ලද එම සංග්‍රහය විනය පිටකය නම් විය. විනය පිටකය ග්‍රන්ථ වශයෙන් කොටස් පහකට බෙදේ. එනම්,

- පාරාජිකා පාළි } - උභතො විභංග
- පාචිත්තිය පාළි
- මහාවග්ග පාළි } - ඛන්ධක
- චුල්ලවග්ග පාළි
- පරිවාර පාළි - පරිවාර

යනු යි.

විනය සංගායනා කිරීමෙන් අනතුරුව ආනන්ද තෙරුන් අමතා මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සූත්‍ර පිටකය හෙවත් ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කළහ. එහිදී මහාකාශ්‍යප තෙරුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් ආනන්ද තෙරණුවෝ "**එවං මෙ සුතං එකං සමයං භගවා.....**" මා විසින් (භාග්‍යවතුන් වහන්සේගෙන්) මෙසේ අසන ලදී" යනුවෙන් මුළු සූත්‍ර පිටකය දේශනා කළහ. අනතුරුව සියලුදෙනා එක්ව සජ්ඣායනා කරන ලදී.

එහිදී සූත්‍ර ධර්ම ප්‍රමාණය අනුව කොටස් පහකට වර්ග කෙරිණි. සද්ධර්මයේ ආරක්ෂාව හා චිර පැවැත්ම සඳහා මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමට ද ඒ ඒ කොටස් භික්ෂු පරම්පරාවලට භාරකරන ලදී.

- දීඝනිකාය (ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට)
- මජ්ඣිමනිකාය (සැරියුත් තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට)
- සංයුත්තනිකාය (මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට)
- අංගුත්තරනිකාය (අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට)
- ඛුද්දකනිකාය (සියලු දෙනාට)

## සංගායනාවේ ප්‍රතිඵල

- තැන තැන විසිරී තිබුණු බුද්ධදේශිත ධර්මය හා විනය එක් රැස් කොට ඒ පිළිබඳ තිබූ දුර්මත ඉවත් කොට බුදුදහම නිර්මලත්වයට පත් කිරීම.
- ධර්මය හා විනය ඒ ඒ භික්ෂු පරම්පරාවලට මුඛ පරම්පරාවෙන් හෙවත් කට පාඩම් කර පවත්වාගෙන යාමේ වගකීම පැවරීම.
- ධර්මය හා විනය ගුරුවරයා වශයෙන් සැලකීමට තීරණය කිරීම.
- පවතින ශික්ෂා පද ලිහිල් නොකිරීමටත් නව ශික්ෂා පද නොපැනවීමටත් තීරණය කිරීම.
- අධර්මවාදීන් හා අවිනයවාදීන් මැඩ පැවැත්වීම.
- ආනන්ද තෙරුන්ට එල්ල වූ චෝදනා විසඳා නිදහස් කිරීම.
- ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය පැන වීමට තීරණය කිරීම.
- අධර්මය හා අවිනය රජවීම වළක්වා ධර්මය හා විනය බැබළවීමට සැලැස්වීම යනාදිය යි.

## දෙවන ධර්ම සංගායනාව

ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසු කලක් යනතුරු ධර්මය නිර්මල ව පැවතුණි. එහෙත් බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක් ගතවීමෙන් මත්තෙහි නැවත ධර්ම සංගායනාවක අවශ්‍යතාව ඇති විය. නැවත වතාවක් සාසන සෝධනයක අවශ්‍යතාව මතුවූයේ වජ්ජිපුත්තක භික්ෂූන් පිළිගෙන තිබුණ ශාසන විරෝධී දස අකැප වස්තූන් නිසා බව **චුල්ලවග්ග පාළිය, දීපවංසය, මහාවංසය බෝධිවංසය, සමන්තපාසාදිකාව** යන ග්‍රන්ථයන්හි සඳහන් කරුණු තුළින් තහවුරු වේ.

### දසඅකැප වස්තු

**සිංගිලෝණකප්ප** :- අඟක ලුණු තබා ගනිමින් ආහාරයට ගැනීම කැප ය.

**ද්වංගුලකප්ප** :- ඉර හැරී හෙවනැල්ල අඟල් දෙකක් වැටෙන තුරු ආහාරය වැළඳීම කැප ය.

**ගාමාන්තරකප්ප** :- වරක් වළඳා අවසන් කොට තවත් ගමකට ගොස් දන් වැළඳීම කැප ය.

**ආවාසකප්ප** :- සීමාව තුළ පිහිටි කුඩා ආවාසයන්හි වෙන වෙන ම පොහොය කිරීම කැප ය.

**අනුමතිකප්ප** :- එක් සීමාවක් ඇතුළත වාසය කරන භික්ෂූන්ගේ කැමැත්ත නොගෙන වෙන් වෙන් වශයෙන් පොහොය කොට නැවත කැමැත්ත ලබාගැනීම කැප ය.

**ආචිණ්ණකප්ප** :- කැප අකැප දෙයක් පිළිබඳ නොසලකා චිරාගත දේ පිළිගැනීම කැප ය.

**අමථිතකප්ප** :- කිරිත් නොවූ දීකිරිත් නොවූ කිරි අවේලාවෙහි වැළඳීම කැප ය.

**ජලෝගිකප්ප** :- රා බවට නොපැමිණි මී රා පානය කිරීම කැප ය.

**අදසක නිසීදනකප්ප** :- වාටියක් නොමැතිව අඳනය පරිහරණය කැප ය.

**ජාතරූපරජතකප්ප** :- රන් රිදී මිල මුදල් පිළිගැනීම කැප ය.

යනු යි.

භික්ෂුව නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාවෙන් බැහැර වී ලෞකික ආශාවන් වෙත නැඹුරුවීමේ ලක්ෂණ දස අකැපවස්තූන් පරිශීලනය කිරීමෙන් පෙනේ. ආවාස කප්ප, අනුමති කප්ප යන

ඒවායින් නිදහස අවශ්‍ය වූ බව පෙනේ. අනිකුත් අකැප වස්තූන් තුළින් සැපවත් ජීවිතයක් අපේක්ෂා කර තිබේ. කෙසේ වෙතත් මෙම දස අකැප වස්තූන් ශාසනයේ චිරස්ථිතියට හේතු නොවන බව තේරුම් ගත් ශාසනභාරධාරී භික්ෂූන් වහන්සේලා දෙවෙනි ධර්ම සංගායනාව සිදු කිරීමට කටයුතු සංවිධානය කළ හ.

## සංවිධාන කටයුතු

කාකණ්ඩපුත්ත යස තෙරුන් වහන්සේ විසල් මහනුවරට වැඩම කරන අවස්ථාවේ වජ්ජිපුත්තක භික්ෂූහු මුදල් සම්මාදමේ යෙදී සිටියහ. එහිදී වජ්ජිපුත්තක භික්ෂූන්ට යස තෙරණුවෝ එය අනිසි බව කීහ. එහෙත් ඔවුහු එය නොපිළිගත්හ. ඒ වෙනුවට යස තෙරුන්ටත් මුදල් දී තම පක්ෂයට හරවා ගැනීමට යත්න දැරූහ. එහෙත් යස තෙරණුවෝ එයට අකැමැති වූහ. මේ නිසා වජ්ජිපුත්තක භික්ෂූහු යස තෙරුන්ට විරුද්ධව කටයුතු කිරීමට ද පෙළඹුණහ.

යස තෙරණුවෝ කොසඹෑ නුවරට ගොස් වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තූන් ප්‍රකාශ කරමින් ඉන් ශාසනයට වන හානිය ප්‍රකාශ කොට ධර්ම විනය ආරක්ෂාවට පියවර ගතයුතු බව දැන්වූහ. සෝරෙය්‍ය නුවර විසූ රේවත හිමි යස තෙරණුවන්ගේ අදහසට එකඟ විය. සබ්බකාමී මහාරහතන් වහන්සේ ද මේ සඳහා එක් වූහ.

විශාලා මහනුවර දෙළොස් ලක්ෂයක් පමණ භික්ෂූන් එකතුව මෙය විසඳීමට යෑමෙන් මතභේද ඇති වේ යැයි තීරණය කළ යස තෙරුණුවෝ ඒ අතරින් බුදුන් වහන්සේ සියසින් දුටු අටනමක් තෝරා ගත්හ. **සබ්බකාමී, රේවත, යස, සාළ්හ, ඛුජ්ජසෝභිත** හා **සම්භූත** යන සයනම ද අනුරුද්ධ හිමියන්ගේ සද්ධිවිහාරික ශිෂ්‍ය **වාසගාමි** හා **සුමන** යන දෙනම ඒ අට නමට ඇතුළත් වූ රහතන් වහන්සේලා ය.

මේ අටදෙනා වහන්සේලා දස අකැප වස්තූන් විනය විරෝධී ද විනය විරෝධී නොවේ ද යනුවෙන් සාකච්ඡා කළහ. යස තෙරණුවෝ ඒ සියල්ලට ම පිළිතුරු දුන්හ. උන්වහන්සේලාගේ තීරණය වූයේ ''ආචිණ්ණ කප්ප'' හැර සියලු කරුණු භික්ෂුවට අකැප බව යි. මෙය මහාසංඝ සභාවට දැනුම් දීමෙන් පසු එයට අනුමැතිය ද ලැබුණි. මේ නිසා දස වස්තූන් පිළිගත් දසදහසක් පමණ වජ්ජිපුත්තක භික්ෂූහු නිගාවට පත්ව නික්ම ගොස් කොසඹෑනුවර ඝෝෂිතාරාමයට රැස් වූහ.

## සංගායනා කිරීම

ත්‍රිපිටකධාරී භික්ෂූන් හත්සියයක් දෙනාගේ සහභාගිත්වයෙන් විශාලා මහනුවර වාළුකාරාමයේ දී පැවැත්වූ මෙම ධර්ම සංගායනාව අටමසකින් නිම විය. මේ සඳහා කාලාශෝක රජු විසින් ප්‍රධාන දායකත්වය ලබා දී තිබේ. හත්සියයක් දෙනා සහභාගීවූ නිසා ''සත්තසතිකා සංගීති'' නමින් මෙය ව්‍යවහාරයට එක් විය.

## ප්‍රතිඵල

චුල්ලවග්ග පාළියේ අග දක්වෙන සංගීති ඛන්ධක දෙක ද අංගුත්තරනිකායෙහි මුණ්ඩක සූත්‍රය ද ඇතුළත් ධර්ම කොටස් කීපයක් ම මෙම සංගායනා අවස්ථාවෙහි ත්‍රිපිටක පාළියට එකතු කළ බව අටුවාව දක්වයි.

දස අකැපවස්තු අධර්මවාදී යැයි සලකා එය බැහැරකොට මෙම සංගායනාව පැවැත්වීම නිසා නැවත වරක් බුද්ධ ධර්මය නිර්මලව ආරක්‍ෂා විය. දුර්ලබ්ධි ගත් අලජ්ජි වජ්ජි පුත්තක භික්ෂූන් සසුනෙන් නෙරපා දමා ථේරවාදී සංඝ සමාජය නිර්මල කෙරිණි.

දස දහසක් පමණ භික්ෂූන් ඇතුළු වජ්ජිපුත්තක තෙරවරු රාජ සහයෝගයක් නොමැතිව ප්‍රාන්ත පාලකයෙකුගේ සහයෝගයෙන් වෙන ම ධර්ම සංගායනාවක් පැවැත්වූහ. මහාදේව තෙරුන්ගේ මූලිකත්වයෙන් පැවැති මෙම සංගායනාව ''මහාසංගීති'' නමින් හැඳින් වේ. ඒ සඳහා සහභාගී වූ භික්ෂූහු මහාසංඝික නමින් අලුත් නිකායක් බිහි කළහ. මෙලෙස සංගායනා දෙකක් පැවැත් වූ බවට කරුණු සඳහන් වී තිබේ. මේ හේතුවෙන් ථේරවාද හා මහායාන යනුවෙන් මහාසංඝයා නිකායන් දෙකකට වෙන් විය. ඒවා තුන්වන ධර්ම සංගායනා කාලය එළඹෙන විට අටළොස් නිකායකට බෙදී පැවතුණි.

**මෙහි මහාසාංඝික නිකාය නිසා ඇතිවූ කොටස් පහකි.**

1. ගෝකුලික ය
2. එකබ්බෝහාරික ය
3. පඤ්ඤත්තිවාදි ය
4. බාහුලික ය
5. චෙතිය වාදි යනුවෙනි.

**ථේරවාදය ශාඛා එකොළසකට බෙදිණි. එනම්,**

1. මහිංසාසක ය
2. වජ්ජිපුත්තක ය
3. ධම්මොත්තරිය
4. සම්මිතීය ය
5. සබ්බත්තවාදී ය
6. ධම්මගුත්තික ය
7. භද්‍රයානික ය
8. ඡන්නාගරික ය
9. කස්සපී ය
10. සංකන්තික ය
11. සුත්තවාදී ය

යනු යි.

## තෙවන ධර්ම සංගායනාව

දෙවන ධර්ම සංගායනාව පවත්වා අවුරුදු 118 ක් පමණ ගතවනවිට නැවත ධර්ම සංගායනාවක් පැවැත්වීමේ අවශ්‍යතාව මතු විය. එනම් භාරතයේ ශ්‍රේෂ්ඨතම පාලකයා වූ ධර්මාශෝක රාජ්‍ය සමයේ දී ය.

- **භික්ෂූන් විවිධ නිකායවලට බෙදී සිටීම.**
- **බුද්ධධර්මය පිළිබඳව විවිධ අදහස් ඉදිරිපත් වී තිබීම.**
- **අධර්මවාදීන් සසුනට ඇතුල්වීම.**
- **ප්‍රබල බෞද්ධ රාජ්‍ය පාලකයකුගේ සහාය සහ ආරක්ෂාව නොමැතිවීම යන කරුණු නිසා බුදු සසුන දුර්වල තත්ත්වයකට පත්වීම. එහිලා ප්‍රධාන හේතු ලෙස පෙනේ.**

දෙවන ධර්ම සංගායනාව හේතුවෙන් සංඝ සමාජය නිකාය වශයෙන් කොටස් වූ බව කියන ලදි. විවිධ අදහස් දරූ භික්ෂූන් වහන්සේලා ස්වාධීනව ධර්මය විග්‍රහ කරන්නට වූහ. ඒ නිසා විවිධ වාද විවාද දර්ශනවාද බිහි විය. විවිධ භේද ඇතිවීමත් සමග බුදුසසුන තුළ අර්බුදකාරී තත්ත්වයන් උද්ගත විය. මේ අතර අශෝක රජ දික්විජය කරමින් දඹදිව අධිරාජ්‍යයා බවට පත්විය. දරුණු යුද්ධයෙන් පසුතැවිල්ලට පත්ව සිටි හෙතෙම නිග්‍රෝධ සාමණේර හිමියන් දැක පැහැදී බුදුදහම වැළඳ ගත්තේ ය.

බුද්ධ සාසනයට රාජ්‍ය අනුග්‍රහය යොමු වූ හෙයින් ලාභයෙන් පිරිහුණ අන්‍ය තීර්ථකයෝ සිවුපසයට ගිජුව සසුනට ඇතුළත් වූහ. එහෙයින් සිල්වත් භික්ෂූහූ දුසිල්වතුන් සමඟ පොහොය කර්ම කිරීම ප්‍රතික්ෂේප කළහ. වසර හතකින් පමණ විනය කර්ම නොකළ බව දැනගත් රජු කපිල නම් ඇමතිවරයා සිල්වත් භික්ෂූන් වෙත යවා පොහොය කර්ම කරන ලෙසට දන්වා සිටියේ ය. සිල්වත් භික්ෂූන් වහන්සේලා දුසිල්වතුන් සමඟ පොහොය කර්ම කිරීමට අකමැති බව ප්‍රකාශ කළ හ. මීට කිපී කපිල ඇමතියා කීප නමකගේ හිස ගසා දැමීය. එය නතර වූයේ රජුගේ සොහොයුරෙකු වූ තිස්ස හිමියන්ගේ පැමිණීමෙනි.

ඇමතිවරයාගේ සාපරාධී ක්‍රියාව දැනගත් රජු අධික ලෙස කම්පා විය. ඇමතියා කළ පාප කර්මයට තමාට ද විපාක විඳීමට සිදුවේ යැයි රජු තුළ සැකයක් ඇතිවිය. එය භික්ෂූන්ගෙන් විමසූ කල භික්ෂූන්ගෙන් හරි පිළිතුරක් නොවී ය. විවිධ මතයන් දැරූහ. මේ නිසා අහෝගංග නම් පර්වතයේ විවේකයෙන් සිටි මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේට වැඩමවන ලෙසට ආරාධනා යැවිණි. උන්වහන්සේ එම ආරාධනය දෙවතාවක් ම ප්‍රතික්ෂේප කළහ. තුන්වෙනි වතාවේ දී බුදුසසුන රැකගැනීමට වැඩමවන්න යැයි ආරාධනා කළ විට එහි වැඩම කොට ධර්ම දේශනා කර රජුගේ හිතේ තිබුණා වූ සැකය පහකර දැමූහ. අනතුරුව රජතුමා දින හතක් මුළුල්ලේ මොග්ගලීපුත්තතිස්ස හිමියන්ගෙන් ධර්මය ඉගෙන ගෙන ශාසනය කෙරෙහි විශ්වාසය තහවුරු කරගත්තේ ය. දුසිල්වතුන් සහ සිල්වත් භික්ෂූන් තෝරා ගැනීමට රජුට දැඩි උවමනාවක් විය. එහෙයින් බුදුන් වහන්සේ කිනම් වාදියෙක් දැයි විචාරා විභජ්ජවාදී යැයි කී භික්ෂූන් සසුනෙහි තබා හැටදහසක් දුසිල්වත් භික්ෂූන් පළවා හැර සාසනය පාරිශුද්ධත්ව භාවයට පත් කළේ ය.

### සංගායනා කිරීම

වැරදි මත නිසා බුදුදහම කෙලෙසී ඇතිබව දත් මොග්ගලීපුත්තතිස්ස තෙරණුවෝ ධර්ම විනය සංගායනාවක් කළයුතු යැයි ධර්මාශෝක රජතුමාට දන්වූහ. රජතුමා ඒ සඳහා පැළලුප්නුවර අශෝකාරාමය පිළියෙල කොට, දියයුතු සහයත් ආරක්ෂාවත් ලබාදුන්නේ ය. මොග්ගලීපුත්තතිස්ස හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම සංගායනාවට නවමසක් ගතවිය. දහසක් භික්ෂූන් වහන්සේ සහභාගී වූ හෙයින් මේ සංගායනාව ''සාහස්සිකා'' සංගිතිය යනුවෙන් ද හැඳින් වේ. මෙය සිදු වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර 235 වැන්නේ දී ය.

### ප්‍රතිඵල

1) බුදුරදුන් වදාළ මාතෘකා අනුව ප්‍රථම ධර්ම සංගායනාවේ දී පිළියෙල කළ ''කථාවත්ථුප්පකරණ'' නම් වූ අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථය මොග්ගලීපුත්තතිස්ස හිමියන් විසින් සම්පූර්ණ කොට සම්පාදනය කරන ලද්දේ මේ සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි. එය පරවාද 500ක් මර්දනය සඳහා සකවාද පන්සීයක් ඇතුළත් මහගු ග්‍රන්ථයකි. මෙය පරිශීලනය තුළින් බුදුදහම පිළිබඳ ව මනා අවබෝධයක් ලබාගත හැකි ය.

2) සැට දහසක් පමණ අධර්මවාදීන් පළවා හළ හෙයින් නැවත ධර්ම විනය නිර්මල භාවයට පත් විය.

3) ත්‍රිපිටක ධර්මය අවසාන වශයෙන් අංග සම්පූර්ණ වීම සිදුවීය.

4) නෙරපා හරින ලද දුසිල්වත් භික්ෂූන් නැවත පැවිදි වී හේමවතය, පුබ්බසේලිය ආදී නිකාය නවයක් ම ඇතිවීම, එපමණක් නොව අංගුලිමාල පිටකය වෙස්සන්තර වැනි අධර්ම ග්‍රන්ථ ද රචනා වීම.

5) ධර්මාශෝක රජුගේ දායකත්වය නිසා බුදුදහම නව ප්‍රබෝධයක් ලැබී ය. වෙහෙර විහාර විශාල ප්‍රමාණයක් ඉදි විය. කලාශිල්ප දියුණු භාවයට පත්විය.

6) තුන්වෙනි ධර්ම සංගායනාවේ ප්‍රධාන වශයෙන් වැදගත් ම ප්‍රතිඵලය වන්නේ නවරට ධර්මදූත සේවාව යි. භාරතයෙන් බැහැර දහම ව්‍යාප්ත කිරීමට රජතුමා කටයුතු කිරීමයි. ඒ නවරට ධර්ම දූත සේවාව නම්,

1) කාශ්මීර ගන්ධාර දේශය

- නායකත්වය :- මජ්ඣන්තික තෙරුන් වහන්සේ
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- ආසිවිසෝපම සූත්‍රය

ඉන්දියාවේ වයඹදිග පිහිටි මේ ප්‍රදේශය මුල් කාලයේ ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස පැවතුණි. එහෙත් කණිෂ්ක රාජ්‍ය සමයේ සිට සර්වාස්තිවාදී භික්ෂූන්ගේ මධ්‍යස්ථානයක් බවට පත්විය.

2) මහිසමණ්ඩලය

- නායකත්වය :- මහාදේව තෙරුන්
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- දේවදූත සූත්‍රය

ඇතැම්හු මෙය වින්ධ්‍යා පර්වතයට දකුණින් පිහිටි ප්‍රදේශයකැයි කියති. සමහරු වර්තමාන මයිසූර් රාජ්‍යය ලෙස හඳුන්වති.

3) වනවාසී දේශය

- නායකත්වය :- රක්ඛිත තෙරුන් වහන්සේ
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- අනමතග්ග සූත්‍රය

දකුණු ඉන්දියාවේ පිහිටි මෙහි පසුකාලයේ බෞද්ධ ආයතන රාශියක් ම ගොඩනංවන ලද බව පෙනේ.

4) අපරන්ත දේශය

- නායකත්වය :- යෝනක ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- අග්ගික්ඛන්ධෝපම සූත්‍රය

මෙය පිහිටා ඇත්තේ බටහිර ඉන්දියාවේ ය. සුප්‍රසිද්ධ සුප්පාරක (සොපාර) පටුන අපරන්ත දේශයට අයත් එකකි.

5) මහාරට්ඨය

- නායකත්වය :- මහා ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- මහා නාරදකස්සප ජාතකය

වර්තමාන මරාටි දේශය යි.

6) යෝනක රට්ඨය

- නායකත්වය :- මහා රක්ඛිත තෙරුන් වහන්සේ
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- කාලාම සූත්‍රය

ග්‍රීක් රාජ්‍යය යෝනක රට්ඨය සේ හැඳින් වේ. ග්‍රීකයන් යටතේ ඉන්දියාවේ වයඹ දිග පිහිටි ප්‍රදේශයකැයි තවත් අය සඳහන් කරති.

7) හිමවන්ත ප්‍රදේශය

- නායකත්වය :- මජ්ඣිම තෙරුන් වහන්සේ
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- ධම්මචක්කප්පවත්තන සූත්‍රය

හිමවන්ත දේශය යනුවෙන් හඳුන්වන්නේ හිමාලය ප්‍රදේශය යි.

8) ස්වර්ණභූමිය

- නායකත්වය :- සෝණ, උත්තර යන තෙරුන් වහන්සේලා
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- බ්‍රහ්මජාල සූත්‍රය

ස්වර්ණභූමිය ගැන මතභේද කීපයක් ම පවතී. බුරුමය යයි ද තවත් අය සෝණ ගඟ අසබඩ ප්‍රදේශයක් යැයි ද වෙනත් අය බෙංගාලයේ පිහිටි කර්ණ ස්වරණ ප්‍රදේශය යැයි ද කියති.

9) තම්බපණ්ණි ද්වීපය

- නායකත්වය :- මිහිඳු මහරහතන් වහන්සේ
- ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය :- චූල්ලහත්ථිපදෝපම සූත්‍රය

මෙය ශ්‍රී ලංකාව ය යන්න ප්‍රකට කරුණකි.

**අභ්‍යාස**

01. ප්‍රථම ධර්ම සංඝායනාවේ දී ධර්ම විනය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාම සඳහා භාරකළ අයුරු දක්වන්න.
02. ප්‍රථම ධර්ම සංඝායනාවේ ප්‍රතිඵල මොනවාදැයි දක්වන්න.
03. දස අකැප වස්තු නම් කරන්න.
04. තෙවන ධර්ම සංඝායනාවේ ප්‍රතිඵල දක්වන්න.
05. තෙවන ධර්ම සංඝායනාවෙන් පසු ධර්ම දූත කණ්ඩායම් යවන ලද රටවල් නම් කරන්න.


නොමිලේ බෙදා හැරීම පිණිසයි

27 පාඩම

# බුදුසසුන රජ හසුන කළ අධිරජ

අශෝක රජතුමා මෞර්ය වංශයට අයත් පාලකයෙකි. බුදුරදුන්ගේ ධාතු බෙදන අවස්ථාවෙහි පිප්ඵලී වනයෙහි විසූ මෞර්යයන් ද ධාතූන් වහන්සේ ලබා ගත් බව සඳහන් වේ. මෙම වංශය පිළිබඳ නිවැරදි තොරතුරු ලැබෙන්නේ නන්ද රජ පෙළපතින් පසු බලයට පත් චන්ද්‍රගුප්ත නම් මෞර්ය වංශික රජතුමාගේ සිට ය. ඔහු රජ වූයේ ක්‍රි.පූ. 4 වෙනි සියවසේ දී ය.

මෞර්ය රාජ වංශයේ ආරම්භක චන්ද්‍රගුප්ත රජතුමාගෙන් පසු ඔහු පුත් බින්දුසාර රජ විය. දේවීවරුන් දහසය දෙනෙකු සිටි මේ රජුට පුත්‍රයෝ එකසිය එක් දෙනෙකු වූහ. වැඩිමහල් පුත්‍රයා සුමන ය. ධර්මා නම් දේවියගේ පුත්‍රයන් වශයෙන් දැක්වෙන්නේ අශෝක හා තිස්ස යන දෙදෙනා ය. පියා ජීවත් ව සිටිය දී යුවරජ වූ අශෝක අවන්ති රාජ්‍යය පාලනය කළේ ය.

බින්දුසාර රජතුමාගේ අභාවයෙන් පසු අශෝක රජ තනතුරට පත් විය. ඓතිහාසික වාර්තාවන්ට අනුව ඔහුගේ අභිෂේකය සිදු වූයේ පියාගේ මරණයෙන් අවුරුදු හතරක් ඇවෑමෙනි. මෙසේ වන්නට ඇත්තේ සිහසුන සඳහා අරගල ඇති වූ නිසා විය යුතු යි. මහාවංසය සඳහන් කරන අන්දමට තම සොහොයුරන් සමඟ සටන් වැදුණු බවත් තිස්ස සොහොයුරා හැර සෙසු සොහොයුරන් අනූනව දෙනෙකු විනාශයට පත් කළ බවත් පෙනේ. චණ්ඩාශෝක යන නම එනිසා ලැබුණේ යයි සඳහන් කරතත් අභිෂේකයෙන් දහතුන් වැන්නෙහි පිහිටුවන ලද 5 වන ගිරි ලිපියෙහි සොහොයුරන් ගැන සඳහන් වන නිසා එම මතය පිළිගැනීම අපහසු ය. අශෝක රජතුමාගේ දේවීවරුන් අතර විදිසා දේවියගේ දරුවන් ලෙස මහින්ද කුමාරයාගේත් සංඝමිත්තා කුමරියගේත් නම් සඳහන් ය.

පියා සතු රාජ්‍යයෙන් පමණක් සෑහීමකට පත් නොවූ අශෝක අභිෂේකයෙන් අටවන අවුරුද්දේ දී කාලිංග දේශයට විරුද්ධව යුද වැදුණි. මේ වන විට හැට දහසක (60,000) පාබල හමුදාවක් ද හත්සියයක (700) ඇත් හමුදාවක් ද කාලිංගයන් සතු විය. අභිෂේකයෙන් දහතුන් වැන්නේ දී ලියූ 13 වන ගිරි ලිපියෙහි සඳහන් වන අන්දමට මෙම සටන නිසා කාලිංගයෝ එක්ලක්ෂ පනස් දහසක් (1,50,000) සිරභාරයට ද ලක්ෂයක් පමණ (1,00,000) ජීවිතක්ෂයට ද පත් වූහ. තවත් බොහෝ අය විනාශ වූහ. අන්තිමේ දී කාලිංග දේශය සියතට ගත් අශෝක එහි පාලනය යුව රජෙකු වෙත පැවරී ය.

අශෝක රජතුමා එතෙක් ඉන්දියාවේ කිසිදු පාලකයෙකුට අයත් නොවූ තරම් රාජ්‍යයන් යටත් කොට ගත්තේ ය. උතුරින් හිමාලය දක්වාත් දකුණින් ස්වර්ණගිරිය ඇතුළු ක්‍රිෂ්ණා, තුංගභද්‍රා නදී දක්වාත් බටහිරින් සුනාපරන්තය, සෞරාෂ්ට්‍රය, බටහිර අවන්තිය ඇතුළු අරාබි මුහුදේ නැගෙනහිර වෙරළ දක්වාත් නැගෙනහිරින් බ්‍රහ්මපුත්‍ර නදිය දක්වාත් වයඹින් ගාන්ධාරය ඇතුළු ප්‍රදේශයත් සීමා කොට අතිවිශාල රාජ්‍යයක් අශෝක රජු යටතේ පැවතුණි.

## අශෝක රජතුමා ශ්‍රේෂ්ඨ අධිරාජයෙකු වූ අයුරු

බු.ව. 218 දී පාටලීපුත්‍ර නගරය අගනුවර කොට ගෙන බලයට පත් අශෝක රජතුමා බු.ව. 255 දක්වා පාලනය ගෙන ගියේ ය. මේ කාලය තුළ අනුගමනය කළ විවිධ ක්‍රියාවන් නිසා ලෝක ඉතිහාසයේ අශෝක අධිරාජයා ශ්‍රේෂ්ඨ පාලකයෙකු බවට පත්වේ.

යුදයෙන් රටවල් ජයගත හැකිව තිබිය දී, දිග්විජය අතහැර ධර්ම විජයට සැරසුන වෙනත් අධිරාජයකු ගැන ලෝක ඉතිහාසයේ සඳහන් නොවේ. අවිබලයෙන් ලොව දිනීමට ගිය නැපෝලියන්, ඇලෙක්සැන්ඩර් හා හිට්ලර් වැනි අයගේ ජීවිත කෙළවර වූයේ ද රණකාමීත්වයෙන් කටයුතු කරද්දී ය. අශෝක දහම් විජයට පිළිපන්නේ උසස් රණ කාමීත්වයක් ද ඇතිව තිබිය දී බව කාලිංග සටන සාක්ෂි දරයි. මෙය අශෝක අධිරාජයාගේ ශ්‍රේෂ්ඨත්වය කියාපාන කරුණකි.

මෞර්ය පෙළපතේ ආරම්භකයා වූ චන්ද්‍රගුප්ත කළ සටන් නිසා රාජධානි කිහිපයක් ම ඔහු යටතට පත් ව තිබිණි. චන්ද්‍රගුප්ත සහ එයින් පසු බලයට පත් බින්දුසාර රජුගේ අවදියේ ගොඩනගා තිබූ රාජ්‍යය තවදුරටත් පුළුල් කර ගැනීම අශෝක රජු සතු වගකීමක් විය. රාජ්‍යය ලැබීමට පෙර තක්ෂිලා හා අවන්ති ප්‍රදේශවල ඔහු ගෙන ගිය පාලනය නිසා ඔහුට රාජ්‍ය කටයුතු ගැන පරිචයක් ලැබී තිබුණි. මෙය ද උපකාරී කොට ගත් අශෝක බලයට පත් මුල් අවදියේ දී ම විශාල රාජ්‍යයක් ගොඩනැගීමට සමත් විය.

අශෝක රජතුමා උසස් පාලකයෙකු බවට පත් වීමට තවත් හේතුවක් වූයේ ඔහු අනුගමනය කළ මධ්‍යස්ථ ප්‍රතිපත්තියයි. ඔහුගේ ම සෙල්ලිපිවල සඳහන් වන අන්දමට කුලය, ධනය, බලය, ආදී කිසිදු භේදයක් නොමැතිව සෑම දෙනාට ම සමාන ලෙස නීතිය ක්‍රියාවෙහි යෙදවිණි.

ඔහුගේ ආගමික ප්‍රතිපත්තිය ද මධ්‍යස්ථ ය. ශාන්ත පාවුළු සාන්තුවරයාත් රෝමයේ මාකස් යුරේලියස් රජතුමාත් ආගම් ප්‍රචාරය කිරීම නිසා ඉතිහාසයෙහි වැදගත් තැනක් හිමිකොට ගෙන තිබේ. එහෙත් ඔවුහු වෙනත් ආගම් මර්දනය කරමින් තම ආගම ප්‍රචාරය කළ හ. අශෝක රජතුමා භාරතයේ පැවති එකදු ආගමක් හෝ රාජ්‍ය බලය යොදා මැඩ පැවැත්වීමට පියවර නොගත්තේ ය.

ඉන්දියාවේ මහා අක්බාර් රජු, කොන්ස්ටැන්ටයින් වැනි අය ආගමික ප්‍රතිසංස්කරණය ඇති කිරීමට උත්සාහ ගන්නා ලද්දේ තම බලය තහවුරු කරගැනීම සඳහා ය. බලය තහවුරුව තිබිය දී ම අශෝක රජතුමා ධර්මය ප්‍රචාරය කිරීම ඉහත සඳහන් අයට වඩා කැපී පෙනෙන ලක්ෂණයකි.

ජන ජීවිතයට සිරිත් විරිත්, ගුණධර්ම ආදිය සාර්ථකව සම්බන්ධ කළ පාලකයෙකු අශෝක හැර වෙනත් නොමැති තරම් ය. ඔහු බුද්ධ ධර්මයේ සඳහන් යහපත් ගුණ ධර්ම ජනතාවට පුරුදු පුහුණු කළේ ය.

ඉහත සඳහන් කරුණු අනුව එච්.ජී. වෙල්ස් (The Outline of History) සඳහන් කරන අන්දමට අශෝක ලෝකයේ රජවරුන් අතර පුදුම පුද්ගලයෙකු පමණක් නොව අන් අයෙකුට සමකළ නොහැකි ශ්‍රේෂ්ඨත ම පුද්ගලයා බවට ද පත් වේ.

### අශෝක ධර්මය

අශෝක රජතුමා උපතින් ජෛනයකි. කාලිංග සටනින් සිදු වූ මහා මනුෂ්‍ය ඝාතනය ගැන ආපසු හැරී බැලූ ඔහු මහත් සංවේගයට පත් විය. දිනපතා රජ මැදුරේ දන් වැළඳූ බමුණු, තීර්ථක ආදීන්ගේ අසංවර ගති කෙරේ අශෝක රජු තවත් පැත්තකින් කළකිරීමට පත්ව සිටියේ ය. මේ අතර රජු තම වැඩිමහල් සහෝදරයා වූ සුමන කුමාරයාගේ පුත් නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ සන්සුන් ගමන දැක පැහැද පසුව බුදුදහම වැළඳ ගත්තේ ය.

අශෝක රජතුමා ලියන ලද භාබ්‍රෑ, කෝසම්බි, සාරානාත්, මස්කි ආදී ශිලා ලේඛනයන්ට අනුව අශෝක රජතුමා බුදුදහම වැළඳ ගත් බව ස්ථිර වේ. එහෙත් ඔහු ප්‍රචාරයට පත් කළේ බුදුදහමෙහි සඳහන් කර්මය, නිර්වාණය, පුනරුප්පත්තිය වැනි ගැඹුරු ධර්මයන් නොවේ. මව්පියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරුන්ට සැලකීමේ වැදගත්කම, මහණ බමුණන් පිදීමේ අගය, දාසි දස් කම්කරු ආදීන්ට කළයුතු සංග්‍රහ, සතුන්ට කරුණාව දැක්වීම, අනුන්ගේ හිත සුව පිණිස ක්‍රියාකිරීම, සත්‍යවාදී බව, අනලස්ව කටයුතු කිරීම ආදිය ය

ඒ අනුව සලකා බලන විට හොඳ මනුෂ්‍යයෙකු වීමට අවශ්‍ය ආචාර ධර්ම රාශියකුත් උසස් මනුෂ්‍යයෙකු සේ ජීවත් වීමට අවශ්‍ය කරන ජීවන ක්‍රමයකුත් ඔහුගේ ධර්මය සේ ප්‍රචාරය කළ බව පෙනේ. මේ නිසා අශෝකයන්ගේ ධර්මය ජනතාව සදාචාරාත්මක කිරීම සඳහා ඉදිරිපත් කළ නීති මාලාවකැයි සමහරු කියති. එහි ඇති කැපී පෙනෙන ලක්ෂණය නම් ඕනෑම ආගමක් අදහන අයෙකුට පිළිගැනීමට හැකිවීම යැයි මහාචාර්ය බරුවා මහතා සඳහන් කරයි. එක් රටක් පමණක් නොව මුළු ලෝකය ම එක්සත් ව සාමකාමීව අභිවෘද්ධිදායකව තබා ගැනීමට වුව ද අශෝක ධර්මය පොහොසත් වෙයි.

### අශෝක ධර්මයට බුදුදහමින් ලත් එළිය

හොඳ සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය සමාජ ධර්ම පිළිබඳ ව සොයන්නකුට බුදු දහමින් තරම් එළියක් වෙනත් කිසිදු ආගමකින් නොලැබේ. සිඟාලෝවාද සූත්‍රය පමණක් වුවත් හරිහැටි පිළිපැදීමෙන් යහපත් සමාජයක් ගොඩනැගිය හැකි ය. මෙවැනි උපදෙස් ඇතුළත් සූත්‍ර කීපයක් ම බෞද්ධයා අතර ප්‍රචලිත ය.

අශෝක රජතුමා ප්‍රචාරය කළ ධර්මය සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කළ විවිධ දහම් කොටස් ඔහුට ප්‍රයෝජනවත් වූ බව පැහැදිලි කරුණකි. තීර්ථකයන් සසුනෙන් නෙරපීමට පෙර සත් දිනක් මුළුල්ලේ අශෝක රජතුමා ධර්මය උගත් බව ප්‍රකට ය. එයින් පසුව ද මොග්ගලීපුත්තතිස්ස තෙරුන් නිති ඇසුරු කළාට සැක නැත. රජතුමා සංඝයා වහන්සේ හමුවට ගිය බව ගුජරාටි, බ්‍රහ්මගිරි, මස්කි වැනි සෙල්ලිපිවල සඳහන් වේ. මෙසේ සංඝයා නිරන්තරයෙන් ඇසුරු කිරීමෙන් ධර්මය පිළිබඳ ව පුළුල් අවබෝධයක් රජුට ලැබුණි.

සත්ත්වයා කෙරෙහි මෛත්‍රිය දැක්වීම, පරාර්ථ සේවය, පිදිය යුත්තන් පිදීම, මහණ බමුණන් පිදීම සහ සැලකිලි දැක්වීම, නෑ හිත මිතුරන්ට සැලකීම, නිවැරැදි ව ජීවත් වීම වැනි කරුණු ගැන සිගාලෝවාද, මංගල, ව්‍යග්ඝපජ්ජ ආදී සූත්‍රයන් ගෙන් අශෝක රජතුමා ජනතාවට උපදෙස් දී ඇත. 'ගිහි විනය' නමින් බෞද්ධ සාහිත්‍යයේ හැඳින්වෙන එම ගුණ ධර්ම ගැන අශෝක රජතුමා නිතර සඳහන් කොට ඇත. ඔහු ජනතාව සඳහා දක්වා ඇති කරුණු සමූහය සම්පූර්ණයෙන් ම බුද්ධ දේශනාවට සමාන වනවා මිස එකදු කරුණකින් හෝ වෙනස් කමක් ඇති නොවන බව පැහැදිලි ය. මේ අනුව නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ හමුවේ සිට ලබාගත් බුදුදහමේ ආභාසය අශෝක ධර්මය කෙරෙහි වෙන් නොකළ හැකි සේ බලපා ඇති බව පිළිගත යුතු වේ. අශෝක ප්‍රචාරය කළ ධර්මය බුද්ධ ධර්මය යයි. රායි චෞදරී, බණ්ඩකාර් වැනි ඉතිහාසඥයන් විසින් සඳහන් කරනුයේ ඒ නිසා විය යුතු ය.

### රාජ්‍ය පාලන ධර්මයක් වශයෙන් අශෝක ධර්මයේ ඇති සර්ව සාධාරණත්වය

බුද්ධ ධර්මයෙහි වැදගත් තැන් ගරුකොට ගත් අශෝක රජතුමා එම ඉගැන්වීම් රාජ්‍ය පාලන ධර්මයක් බවට පත් කොට ගත් බව පෙනේ. අශෝක රජතුමා පාලකයෙකු තුළ තිබිය යුතු දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව යන සංග්‍රහවස්තු හතර ම ජනතාව උදෙසා ක්‍රියාත්මක කළේ ය. මුළු මහත් ජනතාව තමාගේ දරුවන්යැයි **(සවෙ මුනිසා මම පජා)** ලොවට හඬගා කීවා පමණක් නොව එම අදහස අර්ථවත් වන ලෙස පාලනය ද මෙහෙය වී ය.

සියලු සතුන් කෙරෙහි එක හා සමාන ලෙස මෛත්‍රිය සහ කරුණාව පැතිර වූ පාලකයෙකු වශයෙන් අශෝක රජු නම් කළ හැකි ය. ඔහු පොදු ජනයාට යහපත ගෙනදෙන ගස් ද බෙහෙත් පැලෑටි වර්ග ද රෝපණය කර වී ය. පැන් පොකුණු ඉදිකර වී ය. මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණක් නොව තිරිසන් සතුන් උදෙසා ද ආරෝග්‍ය ශාලා සැදවී ය.

ගුණධර්ම රැකීමේ දී තමා පළමු කොට සුදුසු ගුණයෙහි පිහිටුවීම අශෝක රජතුමාගේ කැපී පෙනෙන ලක්ෂණයකි. උදාහරණයක් වශයෙන් සතුන් කෙරෙහි දැක්වූ දයාව පෙන්විය හැකි ය. මුල් කාලයේ දිනපතා ආහාරය සඳහා රජ මැදුරෙහි සිය ගණන් සතුන් මැරීම ප්‍රතිපත්තිය වී තිබුණි. අශෝක රජතුමා අනුක්‍රමයෙන් එය අඩුකර ගෙනවුත් මොණරුන් දෙදෙනෙකුත් එක් මුවෙකුත් දක්වා අඩු කොට අන්තිමේ එසේ සතුන් මැරීම සම්පූර්ණයෙන් නතර කළේ ය. මෙසේ සියලු සතුන්ට ම අභය දානය දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ රජතුමා අනතුරුව සතුන් නොමරන මෙන් ජනතාවගෙන් ඉල්ලී ය. සතුන් මරා යාග නොකරන ලෙස ද දැන්වී ය. සතුන් වසන කැලෑ ගිනි තැබීම ද තහනම් කරන ලද්දේ පොදුවේ සතුන් වෙත පෑ දයාව නිසා ය. සත්ත්ව යාග පවත්වන සමහර ආගම්වලට මෙම නීතිය තරමක අවහිරයක් ව පෙනෙතත් පොදුවේ සලකන විට සියලු සතුන් කෙරෙහි දයාන්විතව කටයුතු කිරීමක් බව පිළිගත යුතු වෙයි.

භික්ෂූන් වහන්සේ අතර පවා සමගිය සහ සමාදානය ඇති කිරීමට අවශ්‍ය ය පියවර ගැනීම අශෝක රජු කළ තවත් ක්‍රියාවකි. භික්ෂූන් වහන්සේ අතර භේදකාරී ව ක්‍රියා කරන්නවුන් සුදුවත් හඳවා සසුනෙන් නෙරපී ය. යහපත් සංඝ සමාජයක අය විසින් දැනගත

යුතු ධර්ම කොටස් පිළිබඳ ව අවබෝධයක් තිබූ රජතුමා ඒවා දැනගැනීමේ අගය සංඝයාට මතක් කර දුනි. විශේෂයෙන් අනාගත භය සූත්‍රය, අරියවංස සූත්‍රය, සාරිපුත්ත සූත්‍රය, මුනි සූත්‍රය යන සූත්‍ර ධර්ම නිතර සිහියේ තබාගන්නා ලෙස ලිපි මගින් සංඝයා වහන්සේගෙන් ඉල්ලා සිටියේ ය.

පිදිය යුත්තන් පිදීමේ අගය පෙන්වා දුන් අශෝක රජු තමා ද එම ගුණය උසස් කොට සැලකී ය. සේවය සඳහා යොදා ගන්නා දැසිදස් කම්කරු ආදීන් පිළිබඳ ව විශේෂයෙන් සඳහන් කළ ඔහු ඒ අයට කළයුතු සංග්‍රහ ආදිය නොඅඩුව කරන මෙන් ඉල්ලී ය. අනුන් නොරැවටීම, වංචා නොකිරීම ජනතාව තුළ තිබිය යුතු ගුණධර්ම ලෙස දක්වා ඇත.

## ධර්ම ප්‍රචාරක කටයුතු

අශෝක රාජ්‍ය සමයෙහි තරම් බුදුදහම ලොවෙහි ව්‍යාප්ත වූ වෙනත් පාලන කාලයක් නැති තරම් ය. ඔහුගෙන් සිදු වූ ආගමික සේවය වෙනත් කිසිදු පාලකයෙකුගෙන් නොවූයේ යැයි සලකනුයේ එහෙයිනි. මහාවංසයෙහි සඳහන් කරන අන්දමට 84,000ක් ධර්මස්කන්ධය උදෙසා 84,000ක් වෙහෙර විහාර තුන් වසරක් තුළ සාදා නිම කරන ලදී. අශෝකාරාමය වැනි සුවිසල් ආරාමයන් හා සාංචි මහා ස්තූපය වැනි අහස් කුසට විහිදී ගිය සැයනුත් ඒ අතර දක්නට ලැබේ. හියුංසාං සංචාරක භික්ෂූන් වහන්සේ වැනි විදේශීය ලේඛකයෝ අශෝක ඉදිකළ බෞද්ධ පූජනීය ස්ථාන පිළිබඳ ව වර්ණනාත්මක ව කරුණු දැක්වූහ.

රජතුමා වෙනුවෙන් ආගමික කටයුතු සිදුකිරීම සඳහා ධර්ම මහාමාත්‍ර නමින් ඇමතිවරුන් පත් කළ බව දැක් වේ. අභිෂේකයෙන් 13 වෙනි වර්ෂයේ දී පත්කළ මේ අය පස් වසරකට වරක් සෑම ප්‍රදේශයක ම සංචාරය කළ බව පැහැදිලි වේ. දැහැමි නීති රීති පැනවීම පොදුවේ සෑම ආගමක් අතර ම මිත්‍රත්වය ඇතිකිරීම, රජු වෙනුවෙන් කළ යුතු ආගමික කටයුතු සිදුකිරීම වැනි දේ ඔවුන්ට භාර වූ කාර්යයන්ගෙන් කිහිපයකි. ඒ ඒ ප්‍රදේශවල කටයුතු කිරීමේ දී මහාමාත්‍ර, රජ්ජුක යන නිලධාරීන්ගේ සහාය ධර්ම මහාමාත්‍රවරුන්ට ලැබුණි. ආගමික කටයුතු සඳහා උසස් ඇමතිවරුන් පත්කළ බව ලෝක ඉතිහාසයේ සඳහන්වන ප්‍රථම අවස්ථාව මෙය යි.

ගුණධර්ම වර්ධනයට අවශ්‍ය විවිධ පියවර ගත් අශෝක රජතුමා එයින් එකක් වශයෙන් වන්දනාගමන් හි යෙදීම ක්‍රියාත්මක කළ බව පෙනේ. අභිෂේකයෙන් 10 වන වර්ෂයේ දී ශ්‍රී මහා බෝධියත් 20 වෙනි වර්ෂයේ දී ලුම්බිණියත් වැඳීමට ගිය බව සඳහන් කොට තිබීම එයට නිදසුනකි. ජනතාව ධාර්මික තත්ත්වයට පත්කිරීමට මෙම ක්‍රියාවන් හේතු වූවාට සැක නැත.

ධර්ම ප්‍රචාරය සඳහා අනුගමනය කළ ඉතා වැදගත් අංගයක් වූයේ ධර්ම කරුණු ඇතුළත් ශිලා ලේඛන ලියවා වැඩි වශයෙන් ජනයා ගැවසෙන මංසන්ධි අසල පිහිටු වීමයි. ඒ ඒ ප්‍රදේශවල ජනතාවගේ භාෂාවෙන් ඉතා ලිහිල්ව ලියූ මෙම ලිපි කියවීමෙන් රට වැසියා සුමගට යොමු වූවාට සැක නැත.

මොග්ගලීපුත්තතිස්ස තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ ධර්ම සංගායනාවෙහි ප්‍රධාන දායකත්වය දැරූ අශෝක අධිරාජයා එයින් අනතුරුව රටවලට ධර්ම දූතයන් වහන්සේලා පිටත් කරවීමට අවශ්‍ය සහාය දුන්නේ ය. ලංකාවට වැඩම වූ මිහිඳු මහරහතන් වහන්සේත් සංඝමිත්තා තෙරණියත් සුමන සාමණේරයන් වහන්සේත් පිළිබඳ ව සලකන විට සම්බුදුසසුන සඳහා සේවය කිරීමට රජ පවුලේ ම අය යොදාගත් ආකාරය ප්‍රකට වෙයි.

අශෝක රජතුමා යටතේ නොපැවති ඉන්දියාවේ සමහර රාජ්‍යයන් වෙත ද බෞද්ධ පණිවුඩය යැවීමට පියවර ගත් බව සෙල්ලිපිවල සඳහන් වෙයි. සොළී රාජ්‍යය කේරළ පාණ්ඩ්‍ය රාජ්‍යය එයට නිදසුන් ය.

තෙවෙනි ධර්ම සංගායනාවෙන් පසු ධර්ම දූතයන් වහන්සේලාගේ මාර්ගයෙන් ධර්ම පණිවුඩය පිටත් කොට යැවූ බව කලින් ද සඳහන් විය. ඒ හැරුණු විට අශෝක රජතුමා විසින් ම රටවල් කිහිපයක රජුන් වෙත තානාපතිවරුන්ගේ මාර්ගයෙන් ධර්ම පණිවුඩය යැවූ බව දැක් වේ.

එම පාලකයන් නම්:-

1. සිරියාවේ පාලකයා වූ II ඇන්ටියෝකස් (ක්‍රි.පූ. 261-246) රජු
2. ඊජිප්තුවේ II ටොලමි පිලඩෙල්පස් (ක්‍රි.පූ. 285-247) රජු
3. මැසිඩෝනියාවේ ඇන්ටිගොනස් ගොනටස් (ක්‍රි.පූ. 272-230) රජු
4. එපිරස්හි ඇලෙක්සැන්ඩර් (ක්‍රි.පූ. 272-255) රජු

මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩමවීමට පෙරත් ඇමතියන් මගින් දෙවන පෑතිස් රජුට ද තෙරුවන් සරණ යන ලෙස පණිවුඩයක් එවීමට අශෝක රජු ක්‍රියා කළේ යැයි මහාවංසයෙහි සඳහන් වේ. ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ගෙන සංඝමිත්තා තෙරණිය මෙරටට එවීම සඳහා ද රජතුමාගෙන් ලැබුණ සහාය විශාල ය. මේ අනුව ඈත රටවලට පවා බුද්ධ ධර්මය ව්‍යාප්ත කිරීමට කටයුතු කළ කෙනෙකු වශයෙන් අශෝක රජතුමාට ඉතිහාසයේ ලැබෙනුයේ වැදගත් තැනකි.

**අභ්‍යාස**

01. අශෝක රජතුමා ශ්‍රේෂ්ඨ අධිරාජ්‍යයෙකු වන්නට බලපෑ සාධක නම් කරන්න.
02. අශෝක රජතුමා බුදු දහම වැළඳ ගත් බව තහවුරු කෙරෙන ශිලාලේඛන 4ක් නම් කරන්න.


නොමිලේ බෙදා හැරීම පිණිසයි

28 පාඩම

# භික්ෂූන් වහන්සේගේ ආගමික මෙහෙවර

## පරිත්‍රාණ දේශනා සහ දොරකඩ අස්න දේශනා

### පිරිත යන වචනයේ අර්ථ විවරණය

පරි + පූර්ව √ත්‍රා ධාතුවෙන් නිපන් සංස්කෘත පරිත්‍රාණ, පාලි පරිත්ත යන පදයන්ගෙන් බිඳී සැකසුණු සිංහල පිරිත් යන පදයේ අර්ථය ආරක්ෂාව යන්න යි. මිනිසාගේ සිතුම් පැතුම්වලට බාධා කරවන නොයෙක් මාදිලියේ අදෘශ්‍යමාන බලවේග, අපල උපද්‍රව ආදියෙන් ආරක්ෂාව සැලසීම පිරිතේ ප්‍රධාන ම කාර්යය යි. අටුවාචාරීන්ට අනුව **"පරි සමන්තතො තායති රක්ඛතීති පරිත්තං" "අන්තරායං පරිහරන්තං තායතීති පරිත්තං" පරිතො වා සබ්බුපද්දවතො තායතීති පරිත්තං"** යනුවෙන් හාත්පසින් ආරක්ෂා කරයි. අන්තරාය දුරු කරමින් ආරක්ෂා කරයි. සියලු ම උපද්‍රවවලින් ආරක්ෂා කරයි. යන අර්ථ පිරිත යන වචනයේ ඇතුළත් වී තිබේ.

### පිරිත වර්ගීකරණය

පිරිත් දේශනාව සඳහා ගතවන කාලය අනුව පිරිත් වර්ග කොට තිබේ.

01. වරු පිරිත
02. තුන්වරු පිරිත
03. තිස්පැයේ පිරිත
04. තිස්පැය තුනේ පිරිත
05. තිස්පැය පහේ පිරිත
06. තිස්පැය හතේ පිරිත
07. සති පිරිත

ආදී වශයෙනි.

### පිරිත සඳහා ආරාධනා කිරීම

පිරිත සඳහා ආරාධනාව කීප අවස්ථාවක දී සිදුකරනු ලබයි. මූලික වශයෙන් පිරිත දේශනා කරගනු කැමති අය විසින් අදාළ විහාරස්ථානයට ගොස් එහි නායක ස්වාමීන් වහන්සේට දැහැත් වට්ටියක් පිළිගන්වා පිරිත සඳහා ආරාධනා කොට දිනයක් වෙන්කර ගැනීම කළ යුතු ය. පිරිත් දේශනාව සඳහා මහා සංඝරත්නය වැඩමකළ පසු දැහැත් වට්ටියක් පිළිගන්වා මෙලොව ආරක්ෂාව පිණිසත් පරලොව පිං පිණිසත් මෙතැන් පටන් අප කෙරෙහි අනුකම්පාවෙන් පිරිත් දේශනා කරන ලෙස ආරාධනා කරනු ලැබේ. එහිදී තිස්පැය, තුන්තිස්පැය, ආදී වශයෙන් සඳහන් කොට ආරාධනා කිරීම සිදුකෙරේ. තව ද එම ආරාධනා වාක්‍යය මහා සංඝරත්නය විසින් දායක පින්වතුන් ලවා ප්‍රකාශ කරවනු ලබයි. තිස්පැය හතේ පිරිතක දී සහ සති පිරිතක දී මෙම ආරාධනාවෙන් පසුව පිරිතේ තේවාව භාර නායක ස්වමීන්ද්‍රයන් වහන්සේ විසින් දායක පිරිසෙන් ප්‍රශ්න කිහිපයක් අසනු ලබයි.

- මේ පිරිත අවසාන වන්නේ කවදා ද?
- සූත්‍ර දේශනාව පවත්වන්නේ කෙදින ද?
- විහාරස්ථානය අයත් පළාත, දිස්ත්‍රික්කය, කෝරළය, පත්තුව කුමක් ද?
- දොරකඩ අස්න ප්‍රකාශය සඳහා දරුවකු සූදානම් කර තිබේ ද?

ආදී වශයෙනි. අනතුරුව දොරකඩඅස්න දේශනා කරන දරුවා මහා සංඝරත්නය වෙත දෙමාපියන් විසින් භාරදීම සිදුකරනු ලබත්.

පිරිත් දේශනාව ආරම්භ කිරීමට පළමුව මහා සංඝරත්නය විසින් ''විපත්ති පටිබාහාය... ආදී ගාථාත්‍රයක් දායකයන් ලවා ප්‍රකාශ කරමින් පිරිත් දේශනා කිරීමට ආරාධනා කිරීම තවත් එක් ආරාධනාවකි. සත්කෝරළය ප්‍රදේශයේ දී මෙම චාරිත්‍රය සිදු කරන්නේ පන්සිල් ගැනීමට ප්‍රථමයෙනි. සෙත් පිරිත්, වරු පිරිත් දේශනාවල දී මෙ ගාථාත්‍රයෙන් ආරාධනා කිරීම සිදු නොවේ.

### පිරිත් මණ්ඩපය

පින්කමට දින කිහිපයකට පෙර පිරිත් මණ්ඩපය ඉදිකරන අතර එහි දී චාම් බව මෙන් ම සෞන්දර්ය පිළිබඳව ද සැලකිලිමත් වේ. සතර දිශාවට දොරටු සතරක් තබා ඒ දෙපස පුන්කලස් තබා පහන් දල්වීම සිදු කෙරේ. සාමාන්‍යයෙන් ආසන දොළහක් පැනවීමට අවශ්‍ය තරම් ඉඩපහසුකම් ඇති ලෙස ඉදි කරන පිරිත් මණ්ඩපය බුද්ධ මන්දිරයක් බඳු ය.

පිරිත් පුරණ ස්වාමීන් වහන්සේලා දෙනමට වැඩ සිටින්නට පනවන ආසන දෙකට පිටුපසින් අතු කීපයක් සහිත පුවක් පැළයක් තබා රාජගහ සකසනු ලැබේ. එම යුගපුටවට එලන ලද සුදු ඇතිරිල්ලේ ඉහළ කෙළවර අවානක හැඩයෙන් පුවක් පැළයට බැඳීමෙන් එය නිර්මාණය කෙරේ. පොල්මල් හනස්නෙන් ඉරාගත් තීරුවලින් රවුම් දරඬුවක් මෙන් සකසාගත් වළයම ප්‍රධාන පිරිත් හුය බැඳීම සඳහා ය. පිරිත් මණ්ඩපයේ උඩට වියන් බැඳ පුවක් මල් කිණිති බුලත්කැන්, නාදළු, බෝකොළ ආදිය එල්ලනු ලැබේ. මණ්ඩපයේ දොරටුව ඉදිරිපස කුටි හතරකින් යුතු ප්‍රධාන මල් පැළයක් සතරවරම් දෙවියන් උදෙසා ය. ගම්භාර දෙවියන් උදෙසා සාමාන්‍ය ප්‍රමාණයේ මල් පැලකි. එහි මල් පහන් ආදිය තැන්පත් කරන්නේ කෙසෙල් කොළයක් ඇතිරීමෙන් පසුව ය. මණ්ඩපය මධ්‍යයේ මේසයක් තබන අතර ප්‍රධාන දොරටුවෙන් ඇතුළුවන විට වම්පස මුල්ලේ ධාතූන් වහන්සේ තැන්පත් කිරීමට ආසනයක් තනනු ලැබේ. ඇතැම් පළාත්වල සධාතුක කරඬුන් වහන්සේ තැන්පත් කරනු ලබන්නේ මණ්ඩපය මධ්‍යයෙහි ඇති මේසය මත උස්ව තැනූ ආසනයක ය.

### තිස්පැයේ පිරිත

තිස්පැයක් යනු පුරා රාත්‍රියකි. සවස 6 සිට උදෑසන 6 දක්වා කාලය සිංහල ක්‍රමය අනුව තිස්පැයකි. එවන් කාල පරිච්ඡේදයක් පුරා පවත්වන පිරිත තිස්පැයේ පිරිත වශයෙන් හඳුන්වයි. මේ සඳහා මූලික වශයෙන් ගෙහිමියා විසින් විහාරස්ථානයට ආරාධනා කොට සුදුසු දිනයක් වෙන්කර ගෙන, ගේ දොර පිරිසිදු කොට පිරිත් මණ්ඩපයක් සකස් කොට

මූලික කරුණු සම්පූර්ණ කරගත යුතු වේ. පිරිත් දේශනාව පවත්වන දිනයේ සිදුකරන ක්‍රියා පිළිවෙළ නම්,

- ආරාධිත විහාරස්ථානයට ගොස් ගිලන්පස බුද්ධ පූජාව පවත්වා දෑහැත් ගිලන්පස පිළිගන්වා මහා සංඝරත්නය නියමිත වේලාවට සධාතුක කරඬුන් වහන්සේ හා පිරිත් පොත් වහන්සේ පෙරටු කොට පුද පෙරහැරින් වැඩම වීම. මේ සඳහා සුදු ඇඳගත් දෙදෙනෙකු සුදු ලේන්සු හෝ තුවා ඇතිව සිටිය යුතු අතර වියන ඇල්ලීමට හතරදෙනෙකු අවශ්‍ය වේ.

- පා ධෝවනය කොට සුදු පාවඩ මතින් මහාසංඝරත්නය නිවසට වැඩමවීම හා ගිලන්පස පිළිගැන්වීම.

- පිරිත් මණ්ඩපයට මහා සංඝරත්නය වැඩම වීම.

- ගිහි පිරිස පන්සිල් සමාදන් කරවීම හා දෑහැත් වට්ටියක් පිළිගන්වා පිරිතට ආරාධනා කිරීම සිදු කෙරෙයි. මෙම චාරිත්‍රය සත්කෝරළය, සතරකෝරළය ප්‍රදේශවල සිදුවන අතර අනෙක් ප්‍රදේශවල දෑහැත් වට්ටිය පිළිගන්වා ආරාධනා කිරීම මූලිකව ම සිදුකෙරෙයි.

- පිරිත් අනුශාසනාව, මෙහි දී පිරිතේ ඇති වටිනාකම හා ආනිසංස පිළිබඳ ව හැඳින්වීමක් සිදුකරනු ලබයි.

- පහන් දැල්වීම, මෙහි දී මණ්ඩපය වටා ඇති පුන්කළස්වල පහන් දැල්වීම සිදුකෙරේ. මණ්ඩපය ඉදිරිපිට මිදුලේ පහන් පැළ සකසනු ලබන්නේ සතරවරම් දෙවියන් හා ගම්භාර දෙවියන් වෙනුවෙනි. පහන් පැළ දල්වා හඳුන්කූරු දල්වා, මල් පූජා කොට, ලදපස්මල් ඉස, හේවිසි වාදනය කරනු ලබයි.

- සියනෑ කෝරළ ප්‍රදේශයේ දී, කොළඹ ප්‍රදේශයේ දී පහන් දැල්වීමෙන් අනතුරුව පන්සිල් සමාදන් කරවීම, පිරිතට ආරාධනා ගාථා කියවීම සිදුකරනු ලබයි. එහෙත් දකුණු ප්‍රදේශය, සත්කෝරළය, සතරකෝරළය, උඩරට ප්‍රදේශ යන සෑම පළාතක දීම ප්‍රථමයෙන් ම පන්සිල් සමාදන් කරවා ගිලන්පස බුද්ධපූජාව පැවැත් වීම සිදු කරති.

දේවාරාධනාව

- **පිරිත් පේ කිරීමෙන් පිරිත ආරම්භ කිරීම** මෙහි දී නමස්කාර පාඨය, තිසරණය වන්දනා කිරීම හා ජයමංගල ගාථා සජ්ඣායනය කොට යංදුන්නිමිත්තං, දුක්ඛප්පත්තා ච ... සබ්බේ බුද්ධා .. ගාථා සජ්ඣායනා කරනවිට ධාතු කරඬුව, රාජගහ, පිරිත් පැන් කළය සම්බන්ධකර ඇති පිරිත් හුය, තද කිරීම සිදුකරනු ලබයි. දකුණු පළාතේ පිරිත් දේශනාවල පේ කිරීම සඳහා ඉහත දේශනාවලට අමතරව අවිජ්ජා පච්චයා ... ආදී පාඨයන් භාවිත කරයි. උඩරට ප්‍රදේශයේත් රාමඤ්ඤ නිකායික භික්ෂූන් වහන්සේත් පිරිත් පේ කිරීම සිදුකරන්නේ නැත.

- මඟුල් බෙර වාදනය හා හේවිසි වාදනය සිදුකිරීම් තුන් වටයක් සිදු කරයි. එහෙත් දකුණු පළාතේ මෙහි දී වාදනය කරන්නේ මඟුල් බෙරය පමණ යි.

- **මහ පිරිත ආරම්භ කිරීම**, මේ සඳහා තුන් සූත්‍රය හා මහා ජයමංගල ගාථා භාවිත කරයි. මණ්ඩපයේ වැඩ සිටින මහා සංඝරත්නය පිරිත් හුය අතට ගැනීමත් ඊට සම්බන්ධ ව පිරිත් නූල් ගිහි පිරිස අතට ලබාදීමත් මෙහි දී සිදුකරනු ලබයි.

- **යුග දේශනා පැවැත්වීම**, පිරිත් පොතේ නමස්කාර පාඨයේ පටන් ඉසිගිලි සූත්‍රය අවසානය දක්වා

- මධ්‍යම රාත්‍රිය ධම්මචක්කපවත්තන සූත්‍රය ඇතුළත් සූත්‍ර දේශනා හතක් දේශනා කිරීම.

- හතරදෙනා වහන්සේ නමක් බැගින් වැඩ හිඳගෙන ආටානාටිය සූත්‍ර දේශනාව, හමාර දේශනාව වශයෙන් දේශනා කිරීම

- අළුයම සෙත් පිරිත් දේශනා පවත්වා පන්සිල් සමාදන් කරවා පිං අනුමෝදන් කිරීම.

- පිරිත් පැන්, පිරිත් නූල් ලබාදීම.

**තිස් පැය තුනේ හා තිස්පැය පහේ පිරිත**

මෙහි දී තිස් පැයේ පිරිතට වඩා යම් යම් වෙනස්කම් දක්නට ලැබේ. මූලික චාරිත්‍ර ධර්ම තිස්පැයේ පිරිතක මෙන් සිදුවේ. තිස්පැය තුනේ පිරිතක් සඳහා රාත්‍රී කාල දෙකක් හා දවල් කාල එකක් යෙදේ.

**පවත්වන පිළිවෙල**

- පළමු දින රාත්‍රී මහපිරිත් දේශනාවෙන් අනතුරුව යුග දේශනාව පැවැත් වීම සිදුවේ.

- පසුදින උදෑසන හයට මහාසංඝරත්නය මණ්ඩපයට වැඩමවා මහාපිරිත් දේශනාවක් පවත්වනු ලබයි.

- මහ පිරිතෙන් අනතුරුව නැවත යුග දේශනා පවත්වන අතර සවස 2.20 ට ජාම හේවිසි වාදනය පැවැත්වීමත් 3.00 ට මහ පිරිත් දේශනාවත් සිදුවේ.

- සවස 5.00 ට පමණ තෙල්, මල්, රැගෙන පිරිත් පැන් කොතලයක් මණ්ඩපයෙන් ලබාගෙන පෙරහැරින් දේවාලයට ගොස් තෙල්මල් පුදා පිරිත් පැන් ඔප්පු කොට පිරිත් දේශනා කොට මඟුල් බෙර හේවිසි වාදනය පවත්වා දෙවියන්ට රාත්‍රී පිරිත් ඇසීමට පැමිණෙන ලෙස ආරාධනා කරනු ලබයි.

- දෙවෙනි දින රාත්‍රී 10 ට මහ පිරිත් දේශනාව පැවැත්වීම සිදුවේ.

- මීට පෙර අවස්ථාවල පන්සිල් සමාදන් වීම මඟුල් බෙර, හේවිසි පැවැත්වීම මහ පිරිතට පෙර සිදුවුවත් දෙවෙනි දින එය සිදුවන්නේ සූත්‍ර දේශනා ආරම්භ වීමට පෙර ය. ඊට හේතුව එදින විශේෂත්වයක් ගෙන ධම්මචක්ක සූත්‍රය ඇතුළු සූත්‍ර දේශනා පැවැත්වීම යි.

- මහපිරිත් දේශනාවෙන් අනතුරුව සූත්‍ර දේශනා පිළිබඳ අනුශාසනාවක් පැවැත්වීම සිදු වේ.

- අනතුරුව මහසඟරුවනටත් හේවිසි වාදන ශිල්පීන්ටත් පිරිත් පැන් ලබාදීම සිදුකර පන්සිල්හි පිහිටුවා මඟුල් බෙර, හේවිසි වාදනය කොට සූත්‍ර දේශනා ආරම්භ කරනු ලබයි.

- හමාර දේශනාවන් පවත්වා සෙත්පිරිත් දේශනා කොට පන්සිල් සමාදන් කරවා පිං අනුමෝදන් කර පිරිත් පැන් පිරිත් නූල් බෙදාදීමෙන් නිමාවට පත් වේ.

### තිස්පැය හතේ හා සති පිරිත

- තිස් පැය හතේ හා සති පිරිත් සම්බන්ධ චාරිත්‍ර විධි රාශියකි. මෙම දෙකෙහි වෙනස වන්නේ කාලය වැඩිවීම පමණි. තිස්පැය හතේ පිරිත රාත්‍රී කාල හතරක් සහ දවල් කාල තුනකින් ද සති පිරිත දින හතකින් ද යුක්ත ය. සමහර අවස්ථාවල දී දින නවයක් ද යොදා ගැනේ. මුල් දිනය හා අවසන් දිනය අතහැර දින හතක් යොදාගනී. සති පිරිත හා තිස්පැය හතේ පිරිත සම්බන්ධ චාරිත්‍රවිධි බොහෝ සෙයින් සෑම පළාතක ම සමාන බවක් දක්නට පුළුවන.

- තිස්පැය හතේ හා සති පිරිත සඳහා සහභාගී වන්නේ උපසම්පදා භික්ෂූන් වහන්සේලා පමණි. පළමු දින පිරිත පේ කිරීමෙන් අනතුරුව දොරකඩ අස්න ප්‍රකාශය සිදුවන තුරු සාමණේර හිමි නමකට හෝ ගිහි අයෙකුට මණ්ඩපයට ඇතුල්විය නොහැකි ය.

- මෙවැනි පිරිත් දේශනාවන් සිදු කරන්නේ විහාරස්ථානයක හෝ වෙනත් පොදු ස්ථානයක පමණි. නිවෙස්වල සිදුවන්නේ නැත.

- මණ්ඩපය සකස් කිරීමේ දී වෙනත් පිරිතක දී මෙන් නොව සුළු වෙනස්කම් දැකිය හැකි ය. විශේෂයෙන් රාජගහ සහ ඊට සම්බන්ධ ප්‍රධාන ආසන දෙක හෙවත් යුගාසනය මණ්ඩපයේ මධ්‍යයට වෙන්නට සකස්කොට අනෙක් ආසන වටේට තබනු ලබයි.

- අනෙක් පිරිත් දේශනා අවස්ථා මෙන් ම පළමු දින භික්ෂූන් වහන්සේ පිරිත් මණ්ඩපයට වැඩමවීම සිදු කරනු ලබයි. අනතුරුව දැහැත් වට්ටියක් පිළිගන්වා සතියක් හෝ සත්වරුවක් පිරිත් දේශනා කරන ලෙස ආරාධනාව සිදු කරන අතර දොරකඩ අස්න ප්‍රකාශ කර දේවදූත දරුවා හා පරිවාර දූතයන් මහා සංඝරත්නයට භාරදීමේ චාරිත්‍රය මෙහි දී සිදු කරයි.

- ඉන්පසු සතරවරම් දෙවියන් හා ගම්භාර දෙවියන් වෙනුවෙන් ඉදිකළ පහන් පැළ දල්වා හේවිසි ශබ්ද පූජා පවත්වයි.

- පිරිත් පේ කිරීමෙන් පසුව මඟුල් බෙර වාදනය හා හේවිසි ශබ්ද පූජා පවත්වා මහා සඟරුවන පිරිත්හුය අතට ගෙන මහපිරිත දේශනා කරනු ලබයි. **සබ්බේ බුද්ධා බලප්පත්තා** ගාථාව දේශනා කරනවිට මහා සංඝරත්නය අත ඇති පිරිත්හුය මණ්ඩපයේ උඩ ගැටගැසීම සිදු කරයි.

- තිස් පැය හතේ පිරිත් දේශනාවක දී නම් මහපිරිත් දේශනය අවසන් වනවිට දෙනමක් යුගාසනයට වැඩමවා දේවදූතයා ලවා පිරිතට ආරාධනා ගාථා කියවා දේවාරාධනය කොට යුග දේශනා ආරම්භ කරයි.

- සති පිරිත් දේශනාවක දී මහ පිරිත් දේශනාවෙන් පසුව මහා සංඝරත්නය තුනුරුවන් වන්දනා කොට මණ්ඩපය වසා තබනු ලබයි. නැවත පිරිත ආරම්භ කරන්නේ අළුයම් කාලයේ ය.

- දිනපතා උදේ හයට, සවස තුනට හා රාත්‍රී නවයට මහ පිරිත් දේශනාවන් පවත්වන අතර අන් අවස්ථාවල යුග දේශනා නොකඩවා පැවැත්වේ.

- තිස් පැය හතේ පිරිතක නම් තුන්වන දිනය හා සති පිරිතක නම් හයවන දින තවත් වැදගත් දිනයකි. මෙම දිනය හඳුන්වන්නේ සූත්‍ර දේශනා දිනය වශයෙනි.

- එදින සවස මහ පිරිත් දේශනාවෙන් පසුව මණ්ඩපය හා මල්පැල, පුන්කලස් අලුත් කිරීම සිදු වේ. නාදළු, බුලත් කිනිති, පුවක්මල් කිනිති අළුතින් මණ්ඩපයේ එල්ලනු ලබයි. පිරිත්හුය නැවත ගැට ගැසීමට ගොක්කොළ වට්ටේට දැමීම ද සිදුවේ. මණ්ඩපය වටා ඇති පුන්කලස්වලට අලුතින් පොල්තෙල් දමා සකසන අතර එළියේ පහන් පැළ නැවත සකසනු ලබයි.

- තිස්පැය හතේ හා සති පිරිත් දේශනාවල අවසාන දිනය විශේෂ චාරිත්‍රවලින් සමන්විත ය. පෙරදින සූත්‍ර දේශනා අවසන් කොට නැවත යුගදේශනා ආරම්භ වේ.

- අවසන් දින මහා සංඝරත්නය උදේ 9 ට මණ්ඩපයට වැඩමවා මහ පිරිත දේශනා කරනු ලබයි. අනතුරුව අනුශාසනාව දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේ, දේවාල පත්‍රය භාර ස්වාමීන් වහන්සේ, දේවදූත දරුවා, පරිවාරදූතයන් හා තලගොබය මණ්ඩපයට වැඩම වීම සිදු වේ. ලිත දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත් අනුශාසනාව දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත් දේවදූත දරුවාටත් පිරිත්පැන් ලබාදී පිරිස පන්සිල්හි පිහිටුවා ලිත දේශනා කරනු ලබයි. එය දේවාලපත්‍ර භාර ස්වාමීන් වහන්සේ විසින් සිදුකරනු ලබයි.

- ලිත දේශනාවෙන් අනතුරුව අනුශාසනා දේශනා කරන ස්වාමීන් වහන්සේ යුග පුටුව පිටුපස සිටගෙන විහාර අස්න දේශනාව කරනු ලබයි. එහි අන්තර්ගත වන්නේ ලංකාවේ පැරණි සිද්ධස්ථාන 275ක නාමාවලියකි. එම නාමාවලිය නම් පොතෙහි අන්තර්ගතවී ඇත.

- මේ අතර කාලය තුළ තවත් විශේෂ චාරිත්‍රයක් ඉටු කරනු ලබයි. එනම් දේවාල තල්පත් සකස් කිරීම යි. දේවාල තල්පත් පහක් සකස් කෙරේ. මෙය දේවාල පත්‍රය භාර ස්වාමීන් වහන්සේ විසින් සකස් කරනු ලබන අතර එහි අන්තර්ගත වන්නේ අසවල් විහාරස්ථානයේ පිරිත් දේශනා පිංකම් පවත්වන බවත් බණ හමාර කරන තැනට සහපිරිවර දෙවියන් සමග පැමිණෙන ලෙස කරන සංඝ ආඥාවකි.

- දේවදූතයා ඇතුළු පිරිස පන්සිල්හි පිහිටුවා දේවාලපත්‍රය දේශනා කිරීම් සිදුවන අතර එයින් අදහස් කරන්නේ දෙවියන් වෙත මහා සංඝරත්නය විසින් සිදුකරන සංඝ ආඥාවකි.

- මල්වට්ටි 5ක්, පිරිත් පැන් කොතළයක්, පොල්තෙල් බෝතලයක්, හඳුන්කූරු, කපුරු, දේවාලය වෙත රැගෙන යා යුතුයි. පූජා ද්‍රව්‍යයන් දේවාලයට ඔප්පු කර එම දේවාලස්ථානයේ දී ද දේවාල තල්පත දේශනා කොට මඟුල් බෙර හේවිසි වාදනය කළ යුතු ය. දකුණු පළාතේ දේවාලයේ දී තල්පත දේවදූත දරුවා විසින් කියවනු ලබයි. එසේ ම දකුණු පළාතේ දේවදූතයකු සමග පරිවාර දූතයන් අට දෙනෙකු යොදා ගැනේ.

- දේවාල පෙරහැර විහාරස්ථානයෙන් පිටත් වූ පසු මහා සංඝරත්නය නමස්කාර පාඨයේ පටන් දසධම්ම සූත්‍රය අවසානය දක්වා යුග දේශනා කොට මහ පිරිත් දේශනාවක් සිදුකර නැවතත් යුග දේශනා ආරම්භ කරත්.

- එම යුග දේශනාවන් රාත්‍රී මංගල සූත්‍ර දේශනාව දක්වා සිදුකෙරේ. විශේෂයෙන් දකුණු පළාතේ දේවදූත පෙරහැර විහාරස්ථානයට ගෙවදින අවස්ථාවේ මහාසමය සූත්‍ර දේශනාව පවත්වනු ලබයි. ඊට හේතුව මහාසමය සූත්‍රය ඇසීමට දෙවියන් ප්‍රිය කිරීම යි. එහි ඇතුළත් වන්නේ දෙවියන්ගේ නම්ගොත් පිළිබඳ ව යි. මෙය ඉතා විසිතුරු ලෙස කරන දේශනාවකි.

**හේම කද**

- තිස්පැය හතේ හා සති පිරිත් දේශනාවල හේම කද භාවිත කිරීම ද විශේෂ චාරිත්‍රයකි. හේම කද යන්නෙන් දෙවියන් සඳහා ගෙනයන කද හැඳින් වේ. හේම කද සකස් කිරීම ඉතා දක්ෂ යතිවරයෙකුගේ අනුශාසනා පරිදි මහසංඝයා විසින් කරනු ලැබේ. කතරගම දේවාලයේ මුරුතන් කද, දළදා මාළිගාවේ බුද්ධ පූජාව වැඩමවන කද ආදර්ශ කොට හේම කද සකස් කරති. දේවදූතයා විසින් දේවතල්පත රැගෙන යන්නේ හේමකදෙනි.

දේවතල්පත් දෙකට නවා සුදු රෙද්දකින් ඔතා මෙය සකස් කර ගැනීම සාමාන්‍ය පිළිවෙත යි. දකුණු පළාතේ මේ සඳහා අලංකාර හේම කදක් සකස් කරනු ලබයි. පොල් පිත්තේ පට්ටාවලින් සකසන ලද කේතුවක හැඩය ගත් බඳුන් දෙකක් සකස් කොට අඩි 3ක පමණ පොල් නාරටියක දෙපස ගැටගසා අලංකාර රෙදිවලින් සරසනු ලබයි.

එහි එක් පසෙක දේවතල්පත් හා අනෙක් පස බුලත් කිණිති, නා කිණිති හා පුවක් මල් කිණිති එල්ලනු ලබයි. අනෙක් බොහෝ ප්‍රදේශවල බුලත් කිණිති, නා කිණිති හා පුවක් මල් කිණිති දේවතල්පතෙහි ම මුල් කොණෙහි එල්ලනු ලබයි. මෙසේ අලංකාරයෙන් සකසා ගත් කද හේම කද වශයෙන් ව්‍යවහාර වේ. මෙසේ සකස් කළ හේමකද දේවදූතයා විසින් පෙරහැරෙහි රැගෙන යනු ලබයි. දකුණු පළාතේ හේම කද රැගෙන දේවදූතයා හා පරිවාර දූතයෝ මණ්ඩපය වටා තුන්විටක් පැදකුණු කොට පෙරහැරට එකතු වෙත්. අනෙක් ප්‍රදේශවලදී සිදුවන්නේ ප්‍රධාන දොරටුව අභියස දී අනුශාසනා දේශනා කරන ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ වෙතින් හේම කද ලබාගෙන පෙරහැරට එකතු වීම යි.

## දොරකඩ අස්න හා අනුශාසනා අස්න දේශනාව

සති පිරිත් හා තිස්පැය හතේ පිරිත් දේශනාවල අවසාන දින රාත්‍රියෙහි විශේෂිත චාරිත්‍ර විධි අනුගමනය කරනු ලබයි. එදින විශේෂත්වය වන්නේ දොරකඩ අස්න ප්‍රකාශය හා අනුශාසනා අස්න දේශනාව යි. රාත්‍රී දහයට පමණ මහා සංඝරත්නය මණ්ඩපයට වැඩම වීම සිදුවේ. මණ්ඩපයට වැඩම කළ භික්ෂූන් වහන්සේ පළමු ව එතෙක් දේශනා නොකළ ඉසිගිලි සූත්‍රයේ අවසාන ගාථා දෙක දේශනා කිරීම සිදු කරත්. මෙහි දී එම දේශනාව කිරීමට හේතුව පිරිත් පොතේ මුල් බණවර දෙක හා තුන්වන බණවර සම්බන්ධ කිරීම යි. ඉන්පසු මංගල සූත්‍රය දේශනා කෙරේ. එදිනට මංගල සූත්‍රය පමණක් දේශනා කිරීමට බලපෑ හේතු දෙකකි.

- පිරිත ආරම්භක දිනයේ මහ පිරිත් දේශනාවට රතන සූත්‍රය හා කරණීයමෙත්ත සූත්‍රය පමණක් දේශනා කරන ලදි. එදින දේශනා නොකළ මංගල සූත්‍රය අවසන් දින රාත්‍රියේ දේශනා කිරීම.

- අවසන් දින රාත්‍රියේ පිරිත් ශ්‍රවණයට දෙවියන් පැමිණෙන බැවින්, දෙවියන්ට ඇති වූ පැනයක් විසඳීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ මංගල සූත්‍රය ශ්‍රවණයට දෙවියන් ප්‍රිය කිරීම.

මංගල සූත්‍ර දේශනාවෙන් පසුව අනුශාසනා දේශනාව සිදු කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා දේවදූත දරුවාත් පරිවාර දූත දරුවනුත් මණ්ඩපයට වැඩම වීම සිදු වේ. එහිදී පළමු ව සිදු කරන්නේ දොරකඩ අස්න, අනුශාසනා අස්න පිළිබඳ ව හැඳින්වීමක් ඇතුළත් අනුශාසනාවක් කිරීම යි. දේවදූත දරුවා හා පරිවාර දූත දරුවන් ඇතුළු ගිහි පිරිස පංචසීලයෙහි පිහිටුවා අනුශාසනා අස්න දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත් දේවදූත දරුවාටත් පරිවාර දූත දරුවන්ටත් පිරිත් පැන් දෙනු ලබයි. ඉන්පසුව අනුශාසනා දේශනාව ආරම්භ කෙරේ. පළමු ව මණ්ඩපද්වාරයෙහි මිනිසුන් ඇත්දැයි ප්‍රශ්න කරන අතර

දරුවා මිනිසුන් ඇති බව පිළිතුරු දෙයි. දෙවනුව දේවතාරාධනාවට ගියා දැයි විමසයි. පුද පෙරහැරින් දේවතාරාධනාවට ගිය බව දේවදූත දරුවා සඳහන් කරයි. තුන්වෙනුව විමසන්නේ දෙවියන්ගේ පැමිණීම පිළිබඳ ව යි. සතරවරම් දෙවියන් ප්‍රධාන සෑම දෙවියන් ම පැමිණ ඇති බව පිළිතුරු දෙනු ලබයි. ධෘතරාෂ්ඨ, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ, යන සතරවරම් දෙවි මහරජ දරුවන් ඇතුළු සෑම දෙවියෝ ම සහ පිරිවරින් වැඩිසේක. යනුවෙන් එහිදී සඳහන් කරයි. දොරකඩ අස්න ප්‍රකාශනයෙන් අනතුරුව සිදුවන්නේ අනුශාසනා අස්න දේශනාව යි. මෙයින් සිදුකරන්නේ පිංකම සිදුකිරීමෙන් ලැබූ පිං දෙවියන්ගේ නම්ගොත් ප්‍රකාශ කරමින් අනුමෝදන් කරවීම යි. පිංඅනුමෝදන් වූ දෙවියන්ගේ ආශිර්වාදය පිංකම කරවූ අයට සලසාදීම යි.

## පිරිත් හමාර කිරීම

දොරකඩඅස්න හා අනුශාසනාඅස්න දේශනාව අවසන් වීමෙන් අනතුරුව හතර දෙනා වහන්සේ බැගින් වැඩහිඳ ආටානාටිය සූත්‍ර දේශනාව පවත්වනු ලබයි. මෙය හමාර දේශනාව නමින් ද හැඳින්වේ. ඊට ඇතුළත් වන්නේ පිරිත් පොතෙහි තුන්වන හා හතරවන බණවර දෙක යි. හමාර දේශනාවෙන් පසුව සෙත්පිරිත් දේශනාව පවත්වා පන්සිල් සමාදන් කරවා පිං අනුමෝදන් කොට පිරිත් පැන් හා පිරිත් නූල් ලබාදීමෙන් පිරිත හමාර වේ.

## ශබ්ද පූජා, පැවැත්වීම හා සම්බන්ධ චාරිත්‍ර

පිරිත් දේශනාවල දී ශබ්ද පූජා, පැවැත්වීම අවස්ථා කිහිපයක දී සිදුවේ. එනම්,

- සධාතුක කරඬුව, පිරිත් පොත් වහන්සේ හා මහා සංඝරත්නය මණ්ඩපයට වැඩමකර වීමේ අවස්ථාව
- පහන් පැල් දල්වන අවස්ථාවේ දෙවියන් වෙනුවෙන් ශබ්ද පූජා පැවැත්වීම.
- මහපිරිත් දේශනාවට පෙර මගුල්බෙර හා හේවිසි, ශබ්ද පූජා පැවැත්වීම මෙය තුන් විටක් පවත්වනු ලබන අතර දකුණු පළාතේ මගුල් බෙරය පමණක් වාදනය කරයි. හත් කෝරළය ප්‍රදේශයේ දී හත්වාරයක් මගුල් බෙර හා හේවිසි ශබ්ද පූජාව පැවැත් වේ.
- ධම්මචක්ක සූත්‍ර දේශනාව ආරම්භ වීමට ප්‍රථමයෙනුත්, මහාසමය සූත්‍ර දේශනාව ආරම්භවීමට ප්‍රථමයෙනුත් නැවත ශබ්ද පූජා පවත්වනු ලබයි. තිස්පැය හතේ හා සති පිරිත් දේශනාවල දී ධම්මචක්ක සූත්‍රය ඇතුළු සූත්‍ර හත ම දේශනා කිරීමේ දී එක් සූත්‍රයක් ආරම්භ වීමට ප්‍රථම ශබ්ද පූජා පවත්වනු ලබයි.
- ආටානාටිය සූත්‍ර දේශනාව ආරම්භ වීමට ප්‍රථමයෙන් ද ශබ්ද පූජා පැවැත් වේ.
- පිරිත් දේශනාව අවසාන වීමේ දී ද මගුල් බෙර සහ හේවිසි පැවැත් වීම සිදු වේ.
- තිස්පැයට වැඩි පිරිත් දේශනා අවස්ථාවල මහ පිරිතට වැඩමවන අවස්ථාව හේවිසි ශබ්ද පූජා මැද සිදු වේ.

- තිස්පැය තුන, තිස්පැය පහ, තිස්පැය හත හා සති පිරිත් දේශනාවල දී උදේ 5.30ට පමණ අළුයම්දුරේ තේවාව ද සවස 2.30 ට ජාම හේවිසි පැවැත්වීම ද සවස 6.00 ට හැන්දෑදුරේ තේවාව ද සිදු කිරීම විශේෂත්වයක් ගනියි. එසේ ම උදේ, දවල්, හවස, බුද්ධ පූජාවන් පවත්වන අවස්ථාවල ද ශබ්ද පූජා පැවැත් වේ.

## යුගාසන දේශනා

මිහිඳු මහරහතන් වහන්සේ වැඩමවීමත් සමග මෙරට සම්බුදු සසුන මුල් බැසගත්තේ ය. යුගයෙන් යුගය වැඩසිටි මහරහතන් වහන්සේලා ප්‍රමුඛ මහ සඟපරපුර සම්මා සම්බුද්ධ සාසනය දිවි හිමිකොට ආරක්ෂා කරගත්කල් හි එසේ බුදුදහම මහජනයාට සමීප කරවීමට විවිධ ධර්මෝපක්‍රම භාවිත කිරීමට යුගකාරක මහතෙරුන් වහන්සේලාට සිදුවිය. එහි එක් ප්‍රතිඵලයක් ලෙස යුගාසන බණ හෙවත් ආසන දෙකේ බණ සිංහල ජන සමාජයට දායාද වී තිබේ.

යුගාසන ධර්ම දේශනා ක්‍රම මහනුවර යුගයේ සිට පැවතෙන්නකි. ඒ යුගය වනවිට පිරිහී තිබූ ශාසනය නගාසිටුවීමට යොදාගත් එක් උපක්‍රමයක් ලෙස ද මෙම යුගාසන දේශනා ක්‍රමය හැඳින්විය හැකි ය. බුද්ධ දේශනාවන්හි සහ මහා ශ්‍රාවකයන් වහන්සේලාගේ දේශනාවන්හි එන සංවාදශීලී දේශනා මෙයට පූර්වාදර්ශ වන්නට ඇත.

යුගාසන ධර්ම දේශනාව සකස්කොට තිබෙන්නේ පැරණි සිදුවීමක් ආදර්ශයට ගනිමිනි. එනම්, සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව, සිදුකළ ප්‍රථම ධර්ම සංගායනාව යි. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රශ්න විමසූ ආකාරයත් ආනන්ද මහරහතන් වහන්සේ ඒවා විසඳූ ආකාරයත් මෙහි දී සැලකිල්ලට ගෙන ඇත.

පෙළ අටුවාවල එන ප්‍රවෘත්ති විමසිල්ලෙන් බලනවිට පෙනීයන්නේ පෙර දේශනා විධි තුනක් පැවති බව යි.

**01. ඔසාරණ (පදභාන) - පාලියෙන් දේශනා පාඨ කීම**
**02. කථන - අර්ථ දක්වීම**
**03. සරභඤ්ඤ - සම්මත විරිත්වලට අනුව මධුරස්වරයෙන් ධර්ම පාඨකීම**

යනුවෙන් යුගාසන ධර්ම දේශනාවක දී මෙම ක්‍රම තුන ම භාවිත වේ.

## යුගාසන ධර්ම දේශනා පිළිවෙළ

යුගාසන දේශනාවක දී පළමුවෙන් ම දේශනාව පවත්වන ශාලාවෙහි උඩුවියන් බැඳ සරසා ඒ මැද වජ්‍රාසන නමින් හඳුන්වන විශේෂ ආසන දෙකක් එක් ආසනයක් නැගෙනහිරට මුහුණලාත් අනෙක ඊට දකුණු පසින් උතුරට මුහුණලාත් පැණවීම සිරිත ය. රාත්‍රී කාලයෙහි තිසි සමය උදාවූ පසුව දේශකයන් වහන්සේලා පුද සිරිත් ගෞරව සහිතව වැඩමවීම යි. එහි දී උන්වහන්සේලා ප්‍රධාන ආසනය ඉදිරියෙහි සිට පිරිස දෙසට හැරී සිටගෙන ම,

ඉච්ඡිතං පත්ථිතං තුය්හං ඛිප්පමෙව සමිජ්ඣතු
සබ්බෙ පූරෙන්තු චිත්ත සංකප්පා චන්දො පණ්ණරසො යථා

යන ගාථාවෙන් පිරිසට ආශිර්වාද කරත්. ආසනවල වැඩසිටින්නේ ඉන් අනතුරුව ය. යුගාසන දේශනාව කරන ආසන සම්පූර්ණයෙන් ම ආවරණය කිරීම ද සිරිතකි. පිරිස අතරෙහි සිටින සූදානම් වූ අයෙක් ආසන ඉදිරියෙහි දොහොත් මුදුන් දී වැඳගෙන මිහිරි වූ ස්වරයෙන් පාලි පද්‍යයෙන් පන්සිල් ආරාධනාව අනතුරුව සිදුකරයි.

සුබය තිලෝ හිරුමෙන් උදයාසල
සැඩ කිරණින් දිළි මුළු දෙරණේ
නිබය කසුන් බඳුනේ පිරුණා මත
දෙව් සමුදා පිළිගත් බැතිනේ
අබය පුරේ අම සම්පත් ගෙනදෙන
මුනිරජ වදහල පෙළ දම්නේ
සබය මෙතැන් සතහට පන්සිල්
දෙවනා ලෙස නමදිමු යති සඳුනේ

යනාදී සුමිහිරි පද්‍යයන් මෙහි දී භාවිත කෙරේ. ආරාධනාවට අනුව දකුණුපස ආසනයේ වැඩසිටින දේශකයන් වහන්සේ පිරිස පන්සිල්හි පිහිටුවත්. පන්සිල් සමාදන් වූ පසු ධර්ම දේශනාව සඳහා ආරාධනා කරන්නේ ද ලලිතවත් වූ ගද්‍ය පද්‍ය පාඨයන් ප්‍රකාශ කරමිනි.

ගගන තල මැද දිලෙන පුන්සඳ ලෙසට බැඳි සුදු වියන්
අවට වට තරු විලස බබලන අඳුරු දුරු කරලා පහන්
රුවට වගුරළි පෙළට මල ලොඹු දොරටුවල සැදි පුන් කලස්
එමැද වැඩහුන් බණ අසුන් පිට යතිඳු පා වැඳලා කියම්

දිනා මුනිමරඟනා බිඳ බුදු වුණා දෙසු දම් තිසර ණා
සනා දුක් සනසනා සව්සත සසර සයුරෙන් ගොඩල නා
ගුණා කර දෙසු දහම් අමරස පොවන මෙන් දෙසනා මෙනා
මනා සිත් පින පිනා ඔබ වෙත කරමු වැඳ ආරාධනා

"ශ්‍රීමත් මධුරෝදාර ගම්භීර ධීරවීර වික්‍රම ප්‍රතාල..... ප්‍රවර නෛකගුණ ගණානුභාවෝත්පන්න පතල සිරි පතළ කර විපුල වූ සකල සුරනර බඹුන් පැළැඳි හිස කිරුළුවන් විකල පත් මිසදුටුත් එකම සිරි පා පියුම් ඔවුන් හිස පළඳවා කෙලෙස් රුපු බිඳ හැර සොර මරුන් සුන්කරා නිවන්සිරි පුරපුරා ලොව්තුරා බුදු වූ භාග්‍යවත් තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර වදාරණ ලද්දාවූ සුවාසූ දහසක් ධර්මස්කන්ධයන්

අතුරෙන් මෙම තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි දහම් දෙසනු පිණිස උදාර කර ශ්‍රද්ධාදීන් සමන්විතව විසිතුරු කොට කරවන ලද නිර්ජරවන් ශ්‍රී විභූති ඇති මෙම ධර්ම ශාලාවෙහි පනවන ලද ධර්මාසනාරූඪව වැඩහුන්නා වූ පින්වත් ස්වාමීන් වහන්ස,''

''නෙක දිවා ඍද්ධි ප්‍රතාප ශෝභිත වූ ධෘතරාෂ්ඨ-විරූඪ විරූපාක්‍ෂ වෛශ්‍රවණ යන සතර වරම් දෙවි මහ රාජෝත්තමයන් වහන්සේලා ප්‍රමුඛ කොට ඇති සියලු ම දිව්‍යරාජ සමූහයාට ද අද මෙතැන්හි රැස්වූ සකල ශ්‍රද්ධාවන්ත සත්පුරුෂාදීන්ට මෙම පින්කම කරවීමට ඇතුළත් වූ දායක මූලිකකාරකාදීන්ට ද ඔබ වහන්සේට ද මට ද අපට ද අප සියලු දෙනාගේ ගුරුවර දෙමව්පිය ඥාති මිත්‍රාදීන්ට ද මතු ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රතිලාභයට පැමිණෙන පිණිස අභිප්‍රායානුකූල වූ විසිතුරු මධුර ධර්මයක් දේශනා කර වදාළ මැනවි......

මේ ආදී ආරාධනාව එක් අයෙකු හෝ කිහිපදෙනෙකු විසින් කරන අවස්ථා ද ඇත.

ධර්ම දේශනාව මෙතැන් සිට ඇරඹෙයි. පළමු කොට ප්‍රධාන ආසනයේ දේශකයන් වහන්සේ නමස්කාර පාඨයෙන් පටන්ගෙන රත්නත්‍රය නමස්කාර ගාථා පන්තියක් හා සංග්‍රහ පාඨයන් මිහිරි තාලයට කියමින් පිරිස ප්‍රබෝධමත් කරත්. ඉන් පසු දකුණු පස ආසනයේ දේශකයන් වහන්සේ තමා වෙත වූ බණ පොත බලාගෙන තමන් වෙත නියම කරගත් සූත්‍රයේ නිදාන පාඨය කියවා එහි එක් එක් පදය අනුව ඉදිරිපත් කරනවිට අනෙක් ආසනයෙහි දේශකයන් වහන්සේ කර්ණරසායන වාක්‍යවලින් එහි අර්ථය දේශනා කරත්.

මෙම යුගාසන දේශනාව තුන්යම් රාත්‍රිය පුරා ම සිදු කරන්නකි. දේශනාවෙහි එක් කොටසක් නිමකිරීමෙන් පසු විවේකයක් ලබාදෙයි. එම විවේක කාලය පුරා හේවිසි ශබ්ද පූජාව සිදුකරන අතර එය යාමය ගැසීම ලෙස සැලකේ. යාමය ගැසීමෙන් පසුව සූත්‍රයට අර්ථ කියූ දේශකයන් වහන්සේ ම එම සූත්‍රය ඇසුරු කොට සවිස්තර ධර්ම දේශනාව පවත්වන අතර ආසනය ඉදිරියේ වාඩි වී වැඩිහිටි ගිහි පින්වතෙකු විසින් දේශකයන් වහන්සේගේ වචනයක් පාසා පිළිවදන් දීමේ සිරිතක් ද ඇත. කාලයට අනුව වරින්වර යාමය ගසන අතර සූත්‍ර ධර්ම විස්තර දේශනාවන් සිදුකර අවසානයේ මෛත්‍රෙය වර්ණනාව සිදු කරයි.

**මෛත්‍රේය බුද්ධ වර්ණනාව**

ශ්‍රීමත් ශ්‍රීපති ශ්‍රීමත් ප්‍රජාපති මෞලි මනුභානු ප්‍රභාසුර ශ්‍රීපාද පඞ්ක්ති ඇති අප ත්‍රෛලෝක තිලක තිලෝගුරු භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ මෙයට වීසතාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි අසරණ සරණ සසර සැරිසරණ සේක් දෙන දනහට ලෝභයෙන් දන නිසා සව්සතුන් වෙත උතුම් කරුණාවෙන් පිරුණාවූ මව්සමග නැව්නැගී අව්කකා රැව්තදව ඌම් මැඩ ගව්ගණන් ගෙවා ගොස් යන්ට ගිය නැව යන්ට ගියගමන් වළකා සුන් කළහ.

මෙසේ පවන් වේගයෙන් එවන් නැව රුවල් ජල ගැලූ සඳ නිවන් පුර යන්නාට පෙරනිමිති දක්වන්නා සේ මව් කර හොවාගෙන මූදුවල පීනමින් අනාගාමී බඹ අයදිමින් ලොව්තුරා බුදුබැව් ප්‍රාර්ථනා කළ සේක.

මෙසේ පුරිත පාරමිතා ධර්මයන් ඇති මාගේ මාගේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර වදාරණ ලද ශ්‍රී සද්ධර්මය නම් පංචවස්ස සහස්සානි සහස්සානං සත්තාහං අමතං මහා නිධානං සවායාපිකා භවිස්සන්ති යන්නෙන් පස්වා දහස් අවුරුදු මුළුල්ලෙහි නිමානැති සතුන් හට අමාමහ නිවන් සිරි සාධා දී ලන සේක.....

මෛත්‍රෙය වර්ණනාවෙන් පසුව දායකවරු දේශකයන් වහන්සේට පිරිකර පූජා කිරීමෙන් අනතුරුව සියලුදෙනා ම පන්සිල්හි පිහිටුවා පින් අනුමෝදන් කර දේශකවරු ආසනයෙන් බසිති.

යුගාසන දේශනාවන්හි සාමාන්‍ය පිළිවෙළ මෙය වුවත් ප්‍රාදේශීය වශයෙන් පුදසිරිත්වල යම් යම් වෙනස්කම් දැකිය හැකි ය. ආසන පහේ දේශනා, ආසන හතේ දේශනා පවා අතීතයෙහි සිදුකර ඇත.

**අභ්‍යාස**

01. පිරිත් දේශනා වර්ග නම් කරන්න.
02. තිස්පැයේ පිරිත් දේශනාවක මූලික කටයුතු ලැයිස්තුවක් පිළියෙල කරන්න.

**පැවරුම**

01. දොරකඩ අස්න අනුශාසනා කොටසක් ශිෂ්‍ය සමිතියේ ඉදිරිපත් කරන්න.
02. යුගාසන ධර්ම දේශනාවක ආරාධනා කොටස ශිෂ්‍ය සමිතියේ ඉදිරිපත් කරන්න.

29 පාඩම

# බුදු දහමින් හැදී වැඩුණු සිංහලය

හෙළ සංස්කෘතිය යනු හෙළයන්ගේ සංස්කෘතිය යි. එනම් සිංහලයන්ගේ ඇවතුම් පැවතුම් සමුදය යි. වසර 2500කට වඩා ඈත ඉතිහාසයකට උරුමකම් කියන සිංහලයන්ගේ එම ඇවතුම් පැවතුම් සමුදය බුදුදහමේ ආභාසයෙන් කෙසේ පෝෂණය වී දැයි සොයා බැලීම මෙම පාඩමේ අරමුණ යි.

ඕනෑම රටක සංස්කෘතිය සකස් වන්නේ එම රටේ ජනතාවගේ ඇදහිලි විශ්වාස සම්ප්‍රදායික පිළිගැනීම් වැනි දේ පදනම් කරගෙන ය. ඒ අනුව ප්‍රාග් බෞද්ධ ලංකාවේ ද සංස්කෘතිය සකස් වීමෙහි ලා එකල ලාංකේය ජනයා අදහන ලද විවිධාකාර වූ වැඳුම්, පිදුම්, ඇදහිලි, විශ්වාස පාදක වී ඇති බව අතීත තොරතුරුවලින් පැහැදිලි වේ.

ඒ පැරණි සංස්කෘතිය තුළ කිසියම් ඇවතුම් පැවතුම් සමූහයක් මත සරල සංස්කෘතික රටාවක් ප්‍රකට කළ ද එය සමාජ ධර්මවලින් පිරිපුන් හර පද්ධතියකින් සැදුම්ලත් එකක් නොවී ය. විටෙක එය මිථ්‍යා විශ්වාස සමඟ මිශ්‍ර වූවක් විය. තවත් විටක කුල-ගෝත්‍ර මත රැඳුණු වාර්ගික බවක් ඉසිලී ය. එමෙන් ම හිංසනය, ඝාතනය වැනි අකාරුණික ගති ලක්ෂණවලින් යුක්ත විය. සාධාරණ බව, සමානාත්මතාව, අන්‍යෝන්‍ය ගෞරවය වැනි සමාජ සාමූහික ලක්ෂණ එහි දක්නට නොලැබිණ. කොටින් ම එම සංස්කෘතියේ ආගමික, දේශපාලනික ආදී සෑම අංශයකින් ම විදහා පෙනුණේ ප්‍රාථමික වූත් නොදියුණු වූත් ජන සංස්කෘතික ලක්ෂණ ය.

නිර්මල ථෙරවාදී බුදුසමය ද රැගෙන අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ භාරතයේ සිට මෙරටට වැඩම වන්නේ එවන් සංස්කෘතික පසුබිමක් පැවති සමයක ය. බුදුරජාණන් වහන්සේ තෙවරක් ලක්දිවට වැඩමවීම ආදී හේතු නිසා මිහිඳු මාහිමියන්ගේ වැඩමවීමට පෙර ලක්දිව බුදුසමය පැවති බවට යම් යම් මතිමතාන්තර පැවතිය ද ස්ථිරසාර ව බුදුසමය ලක්දිවට ලැබෙන්නේ මහින්දගමනයත් සමඟ ය.

මහින්දගමනය හුදෙක් ධර්ම ව්‍යාප්තිය උදෙසා ආගමික මුහුණුවරින් පමණක් සිදුවූ සංසිද්ධියක් නොවේ. එය ලක්දිව ආගමික අංශයෙන් පමණක් නොව මහා සංස්කෘතික පෙරළියක් සහිතව ආර්ථික, සමාජ, දේශපාලන, ආදී සෑම අංශයක් ම නවෝදයක් ඇති කරලන්නට සමත් වූවකි. ඉන්, එතෙක් ලංකාවේ පැවති සංස්කෘතිය නොසිතූ විරූ ලෙස වෙනස් වී යාමටත් බෞද්ධ ආචාර සමාචාර විධි ඔස්සේ පෝෂණය වීමටත් ලැබුණේ මනා පිටුබලයකි.

බුදුසමයේ බලපෑමෙන් ලාංකික සංස්කෘතියේ වර්ධනීයව පෝෂණය ලද මූලික ම අංශය ආගම යි. එතෙක් මිථ්‍යා විශ්වාස මත ගස් -ගල් -ඉර- හඳ තාරකාවලට පමණක් නොව යක්ෂ නාගාදීන්ට පවා වැඳුම් පිදුම් කරමින් පවත්වාගෙන ගිය ආගමික රටාව වෙනුවට බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය මත විශ්වාසය තබා ආචාර විද්‍යාත්මක සිරිත් විරිත් සහිතව දර්ශනික වටිනාකමකින් හෙබි දහමක් ශ්‍රී ලාංකිකයින්ට මිහිඳු මා හිමියන් විසින් උරුම කර දෙන ලදී.

එහි ප්‍රතිඵලය වූයේ ලාංකිකයා, බුදුරජාණන් වහන්සේ එක ම ශාස්තෘවරයා ලෙස පිළිගනිමින් කටයුතු කිරීම යි. උන්වහන්සේ සිහිපත් කරමින් චෛත්‍යයට, බෝධියට, බුදු පිළිමයට වැඳුම් පිදුම් කිරීම යි. වෙසක්, පොසොන්, ඇසළ ආදී උත්සව සංවිධානය කිරීම යි. බෞද්ධ ඉගැන්වීම්වලට අනුගතව ජීවිතය සකසා ගන්නට කටයුතු කිරීම යි. ප්‍රාග් බෞද්ධ යුගයේ ලාංකික සංස්කෘතියේ දක්නට නොලැබුණු කරුණාව, මෛත්‍රිය, දයාව, අනුකම්පාව, සමානාත්මතාව, අවිහිංසාව, පරෝපකාරය වැනි උසස් ගුණාංග තම ජීවිතය තුළින් පිළිබිඹු වන සේ කටයුතු කිරීම යි. එහිලා ලාංකිකයා පදනම වශයෙන් තබා ගත්තේ "පංචශීල ප්‍රතිපදාව" යි. මෙලොව පරලොව විශ්වාසය තබා එහි දියුණුවටත් අවසන නිවන සාක්ෂාත් කර ගන්නට අවශ්‍ය කුසල් රැස් කර ගැනීම යි.

ශ්‍රී ලාංකිකයාගේ සමාජ ජීවිතය පෝෂණය වීමෙහිලා ද බුදුසමයෙන් ලැබුණේ අසීමිත අනුබලයකි. ලාංකිකයාගේ සමස්ත ජීවිතය ම බෞද්ධ ආභාසයක් මත සැකසී ඇති අයුරු දක්නට ඇත. දරුවකු මෙලොව බිහිවීමට පෙර භික්ෂූන් වහන්සේලා ලවා අංගුලිමාල පිරිත දේශනා කරවා ගනිමින් ආරම්භ කරන බෞද්ධ චාරිත්‍රකරණය ඔහුගේ මරණයෙන් ද කෙලවර වන්නේ නැත. මරණින් පසුව දින හතේ, තුන් මාසයේ, වර්ෂයේ හා වාර්ෂිකව වශයෙන් පුණ්‍යානුමෝදනා පින්කම් කරමින් එය අඛණ්ඩ ව පවත්වාගෙන යාමේ චාරිත්‍රය ලාංකිකයාට නිතැතින් උරුම විය. ඒ අතරතුර කාලයේ ඉඳුල් කට ගෑම, හිසකෙස් කැපීම, අකුරු කියවීම, ශිල්ප-ශාස්ත්‍ර ලබා දීම ඉන් පසුව රැකියා, ව්‍යාපාර කටයුතු ඇරඹීම, උපන් දින සැමරීම, ආවාහ විවාහ ආදී චාරිත්‍රවිධි සියල්ල ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය සහිතව විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් භික්ෂූන් වහන්සේලාගේ මග පෙන්වීම යටතේ සිදුවිය. ගමේ සිදුවන පොදු ගැටලු පමණක් නොව පවුලක සිදුවන ගැටලු පවා ධර්මානුකූලව නිරාකරණය කළේ භික්ෂූන් වහන්සේ ය. භික්ෂුව සඳහා " කුල දේවතා " යන ගෞරව නාමය ලැබුණේ ඒ නිසා ය.

බුදුසමය ලක්දිවට ලැබෙන්නට පෙර කුමන හෝ ආර්ථික රටාවක් මත ලාංකිකයා සිය ජීවන රටාව පවත්වාගෙන ගියේ ය. එහෙත් එහි විධිමත් පදනමක් පවතින්නට ඇතැයි කිසිසේත් විශ්වාස කළ නොහැක. මිහිඳු මා හිමියන් හඳුන්වා දුන් නව දහමේ ආලෝකය ශ්‍රී ලාංකේය ආර්ථික රටාව විෂයෙහි ද අපරිමිතව ලැබී ඇත.

එය කෘෂිකර්මාන්තය මත පදනම් වූවකි. එහි සියලු චාරිත්‍ර වාරිත්‍ර විධි මිථ්‍යා විශ්වාසවලින් බැහැරව අවිහිංසාව, පාරිසරික හිතෛෂී බව වැනි සංකල්ප හා මිශ්‍රව ක්‍රියාත්මක කෙරිණ. කෘමි හා වෙනත් පාරිසරික උවදුරුවල දී ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් පිරිත් කළ පිරිත් පැන් ටිකක් හේනට ගෙන යාමට ඉසින්නට වග බලා ගැනීමෙන් එය තහවුරු වේ.

තම ශ්‍රමය, උත්සාහය මත කැලෑ කොටා ගත් හේනෙන්, කුඹුරෙන් ලැබූ අස්වැන්න, බව බෝගය දැහැමෙන් සෙමින් සැකසුනකි. ඒ නිසා ම එහි අග්‍ර භාගය තෙරුවන්ට පිදීමට ලාංකික බෞද්ධයා හුරු විය. අනිත් අංශ කෙරෙහි මෙන් ම ලාංකිකයාගේ ආර්ථික සුසංවිධිත කටයුතු කෙරෙහි භික්ෂුවගේ දායකත්වයත් මග පෙන්වීමත් නිරන්තරව සිදු විය. ගොවි ගැටලුවල දී ඊට විසඳුම් සෙවීමේ මූලිකයා වූයේ භික්ෂූන් වහන්සේ ය. ඒ සඳහා විනිශ්චය ශාලාව වූයේ ධර්ම ශාලාව ය.

රටක සංස්කෘතිය පිළිබඳව සඳහන් කිරීමේ දී දේශපාලනය ප්‍රබල සාධකයකි. ඊට හේතුව සාංස්කෘතික හැඩගැස්ම කෙරෙහි දේශපාලනය ප්‍රබල ව බලපෑම් ඇති කිරීම යි. මිහිඳු මාහිමියන්ගේ වැඩම වීමත් සමඟ ලක්දිව පැවති දේශපාලනය කෙරෙහි ද බුදුසමයේ ආභාසය ලැබිණ. ඒ අනුව මිහිඳු හිමියන්ට අවශ්‍ය වූයේ බෞද්ධ ඉගැන්වීම්වලින් ශික්ෂණය ලත් පාලන රටාවක් ලංකාවේ ස්ථාපිත කරලීම යි. දේවානම්පියතිස්ස රජුගෙන් ඇරඹි නව දේශපාලන රටාව බුදුසමයෙන් නිර්දේශිත පංචශීල ප්‍රතිපදාව, දස රාජ ධර්මය, දස සක්විතිවත්, සතරසංග්‍රහවස්තුව ආදි දේශපාලන ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියාත්මක වන්නට විය. ලක්දිව සිංහාසනය සඳහා පත්වන පාලකයා බෞද්ධයකු ම වියයුතු බවටත් ඔහු බෝධිසත්ත්ව ගුණෝපේත වියයුතු බවටත් අතීතයේ සිට ජන මතයක් ගොඩනැගුණේ ඒ නිසා ය.

එමෙන් ම ඒ පාලකයාගේ එක ම අනුශාසකයා බෞද්ධ භික්ෂූන් වහන්සේ ලෙස පිළිගනිමින් කටයුතු කරන්නට පාලකයා මැලි නොවී ය. ඒ නිසා අතීත රාජ්‍යය ධාර්මික බවින් පිරිපුන් විය. බුදුන් වහන්සේගේ පාත්‍ර ධාතුව, දළදා වහන්සේ වැනි බෞද්ධ පූජනීය වස්තූන් සුරැකීමට ඇති හැකියාව මත පමණක් ම පාලකයා පත් කර ගැනීමට තරම් බෞද්ධ බලපෑම දේශපාලනය කෙරෙහි සිදු වී ඇත.

කලා ශිල්ප රටක සංස්කෘතියේ ප්‍රෞඪත්වය විදහාපාන තවත් ප්‍රධාන ලක්ෂණයකි. ලක්දිව කලාශිල්ප සකස් වීම පිළිබඳ ව අවධානය යොමු කරන විට ද පෙනී යන්නේ ඒ කෙරෙහි ද බෞද්ධ බලපෑම පූර්ණ වශයෙන් සිදු වී ඇති බව යි. ඒ බව බෞද්ධ සලකුණකින්, බෞද්ධ තේමාවකින් තොරව කලා නිර්මාණයක් දක්නට නොලැබීමෙන් ම තහවුරු වේ. අපට අතීතයෙන් උරුම වූ ගල් කණුවක්, සිතුවමක්, පැරණි ගොඩනැගිල්ලක් ආදිය වේ නම් ඒ සියල්ල තුළ ඇත්තේ බෞද්ධ සලකුණු ය.

"සාහිත්‍යය" ශ්‍රී ලාංකේය සංස්කෘතියේ තවත් පිළිඹිබුවකි ඒ අනුව සිංහල සාහිත්‍ය පෝෂණය විෂයෙහි ද බෞද්ධ ආභාසය මනාව ලැබී ඇති බව දක්නට ඇත. සිංහල සාහිත්‍ය යනු බෞද්ධ සාහිත්‍යය යැයි පිළිගැනීමට තරම් සාධක අපට හමු වේ. අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ලියවී ඇති සාහිත්‍යය කෘති වැඩිම ප්‍රමාණය බෞද්ධ තේමාවකින් සැකසී ඇති අයුරු මනාව පැහැදිලි වේ. එමෙන් ම ඒ මහගු සාහිත්‍යයේ හිමිකරුවන් වැඩි දෙනා බෞද්ධ භික්ෂූන් වහන්සේලා ය. නැතහොත් බෞද්ධ ආභාසය ලත් ගිහි ජනයා ය. සාහිත්‍යය බිහිවුණු මධ්‍යස්ථාන ගත් කල ඒ සියල්ලක් ම බෞද්ධ ආරාමයන් ය. එවැනි පසුබිමක නිම වූ සාහිත්‍යය තුළ ශ්‍රී ලාංකේය හර පද්ධතිය අපූරුව පිළිබිඹු කෙරිණ.

මේ සියලු තොරතුරුවලින් අනාවරණය වන්නේ අතීතයේ සිට ආ සිංහල සංස්කෘතිය හා බෞද්ධ සංස්කෘතිය යනු දෙකක් ලෙස නොව ගසට පොත්තත් පොත්තට ගසත් සේ බැඳී ලක්දිව ක්‍රියාත්මක වූ බව යි. මිහිඳු මාහිමියන් මෙරට ස්ථාපිත කරන ලද බෞද්ධ සංස්කෘතිය වසර දහස් ගණනක නොසිඳී ආ බව පැහැදිලි ය. ඒ කාලය තුළ ලාංකිකයන්ට කෙතරම් දරුණු සාංස්කෘතික බලපෑම් ඇති වී ද? එසේ වුවත් සිය උරුමයක්, දායාදයක්, ලෙස සැලකූ බෞද්ධ සංස්කෘතිය අතැර අන් සංස්කෘතීන් වැළඳ ගන්නට සැබෑ ශ්‍රී ලාංකික බෞද්ධ ජනයා පෙළඹී නොයාම වත්මන් අපි ලද ඉමහත් භාග්‍යයකි.

### ක්‍රියාකාරකම

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

01. සංස්කෘතිය යනු කුමක් ද?
02. රටක සංස්කෘතිය සකස් වන්නේ කෙසේ ද?
03. ප්‍රාග් බෞද්ධ යුගය යනු කුමක් ද?
04. ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති ආගමික විශ්වාස පහක් නම් කරන්න.
05. ප්‍රාග් බෞද්ධ ලාංකේය සංස්කෘතියේ පැවති ලක්ෂණ තුනක් දක්වන්න.
06. බුදුරජාණන් වහන්සේ ලක්දිවට වැඩම කළ අවස්ථා තුන දක්වන්න.
07. මහින්දගමනය සිදුවූ පොහොය දිනය කුමක් ද?
08. මහින්දගමනය සිදුවන විට ලක්දිව විසූ පාලකයා කවු ද?
09. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ ලක්දිවට පැමිණි පිරිස නම් කරන්න.
10. මිහිඳු මාහිමියන් තමන් වහන්සේ හඳුන්වා දෙමින් මිහින්තලයේ දී දෙසූ ගාථාව ලියන්න.

### ක්‍රියාකාරකම

පහත සඳහන් රචනාමය ප්‍රශ්නවලට ප්‍රමාණාත්මක පිළිතුරු සපයන්න.

01. මහින්දගමනය සිදුවූ අයුරු පැහැදිලි කරන්න.
02. මිහිඳු මාහිමි ප්‍රධාන පිරිස ලක්දිවට වැඩම වූ පළමු දින පහ තුළ සිදු වූ සිදුවීම් කවරාකාර දැයි පහදන්න.
03. ප්‍රාග් බෞද්ධ ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස නිදසුන් සහිතව පහදන්න.
04. මහින්දගමනයෙන් පසු ලක්දිව සිදු වූ ආගමික නවෝදය පිළිබඳ පැහැදිලි කරන්න.
05. ප්‍රාග් බෞද්ධ ලංකාවේ බ්‍රාහ්මණාගම පැවති බවට සාධක හමු වේ. විමසන්න.

### පැවරුම

01. ප්‍රාග් මහින්ද යුගයේ ලක්දිව බුදුදහම පැවති බවට මතයක් පවතී. මීට අදාළ සාක්ෂි ඇතුළත් වන සේ තොරතුරු සොයා කුඩා පොතක් සකස් කරන්න.

# 30 පාඩම ලොවට වඩන මෙත හා සතට සදන සෙත

පුද්ගලයාගේ සමාජගත ජීවිතය අර්ථවත් කරලීම බුදුදහමේ මූලික අරමුණකි. ඊට හේතුව සමාජ ජීවිතය යනු පුද්ගලයාගේ මෙලොව ජීවිතය යි. යම් පුද්ගලයෙකු මෙලොව ජීවිතය අර්ථවත් කර ගන්නේ නම් ඊට අනුරූපව ඔහුගේ පරලොව ජීවිතය ද අර්ථවත් වේ. දෙලොව ජීවිතය ම සාර්ථක කරගත් පුද්ගලයා පරම විමුක්තිය වූ නිවන සාක්ෂාත් කර ගැනීමට ද වෙහෙසෙයි. එවැනි පරමාර්ථ රැසක් සඵල වීමට නම් සමාජගත ජීවිතය මූලික වශයෙන් අර්ථවත් වියයුතු ම ය. ඒ සඳහා බුදුදහම නිර්දේශ කරන ප්‍රතිපත්ති දෙකක් ලෙස සතර බ්‍රහ්ම විහරණ හා සතර සංග්‍රහ වස්තුව සඳහන් කළ හැකි ය.

## 1. සතර බ්‍රහ්මවිහරණ

උතුම් වූ ශ්‍රේෂ්ඨ වූ යන අර්ථ බ්‍රහ්ම යන්නෙහි ඇත. විහාර යනු වාසය කිරීම, පැවැත්ම යන්න යි. ඒ අනුව උතුම් අන්දමින්, ශ්‍රේෂ්ඨ අන්දමින් වාසය කිරීම, පැවතීම යනු බ්‍රහ්ම විහරණ හෙවත් විහරණ යන්නෙහි අර්ථය යි. පුද්ගල ජීවිතය ශ්‍රේෂ්ඨත්වයට පත් කරගත හැකි පැවතුම් හතරක් සතර බ්‍රහ්මවිහරණ යනුවෙන් දක් වේ. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු ඒවා ය. මහා බ්‍රහ්මයා තුළ මුලු ලෝකයා කෙරෙහි පවතින පැවතුම් හතරක් ලෙස ද මේවා හැඳින් වේ.

### මෙත්තා

මෙත්තා යනු මෛත්‍රී බව යි. නැතහොත් මිතුරු බව යි. කිසිදු භේදයකින් තොරව සියලු ම සත්ත්වයන් දුකින් මිදී සැපෙන් යුතුව ජීවත් වනු දැකීමට සිත පොළඹවන උසස් සිතුවිල්ල මෛත්‍රිය යි. තම මිතුරා පිළිබඳ තමා තුළ පවතින හිතවත් භාවයට සමාන හිතවත් කමක් සියලු ම සත්ත්වයන් කෙරෙහි දැක්වීම මෛත්‍රීය ලෙස තවත් අයුරකින් දැක්විය හැකි ය.

අවංක මිතුරා, තම මිතුරාට සියලු කල්හි ප්‍රාර්ථනා කරන්නේ යහපතක් ම ය. එමෙන් ම විපතක් දුකක් කෙසේවත් ප්‍රාර්ථනා කරන්නේ නැත. එබඳු මානසික ස්වාභාවයක් සතුරු - මිතුරු ආදී සියල්ලන්ට ම ඇති කර ගැනීම මෛත්‍රියේ ඇති එක ම උසස් ලක්ෂණය යි. ඒ වෙනුවෙන් කරන මානසික ව්‍යායාමය, මානසික ක්‍රියාදමය මෛත්‍රී භාවනාවෙන් සිදු කෙරේ.

### කරුණා

මිනිස් සිතෙහි ඇති වන අනුකම්පා සහගත සිතුවිල්ල කරුණාව යි. එය උපදින්නේ අන් අයගේ දුකත් දුටු විට ය. එමෙන් ම ඔවුන් ඒ දුකින් මුදවාලීම පිළිබඳ අවශ්‍යතාව ය මත ද කරුණා සිතුවිල්ල ඇති වේ.

තවද අනුන්ගේ දුක කැමති නොවන්නා වූ, අනුන්ගේ දුක නොඉවසන්නා වූ අනුන්ගේ දුකට විරුද්ධ වන්නා වූ ස්වාභාවය ද කරුණාව යි.

අටුවාචාරීන් වහන්සේලා,

"පරදුක්ඛෙ සති සාධූනං හදය කම්පනං කරොතීති කරුණා"

යනුවෙන් දක්වා ඇත්තේ මෙය යි. දුක ඇති වූ විට නැදෑකම්, හිතවත්කම්, මත පිහිට වන්නට සිතයි නම් එහි බ්‍රහ්මවිහාරයක් නැත. ඕනෑ ම සත්ත්වයකුගේ අසරණ බව සලකා ඔවුන්ට පිහිටවීමට සිත පෙළඹේ නම් එය නියම කරුණාව වේ.

යමෙකු දුකට පත් වූ විට කරුණා ස්වරූපයෙන් ශෝකයක් ද ඇති වේ. එබඳු ශෝකය කරුණාව වැඩීමට බාධාවකි. කරුණාව හඬා වැළපීමට කාරණයක් ද නොවේ. එයින් ද සැබෑ කරුණාව වැළකී යයි.

දුකට පත් පුද්ගලයාට මෙලොව පමණක් නොව යහපත කියා දී පරලොව දුකින් ද මිදීමට උපකාර කළ හැකි නම් එය කරුණාවේ ශ්‍රේෂ්ඨතම ලක්ෂණය වේ.

**මුදිතා**

අනුන්ගේ සම්පත්තිය දකින්නා වූ ද අසන්නා වූ ද සත්පුරුෂයන්ගේ සිත්හි ඇතිවන්නා වූ ඊට සතුටු වන්නා වූ අනුකූල වන්නා වූ ඊර්ෂ්‍යාවට ප්‍රතිවිරුද්ධ වූ ස්වභාවය මුදිතාව යි.

අනුන්ගේ සැපත-සතුට තමන්ට ම ලද දෙයක් සේ සලකා ඊට අනුරූපව සතුටු වීම මුදිතාවේ ප්‍රධාන ලක්ෂණය යි.

ඕනෑම අයකු දැහැමි ලෙස ලබා ඇති සැප සම්පත් දැක සතුටු වනවා මිස ඊර්ෂ්‍යා නොකළ යුතු ය. අනුන් විසින් විඳිනු ලබන සැප සම්පත් දැක තමන්ගේ සිත දූෂණය කර ගැනීම තරම් තවත් අනුවණ කමක් නැත.

සතුට යන වචනය ප්‍රීතිය යන අර්ථය දීමට බොහෝ සෙයින් යෙදෙයි. එහෙත් මෙහි සඳහන් සතුට, සාමය ප්‍රීතිය නොවේ. ඒ ප්‍රීතියට කෙලෙස් ධර්ම මූලික වේ. මුදිතාව නිසා ඇති වන සතුට නික්ලේශීය. අප ඇති කරගත යුත්තේ ඒ කෙලෙස් රහිත සතුට යි.

**උපෙක්ඛා**

උපෙක්ඛා හෙවත් උපේක්ෂාව යනු සිතෙහි ඇති වන මැදහත් බව යි. ගැටලුවක දී කරදරයක දී පමණක් නොව ජීවිතය හා සම්බන්ධ ඕනෑ ම අවස්ථාවක අන්තගාමී සිතුවිලිවලට නොයා අපක්ෂපාතීව ඉවසීමෙන් කටයුතු කරන ස්වභාවය ඇත්තේ උපේක්ෂාව තුළ ය.

පුද්ගලයන් හා වස්තූන් කෙරෙහි විවිධාකාර බැඳීම් ඇතිව වෙසෙද්දී ඇති වන මානසික ගැටුම් නිසා සිතෙහි සමබර බව බිඳී යයි. සිත ව්‍යාකූල වෙයි. එවන් අවස්ථාවලදී මෙකී උපේක්ෂාව නැතහොත් සමබර බව ඇති කර ගැනීම අතිශය වැදගත් ය. එවිට ගැටලු විසඳා ගනිමින් ජීවිතයේත් සමාජයේත් යථා ස්වාභාවය අවබෝධය අවබෝධ කරගැනීමට පහසු වනු ඇත.

රාගය, ද්වේශය ආදී කෙලෙස් සිතිවිලිවලට ප්‍රතිවිරුද්ධව ඉහත සිතිවිලි ක්‍රියා කරන නිසා විවිධ කෙලෙස් ධර්ම සිතට ඇතුළත් වීම වැළකී යයි. මෙත්තා ආදී සිතිවිලි ඇත්තෝ නිරන්තරයෙන් සෞම්‍ය වූවෝ ය. ඒ නිසා ම ඔවුහු උත්තමයෝ ය.

නොඉවසිල්ල, අසහනය, අතෘප්තිය ආදී නරක සිතිවිලි ඉවතලා උත්තම ජීවිත ගෙවන්නට පුද්ගලයාට ඉවහල් වනුයේ මෙම සතර බ්‍රහ්ම විහරණ ය.

## 2. සතර සංග්‍රහ වස්තුව

පුද්ගල ජීවිතය අර්ථවත් කර ගැනීම උදෙසා බුදුදහමෙන් නිර්දේශ කොට ඇති තවත් ප්‍රධාන ප්‍රතිපත්තියක් ලෙස සතර සංග්‍රහ වස්තුව සඳහන් වේ. සතර සංග්‍රහ වස්තුව පැතිකඩ දෙකකින් අර්ථ ගැන්වී ඇති බව දක්නට ඇත. ඉන් පළමුවැන්න පොදුවේ පුද්ගල ජීවිතය අර්ථවත් කර ගැනීම උදෙසා අනුගමනය කළයුතු ප්‍රතිපත්තියක් ලෙස ද දෙවැන්න රටක පාලකයා සිය මහජනයා වෙනුවෙන් අනුගමනය කළයුතු ප්‍රතිපත්තියක් ලෙස දක්වේ. මෙහි විස්තර වනුයේ ඉහත සඳහන් පළමු අර්ථය මූලික කරගෙන ය.

ඒ අනුව පුද්ගලයාගේ ජීවිතය අර්ථවත් කර ගැනීම උදෙසා කරුණු හතරක් වශයෙන් මෙම ප්‍රතිපත්තිය දක්වා ඇත. දනය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව යනු ඒවා ය.

### දනය

දනය යනු දීම යි. එනම් පරිත්‍යාගය යි. සමූහචාරී මිනිසකු වන මිනිසා වෙසෙන්නේ පුද්ගල සමූහයකින් යුත් සමාජයක ය. එවිට සාමූහික පැවැත්ම උදෙසා විවිධාකාර පරිත්‍යාග කිරීම් සිදු කිරීමට පුද්ගලයාට සිදු වේ. අවස්ථානුකූලව එම ඕනෑ ම පරිත්‍යාගයක් කිරීම පුද්ගලයාගේ වගකීමකි. දානය ලෙස ගෞරවනීයව කරන එම සමාජ වගකීම සමාජ ජීවිතයේ දී වැදගත් වේ.

තමාට ලැබෙන ඕනෑ ම දෙයක් දන්දීම, පරිත්‍යාග කිරීම පමණක් ම මෙහි දනය ලෙස නෙගැනේ. සාමූහික පැවැත්ම උදෙසා කරන පරිත්‍යාගය ම මෙහි දනය නම් වේ. එය ද්‍රව්‍ය වශයෙන් නොව උපදේශනාත්මක සිතුවිල්ලක් මගින් කරන පරිත්‍යාගයක් ද විය හැකි ය.

සාමූහිකව විසීමේදී ලෝභී, මසුරු, කුහක ගති යම් පුද්ගලයකු තුළ පවතී නම් ඔහු සමාජ රාමුවෙන් ඈත් කෙරෙයි. ඔහු හුදෙකලා වී යයි. එවිට ඔහුට පුද්ගල අරමුණු හෝ සමාජ අරමුණු කරා යා නොහැකි ය. එම නිසා පරිත්‍යාගශීලීව කටයුතු කිරීම ශ්‍රේෂ්ඨ ය.

### ප්‍රියවචනය

සාමූහිකව විසීමේ දී සුහදශීලීව කෙරෙන ඇමතීම්වලට සෑම පුද්ගලයකු ම අසන්නට කැමති ය. එවිට සියලු දෙනාට අන්‍යෝන්‍ය ගෞරවය සහිතව විසීමට අවස්ථාව උදා වේ. ප්‍රිය වචනය යනුවෙන් අදහස් කරනුයේ ඒ අන්‍යෝන්‍ය ගෞරවය උදෙසා ඉවහල් වන වචන ය. එම වචන ඇසීමෙන් පුද්ගලයා නොරැවටේ. පුද්ගලාන්තර බිඳීයාමක් සිදු නොවේ. භීතියටත් තැති ගැනීමටත් පත් නොවේ. කාලය ද කා දමන අර්ථහීන වූවක් නොවේ. මෙම වැරදි වචන අවස්ථා හතරෙන් මිදී මුවින් පිට වන යම් වචනයක් වේ නම් එය ප්‍රිය වචනයකි. එවැනි වචන ඇසීමට මිනිසුන් පමණක් නොව සමස්ත සත්ත්ව ලෝකය ම ප්‍රිය ය. අප හා ජීවත් වන තිරිසන් සතුන්ගේ හැසිරීම්වලින් ඒ බව තහවුරු වේ.

බුදුරදුන්ගේ දේශනාව නම් යමෙක් කතා කළයුතු නම් එය ප්‍රිය වචනයක් ම විය යුතු ය. ප්‍රිය වචනවලින් තොර නම් කතා නොකර සිටීම යහපත් බවයි.

ප්‍රිය වචන කතා කිරීමේ වැදගත්කම ඇත්තේ ඇසීමෙන් අන් අය සතුටු කිරීම තුළ පමණක් නොවේ. එවැනි වචන කතා කරන්නාට විවිධාකාර අර්ථ රාශියක් හිමි කර ගැනීමට හේතු වේ. එවැනි අර්ථ අත්පත් කර ගැනීම සාමාන්‍ය පැවැත්මට ඉමහත් පිටුවහලකි.

### අර්ථචර්යාව

පුද්ගලයාට සමාජගතව විසීමේ දී ආත්මාර්ථය පමණක් ගැන සිතා කටයුතු කිරීමට ඉඩක් නැත. එසේ යම් පුද්ගලයකු සිතන්නේ නම් ඔහු ද සමාජ රාමුවෙන් බැහැර වේ. එවිට සමාජගතව විසීමෙන් ඔහුට ලැබෙන වරප්‍රසාද අහිමි වී යයි. එම නිසා සමාජයේ වෙසෙන අන් අය කෙරෙහි ද සිතා මතා ඔවුන්ගේ ද යහපත උදෙසා කටයුතු කිරීමට පුද්ගලයාට සිදු වේ. සතර සංග්‍රහ වස්තුවේ අර්ථචර්යාව යනුවෙන් අදහස් කෙරෙන්නේ එම පරාර්ථචර්යාව යි.

"පරත්‍ථං පටිපජ්ජථ"

යන බුදු ඔවදනට අනුව පුද්ගල ජීවිතය තුළ පරාර්ථය අනිවාර්ය ය. මින් අදහස් කෙරෙන්නේ ස්වකීය ජීවිතය ම අනුන් උදෙසා කැප කරමින් කටයුතු කිරීම නොවේ. ධාර්මිකව තම ජීවිතය අර්ථවත් කර ගැනීම පළමුව සිදු කොට අන් අයගේ ද ජීවිත ආලෝකවත් කරලීම උදෙසා අවස්ථානුකූලව සිය ශක්ති ප්‍රමාණයෙන් දායක වී කටයුතු කිරීම වැදගත් වේ. සැබෑ පරාර්ථ චර්යාව යනු එය යි.

ආත්මාර්ථය අපේක්ෂා කිරීම වැනි යටි අරුත් සහිතව කරන පරාර්ථ චර්යාවක් ද සමාජයේ දක්නට ඇත. එය සැබෑ පරාර්ථ චර්යාව නොවේ.

**සමානාත්මතාව**

ජාති-කුල වශයෙන් හෝ කළු සුදු-වර්ණ වශයෙන් හෝ ධනය-බලය වශයෙන් හෝ උගත්-නූගත් වශයෙන් හෝ ආදී විවිධ වර්ග කිරීම්වලට යටත් නොකොට සමාජයේ වෙසෙන සියල්ලන් තමා හා සමාන කොට සැලකීම සමානාත්මතා ගුණය යි.

ඉහත බෙදීම් යටතේ වර්ග කොට සැලකීමෙන් සමාජ සාමූහිකත්වය බිඳී යයි. එවිට පුද්ගල සමාජ වශයෙන් ඉදිරියට යාමට (සමාජ ප්‍රගමනයට) තිබෙන ඉඩ කඩ ඇහිරී යයි. ඒ පුද්ගලයා සතු ගුණාත්මක වටිනාකම්වලට අගයක් දී ඊට අනුරූපව කටයුතු කිරීම වර්ගවාදය නොවේ. එය සමාජයක පැවතිය යුතුය.

"පූජාච පූජනීයානං"
"පණ්ඩිතානං ච සෙවනා"

වැනි වචනවලින් ද ඉස්මතු කරන්නේ අගය කළ යුත්තා, පිදිය යුත්තා උසස් කළ යුතු බව යි. ඉහත බෙදීම් යටතේ අහේතුව වර්ගවාදී නොවී සාමූහික අගයක් සහිතව කටයුතු කිරීම සමානාත්මතාව යි.

ඉහත විස්තර වූ කරුණු හතර පදනම් කරගෙන සමාජයේ අන්අයට සංග්‍රහාත්මක ව කටයුතු කරන්නේ නම් එම සමාජය පරිහානියට පත් නොවේ. එමෙන් ම ඒ තුළින් ඔවුනොවුන් අතර තව තවත් සුහදතා ගොඩනැගී යහපත් සමාජයක් බිහි වේ.

**ක්‍රියාකාරකම්**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. යහපත් සමාජයක් ඇති කරලීම සඳහා සතර බ්‍රහ්ම විහරණ කෙසේ ඉවහල් වන්නේ ද යි පහදන්න.
02. සමාජයට කළයුතු සංග්‍රහයක් ලෙස සතර සංග්‍රහ වස්තුව දක්වන ලද්දේ ඇයි දැයි පහදන්න.
03. සතර බ්‍රහ්මවිහරණ පුද්ගලයාගෙන් ඇත්වන විට ඇතිවන ස්වභාවය කවරාකාර දැයි විස්තර කරන්න.
04. දනය යන්න සමාජමය වශයෙන් හා ආගමික වශයෙන් වැදගත් වන අයුරු පැහැදිලි කරන්න.
05. "යහපත් සමාජයක් ගොඩ නගමු" යන මැයෙන් රචනයක් ලියන්න.